# සිංහල
# විමාන වස්තු
# ප්‍රකරණය

සෙංඛණ්ඩ සෙලාබ්‍ය උපොසථ පුෂ්පාරාමයෙහි වැඩ විසූ

**ගම්මුල්ලේ රතනපාලාභිධාන මහා ස්ථවිර**

පාදයන් වහන්සේ විසින් විරචිතයි.

මඩපාත ශෛලතලාරාම විහාරාධිපති

**මඩපාත සීලානන්ද මහා ස්ථවිර පාදයන්**

වහන්සේගේ ශිෂ්‍යවූ

**මාකෙහෙල්වල ධම්මානන්ද ස්වාමිපාදයන්**

වහන්සේ විසින් සකස්කරණ ලදී.

නුගේගොඩ, ගංගොඩවිල

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ

**ආචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමිගේ**

ප්‍රස්තාවනාවෙන් යුක්තයි.

## සංඥාපනය.
## සිංහල විමාන වස්තු ප්‍රකරණය.

මේ මාහැඟි ධර්ම ප්‍රකරණය වනාහි මීට වර්ෂ 156 කට පූර්වයෙහි ශෙඩ්ඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රී වර්ධනපුරය රාජධානිය කොට ලඩ්කා රාජ්‍යයෙහි එකච්ඡත්‍ර නංවා රාජ්‍යශ්‍රීයට පැමිණි කීර්තිශ්‍රී රාජසිංහ මහීපාලයන්ගේ කාලයෙහි ශ්‍රී වර්ධනපුර උපොසථ පුෂ්පාරාම මහා විහාරයෙහි වැඩ විසූ **ගම්මුල්ලේ රතනපාලාභිධාන** මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් **ගලගෙදර ඉන්දජෝති** මහා ස්ථවිරපාදයන් වහන්සේගේ ආරාධනාවෙන් සිංහල භාෂාවට නගන ලද්දකි.

යථොක්ත **රතනපාල** මහා ස්ථවිරයාණන් වහන්සේ වනාහි උපොසථ පුෂ්පාරාම මහා විහාරාධිපතිව වැඩවිසූ එකොළොස් දහස් ග්‍රන්ථ සඩ්ඛ්‍යාවකින් ප්‍රතිමණ්ඩිත **සාරාර්ථ සංග්‍රහ** නම් ධර්ම ප්‍රකරණය ද පාළි භාෂාමය විශිෂ්ට ගද්‍ය කාව්‍යක්වූ මහා බොධි වංශයට සිංහලාර්ථ ව්‍යාඛ්‍යාවද **අභිසම්බොධි අලඩ්කාරයද** යනාදී බොහෝ ග්‍රන්ථ සමූහයක සම්පාදනය කළාවූද අතිශයින් නෂ්ට ප්‍රාප්තව තුබූ සම්බුද්ධ ශාසනය මහොත්සාහයෙන් යථා ස්ථානයෙහි තබා ලූ බොධි සත්ව ගුණොපේත **වැලිවිට පිණ්ඩපාතිකසරණඩ්කරාභිධාන** සඩ්ඝරාජ මාහිමියාණන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් වූ උපොසථාරාමයෙහි නායක පදවියට පත්ව වැඩ විසූ **ධම්මරක්ඛිත** නායක ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයකි. මුන් වහන්සේ ත්‍රිපිට ධර්මයෙහි හා ඡන්දස් ව්‍යාකරණ නිඝණ්ඩු ගණිතාදී නොයෙක් ශාස්ත්‍රයන්හිද පාරප්‍රාප්ත වූ උතුමෙකු බව මෙම ග්‍රන්ථය කියවීමෙන් ඔප්පු වේ.

මෙහි **විමාන නම්** විශිෂ්ට වු දෙවතාවන්ගේ ක්‍රීඩා නිවාස ස්ථානයෝයි. ඒ විමාන වනාහි, ඒ දෙවතාවන් මිනිස් ලොවදී යහපත් ශ්‍රද්ධා සීලාදීගුණ ධර්මයන්ගෙන් යුක්ත මනුෂ්‍යයන්ව සිට ඔවුන්ගේ ඒ සුචරිත කර්මානුභාවයෙන් දෙව් ලොවෙහි, යොදුන් දෙයොදුන් ආදී ප්‍රමාණ විශේෂයෙන් යුක්ත විමාන බැවින්ද, නානා රත්නයන්ගෙන් මනාව සැදුම් ලද්දවූ විසිතුරු වර්ණ සංස්ථානාදී ශොභාවන්ගෙන් මොනවට හෙබියාවූ, විශේෂයෙන්ම වර්ණවත්ව පහළවන ඒ දෙවතාවන්ගේ නිවාසස්ථාන විමාන නම් වේ. ඒ ඒ දේවතාවන්ගේ රූප සෞන්දර්‍ය යසොභොග පරිවාරාදී සම්පත්තින් නිසා, නිමිත්තවූ දෙශනාව හෙවත් වස්තුව දෙශනාවට කාරණාවූ යෙනුයි, **විමාන වස්තු** නම්.

තවද මේ විමාන වස්තු ප්‍රකරණය පිළිබඳ මුල් පොත ඛුද්දක නිකායට ඇතුළත් කොට ගාථාඞ්ගයෙන් පාළි විමාන වස්තුව සංග්‍රහ කරණ ලදී. එහි විමාන වස්තු පුච්ඡා විස්සජ්ජන වශයෙන් ගාථාවෝ ද්විප්‍රකාර වෙති. පුච්ඡා ගාථාවෝ වනාහි සමහරක් බුදුරජාණන් වහන්සේ විසින්ද, සමහරක් මුගලන් මහරහතන් වහන්සේ ආදී මහ රහතන් වහන්සේලා විසින්ද ශක්‍රාදී දෙවියන් විසින්ද අසනලද ගාථාවෝයි. විස්සජ්ජන ගාථාවෝ වනාහි, ඊට පිළිතුරු වශයෙන් ඒ විමන් වැසි දෙවතාවෝ ප්‍රකාශ කරණලද ගාථාවෝයි. ඒ ද්විප්‍රකාර ගාථාවෝ එක්රැස්කොට ධම්ම සංගීති කාරක මහ රහතුන් වහන්සේලා විසින් සංග්‍රහ කොට විමාන වස්තු නාමයෙන් තබන ලද්දේය. එම පාලි විමාන වස්තු ප්‍රකරණයට බදරතිත්ථ විහාර වාසී **භදන්තාචරිය ධම්මපාල** මහා ස්ථවිරපාදයන්වහන්සේ **පරමත්ථ දීපනී** නම් විමාන වස්තු අටුවා කථාව ලියනලදී. එබැවින් මතු එන දවස පාළි අර්ථ නොදන්නා සැදැහැවත් සත් පුරුෂ මනුෂ්‍යයන්ට වන විපුල ප්‍රයෝජන සැලකූ පූර්වෝක්ත **ගම්මුල්ලේ රතනපාලාභිධාන** මාහිමියාණන් වහන්සේ විසින් යථෝක්ත ප්‍රකරණය සිංහල භාෂාවට නගන ලදී.

මෙයට, ශාසනස්ප්‍රීතිකාමී,

**ශෛලතලාරාමය,**
**මඩපාත**
**24-8-39**

**මාකෙහෙල්වල ධම්මානන්ද**

# ප්‍රස්තාවනාව

ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පසළොස අතරින් විමාන වත්ථුව සයවැන්න ය. **ඛුද්දක නිකායේ** ග්‍රන්ථ අතර විෂය ස්වරූපය අනුව **විමාන වත්ථුව** හා **පෙතවත්ථුවත් අපදාන පාළියත්** බෙහෙවින් සමාන ලක්ෂණ දරයි. විවිධ ආත්මභාව ලැබූවන් තමන් කරන ලද අකුසල කර්ම නිසා දුගතිවල ඉපිද නොයෙක් දුක්විඳින ආකාරය **පෙතවත්ථුවෙහි** විස්තර වේ. **විමාන වත්ථුවෙහි** සඳහන් වන්නේ ඒ ඒ අය මිනිස් අත්බව ලැබූ කාලයෙහි තමන් කරන ලද කුසල කර්ම නිසා ලබන ලද දිව්‍යමය සැප සම්පත් පිළිබඳ විස්තරයකි. **බුද්ධ වංස පාළියෙහි** අතීත බුදුවරයන් පිළිබඳ චරිත කථා දැක්වෙන අතර **ථෙර ථෙරී** ගාථාවන්හි තෙරවරුන්ගේ හා තෙරණියන්ගේ මෙම ජීවිතයේ අත්දැකීම් විස්තර කෙරෙන ආත්ම භාෂණ දැකිය හැකිය. අපදානයෙහි දක්නට ලැබෙන්නේ ඒ ඒ පුද්ගලයන් කරන ලද කුසල කර්මයන්හි විපාකයන් ය. ඒවා එම සම්පත් ලද පිනැත්තෝ ම විස්තර කරති.

විමානවත්ථුව එයට තරමක් වෙනස් වන්නේ පුච්ඡාවිස්සජ්ජන ක්‍රමය හෙවත් මුගලන් මහරහතන් වහන්සේ හෝ **මහාකාත්‍යායන** මහරහතන් වහන්සේ හෝ අසන පැනයකට පිළිතුරු වශයෙන් තමන් කළ කුසල කර්ම හා ඒවායේ අගය පැහැදිලි කිරීම් ය. "**විමාන**" යන්නෙන් දිව්‍ය ප්‍රාසාද අදහස් කරනු ලැබේ. එම දිව්‍ය විමානයන් අතිශයින් විචිත්‍ර ය. යොදුන් ගණන් විශාල ය. ඒවා විශිෂ්ටවූ දේවතාවන්ගේ ක්‍රීඩා නිවාසස්ථාන වන්නේ යැයි මාකෙහෙල්වල ධම්මානන්ද හිමියෝ සඳහන් කරති[1].

විමානවත්ථුව වර්ග සතකින් සමන්විත ය. පළමුවන පීඨවර්ගය, දෙවන චිත්‍රලතා වර්ගය, තුන්වැනි පාරිච්ඡත්තක

---

[1]. සිංහල විමානවත්ථු ප්‍රකරණය සංස්කරණය 1 පිට

වර්ගය සතරවන මඤ්ජෙට්ඨක වර්ගය, පස්වැනි මහාරථවර්ගය, සයවැනි පායාසි වර්ගය සත්වැනි සුනික්ඛිත්ත වර්ගය විමාන වත්ථුවෙහි මුළු කථාවස්තු සංඛ්‍යාව අසූපහක් වේ. එයින් පණහක් ස්ත්‍රී විමාන වස්තූන් ය. අතුරු කථාද සමග කථාවස්තු සියල්ල 123 කි.

## අන්තර්ගතය -

විමාන වත්ථුවෙහි අන්තර්ගතය දෙස විමසා බලන විට පැහැදිලි වන්නේ මිනිස් අත්බව ලබාසිටි යුගයෙහි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට අයත් නොයෙක් දෙනා විසින් සිදුකරනලද යම් යම් පුණ්‍ය කර්මයන් හේතුවෙන් දිව්‍ය සම්පත් ලබන ලද බවය. මිනිස් ලොවදී පතිව්‍රතා ධර්මය සුරැකි එක් කාන්තාවක් සිරුරේ පැහැය හා සම්පත්තියද ලබා දෙවඟනක වූවාය[1]. මෙබඳුම කථාවස්තුවක් පාරිච්ඡත්තක වර්ගයෙහි ලතා විමාන වස්තුවෙහි දැක්වේ[2]. වෙසවුණු රජුගේ දූවරු වූ සක් දෙව්ඳුගේ පිරිවර වූ බබලන සිරුරු ඇති දෙවඟනෝ දැහැමි ගුණයෙන් බබලන්නාහුය. ඔවුනතුරෙන් සූතා දෙව්දුව ලතා දෙව්දුවට මෙසේ ප්‍රකාශ කළාය.

උපුල් මල් දරන රුවන් මුවා මලින් නැගුණු රැළි ඇති රන්වන් සිවි ඇත්තීය තී විචාරමි. තිගේ පරිවාර සම්පත්තිය හා කීර්තිය කවර පිනකින්ද?

මිනිස් දුවක් වූ මම මහත් සම්පත් ඇති කුලයක ලේලියක් වීමි. ක්‍රෝධ නොකරන සුලු සවාමියාගේ සිත්ගෙන ඔහුට අනුකූලව පවත්නා සුලු විමි. තරුණ වූ ඒ මම පතිව්‍රතාවක් වීමියි, විස්තර කරන්නීය. එහිදී අනෙක් දෙවඟනෝද තමන් කළ යහපත් ක්‍රියා විස්තර කරති. මේ ලතා තොමෝ යමක් කියාද එය තොප විසින්

---

1. විමානවත්ථු පාලි 23 පිට.

2. විමානවත්ථු පාලි. බු.ජ.මු. 20, 22 පිටු.

අසන ලද්දේ නොවේද? උතුම් සත්‍රීන්වූ අපට සවාමි පුරුෂයන්ගේ පිහිට උතුම්ය. අපට ඔවුහු දෙවියෝද වෙතියි. සඳහන් කර තිබේ. යහපත් සවාමිභායර්‍යා සබඳතාවයෙහි අගය සහ පතිව්‍රතා ධර්මය සුරැකීමේ ආනිසංසයන්ද විස්තර කර ඇත්තේ අනාගත මිනිස් පරපුරටද ආදර්ශයක් දක්වන අයුරිනි. තෙරුවනෙහි පැහැදී වාසය කළ නිසා තමන් දිව්‍ය අප්සරාවන් ලක්‍ෂයක් පිරිවර ඇති වෛදූර්ය මාණික්‍යයෙන් අලංකෘත විමානයක උපතලද බව **කෙසකාරී විමාන වස්තුවෙහි**[1] දැක්වෙන දෙව්දුව විස්තර කර තිබේ. පන්සිල් රැකීම නිසා දවහත් තරුව මෙන් තමන් බබලමින් සිටින බව **උපොසථ විමාන වස්තුවෙහි** දැක්වෙන දෙව්දුව විස්තර කරන්නීය.[2] සද්ධා දෙව්දුවද පන්සිල් රැකීම නිසා එබඳු සම්පත් ලැබූ බව විස්තර කර තිබේ[3].

කැවුමක්, උක් දඬුවක්, යවධාන්‍යයෙන් කළ කොමුපිඩුවක්, ආදී සුළු දෙයක් වුව පහන් සිතින් පූජාකළ පිනින් නොයෙක් දිව්‍යමය සැප සම්පත් ලද ආකාරය විමාන වස්තුව පුරාම දැකිය හැකිය.

**ග්‍රන්ථපරමාර්ථය -**

බොහෝ විමාන වස්තුවක සඳහන් වන්නේ කවර පිනකින් ඔබගේ සුචරිත ඵලය සමෘද්ධවූයේද? යනුවෙනි[4]. සැබවින් විමාන වස්තුවෙහි පරමාර්ථවන්නේ ජනසමාජය සුචරිතයෙහි පිහිටුවීම බව පැහැදිලිය. පන්සිල් සුරැකීම, පතිව්‍රතාධර්මය සුරැකීම, නොයෙක් දේ දන්දීම හා යහපත් ධාර්මික හැසිරීමෙහි යෙදීම නිසා මෙබඳු උතුම් දිව්‍යමය සම්පත් ලබා සැපවත් විය හැකිය යන්න

---

[1]. විමානවත්ථු පාලි බු.ජ.මු. 33, 34 පිටු
[2]. එම 51 පිට
[3]. එම 53 පිට
[4]. එම 264 ගාථාව

අවධාරණය කිරීම ග්‍රන්ථයෙහි මූලික පරමාර්ථය වූ බව සඳහන් කළ හැකිය. පාපයට යොමුවෙමින් සිටින ජනයා ඉන් මුදවා යහපතට යොමුකරවීමත් එසේ දහමට නැඹුරුවන්නන් තිවන් සුවය කරා යොමු වන්නට සැලැස්වීමත් මෙම ධර්ම ග්‍රන්ථයන්ගෙන් අපේක්ෂා කර තිබේ.

සැබැවින්ම විමානවස්තුව කියවන කවර අයකුගේ වුවද සිත යහපතට නැඹුරු කෙරෙන ආකාරයෙන් ඒ ඒ දෙවිවරුන්ගේ හා දෙවඟනන්ගේ විස්තර අතිශය චමත්කාර ජනක ලෙස ඉදිරිපත් කර ඇති බව සඳහන් කළ යුත්තකි. ඇතැම් තැනක දිව්‍යමය සම්පත් විස්තර කිරීමට සාහිත්‍යමය කෘතියක දැක්වෙන වර්ණනාත්මක භාෂාව සාර්ථක ලෙස යොදාගෙන ඇති බව **නාග විමාන වස්තුව** ඇතුළු විමාන වස්තුන්ගෙන් පැහැදිලිවෙයි[1].

එහෙත් ඒවා පුද්ගලයා හුදෙක් කාමයට නොව ධර්මයට නැඹුරු කරවන සුලුය.

## පරිවර්තනය හා එහි කතුවරයා

**පාළි විමාන වත්ථුව**, **සිංහල විමාන වස්තු ප්‍රකරණය** නමින් සිංහලට නගන ලද්දේ **කීර්ති ශ්‍රී රාජසිංහ** රජු දවස මහනුවර මල්වතු මහා විහාරයෙහි වැඩ විසූ **ගම්මුල්ලේ රතනපාලාභිධාන** මාහිමියන් විසිනි.

උන් වහන්සේ වැලිවිට සරණංකර සංඝරාජයන්වහන්සේගේ ශිෂ්‍යයකු වූ මල්වතු මහා විහාරයෙහි නායක පදවියට පත් **ධම්මරක්ඛිත නාහිමියන් ගේ ශිෂ්‍යයෙකි**. මෙම ග්‍රන්ථය මුල් යුගයෙහි හඳුන්වා ඇත්තේ **එළුවිමාන වස්තු ප්‍රකරණය** නමිනි.

---

[1]. විමානවත්ථු පාලි බු.ජ.මු. 92 පිට 706, 707 ගාථා

සරණංකර සංඝරාජයන් වහන්සේ ගොඩනැගූ බෞද්ධ ප්‍රබෝධයත් සමග බොහෝ ගිහිපැවිදි උගතුන් විසින් ධර්මය සරළව ජනතාවට ඉදිරිපත් කිරීම පිණිස පාලියෙන් තිබූ නොයෙක් ධර්ම ග්‍රන්ථ සිංහලට පෙරලීම සිදුකරණු ලැබිණ. එහෙත් ඇතැම් ග්‍රන්ථයක බස කර්‍කෝර ලක්‍ෂණ දරයි. එසේ වුවත් මෙම සිංහල විමාන වස්තුවෙහි භාෂාව අතිශයින් සරළ රීතියක් ඔස්සේ සම්පාදනය වී තිබීම වැදගත් කරුණකි.

**පාලි විමානවත්ථුවට පරමත්ථදීපනී** නම් අට්ඨකථාව ලියන ලද්දේ භදන්තාචරිය ධම්මපාල මාහිමියන් විසිනි. ගාථාපන්තීන්ගෙන් සංග්‍රහ වී ඇති මුල් පෙළ ග්‍රන්ථය ප්‍රථම සංගීතියෙහිදී සංගීතිකාරක මහරහතන් වහන්සේලා විසින් විමානවත්ථුව වශයෙන් එක් කෘතියක් ලෙස සංග්‍රහ කරන්නට ඇතැයි සැලකේ.

වඩාත් ලෞකික යසඉසුරුපතා දුසිරිතට නැඹුරුවෙමින් සිටින වර්තමාන ජනසමාජයට සිංහල විමානවස්තුප්‍රකරණය නිවැරදි දැහැමි ජීවන මාර්ගය පැහැදිලි කරන අගනා ධර්මග්‍රන්ථයක් ලෙස අගය කළ යුතුය.

**ආචාර්ය. මීගොඩ පඤ්ඤාලෝක හිමි.**
97-11-02

# පටුන


| | | | පිට |
|---|---|---|---|
| | ප්‍රාරම්භය | | 1 |

**පීඨ වග්ගය**

| | | | |
|---|---|---|---|
| 1. | සුවණ්ණ පීඨ | විමාන වස්තුව | 8-15 |
| 2. | දුතිය පීඨ | විමාන වස්තුව | 15-16 |
| 3. | තතිය පීඨ | විමාන වස්තුව | 17 |
| 4. | චතුත්ථ පීඨ | විමාන වස්තුව | 17-18 |
| 5. | කුඤ්ජර | විමාන වස්තුව | 18-24 |
| 6. | නාවුකා | විමාන වස්තුව | 24-27 |
| 7. | දුතිය නාවුකා | විමාන වස්තුව | 27-28 |
| 8. | තතිය නාවුකා | විමාන වස්තුව | 28-29 |
| 9. | දීප | විමාන වස්තුව | 29-32 |
| 10. | තිල දක්ඛිණා | විමාන වස්තුව | 32-34 |
| 11. | පතිව්‍රතා | විමාන වස්තුව | 34-37 |
| 12. | දෙවන පතිව්‍රතා | විමාන වස්තුව | 37-38 |
| 13. | සුණිසා | විමාන වස්තුව | 38-40 |
| 14. | දුතිය සුණිසා | විමාන වස්තුව | 40 |
| 15. | උත්තරා | විමාන වස්තුව | 40-50 |
| 16. | සිරිමා | විමාන වස්තුව | 50-58 |
| 17. | කේසකාරී | විමාන වස්තුව | 58-63 |

**චිත්‍රලතා වග්ගය**

| | | | |
|---|---|---|---|
| 18. | දසි | විමාන වස්තුව | 64-68 |
| 19. | ලඛුමා | විමාන වස්තුව | 68 |
| 20. | ආචාම දයිකා | විමාන වස්තුව | 69-70 |
| 21. | චණ්ඩාලි | විමාන වස්තුව | 70-74 |
| 22. | භද්‍රා | විමාන වස්තුව | 74-79 |
| 23. | සෝණදින්නා | විමාන වස්තුව | 79 |
| 24. | උපෝසථා | විමාන වස්තුව | 79-80 |
| 25. | සද්ධා | විමාන වස්තුව | 80-81 |
| 26. | සුනන්ද | විමාන වස්තුව | |
| 27. | භික්ෂාදායිකා | විමාන වස්තුව | 81-82 |
| 28. | දුතිය භික්ෂාදායිකා | විමාන වස්තුව | 83 |

පරිච්ඡත්තක වග්ගය

| | | |
|---|---|---|
| 29. උලාර | විමාන වස්තුව | 83-86 |
| 30. උච්ඡුදායිකා | විමාන වස්තුව | 86-88 |
| 31. පල්ලඞ්ක | විමාන වස්තුව | 89-90 |
| 32. ලතා | විමාන වස්තුව | 90-93 |
| 33. ගුත්තිල | විමාන වස්තුව | 93-103 |
| 34. දද්දල්ල | විමාන වස්තුව | 103-104 |
| 35. සේසවතී | විමාන වස්තුව | 104-108 |
| 36. මල්ලිකා | විමාන වස්තුව | 109-110 |
| 37. විසාලක්ඛි | විමාන වස්තුව | 111-112 |
| 38. පරිච්ඡත්තක | විමාන වස්තුව | 113-115 |

මඤ්ජෙට්ඨක වග්ගය

| | | |
|---|---|---|
| 39. මඤ්ජෙට්ඨක | විමාන වස්තුව | 115-117 |
| 40. පභස්සර | විමාන වස්තුව | 117-119 |
| 41. නාග | විමාන වස්තුව | 119-120 |
| 42. අලෝම | විමාන වස්තුව | 121-122 |
| 43. කඤ්ජිකදායිකා | විමාන වස්තුව | 122-124 |
| 44. විහාර | විමාන වස්තුව | 125-129 |
| 45. පීත | විමාන වස්තුව | 129-132 |
| 46. චතුරිත්ථි | විමාන වස්තුව | 132-133 |
| 47. අම්බ | විමාන වස්තුව | 133-135 |
| 48. රජ්ජුමාලා | විමාන වස්තුව | 135-140 |
| 49. උච්ඡු | විමාන වස්තුව | 141 |
| 50. වන්දන | විමාන වස්තුව | 141-142 |

මහාරථ වග්ගය

| | | |
|---|---|---|
| 51. මණ්ඩූක දිව්‍යපුත්‍ර | විමාන වස්තුව | 142-145 |
| 52. රේවතී | විමාන වස්තුව | 145-155 |
| 53. ඡත්තමානවක | විමාන වස්තුව | 155-156 |
| 54. කක්කටක රසදායක | විමාන වස්තුව | 156-158 |
| 55. ද්වාරපාලක | විමාන වස්තුව | 159-160 |
| 56. කරණීය | විමාන වස්තුව | 161 |
| 57. දුතිය කරණීය | විමාන වස්තුව | 161-163 |

| | | |
|---|---|---|
| 58. සුචි | විමාන වස්තුව | 163 |
| 59. දුතීය සුචී | විමාන වස්තුව | 163 |
| 60. නාග | විමාන වස්තුව | 163-166 |
| 61. දුතිය නාග | විමාන වස්තුව | 166-167 |
| 62. තතීය නාග | විමාන වස්තුව | 167-170 |
| 63. චූළරථ | විමාන වස්තුව | 171-181 |
| 64. මහාරථ | විමාන වස්තුව | 182-186 |
| **පායාසි වර්ගය** | | |
| 65. අගාරිය | විමාන වස්තුව | 186-188 |
| 66. දුතිය අගාරිය | විමාන වස්තුව | 188 |
| 67. ඵලදායක | විමාන වස්තුව | 188-190 |
| 68. උපස්සයදායක | විමාන වස්තුව | 191-193 |
| 69. දුතීය උපස්සයදායක | විමාන වස්තුව | 193 |
| 70. භික්ඛාදායක | විමාන වස්තුව | 193-194 |
| 71. යවපාලක | විමාන වසතුව | 195 |
| 72. කුණ්ඩලී | විමාන වස්තුව | 195-197 |
| 73. දුතීය කුණ්ඩලී | විමාන වස්තුව | 197 |
| 74. උත්තර | විමාන වසතුව | 197-209 |
| **සුනික්ඛිත්ත වර්ගය** | | |
| 75. චිත්තලතා | විමාන වස්තුව | 209-210 |
| 76. නන්දන | විමාන වස්තුව | 210 |
| 77. මණිථූණ | විමාන වසතුව | 210 |
| 78. සුවණ්ණ | විමාන වස්තුව | 211-213 |
| 79. අම්බ | විමාන වස්තුව | 213-215 |
| 80. ගොපාල | විමාන වසතුව | 215-219 |
| 81. කන්ථක | විමාන වස්තුව | 219-223 |
| 82. අනේකවණ්ණ | විමාන වස්තුව | 223-225 |
| 83. මට්ටකුණ්ඩලී | විමාන වසතුව | 225-227 |
| 84. සෙරීස්සක | විමාන වස්තුව | 227-236 |
| 85. සුනික්ඛිත්ත | විමාන වසතුව | 236-238 |
| ශාසනෝපකාර | සංග්‍රහ වසතුව | 239-247 |

සිංහල

# විමාන වස්තු ප්‍රකරණය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## ප්‍රාරම්භය.

**මහාකාරුණිකං නාථං ඥෙය්‍යසාගර පාරගුං.**
**වන්‍දෙ නිපුණ ගම්භීරං විචිත්‍ර නයදෙසනං.**

යනුහෙයින් මේ විමානවස්තු ප්‍රකරණය කරන්නා වූ මහා විහාර වාසීවූ ත්‍රිපිටකධාරී ධර්‍මපාල නම් මහා ස්ථවිරයන් විසින් ප්‍රකරණාරම්භයට පළමුව ඉෂ්ටදෙවතා නමස්කාර වශයෙන් භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධසර්‍වඥ රාජොත්තමයාණන් වහන්සේගේ ශ්‍රී පාද ද්වන්‍දයට නමස්කාර පිණිස,

"ප්‍රස්තාරො නෂ්ටමුද්දිෂ්ට
මෙකද්ව්‍යාදි ලගක්‍රියා,
සඞ්ඛ්‍යාන මධ්වයොගශ්ච
ෂඩෙ තෙ ප්‍රත්‍යයාඃ ස්මෘතාඃ"

යනු හෙයින් ප්‍රස්තාර ප්‍රත්‍යය නෂ්ටය උද්දිෂ්ටය එකද්ව්‍යාදී ලග ක්‍රියාවය වෘත්ත සංඛ්‍යා අධ්වයොගය යන ෂඩ්විධ ප්‍රත්‍යයකින් ව්‍යාප්ත ඡන්‍දෙලක්ෂණය සකල ශාස්ත්‍රයෙහි අන්තර්ගත හෙයින් මෙහිද විස්තාරායාමයෙන් තුන්දස් අටසිය සතලිස් අඟුලක් පමණ භූමි ප්‍රදෙශයෙක්හි ප්‍රස්තාර කටයුතු වූ සර්‍වගුරු වෘත්ත එකකින් හා එකක් ලඝු සතක් ගුරුවෘත්ත අටකින් හා දෙකක් ලඝු සයක් ගුරුවෘත්ත විසි අටකින් හා තුනක් ලඝු පසක් ගුරුවෘත්ත පනස් සයකින් හා සතරක් ලඝු සතරක් ගුරු වෘත්ත සැත්තෑවකින් හා පසක් ලඝු තුනක් ගුරු වෘත්ත පනස් සයකින් හා සයක් ලඝු දෙකක් ගුරු වෘත්ත විසි අටකින් හා ප්‍රස්තාර කොටිප්‍රාප්ත තැන් දක්නා සර්‍ව ලඝු වෘත්ත එකක් ඇතුළුව දෙසිය පනස් සයක් පමණ වෘත්ත සංඛ්‍යාවක් ඇත්තාවූ "උක්තාය අත්‍යුක්තාය" යනාදීන් දක්වන ලද එකාක්ෂරයෙහි පටන් සවිසිවන අක්ෂරය දක්වා සවිස්සක් පමණ ඡන්‍දස් අතුරෙන් අනුෂ්ටුබ් නම් ඡන්‍දසෙහි සවිසිවන තැනින් පළමුවන විෂම පාදය හා එකුනානුවන තැනින් දෙවන සමපාදය හා

එකුන් තිස්වන තැනින් තුන්වන විෂම පාදය හා දෙයානුවන තැනින් සතරවන සමපාදය හා සතරසථාන යෙකින් පාද සතර උගුළුවාගෙන "සමෙසු සිනධුතො ජෙන පථ්‍යා වත්තං පකිත්තිතං"යි. යනුහෙයින් සම පාද යුගලයෙහි සතර වර්ණයෙකින් පරව ජගණයක් කරනකොට ගෙන පථ්‍යාවක්ත්‍ර නම් වූ අර්ධසම වෘත්තයට නගායගණ සගණ වය ගුරු වයකින් පළමුවන පාදය හා ආද්‍යනතගුරු දෙකක් හා ජගණවයකින් දෙවන පාදය හා තගණ සගණ වය ගුරු වයකින් තුන්වන පාදය හා ආද්‍යනත ලඝු ගුරුවය හා භගණ ජගණ වයකින් සතරවන පාදය හා පාද සතර සම්බනධිත වූ ගණ අටකින්ද අක්‍ෂර දෙතිසකින්ද මාත්‍රා එකුන් පණසකින්ද ගුරු සතළොසකින්ද ලඝු පසළොසකින්ද විශ්‍රාම සතරකින්ද වර්ගාක්‍ෂර එක්විස්සකින් ද අවර්ගාක්‍ෂර එකොළොසකින්ද අඝොෂාක්‍ෂර නවයකින්ද ඝොෂාක්‍ෂර තෙවිස්සකින්ද කණ්ඨජාක්‍ෂර සයකින්ද තාලූජාක්‍ෂර සතරකින්ද මූර්ධජාක්‍ෂර සයකින්ද දනතජාක්‍ෂර දසයකින්ද ඔෂ්ඨජාක්‍ෂර සතරකින්ද දනෙතාෂ්ඨජාක්‍ෂර දෙකකින්දැයි මෙසේ වර්ණ විශේෂයෙන් මිශ්‍රවූ විෂම පාද මාත්‍රා විෂම වෘත්ත විෂම ගුරු විෂම ලඝු විෂම පාද සතරක් සමබනධ කොට කියනලද මේ ගාථාවෙහි අභිප්‍රාය නම්: සකල සත්වයන් කෙරෙහි පතළ මහා කරුණා ඇත්තාවූ වෛනෙය ජනයන් කෙරෙහි කළ කරුණාවෙන් දිවකුරු බුදුන් සමයෙහි අතටපත් නිවන් හැර භවදුර්ගයට වැද සමතිස් පැරුම් දම් පුරා බුදුව සකලඥෙය සාගරයාගේ පරතෙරට පැමිණියාවූ නානා නය නිපුණ ගම්භීර විචිත්‍ර දෙශනා ඇති සර්වලොකෛකනාථ වූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ නමස්කාර කෙරෙමි කියා සර්වජන හෘදයානන්ද කරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට කරන ලද නමස්කාර ඇතිව සකල ර්‍ථපවාසීන්ට වැඩ පිණිස ගම්භීර වූ ගාථා පදාර්‍ථයන්ට අටුවා හා ඒ ඒ වස්තූන්ට නිදනාදී වශයෙන් විස්තර කොට අර්‍ථ වර්ණනා කළසේක. එබැවින් මේ විමානවස්තු ප්‍රකරණය සිංහල භාෂාවෙන් ප්‍රකාශකරන්නාවූ අප විසිනුදු පූර්වාචාර්‍යවර යන්ගේ වචනානුකූලව "නිත්‍යෙන පූරණාර්‍ථ මර්ථනපදෙදහ" හරණ මධ්‍යාහාරඃ"යි යනුහෙයින් අධ්‍යාහාර වශයෙන්ද ක්‍රියාව විසින් කර්තෘ කර්ම දෙක ප්‍රකාශ කරන හෙයින්ද මේ ගාථාවෙහි "විචිත්‍රනය දෙසනං" යන පදයෙහි දෙශනා ක්‍රියාවට කර්තෘ බැවින් "විචිත්‍රනය දෙසනා එතස්ස" යන්නෙන් බුඬරත්නයට එම දේශනා ක්‍රියාවට සුදුසුකර්ම වශයෙන් ධර්මරත්නයද ඒ ධර්ම දෙශනාව මස්තකයෙන් පිළිගෙන එහි වූ පරිද්දෙන් පිළිපැදීමට නිසි කෙනෙකුන් නැතිව දෙශනා ව නොපවත්නා බැවින් එම දෙශනා ක්‍රියාවට නිමිත්ත වූ සඞ්ඝ රත්නයද යන මේ ත්‍රිවිධ රත්නය ම

මේ පදත්‍රීයෙහි සඞගෘහිත බැවින් පුරාතන මහොත්තමයන් කී එක ගාථාවෙහි අන්තිම පදත්‍රීයෙන් ත්‍රිවිධ රත්නයට නමස්කාර පිණිස,

සකල ජනහිතො යො පාණිලෙනං විහාය
සිවම්ව භවමනත්වා ලොකසන්තාරෙහෙතු,
අතුලවිභවවාගො පාරමී පූරිතො තං
සුගතමහහිවන්දෙ අගගසම්බොධිපත්තො.

සියලු සත්වයන්ට වැඩ කැමැත්තා වූ එම කරුණාවෙන් අතට පත් නිවන් හැර ලෝවැසියන් සසර සයුරෙන් එතර කීරිම හෙතුකොට ගෙන සංසාර සාගරය නිර්වාණය සේ සිතා සංසාරයට පැමිණ අවශේෂ සත්වයන් විසින් නොකොට හැකි බැවින් අසදෘශ මහත් වර ධන පරිත්‍යාග ඇතිව යම් වීර්‍ය්‍ය පුරුෂොත්තම කෙනෙක් සමත්‍රිංශත් පාරමී ධර්‍මයන් පිරූසේක්ද එයින් අග්‍රවූ සම්‍යක් සම්බුඬත්වයට පැමිණියේ ද ඒ සකලඥෙය සාගරපාරගත විසිතුරු දෙශනා ඇති සර්‍වඥ රාජොත්තමයාණන් වහන්සේගේ ශ්‍රී පාදවන්දයට නමස්කාර කෙරෙමි,

සොමෙන සීතලගුණෙන පහඬකරෙන
තෙජෙන දෙසිත මහා මුනිනා පණීතං,
ධම්මඤ්ච තස්ස මුනිනො සුත පුඤ්ඤඛෙත්තං
වන්දාමි සඞ්ඝ පවරං අමලං විසුද්ධං.

සිහිල් ගුණයෙන් චන්‍ද්‍රයා වැනි වූ තෙජො ගුණයෙන් සූර්‍ය්‍ය යා වැනි වූ මහර්ෂි වූ බුදුන් විසින් දෙසන ලද උත්තම වූ ධර්‍ම රත්නයට ද ඒ බුදුන්ගේ ඖරසපුත්‍ර වූ මනා පින්කෙත් වූ කෙලශ මල රහිත වූ එසෙයින් ම පිරිසිදුවූ උතුම් සංඝරත්නයට ද නමස්කාර කෙරෙමි.

එවං ගුණගග රතනත්තය මත්ථකෙන
වන්දිත්ව තස්ස රතනත්තයතෙජසා මෙ,
හුත්වා හතන්තරුපසගග අනාමයො හං
වක්ඛාමි සීහළගතෙන විමානවත්ථුං.

ගුණයෙන් අග්‍ර වූ ත්‍රිවිධ රත්නයට මෙසේ නමස්කාර කොට එයින් ජනිත වූ ඉෂ්ටවිපාකයෙන් ද ඒ ත්‍රිවිධරත්නයාගේ තෙජ සින්ද නසනලද සර්‍වාන්තරායොපද්‍රව ඇති මාගේ උවදුරු නැසූ බැවින් සර්‍වප්‍රකාරයෙන් නිරොගිව මේ විමාන වස්තු ප්‍රකරණය හෙළබසින් සංක්‍ෂෙපයෙන් කියමි. මේ විමාන වස්තු දෙශනාව වනාහි මහා සමුද්‍රයසේ ගම්භීර වූ දෙශනා ඇත්තේය. ඒ කෙසේවූ දෙශනාවෙක්ද යත්? ගංගා යමුනාදී නොයෙක් ගංගා ජලප්‍රවාහය යම් සේ ඒ ඒ ගඟදිය පමණින් අනුක්‍රමයෙන් ගැඹුරු

ගැඹුරුව ගොස් මහා සමුද්‍රයට පැමිණ අති ගම්භීරව ගොස් කිසිවක් හටත් අවිෂයව සිටී ද එමෙන් මේ ධර්මදෙශනාවද ඒ ඒ දෙවතාවන්ගේද නුවණ පමණින් ප්‍රකාශකොට කියනලද දෙවභාෂිත හා අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක භාෂිත හා එක්ව ගැඹුරු ගැඹුරුව ගොස් තුන්ලෝවාසී කිසිකෙනෙකුන්ටත් අවිෂය වූ අති ගම්භිර වූ සර්වඥ භාෂිතයට පැමිණ අති ගම්භිර දෙනාත්ථය පෙරළා එළුවට නගා අර්ථ වර්ණනා කෙරෙමියි සිතී නම් සිදුහතු කරඬුවක් ගෙන මුහුදුදිය ඉස්නට උත්සාහ කරන්නාක් වැන්න. තණ දණ්ඩක් ගෙන පොළොව පෙරළන්නට උත්සාහ කරන්නාක් වැන්න, එතකුදු වුවත් මහත් වූ මැණික් ආකරයක් දැක ඒ මැණික් ආකරය සැම නිමවාගත නොහැකි වුවත් එක මැණිකක් පමණවත් කෙනෙකුන්ට සිතූ සිතූ සම්පත් පහළවන හෙයින් වැඩක් ම විනා අවැඩක් නැත්තා සේ මේ ධර්මදෙශනාවද විස්තර වශයෙන් ප්‍රකාශකොට ළිය නොහැක්කේවී නමුත් එක ගාථා පදයකින් වත් බණ කීවන්ටත්බණ ඇසුවන්ටත් නිවන් සම්පත් අවසන්කොට ඓහලෞකික පාරලෞකිකාභිවෘද්ධි වර්ධනයට හෙතුවන්නේය. එසේ හෙයින් හෙළු බස පමණක් දන්නා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්ට වැඩ පිණිසත් පූර්වාචාරිවරයන් ගිය මගින් ආත්මාර්ථ පරාර්ථ වශයෙන් ස්වර්ග මොක්ෂ සම්පත් සාධාගත මැනවැයි සිතා මේ විමාන වස්තු ප්‍රකරණය හෙළු බසට නගා සංක්ෂෙපයෙන් වර්ණනා කෙරෙමි. එහෙයින් මේ ධර්මය ලඝුකොට නොසිතා අන්‍ය විහිත නොව එකඟ වූ සිතින් බණ අසා ස්වර්ග මොක්ෂ සම්පත් ලබන්ට උත්සාහ කටයුතු.

එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු-

විශේෂයෙන්ම දෙවතාවන්ගේ ක්‍රීඩාවට නිවාසස්ථාන වූ ඒ ඒ දෙවතාවන්ගේ ම සුචරිත කර්මයෙන් උපන්නා වූ යොදුන් දෙයොදුන් ආදී ප්‍රමාණ විශේෂයෙන් නානා රත්නයෙන් විරාජමාන වූ විසිතුරු විමාන වර්ණනා සණ්ඨානාදී ශොභාතිසය සම්පත්තියෙන් යුක්ත හෙයින් විශේෂ නාමයෙන්ද, "පීඨන්තෙ සොවණ්ණං මයං උළාරං" යනාදී වූ අනෙකනය දෙශනා වශයෙන් පවත්වන ලද ඒ ඒ දෙවතාවන්ගේ රූපභොග පරිවාරාදී සම්පත් ඉපදීමට නිසි කුශලකර්මය නිසා මේ දෙශනාවගේ පැවැත්වීම හෙයින්ද කර්මවිපාකයට ප්‍රධාන හෙයින්ද විමාන වස්තු නම් වූ මේ දෙශනාව වනාහි පුච්ඡාගාථා විස්සජ්ජනා ගාථා යයි ද්විප්‍රකාර වන්නාහ. එහි විස්සජ්ජන ගාථා ඒ ඒ දෙවතාවන් විසින් ගිය දවස

කරන ලද කුසල් ප්‍රකාශකොට කියනලද්දහ. පුවඡාගාථා වනාහි බුදුන් විසින්ද ශක්‍රාදීන් විසින් ද මහා ශ්‍රාවකයන් විසින්ද කියන ලද්දහ. තවද ඩිතීය ශ්‍රාවක වූ මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් දෙව්ලොව ට වැඩ ඒ ඒ දෙවතාවන් විසින් යටගිය දවස කරනලද කුශල කර්‍මයත් එයින් ලත් සිරිසැපත් විචාරා නැවත බුදුන්ට දන්වා බොහෝ සේම ප්‍රකාශකරවූසේක. හේ කෙසේද යත්? ජනකුමුද විකාසන සරදිඳු සන්නිභවූ සර්‍වඥ රාජොත්තමයාණන් වහන්සේ මේ මහා භද්‍රකල්පයට විසි අසංඛ්‍ය කප්ලක්‍ෂයකින් යට මනොප්‍රණිධානයට පළමුවන නන්‍ද නම් අසඞ්ඛ්‍යයෙහි පහළ වූ බ්‍රහ්මදෙව නම් බුදුන් සමයෙහි කාරකණ්ඩක නම් නුවර අතිදෙව නම් රජ ව බුදුන් දැක හට ගත්තාවූ ප්‍රීතියෙන් මත්ව මතු මහල්තලයෙන් බිමට බැස පැන පෙති දහසක් ඇතිව රථ සකක් සා පියුමක් පැන නැගි පා පියුම් පිළිගත් කල සුවසේ බුදුන් කරා එළඹැ විසිතුරු මහ පියුම් තුණක් හා සමග නොයෙක් රත්නයෙන් පූජාකොට පසඟ පිහිටුවා වැඳ ලොවුතුරා බුදුවෙම්වයි සිතින් පතා එතැන් පටන් මනොප්‍රණි ධානය පිරීමෙන් සතාසඞ්ඛ්‍යය ඇතුළත ලොව පහළ වූ එක්ලක්‍ෂ පස්විසි දහසක් සර්‍වඥයන් දැක මනොප්‍රණිධාන ය මස්‍තකප්‍රාප්ත කළ සේක. එයින් වදළහ.

"තෙසු සත්තඅසඞ්ඛෙය්‍යසු ජාතා ලොකෙක නායකා.
පඤ්චවීසසහස්‍සා ච ලක්ඛමෙකං භවෙකතො.
එත්තකානං මහෙසීනං මනසා පත්‍ථිතෙ තද
දනෙන මෙ සමො නත්‍ථි එසා මෙදනපාරමී"ති.

ඉක්බිති මේ කල්‍පයට තෙළසාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයකින් යට වාග් ප්‍රණිධානයට පළමුවන සර්‍වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි ධඤ්ඤවති නම් නුවර සාගර නම් සක්විති රජ ව රත්සඳුන් හරින් ප්‍රාසාද ලක්‍ෂයක් කරවා පූරාණ ගෞතම නම් බුදුන්ට පිළිගන්වා ස්‍වාමීනි නුඹවහන්සේ මෙන් ශාක්‍ය රාජවංශයෙහි ඉපිද ගෞතම නම් බුදුව සූවිසි අසංඛ්‍යයක් සත්‍වයන් සසරින් මුදවම්වයි කියා වාක් ප්‍රභෙද ප්‍රාර්‍ථනාව කොට එතැන් පටන් නවාසංඛ්‍යය ඇතුළත පහළ වූ තුන්ලක්‍ෂ සතාසූදහසක් බුදුන් දැක මහදන් පවත්වා වාග්ප්‍රභෙද ප්‍රාර්‍ථනාව මස්‍තකප්‍රාප්ත කළ සේක. එයින් වදළහ.

"තෙසු නව අසංඛෙසු ජාතා ලොකෙක නායකා,
තිංසසතසහස්‍සානි සත්තා සීතිසහස්‍ස ච.
එත්තකානං මහෙසීනං වචසා පත්‍ථිතෙ තද,
දනෙන මෙ සමො නත්‍ථි එසා මෙ දනපාරමී"ති.

මෙසේ මනොවාග් ප්‍රණිධානය පිරීමෙන් සොළසාසංඛ්‍යය ඇතුළත පහළ වූ පස්ලක්‍ෂ දෙළොස් දහසක් බුදුවරයන්ට මහ දන් පවත්වා පූරණ ලද මනොවාග් පෙරුම් ඇති මහා බෝසතානෝ මේ කල්පයට සාරසංඛ්‍ය කප් ලක්‍ෂයකින් යට සාරමණ්ඩ නම් කප දීපඞ්කර බුදුන් සමයෙහි සුමෙධ තාපස ව නියත විවරණ ලදින් එතැන් පටන් සාරා සංඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලේහි සමත්‍රිංසත්පාරමී ධර්‍මයන් පිරීමෙන් සූවිසි බුදුකෙනෙකුන් දැක සූවිසි පූජාවක් කොට සූවිසි විවරණත් ලදින් කෙළවර වෙස්සන් තර ව උපන් ජාතියෙන් තුසිපුර පැමිණ දෙව් බඹුන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත්පුර ඉපිද වැඩිවිය පැමිණ සක්විති රාජ්‍යය හැර පැවිදි වැ බොධිපර්‍ය්‍යඞ්කාරූඪ ව ලොවුතුරා බුදුව දම්සක් පවත්වා වෙළුවන නිග්‍රොධාරාම ජෙතවනාදී නොයෙක් විහාර පිළිගෙන සූවිසි අසංඛ්‍යයක් සත්‍වයන් භවකාන්තාර යෙන් එතර කරවන සේක. එසමයෙහි මුළු දඹදිව එක මගුල් ගෙයක් මෙන් ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදී අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝයා වහන්සේ විසින් අලඞ්කෘත විය. ඒ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ වනාහි මේ මහා භද්‍රකල්පයට එකාසංඛ්‍ය කප්ලක්‍ෂයකින් යට අනොමදස්සී නම් බුදුන් සමයෙහි සැරියුත් සාමින් සරද නම් තාපස ව ආශ්‍රමයට වැඩි බුදුන් දැක වන මුල් පලාහාර වළඳවා සතර ගවුවක් උස මලස්නේ බුදුන් වඩා හිඳුවා තුන්ගවු උස මලසුන්වල අගසවු දෙදෙනා වඩා හිඳුවා ගවු දෙගවු උස මල සුන්වල සෙසු ලක්‍ෂයක් රහතුන් වඩා හිඳුවා බුදුන් සිරසට මල් කුඩයක් මවා ඒ කුඩය අතින් අල්වාගෙන සත්දවසක් නිරාහාරයෙන් බුඩාලම්බන ප්‍රීතින් සිට ධ්‍යාන සුවයෙන් වැඩ හුන් බුදුන් ට මෙසේ පූජාකොට බුදුකෙනෙකුන්ට අග්‍රශ්‍රාවක වෙම්වයි ප්‍රාර්‍ථනා කළ සේක. එ සමයෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ සරද තාපසයන්ගේ ගිහි යහළු වූ සිරිවඩ්ඪක නම් සිටුහු මෙපවත් අසා යහළුවාණන් කළ ප්‍රාර්‍ථනාව මමත් කෙරෙමි සිතා නිළුපුල් මණ්ඩපයක් නිමවා බුදුන් ප්‍රධාන වූ එක්ලක්‍ෂ සූසැත්තෑ දහසක් රහතුන් පවරා සත්දවසක් දන්දී බුදුකෙනෙකුන්ට ද්විතීය ශ්‍රාවක වෙම්වයි ප්‍රාර්‍ථනා කළසේක.

මෙසේ දෙදෙනා එක්ව කළ කුශලයෙන් එකාසංඛ්‍ය කප්ලක්‍ෂයක් ඔවුනොවුන් මිත්‍ර ධර්‍මය රක්‍ෂාකොට අප බුදුන් සමයෙහි බමුණු මහසල් කුලයෙහි ඉපිද දෙවුකුමරුවන්සේ වැඩිවිය පැමිණ නොයෙක් සම්පත් හැර බුදුන් කරා එළඹැ පැවිදිව උප සම්පද හා අගතනතුරු ලදින් සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ යි හිරු සඳු සේ ප්‍රසිඩ වූහ. ඒ අගසවු දෙදෙනා අතුරෙන් ෂට් අභිඥ හා සිවුපිළිසිඹියා පත්

රහත් ගුණයෙන් හා සියලු ශ්‍රාවක ඥනයාගේ මස්තකප්‍රාප්ත ඍද්ධිමතුන් කෙරෙහි අගතැන් පත් විතිය ශ්‍රාවක වූ මුගලන් මහ තෙරුන් වහන්සේ එක් දවසක් සකල සත්වයන් කෙරෙහි පතළ කරුණා ඇතිව සිහිනුවණින් යෙදී රහොගත ව ධ්‍යාන සුවයෙන් වැඩහුන් සේක. එසේ වැඩහුන්නා වූ ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේට මේ බඳු සිතෙක් පහළවිය. හේ කෙසේද යත්? දෙව්ලොව දෙවතාවෝ මිනිස් ලොවදී තම තමන්ගේ ශක්ති වූ පරිද්දෙන් පහන් සිත් ඇති වැ දනාදී කුසල් කොට දිව්‍ය ලොකයෙහි ඉපිද උදර වූ සම්පත් අනුභව කරණ පරිදි සියලු මනුෂ්‍යයෝ විශේෂයෙන්ම දන්නාහු වී නම් බොහෝ සේ කුසල්කොට ස්වර්ග මොක්ෂ සම්පත් සාදගනිත්මය. එසේ හෙයින් දෙවචාරිකාවෙන් දෙව්ලොවට ගොස් කර්මානුරූපවූ පරිද්දෙන් උදර සම්පත් අනුභවකරන දෙවතාවන් අතින් කර්මඵල විචාරා ඔවුනොවුන් ලවා කුසල් ප්‍රකාශ කරවා ඒ දෙවතාවන් සාක්ෂිකොටගෙන බුදුන්ට දැන්වූයේ වී නම් බුදුහු අකාශතලයෙන් පූර්ණචන්ද්‍රයා නහා දක්වන්නාසේ මනුෂ්‍යයන්ට කර්මඵල ප්‍රත්‍යක්ෂකොට බණ වදරණසේක. ඒ කල්හි ස්වල්ප මාත්‍ර වූ කුශල කර්මය පවා ශ්‍රද්ධා සමාධියෙන් හා චිත්ත ප්‍රසාද සම්පත්තියෙන්ද ක්ෂෙත්‍රශුද්ධියෙන් ද උදරතර වූ මහත් ඵල මහානිසංසවෙන පරිදි හඟවා ප්‍රකාශකෙරෙමින් ඒ ඒ විමාන වස්තු අත්පේත්පත්තිකොට මහත් ධර්මදෙශනා පවත්වන්නාහ. ඒ ධර්මදෙශනා තොමෝ දිව්‍ය මනුෂ්‍යයන් සහිත බොහෝ සත්වයන්ට වැඩ පිණිස වන්නීයයි සිතා වදරා මුගලන් මහ තෙරහු ශ්‍රී යහන් මස්තකයෙන් නැගී සිට සන්ධ්‍යාවලාවක් අඳුන් කුළවට දිවන්නා සේ දෙපට හඳනා සිවුරු වැළඳ ඉඳුනිල් මිණි කුළක් ස්වර්ණකම්බලයකින් වසන්නාසේ උත්තරාසංගය එකාංශ කෙරෙමින් මනාකොට හැඳ පොරවා හාත්පසින් ජාතිහිඟුල් රස ධාරා විසුරුවන්නාක් මෙන් ද සන්ධ්‍යාවලා හා විදුලි වැළඳ ගමන් ගත් අඤ්ජනකූට පර්වතයක් සේ බුදුන් කරා එළඹැ නමස්කාරකොට එකත්පස් ව හිඳ තමන්ගේ අභිප්‍රාය බුදුන්ට දන්වා අවසර ගෙන හුනස්නෙන් නැගී බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට ඉක්බිති අභිඥපාදක චතුර්ථධ්‍යානයට සමැවද සමාපත්තීන් නැගි ඍද්ධිබලයෙන් එකෙණෙහිම තවුතිසා භවනයට පැමිණ ඒ ඒ දෙවතාවන් විසින් රැස්කරන ලද කුශලකර්ම ඵල විචාරා දෙවතාවන් ඔවුනොවුන් කළ සුචරිත ධර්මයන් ප්‍රකාශකළ කල්හි මිනිස් ලොවට අවුත් පුච්ඡා විස්සජ්ජනා දෙක එක්කොට සියලුම පවත් බුදුන්ට දන්වන සේක. බුදුහු එම අත්පේත්පත්ති කොටගෙන

භික්ෂූන්ට හා සම්ප්‍රාප්ත පිරිසට විස්තර වශයෙන් බණ වදරණ සේක. ශක්‍රාදීන් විසිනුදු එසේම විචාරා පැන විසඳුන් එක්කොට තෙරිඳුන්ට දැන්වූ කළ මහතෙරහු සුගත්හට දන්වා ප්‍රකාශකර වන සේක. මෙම ක්‍රමයෙන් මුගලන් මහතෙරහු සත්ව කරුණාවෙන් බොහෝ සේ විමන්වත් ප්‍රකාශකරවූ සේක. බුදුන් පිරිනිවි කල මහා කාශ්‍යපාදී මහා ස්ථවිරයන් විසින් විනය සූත්‍රාභිධර්ම සංඛ්‍යාත වූ ත්‍රිපිටක ධර්මය සංගායනා කරණ කල්හි ධර්ම භාණ්ඩාගාරික ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ජේතවන වේළුවනාදී ඒ ඒ තන්හි ප්‍රකාශ වූ නොයෙක් විමාන වස්තූන් එක්කොට විමාන වස්තු යයි කියා සංග්‍රහයට නගා සූත්‍රපිටකයෙහි කුදුගත් සඟියට අන්තර්ගත කොට ගාථාඞ්ගයෙන් සංගායනාකර වදාළසේක. ඊට අනතුරුව මේ ලක්දිව මහා විහාරවාසී ධර්මපාල නම් මහා ස්ථවිරයන් විසින් මහා ශ්‍රාවකයන්ගේ අර්ථකථානුසාරයෙන් සකල ද්වීපවාසීන්ට වැඩ පිණිස ඒ ඒ වස්තූන්ට නිදානාදී විභාග විශේෂයෙන් අර්ථවර්ණනා කොට විමානවස්තුප්‍රකරණය කළ සේක. ඒ වනාහි වර්ග වශයෙන් පීඨවර්ගය. චිත්‍රලතා වර්ගය, පාරිච්ඡත්තක වර්ගය, මාඤ්ජෙෂ්ඨක වර්ගය, මහාරථ වර්ගය පායාසි වර්ගය, සුනික්ඛිත්ත වර්ගයයි යන මේ සප්ත මහා වර්ගයකින් ප්‍රතිමණ්ඩිත විය. එයින් පළමුවන පීඨවර්ගයෙහි සතළොසක් වස්තු කථාවෝ ය, දෙවන චිත්‍රලතා වර්ගයෙහි එකොළොසක් වසතු කථාවෝය, තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි දසයක් වස්තු කථාවෝය. පස්වන මහාරථ වර්ගයෙහි තුදුසක් වස්තුකථවෝය සවන පායාසි වර්ගයෙහි දසයක් වස්තුකථාවෝය. සත්වන සුනික්ඛිත්ත වර්ගයෙහි එකොළොසක් වස්තුකථාවෝය මේ සප්ත මහා වර්ගයෙහි සඞගෘහිත අතුරු විමානවස්තූන් හැර පසාසුවක්වසතුකථාවෝය, අතුරු විමන්වත් හා සමග එක්සිය විසිතුනක් වස්තුකථාවෝ ය, මේ මෙසේ එක්දහස් පන්සියයක් ගාථා වශයෙන් ප්‍රකාශකොට වදරණ ලද්ද වූ එක්සිය විසිතුනක් පමණ වස්තුකථාවන් අතුරෙන් පීඨවර්ගයෙහි පළමුවන **සවර්ණපීඨ වස්තුව** නම් කවරැ යත්?

## 1. සවර්ණ පීඨ විමාන වස්තුව.

එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු-

ත්‍රිභුවනෛක තිලක සකලජ්ඥෙය සාගරපාරගතාශෙෂ නෛක ගුණ රතන මන්දිරායමාන වූ සම්‍යක් සම්බුඩ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ සැවැත්නුවර ගොදුරුගම් කොට දෙව්රම් වෙහෙර

වැඩවසන සමයෙහි පසේනදි කොසොල් රජ්ජුරුවන් විසින් බුදුපාමොක් මහා සඞසයා වහන්සේට සත් දවසක් මුළුල්ලෙහි අසදෘශ මහා දනය දවසින් දවස වඩ වඩා පැවැත්වූ කල්හි අනේපිඬු මහ සිටාණන් හා විශාඛා මහ උපාසිකාවන් හා නුවර වාසීන් විසින් තුන් දවසක් මහදන් පැවැත්වූහ. මෙසේ රජ්ජුරුවන් හා මහජනයා විසින් අසදෘශ මහා දනයාගේ ප්‍රවෘත්තිය සියලු දඹදිව මුළුල්ලෙහි ප්‍රසිඬවිය. එකල්හි මහජනයෝ කියන්නාහු කරණ ලද මහත් උදරතර දන පරිත්‍යාගයෙන්ම එල මහත්වේද නොහොත් තමාගේ ශක්ති පමණින් කරණලද දන පරිත්‍යාගයෙනුත් එල මහත්වේදැයි යන මේ කථාව ඉපදවූහ. මේ වචනය ඒ ඒ තැන කියන්නා අසා භික්ෂූහු බුදුරජාණන් වහන්සේට දැන්වූහ. එකල දනයෙහි අනුසස් ප්‍රකාශකොට වදරණ බුදුරජාණන් වහන්සේ-

"න භික්ඛවෙ දෙය්‍යධම්ම සම්පත්තියා ව දනං මහප්ඵලතරං භවිස්සති අථඛො චිත්තප්පසාදසම්පත්තියා ඛෙත්තසම්පත්තියා ච තස්මා කුණ්ඩකමුට්ඨිමත්තම්පි පිලොතික මත්තම්පි තිණසත්ථාර පණ්ණ සත්ථාරමත්තම්පි පූතිමුත්තහරිටකමත්තම්පි විප්පසන්නෙන චෙතසා දක්ඛිණෙය්‍ය පුග්ගලෙ පතිට්ඨාපිතං මහප්ඵලතරං භවිස්සති මහාජුතිකං මහාවිප්ඵාරං"ති.

මහණෙනි දෙය්‍යධර්ම සම්පත්තියෙන් ම එල මහත් වන්නේ නොවෙයි. චිත්තප්‍රසාද සම්පත්තියෙන් ද ක්ෂෙත්‍ර සම්පත්තියෙන් ද එල මහත්වෙයි. එසේ හෙයින් කුඩු මිටක් පමණවත් කල්ගිය රෙදි කඩක් පමණවත් තෘණ සත්ථාර පර්ණ සත්ථාර මාත්‍රයක් වත් ගොමුත්‍ර අරළුවක් පමණවත් යම්කිසි කෙනෙකුන් විසින් පහන්සිත් ඇතිව දක්ෂිණාර්හයන් කෙරෙහි පිහිටුවා දෙන ලද්දේවි නම් මහත් එල මහානිසංස වෙයි, මහාජුතික වෙයි, මහා විප්ඵාර වෙයි, හෙවත් ආයුබල වර්ණාදි වූ මහත් විසාරද වූ සම්පත්තියෙන් ජොතිමත් ව බබලන්නේ යයි වදළ සේක. එකල්හි මේ ධර්ම කථා ප්‍රවෘත්තිය සකල ජම්බුවීපය මුළුල්ලේහි පතළ විය එසමයෙහි මනුෂ්‍යයෝ යථානුරූප වූ පින් සඳහා මහණ බමුණන්ට හා නොයෙක් දුගී මගී යාචකයන්ට දන් දෙති. ගෙහාඩගණවල පැන් එලවා තබති, චාර කොෂ්ඨවල අසුන් පනවා තබති, එසමයෙහි එක්තරා පිණ්ඩපාතික තෙරකෙනෙකුන් වහන්සේ යහපත්කොට හැඳ පෙරව පාත්‍රය අතින් ගෙන ඉදිරි පසු නොබලා වියදඬු පමණින් බිමට නතුකරණ ලද ඇස් ඇතිව ඊර්‍ය්‍යාපථ සම්පන්නව සන්සුන් ලීලාවෙන් එක්තරා ගෙදෙරකට පැමිණිසේක. ඒ ගෘහයෙහි වසන්නා වූ ශ්‍රද්ධා සම්පන්න වූ එක්තරා කුල දියණියක් තෙරුන් වහන්සේ දැක බලවත්ව

හටගත්තාවූ ගෞරව බහුමාන ඇතිව උදර වූ ප්‍රීති සොම්නස් උපදවා පසග පිහිටුවා වැඳ තමන් හිදිනා පුටුව මත්තෙහි රන්වන් වස්ත්‍රයක් අතුට ආසනය පණවා දුන්නීය. තෙරුන් වහන්සේ පණවන ලද ආසනයෙහි වැඩහුන් කල්හි ඕතොමෝ මට මෙහි උතුම් වූ පින් කෙතක් පහළ වී යයි පහන් සිත් ඇතිව ශක්ති වූපරිද්දෙන් අහර පිළියෙළ කොට තෙරුන් වහන්සේට පිළිගන්වා විජනී පත්‍රයක් අතින් ගෙන පවන් පූජා කළාය. ඉක්බිති කරණලද අහරකිස ඇති තෙරුන් වහන්සේ ආසනදාන භොජන දනාදින් ප්‍රතිසංයුක්ත ධර්මකථාවෙන් බණ වදරා වැඩිසේක. ඒ ස්ත්‍රී තොමෝ ඇගේ දනය ද ධර්ම කථාව ද ප්‍රත්‍යවෙක්ෂා කරන්නී ප්‍රීතියෙන් පිරුණාවූ ශරීර ඇතිව ඒ පීඨය ද විහාරයටම දුන්නී ය. එයින් පසු නොබෝකලක් ගිය කල්හි එක්තරා රෝගයකින් පෙලෙන ලද්දී කාලක්‍රියා කොට ඒ කුශලානුභාවයෙන් තවුතිසා භවනයෙහි දෙළොස් යොදුන් රන් විමනෙක උපන්නීය පරිවාර ස්ත්‍රීහුද දහසක් පමණ වූහ.

තවද පීඨදනානුභාවයෙන් විමානයෙහි සතර ගවු පමණ ස්වර්ණ පයර්ඞ්කයෙක් පහළ විය. ඒ පයර්ඞ්කය වනාහි ආකාශ චාරිව සීඝ්‍ර වූ ජව ඇත්තේය. මත්තෙහි කූටාගාර ඇත්තේය. එසේ හෙයින් ඒ විමානය ද පීඨවිමාන නම් විය. පෙර තමන් පුටුව දෙන දවස පීත වර්ණවස්ත්‍රයක් අතුට දුන් හෙයින් කර්මශාදෘෂ්‍ය වශයෙන් කුශල විභාග කොට දක්වන්නාසේ ඒ පයර්ඞ්කය ද ස්වර්ණමය වූයේය. ප්‍රතිග්‍රාහකයන්ගේ ගුණ බලවත් හෙයින් ශීඝ්‍රවූ ජව ඇත්තේය. දක්ෂිණාර්හ පුද්ගලයාහට සිත් රුචි වශයෙන් දුන් හෙයින් යථා රුපි වූ ගමනින් හා ප්‍රසාද සම්පත්තියෙන්ද උදරතරව සර්වප්‍රකාරයෙන්ම ඒ දෙව් දුවගේ හා දුටු දුටුවන්සිත් සතුටු කරවන්නා වූ ප්‍රසාද වහනය වන්නා වූ ශොභාතිශය සම්පත්තියෙන් යුක්ත වූයේය. ලොභයෙන් දුරුවශ්‍රධා සමාධි ගුණයෙන් යෙදි දුන් හෙයින් ස්වර්ණ වර්ණ විය වෙෂයෙන් දුරුව ප්‍රඥ සමාධියෙන් යෙදී දුන් හෙයින් උදරතර විය. මොහයෙන් දුරුව දන් දෙමියි ව්‍යර්ථ උපදවා සමාධියෙන් දුන් හෙයින් මනොමය ජව ඇති ව මනාපස්ථානයකට උපගත වේ. මෙසේ ඒ දිව්‍යාඞ්ගනා තොමෝ මහත්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව කර්මානුරූප වූ පරිද්දෙන් මහත්වූ දිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කරන්නීය. එසමයෙහි දෙවියන්ගේ එක්තරා උත්සවදිනයෙක් දෙවතාවන් අතුරෙහි යම් දිව්‍යලීලාවෙක් දිව්‍යාලඞ්කාරයෙක් දිව්‍යානුභාවයෙක් ඇද්ද එබඳු දිව්‍ය ලීලාවෙන් දිව්‍යලඞ්කාරයෙන් දිව්‍යානුභාවයෙන් දිළිහි දිළිහී උයන් කෙළි පිණිස

නන්දනොද්‍යානයට යන කල ඒ දෙවතා දුව ද සුන්දරවූ දිව සළුවක් හැඳ එසෙයින්ම දිව සළුවක් එකාංශකොට දිව්‍යාභරණයෙන් සැරසී දහසක් දිව්‍යාප්සරාවන් පිරිවරා ස්වකීය දෙළොස් යොදුන් රන්විමනින් නික්ම පීඨවිමානාරූඪව මහත්වූ දිව්‍ය ඍඬියෙන් මහත්වූ දිව්‍ය සෞභාග්‍යයෙන් යුක්තව චන්ද්‍රයා මෙන් ද සහස්‍ර කිරණයාමෙන්ද හාත්පසින් එකොභාස කෙරෙමින් උයන් කෙළියට යන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකා වෙහි හැසිරෙන සේක් තවුතිසා භවනයට පැමිණ ඒ දෙවතා දුවට නුදුරු තෙනෙක්හි ඉඳුනිල් මිනි රුවනක් සේ පෙනි වදළසේක.

නැවත ඒ දෙවතා දු තොමෝ තෙරුන් වහන්සේ දැක උපන්නාවූ ප්‍රීති ප්‍රමොද්‍ය ඇතිව බලවත් සංඝ ගෞරවයෙන් වහාම පයඞ්ඪකයෙන් බැස තෙරුන් වහන්සේ කරා එළඹැ පසග පිහිටුවා දසනඛසමොධාන සමුජ්වලිත වූ අඤ්ජලිපුට මස්‍තකයෙහි තබා වැඳ එකත්පස්ව සිටියාය. තවද ඒ තෙරුන් වහන්සේ වනාහි ඒ දෙවතා දුව තබා සියලු දිව්‍යලොකයෙහි දෙවියන් හා අනන්‍ත සත්‍වයන් විසින් රැස්කරන ලද යම් කුශල කර්‍මයක් ඇද්ද ඒ සියළුම කුශලකර්‍මය තමන් වහන්සේගේ යථා කර්‍මොපගඥනානුභාවයෙන් අතට ගත් සිතුමිණි රුවණක් සේ බලා බල වශයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට දැන වදරණසේක. එතකුදු වුවත් දෙවතාවන්ගේ උත්පත්තිය හා සමග නොහොත් උත්පත්තියට අනතුරුව කොයින් චුතව මෙහි උපන්නෙම් ද කවර නම් කුශල කර්‍මයක් හෙතුකොට ගෙන මෙබඳු සම්පත්ති ප්‍රතිලාභයෙක් මට වූයේ දැයි අතීත භවයෙහි රැස්කරන ලද කුශල කර්‍මය බැලීම දෙවතාවන්ගේ ධර්‍මතාවක් ම හෙයින් බොහෝසේම සිඬවන්නේ ය. එසේ හෙයින් ඒ දෙවතා දුවට ද යම් කුශණයක් පහළවේද ඒ කාරණයෙන් ඒ දෙව්දුව ලවාම කුශල කර්‍මය ප්‍රකාශ කරවා දිව්‍ය මනුෂ්‍යයන් සහිත ලොකයාහට කර්‍මඵල ප්‍රත්‍යක්‍ෂ කරනු කැමතිව මහ තෙරුන් වහන්සේ-

"පීඨං තෙ සොවණ්ණමයං උළාරං
මනොජවං ගච්ඡති යෙන කාමං,
අලඞ්කතෙ මල්‍යධරෙ සුවත්‍ථෙ
ඔභාසසී විජ්ජුරිවබ්භකූටං"ති.

යනුහෙයින් එම්බා දෙවතා දුව තීගේ ඉච්ඡානුරූප වූ පරිද්දෙන් උයන් කෙළි ආදියට යෙමියි සිතු කෙණෙහිම සිතුලෙස පවත්නා හෙයින් මනොමය ජව ඇත්තාවූ යොදුනක් පමණ

මහත් උදරතර ශ්‍රේෂ්ඨ වූ සර්වණ පර්‍යඞ්කාකාර සටහන් ඇත්තා වූ කණක විමානයක් හා තවද අලඞ්කෘත වූ දිව්‍ය ශරීරයෙහි නානා ප්‍රකාර වූ රශ්මි ජාලාවෙන් බබලන්නාවූ අනෙකවිධ රත්නයෙන් විරාජමාන වූ හස්තූපග පාදූපගාදි වූ ප්‍රභෙද වශයෙන් සැටගැලක් පුරාලන පමණ සර්වාභරණයෙන් සැරහී කල්ප වෘක්ෂ පාරිච්ඡත්‍රක සන්තානලතා දි සමභව සුවිසුද්ධ චාමිකර විවිධ රත්නමය වූ පත්‍රකිඤ්ජල්ක කෙසරසමන්ත විජෙජාතමාන වූ විසඵුරන්ත කිරණනිකර රුචිර දිව්‍ය කුසුමයෙන් විභූසිත හෙයින් මාලාධාරී වූ කල්පලතා නිබ්බත්ත නානා වර්ණ විරාග විශේෂ සුපරිසුද්ධ භාසුර ප්‍රභාසම්පන්න දිව්‍ය වස්ත්‍රයන්ගේ වශයෙන් සුන්දර වූ දිව සළුවක් හැඳ එහෙයින්ම සුන්දරවූ දිවසළුවක් එකාංශකොට බබලන්නාවූ නොහොත් අඩ සඳක් වැනි වූ යහපත් නළල් තළයෙන් ද දෙව්දුනු දෙකක් වැනිවූ බැම සහලින්ද තිලපුෂ්පාකාර උස්වූ නාසිකාවෙන්ද බිම්බ ඵල සදෘශවරත්වූ ඔෂ්ඨයෙන්ද පූර්ණ චන්‍ද්‍රයා වැනිවූ මුහුණින්ද රන් කළයක කරක්වැනිවූ ග්‍රීවයෙන්ද ඇත් සොඬකට බඳු වූ බාහු යුගලයෙන්ද පියුම් පෙති වැනි වූ අතුල්තලයෙන්ද සර්වණඵලකයෙක්හි ඔබන ලද රන්බුබුල් දෙකක් වැනි පයෝධර යුගලයෙන් ද රන් පුවරුවක් වැනිවූ යහපත් පිටකින්ද වස්ත්‍රාභරණයෙන් බබලන සිහිනිභකින්ද රඹකඳක් සේ දික්ව වටවූ මහත් ඌරු යුගලයෙන්ද දුනුකේ කැකුළු වැනි කෙණ්ඩා සහලින්ද රන්මිරිවැඩි සහලක් වැනි වූ පතුල් යුගලයෙන්දැයි මෙසේ බබලන්නා වූ රූපශ්‍රීයකින් හා සන්ධ්‍යා කාලයෙහි සූර්‍ය්‍ය තාපයෙන් රැදී ගිය රත් වලාකුලක් යම් සේ සවභාවයෙන්ම බබලා ද එසේ ප්‍රකෘතියෙන්ම ජොතිමත්ව බබලන්නාවූ සන්ධ්‍යා වලාපටලය හාත්පසින් විදුලිය වැළඳ ගත් කල්හි විශේෂයෙන්ම බබලා ද එමෙන් සවභාවයෙන් ම බබලන්නා වූ පීඨ විමානය සර්වාලඞ්කාරයෙන් විභූෂිතව සර්වාකාරයෙන් දීප්තිමත්ව බබලන්නාවූ තීගේ ශරීර ප්‍රභාව හා වස්ත්‍රාභරණාදියෙන් ප්‍රභාමත් වෙයි. තවද චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ සක් රුවන යම් සේ චක්‍රවර්ති මහරජාණෝ "පවත්තතු භවං චක්කරතනං"යි කී කල සිතුලෙස අභිමුඛව අභිමතස්ථානයකට උපගත වේද එමෙන් දෙවතා දුව ද යම් තැනකට යෙම්යි සිතු කෙණෙහිම සඳු විමනක් සේ වායු වෙගයෙන් ආකාශයට පැන නගී මනාපසඨානයටකසම්ප්‍රාප්ත වේ මැයි මෙසේ පළමුකොට ඇගේ සම්පත් ප්‍රකාශ කොට වදරා නැවත ගිය දවස කළා වූ සුචරිත කර්මය විචාරා වදරණ මහ තෙරුන් වහන්සේ-

කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා"

පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං.
කෙනාසි එවං ජලිතානුභාවො වණ්ණොච තෙ සබ්බදිසා
පභාසතී" ති.

යනුහෙයින් එම්බා දෙවධීතෘව සඳුවිමනක් සේ ප්‍රභාමත්වූ පිය විමානයක් හා හාත්පසින් ජොතිමත්ව බබලන්නා වූ ශරීරවර්‍ණයක් හා පරිභොග කටයුතු වස්ත්‍රාභරණාදී මෙබඳු උපකරණයක් හා යම්කිසි ඌනත්‍වයක් නැත්තා වූ සිතූ සිතූවිට ප්‍රිය පරිභොග කටයුතු වූ මෙබඳු සම්පත්තියක් පෙර මිනිස් ලොවදි කෙබඳුවූ කුශලයක් කොට ලබන ලද්දිද කවර කාරණයකින් මෙබඳු වූ දිව්‍යානුභාවයෙන් හා පරිවාර සම්පත් වර්‍ණ සම්පත් ආදියෙන් ජොතිමත්ව බබලාද මම විචාරමි, මට නොවලහා කියවයි විචාරා වදාළ සේක. මෙසේ මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණ ලද ප්‍රශ්නය විසඳු පරිදි දක්වන්නා වූ සඞ්ගීති කාරක තෙරුන්වහන්සේලා විසින්-

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින් මුගලන් මහ තෙරුන් වහන්සේ විසින් විචාරණ ලද ඒ දෙවි දූ තොමෝ එක්තරා තෙර කෙනෙකුන්ට දුන්නාවූ ස්වල්ප දනයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි. සුචරිත කර්‍ම ඵල සිහිකිරීමෙන් ද බුදුන්ගේ වීතිය ශ්‍රාවක වූ ඍද්ධිමත් මුගලන් මහ තෙරුන් වහන්සේ විසින් මාගේ පුණ්‍යඵල ප්‍රතිසංයුක්ත වශයෙන් විචාරණලද්දේයයි දෙකාරණයෙන්ම හටගත්තවූ බලවත් ප්‍රීති සොම්නස් ඇතිව තෙරුන් වහන්සේගේ වචනයමුදුනෙන් පිළිගෙන කුශල ඵල ප්‍රකාශකොට දක්වන්නා වූ දෙවි දූ තොමෝ-

"අහං මනුස්සෙසු මනුස්සභූතා අබ්භාගතානං ආසනකං අදාසිං,
අභිවාදයිං අඤ්ජලිකං අකාසිං යථානුභාවඤ්ච අදාසි දානං,"

තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා.

අක්ඛාමිතෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී"ති.

යනු හෙයින් මිනිස් ලොව විශෙෂ හඟවා විද්‍යමාන වශයෙන් ම මනුෂ්‍යයන්ට අන්‍තගීතව උපන් බව හඟවන පිණිස මනුෂ්‍ය භූතයෙමිය කිව. එහි විශේෂ කවරයත්? මනුෂ්‍යනාරකීකය මනුෂ්‍ය ප්‍රෙතය මනුෂ්‍ය තියඞීගගතය පරමාත්‍ථ වශයෙන් මනුෂ්‍යයෝ යයි චතුර්විධ වන්නාහ. යම් මනුෂ්‍ය ජාතිකෙනෙක් දණ්‍ඩනිග්‍රහාදියට නිසිවූ ප්‍රණාතිපාතාදිවූ අකතීතව්‍යකොට ඒ ඒ තන්හි රාජාදින් විසින් පමුණුවන ලද හස්‍ත පාද ශිරශ්‍ඡෙදදිවධබන්‍ධනාදියට පැමිණ මහත් දුක් අනුභව කෙරෙත් ද ඔහු මනුෂ්‍ය නාරකිකයෝ නම් වෙති. අනෙකුදු යම් මනුෂ්‍ය කෙනෙක් පූර්වජාතියෙහි කළ කර්‍ම වශයෙන් ඉඳුල් බතකුදු සුවසේ නොලැබ සා පිපාසාදි දුකින් පීඩිතව ගෙයක් දොරක් නැතිව ඇස්පිරුණු කඳුළු ඇතිව හිස පිරුණ උකුණන් ඇතිව වෙර පිරුණු කුණු ඇතිව කිසි පිහිටක් නැතිව ශොකයෙන් පීඩිතව සුසුම් ලළා ප්‍රේතයන් සේ දුක් බහුලව ඇවිදිද්ද ඔහු මනුෂ්‍ය ප්‍රෙත නම්වෙත්. අනෙකුදු යම් මනුෂ්‍ය කෙනෙක් දසකර්‍මකාරාදී අනුන් අයිතිවූ පැවතුම් ඇතිව අන්‍යාභිප්‍රාය වශයෙන් බර උසුලමින් හෝ හිනනමයඞීාද ඇතිව අනාචාරයෙහි හැසිර අනුන් විසින් සන්‍තර්ජිත කරන ලදුව මරණ භයින් තැතිගෙන ග්‍රහණ නිශ්‍රිතව හෙවත් වල්වැද හිතා හිත නොදැන තිරිසනුන් සේ දුකසේ තිදීමෙන් හා දුකසේ සා පිපාසා විනොදනය කෙරෙද්ද ඔහු මනුෂ්‍ය තියඞීගගතයෝ නම් වෙත්, යම් මනුෂ්‍යජාති කෙනෙක් වැඩ අවැඩ මෙලෝ පරලෝ දැන කර්‍මඵල අදහමින් සකල සත්‍වයන් කෙරෙහි දයානුකම්පා ඇතිව සංවෙග බහුලව අකුශල කර්‍ම පථය හැර කුසල කර්‍ම පථයෙහි හැසිර දශ පුණ්‍ය ක්‍රියාවස්‍තු පුරද්ද ඔහු මනුෂ්‍ය ධර්‍මයෙහි පිහිටියා වූ පරමාත්‍ථ වශයෙන් මනුෂ්‍යයෝ නම්වෙත්. මම චනාහි ගිය දවස මෙම බුඩොත්පාද කාලයෙහි මේ චතුර්විධ මනුෂ්‍යන් අතුරෙන් මනුෂ්‍ය ධර්‍මයෙහි පිහිටියාවූ විද්‍යමාන මනුෂ්‍යයන්ට අන්‍තගීතව එක්තරා කුලධිතෘවක්ව මනුෂ්‍ය භූතව වසන්නෙමි මාගේ ගෙදෙරට වැඩියාවූ තෙරකෙනෙකුන් වහන්සේ දැක පහන් සිතැතිව මා හිදිනා පුටුව මත්තෙහි පීතවර්‍ණ වස්‍ත්‍රයක් අතුට වඩා හිඳුවා දසනඛසමොධාන සමුජ්වලිත හස්‍තපුට මස්‍තකයෙහි තබා නමස්කාරකොට ඉක්බිති ශක්තිවූපරිද්දේන් අහර පිළියෙල කොට දන් දිනිමි. පීඨාසනයද පූජාකෙළෙමි. එපමණ කුශලානුභාවය හෙතුකොට ගෙන මෙබඳුවර්‍ණ සම්පත් භොග සම්පත් ආදී වූ මහානුභාව සම්පන්න උදරතර දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදින් දසදිග් බබුළුවමියි කියා කුශල කර්‍මය ප්‍රකාශකොට ස්‍වාමීනි සවල්ප දනමය කුශලයෙක් මෙසේ වනකල තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇතිව උදරතරව යම්කිසි දනයක් දෙන ලද්දේ වී නම් චිත්‍ත ශුඩියත් ක්‍ෂෙත්‍ර ශුඩියත් යහපත් බැවින් මහත් ඵල

මහානිසංස වන්නේයයි කිව. ඒ දිව්‍යාඞ්ගනාතොමෝ

තෙරුන් වහන්සේ විසින් විචාරණ ලද ප්‍රශන විසර්ජනය කළ කල්හි මහ තෙරහු විස්තර වශයෙන් බණ වදළ සේක. ඒ ධර්ම දෙශනාව පරිවාර සහිත දෙවතා දුවට සාත්ථක විය. ඉක්බිති මහ තෙරහු මිනිස් ලොවට අවුත් බුදුරජාණන් වහන්සේට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ මෙම අත්ථොත්පත්ති කොට ගෙන එතැන්හි පැමිණි පිරිසට බණ වදළ සේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තුප්‍රකරණයෙහි පීඨවර්ගයෙහි පළමුවන
**සවණී පීඨ වස්තුව** කියා නිමවන ලදී.

## 2. දුතීය පීඨ විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි දුතීය පීඨ විමාන වස්තුව නම් කවරැයත්:-

සුර නර භමරගණාදිසෙවිත පාදපඞ්කජොපෙතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කර වදරණ සේක. එසමයෙහි වනාහි සැවැත් නුවර වාසීවූ එක්තරා ස්ත්‍රියක් තොමෝ තමන්ගේ ගෙට පිඩු පිණිස වැඩ වදළාවූ එක්තරා තෙරුන් වහන්සේ නමක් දැක ප්‍රසන්නවූ සිත් ඇතිව උන්වහන්සේට වැඩහිඳීමට ආසනයක් දෙන්නී තමාගේ පුටුව මත්තෙහි නීල වර්ණවූ වස්ත්‍රයක් අතුට දුන්නිය. ඒ කුශල කර්මය හේතුකොට ගෙන ඕතොමෝ මරණින් මත්තෙහි තවුතිසා භවනයෙහි උපන්නීය. ඇගේ පුණ්‍ය කර්මය විපාක දීම් වශයෙන් වෛඩූර්‍ය මාණික්‍යමයවූ පර්‍ය්‍යඞ්ක විමානයක් ඇට පහළවූයේය. ඕතොමෝ එහි දිව්‍ය සම්පත් විඳිමින් එක් දවසක් සූර්‍ය දිව්‍යරාජයාමෙන් බබලමින් උයන් කෙළිපිණිස යන්නීය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ දිව්‍යාඞ්ගනාවට පෙනී වදළ සේක. එකල්හි ඒ දෙව් දූ තොමෝ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ දිව්‍යාඞ්ගනාවට පෙනී වදළ සේක. එකල්හි ඒ දෙව් දු තෙමෝ තෙරුන්වහන්සේ දැක හටගත් ප්‍රීති ප්‍රමොද්‍ය ඇත්තී තෙරුන්වහන්සේ සමීපයට පැමිණ දෙහොත් මුදුනෙහි තබා වැඳ එකත්පස්ව සිටියාය. එකල්හි තෙරුන් වහන්සේ ඇ විසින් කරන ලද කුශල කර්මය ඇ ලවාම ප්‍රකාශ කරවනු පිණිස මෙසේ විචාරා වදළ සේක.

"පීඨන්තෙ වෙළුරියමයං උළාරං
මනො ජවං ගච්ඡති යෙන කාමං
අලඞ්කතෙ මල්‍යධරෙ සුවත්‍ථෙ
ඔභාසසී විජ්ජුරිවබ්භ කූටං"

යනුහෙයින් එම්බා දෙවතා දූව තීගේ සිතට අනුරූපවූ පරිද්දෙන් උයන් කෙළි ආදියට යෙමියි සිතූ කෙණෙහිම සිතුලෙස පවත්නා හෙයින් මනොමය ජව ඇත්තාවූ යොදුනක් පමණ මහත් උදරතර ශ්‍රෙෂ්ඨවූ වෛඩූර්‍ය්‍ය පර්‍ය්‍යඞ්කාකාර සටහන් ඇත්තාවූ කණක විමානයක් හා අලඞ්කෘතවූ දිව්‍ය ශරීරයෙහි නා නාප්‍රකාර රශ්මි ජාලාවෙන් බබලන්නාවූ අනෙක විධ රත්නයෙන් විරාජමානවූ හස්තූපග පාදූපගාදීවූ ප්‍රභෙද වශයෙන් සැටගැලක් පුරා ලන පමණ සර්‍වාභරණයෙන් සැරහී කල්පවෘක්‍ෂ පාරිච්ඡත්තකාදී සම්භව සුවිසුඬ චාමිකර විවිධ රත්නමය වූ පත්‍ර කිඤ්ජල්ක කෙසරසමන්‍ත විජෝතමානවූ විස්ඵුරන්‍ත කිරණ නිකර රුචිර දිව්‍යකුසුමයෙන් විභූෂිත හෙයින් මාලාධාරීවූ කල්ප ලතා නිබ්බන්‍ත නා නා වර්‍ණ විරාග විශෙෂ සුපරිසුඬ භාසුර ප්‍රභාසම්පන්‍න දිව්‍ය වස්ත්‍රයන්ගේ වශයෙන් සුන්‍දර වූ දිව සලුවක් හැඳ එසෙයින්ම දිව සළුවක් එකාංශකොට බබලන්නවූ නොහොත් අඩ සඳක් වැනිවූ යහපත් නළල් තලයෙන්ද දෙව්දුනු දෙකක් වැනිවූ බැම සහලින්ද යන මේ ආදී ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙන් යුක්තවූ දෙවතා දූ තොමෝ යම් තැනකට යෙමියි සිතූ කෙණෙහිම සඳු විමනක් සේ වායු වෙගයෙන් ඒ දිව්‍ය විමානය ආකාශයට පැන නැගී මනාප ස්ථානයකට සම්ප්‍රාප්ත වේ මැයි. මෙසේ පළමුකොට ඇගේ සම්පත් ප්‍රකාශකොට වදරා නැවත ගිය දවස කළාවූ සුචරිත කර්‍මය විචාරා වදාළ සේක. දෙවතා දූ තොමෝ පළමු විමාන වස්තුවෙහි කියනලද ආකාරයෙන් තෙරුන් වහන්සේ ට විස්තර කොට කී කල්හි තෙරුන් වහන්සේ මිනිස් ලොවට වැඩ වදරා මේ සියලු පවත් බුදුරජාණන් වහන්සේට සැළ කෙළේය. බුදුරජාණෝ එම අත්‍ථොත්පත්ති කොට ගෙන පැමිණි පිරිසට බණ වදාළ සේක. ඒ දෙශනා තොමෝ බොහෝදෙනාට සාත්‍ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්‍ගයෙහි
**දුතීය පීඨ විමාන වස්තු වර්‍ණනාව** කියා නිමවන ලදි.

## 3. තතිය පීඨ විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි තුන්වන පීඨ විමාන වස්තුව නම් කවරයත්,-

සුගත තථාගත භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාම විහාරයෙහි වැඩ වාසය කර වදරණ සේක. එසමයෙහි වනාහි එක්තරා රහත් තෙර කෙනෙක් රජගහනුවර

පිඩු පිණිස හැසිර ලබන ලද පිණ්ඩාහාරය ගෙන භත්තකෘත්‍ය කාලය පැමිණි කල්හි වළඳනු කැමැත්තෙන් හරින ලද දෙරටු ඇති එක්තරා ගෘහයකට වැඩිසේක. ඒ ගෙයි වනාහි ගෘහ සාමිනී ස්ත්‍රී තොමෝ ශ්‍රද්ධා සම්පන්න වූවා තෙරුන් වහන්සේගේ ආකාරය සලකා, ස්වාමීන් වහන්සේ මෙහි වැඩිය මැනව. වැඩහිඳ අහර වළඳ වදළ මැනවයි කියා තමන්ගේ උතුම් පුටුව මත්තෙහි පීත වස්ත්‍රයක් අතුට අසුන් පණවා නිරපෙක්‍ෂ පරිත්‍යාග වශයෙන් දුන්නීය. එසේ දුන්නාවූ ඕතොමෝ මේ ස්වල්ප මාත්‍ර වූ පින කරණකොට ගෙන මතු භවයෙහි ස්වර්ණමය පුටුවක් ලැබේවායි ප්‍රාර්ථනාවක්ද තැබුයේය. ඉක්බිති තෙරුන්වහන්සේ එහි සිට භත්ත කෘත්‍යය කොට පාත්‍රය සුධකිරීමෙන් වඩින්ට ආරම්භ කෙළේය. එකල්හි උපාසිකා තොමෝ ස්වාමීනි, මේ පුටුව නුඹවහන්සේටම පූජාකෙළම්. මට අනුකම්පාවෙන් පිළිගත මැනවයි ආරාධනා කළාය. එබස් අසා තෙරුන් වහන්සේ ඒ පුටුව ගෙන්වා ගෙන ගොස් සංඝයාට දුන් සේක. ඒ උපාසිකා තොමෝ මෑත කාලයෙක්හි එක්තරා රෝගයකින් පෙළෙන ලද්දී කාලක්‍රියාකොට එම කුශල කර්මය කරණ කොටගෙන තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. මුගලන් මහතෙරුන් වහන්සේට සම්මුඛවීමාදි සියල්ල පෙරකී නයින් දැනගත යුත්තේය.

මෙතෙකින් මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන
**පීඨ වර්ගයෙහි තුන්වන පීඨ විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

## 4. චතුත්ථ පීඨ විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ග යෙහි සතරවන පීඨ විමාන වස්තුව නම් කවරයත්-

ත්‍රෛලොක්‍ය ගුරුවූ භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ලෙහෙණුන්ට බත් වැටුප් දෙන හෙයින් කලන්දක නිවාස නම්වූ වෙළුවනාරාමයෙහි වැඩ වාසයකර වදාරණසේක. එසමයෙහි රජගහ නුවර වාසීවූ එක්තරා ස්ත්‍රියක් තෙමෝ තමාගේ ගෙට පිඬු පිණිස වැඩියාවූ භික්ෂු නමක් දැක ප්‍රසන්නවූ සිත් ඇත්තී උන්වහන්සේට ආසනයක් දෙන්නී නිල් වස්ත්‍රයක් ආසනය මත්තෙහි එලා දුන්නීය. එකල්හි තෙරුන් වහන්සේ ඒ මත්තෙහි වැඩහුන් සේක. එකල උපාසිකා තොමෝ, මට මහත් පින් කෙතක් පහළවියයි ඉතා සතුටු සිත් ඇතිව ඛාද්‍ය භොජ්‍යාදියෙන් උන්වහන්සේ වැළඳ වූවාය. ඕ තෙමෝ මෙපණක්ම පින් කොට ඉන් මෑත. භාගයෙක්හි කාලක්‍රියාකරන්නී එම කුශල කර්‍මයාගේ බලයෙන් තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. මෙහි විස්තරද පෙරකී නයින් දැන ගතයුතු.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්‍ගයෙහි

**සතරවන පීඨ විමාන වස්තු වර්‍ණනාව**

කියා නිමවන ලදි,

## 5. කුඤ්ජර විමාන වස්තුව

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන කුඤ්ජර විමාන වස්තුව නම් කවරැයත්? එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු හේ කෙසේද යත්? මාර ගජකුම්භ විදාරණ කෙශරීභූත වූ බුදු රජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහ නුවර සමීපයෙහි වූ ලෙහෙණුන්ට වැටුප් තබා අභය දුන් හෙයින් කලන්දකනිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක් එ සමයෙහි එක් දවසක් නැකත් කෙළි පිණිස කාලඝොෂා කොට නගර වාසීහු රැස්ව මුළු නුවර බෙර ඇසක්සේ බිම සමකොට කළුවැලිපියා සුදු වැලි අතුට සියලු වීථිවල ඒ ඒ තන්හි නානා වර්‍ණ ධවජ පතාක නංවා දෙරක් දෙරක් පාසා කෙහෙල් තොරන් ලවා පුන්කලස් තබා ලදපස්මල් විසිරුවා මුළු නුවර දෙව් පුරයක්සේ අලඞ්කෘත කොට සරහා රාජ රාජ මහාමාත්‍යාදීවූ සියලු නගරවාසීහු ඔවුනොවුන්ගේ බලානුරූපවූ පරිද්දෙන් නානා වර්‍ණ වස්ත්‍රාභරණාදියෙන් සැරසී නැකත් කෙළියට පටන්ගත්තාහුය. තවද මතු මහල් තළයෙන් බිමට නොබස්නා ඉසුරුමත් බිසෝවරු පවා නානා ලඞ්කාරයෙන් සැරහූ ඔවුනොවුන්ගේ පිරිස් හා සමග නැකත් කෙළියට නික්මෙති. එසමයෙහි මුළු නුවර දෙව් පුරයක් සේ අලඞ්කෘත විය. එකල්හි මගධෙශවර වූ බිම්බිසාර නම් මහරජාණෝ පළමුරජදරුවන්ගේ සිරිත් වශයෙන් මහජනයාගේ චිත්තානුරක්‍ෂණය

පිණිස සර්වාභරණයෙන් සැරහී රජගෙන් නික්ම මහසෙන් පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් උදරවූ ශ්‍රී සෞභාග්‍යයෙන් මහ පිරිස් පිරිවරා ශක්‍ර දෙවේන්ද්‍ර ලීලාවෙන් නුවර ප්‍රදක්ෂිණා කරන්ට වන්හ. එසමයෙහි රජගහ නුවර වසන්නාවූ එක්තරා කුල දියණියක් උදර වූ ශ්‍රී සෞභාග්‍යයෙන් මහත් රාජානුභාවයෙන් දිලිහි දිලිහී වඩනා බිම්සර රජහුගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් දැක බලවත්ව හටගත්තාවූ අද්භූත වූ ප්‍රීති සොම්නස් ඇත්තාවූ ඒ ස්ත්‍රී තොමෝ මේ රාජසෘඩි වැනිවූ උදරතරවූ ශ්‍රී සම්පත් ලබනු කැමැත්තෙමි. කවර කාරණයෙකින් ලබන්ට හැකිවන්නෙම් දැයි නුවණැත්තවුන් කරා ගොස් විචාළීය. එකල්හි කල්‍යාණාධ්‍යාස ඇති මෙලෝ පරලෝ වැඩ දන්නා ප්‍රඥාවන්ත මනුෂ්‍යයෝ කියන්නාහු: එම්බා භද්‍රාව මේ ලොකයෙහි යම් ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙක් ඇද්ද ඒ සියලුම සම්පත් සුචරිත කර්‍මයෙන්ම සිඩවන්නේය. එසේ හෙයින් කුශල කර්‍මයෙන් ම සිතූ සිතූ සම්පත් දෙන හෙයින් සිතුමිණි රුවනක් හා සමානය. යම්කිසි ඌනතාවයක් නැත්තාවූ ඉසුරු සම්පත් දෙන හෙයින් කල්පවෘක්ෂයක් හා සමානය. තවද ක්‍ෂෙත්‍ර ශුඩියෙන් ද චිත්ත ශුඩියෙන්ද මහත් ඵල මහානිසංස වෙයි. යම්කිසි දනාදිවූ කුශල කර්‍මයක් කොට කිසි යම් ප්‍රාර්ථනාවක් කළේ වී නම් ඒ ප්‍රාර්ථනාව සිතූ පැතූ පරිද්දෙන් ම සිඩවන්නේය. එතකුදුවුවත් ආසන දනයෙන් ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදී වූ උතුම් වංශ ඇතිවෙයි භොජන දනයෙන් කායබල සම්පත් ඇතිවෙයි. වස්ත්‍ර දනයෙන් වර්ණ සම්පත් ඇතිවෙයි රථ ගැල් ඉද්දෙලි කුනම් ආදී යාන දනයෙන් සුවපහස් ඇතිවෙයි. පහන් පූජාවෙන් පසැස් ලැබෙයි, හෙවත් රන්විමනෙක එබූ මැනික් ගුලි සෙයින් පස්පෑ දිස්නා ඇස් ඇතිවෙයි. ආවාස දනයෙන් අනෙකප්‍රකාරවූ සියළු සම්පත් ලැබෙයි යනාදී කුශල් ප්‍රකාශකොට කීහ.

එපවත් අසා ඒ ස්ත්‍රීතොමෝ මේ මිනිස් ලොව සම්පත්තියට වඩා දිව්‍ය සම්පත් ඉතා උදරයයි සිතා දිව්‍යසම්පත් අරමුණු කොට කුශළ කිරීමෙහි බලවත් වීර්‍ය්‍යය ඇතිවූවාය. එසමයෙහි ඇගේ මාතෘ පීතෘහු අළුත් පිළි දෙකක්ද අළුත් පුටුවක්ද පියුම් කළඹක්ද ගිතෙල් මී සකුරු කිරි සාල් ආදී උපකරණද පරිභොග පිණිස එව්වාහුය. ඒ ස්ත්‍රී වනාහි පරිභොග පිණිස මවු පියන් විසින් එවනලද ගිතෙල් මී සකුරු ආදී උපකරණ දැක සිතන්නී මම ද දන්දෙනු කැමැත්තෙමි. දන් දිය යුතු දනොපකරණත් මා විසින් ලබන ලද්දේයයි සතුටු සිත් ඇතිවැ දෙවන දවස් දන් සරසන්නී අප්‍රොදකර්‍ම කිරිබත් සපයා අන්‍යවූද දනාර්හවූ ඛාද්‍ය භොජ්‍ය විකෘතියක් පිළියෙල කොට දන් ගෙය සුවඳ පිරිබඩ ලවා අළුත් පීඨාසනය විකශිත පද්මයෙන් සරහා අළුත් සුදු වස්ත්‍රයක් අතුට ආසනය

පණාවා ආසනයාගේ සතර පා මත්තෙහි පියුම් රැස් සතරක් තබා උඩ සුදු වියන් බැඳ අවලම්බක පුෂ්පදමයන් එල්වා ආසනය වට සියලු භූමිය සිය අතින් මල්පෙති අතුට ප්‍රතිග්‍රාහකයන් ආ කල පූජා කෙරෙමියි මල් කරඬුවක් එකත් පසෙක තබා මෙසේ සියලු දනොපකරණ සපයා තබා ඉක්බිති ඉස් සෝධා නහා සුදු පිළි හැඳ එසේම සුදු පිළියක් එකාංශකොට ගෙන කාලවේලා පරීක්ෂාකොට දසියක් කැඳවා මාගේ දනයට සුදුසු සිල්වත් කෙනෙකුන් සොයා කැඳවාගෙන එවයි කියා ගමන් කරවූවාය.

එසමයෙහි ආයුෂ්මත්වූ දම් සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ දහසින් බැඳි පියල්ලක් දෙර එලන්නාසේ රජගහ නුවර පිඬු පිණිස හැසිරෙණසේක් ඇතුළු වීථියට පැමිණි සේක. එකල්හි ඒ දසි තොමෝ තෙරුන් වහන්සේ දැක නමස්කාර කොට, "ස්වාමීනි පාත්‍රය මා අතට දී වදරා එක්තරා උපාසිකාවක් හට අනුග්‍රහ පිණිස මෙසේ වැඩිය මැනව"යි ආරාධනා කළාය. එකල්හි තෙරුන් වහන්සේ පාත්‍රය අතට දුන් සේක. ඉක්බිති ඒ දසි පාත්‍රය ගෙන මහ තෙරුන් වඩා ගෙට ගියාය. ඒ උපාසිකාව ද දුරින් වඩනා තෙරුන් වහන්සේ දැක පෙරගමන් කොට තෙරුන් වහන්සේට ආසනය දක්වා, ස්වාමීනි මෙහි පණාවන ලද ආසනයෙහි වැඩහුන මැනව"යි කියා මහ තෙරහු ආසනයෙහි වැඩහුන් කල්හි මල් පූජාකරන්නී ආසනය වට සියතින් පියුම්පෙති විසුරුවා පසඟ පිහිටුවා වැඳ ගිතෙල් මී සකුරු මිශ්‍රවූ අලෙපාදක මී කිරිබතින් වැළඳවූව එසේ වළඳ වන්නී, "මේ කුශලානුභාවය හෙතුකොට ගෙන දිව්‍යමය ඇත්වාහනය මත්තේහි කූටාගාර සටහන් ඇත්තාවූ පය්‍යීඩකයකින් ශොභාමත් දිව්‍ය සම්පත්තියක් පහළවේව"යි කියා ප්‍රාර්ථනා කළාය. නැවත තෙරුන් වහන්සේ වැළඳු ඉක්බිති පාත්‍රය සෝධා ගිතෙල් මී සකුරු පුරා පුටුව මත්තෙහි අතුළාවූ වස්ත්‍රය පාත්‍රයට පුඹුළුවක් කොට තෙරුන් වහන්සේට පිළිගන්වා මහ තෙරහු අනුමෙවෙනි බණ වදරා වඩිනා කල්හි මිනිසුන් දෙන්නකු කැඳවා, "තෙරහු අත තුබු පාත්‍රය හා මේ පය්‍යීඩකයද විහාර යට ගෙන ගොස් දී එත්ව"යි කිව . ඒ පුරුෂයෝද කී ලෙස පාත්‍රය හා පුටුවද විහාරයට ගෙන ගොස් දුන්හ ඒ ස්ත්‍රී එයින් අපරභාගයෙහි නොබෝ කලකින් කාලක්‍රියා කොට එම කුශලානුභාවයෙන් තවුතිසා දෙව්ලොව සාරසියයක් ගව් පමණ රන් විමනෙක උපන්නීය. පරිවාර ස්ත්‍රීහුද දහසක් පමණ වූහ. ඇගේ ප්‍රාර්ථනා වශයෙන් පද්ම මාලාලඞකාරයෙන් අලඞකෘත වූ පියුම් පෙති වැනිවූ ද රේණු වැනිවූද හිසකෙස් හා ලොම් ඇති හෙයින් හාත්පසින් පියුම් පෙත්තෙන් හා මල් රේණුයෙන්ම ශොභාමත් වූ ශරීර බැවින් ජලජමාලාලඞකෘතවූ මනා

දර්‍ශනීය වූ සියුම් මොලොක් සුවපහස් ඇත්තාවූ අනෙකවර්‍ණ රශ්මිජවාලාවෙන් දිලිසෙන්නාවූ සර්‍වාභරණයෙන් විභූෂිතවූ විසිගව් පමණ උතුම් කුඤ්ජර වාහනයෙක් පහළ විය. ඒ ඇතු පිට අනෙකවිධ රත්‍නයෙන් දිලියෙන්නාවූ පද්ම මාලාලඞ්කාරයෙන් අලඞ්කෘත වූ කූටාගාර සටහන් ඇත්තාවූ මනා සුව පහස් ඇත්තාවූ සතර ගව් පමණ උතුම් කනක පර්‍ය්‍යඞ්කයෙක් පහළ විය. එසේ හෙයින් ඒ විමානය කුඤ්ජර විමාන නම් විය. ඒ දෙව් දූ තොමෝ දිව්‍ය සම්පත් අනුභවකරන්නී ඒ කුඤ්ජර විමානයෙහි නොයෙක් රත්නයෙන් විසිතුරු රත්‍න පර්‍ය්‍යඞ්කාරූඪව නන්‍දනොද්‍යානාදියෙහි ක්‍රීඩාකෙරෙමින් මහත්වූ ශ්‍රී සම්පත් අනුභව කරන්නීය.

එසමයෙහි එක්තරා උත්සව දිනයෙක දෙවතාවෝ ඔවුනොවුන්ගේ කර්‍මානුරූප වූ පරිද්දෙන් අනෙකවිධ වූ දිව්‍යශ්‍රීන් දිළිහි දිළිහී උයන් කෙළි පිණිස නන්‍දනොද්‍යානයට යන කල්හි ඒ දෙවතා දුව ද යහපත් වූ දිව්‍ය සළුවක් හැඳ එසෙයින්ම දිව්‍ය සළුවක් එකාංශකොට සැට ගැලක් පමණ දිව්‍යාභරණයෙන් සැරහී දිව්‍යාප්සරාවන් දහසක් පිරිවරා සියක් යොදුන් කනක විමානයෙන් නික්ම කුඤ්ජර විමානාරූඪව මහත් දිව්‍ය සෘඞියෙන් මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් හිරුසඳුසේ භාත්පසින් එකොභාෂ කෙරෙමින් දිලිහි දිලිහී නන්‍දනොද්‍යානයට යන්නීය. එසමයෙහි ආයුෂමත් මුගලන් මහ තෙරුන් වහන්සේ යටකියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් තව්තිසා භවනයට පැමිණ ඒ දෙවතා දුවට නුදුරු තැනෙක්හි කප් රුකක් සේ පෙනී වදළ සේක. එකල ඒ දෙවතා දූ තොමෝ තෙරුන් වහන්සේ දැක බලවත්ව හටගත්තාවූ සඞ්ඝ ගෞරවයෙන් වහාම පර්‍ය්‍යඞ්කයෙන් බැස තෙරුන් වහන්සේ කරා එළඹැ පසඟ පිහිටවූවා දශනඛසමොධාන සමුජ්ජ්වලිත හස්තපුට මස්තකයෙහි තබා වැඳ එකත්පස්ව සිටියාය. එකල මහ තෙරුන් වහන්සේ ඒ දෙවතා දුව විසින් පූර්‍වජාතියෙහි කරණලද කුශල කර්‍මය ඒ දෙවතාදුව ලවා ම ප්‍රකාරශකරවා දෙවියන් සහිත ලොකයාහට කර්‍මඵල ප්‍රත්‍යක්‍ෂ කරවා දෘෂ්ට්‍යානුගතික වශයෙන් භාවනු කැමතිව -

"කුඤ්ජරො තෙ වරාරොහො නානාරතන කප්පනො,
රුචිරො ථාමවා ජව සමපනෙතො ආකාසමහි සමීහති.
පදුමී පදුමපත්තක්ඛි පදුමුප්පල ජුතින්ධරො,
පදුමචුණ්ණාභිකිණ්ණඞෙගා සොණ්ණපොක්ඛරමාලවා.
පදුමානුසටං මගං පදුමපත්ත විභූසිතං,
ඨිතං වග්ගු මනුගඝාති මිතං ගච්ඡති වාරණො.
තස්ස පක්කම මානස්ස සොණ්ණකං සාරපීස්සරො,
තෙසං සුයාති නිඝොසො තූරියෙපඤ්චඞ්ගිකෙ යථා.

තස්ස නාගස්ස ඛන්ධස්මිං සුචිවත්ථා අලඞ්කතා,
මහන්තං අච්ඡරා සංඝං වණ්ණෙන අතිරොචසි.
දානස්ස තෙ ඉදං ඵලං අථො සීලස්ස වා පන,
අථො අඤ්ජලිකම්මස්ස තං මෙ අක්ඛාහි පුච්ඡිතා"ති.

යනුහෙයින් "නිලුපුල් පෙති වැනිවූ නෙත්‍ර යුගලයක් ඇත්තාවූ එම්බා දෙවතා දුව තීගේ මේ උත්තම වාහනයවූ දර්‍ශනීයවූ හස්ති ලක්‍ෂණ රූපශ්‍රී ශොභාවෙන් හා විදුලිය වැළඳ ගත් මහත් රන් පර්‍වතයක් සේ කුම්භාලඞ්කාරාදී අනෙකප්‍රකාර රත්නාලංකාරයෙන් මනාකොට බබලන්නාවූ ආකාශචාරීවූ ජව බලසම්පන්නවූ පද්මයක් සේ පියුම් පෙත්තෙන් අලංකෘතවූ දිව්‍යමය පද්මොත්පල මාලාලංකාර ශරීර ඇති බැවින් පියුම් රැසක්සේ සකල ශරීර පද්මොත්පලමෙන්ම ඒ ඒ තන්හි ජොතිමත්ව බබලන්නාවූ සවර්‍ණමය පියුම් පෙති හා රේණුයෙන් ගැවසී ගත් ශරීර ඇති සෙයින් කිඤ්ජල්කයෙන් හාත්පසින් ආකීර්‍ණවූ ජලජ මාලාලංකෘත ගාත්‍රයක් ඇත්තාවූ ක්‍රීඩා කාලයෙහි නිර්‍මිතව පවත්නාවූ උතුම් වූ මේ ඇත් වාහනයෙන් හා තවද මේ ඇතු ගමන් ගත් කල පියක් පියක් පාසා දක්‍ෂ වූ පණ්ඩිත කෙනෙකුන් විසින් මනාකොට පියුම් සාද සරහා තබන ලද මාර්ගයක් සේ ඇතු තුබු පතුල් මහත් පියුම් නැගී පා පියුම් ධර ධරා නානා වර්‍ණයෙන් විරාජිත වූ ශරීරය හාත්පසින් පෙති පතරින් හා රේණුයෙන් තවරමින් රන්සුණු ඉස්නා සේ ශොභාමත් වෙයි. පිට මත්තෙහි අනර්‍ඝවූ සවර්‍ණ පර්‍ය්‍යඞ්කාරූඪව උන්නවුන් නොවෙහෙසා පියුම් පිට පියුම් තබන්නා සේ යහපත් ඇත් ගමනින්ම යන ගමන් ඇත්තේය. මෙසේ යන්නාවූ ඇතුගේ උභය පාර්‍ශ්වයෙහි එලෙන්නාවූ මහසැලසා මුතු මැණික් ආදියෙන් විසිතුරු වූ නොයෙක් සිය ගණන් රන්මිණි සොෂාව දක්‍ෂවූ ගන්ධර්‍වයන් විසින් වයන ලද ආතතය, විතතය, විතතාතතය, ඝනය, සුසිරය යන පඤ්චාඞ්ගික තුර්‍ය්‍යනාදය යම්සේ කර්‍ණරසායනව ඇසේද එමෙන් පඤ්චාඞ්ගික තුර්‍ය්‍යනාදයෙන් එකනින් නාදවෙයි. ඒ ඇත්කඳ පිට කනකාසනයෙහි දිව්‍යමය වස්ත්‍රාභරණයෙන් සැර හී කනක රූපයක් සේ අලඞ්කෘතවූ උදරතරවූ රූපශ්‍රීන් ජොතිමත්ව තාරකා මධ්‍යයෙහි දිලෙන පූර්‍ණචන්ද්‍රයා සේ මහත්වූ දිව්‍යස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි ශරීරවර්‍ණයෙන් සියල්ලවුන් අභිභවනය කෙරමින් දීප්තිමත්ව බබලන්නා වූ එම්බා දෙවතා දුව තී විසින් මෙබඳු සම්පත්තියක් ලැබීමට කාරණා කවරේද? අන්නපාන වස්ත්‍රාභරණාදි දසවිධ දන වස්තුන් අතුරෙන් කවර දනයක්හුගේ විපාකයෙක්ද? කාය සංවරාදී වශයෙන් කවර ශීල විපාකයෙක්ද? වන්දන මානනාදියද චාරිත්‍ර ශීලයෙහිම අන්තර්‍ගත හෙයින් කවර නම් චාරිත්‍ර

ශීලයක්හුගේ විපාකයෙක්ද? හෙවත් දනශීලාදි වශයෙන් කවර සුචරිත කර්‍මයක් කොට රූප භොග පරිවාරාදි මෙබඳු සම්පත්තියක් ලබන ලද්දීද? හේ මට ප්‍රකාශ කොට කියව'යි කියා යටගිය දවස කළාවූ කුශල කර්‍මය විචාරා වදාළ සේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා.
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනු හෙයින් යට කියනලද ක්‍රමයෙන් සතුටුව තෙරුන් වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන කුශල කර්‍මය ප්‍රකාශ කරන්නාවූ ඒ දෙවතාදූ තොමෝ-

"දිස්වාන ගුණ සම්පන්නං ඣායිං ඣානරතං සතං,
අදසිං පුප්ඵාභිකිණ්ණං ආසනං දුස්ස සන්ථතං.
උපඩ්ඪපදුමමාලාහං ආසනස්ස සමන්තතො,
අබ්භොකිරිස්සං පතෙතහි පසන්නා සකෙහි පාණිහි.
තස්ස කම්මස්ස කුසලස්ස ඉදං මෙ ඊදිසං ඵලං,
සක්කාරො ගරුකාරොච දෙවානං අපචිතා අහං."

යනු හෙයින්, "බොහෝ කුසල් රැස්කොට ශ්‍රාවකපාරමී ඥානය මස්තකප්‍රාප්ත කොට අග්‍ර ශ්‍රාවිකා ගුණයෙන් සමන්විතවූ ආරම්මනූපනිධ්‍යානය ලක්‍ෂණූපනිධ්‍යානය යන ද්විප්‍රකාර වූ ධ්‍යානයන් හා දැවිය යුතුවූ සකල කෙලශයන් නසා අර්හත් ඵලයෙහි පිහිටියාවූ එහෙයින්ම ලොකොත්තර ධ්‍යානයෙහි ඇළුම් ඇත්තා වූ සත්පුරුෂ ගුණයෙන් අග්‍රවූ සැරියුත් මහ තෙරුන් වහන්සේ දැක පහන් සිත් ඇතිවැ මලින් සරහා අළුත් වස්ත්‍රයක් අතුට පණවනලද පීඨාසනයෙහි මහ තෙරහු වඩා හිඳුවා මම වනාහි උපාර්ධයක් පමණ පියුම් පෙති ගලවා ආසනය වටා සියලු භූමිය පියුම් වැසි වස්නාසේ සියතින් මල්පෙති විසුරුවා අලෙපාදක මී කිරිබතින් වළඳවා පුටුව හා වස්ත්‍රයද පූජාකෙළෙමි. ඒ කුශල කර්‍මය හෙතුකොට ගෙන මේ කුඤ්ජර විමාන ආදිවූ උදරතරවූ දිව්‍ය සම්පත් ලදින් බොහෝ දෙවියන් විසින් කරණලද පූජා සත්කාර ගරුකාර බහුමාන කටයුතුවූ දිව්‍ය මය ඓශ්වර්‍ය්‍යයෙන්ද දිව්‍යානුභාවයෙන්ද ආයුෂයෙන්ද වර්‍ණයෙන්ද සැපතින්ද පරිවාරයෙන්ද අධිපති භාවයෙන්ද දසදිග් බබුළුවමි'යි කියා-

"යො වෙ සම්මා විමුත්තානං සන්තානං බ්‍රහ්මචාරිනං,
පසන්නො ආසනං දජ්ජා එවං නන්දෙ යථා අහං.

තස්මා හි අත්ථකාමෙන මහත්තමභිකඞ්ඛතා,
ආසනං දාතබ්බං හොති සරීරන්තිමධාරිනං"ති.

යනුහෙයින්, "ස්වාමීනි මම යම්සේ ආසන දනයක් දී නෙම් කුඤ්ජර විමානය ඇතුළු වූ දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදින් සතුටු වෙම්ද, එමෙන් රත්නත්‍රයාගේ ගුණ සලකා කර්මඵල අදහමින් පහන් සිත් ඇතිව යම්කිසි කෙනෙක් දන් දෙනකල බ්‍රහමචාරිවූ සන්හුන් කාය වාක් මනොචාර ඇති හෙයින් සන්හුන් ඉදුරන් ඇත්තාවූ සකල කෙලශයන් කෙරෙන් මිදුනාවූ එහෙයින්ම ක්ෂීණාශ්‍රවවූ ආය්‍යී පුද්ගලයන්ට යම්කිසි දනයක් දුන්නේවීනම් උදරතරවූ ශ්‍රී සම්පත් ලබමින් මාසේම සතුටු වන්නේය. එසේ හෙයින් මහත් උදරතරවූ ශ්‍රී සම්පත් ආදියෙන් තමහට වැඩ කැමැත්තාවූ ශ්‍රඩාවන්තයන් විසින් පින්කෙත් සොයා අන්තිම දෙහධාරීවූ ක්ෂීණාශ්‍රවවූ ආය්‍යී පුද්ගලයන්ට අසුන් දියයුතු යයි කියා ක්ෂීණාශ්‍රවයන්ට වඩා පින්කෙත් ලොකයෙහි නැතිබව හඟවා විශේෂයෙන්ම ප්‍රශංසාකොට කිව්" මෙසේ මහතෙරුන් වහන්සේ විචාළ පැනය ඒ දෙවතා දුව විසින් විසඳු කල්හි මහ තෙරහු විස්තර වශයෙන් බණ වදළසේක. ඒ ධර්මදෙශනාව පරිවාර සහිතව ඒ දෙවතා දුවට සාත්ථක විය. ඉක්බිති මහතෙරහු මිනිස් ලොවට අවුත් පුච්ඡා විස්සජ්ජනා වශයෙන් සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට දැන්වූසේක. භාග්‍යවත්බුදුරජාණන් වහන්සේ මෙම අත්ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට ධර්මදෙශනාකොට වදාළ සේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨ වර්ගයෙහි
**කුඤ්ජර විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදි

## 6. නාවුකා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **පීඨ වර්ගයෙහි නාවුකා විමාන වස්තුව** නම් කවරැයත්? එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු-

සුර නර බමරගණාදිසෙවිත පාදපංකජොපෙතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන සමයෙහි අන්‍යතර ග්‍රාමාන්තසෙනාසනයෙක වසන්නාවූ සඟ සොළොස් දෙනෙකුන් වහන්සේ බොහෝ දවසක් සර්වඥයන් වහන්සේගේ රූපශ්‍රී නුදුටු හෙයින් "බුදුන් දැක සිත් සනහ ගනුම්හ"යි සිතා ඒ විහාරයෙහි කළමනා ගම්කවත් සපයා තම තමන්ගේ පා සිවුරු ගෙන විහාරයෙන් නික්ම සවර්ණ හංස පෙළක්

සේ සැවැත් නුවර දිශාභිමුඛව දීඝී මාගීයට පැමිණ වඩනාහු ග්‍රීෂ්ම ඍතුයෙහි පළමුවන මස හෙයින් අතුරු මහ නිරුදක කාන්තාර යෙහි පැන් නොලදින් පිපාසයෙන් පීඩිතව පැන් ලද හැක්කැයි අනික් දිශාවකට ගොස් ලිඳක් දැක ඒ ලිඳට නුදුරු තෙනක වැඩ සිටියාහ. එකල, "පැන් ගෙන එම් සිතා ඒ ලිඳට පැන් පිණිස ගියාවූ නාම ගොත්‍රයෙන් අප්‍රසිඬවූ එක්තරා ස්ත්‍රියක් ලිඳ සමීපයෙහි වැඩ සිටි භික්ෂූන් දැක මේ ආයෳීයන් වහන්සේලාට පැනින් ප්‍රයෝජන ඇත්තේය. ගිමන් කල හෙයින් පිපාසිතහයි දැන අනලස්ව අනුකම්පා උපදවා පහන් සිත් ඇතිව පැන් කළයක් ගෙන ගොස්, "ස්වාමීනි සැමදෙනා වහන්සේ ම මා කෙරෙහි අනුකම්පා කොට පැන් පිව මැනව"යි ආරාධනා කළාය. එකල්හි පාත්‍ර ස්ථවිකාවෙන් පෙරහන්කඩ ගෙන පැන් පෙරා සැමදෙනා වහන්සේම අභිප්‍රාය වූ පරිද්දෙන් උදක පානයකොට විඩා සන්සිඳුවා හස්ත පාද ධොවනයෙන් අත් පා සිහිල්කොට ගිමන් හැර ඉක්බිති ඒ ස්ත්‍රියට උදක දනානුමොදනාවෙන් බණ වදරා වැඩි යාහ. ඉක්බිති ඒ පැන් පූජාකළාවූ උපාසිකා තොමෝ ඒ කුශල කම්ය සිත තබා නැවත නැවත සිහිකරන්නී එයින් අපරභාගයෙහි නොබෝ කලකින් කාලක්‍රියා කොට ඒ කුශල කම්ය හෙතුකොටගෙන තවුතිසා දිව්‍යලොකයෙහි දිව්‍යමය කල්ප වෘක්ෂයෙන් උපශොභිතවූ මහත් දිව්‍ය විමානයක උපන්නීය. ඒ විමානය පරික්ෂෙප කොට හාත්පසින් මුතු රැසක්සේ රිදිමය වැල් ලෙන් ගැවසී ගත් බැවින් රිදීපටක් සේ සුදු වැලිතලාවෙන් හා රිදී පවුරක්සේ පුලින තටොප ශොභිතවූ මැණික් කඳක්සේ නිම්ලවූ සිහිල්වූ ජලයෙන් පිරුණාවූ ගංගාවක්ද ඒ ගංගාවගේ උභය තීරයෙහි දිව සුවඳ මල් ගසින් ගැවසී ගත්තාවූ සත් රුවන්මය පවුරු වාසල් දෙරටු ආදියෙන් හෙබියාවූඋද්‍යාන විමානාදියෙන්ද නොයෙක් රත්නයෙන් ජොතිමත්ව බබලන්නාවූ පවුරින් හා සත්රන්මය පියගැට පඬ්කතියෙන් ශොභාමත්වූ මහතොට ඇති පොකුණක්ද ඒ පුෂ්කරණියෙහි රක්ත පද්මය ශ්වෙත පද්මය රක්තොත්පලය ශ්වෙතොත්පලය නීලොත්පලය යනාදි නොයෙක් මල් වනය හා සමග සත්රුවන්මය වූ නැව් විමනෙක්ද පහළවිය. එසේ හෙයින් ඒ විමානයද නාවුකා විමාන නම්විය. ඒ දිව්‍යඞගනා තොමෝ එක් දවසක් නොයෙක් දිව්‍යාභරණයෙන් සැරසී විමානයෙන් නික්ම නාවුකා විමානයෙහි නොයෙක් ලීලායෙන් දිළිහි දිළිහී ජලක්‍රිඩා කෙරෙමින් මහත් දිව්‍ය සම්පත් අනුභව කරන්නීය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ යටකියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙහි හැසිරෙණ සේක් ඒ නාවුකා විමානයෙහි ක්‍රීඩා කරන්නාවූ ඒ දෙවතා දුව දැක, ඒ දෙවතා දුව විසින් පූර්වජාතියෙහි කරණ ලද කුශලකම්ය විචාරා වදරණ මහතෙරුන් වහන්සේ-

"සුවණ්ණඡදනං නාවං නාරි ආරුය්හතිට්ඨසි,
ඔගාහසි පොක්ඛරණිං පදුමං ඡින්දසි පාණිනා,
කෙන තෙ තාදිසො වණ්ණො-පෙ-පභාසතී"ති.

යනුහෙයින්, "රක්ත සවණීනාදීවූ විචිත්‍ර චිත්‍ර කර්‍මයෙන් හෙබියාවූ භිත්ති හා නා නා විධ රත්නයෙන් දිලිහෙන්නාවූ සත්රුවන්මය වූ පලසෙවෙනි ඇත්තාවූ සවණීමය නැවකට නැගී රක්තොපල සෞවතොත්පලාදීවූ නොයෙක් මලින් ගැවසී ගත් හෙයින් දිය කෙළියෙහි ඇළුම් ඇතිව මේ පුෂ්කරණීයෙහි ජලක්‍රීඩාවට
පැමිණ මරකත + මිණිමය මල්දඬු ඇත්තාවූ පද්මරාග මිණි මය පෙති ඇත්තාවූ සවණීමය කර්ණිකා හා රේණුඇත්තාවූ සුවඳ වහනය වන්නාවූ මේ පියුම් අතින් බිඳගෙන ක්‍රීඩාකරන්නාවූ එම්බා දෙවතාදුව, මෙබඳු ශරීර වණීයක් හා උද්‍යාන විමානා දී පරිභොග කටයුතු වූ මෙබඳු සම්පත්තියක් කවරකුශලයකින් ලබන ලද්දීදැ?යි විචාරා වදළසේක. මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාළ ප්‍රශනය ඒ දෙවතාදුව විසඳු බව දක්වන්නාවූ මහා ස්ථවිරයන්විසින් සඞ්ගීතිකාලයෙහි-

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා.
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින් යට සවණීපීඨ වස්තුවෙහි කි සෙයින් මහ තෙරුන් වහන්සේගේ වචනය මුදුණෙන් පිළිගෙන.

"අහං මනුස්සෙසු මනුස්සභූතා පුරිමායජාතියා මනුස්සලොකෙ,
දිස්වාන භික්ඛු තසිතෙ කිලන්තෙ වුට්ඨාය පාතුං උදකං අදාසිං.
යොවෙ කිලන්තානපිපාසිතානං වුට්ඨාය පාතුං උදකං දදාති,
සීතොදිකා තස්ස භවන්ති නජ්ජො පහූතමල්‍යාබහුපුණ්ඩරිකා.
තමාපගා අනුපරියන්ති සබ්බදා සීතොදිකා වාලුකසන්ථතා නදී
අම්බා ච සාලා තිලකා ච ජම්බුයො උද්දාලකා පාටලියො ච ඵුල්ලාඃ
තං භූමිභාගෙහි උපෙතරූපං විමානසෙට්ඨං භුස සොභමානං
තස්සීධ කම්මස්ස අයං විපාකො එතාදිසා කතපුඤ්ඤා ලභන්ති.
තෙන මෙ-ප-පභාසතී"ති.

යනුහෙයින්, "ස්වාමීනි, මම මීට පූර්වජාතියෙහි මනුෂ්‍යයන් අතුරෙන් මනුෂ්‍යධර්මයෙහි පිහිටා විද්‍යමාන මිනිසුන්ට අනන්‍යගීතව මිනිස්ලොව ඉපද මේ බුද්ධොත්පාද කාලයෙහි ගමන් විඩාව පිපාසයෙන් කලාන්තවූ භික්ෂූන් දැක අනලස්ව පහන් සිත් ඇතිව පානය පිණිස පැන් පමණින්

---

+ මාණික්‍යමය - සමහර පොතක

පූජාකෙළෙමි. ඒ කුශලයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි. එසේහෙයින් පිපාසයෙන් කලාන්තවූ කෙනෙකුන්ට පහන් සිත් ඇතිව යමෙක් බොන පැන් දි උපකාරකෙළේවි නම් ඔහු මා සේම සිහිල්ජලයෙන් පිරුණාවූ පඤ්චවර්ණපද්මයෙන් ගැවසීගත්තාවූ පුෂ්කරණියෙන්ද වෛජයන්ත ප්‍රාසාදය වැනිවූ විමානයෙන්ද ඒ විමානය වට හාත්පසින් පවුරු වළල්ලක් සේ නිරන්තර යෙන් ජලවහනය වන්නාවූ රිදී පටක්සේ රජතමය සුදුවැලි තලාවෙන් හෙබියාවූ ගංගාවෝද ඒ ගංතෙර සියලු භූමිභාගයෙහි විමානයට හාත්පසින් මුල පටන් අග දක්වා පිපී වැනිගීය මලින් ගැවසිගත්තාවූ අඹ දඹ සල් පළොල් ඇසළ තිලකාදී වූ නානා ප්‍රකාර සුවඳ මල් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිතවූ උයනින්දැයි මෙසේ මහත් ශ්‍රෙෂ්ඨවූ අතිශයින් දීප්තිමත්ව බබලන්නාවූ උද්‍යාන විමාන පුෂ්කරණ්‍යාදීවූ දිව්‍යසම්පත් ලබන්නේය"යි කියා, ස්වාමීනි, කිසියම් අගයක් නැත්තාවූ නිරන්තරයෙන් මුහුදටම යන්නාවූ ඉතා ස්වල්ප වූ පැන් පමණක් පූජාකළාවූ කුශලානුභාවයෙන් මෙබඳු දිව්‍ය සම්පත්තියක් ලදින් දශදිග් බබුලුවමි" කිව. එකල්හි මුගලන් මහතෙරහු යටකී ක්‍රමයෙන් බණ වදරා බුදුරජාණන් වහන්සේ දැන්වූ සේක බුදුහු එම අත්‍ථෝත්පත්තිකොටගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදළ සේක. ඒ ධර්‍මදෙශනාව බොහෝදෙනාට ප්‍රයෝජනවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි
**පීඨවර්ගයෙහි නාවුකා විමාන වර්ණනාව**
කියා නිමවනලදි.

## 7. දුතිය නාවුකා විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි හත්වන දුතිය නාවුකා විමාන වස්තුව නම් කවරියත්:-

තුන්ලෝවාසින්ගේ ආමිෂ ප්‍රතිපත්ති පූජාවට සුදුසුවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාම විහාරයෙහි වැඩ වාසය කර වදරණසේක. එසමයෙහි වනාහි එක්තරා රහත් කෙනෙකුන් වහන්සේ වස්වසන කාලය ආසන්නවූ කල්හි ග්‍රාමකාවාසයෙක්හි වස්වසනු කැමතිව සැවැත් නුවරින් නික්ම වස් විසීමට සුදුසු ගමක් සොයමින් සවස්භාගයෙහි දීර්‍ඝමාර්‍ගයට පිළිපන්සේක, මාර්‍ගයාගේ දුර්‍ඝත්වය කරණ කොටගෙන කලාන්තවූයේ නටුවාවූ ශරීර ඇතිව අතුරු මාර්‍ගයෙහි

එක්තරා ගමකට පැමිණියේය. එසේ පිටගමකට පැමිණද සෙවනින් යුත් තැනෙක් හෝ ජලයෙන් යුක්තවූ තැනෙක් හෝ නොදක්නේ මාර්ගයාගේ දුර්ගත්වයෙන් මඩිනු ලබන්නාවූ සිවුරු පොරවා ආසන්නවූ ගමට ප්‍රවිෂ්ටව ඒ ගම ඉතා දුරින් පිහිටියාවූ ගෙයක්හි දොර සමීපයෙහි වැඩ සිටිසේක. එකල්හි ඒ ගෘහයෙහි වසන්නාවූ එක්තරා ස්ත්‍රියක් තොමෝ තෙරුන්වහන්සේ දැක, "ස්වාමිනි, කොහිසිට වැඩිසේකදැ"?යි විචාරා, මාර්ග ක්ලාන්ත බවද, පිපාසිතබවද, දැන, "වඩිනුමැනව, ස්වාමීන්වහන්සැයි කියා "ගෙට වැඩමවා වැඩහිඳ වදාළමැනව"යි ආසනයක් පනවා දුන්නිය. ඉක්බිති තෙරුන් වහන්සේ අස්නෙහි වැඩහිඳ වදාළසේක. ඒ ස්ත්‍රීතොමෝ තෙරුන්වහන්සේට පාදෝනා පැන් හා පාදයන්හි ගැල්වීමට තෙල්ද පිළිගන්වා තල්වැටක් ගෙන පවන් සැලූවාය. පවන් සලා පරිදහයන් සන්සිඳුනු කල්හි මිහිරිවූ සුගන්ධවත්වූ සිහිල්වූ පානවර්ගයක් යොදා වළඳනු පිණිස පිළිගැන්වූවාය. තෙරුන් වහන්සේ ඒ පානය වළඳ සන්සිඳෙනලද ක්ලාන්ත ස්වභාව ඇති සේක් අනුමෝදනා වදරා වැඩිසේක. ඒ ස්ත්‍රීතොමෝ මෑත කලෙක්හි කාලක්‍රියාකොට එම කුශලයාගේ හෙතුවෙන් තවුතිසා භවනයෙහි උපන්නීය. මෙහි අනෙකුදු සියලු ප්‍රවෘත්තිහු පළමුවන නාවුකා විමාන වස්තුවෙහි ප්‍රකාශවූ පරිදි දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි
**සත්වන දුතිය නාවුකා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදි.

## 8. තතිය නාවුකා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තතිය නාවුකා විමාන වස්තුව නම් කවරියත්:- සර්වලොකෙක නායකවූ බුදුරජාණෝ කොසොල්රට සැරිසරා වඩනාසේක් භික්ෂු සඞ්ඝයා පිරිවරා ථූන නම් බමුණුගමට වැඩිසේක. එගම්වැස්සෝ බුදුන් වඩනා බව අසා මාර්ගවල් අවුරා ලිං පොකුණු ආදියත් පිදුරුවලින් වසා දන මානාදි වශයෙන් කිසි උපකාරයක් නොකටයුතුයයි කියා කතිකා කළ බැවින් මනුෂ්‍යයෝ බුදුන්ට හා සංඝයාට කිසි උපකාරයක් නොකරන්නාහ. එසමයෙහි බමුණෙකුගේ දසියක් පැන් කළයක් ගෙනයන්නී ගසක් මුල වැඩහුන් බුදුන් දැක, "ගම්වැසියෝ මට කුමක්කරතත් බුදුන්ට පැන් දී මිස නොනවතිමි" සිතා හිස තුබූ පැන්කළය ගෙන ගොස් බුදුන්ට පැන්

පිළිගන්වා මහසංඝයාටත් පැන් පිළිගන්වා අඩුනොව තිබෙන පැන් කළය දැක ප්‍රීතියෙන් පිනපිනා, මගේ ජීවිතය සඵලවියයි සිතා පැන් කළය ගෙන ගෙට අභිමුඛව යන්නිය. ඇගේ ස්වාමිවූ බ්‍රාහ්මණයා එපවත් අසා, ගම්වැස්සන් කළකතිකාවත් බිඳ මටත් නින්‍දා කළහයි කියා බිම හෙලා අතින් පයින් ඇණ මැරීය ඒ දසිතොමෝ පැන් පූජා කළ කුසලයෙන් තවුතිසා භවනයෙහි රන් විමනෙක උපන්නීය.

ඉක්බිති බුදුරජාණෝ ලිඳකින් පැන් ගෙනඑවයි කියා අනඳ මහතෙරුන්වහන්සේට වදාළ සේක. මහතෙරහු පාත්‍රය ගෙන ලිඳ සමීපයට වඩනාකල පිදුරු බොල් ආදිය ඉපිල පැන් ඉතිර නැගෙමින් ලින් පැන් පොකුණු ආදිය පුරා ගියේය. මනුෂ්‍යයෝ ඒ ආශ්චර්‍ය්‍ය දැක සතුටුව වැඩ ඉන්ට සෙනසුන් සලස්වා දෙවන දවස් සියලු ථූණ නම් බමුණු ගම්වැස්සෝ එක්ව බුදුපාමොක් මහා සංඝයා වහන්සේ වළඳවා ඉක්බිති බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහුය. ඒ දිව්‍යාඞ්ගනාව පැන් පූජාවෙහි අනුසස් හා තුනුරුවන්ගේ ගුණ ප්‍රකාශකරවනු පිණිස නාවුකා විමානාරූඪව අවුත් බුදුන් වැඳ දිලිහි දිළිහී සිටියාය බුදුරජානෝ ඇගේ කුශල කර්‍මය ඒ දිව්‍යාඞ්ගනාව ලවාම ප්‍රකාශ කරවා චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක දිව්‍යාඞ්ගනාව සෝවාන් ඵලයෙහි පිහිටා බුදුන් වැඳ අවසර ගෙන ගියාය. ඒ ධර්‍මදෙශනාව බොහෝ දෙනාට සාත්‍ථිකවිය. මෙහි විස්තර දන පරිච්ඡේදයෙන් දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි
**පීඨ වර්‍ගයෙහි තතිය නාවුකා විමාන** වස්තුව
සංක්‍ෂෙපයෙන් කියා නිමවන ලදී.

## 9. දීප විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨ වර්‍ගයෙහි දීප විමාන වස්තුව නම් කවරයත්? හේ මෙසේ දතයුතු-

විනය ජන නලින විකාසනාංසුමාලීභවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන සමයෙහි එක්තරා පොහෝදිනයෙක බොහෝ උපාසකවරු පෙහෙවස් සමාදන්ව ඔවුනොවුන්ගේ ශක්ති පමණින් පෙරවරු දන් දී ඉක්බිති පෙරවරු කාලයෙහිම බත් අනුභව කොට පස්වරු භාගයෙහි සුදු පිළිහැඳ සුදුපිළි එකාංශකොට සඳුන් තුවරලාදි සුවඳ බඩු හා ගෙතු නොගෙතු නොයෙක් සුවඳ මල් ගත් අත් ඇතිව විහාරයට ගොස් ඔවුනොවුන් අභිප්‍රායවූ භික්‍ෂූන් කරා ගොස් භජනය සෙවනය කොට වැඳ පුද ඉක්බිති සවස ධර්‍මශාලාවෙහි බණ

අසන්නාහු විහාරයෙහිම වසනු කැමතිව ගිය හෙයින් බණ අසමින් සිටියදීම සූර්‍ය්‍යාස්තඞ්ගතවී අන්ධකාර විය. එකල්හි නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා ස්ත්‍රියක් "දැන් වනාහි පහන් ආලෝකය උවමනා කල් වන්නේය. එසේ හෙයින් මා විසින් පහණක් දැල්වුව මැනව"යි සිතා අගේ වාසභවනයෙන් පහන් තෙල් ආදී උපකරණ ගෙන්වා පහණක් දල්වා ධර්‍මාසනය පෙරටුව තබා සතුටුව බණ අසා ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ඇ විසින් පිදූ ප්‍රදීප දානය සිහිකොට ගියාය. ඉන් නොබෝ කලක් ගිය පසු කාලක්‍රියා කොට ඒ කුශල කර්‍මය හෙතුකොට ගෙන තවුතිසා භවනයෙහි හිරු විමනක් සේ නොයෙක් රශ්මිජාලාවෙන් දිප්තිමත්ව බබලන්නාවූ මහත් ජොතිරස විමානයක උපන්නීය, ඇගේ ශරීරප්‍රභාව වනාහි සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තාරකා මධ්‍යයෙහි දිලියෙන පූර්‍ණ චන්‍ද්‍රයා සේ ශරීරාලොකයෙන් දසදිග් බබුලුවමින් මහත්වූ දිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කරන්නීය. එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ තවුතිසා භවනයෙහි දෙවචාරිකාවෙහි හැසිරෙණ සේක් හිරු සඳසේ ශරීරාලොකයෙන් දිලිහි දිලිහී දහසක් දෙවඟනන් පිරිවරා දිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කරන්නාවූ දිව්‍යාඞ්ගනාව දැක මේ සම්පත් ලැබීමට ඇ විසින් පූර්‍වජාතියෙහි කළාවූ සුචරිත කර්‍මය ප්‍රකාශ කරවනු කැමති මහ තෙරුන් වහන්සේ-

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා
කෙන තෙ තාදිසො වණ්ණො-පෙ-පභාසතී"ති.

යනුහෙයින්, "එම්බා දෙවතාදුව යම්සේ ඔසධී තාරකා අනික් තාරකාවන් අභිභවමින් දසදිගුන් එකාලොක කෙරේද, එමෙන් සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තීගේ මහත් වූ රූපශ්‍රී ශොභාවෙන්ද යහපත්වූ ඡවි වර්‍ණයෙන්ද දශදිග් එකාලොක කෙරෙමින් ජොතිමත්ව බබලන්නීය"යි මෙසේ පළකොට ඇගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් ප්‍රකාශකොට ඊට අනතුරුව, "මෙබඳු විමානයක් හාත්පසින් ජොතිමත්ව බබලන්නාවූ ශරීර වර්‍ණයක් හා පරිභොග කටයුතු වස්ත්‍රාභරණාදී මෙබඳු උපකරණයක් හා ප්‍රිය පරිභොග කටයුතුවූ මෙබඳු සම්පත්තියක් පෙර මිනිස් ලොවදී කවර කුශලයක් කොට ලබන ලද්දීද? කවර කාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දසදිග් බබුලුවාදැ"යි විචාරා වදළසේක. මෙසේ තෙරුන් වහන්සේ විසින් විචාළ ප්‍රශ්නය දෙවතා දුව විසඳු පරිදි හඟවන පිණිස සඞ්ගීති කාරක මහා ස්ථවිරයන් විසින්-

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, මුගලන් මහ තෙරුන් වහන්සේ ගේ වචනය මුදුනෙන් පිළිගෙන ප්‍රශ්නය විසර්ජනය කරන්නාවූ දෙවතාදූ තොමෝ,

"අහං මනුස්සෙසු මනුස්සභූතා පුරිමාය ජාතියා මනුස්සලොකෙ.
තමන්ධකාරම්හි තිමිසිකායං පදීපකාලම්හි අදං පදීපං.
යො අන්ධකාරම්හි තිමිසිකායං පදීපකාලම්හි ද දති දීපං,
උප්පජ්ජති ජොතිරසං විමානං පහූතමල්‍යං බහුපුණ්ඩරිකං.
තෙන මෙ තාදිසො වණ්ණො තෙන මෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසො පියා".

තෙනම්හි එවං ජලිතානුභාවා,
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසති.
තෙනාහං විමලොභාසා අතිරොචාමි දෙවතා,
තෙන මෙ සබ්බ ගතෙතහි සබ්බා ඔභාසතෙ දිසා"ති.

යනු හෙයින්, "ස්වාමීනි මම මීට පූර්වජාතියෙහි මිනිස්ලොව ඉපිද විද්‍යමාන මනුෂ්‍යයන්ට අනතගීතව මෙලෝ පරලෝ හැදින වසන්නෙමි, එක්තරා පොහෝ දිනයෙක ධර්මශාලාවකට ගොස් රාත්‍රිකාලයෙහි පහන්සිත් ඇතිව පහණක් දල්වා ධර්මාශනය පෙරටුව පුද සතුටුව බණ ඇසීම් එපමණ කුශලානුභාවයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි. එසේ හෙයින් මේ ලොකයෙහි ස්ත්‍රී පුරුෂාදීන් අතුරෙන් යම්කිසි කෙනෙක් මහත්වූ බහලාන්ධකාර ඇතිව ප්‍රදීපාලොකයෙන් ප්‍රයෝජන ඇති කාලයෙහි පහණක් දල්වා වේවයි, ප්‍රදීපයට හිතවූ පහන්වැටි පහන් කඳු පහන් තෙල් පහන් මලාදී උපකරණ සපයා වේවයි, පහන් සිත් ඇතිව පූජාකෙළේවි නම් මා සේම උත්පත්තික්ෂණයෙහිම මහත් ගිනි කඳක්සේ දිළියෙන්නාවූ නොයෙක් රශ්මිමාලාවෙන් හා සෙවනොත්පල නීලොත්පලාදී වූ නොයෙක් මලින් සරහනලද ශ්‍රීයහනින්ද මාලාකර්ම ලතාකර්මාදි නොයෙක් විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන්ද හෙබියාවූ ජොතිරස විමානයෙක ඉපිද ශරීර වර්ණයෙන්ද සෙසු දෙවතාවන් අභිභවමින් දශදිග් බබුළුවන්නේ වේදැ"යි කියා "නැවත ස්වාමීනි මමද පහන් පූජාවෙහි ආනිශංසයෙන් මෙබඳු සම්පත්තියෙන්ද ශරීර ප්‍රභාවෙන්ද දශදිග් බබුළුවමි" කිව. මහ තෙරුන් වහන්සේ විසින් විචාරණලද ප්‍රශ්නය ඒ දෙවතාදූව විසින් විසඳූ කල්හි මහ තෙරුන් වහන්සේ ඒ දෙවතා දූවගේ චරිතය බලා හෙතු සම්පත් ඇතිහෙයින් මාර්ගඵලාධිගමයට සමර්ථයයි දැන චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදළ සේක. ඒ ධර්මදෙශනාවසානයෙහි ඒ දිව්‍යාඞ්ගනාව සහපිරිවරින් සෝවාන් ඵලයෙහි පිහිටියාය. ඉක්බිති මහ තෙරුන් වහන්සේ මිනිස් ලොවට අවුත් ඒ සියලුම ප්‍රවෘත්තිය බුදුරජාණන් වහන්සේට දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අත්ථොත්පත්තිකොට

ගෙන එතැන්හි රැස්වූ පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයෝජන විය. එතැන් පටන් බොහෝසේම මනුෂ්‍යයෝ පහන් පූජාකොට ස්වර්ග පරායණ වූහ.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨ වර්ගයෙහි
**දීප විමාන වස්තුව** කියා නිමවන ලදී.

## 10. තිලදක්ෂිණා විමාන වස්තුව.

තවද, මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **පීඨ වර්ගයෙහිතිල දක්ෂිණා විමාන වස්තුව** නම් කවරැයත්?

මුනිභමරගණාභිචුම්බිත පාදපඞ්කජොපෙතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක එසමයෙහි රජගහනුවර වසන්නා වූ දරුගැබ් ඇති එක්තරා ස්ත්‍රීයක් තෙල් සිදිනා කැමතිව තල සුහක් සෝඩා අව්වෙහි ලා වියලන්නීය. ඕ තොමෝ ගෙවුනාවූ ආයු ඇති හෙයින් එදවස්ම කාලක්‍රියාකොට නරකයෙහි උපදනා අකුශල් ඇත්තීය. එසේ හෙයින් එදවස් ම ඇගේ අකුශල කර්මයට අවකාශව සිටියේය. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ අළුයම් වේලෙහි මහා කරුණා සමාපත්තීන් නැගී මුළු ලෝ බලා වදරණසේක් ඒ ගර්භිණිය දැක වදරා ඈ කෙරෙහි කරුණා උපදවා සිතා වදරණ සේක්, මේ ස්ත්‍රිය මේ දවස්ම කාලක්‍රියාකොට නරකයෙහි උපදියි. දැන් මා එතනට ගියකල වියලන්නාවූ තල රැසින් තල දෙහොතක් පූජා කෙරෙයි. ඒ කුශල කර්මය ඈට ප්‍රතිෂ්ඨාධාරව ස්වර්ගාපවර්ග සම්පත්තියට කාරණා වන්නේය`යි සර්වඥතාඥනයෙන් දැක වදරා තිලප්‍රතිග්‍රහණයෙන් නරකයට යන ගමන් වළකා ස්වර්ගුපගමනය කෙළේවී නම් ඉතා යෙහෙකැ`යි කරුණා කොට වදරා සර්වඥයන් වහන්සේ එකෙණෙහිම සැවැත් නුවරින් රජගහ නුවරට ඇසිල්ලකින් වැඩ පූර්වාහන කාලයෙහි සිවුරු ගැටවටු ගන්වා පාත්‍රා ධාතුව ශ්‍රී හස්තයට ගෙන වදරා රජගහ නුවර ගෙපිළිවෙලින් පිඩුසිගා වඩනාසේක් ඇගේ ගෙදෙරට පැමිණිසේක. එකල්හි ඒ ස්ත්‍රි තොමෝ ගිනිකඳක් සේ දිළිහි දිළිහී දෙර සමීපයෙහි වැඩ සිටි බුදුන් දැක මහත් වූ බුඩාලම්බන ප්‍රීතිය උපදවා ප්‍රීති සොම්නස් ඇතිව වහාම හුන් තැනින් නැගී සිට බුදුන් වැඳ ඉක්බිති දන් දියයුතු වූ කිසිවක් ඇද්දැයි බලා නොදැක අත්පා පිරිසුදු කොට වියලන තල එකතැන්කොට තල

දෙහොතක් පමණ ගෙන ගොස් බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වා නමස්කාර කළාය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඈ කෙරෙහි කරුණාවෙන් "සුවපත් වේවා"යි වදරා වැඩිසේක. ඒ ස්ත්‍රී තොමෝ එම දින රැය අළුයම් වේලෙහි කාලක්‍රියාකොට ඒ කුශලානුභාවයෙන් නරකයට යන ගමන් වැළකී නිද පිබිදියාක්හුසේ තවුතිසා දිව්‍ය ලොකයෙහි අටසාලිස් ගව් පමණ රන්විමනෙක උපන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙහි හැසිරෙණ සේක්, දහසක් දෙවඟනන් පිරිවරා මහත්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් ශ්‍රී සම්පත් අනුභව කරන්නාවූ ඒ දෙවතාදුව දැක වදරා ඈ විසින් මේ සම්පත් ලැබීමට පූර්වජාතියෙහි කළාවූ කුශල ප්‍රකාශ කරවනු කැමතිව විචාරා වදරණ මහ තෙරුන් වහන්සේ-

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ.
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා,
කෙන තෙ තාදිසො වණ්ණො-පෙ-පභාසතී"ති.

යනුහෙයින්, "එම්බා දෙවතා දුව යම්සේ ඔසධී තාරකා අවශේෂ තාරකාවන් අභිභවමින් දසදිගුන් ඒකාලෝක කෙරේද එමෙන් සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තීගේ මහත්වූ රූපශ්‍රී ශොභාවෙන්ද ඡවි වර්ණයෙන්ද දශදිග් එකාලොක කෙරෙමින් ජොතිමත්ව බබලන්නීය"යි මෙසේ පළමු කොට ඇගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් සංක්‍ෂෙපයෙන් ප්‍රකාශකොට ඊට අනතුරුව, "මෙබඳු විමානයක් හා හාත්පසින් ජොතිමත්ව බබලන්නාවූ ශරීර වර්ණයක් හා පරිභොග කටයුතුවූ වස්ත්‍රා භරණ උද්‍යාන විමානාදී මෙබඳු සම්පත්තියක් පෙර මිනිස් ලොව දී කවර කුශල කර්මයක් කොට ලබන ලද්දීද, කවර කාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දශදිග් බබුලුවාදැ"යි විචාරා වදළසේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණ ලද්දවූ ප්‍රශ්න විසර්ජනය කරණ ඒ දෙවතා දූ තොමෝ "බුදුගුණ සිහිකොට ස්වල්ප දනයෙන් මෙතෙක් සම්පත්තියක් ලද්දෙමි"යි සතුටුව මහ තෙරුන් වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන-

"අහං මනුස්සෙසු මනුස්ස භූතා,
පුරිමාය ජාතියා මනුස්ස ලොකෙ,
අද්දසං විරජං බුද්ධං විප්පසන්නමනාවිලං,

ආසජ්ජ දනං අදසිං අකාමා තිල දක්ඛිණං,
දක්ඛිණෙය්‍යස්ස බුද්ධස්ස පසන්නා සෙහිපාණිහි,
තෙන මෙ-පෙ-පභාසතී"ති.

යනුහෙයින්, "ස්වාමීනි මම මීට පූර්ව ජාතියෙහි මෙම බුද්ධොත්පාද කාලයෙහි මිනිස් ලොව ඉපිද විද්‍යමාන මිනිසුන්ට අනතගීතව දවස් යවන්නෙමි, එසමයෙහි එක් දවසක් තෙල් පිණිස තල සොධා අව්වෙහි ලා වියලන්නේ, එකල්හි දිපදේත්තමවූ බුදුරජාණන් වහන්සේ සත්ව කරුණාවෙන් පිඬුසිඟා වඩනා සේක් මාගේ ගෙදෙරට වැඩිසේක. බුදුන් දැක හටගත්තාවූ බලවත් ප්‍රීතිසොම්නස් ඇතිව දන් දියයුත්තක් නොදැක තල දෙහොතක් පූජාකෙළෙමි. තල දන් දී දිව්‍යසම්පත් ලබමි. කියා පළමු දන් දෙනු කැමතිව සිදු කළ කිසි උත්සාහයක් නැතිවම දක්ෂිණාවත්ශ්‍රධාවත් සම්ප්‍රාප්ත වූ හෙයින් බුදුන් දුටුකෙණෙහිම සිත පහදවා අග්‍රදක්ෂිණෙය්‍ය වූ සර්වඥයන් වහන්සේට දුන්නාවූ ස්වල්ප දනමය කුශලකර්මය හෙතුකොටගෙන මෙබඳු සම්පත්තියක් ලදිමි යි, ස්වාමීනි" කිව. එකල්හි මහ තෙරහු පිරිවර සහිත දෙවතා දුවට විස්තරවශයෙන් බණ වදරා මිනිස්ලොවට අවුත් බුදුරජාණන් වහන්සේට දැන්වූසේක බුදුරජාණන් වහන්සේ එම අතේථොත්පත්ති කොටගෙන එතැන්හි පැමිණි පිරිසට ධර්මදේශනා කොට වදළ සේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨවර්ගයෙහි
**තිල දක්ෂිණා විමාන වස්තුව**
කියා නිමවන ලදී.

## 11. පතිව්‍රතා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨවර්ගයෙහි පතිව්‍රතා විමාන වස්තුව නම් කවරයත්:- එහි උත්පත්ති කථාව මෙසේ දතයුතු.

සනරාමරලොක ගුරුවූ භාග්‍යවත් සර්වඥරාජොත්තමයාණන් වහන්සේ එක් සමයෙක සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි නාමගොත්‍රයෙන් අප්‍රසිඬවූ එක්තරා ස්ත්‍රියක් පතිව්‍රතා ධර්මය රක්ෂා කරන්නී ස්වාමිපුත්‍රයාට කීකරුව චිත්තානුකූලවූ පැවැතුම් ඇතිව පුත්‍රයෙකු රක්නා මෑණි කෙනෙකුන්සේ කන බොන දෙය මියුරුකොට දීමෙන්ද වරද ඉවසීමෙන්ද ආචාර සමාචාර කිරීමෙන් අත් පා මෙහෙකිරීමෙන්ද අප්‍රිය වචනයෙන් දුරුව ප්‍රියවචන කීමෙන්ද මුසාවාදයෙන්

දුරුව සැබෑ වචන කීමෙන්ද අඛණ්ඩ කොට පඤ්චශීලය රක්‍ෂා කෙරමින් ස්වාමියා හැර අනෙක් පුරුෂයෙකුගේ මුහුණ කාමයෙන් අන්ධව රාගසිතින් නොබලා පතිව්‍රතා ධර්මය නොකඩකොට රක්‍ෂාකෙරෙමින් ශ්‍රද්ධාදී ගුණධර්මයෙහි පිහිටා ශක්ති වූ පරිද්දෙන්දන් දෙමින් නොයෙක් කුශල් කෙරෙමින් වසන්නී එක්තරා රෝගයකින් පෙළෙන ලද්දී කාලක්‍රියා කොට තවුතිසා භවනයෙහි මහත්වූ රන්විමනෙක උපන්නීය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් තවුතිසා භවනයට වැඩ දහසක් දෙවඟනන් පිරිවරා සැට ගැලක් පමණ සර්වාභරණයෙන් සැරහී මහත්වූ දිව්‍ය ශ්‍රී සම්පත් අනුභවකරන්නාවූ ඒ දෙවතාදුව දැක ඇගේ විමානය සමීපයට ගොස් වැඩ සිටිසේක. එකල්හි ඒ දෙවතාදුව දහසක් දෙවඟනන් පිරිවරා මහතෙරුන්වහන්සේගේ ශ්‍රීපාදයට නමස්කාර කොට එකත්පස්ව සිටියාය එකල්හි මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යාඞ්ගනාව විසින් පූර්වජාතියෙහි කළාවූ සුචරිතකර්මය ඒ දෙවතාදුව ලවාම ප්‍රකාශකරවනු කැමතිව මේ ගාථාවන්ගෙන් මෙසේ විචාරා වදාළසේක.

"කොඤ්චා මයූරා දිවියාච හංසා.
වග්ගුස්සරා කොකිලා සම්පතන්ති,
පුප්ඵාභිකිණ්ණං රම්මමිදං විමානං,
අනෙක චිත්තං නරනාරි සෙවිතං.
තත්ථච්ඡසී දෙවි මහානුභාවෙ,
ඉද්ධි විකුබ්බන්ති අනෙකරූපා.
ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො,
නච්චන්ති ගායන්ති පමොදයන්ති.
දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ.
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා,
වණ්ණො ච තෙ සබ්බදිසාපභාසතී" ති.

යනුහෙයින්, "එම්බා දෙවතාදුව, රන් රිදී මුතු මැණික් ආදි නොයෙක් රත්නයෙන් විසිතුරුවූ භිත්තිස්තම්භසොපාන මාලා කර්මාදි අනෙක ප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් හෙබියාවූ විමානයෙන්ද එසේම අනෙකවිධ රත්නයෙන් ශොභාමත්වූ පවුරු හා වාසලින් අලඞ්කෘත වූ උයන් පොකුණු ගල්තලා කල්පවෘක්‍ෂාදී යෙන්ද ශොභාමත්විය. තවද මේ විමානයෙහි ගෙතු නොගෙතු නොයෙක් මලින් සැරහි චිත්තාභිරමණය කරන්නාවූ පරිවාර දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවන් විසින් නිරන්තරයෙන්

ගැවසී ගත්තේය. මේ විමානය හාත්පසින් කොස්ලිහිණියෝද මයුරයෝද සවර්ණහංසාදිහංසයෝද කාලකොකිල පුස්සකොකිලාදී කොවුල්ලෝද යන පක්ෂිසමූහයන් ඒ ඒ තැන මනොඥවූ මධුරස්වරයෙන් නාද කෙරෙමින් තීගේ චිත්තාභිරමණය පිණිස ලලනය කෙරෙමින් නටති, ලීලා දක්වති. මේ සියල්ල අධිපතිවූ මහානුභාවසම්පන්න වූ යහපත්වූ රූපශ්‍රී ඇත්තාවූ එම්බා දෙවතාදුව, හංසමයුරාදී අනෙක ප්‍රකාර රූප මවා නානාවර්ණ යෙන් සැරහී අනෙක විධ වූ ලීලා දක්වා නටන හෙයින් විකුර්වණ සෘඩියෙක් මෙන් තීගේ කර්මනැමති විකුර්වණ සෘඩියෙන් පහළ වූ පරිවාර ස්ත්‍රීන් හා දිව්‍යපුත්‍රයන් විසින් අනෙකප්‍රකාර ලීලා දක්වමින් හාත්පසින් නටති, ගී කියති, ගායනා කෙරෙති, සතුටු එලවති' යනාදීන් පළමුකොට ඇගේ සම්පත් ප්‍රකාශ කොට ඊට අනතුරුව, 'මහත් දිව්‍යසෘඩිප්‍රාප්ත මහානුභාවසම්පන්න එම්බා දිව්‍යාඞගනාව, තී මීට පූර්වජාතියෙහි මනුෂ්‍යභූතව කවර කුසලයක් කොට මෙබඳු දිව්‍ය සෘඩියෙක් දිව්‍යානුභාවයක් දිව්‍යසම්පත්තියක් ලද්දීද, කවර කාරණයකින් මෙබඳු වස්ත්‍රාභරණාදී යෙන් හා ශරීරවර්ණයෙන්ද දශදිග් බබුලුවාද මීට කාරණාවූ සුචරිත කර්මය ප්‍රකාශකොට කියව'යි වදළසේක

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, සතුටුව මහතෙරුන් වහන්සේගේ වචනය මුදුණෙන් පිළිගෙනඃ-

"අහං මනුස්සෙසු මනුස්සභූතා,
පතිබ්බා නාඤ්ඤමනා අහොසිං
මාතාව පුත්තං අනුරක්ඛමානා
කුද්ධාපහං නප්ඵරුසං අවොචං.
සච්චෙ ඨිතා මොසවජ්ජං පහාය,
දානෙ රතා සඞ්ගහිතත්තභාවා
අන්නං ච පානං ච පසන්නභාවා
සක්කච්චදානං විපුලං අදාසිං,
තෙන මෙ-පෙ-පභාසති" ති

යනුහෙයින්, "ස්වාමීනි මම මීට පූර්වජාතියෙහි මෙම බුද්ධොත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපද ශීලාදී ගුණධර්මයෙහි පිහිටා පතිව්‍රතාධර්මය රක්ෂාකරන්නෙමි, මාගේ ස්වාමිපුත්‍රයා හැර රාග චෙතනාවෙන් පෙරළියාවූ සිත් ඇතිව අනෙක් පුරුෂයෙකුගේ මුහුණ කිසිකලෙකත් නොබැලුවෙමි.

පුත්‍රයකු රක්නා මෑණියකුසේ අවැඩ දුරුකිරීමෙන් වැඩෙහි පිහිටුවනු කැමතිව දයානුකම්පා ඇතිව මාගේ ස්වාමිපුත්‍රයා රක්‍ෂා කෙළෙමි. අනුන් කළ වරදක් නිසාවත් ස්වාමිපුත්‍රයන් කිපි කලද පරුෂ වචනයෙන් බණනලකලද පරුෂ වචනයක් නොකියෙමි. ප්‍රිය බස්ම කීමි. සතුටින් මුත් කිපි සිතින් කිසිකලෙකත් මාහිමියන් මුහුණනොබැලූ යෙමි එකාන්තයෙන් මුසාවාදයෙන් දුරුව සැබෑ බස්ම කීමි. දනයෙහි ඇළුම් ඇතිව දන, ප්‍රියවචන, අර්ථචර්‍ය්‍යා, සාමානාත්මතාය යන සතර සඞ්ග්‍රහවෙන් අනුන්ට සංග්‍රහකෙළෙමි. ශ්‍රද්ධාසමාධියෙහි යෙදෙමින් කර්මඵල අදහමින් අන්න පාන වස්ත්‍රාභරණාදියෙන් උදරතරවූ මහත් දන්සරහා සකස්කොට පූජාකෙළෙමි. මෙපමණ කුශලකර්මයන් හෙතුකොටගෙන මෙබඳුවූ දිව්‍යශ්‍රී සම්පත්තියක් ලදින් ශරීරවර්ණයෙන් දශදිග් බබුලුවමි, කිව. මෙසේ මහතෙරුන්වහන්සේ විසින් විචාළාවූ ප්‍රශ්නය ඒ දෙවතා දුව විසින් විස්සජ්ජනය කළකල්හි මහතෙරුන්වහන්සේ පරිවාර සහිත ඒ දෙවතාදූවට විස්තර වශයෙන් බණ වදරා ඉක්බිති මිනිස්ලොවට වැඩ ප්‍රශ්න පුච්ඡා විස්සජ්ජන දෙක යුක්තකොට බුදුරජාණන් වහන්සේට දැන්වූසේක. බුදුහු එම අර්ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදළසේක, ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථක විය.

දෙවැනිවූ පතිව්‍රතා විමාන වර්ණාවද මේ නයින් දතයුතු.
මේ විමාන වස්තු ප්‍රකරණයෙහි
**පීඨවර්ගයෙහි පතිව්‍රතා විමාන වර්ණාව**
කියා නිමවන ලදි

## 12. දෙවන පතිව්‍රතා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි දෙළොස් වැනිවූ දුතිය පතිව්‍රතා විමාන වස්තුව නම් කවරැයත්-

අසෙසජනවන්‍දනීයවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසයකර වදරණසේක එසමයෙහි එක්තරා උපාසිකාවක් තොමෝ පතිව්‍රතා රක්‍ෂාකරන්නී ශ්‍රද්ධායෙන් යුක්තවූවා ඉතා පිරිසිදුකොට පන්සිල් රක්‍ෂා කළාය. එසේම ශක්ති පමණින් දනයන්ද දුන්නීය. මෑත කලෙක්හි ඕ තොමෝ කාලක්‍රියාකොට තව්තිසා භවනයෙහි දෙළොස් යොදුන් පමණ වූ වෛඩූර්‍ය්‍ය ප්‍රාසාදයෙක්හි උපන්නීය. අනෙකුදු සියලූ විස්තර කථාව පළමුවන පතිව්‍රතා විමාන

වස්තුවෙහි කියන ලද පරිදි දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි
**දෙලොස්වැනිවූ දෙවන පතිව්‍රතා විමාන වස්තුවර්ණනාව**
කියා නිමවනලදි.

# 13. සුණිසා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තෙළෙස් වැනිවූ සුණිසා විමාන වස්තුව නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු හේ කෙසේද යත්?

තුන්ලෝවාසීන්ට ප්‍රදීපයක් බඳුවූ ජගදනන්දලොචනවූ පර දුකබදුකකිතවූ කරුණානිධානවූ මාගේ සම්මාසම්බුදුරාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර එක්තරා කුලගෙයෙක්හි ස්වාමිකුලයට පැමිණි එක්තරා යෙහෙළියක්තොමෝ පෙරවරු වේලෙහි තමාගේ ගෙට පිඩු පිණිස පැමිණියාවූ ක්‍ෂයකරණලද කෙලෙස් සතුරන් ඇති එක්තරා රහත් තෙරකෙනකුන් වහන්සේ දැක බලවත්ව හටගත්තාවූ ප්‍රීතිසොම්නස් ඇත්ති, "මට මේ උත්තම වූ පින්කෙතක් පහළවූයේය"යි අනුභවය පිණිස තමා ලත් පූවභාගයෙන් භාගයක් ආදරයෙන් ගෙන සුපිළිසන්ව පැමිණි ඒ තෙරුන්වහන්සේට පිළිගැන්වූවාය තෙරුන් වහන්සේද එය පිළිගෙන අනුමෝදනා වදරා වැඩිසේක. ඉක්බිති ඕ තොමෝ එ කුශලකර්මය පමණක්මකොට ඉන් මෑතභාගයෙක්හි ආයුෂයාගේ පිරිහීමෙන් මරණින් මත්තෙහි නිද පිබිදියාක්මෙන් තවුතිසා භවනයෙහි රන්විමනෙක උපන්නීය. ඉක්බිති ඒ දිව්‍යාඞ්ගනාතෙමෝ පඤ්චාඞ්ගික තූර්යභාණ්ඩ ගත් දහස් ගණන් නළු නාටක සමූහයා විසින් පිරිවරණලදුව මහත්වූ දිව්‍යානුභාවයෙන් දිලිහිදිළිහි උදර වූ දිව්‍යසම්පත් අනුභව කෙරෙමින් නන්දනොද්‍යානයෙහි හැසිරෙන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ යටකියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඞ්ගනාව දැක ඈ විසින් ගිය දවස කළාවූ කුශලකර්මය ලොකයාහට ප්‍රකාශකරවනු කැමතිව විචාරා වදරණ තෙරුන්වහන්සේ, "අභික්කන්තෙන වණ්ණෙන" යනාදී ගාථා වත් වදළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ.
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.
කෙන තෙ තාදිසො වණ්ණො-පෙ-පභාසතී" ති

යනුහෙයින්, "එම්බා දෙව්දුව, යම්සේ ඔසධී තාරකාව අවශේෂ තාරකාවන් අභිභවමින් දශදිගුන් එකාලොකකෙරේද, එමෙන් සෙසු දෙවතාවන් අභිභවනයකොට තීගේ මහත්වූ රූපශ්‍රී ශොභාවෙන්ද ඡවිවර්ණයෙන්ද දශදිග් එකාලොක කෙරෙමින් ජොතිමත්ව බබලන්නාවූ ශරීරවර්ණයක් හා පරිභොගකටයුතු වස්ත්‍රාභරණාදී මෙබඳු සම්පත්තියක් පෙර මිනිස්ලොවදී කවර කුශලකර්මයක්කොට ලබන ලද්දීද, කවරකාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දශදිග් බබුලුවාදැ?"යි විචාරා වදළසේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසී යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරනලද්දවූ ප්‍රශ්නය විසර්ජනය කරණ ඒ දෙවතාදුතොමෝ, "සංඝ ගුණ සිහිකොට දෙනලද ස්වල්පදනයෙන් මෙතෙක් සම්පත්තියක් ලද්දෙමි"යි සතුටුව මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන මෙසේ කියන්නී.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
සුණිසා අහො සිං සසුරස්ස ගෙහෙ
අද්දසං විරජං භික්ඛුං විප්පසන්න මනා විලං
තස්ස අදසහං පූවං පසන්නාසෙහි පාණිහි.
භාගඩ්ඪභාගං දත්වාන මොදමි නන්දනෙ වනෙ.
තෙන මෙ තාදිසො වණ්ණො-පෙ-පභාසති" ති

යනුහෙයන්, "ස්වාමීනි. මම මීට පූර්වජාතියෙහි මෙම බුඩොත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපිද මාගේ ස්වාමියාගේ පියාණන් අයිත් ගෙදෙර ඒ පියාණන්ට යෙහෙළිව දවස් යවන්නෙමි එසමයෙහි එක් දවසක් ක්ෂයකරණලද කෙලෙස් සතුරන් ඇති එක් තෙරකෙනෙකුන් වහන්සේ පිඩු පිණිස හැසිරෙණසේක් මා වසන ගෙදෙරට පැමිණිසේක. උන්වහන්සේ කෙරෙහි හටගත්තාවූ බලවත් ප්‍රීති සොම්නස් ඇතිව මට අනුභවය පිනිස තිබූ පූවකොටසින් භාගයක් සිත පහදවා පුණ්‍යක්ෂෙත්‍රවූ ඒ සංඝරත්නායට පිදුයෙමි ඒ දුන්නාවූ ස්වල්පදනමය කුශලකර්මය කරණකොට ගෙන මෙබඳු සම්පත්තියක් ලදිමි, ස්වාමීනි, කිව එකල්හි මහ තෙරහු පිරිවර සහිත දෙවතාදුවට විස්තරවශයෙන් බණ වදරා මිනිස්ලොවට අවුත් බුදුරජානන්වහන්සේ ට දැන්වූසේක බුදුරජාණන්වහන්සේ එම අත්‍ථොත්පත්ති කොට ගෙන එතැන්හි පැමිණි පිරිසටධර්මදෙශනාකොට වදළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජනවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි පීඨවර්ගයෙහි
**පළමුවන සුණිසා විමානවස්තු වර්ණනාව**
කියා නිමවනලදි

## 14. දෙවන සුණිසා විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි දශසතර වැනිවූ දෙවන සුණිසා විමාන වස්තුව නම් කවරයත්-

සර්වධර්මයන් සර්වාකාරයෙන් දත්තාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසයකර වදරණසේක. එසමයෙහි සැවැත්නුවර සවාමිකුලයට ගියාවූ එක්තරා කුමාරිකාවක් තොමෝ පෙරවරු වේලෙහි තමා ගේ ගෙට පිඬු පිණිස පැමිණියාවූ ක්‍ෂයකරනලද කෙලෙස් සතුරන් ඇති එක්තරා රහත් තෙරකෙනකුන් දැක බලවත්සේ හටගත් ප්‍රීති සොම්නස් ඇත්තී, "මට මේ උතුම් පින්කෙතක් පහළවිය"යි සිතා අනුභවය පිණිස තමා ලත් කොමුපිඬු කොටසින් භාගයක් ආදරයෙන් ගෙන සුපිළිසන්ව වැඩියාවූ ඒ තෙරුන් වහන්සේට පිළිගැන්වූවාය. තෙරුන්වහන්සේද එය පිළිගෙන අනුමෝදනා වදරා වැඩිසේක. ඉක්බිති ඕතොමෝ මෑතකලෙක්හි කලක්‍රියා කරන්නී එම කුශලකර්මයාගේ හෙතුවෙන් මරණින් මත්තෙහි නිදිපිබිදියක් මෙන් තවුතිසා භවනයෙහි රන් විමනෙක උපන්නීය. අනෙකුදු විස්තර පළමුවන සුණිසා විමාන වස්තුවෙහි ආ පරිදි දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන පීඨ වර්ගයෙහි
**දශසතරවැනිවූ දෙවන සුණිසා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 15. උත්තරා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පසළොස්වැනිවූ උත්තරා විමාන වස්තුව නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු හේ කෙසේද යත්?

සර්වජන මනොනන්දකරවූ අප භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර සමීපයෙහි වූ ලෙහෙණුන්ට වැටුප් තබා අභය දුන්හෙයින් කලන්දක නිවාප නම්වූ, වෙළුවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි පූණ්ණනම්වූ දුප්පත් පුරුෂයෙක් රජගහනුවර සිටුහු ආශ්‍රයකොට ජීවත්වෙයි. ඔහුගේ උත්තරා නම් භාර්‍යාවෝද උත්තරා නම් දුවණියෝද ඔහුගේ ගෙහිම විසූහ. එකල්හි එක් දවසක් රජගෙහි නැකැත් කෙළි පිණිස ඝෝෂා කළාහුය. ඒ හෙරි ශබ්දය අසා සිටාණෝද උදෑසනම තම නිවසටම පැමිණියාවූ පූණ්ණ නම් දසයා බණවා "දරුව, අපගේ පිරිවර ජනයෝ තුමූ නැකත් කෙළි කෙළිනා කැමැත්තෝය තෝ වනාහි නැකැත් කෙළි කෙළින්නහුද, හුදෙක් බැලමෙහෙ කරන්නාහුදැ?"යි ඇසූහ. එකල්හි පූණ්ණ නම් දසතෙමෙ කියනුයේ, "ස්වාමීනි, නැකැත්කෙළි වනාහි ධනවතුන් විසින් කළමනා කටයුත්තෙක් වන්නේය. මාගේ ගෙහි වනාහි බැලමෙහෙකොටත් කැඳ බත් සහල් ආදියක් නැති කල්හි මට නැකැත් කෙළියෙන් කවර ප්‍රයෝජනද? එහෙයින් මට ගොනුන් ලැබේනම් සීසෑම පිණිස යන්නෙමැ"යි කීයේය. එබස් අසා සිටාණෝ කියන්නෝ, "පූණ්ණය, එසේ වී නම් ගොනුන් හැරගෙන ගොස් සීසාව" යි කීහ. එකල පූර්ණ නම් දසතෙමේ මහත් ශක්තිසම්පන්නවූ ගොනුන් දෙදෙනෙක් ද යහපත්වූ නගුලක්ද ගෙන භාර්‍යාවට කථාකොට "සොඳුර, මේ නුවර වාසීහු නැකැත්කෙළි කෙළිති. මම වනාහි දිළිඳු බැවි ඇති හෙයින් බැලමෙහ පිණිස යන්නෙමි. මට පළමු දවසට වඩා අද දෙගුණයක්කොට බත් මාළු පිස ගෙන එව"යි කියා සීසාන පිණිස කෙතට ගීයේය. මෙසේ ඇති කල්හි ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ නිරොධ සමාපත්තියට සමවැද සත්වැනි දවස වූයේය. එදවස්හි උන්වහන්සේ සමවතින් නැඟී, "අද මා කවරක් හට සංග්‍රහකරන්ට වටනේදැ?යි තමන් වහන්සේගේ කරුණා නැමති දැල දමා බලනසේක් තමන්වහන්සේගේ කරුණා ඥාණ දැල ඇතුළට අනවරතයෙන් බැලමෙහෙකොට වසන පූණ්ණ නම් දසයා ප්‍රවිෂ්ටවූ බැව් දැන, "මට සංග්‍රහකරන්ට හෙතෙම ශ්‍රද්ධාවන්තයෙක් වන්නේදැ?"යි ඔහුගේ ශ්‍රද්ධාවත් බවද සංග්‍රහකිරීමට සමර්ථබවද බලනසේක් ප්‍රත්‍යය හෙතු සම්පත් හා ඔහු විසින් ලබනලද මහත් සම්පත්ති ප්‍රතිලාභයද දැන තමන්වහන්සේගේ පාසිවුරු ගෙන ඒ පූණ්ණනම් දසයා සී සාන තෙනට වැඩ කෙත සමීපයෙහි එක් වනලැහැබක් දිසාව බලමින් වැඩ සිටිසේක එකල පූර්ණ නම් දසතෙම තෙරුන්වහන්සේ දැක සීසෑම නවතා උන්වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ දැහැටු දණ්ඩෙන් මුන්වහන්සේට ප්‍රයෝජන ඇතැයි සිතා දැවටු දණ්ඩක් කැපකොට

පිළිගැන්වූය. ඉක්බිති තෙරුන්වහන්සේ පාත්‍රය හා පෙරහනද ගෙනදුන්නේය. එකල පූර්ණතෙම මුන්වහන්සේට පැණින් ප්‍රයෝජන ඇතැයි සිතා පෙරහන හා පාත්‍රය ගෙන පැන් පෙරා පිළිගැන්විය. එකල තෙරුන්වහන්සේ සිතා වදරණසේක් "මොහුගේ භාර්යාතොමෝ ගෙහි වසන්නීය. මා විසින් නොදක්නාලද්දීය. එහෙයින් මම මොවුන්ගේ ගෙදෙර යම්"යි සිතා ඈ කුමක්කරන්නීදැයි බලා වදළසේක. එකල පූර්ණ නම් දසයාගේ භාර්යාව ස්වාමියා සී සාන කෙතට අහර සපයා ඊම පිණිස යෙදුනී අහර ගෙන මාර්ගයට වන්කල මාද මගදී සම්මුඛවිම පිණිස යාම සුදුසුයයි සිතා වදරා මඳ වේලාවක් පමාව අහර පිස ගෙන පූර්ණම්බිකාව මහට වන්කල තමන්වහන්සේද මහට පිළිපන්සේක් ඇතුළු නුවරට අභිමුඛව වැඩිසේක මෙසේ වඩින මහ තෙරුන්වහන්සේ දැක පූර්ණම්බිකාව මෙසේ සිතන්නී, "මම සමහර දවසෙක දියයුතු දන වස්තු ඇති කල්හි ආර්යයන් වහන්සේ නොදක්නෙමි. දියයුතු කිසිම දන වස්තුවක් නැති කල්හි ආර්යයන් වහන්සේ දක්නට ලැබේ. අද වනාහි ආර්යයන් වහන්සේද දක්නා ලද්දෙමි, දියයුතු දන වස්තුවකුදු ඇත්තෙමි. එබැවින් මුන්වහන්සේට සංග්‍රහ කරන්ට වටනේය."යි සිතා ඕ තොමෝ බත් බඳුන බිම තබා තෙරුන් වහන්සේ පසඟ පිහිටුවා වැඳ මෙසේ කියන්නී "ස්වාමින් වහන්ස නුඹවහන්සේ මේ දනය ප්‍රණීත බවෙක් හෝ අප්‍රණීත බවෙක් හෝ නොසිතා දසවූ අපට සංග්‍රහ පිණිස වළඳ වදළ මැනව"යි ආරාධනා කළාය. ඉක්බිති තෙරුන් වහන්සේ පාත්‍රය පා වදළ කල්හි පූර්ණම්බිකා තෙමෝ එක් අතකින් බත් සැලිය ගෙන අනෙක් අතින් පාත්‍ර යට පිළිගන්වන්නී භාගයක් පිළිගැන්වූ කල්හි තෙරුන්වහන්සේ අතින් පාත්‍රය වසා වදළේය. එකල දසි තොමෝ කියන්නි, ස්වාමීනි දසවූ අපට අනුකම්පාවෙන් මේ ඉතිරි භාගයත් පිළිගෙන ලොකානුකම්පා කළ මැනව. ස්වල්පයක් පමණකුදු ඉතිරි නොකොට දෙනු කැමැත්තම්හ"යි කියා සියල්ල පාත්‍රයට පිළිගැන්වූවාය. එසේ පිළිගන්වා, "ස්වාමීනි දෘෂ්ට ධර්ම වශයෙන් පින් බලාපොරොත්තු වන්නෙමැ"යි කිය. තෙරුන්වහන්සේද, "තොපගේ ප්‍රාර්ථනාව එසේම ඉෂ්ටවේව"යි අනුමෝදනා වදරා පැන් එාසු තෙනකට වැඩ වැළඳු සේක. ඒ ස්ත්‍රීතොමෝද ආ පසු ගෙදෙරට පැමිණ නැවතත් සහල් ආදී උපකරණ සොයා අහර පිසීය. එකල පූර්ණ නම් දස තෙමේද අඩකිරියෙක් පමණ සී සා බඩසාය බැවින් සීසාන්නට නොහැක්කේ ගොන් මුද එක්තරා රුක් සෙවනකට වැද මාර්ගය බල බලා හුන්නේය. ඉක්බිති ඔහුගේ භාර්යා තොමෝ සී සාන තෙනට බත් ගෙන එන්නී ඔහු දැක මෙසේ සිතුවාය. "මෙතෙම මහත් කුසගින්නෙන් පීඩිතව මා එන්නා බල බලා හිඳිනේ ඉදින් මා පමාවීයයි මහත් කෝපයට පැමිණ

තජින කොට සී සානා කැව්ටින් තැළුයේ වී නම් නපුර, මා විසින් කරණ ලද කුශල කර්‍මය නිරර්‍ථක වන්නේය. එහෙයින් මාගෙන් යමක් විචාරන්නට මත්තෙන් මා විසින් කරණලද කුශල කර්‍මය කියන්නෙමැ˙යි සිතා දුරදීම එන්නී, ස්වාමියාහට අඬගා, ˙ස්වාමිය අද මේ එක දවසට සිත පහදවා ගනුව. මා විසින් කරණලද කුශලකර්‍මය නිරර්‍ථක නොකරව˙යි කියමින් මෙසේ කීවාය. ˙ස්වාමිය මම උදෑසනම නුඹවහන්සේට බත් පිස ගෙනෙනුයෙම් අතුරු මාර්‍ගයෙහිවඩනා දම්සෙනෙවි සැරියුත් මහා ස්වාමීන් වහන්සේ දැක නුඹගේ බත උන්වහන්සේට පිළිගන්වා නැවත ගෙට ගොස් බත් පිසගෙන එන්නමෝය. ස්වාමිය සිත පහදවා ගනුව˙යි කීවාය. ඒ පුරුෂයාහට කියනලද කාරණය නොඇසුනේ, ˙සොඳුර කුමක් කියන්නීදැ?˙යි ඇසුයේය. පසුව ඒ කාරණය අසා, ˙සොඳුර ආර්‍ය්‍යයන් වහන්සේට තී විසින් දෙනලද දනය ඉතා යෙහෙක, සොඳුර මමද අද උදසන්හි උන්වහන්සේට දැහැටි දඬු හා මුව දේනා පැන් ප්‍රසන්නවූ සිතින් පූජාකෙළෙම්˙යි සතුටුව ඇ විසින් ගෙන එනලද බත් අනුභව කෙළේය. සවස්ව ගොස් බත් අනුභවකළ හෙයින් කලානතවූ ශරීර ඇත්තේ තම භාර්‍ය්‍යාවගේ ඇකයෙහි හිස තබා නිදගත්තේය.

ඉක්බිත්තෙන් ඒ දුගී තෙම උදය කාලයෙහි සානලද කෙතෙහි පස්පිඩු සියල්ලම රත්රන්ව කිණිහිරි පුෂ්පයන් සේ දිළිසෙන්ට වන. හෙතෙම නින්දෙන් පිබිද බලා භාර්‍ය්‍යාවට මෙසේ කිය. ˙සොඳුර මා විසින් සාන ලද සියලූ තන්හිම මට ස්වර්‍ණයන්ව පෙනෙයි. හේ කවර කාරණයෙක්ද? ඉතා සවස්ව ගොස් බත් අනුභව කළ හෙයින් ඇස් භ්‍රමණය වන්නේදැ?˙යි කීය. එකල ඔහුගේ ඇඹේණියෝද බලන්නී, ˙ස්වාමිය මටද එපරිද්දෙන්ම පෙනෙන්නේය˙යි කීවාය. ඉක්බිති පූර්‍ණ නම් දසතෙමේ කෙතට බැස එක් පිණ්ඩයක් ගෙන නගුලිසෙහි ගසාරත්රන් බව දැන, ˙අහෝ ආර්‍ය්‍යවූ ධර්‍ම සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේට දෙනලද දනයාගේ විපාක අදම දක්නා ලද්දේමැ˙යි කියා ˙මෙපමණ ධනයක් ප්‍රවේසම කොට තබා අනුභවකරන්ට අප වැන්වුන්ට නොහැක්කේය˙යි තමහට අනුභවය පිණිස භාර්‍ය්‍යාව විසින් බත් ගෙන එන ලද තලියට රත්රන් පුරවාගෙන රජගෙට ගොස් අවකාශ පරිදි රජ් ජුරුවන් දැක රජහු වැඳ එකත්පසෙක සියේය. රජතෙමේ, ˙දරුව කුමක් නිසා පැමිණියෙහිදැ˙යි විචාළ කල්හි, ˙දෙවයන් වහන්ස අද මා විසින් සාන ලද සියල්ල රත්රන් වූයේය. ඒ රත්රන් සියල්ලම ගෙන්වා ගත මැනව˙යි කීය. ඒ අසා රජතෙමෙ ˙තෝ කවරෙක්දැ?˙යි ඇසීය ˙ස්වාමීනි මම පූර්‍ණ නම් දසයෙමි˙ කීය. ˙තෝ විසින් අද කවර කර්‍මයක් කරණ

ලදදැ?"යි කී කල්හි "ස්වාමින් වහන්ස අද උදසනම දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේට දැවටු හා මුව දේනා පැන්ද පිළිගැන්වීම් මාගේ භාර්‍යා තොමෝ මට පිසගෙන එනලද ආහාරය පිළිගැන්වූවාය"යි කීය. රජතෙම ඒ අසා කියනුයේ, ධම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේට දෙනලද දනයාගේ විපාක අදම ලද්දේය. මීට කුමක් කරමෝදැ?"යි විචාළේය. ඒ අසා පුණ්ණ තෙමේ, "ස්වාමීන් වහන්ස සිය ගණන් බොහෝ රථ යවා ඒ ස්වර්ණය ගෙන්වා ගත මැනව"යි කීය. රජ තෙමෙ ඒ අසා රථ යැවුයේය. රාජපුරුෂයන්, "රජහු සන්තක ධනය"යි කියා ගනු ලබන කල්හි ගන්නා ලද ඒ සියල්ලම මැටිම වූයේය. රාජපුරුෂයෝ රජුකරා ගොස් ඒ ප්‍රවෘත්තිය කිකල්හි තෙපි කුමක් කියා ගන්නා ලද්දේදැ?"යි ඇසීය. "නුඹවහන්සේ සන්තක ධනයයි කියා අපි ගතුම්හ"යි කී කල්හී, "දරුව යව, පුණ්ණයාගේ ධනයයි කියා ගනුව"යි කීය. ඒ අසා රාජපුරුෂයෝ කෙතට පැමිණ එපරිද්දෙන්ම කළෝය. එකල ගත් ගත් සියල්ලම රත්රන්ම වූයේය. රාජපුරුෂයෝ ඒ සියල්ලමගෙන ගොස් රජමිදුලෙහි රැස්කළෝය. ඒ රැස්කරණ ලද රත්රන් ගොඩ අසූරියනක් පමණ උස්වූයේය. රජතෙමේ නුවර වාසීහු රැස්කරවා මෙසේ කීයේය. "සගයෙනි මේ නුවර වනාහි මෙපමණ රත්රන් කවරක්හට ඇද්දැයි?"යි විචාළේය. ඒ අසා නගරවාසීහු "දෙවයන් වහන්ස මෙනුවර කිසිවෙක් හටත් මෙබඳු ස්වර්ණයෙක් නැත්තේමය"යිකීහ රජතෙමේ විචාරනුයේ, "මෙබඳු ධවතුන්ට සිටු තනතුරු දියයුතුයි"යි නුවරුන් විසින් කියනලද බස් පිළිගෙන ඒ පුණ්ණයාහට බොහෝ ධනය සමගම "මහධන සිටාණෝය"යි නම් කොට සිටු තනතුරු දුන්නේය. ඉක්බිති ඒ මහධන සිටුවරයාණෝ කියන්නාහු "මහ රජ්ජුරුවන් වහන්ස මෙතෙක් කල් අපි බැළමෙහෙ කිරීමෙන් අනුන්ගේ ගෙහි විසුම්හ. එබැවින් අපට හිඳිනා පිණිස වාසස්ථානයක් නොදෙන්නහුදැ?"යි කීය. එපවත් අසා මහරජ තෙමේ කියනුයේ, "තෙල පෙනෙන වන ලැහැබ පුරාණ කාලයෙහි වාසය කළ සිටුහු විසූ තෙනය. එතැන ශුද්ධකරවා ගෙය ඉදිකොට ගනුව"යි කීය. සිටු තෙමේද එපවත් පිළිගෙන කිහිප දිනකින් ප්‍රාසාදයක් කරවා ගෙහි ප්‍රවේශ මඞ්ගලයද සිටු සේසත් ලත් මඞ්ගලයද යන මඟුල් දෙකම එකවරම කරණුයේ පළමුකොට බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාට සත්දවසක් දන් දුන්නේය. ඉක්බිත්තෙන් ශාස්තෲන් වහන්සේ දනානුමෝදනා වදරණ සේක් පිළිවෙළ කථාව වදළ සේක. ධර්‍මදෙශනාවසානයෙහි මහධන සිටානන් හා සිටු භාර්‍යාවෝද උත්තරා නම් තම සිටු දුවණියෝ ද යන තුන්දෙනාම සෝවාන් ඵලයෙහි පිහිටියෝය. ඉන් මෑත කලෙක්හි රජගහනුවර සිටාණන් ගේ සිටු පුත්‍රයාහට පුණ්ණ සිටාණන්ගේ ධීතෘව

විවාහකර ගැනීමට කථාකෙළ්ය. එකල්හි පූර්ණ සිටුතෙමේ නොකැමැති වුයේය. රජගහනුවර සිටානෝ එපවත් අසා කියන්නේ, "අපට එසේ නොකරව, මෙපමණ කාලයක් මුළුල්ලෙහි අප නිසාම වාසයකොට සම්පත්තියක් ලද්දේය. එබැවින් අපගේ පුත්‍රයාහට තොපගේ දියණියෝ පාවා දෙව"යි කීය. එබස් ඇසූ පූර්ණ සිටාණෝ කියනුවෝ, "තොපගේ පුත්‍ර තෙම මිථ්‍යාදෘෂ්ටිකය, අපගේ දූවණියහට වනාහි රත්නත්‍රය හැර වාසය කරන්ට අපොහොසත්ය, එබැවින් නොදෙමුය"යි කිවාහුය. ඉක්බිති එනුවර වාසය කරන්නාවූ බොහෝ සිටුවරු හා ගෘහපතිහුද, "නුඹවහන්සේ මේ සරණ බන්ධනයට කැමති නොවන්නාහු නම් ඒ රජගහ නුවර සිටුහු කෙරෙහි අපගේ විශ්වාසයෙක් නොවන්නේය. එබැවින් නුඹවහන්සේගේ ධීතෘව රජගහ නුවර සිටුහුගේ පුත්‍රයාට දෙව"යි යාච්ඤා කළෝය. එබස් අසා පූර්ණ සිටු තෙමේ සතුටුව ඇසළ මස පුණු පොහෝ දින යෙහි තම දූහිතෘව රජගහනුවර සිටුපුත්‍රයාට පාවාදුන්නේය.

උත්තරා නම් ඒ සිටු කුමාරිකාවහට වනාහි ස්වාමි කුලයට ගිය කල් තැන් පටන් භික්ෂුවක් කරා හෝ භික්ෂුණියක් කරා හේ එළඹ යම්කිසි දනයක් දෙන්නටවත් යම්කිසි ධර්මයක් අසන්ටවත් නොලැබුණිය. මෙසේ අඩ තුන් මසක් ගිය කල්හි තමා සමීපයෙහි හුන්නාවූ පරිවාර ජනයන් අතින් මෙසේ විචාළීය. "පින්වත්නි දැන් ඇතුළු වස කොපමණ ඉතිරිව තිබේද?"යි ඇසුවාය. එබස් ඇසූ පිරිවර ජනයෝ කියන්නාහු, "ආර්යාවෙනි තව ඇතුළු වස අඩ මසක් ඇත්තේය"යි කීවෝය. එබස් අසා සිටු දූවණි තොමෝ, "මෑණියෙනි පියාණෙනි කවර කරණයක් හෙතු කෙටගනෙ මා මෙබඳු දඟගෙයෙක්හි ලුවහුද? මේ මිථ්‍යාදෘෂ්ටි කුලයට පාවාදීමට වඩා අනුන්ගේ ගෙහි දසියකු කළහු නම් ඉතා හොබෙනේ නොවේද? ස්වාමිකුලයට ආකල් තැන් පටන් භික්ෂුදර්ශනාදී කිසිම පිනක් කරන්නට නොලැබුණිය"යි කියා මවුපියන්ට හසුනක් ලියා යැව්වාය. ඉක්බිත්තෙන් ඇගේ මවු පියෝ ඒ හසුන දැක බලා, "අපගේ ධීතෘව මහත් දුකට පැමිණි යේය"යි විකේෂ්පවූ සිත් ඇතිව, "දූවණියෙනි මේ නුවර සිරිමා නම් වූ ගනිකාවක් ඇත්තිය. දවසකට කහවණු දහසක් මිළ නියමකොට ගන්නාය. එබැවින් මේ කහවනු ගෙනදී ඈ ගෙන්වාගෙන ස්වාමියාහට පාවාදී නුඹ කැමති පරිද්දෙන් පින් කරව"යි කියා පසළොස් දහසක් කහවනු හා සමග හසුනක්ද යැවූහ. උත්තරා නම් සිටු දියණිය කහවනු සහිතවූ ඒ හසුන ගෙන හසුනෙහි කීතියායෙන් සිරිමාව ගෙන්විය. එකල්හි සිටු පුත්‍රතෙම " මේ කවර කාරණයෙක්දැ?"යි විචාළේය. උත්තරාව කියන්නී "ස්වාමිය මේ අඩ මස තෙපි මාගේ යහළුවූ මේ

කුමාරිය හා සමග වාසය කරව. මම වනාහි මේ අඩ මස දන්දෙනු කැමැත්තම්හ. ධර්මය අසනු කැමැත්තම්හ`යි කීවාය. ඒ සිටු කුමාර තෙමේද මනා රූ ඇති කුමාරිකාවක් ලත්බැවිනුත් ඈ පිළිබඳව හටගත්තාවූ සිත් ඇති බැවිනුත් `මැනව`යි සතුටුවූහ. උත්තරා නම් සිටු දූවනි තොමෝ වනාහි බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට ආරාධනා කරන්නී, `ස්වාමීන් වහන්ස මේ අඩ මස මාගෙන් විනා අන් තෙනකට පිඬු පිණිස නොවඩින සේක්ව`යි කියා යාච්ඤකොට සිටිකල්හි ඒ ආරාධනාව තථාගතයන් වහන්සේ ඉවසා වදළ සේක. මෙසේ ඇති කල්හි ඒ උත්තරා තොමෝ, `දැන් මෙතැන් පටන් මහා පවාරණය යම් දවසෙකද, ඒ දක්වා ශාස්තෲන් වහන්සේට උපස්ථාන කරන්ටද ධර්මශ්‍රවණය කරන්ටද ලැබුණේය`යි ඔද වැඩියාවූසිත් ඇත්තී, `මෙසේ කැඳ පිසව, මෙසේ බත් පිසව, මෙසේ පූව පිසව`යි මහත් සන්තොෂයෙන් ඒ සියල්ල සංවිධාන කරමින් හැසිරෙන්නීය. මේ නියායෙන් මහා පවාරණ දිනය හෙටයි ආසන්නවූ කල්හි සිටුකුමාරිකා තෙමෝදැළි හා අළු වැකුණු හරීරය ඇතිව දන සංවිධාන කරන්නී ඇගේ සිටු කුමාරතෙම කවුළු දෙර සමීපයට අවුත් බලා, `අහෝ අන්ධ බාලවූ සත්‍රීහු මෙබඳු සිටු ප්‍රාසාදයන්හි ශ්‍රී සම්පත් අනුභව නොකොට මුණ්ඩවූ ශ්‍රමණයන්ට උපස්ථාන කරන්නාහ`යි කියා සිනාසී පහව ගියේය. මෙසේ සිටු කුමාරයා පහව ගිය කල්හි ඔහු සමීපයෙහි හුන්නාවූ සිරිමා තොමෝ, `මොහු කුමක් පිනිස සිනාසුනේදැ?`යි කවුළු දෙර සමීපයට පැමිණ බලන්නී උත්තරාව දැක, `මේ සිටු කුමාරතෙම මැ හා සමග මිත්‍ර සන්ථවයක් ඇතැ`යි සිතුවාය. ඕතොමෝ පිට සත්‍රියක්ව අඩ මසක් සම්පත් අනුභව කරන්නී පිට සත්‍රියක් බවත් නොදැන, `මම ගෘහසාමිනිය`යි සිතුවාය මෙසේ සිතුවාවූ ඕතොමෝ උත්තරාව කෙරෙහි ආඝාත බැඳ, උත්තරාවට දුක් දෙන්නෙමැ`යි ප්‍රසාදයෙන් බැස දන් පිසන ශාලාවට පැමිණ පූව පිසන තැනින් කකියවන ලද ගිතෙල් සැන්දක් ගෙන උත්තරාව දිශාවට අභිමුඛව ගියාය. උත්තරාවද එන්නාවූ ඈ දැක මෙසේ සිතුවාය. `මාගේ යහළු වූ මේ කුමාරිකාවන් මට මහත් උපකාරයක් කරණ ලද්දේය. ඒ උපකාරයට මේ සක්වල ගල අවකාශ නැත්තේය. බ්‍රහමලොකය ඉතා මිටිවන්නේය. මාගේ යහළු කුමාරියගේ ගුණය ඊට වඩා අධික වන්නීය. මට වනාහි ඈ නිසා දන් දෙන්ටද බණ අසන්ටද ලැබුණිය. ඉදින් මැ කෙරෙහි මම ක්‍රොධ ඇත්තෙම් නම් මේ ගිතෙලින් මම දැවෙම්වා, එසේ නැති කල්හි මම නොදැවෙම්වා කියා මෛත්‍රී වැඩුවාය, ගිතෙල් හැන්ද ගෙන පැමිණියාවූ සිරිමා තෙමෝ උත්තරාවගේ හිසෙහි ඒ කකියනලද ගිතෙල් වත්කළාය. වඩනාලද මෛත්‍රී ඇති ඒ උත්තරාවගේ ශරීරය සිහිල්ජලයක් වත්කළාක් මෙන් වූයේය.

ඉක්බිති සිරිමාතොමෝ, "මෙය සිහිල්ව ගියේය"යි නැවතත් තෙල් සැන්දක්පුරවා උත්තරාවට ඉසීම පිණිස ගෙන එන්නී උත්තරාවගේ දසීහු දැක, "බොල අසත්පුරුෂ කෙල්ල, අපගේ ආර්යාවට මෙබඳු අපරාධයක් කළ යුතුදැ?"යි කියමින් ඇය අල්ලා අතින් පයින් තළා බිම හෙළුවෝය. උත්තරාවද ඒ කෝලාහලය සන්සිඳුවන්ට උත්සාහ ගත්තී නොහැකිවූවාය. ඉක්බිති උත්තරා වෝ තුමු ඈ බිම හෙළා මැඩගෙන සිටින්නාවූ දසීන් බැහැරකොට කියන්නාහු, "තී මෙබඳුවූ බැරෑරුම් කටයුත්තක් කරණලද්දේ ඉතා නපුරුය"යි සිරිමාවට අවවාදකොට ඈ උණුදියෙන් නාවා ශරීරය ශතපාකතෛලයෙන් ආලේප කළාහ. එකෙණෙහි සිරිමා තෙමෝ තමා බැහැර ස්ත්‍රියක් බැව් දැන මෙසේ සිතුවාය. "ස්වාමියාගේ සිණාසීම දුටු මා විසින් මේ උත්තරාවගේ හිසට කකියවන ලද තෙල් වත්කිරිම මා විසින් කරණලද ඉතාම බැරෑරුම් කර්‍මයෙක. මෑ ගනුව, අල්වවයි කියා දසීහු වටකොට මා අල්වා මට කළයුතු සිල්ලක්ම කළෝය. ඉදින් මම වනාහි මේ උත්තරාක්‍ෂමාකර නොගන්නෙම් නම්, මාගේ හිස සත්කඩක්ව පැළෙන්නේය"යි උත්තරාවගේ පාදමූලයෙහි වැටී "ආර්යාවෙනි මා අතින් සිදුවූ සියලු වරදට ක්‍ෂමාවන සේක්වා"යි කීවාය. එකල්හි මෙත් සිත් ඇති උත්තරාතොමෝ කියන්නී, "මාගේ පියාණන් වහන්සේ යම් කලෙක ක්‍ෂමාකරවාගන්නෙහිද එකල්හි මම ක්‍ෂමාවූයෙමි"යි කීවාය. එකල්හි සිරිමා තොමෝ "ආර්යාවෙනි මම නුඹ වහන්සේගේ පියවූ පුණ්‍ණ සිටාණන්වහනසේ ක්‍ෂමාකරවා ගන්නෙමි. එබැවින් මට ක්‍ෂමාවුව මැනව"යි කීවාය එබස් අසා උත්තරාවෝ කියන්නෝ, "පුණ්‍ණ සිටුතෙමේ මාගේ මෙම අත් බැවෙහි ජනක පියතෙමේය. නිවන් රස බෙදදීලූ පිය තෙම ක්‍ෂමාකරගත් කල්හි මමද ක්‍ෂමාවූයෙම් නම් වන්නෙමැ"යි කීහ. "ඒ නිවන් රස බෙදදිලු පියහු කවරහුදැ?"යි සිරිමා තොමෝ, විචාරණලද්දී, "සම්‍යක් සමබුඩයන්වහන්සේය"යි කිවාය. සිරිමා තොමෝ , "ඒ බුදුන් හා සමග මාගේ විශ්වාස බවෙක් නැත්තේය. එබැවින් මා විසින් කුමක් කටයුතුදැ?"යි විචාළ උත්තරාවෝ කියන්නෝ, "ශාස්තෘන්වහන්සේ භික්‍ෂුසංඝයා පිරිවරා හෙට දින පෙරවරු වේලෙහි අප නිවසට වඩිනා සේක. තෙපිද ලදමනා යම් සත්කාරයෙක් රැගෙන මෙහි අවුත් උන්වහන්සේ ක්‍ෂමාකොට ගතයුත්තෙහිය"යි කීහ. ඕතෙමෝ, "ආර්යාවෙනි, මැනවැයි කියා නැගී තමාගේ ගෙට ගොස් පන්සියක් පමණ පිරිවර ස්ත්‍රීන්ට නියමකොට අනෙකප්‍රකාර වූ සූප හා ඛාද්‍යාදිය සම්පාදනය කවරවා දෙවෙනි දවස්හි බුදුරජාණන්වහන්සේට සත්කාර කරණු පිණිස උත්තරාවගේ ගෙට පැමිණ භික්‍ෂුසංඝයා සහිත බුදුරජාණන්වහන්සේට දනය පිළිගන්වන්ට නොදන්නී එක් පාර්‍ශවයෙක් සිටියාය. උත්තරාතොමෝ

ඒ සියල්ලගෙන පිළිගැන්වූවාය බුදුරජාණන් වහන්සේගේ භත්තකෘත්‍යාවසනායෙහි පරිවාර ස්ත්‍රීන් හා සමග සිරිමාතොමෝ ශාස්තෘන්වහන්සේගේ පාදමූල යෙහි වැද හොත්තිය ඉක්බිති ශාස්තෘන්වහන්සේ, "සිරිමාවෙනි කවර වරදෙක්දැයි?යි විචාරා වදාළසේක. ස්වාමීන්වහන්ස, මා විසින් ඊයේ දවස්හි මෙබඳු කර්‍මයෙක් කරණලද්දේය. එකල්හි මේ සියලු දසීහු මට තර්ජනය කිරීමෙන් වළකා මට බොහෝ උපකාරකළෝය. මේ උත්තරාවගේ ගුණ දැන මම ක්‍ෂමාකොට ගතිමි එසේකල්හි, නුඹවහන්සේ ක්‍ෂමාකරගත්තෙහි නම් එකල මම ක්‍ෂමා වූයෙමි නම් වෙමියි උත්තරාව විසින් කියනලද්දිමි. එබැවින් මම නුඹවහන්සේ ක්‍ෂමාකරගණිමිය"යි කීවාය. බුදුරජාණන්වහන්සේ, " ඒ කාරණය සැබෑද?"යි උත්තරාවන්ගෙන් අසා වදාළසේක එකල උත්තරාතොමෝ ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස, දන්දීමද ධර්‍මශ්‍රවණය කිරීමද මා විසින් ලබනලද්දේ මාගේ යහළුවූ මේ සිරිමාව නිසාමය. එබැවින් මෑගේ ගුණයට චක්‍රවාට පර්‍වතය අවකාශ මදිය. ගුණ එයිටත් වැඩිය. බ්‍රහ්මලොකය මිටිය. මෑගේ ගුණ අධික වන්නීය මැ කෙරෙහි මාගේ ක්‍රොධයෙක් නැත්තේය ඇත්තේවීනම් මේ කකියවන තෙළින් මම දැවෙම්වා, එසේ නැතිකල්හි මම නොදැවෙම්වායි කියා මෛත්‍රිය වැඩුවෙමි" යි කීවාය ශාස්තෘන්වහන්සේ " උත්තරාව සාධු සාධු ක්‍රොධය මෙසේ දිනිය හැක්කේය. ක්‍රොධය තෙම ක්‍රොධ නොකිරීමෙන්ද ආක්‍රොෂයතෙම ආක්‍රොෂනොකිරීමෙන්ද නින්‍දකිරීම නින්‍දනොකිරීමෙන්ද තද මසුරුකම තමා සතු වස්තුව දීමෙන්ද බොරුකීම බොරුනොකීමෙන්ද දිනිය හැක්කේය"යි එම අර්‍ථයප්‍රකාශකොට

"අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ.
ජිනෙ කදරියං දනෙන සච්චෙන අලිකවාදිනං" ති,

යන මේ ගාථා ධර්‍මය වදරා අවසානයෙහි චතුරාර්‍යසත්‍යය වදාළසේක චතුස්සත්‍ය ධර්‍මදේශනාවගේ අවසානයෙහි උත්තරාවෝ සකෘදගාමි ඵලයෙහි පිහිටියාය. ස්වාමීවූ සිටුකුමාරතෙමේද පියවූ රජගහනුවර සිටුතෙමේද සෝවාන්ඵලයෙහි පිහිටියෝය. පන්සියයක් පිරිවාර ජනයන් සහිත සිරිමාතොමෝද සෝවාන්ඵලයෙහි පිහිටියාය. ඉක්බිති අනෙක් කලෙක්හි උත්තරාතොමෝ කාලක්‍රියාකොට තවුතිසා භවනෙහි රන්විමනෙක්හි උපන්නීය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් තවුතිසා භවනයට වැඩ මහත්වූ දිව්‍යෛශ්වර්‍යයෙන් වසන්නාවූ උත්තරා නම් දෙවඪීතෘව දැකවදරා ඈ විසින් මේ සම්පත් ලැබීමට පූර්‍වජාතියෙහි කළාවූ

කුශලකර්මය ප්‍රකාශකරවනු කැමතිව විචාරා වදරණ තෙරුන්වහන්සේ "අභික්කන්තෙනවණ්ණෙන" යන ගාථාවන් වදළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ.
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධීවිය තාරකා,
කෙන තෙ තා දිසො වණ්ණා - පෙ - පභාසතී"

යනුහෙයින්, "එම්බා දෙවතාදූව, යම්සේ ඔසධීතාරකාව අනෙක් තාරකාවන් අභිභවමින් දසදිගුන් එකාලොක කෙරේද එපරිද්දේන් සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තීගේ මහත්වූ රූපශ්‍රී ශොභාවෙන්ද යහපත්වූ ඡවිවර්ණයෙන්ද දශ දිග් එකාලොක කෙරෙමින් ජොතිමත්ව බබලන්නීය"යි ප්‍රකාශ කොට ඊට අනතුරුව "මෙබඳු විමානයක්ද හාත්පසින් ජොතිමත්ව බබලන්නාවූ ශරීරවර්ණයක් හා පරිභොගකටයුතු වස්ත්‍රා භරණාදී මෙබඳු සම්පත්තියක්ද පෙර මිනිස්ලොව දී කවර කුශලයක්කොට ලබනලදද, කවර කාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දශදිග් බබුලුවාදැ?"යි විචාරා වදළසේක. මෙසේ තෙරුන් වහන්සේ විසින් විචාළ ප්‍රශ්නය දෙව්දුව විසඳූ පරිදි හඟවන පිණිස සඞ්ගීතිකාරක තෙරුන් විසින්:-

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා.
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"

යනුහෙයින් මුගලන් මහතෙරුන් වහන්සේගේ වචනය මුදු ණෙන් පිළිගෙන ප්‍රශ්ණ විසර්ජනය කරන්නාවූ ඒ දෙවතාදූතොමෝ:-

"ඉස්සාව මච්ඡෙරමථො පළාසො
නාහොසි මය්හං ඝරමාවසන්තියා,
අක්කොධනා භත්තුවසානුවත්තිනී
උපොසථෙ නිච්චහමප්පමත්තා
චාතුද්දසිං පඤ්චදසිං යචපක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං,
උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා.
සංයමා සංවිභාගා ච විමානං ආවසාමහං.
පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අති චාරා ච මජ්ජපානා ච ආරකා.
පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො ගොතමස්ස යසස්සිනො
සාහං සකෙන සීලෙන යසසා ච යසස්සිනි,

අනුභොමි සකං පුඤ්ඤං සුඛිතා චමහි අනාමයා
තෙන මෙ තාදි සොවණ්ණො-පෙ-පභාසතී"ති.

යනුහෙයින්, "ස්වාමීනි, මම මීට පූර්වජාතියෙහි කුලදැරියන්ව විසූයෙමි ඊර්ෂ්‍යාවද මසුරුබවද ගුණමකුබවද කිසිලෙසකින් නො කෙළෙමි ක්‍රොධ නොකෙළෙමි ස්වාමීපුත්‍රයාට පැවතිය යුතුවූ සියලු ගුණයන්ගෙන් යුක්තව වාසයකෙළෙමි. නිරන්තරයෙන් උපොෂථයෙහි අප්‍රමාදව විසූයෙමි, තුදුස්වක් දිනයෙහිද පසළොස්වක්දිනයෙහි ද පක්ෂය සම්බන්ධිවූයම් අටවක් දිනයෙක් ඇද්ද ඒදිනෙහිද ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද අෂ්ටගුණාඞ්ගයෙන් යුක්තවූ උපොසථයෙහි වාසයකෙළෙමි සියලු කාලයෙහිම සීලසමාදානයෙන් යුක්තවම සීලසංවිභාගයෙන් යුක්තවම මාගේ ගෙහි වාසය කෙළෙමි. එසේම ප්‍රාණඝාතයෙන්ද සොරකම් කිරීමෙන්ද පරදර සේවනයෙන්ද බොරු කීමෙන්ද සුරාපානය කිරීමෙන්ද විශෙෂයෙන්ම දුරුවූයෙමි පඤ්චශික්ෂාපදයෙහි ඇලුනෙමි ආර්‍ය්‍ය සත්‍යය දැනීමෙහි දක්ෂ වීමි යසස් ඇත්තාවූ පසැස් ඇති ගෞතමයන්වහන්සේගේ උපාසිකාවක් වීමි. එසේ වූ මම යහපත් වූ ශීලයෙන්ද යුක්ත වීමි එසේම යසස් ඇත්තෙමි නිරාමය වූ සැප ඇත්තියක්ව ස්වකීය පුණ්‍යය අනුභවකරමි ස්වාමින් වහන්ස, මෙබඳු දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදින් ශරිරවර්ණයෙන්ද දශදිග් බබුලුවමියි කිව මෙසේ කියා "ස්වාමීනි, මිනිස්ලොවට වැඩ වදරා මම බුදුරජාණන්වහන්සේගේ ශ්‍රීපාදපද්මය වදිනෙමැය"යි සැළකොට" මාගේ ශ්‍රාමණ්‍යඵලය සම්මාසම්බුදු රජාණන්වහන්සේගෙන් අසා වදළමැනව"යි යාච්ඤා කළාය. ඉක්බිති තෙරුන්වහන්සේ මිනිස් ලොවට වැඩ වදරා සම්මාසම්බුදුරාණන් වහන්සේ කරා එලැඹ උත්තරාවන් විසින් ශ්‍රීපාද ද්වන්දය වදිනාලද්දේයයි සැලකල කල්හි තථාගතයන් වහන්සේ, "ඒ උත්තරාතොමෝ සකෘදගාමි ඵලප්‍රාප්තවූ මාගේ ශ්‍රාවිකාවක් වන්නීය"යි විස්තර කථාව සමග චතුස්සත්‍යය වදළසේක. ඒ ධර්මදෙශනාතොමෝ බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තුප්‍රකරණයෙහි
**පීඨවර්ගයෙහි උත්තරා විමාන වර්ණනාව**
කියා නිමවන ලදී

## 16. සිරිමා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සොළොස්වැනිවූ සිරිමා විමාන වස්තු නම් කවරැයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

සර්වලොකෛක ප්‍රදීපායමානවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වාසයකරවදරනසේක. උත්තරා වස්තුවෙහි කියනලද පරිද්දෙන් සිරිමා නම් ගණිකාතොමෝ එසමයෙහි සෝවාන් ඵලයට පැමිණිහෙයින් හරිනලද කිළිටි වූ කර්මාන්ත ඇත්තී දෙවෙනි දවස්හි බුදුන් ප්‍රමුඛ භික්ෂුසංඝයා ස්වකීය නිවසට වැඩමවා දන්දී එතැන් පටන් නිරන්තරයෙන් අට සලාක බතක් භික්ෂුසංඝයාට නියමකොට එතැන් පටන් භික්ෂුන් වහන්සේලා අට නමක් ඇගේ නිවසට වැඩමවා දන් දෙන්නීය. මෙසේ දන්දෙනකල්හි ඕතොමෝ, "ස්වාමීන්වහන්ස, මේ ගිතෙල් පිළිගනු මැනව, මේ කිරි පිළිගනු මැනව" යි යනාදීන් කියා භික්ෂූන් වහන්සේලාගේ පාත්‍රයන් ආහාරාදියෙන් පුරවන්නීය. එක් භික්ෂුවක් විසින් ලබනලද දනය තුන්දෙනෙකුට හෝ සතරදෙනෙකුට හෝ පමණ පොහොනේය. දවසක් පාසා සොළොස් කහවනුවක් වියදම්කොට උදසන්හි දනය සපයා දෙන්නිය. ඉක්බිත්තෙන් එක් දවසක් එක්තරා භික්ෂුවක්තෙමේ අටසලාක බතින් එකක් වළඳ තුන්යොදනක් පමණ වූ තෙනෙක්හි එක්තරා විහාරයකට ගියේය. ඉක්බිති සවස්වේලෙහි උන්වහන්සේට උපස්ථානය පිණිස පැමිණි භික්ෂූහු, " ඇවැත්නි, කොහින් භික්ෂාව ගෙන මෙහි ආයෙහිදැ?යි ඇසූහ එකලතෙරුන්වහන්සේ කියනසේක, " ඇවැත්නි, සිරිමාවගේ සලාක බත් අටින් එකක් ලැබ ආයෙමි" යි කීයේය එබස් ඇසූ භික්ෂූහු, "ඇවැත්නි, එය යහපත්කොට දෙන්නේදැ?"යි විචාළෝය තෙරුන් වහන්සේ කියනුයේ, "සිරිමාවගේ භත්තාග්‍රය වර්ණනාකරන්ටද නොපොහොසත්මි. ඇ එය ඉතා ප්‍රණීතකොට දෙන්නීය. ඕතොමෝ මනා රූ ඇත්තීය. එපරිද්දෙන්ම ඈ විසින් දෙනලද දනයද ඉතා උතුම්වන්නේය. එක භික්ෂුවක්හට දෙනලද්ද තුන් සතර දෙනෙකුට පමණ පොහෝනේය"යනාදීන් විස්තරකොට කීයේය. ඉක්බිති එක්තරා භික්ෂුවක් තෙමේ ඇගේ ගුණ කථාව අසා ඈ නොදක්නාලද්දේම ශ්‍රවණමාත්‍රයෙන් ඇය කෙරෙහි ස්නේහ උපදවා, " මා විසින් එහි ගොස් ඇය දක්නට සුදුසුය"යි තමාගේ අදහස ඒ භික්ෂුන්වහන්සේට කියා එහි පවත්නා තත්වය ඇසූකල්හිඒ භික්ෂුන්වහන්සේ කියනුයේ, "සෙට අටසලාක බතෙහි සංඝස්ථවිරව තොපට ඒ බත ලැබිය හැක්කේ ය"යි කීයේය. ඒ අසා ඒ ක්ෂණයෙහිම පාසිවුරු ගෙන යනුයේ උදසන අරුණුනැගුණු කල්හිම සලාකාග්‍රයට ප්‍රවිෂ්ටව සිටියේ සඞ්ඝස්ථවිරව අටසලාක බත ලැබුයේය. පළමුකොට යම් පමණ භික්ෂු පිරිසක් වැඩිසේක්ද උන්වහන්සේලා වළඳ වැඩිසේක. ඒ ඇසිල්ලෙහිම ඒ සිරිමාවගේ ශරීරයෙහි රෝගයෙක් උපණ, එසේ හෙයින් සියලු

ආභරණයෝ මුදු වැදහොත්තීය. ඉක්බිති අට සලාකබත් ලැබීම පිණිස පැමිණියාවූ භික්ෂූන් දැක දසීහු සිරිමාවට සැළකළෝය. එබස් ඇසූ ඕතොමෝ පැමිණ භික්ෂූන්වහන්සේලා වැඩහිඳුවීමට හෝ උන්වහන්සේලාගේ පාත්‍රාගැනීමට හෝ නොහැක්කේ දසීන්ට නියමකරන්නී, "දරුවෙනි, පාත්‍රාගෙන ආයඝීයන්වහන්සේලා වැඩහිඳුවා කැඳ වළඳවා අවුලු ආදිය පිළිගන්වා බත් වේලාව පැමිණිකල්හි පාත්‍රයන් බතින් පුරවා දෙව" යි කීවාය දසීහු එබස් පිලිගෙන භික්ෂූන්ට කැඳ අවුලු වළඳවා වේලා සම්ප්‍රාප්තවූ කල්හි බතින් පාත්‍රයන් පුරවා සිරිමාවහට සැලකළෝය. එකල ඕතොමෝ කියන්නී, "මා උසුලාගෙන යෙව්. ආයඝීයන්වහන්සේලා වඳින්නමෝය"යි කීවාය. එබස් ඇසූ දසීන් ඇ ඔසවාගෙන භික්ෂූන්වහන්සේලා වැන්දය. එකල්හි ඇය කෙරෙහි පැහැද සිටි භික්ෂුතෙම ඇ ගැනසිතන්නේ, "ගිලන්ව වසන කල මැගේ රූපශොභාතෙමෝ මෙපමණ ඇතිකල්හි නිරෝගිව සර්වාභරණයෙන් සැරහී සිටිකල්හි රූපසමපත්තිතොමෝ කවරපරිද්දකින් වන්නීද?"යි නොයෙක් වර්ෂකොටි ගණනෙක්හි රැස්කරණලද කෙලශ සමූහයට අවකාශ බලමින් සිට එතැන්හිදී අවකාශලද්දේය ඒ භික්ෂුතෙම වනාහි අනෙක් ස්වභාවයකට පැමිණියේ බත් අනුභවකිරිමට නොහැකිව පාත්‍රය ගෙන විහාරයට ගොස් පාත්‍රය හැර එක් පාර්ශ්වයෙක්හි තබා සිවුරෙහි කොණ දිග හැරබිම අතුට වැදහොත්තේය. ඉක්බිති තමා යහළුවූ එක්තරා භික්ෂුවක් විසින් යාච්ඤාකරණලද්දේත් අනුභව නොකළේය. හෙතෙම එහෙයින් සුන්බත් විය. සිරිමාවෝද එදවස්හිම කාලක්‍රියාකළාය. රජතෙමේ එවේලෙහි, "ජීවකයාගේ බාලසහෝදරිය වූ සිරිමාතොමෝ කාලක්‍රියාකළාය"යි බුදුරජාණන්වහන්සේට හස්නක් යැව්වේය. බුදුරජාණන් වහන්සේ එපවත් දැන, "සිරිමාවගේ ශරීරය නොදැවිය යුතුය. අමුසොහොණෙහි සුනඛාදීන්ට කා නොහැකි පරිද්දෙන් තැන්පත්කොට තබ්බව"යි රජහට හස්නක් යවා වදාළසේක. ඒ හසුන ලද රජතෙමේ එපරිද්දෙන්මකෙළේය. තවද සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ නියමය පරිදි රජතෙමේ පිළිවෙළින් තුන්දවස ඉක්ම සතරවෙනි දවස්හි සිරිමාවගේ ශරීරය ඉදිමී නවද්වාරයෙන් පණුවන් නික්මෙන්ට වන. සියලු ශරීරය බිඳිගිය හැල් බත් සැළියක්මෙන් විය. එකල්හි "ගෘහරක්නා දරුවන් තබා අනෙක් සියල්ලෝම සිරිමාව දැකීම පිණිස යායුත්තාහ. එසේ නොයන්නාහු නම් අටකහවනුවක් දඩය"යි කියා නුවරබෙර පියව්කරවූයේය. ඒ බැව් බුදුරජාණන්වහන්සේටද දැන්වූහ. බුදුරජාණන්වහන්සේ භික්ෂූනට, "සිරිමාව දැකිම පිණිස මම යමි. මා සමග යාමට සියලු භික්ෂූහු එත්වා"යි වදාළසේක. එකල්හි උතුරු ගුණයෙන් දහරවූ ඒ ලාමක භික්ෂුතෙම වචනමාත්‍රයක් පමණවත්

නොකොට සතරදිනක් සුන්බත්ව වැදහොත්තේය. පාත්‍රයෙහි තිබූ බත් කුණුවී මළ නැංගේය ඉක්බිති ඒ භික්ෂුවගේ යහලුවූ එක්තරා භික්ෂුවක් තෙමේ සමීපයට එලඹැ, ˝ඇවැත්නි, ශාස්තෲන්වහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා සිරිමාව දක්නට යන්නේය. තෙපිත් යන්නහුදැ?˝යි විචාළකල්හි සිරිමාව යයි කී වචනයෙන්ම දවස් සතරක් අහර නොවළඳ එක් වචන මාත්‍රයක් පමණකුදු කොට ගත නොහැකිව වාසය කළ ඒ භික්ෂුතෙමේ වහා නැගිට, ˝මමද යමි˝යි පාත්‍රයෙහි තුබු කුණු වූ බත් අස්කොට පාත්‍රය සෝධා පයියෙහි ලාගෙන භික්ෂුසඞ්ඝයා හා සමග මගට පිළිපන්නේය බුදුරජාණන්වහන්සේද භික්ෂුසංඝයා පිරිවරා අමුසොහොනට වැඩ එක් පාර්ශ්වයෙක්හි වැඩසිටි සේක. භික්ෂුණීපිරිසද රාජපිරිසද උපාසක පිරිසද උපාසිකා පිරිසද යන සිවුපිරිසම එක් පාර්ශ්වයෙක්හි සිටියෝය. එකල්හි ශාස්තෲන්වහන්සේ ˝මහරජ මැ කවරියක්දැ?යි විචාරා වදාළසේක. මහරජතෙම, ˝ස්වාමීන්වහන්ස, මෝතොමෝ ජීවකයාගේ නැගෙණිවූ සිරිමාවය˝ යි සැළකෙළේය. ඒ අසා බුදුරජාණන්වහන්සේ, මැ සිරිමාවදැ?˝යි නැවතත් විචාළසේක. ˝එසේය˝ යි කියා රජතෙමේ සැළකෙළේය. ˝මහරජ, එසේ වීනම ˝දහසක් දී සිරිමාව ගනුවයි කියා නුවර බෙර හසුරුව˝යි වදාළසේක. මහරජතෙමේ එසේ කෙළේය. එකල්හි ඒ හෙරි ශබ්දය ඇසුවාවූ කිසිවෙක් අපි ගන්නෙමුය˝යි කියා හෝ ˝නොගන්නෙමුය˝යි කියා හෝ කිසිවක් නොවිචාරාම පිළිකුල්වූ සිත් ඇතිව සිටියේය. ස්වාමීන්වහන්ස කිසිවෙක් නොගන්නේයයි කියා ඒබව රජතෙමේ බුදුරජානන්වහන්සේට සැළකෙළේය. ˝මහරජ, ඉන් අඩක් දී ගනුවයි යි කියා බෙරපියවි කරව˝යි කියා වදාළසේක. රජතෙමේ ˝ඉන් භාගයක්වූ කහවනු පන්සියයක් දී මැ ගනුව˝යි කියා බෙරවපියවි කරවූයේය. එසේ කොටත් කිසිවෙක් නොගන්නා බැවින් ඉන් භාගයක්වූ කහවනු පන්සියයක් දි මැ ගනුව˝යිකියා බෙරපියවි කරවූයේය. එසේ කොටත් කිසිවෙක් නොගන්නා බැවින් ඉන් අඩ අඩ කොට මිල නියමකිරීමෙන් යටත්පිරිසෙයින්, ˝එක කාකණිකයක් දීමෙන්වත් ගනුව˝යි නියමකොටත් කිසිවෙක් ගන්නා තබා එක් වචනමාත්‍රයෙක් වත් නැති බැවින් ˝නොමිලයේවත් ගනුව˝යි කියා බෙර හැසිර වූයේය. ˝එසේත් ගන්නවුන් නැතැ˝යි බුදුරජාණන්වහන්සේට සැළකෙළේය. ඉක්බිති බුදුරජාණන්වහන්සේ, ˝මහණෙනි මහජනයාහට ප්‍රියව සිටි මේ මාගම බලව්. පෙර මේ මාගම් තොමෝ මෙනුවර වාසයකළ කෙනෙක, දහසක් කහවනු දී එක දවසක් ලබන ලද්දියක. දැන් වනාහි නොමිළයෙහිවත් ගන්නෙකු නැත්තේය. කැඩි බිඳි යන මේ ශරීරය මෙපමණ කලක් අලඞ්කාර කරණලද්දේය. නවද්වාරයෙකින් නිරන්තරයෙන් කුණුවැහෙන්නාවූ

තුන්සියයක් ඇටසඟළින් යුක්තවූ නිරන්තරයෙන් රොගාතුරවූ හුදෙක් බාලජනයා පමණක්ම ප්‍රාර්ථනා කරන්නාවූ අස්ථිරවූ ආත්ම භාවය යි දක්වනසේක්,

පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං.
ආතුරං බහුසංකප්පං යස්ස නත්ථි ධුවං ඨිති" ති

යනාදී ගාථාව වදාළසේක. දෙශනාවගේ කෙළවර සිරිමාව පිළිබඳ සිත් ඇතිභික්ෂුතෙම පහවූ රාග ඇතිවවිදර්ශනා වඩා රහත් වූසේක. එවේලෙහි අසූසාර දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමයවූයේය. එසමයෙහි වනාහි සිරිමා නම්වූ දෙවධිතෘ තොමෝ තමා විසින් ලබනලද දිව්‍යසම්පත් බලා, "කොහි සිට මේ දිව්‍යලොකයට ආයෙම්දැ?"යි බලන්නී පූර්වාත්මභාවයෙහි තමාගේ ශරීරය සමීපයෙහි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණලද බුදුරජාණන්වහන්සේද බොහෝ ජනසමූහයාද එක්රැස්ව සිටින බව දැක පන්සියයක් දිව්‍යකුමාරිකාවන් විසින් පිරිවරනලදුව පන්සියයක් රථ නැගී දෘශ්‍යමාන ශරීර ඇතිව අවුත් රථයෙන් බැස පිරිවර සහිතව බුදුරජාණන්වහන්සේ වැඳ කරණලද ඇඳිලි ඇතිව සිටියාය. එකල්හි වනාහි ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සිටියේ බුදුරජාණන්වහන්සේට මෙසේ සැල කෙලේය. ස්වාමීන් වහන්ස, එක ප්‍රශ්නයෙක් ඇසීමට බුදුරජාණන් වහන්සේ මට අනුදැන වදරණසේක්වා"යි දැල්විය. "වංගීසය, අසව" යි වදාළසේක. ආයුෂ්මත්වූ වංගීස ස්ථවිර තෙම සිරිමා නම් දෙව්දුව ගෙන් මෙසේ විචාළේය.

"යුත්තා ච තෙ පරම අලඞ්කතා හයා
අධොමුඛා අඝසිගමා බලි ජවා,
අභිනිම්මිතා පඤ්චරථාසතා ච තෙ
අන්වෙන්ති තං සාරථි චොදිතා හයා
"සා තිට්ඨසි රථවරෙ අලඞ්කතා
ඔභාසයං ජලමිව ජොතිපාවකො,
පුච්ඡාමි තං වරතනු අනොමදස්සනෙ
කස්මානු කායා අනධිවරං උපාගමී"

යනුහෙයින්, "එම්බා දෙවතාදුව, දිව්‍යමයවූ සර්වාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ සෛන්ධවයන් යොදනලද දිව්‍යරථ නැගී මහා ජවසම්පන්නව මවාගත් පන්සියයක් රථයෙන් පැමිණියාවූ තී සැටදහසක් ගැල්පුරවාලිය හැකි දිව්‍යමයවූ සර්වාභරණයෙන් සැරහී අලඞ්කෘතව සඳහිරුමෙන් දිළිහි දිළිහී මහත් ප්‍රසාද එලවමින් සිටින්නිය

බුදුරජාණන්වහන්සේ දැකීමට තී කවර නම් දිව්‍ය නිකායකින් පැමිණියාදැ?"යි විචාළේය මෙසේ තෙරුන්වහන්සේ විචාළකල්හි දෙවතා දූ තොමෝ.

"කාමග්ගපත්තානං යමාහුනුත්තරං
නිම්මාය නිම්මාය රමන්ති දෙවතා,
තස්මා කායා අච්ඡරා කාමවණ්ණිනී
ඉධාගතා අනධිවරං නමස්සිතුං"

යනුවෙන්. "ස්වාමීන්වහන්ස, කාමූපභොගයෙහි අග්‍ර බව ප්‍රාර්ථනාකළවුන්ට පරනිර්මිතවසවර්ති දෙවකාය යසසින්ද භොගාදී වශයෙන් ද උතුම්වේද එබඳු ශරීරයෙන් යුක්තව නිර්මානරතිදෙවියන් යම් ක්‍රමයකින් කැමැතිවනලදද එපරිද්දෙන් මව මවා කෙළිමින් නිර්මානරති දෙවනිකායිකවූ යම් රූපයක් දැකීමෙන් සතුටුවේද එවැනිවූ රූපශොභාවයකින් යුක්තව සම්මා සම්බුදුරජාණන්වහන්සේ දැකීම පිණිස මේ මනුෂ්‍යලොකයට පැමිණියෙමි"යි කීවාය. මෙසේ දෙවතාදුව තමාගේ නිර්මානරති භාවය ප්‍රකාශකළ කල්හි, ඇගේ පෙරභවයද පෙර කරණලද කුශලකර්මයද ලබ්ධියද ප්‍රකාශ කරවනු කැමති මහතෙරුන් වහන්සේ,

"කිං ත්වං පුරෙ සුචරිතමාචරිධ
කෙනච්ඡසි ත්වං අමිතයසා සුඛෙධිතා
ඉඩ්ඩි ච තෙ අනධිවරා විහඞ්ගමා
වණ්ණො ච තෙ දසදිසා විරොචති
"දෙවෙහි ත්වං පරිවුතා සක්කතා ච සි
කුතො චුතා සුගතිගතාසි දෙවතෙ,
කස්ස වා ත්වං වචනකරානුසාසනි
ආචික්ඛ මේ ත්වං යදි බුද්ධ සාවිකා"

යනුහෙයින්, "තී වනාහි බොහෝසේ රැස්කරණලද පුණ්‍යකර්මය කරන කොටගෙන අනෙකප්‍රකාරවූ යසපිරිවර ඇත්තී සැපයෙන් වැඩුනාවූ උතුම් වූ දිව්‍යානුභාවයෙන් යුක්තව ආකාශ ගාමීව දශදිශාවන් බබුලුවන්නීය. එසේම පිරිවරනලද දහස් සඞ්ඛ්‍යාත පරිවාරජනයන් ඇති තොපි කවරගතියකින් නික්ම මෙබඳු මහානුභාව සම්පන්න දිව්‍යගතියට පැමිණියෙහිද? එවැනි යහපත්වූ අනුශාසනා කිරීමෙහි ඉතා දක්‍ෂවූ බුඬ ශ්‍රාවිකාවූ තීගේ ලබ්ධි ආදිය කියව"යි වදළසේක එබස් අසා දෙවතාදූතොමෝ මේ ගාථාවන් ප්‍රකාශ කළාය.

"නගරන්තරෙ නගරවරෙ සුමාපිතෙ
පරිචාරිකා නගරවරස්ස සිරිමතො,
නච්චෙ ගීතෙ පරමසුසික්ඛිතා අහුං
සිරිමාති මං රාජගහෙ අවෙදිංසු

"බුද්ධො ච මේ ඉසිනිසභො විනායකො
අදෙසයි සමුදයදුක්ඛනිච්චතං,
අසඞ්ඛතං දුක්ඛනිරොධ සස්සතං
මග්ගඤ්චිමං අකුටිලමඤ්ජසං සිවං

"සුත්වානහං අමතපදං අසඞ්ඛතං
තථාගතස්සනධිවරස්ස සාසනං.
සීලෙස්වහං පරමසුසංවුතා අහුං
ධම්මෙ ඨීතා නරවරබුද්ධභාසිතෙ

"ඤත්වානහං විරජ පදං අසඞ්ඛතං
තථාගතෙන නධිවරෙන දෙසිතං.
තත්ථෙවහං සමථසමාධීමා ඵුසිං
සායෙව මෙ පරමනියාමතා අහු.

"ලද්ධානහං අමතවරං විසෙසනං
එකංසිකා අභිසමයෙ විසෙසිය,
අසංසියා බහුජනපූජිතා අහං
ඛිඩ්ඩාරතිං පච්චනුභොමනප්පකං,

"එවං අහං අමතදසම්හි දෙවතා
තථාගතස්සනධිවරස්ස සාවිකා,
ධම්මද්දසා පඨමඵලෙ පතිට්ඨිතා
සොතාපන්නා න ච පනමත්ථි දුග්ගති.

"ස වන්දිතුං අනධිවරං උපාගමිං
පාසාදිකෙ කුසලරතෙ ච භික්ඛවො,
නමස්සිතුං සමණසමාගමං සිවං
සගාරවා සිරිමතො ධම්මරාජිනො.

"දිස්වා මුනිං මුදිතමනම්හි පීණිතා
තථාගතං නරවරදම්මසාරථිං,
තණ්හච්ඡිදං කුසලරතං විනායකං
වන්දමහං පරමහිතානුකම්පකං."

යනුහෙයින්, "ඉසිගිලි ආදි පස්මහා පර්වතයන්ගේ මධ්‍යවර්තිවූ මහාගොවින්දාදි පණ්ඩිතයන්ගේ අනුශාසනාපරිදි නිර්මිත කරණලද ප්‍රාසාදපඞ්ක්තියෙන් යුක්තවූ නෘත්‍යගීතාදීයෙහි මනා පරිචයක් ඇතිව උතුම්වූ රජගහ නුවර බිම්බිසාර මහ රජ්ජුරුවන්ගෙන් ලබනලද ගරුසම්භාවනා ඇති මනාකොට හික්මුනාවූ නගරශොභිනියක් වූයෙමි. එකල්හි දශබල ධාරීවූ විනෙයජනයන් හික්මවන්නාවූ තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් නිර්වාණ ධර්මය කුළුගන්වා චතුරාර්‍ය්‍යසත්‍යය මට දෙශනාකොට වදරණ ලද්දේය. දෙවියන් සහිත ලොකයාහට අග්‍රදක්ෂිණාහීවූ තථාගත සම්‍යක් සම්බුඬයන්වහන්සේ විසින් කුළුගන්වා දෙශනාකරණලද ධර්මය මම සිලයෙහි පිහිටා ශ්‍රවණය කොට ධර්මයෙහිද පිහිටියෙමි. ඒ අනධිවරවූ තථාගතයන්වහන්සේ විසින් අමෘත පදය ගෙනහැර දක්වා වදරණ ලද ධර්මය ඇසූ මා විසින් ඒ නිවන් මග දැන සමථ සමාධිය ස්පර්ශකරණලද්දේය. එය මාගේ උතුම් නියාමක ධර්මය වූවාය. එසේ වූ මම නිර්වාණමාර්ගයට පැමිණ රත්නත්‍රය පිළිබඳව කිසි සැකයක් නැතිව පෘථක්ජනබවෙන් නොවෙනස්ව නිඃශංකා ඇත්තෙමි බහුජනපූජිතව ඛාලප වූ ක්‍රීඩා සැපය අනුභවකරන්නෙමි. එසේම නිර්වාණමාර්ගය දර්ශනය කෙරෙමින් පැමිණෙන ලද චතුරාර්‍ය්‍ය සත්‍යය ඇත්තෙමි සෝවන් ඵලයෙහි පිහිටියාවූ අනධිවර වූ තථාගත ශ්‍රාවිකාවක් විමි. ප්‍රථම ඵලයට පැමිණියාවූ ඒ මම කිසිකලෙකත් දුගතියකට නොපැමිණෙන්නෙමි. ස්වාමිනි, ප්‍රසාද වහනය වන්නාවූ නිවනෙහි ඇළුනාවූ යහපත් ශ්‍රමණ සමාගමය වූ භික්ෂූන් වැඳිම පිණිසද අනධිවරවූ ශ්‍රීමත් වූ ධර්මරාජන්වූ බුදුරජාණන්වහන්සේ වැඳීම පිණිසද ගෞරව සහිතව පැමිණියෙමි එසේ වූ බුදුරජාණන්වහන්සේ දැක ප්‍රමුදිතවූ සිත් ඇතිව ක්ෂයකරනලද තෘෂ්ණා ඇති කුශලයෙහි ඇලුනාවූ තුන්ලොවට නායක වූ නරදම්‍ය සාරථී සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා ඇති තථාගතයන් වහන්සේ මම වඳිනෙමි"යි කීවාය.

මෙසේ ඒ සිරිමා දෙවධිතෘතොමෝ තමාගේ ලබ්ධිය හා රත්නත්‍රය කෙරෙහි ප්‍රසාද බවද ප්‍රකාශකොට භික්ෂුසඞ්ඝයා සහිත බුදුරජාණන්වහන්සේට වැඳ ප්‍රදක්ෂිණාකොට දිව්‍යලොකයටම ගියාය. බුදුරජාණන්වහන්සේ ඒ උපන් කතාව අත්‍ථොත්පත්ති කොටගෙන ධර්ම දෙශනා කළ සේක ඒ ධර්ම දෙශනාව කෙළවර කළකිරුණාවූ භික්ෂුතෙම රහත් වූයේය. පැමිණ සිටි පිරිසටද ඒ ධර්මදේශනාතොමෝ සාර්ථක වූවාය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි
**පීඨවර්ගයෙහි සිරිමා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

## 17. කෙසකාරි විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පීඨ වර්ගයෙහි කෙසකාරි විමාන වස්තුව නම් කවරයත්:-

සුර නර විහගගණාකීර්ණ අමෘතඵල හරිත කල්ප වෘක්ෂයක් වැනි සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ එක් සමයෙක්හි කසී රට බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භික්ෂූහු පූර්වාහ්න සමයෙහි මනාකොට හැඳ පෙරවකයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන පිඬු පිණිස බරණැස් නුවරට වඩනාහු එම නුවර නාම ගොත්‍රයෙන් අප්‍රසිඩවූ එක්තරා බ්‍රාහ්මණයෙකුගේ දෙරකඩ සමීපයෙන් වඩනාහ. ඒ ගෙයි වසන්නා වූ බමුණාගේ කෙසකාරී නම් කුමාරිකා තොමෝ ගෘහවාරයෙහි මෑණියන් හිස උකුණන් හරිමින් සිටියාය. එදවස්ද පා සිවුරු ගෙන දෙර සමීපයෙන් පිඬු පිණිස වඩනා භික්ෂූන් දැක ඒ කුමාරිකවෝ මෑණියන් අතින් විචාරන්නී, මෑණියන් වහන්ස මේ භික්ෂූහු පැවිදිවූ බවක් මුත් ප්‍රථම නව යෞවන වයසින් යුක්තයහ. යහපත් දර්ශනීය වූ රූප ශ්‍රී ඇත්තාවූ සුකුමාලවූ ශරීර වර්ණඇත්තාහ. මේ ලොකයෙහි මහණවීමට කාරණා වූ පරිහානි සතරක් ඇත්තාහ. එයින් එක් පරිහානියකුත් මේ පැවිද්දන් කෙරෙහි නැතැයි සිතමි. මොහු කුමක් දැක කුමක් පිණිස ගිහි ගෙය හැර පැවිදිවූවාහුද?"යි මෑණියන් අතින් විචාළීය. එබස් අසා ඒ කෙසකාරි කුමාරිකාවගේ මෑණියෝ කියන්නාහු. "දියණියෙනි මේ ලොකයෙහි මහා සම්මත රජහු පටන් අසංකීර්ණව පැවත ආවාවූ ශාක්‍ය කුල තිලකයක් වැනිවූ ශුඩොදන මහා රාජොත්තමයන්ගේ පුත්‍රවූ උදරතර මහා සම්පත් ඇති හෙයින්ද දිව්‍ය සෙනාවක් සේ රූපශ්‍රීන් අග්‍රප්‍රාප්ත වූ ශාක්‍ය කොළිය දෙනුවර වාසීවූ නොයෙක් දහස් ගණන් ඤති රාජ සමූහයක් ඇති හෙයින්ද භොග ව්‍යසන ඤති ව්‍යසනාදී කිසි පරිහානියක් නැතිව සත් දවසින් ලබන්ට තිබූ සක්විති රාජ්‍යය හැර මහෙශාක්‍ය රාජකුලයෙන් නික්ම පැවිදිව සර්ව ධර්මයන් සර්වකාරයෙන් දත්තාවූ ශාස්තෘ වූ ගෞතම නම් බුදුකෙනෙක් මේ ලොකයෙහි පහළ විය, ඒ සියල්ල දත් බුදුරජානන් වහන්සේ මෙසේ බණ වදරණ සේක. කෙසේද යත්? පයර්‍යාප්ති ධර්මයන් සර්වභාගයෙන් සුන්දර බැවින් එක ගාථාවෙක්හි ප්‍රථමපාද වශයෙන් ද එකානුසන්ධික සූත්‍රයෙහි

නිදන වශයෙන්ද නා නා සන්ධික සූත්‍රයෙහි ප්‍රථමානු සන්ධිවශයෙන්ද තමහට අර්ථභූතවූ ශීලයෙන්ද යනාදිවූ නොයෙක් අර්ථයෙන් ආදියෙහි ශෝභනවූ හෙයින්ද ද්විතීය තෘතීය පාදයෙන්ද නිදන නිගමනයන්ගේ මධ්‍යයෙහි සමථ විදර්ශනා මාර්ග ඵලයෙන්ද නොහොත් විදර්ශනා මාර්ගයෙන්ද ධර්ම සුධර්මත්වයෙන්ද ප්‍රත්‍යෙකබොධි ඥානයෙන්ද ප්‍රතිපත්තියෙන්ද අර්ථ ශුද්ධියෙන්ද මධ්‍යයෙහි හොභන හෙයින්ද පශ්චිම පාදයෙන්ද නිගමනයෙන්ද නිර්වාණයෙන්ද සංඝ සුප්‍රතිපත්තියෙන්ද ශ්‍රාවක බොධි ඥානයෙන්ද ප්‍රතිපත්ති ඵලකෘත්‍ය ශුද්ධියෙන්ද අවශානයෙහි ශොභනවූ හෙයින්ද යන මේ ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූ මේ ශාසන ධර්මය ප්‍රකාශකරන්නාවූ අර්ථ රහිත අන්නපාන ස්ත්‍රී පුරුෂ වර්ණනාව හැර සම්මුති පස්ථානාදී නිශ්‍රිත නෛර්යාණික දෙශනාව පවත්වන හෙයින්ද මහා ශ්‍රාවක කාත්‍යායන මහාස්ථවිර භාෂිතවූ නෛරුක්තික්‍රමයෙන්ද සංකාශන ප්‍රකාශන විවරණ විභජන උත්තානීකරණ ප්‍රඥප්ත්‍යාර්ථ පද සමායොගයෙන් අර්ථ ගම්භීර ප්‍රතිවෙධ ගම්භිරත්වයෙන්ද අර්ථ සහිතව ද්‍රවිඩ කිරාක යවන පාරසිකාදි භාෂාවන් සේ එක ද්විප්‍රකාර ව්‍යඤ්ජන මාත්‍රයක් නොවී ශිථිල ධනිතාදිවූ දශවිධ ව්‍යඤ්ජනයෙන් සම්පූර්ණ බැවින් ද අක්ෂර පදව්‍යඤ්ජනක නිරුක්ති නිර්දේශයෙන්ද ව්‍යඤ්ජන සම්පන්න වූ ප්‍රක්ෂෙප වූ අනුක්ති ව්‍යවදාර්ථයන් නැති බැවින්ද ශීල සමාධි ප්‍රඥාදී ප්‍රභෙද ධර්මාඞ්ග සමාගමයෙන්ද හාත්පසින්ම පරිපූර්ණ වූ පරිත්‍යජ්‍ය සංක්ලෙශ ධර්මයන්හුගේ අභාවයෙන්ද නිර්දෙෂ බැවින්ද දෘෂ්ටිමානාද්‍යුපක්ලෙශාභාව වෘත්ත දුඃඛනිස්සරණ ප්‍රවෘත්ති ලොකාමිශ නිරපෙක්ෂත්වාදී හේතුයෙන්ද අත්‍යන්ත නිර්මලවූ ශ්‍රෙෂ්ඨාර්ථ බ්‍රහ්ම ශබ්දයෙන්ද වාච්‍යවූ බුද්ධප්‍රත්‍යෙක බුද්ධශ්‍රාවකයන්ගේ චරියාව යයි කියන ලද ශාසන මාර්ග බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙමින් විනෙය ජනයන් කෙරෙහි පතළ කරුණාවෙන් ධර්මදෙශනාකොට වදරණ සේක. ඒ ශාක්‍යකුල තිලකවූ බුදුරජාණන් වහන්සේගේ ධර්මදෙශනාව අසා මහත් රාජ්‍ය ශ්‍රී සම්පත් පවා හැර බොහෝසේම පැවිදිවන්නාහුවේදැ?"යි කීහ. එසමයෙහි සෝවාන් මාර්ග ඵලයෙහි පිහිටි යාවූ මේ සර්වඥ ශාසනය විශේෂයන්ම දක්නාවූ එක්තරා උපාසක කෙනෙක් ඒ වීථි මග යමින් සිට උන් කියන කථාව අසා ඔවුන් සමීපයට ගියේය. එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරිකා තෙමෝ කියන්නී, "එම්බා උපාසක ඥාති ව්‍යසනාදී කිසි පරිහානියක් නැතිව ක්ෂෙත්‍ර වස්තු ගව මහිස ධන ධාන්‍යාදී මහත් වූ උපභොග පරිභොග සම්පත් හැර බොහෝ කුල පුත්‍රයෝ ශාක්‍ය පුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ සස්නෙහි පැවිදිවෙති. ඊට කාරණා කවරේද? කවර අර්ථයක් පිණිස කවර වැඩක් දැක, කවර ප්‍රයෝජනයක් පිණිස පැවිදි වෙද්ද?"යි විචාළීය. එබස් අසා

ඒ උපාසක තෙම පඤ්චකාමයෙහි ආදිනව සහ නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංසද දක්වන්නේ, "එම්බා කුමාරිකාව පඤ්චකාම සම්පත්තිය නම් බොහෝකල් නොපවත්නා හෙයින් අතට ගත් දියත්තක් වැන්න, සිහිනෙන් අනුභව කළ භොජනයක් වැන්න, ශොකකිරීමය, දුක්ඛය, දෞර්මනස්‍යය, උපායාසය යනාදිවූ මහත් ඝොර දරුණුවූ සංසාර දුඃඛයට කාරණා වන හෙයින් මහත් ගිනි අඟුරු වළක් වැන්න, දරුණු විෂඝොර සර්පයකු වැන්න, ළෙහි ඇණී උලක් වැන්න" යනාදීන් පඤ්චකාමයෙහි ආදීනව හා "පඤ්චකාම සම්පත් හැර ගිහිගෙන් නික්ම පැවිදිවීම නම් සසර දුකින් මිදීමට කාරණා වන හෙයින් සිරගෙන් මිදුනාක් වැන්න, අති භයානකවූ අක් මුල් නැති සසර දුකින් මිදීමට කාරණා වන හෙයින් සිංහ ව්‍යාඝ්‍රාදී නොයෙක් උවදුරු සහිතවූ වනාන්තරයකින් නික්ම නිරුපද්‍රව ස්ථානයකට පැමිණි කෙනෙක් වැන්නැ"යි යනාදීන් පඤ්චකාම සම්පත් හැර නික්ම පැවිදීවීමෙහි ආනිශංසයද ප්‍රකාශකරමින් ඔහුගේ නුවණ පමණින් විස්තර කොට කීයේය. "තවද මේ ත්‍රිවිධ රත්නය නම් හිරුට වඩා තෙජොගුණය මහ මුහුද සේ ගැඹුරු ගුණය, මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි ප්‍රසන්නවූ තිරශ්චිනාදීන්ට පවා ස්වර්ග මොක්ෂ සම්පත් දයකවූ මහත්ගුණ ඇත්තේය." යනාදී රත්නත්‍රයෙහි ගුණද පංච ශීලය රක්ෂාකිරීමෙන් සිඬවන්නාවූ ඓහලෞකික පාරලෞකිකාභිවෘඬියද දෘෂටධාර්මික සාම්පරායිකාදී ගුණානිශංස වශයෙන් ප්‍රකාශකොට කීයේය. එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරිකාව එපවත් අසා සතුටු සිත් ඇතිව, "එම්බා උපාසකය එසේ වීනම් අප විසිනුදු ඒ සරණයෙහිද ශීලයෙහිද පිහිටා තා විසින් කියනලද ගුණානිශංසයට පැමිණෙන්ට පිළිවන්දැ?යි විචාළීය. එබස් අසා ඒ උපාසක තෙම කියනුයේ බුදුන් විසින් දෙශනා කරණ ලද මේ ධර්මය නම් සාධාරණය, සියලු සත්වයන්ට ප්‍රතිෂ්ඨාධාරය, එසේ හෙයින් කුමකින් නොහැකිවන්නේද? ඒකාන්තයෙන්ම හැකිවන්නේය" කියා සරණයද පඤ්චශීලයද දුන්නේය. සමාදන්වූ සරණ සිල් ඇති ඒ කුමාරිකා තොමෝ හේතු සම්පත් ඇති හෙයින් "ආචාරිනි මින්මතු කුමක් කටයුතුදැ?යි විචාළාය. හෙතෙම ඇ නුවණ ඇතිබව සලකා උපනිශ්‍රය සම්පත් ඇත්තීය යි දැන ශරීර ස්වභාවය දක්වමින් කායගතා සති වශයෙන් ඵත්තිංසාකාර කර්මස්ථානයන් කියා කායවිරතිය උපදවා කායවිරාගයෙන් මත්තෙහි අනිත්‍යතා ප්‍රතිසංයුක්ත කථාවෙන් සංවෙග උපදවා විදර්ශනා මාර්ගයට නිසි පිළිවෙත් කියා ගියේය. ඉක්බිති ඕතොමෝ උපාසකයා විසින් කියනලද ඒ සියලුම ප්‍රවෘත්තිය සිත තබා ප්‍රතිකූල මනස්කාරයෙහි එලවන ලද සිත් ඇතිව විදර්ශනා වඩා උපනිශ්‍රය සම්පත් ඇති හෙයින් නොබෝ කලකින්ම සෝවාන් ඵලයෙහි පිහිටියාය. ඉක්බිති

ඒ කෙසකාරි තොමෝ එයින් පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට එම කුශලානුභාවයෙන් තවුතිසා භවනයෙහි ශක්‍රදෙවෙන්‍ද්‍රයාට පරිචාරිකාව උපන්නීය. පරිවාර ස්ත්‍රීහු ලක්‍ෂයක් පමණ වූහ. ආශ්චර්යමත්වූ රූපශ්‍රීන් දිළිහි දිළිහී සිටි දිව්‍යාඞ්ගනාව දැක මහත්වූ ප්‍රීති සොම්නස් උපදවා සතුටු සිත් ඇතිව ශක්‍ර දෙවෙන්‍ද්‍රතෙම ඒ දෙවතා දුව විසින් ගිය දවස කළාවූ සුචරිත කර්‍මය ප්‍රකාශ කරවනු කැමතිව "ඉදං විමානං රුචිරං පභස්සරං" යානදී ගාථා සතරින් විචාළේය.

"ඉදං විමානං රුචිරං පභස්සරං
වෙළුරියත්‍ථම්භං සතතං සුනිම්මිතං,
සොවණ්ණ රුක්ඛෙහි සමන්තමොත්‍තං
ඨානං මම කම්මවිපාකසම්භවං.
තත්‍රූපපන්නා පුරිමච්ඡරා ඉමා
සතතං සහස්සානි සකෙන කම්මුනා,
තුවංසි අජ්ඣුපගතා යසස්සිනී
ඔභාසයං තිට්ඨසි පුබ්බදෙවතා.
සසි අධිගය්හ යථා විරොචති
නක්ඛත්තරාජාරිවතාරකා ගණං,
තථෙව ත්වං අච්ඡරාසං ගණං ඉමං
දද්දල්ලමානා යසසා විරොචසි.
කුතොනු ආගම්ම අනොමදස්සනෙ
උප්පන්නා ත්වං භවනං මමායිදං,
බ්‍රහ්මංව දෙවා තිදසා සඉන්දකා
සබ්බෙ න තප්පාමසෙ දස්සනෙතං"

යනු හෙයින්, "දස දිග රැස් විහිදෙන්නාවූ රන් කඳින් හා ශාඛාවලින්ද නොයෙක් වර්‍ණයෙන්ද බබලන්නාවූ පිපී වැනීගිය මලින් ගැවසී ගත්තාවූ අනෙක විධ දිව්‍ය වෘක්‍ෂ පඞ්කතියෙන් ගැවසී ගත් හෙයින් ස්වර්‍ණ වෘක්‍ෂ පෙළින් ගැවසී ශොභාමත්වූ උයන් පොකුණු කල්පවෘක්‍ෂාදියෙන් අති රම්‍ය වූ මෙම ස්ථාන යෙහි වෛදූර්‍ය මිණිමයවූ ටැම් ඇත්තාවූ අනෙකවිධවූ දිව්‍ය රත්නයෙන් සුනිර්‍මිත වූ භිත්ති දොර කවුළු සොපාන මාලාකර්‍ම ලතාකර්‍මාදියෙන් ශොභාමත්වූ නොයෙක් රැසින් දිළියෙන හෙයින් ප්‍රභාමත්වූ අති මනොඥවූ මේ විමානය අතිශයින් ශොභිතවිය. මේ විමානාධිගෘහිතව උපන්නාවූ එම්බා භද්‍රාව මාගේ මේ ශක්‍ර පුරයෙහි මාගේම කර්‍ම විපාකයෙන් පහළවූ ලක්‍ෂයක් පමණ දිව්‍යාඞ්ගනාවන් හා

මේ පුර ස්ත්‍රීන් මධ්‍යයෙහි රූපශ්‍රීයෙන් හා ශරීරාලෝකයෙන් දශදිගුන් එකාලොක කෙරෙමින් සිටිනීය. සසලාඤ්ජනයක් ඇත්තාවූ සියලු නක්‍ෂත්‍ර තාරකාවන්ට අධිපති හෙයින් නක්‍ෂත්‍ර රාජන්වූ චන්‍ද්‍රතෙම සියලු තාරකා සමූහයා අභිභවනය කොට අධික වූ කාන්තියෙන් යම්සේ අතිශයින්ම බබලාද එමෙන් යශශ්‍රී ඇති එම්බා භද්‍රාව, තී මේ ස්ත්‍රී සමූහයා අභිභවා දිලියෙමින් අතිශයින්ම දීප්තිමත්ව බබලන්නෙහිය. සහම්පති මහා බ්‍රහ්මයා මේ තවුතිසා භවනයට පැමිණිකල තවුතිසා වාසීවූ ඉන්‍ද්‍රාදි දිව්‍යසමූහයා ඒ බ්‍රහ්ම රුව බලා යම්සේ තෘප්තියකට පත් නොවේද එමෙන් තීගේ රූසිරු බලා අපි සියල්ලද තෘප්තියකට නොපැමිණෙම්හ. මෙබඳු රූපශ්‍රීයක් ඇත්තාවූ අලාමක දර්‍ශනීය වූ එම්බා දිව්‍යාඞ්ගනාව, තී කොයින් අවුත් මාගේ මේ දිව්‍යභවනයෙහි උපන්නෙහිද? කවර කුශලයක් කොට මෙබඳු සම්පත්තියක්ලද්දෙහිදැ?"යි විචාළේය. මෙසේ ඒ සක්දෙව් මහරජාණන් විසින් විචාළ ප්‍රශ්න විසර්ජනය කරන දිව්‍යාඞ්ගනාතෙමෝ මෙසේ කිව.

"යමෙතං සක්ක අනුපුච්ඡසෙ මම
කුතො චුතා ත්වං ඉධආගතාති,
බාරානසී නාම පුරත්ථිකාසිනං
තත්ථ අහොසිං පුරෙ කෙසකාරිකා.
බුද්ධෙ ච ධම්මෙච පසන්නමානසා
සංඝෙ ච එකන්තගතා අසංසයා
අඛණ්ඩසික්ඛා පදෙ ආගතප්ඵලො
සම්බොධිධම්මෙ නියතා අනාමයා"

යනුහෙයින්, "ශක්‍රදෙවේන්‍ද්‍රයාණන් වහන්සේ. මා ගිය දවස කළ කුශලයත්, කොයින් චුතව මෙහි උපන්නෙහිදැ"?යි කියා පෙරවිදුතැනුත් කර්‍මානුරූප වශයෙන් විචාරණසේක් වී නම් අසා වදළ මැනව, කසීරට බරණැස් නුම් නුවරෙක් ඇත්තේය. මම ඒ නුවර කෙසකාරි නම් බමුණු කුමාරිකාවක් වීමි. එකල්හි බුද්ධ රතනය ධම්මරතනය, සංඝ රතනය යන මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි ප්‍රසන්න වූ සිත් ඇතිව නොකඩකොට පඤ්චශීලය රක්‍ෂා කෙළෙමි. ත්‍රිවිධ සංයෝජනයෙන් දුරුව සොවාන්ඵලයෙහි පිහිටා සංකාරහිතව දෘෂ්ට්‍යාසයෙන් එතරව අධික වූ කෙලශරොගයෙන් මිදී එකාන්තයෙන්ම නිවන් මගට පැමිණ නිරෝගි සුවපත් වීමි"යි කිව. එබසට සතුටුව ප්‍රශංසාකරන්නාවූ සක්දෙව් මහරජාණෝ මේ මතුකියන ගාථායෙන් මෙසේ කීහ.

"තං ත්‍යාභිනන්දමසෙ සාගතඤ්ච තෙ
ධමෙමනචත්‍වං යසසා විරොචසි,
බුඬෙ ච ධමෙම ච පසන්නමානසෙ
සංඝෙ ච එකන්තගතෙ අසංසයෙ.
අඛණ්ඩසික්ඛාපදෙ ආගතපඵලෙ
සමෙබාධිධමෙම නියතෙ අනාමයෙ"ති.

යනුහෙයින්, "බුඬරත්නය ධම්මරත්නය සංඝරත්නය, යන මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි පහන් සිත් ඇත්තාවූ අචලශ්‍රඬාවෙන් යුක්තවූ ශික්ෂාපද වශයෙන් ශීල සමාධි ප්‍රඥාදී ගුණයෙන් සමන්නාගතවූ පැමිණෙනලද සොවාන් පල ඇති හෙයින් එකාන්තයෙන් නිර්වාණමාර්ගයට පැමිණියාවූ එහෙයින්ම නිරොගවූ අලාමක දර්ශනීය වූ එම්බා භද්‍රාව, තී මේ දිව්‍යභවනයට ආගමන ඉතා යහපත. තීගේ යම් පරිවාරාදී සම්පත්තියෙක් යසසෙක් ඇත්නම් ඒ සියල්ලම ධර්මයෙන්ම ජොතිමත් වෙයි. එසේ හෙයින් විශේෂයෙන්ම සතුටුවම්හ"යි කියා ප්‍රශංසාකෙළේය. ඉක්බිති එක් දවසක් මුගලන් මහතෙරුන්වහන්සේ යට කී ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනා දැක ශක්‍රදෙවෙන්ද්‍රතෙම මහතෙරුන්වහන්සේ කරා එළැඹ නමස්කාරකොට එකත්පස්ව සිට මෙහි කියනලද ප්‍රශ්නයත් විසර්ජනයත් එක්කොට ඒ සියලු ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට දැන්වූයේය. මහතෙරණුවෝද ඒ සියල්ල බුදුරජාණන්වහන්සේට සැළකළහ බුදුරජාණන්වහන්සේ එම කථාව අත්‍ථෝත්පත්තිකොට ගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට ධර්මදෙශනාකොට වදාළසේක. ඒ ධර්මදෙශනාව දිව්‍යමනුෂ්‍යයන් සහිත ලොකයාහට ප්‍රයෝජනය විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි
**කෙසකාරි විමානවස්තු වර්ණනාව**
කියා නිමවනලදී

පරමාර්ථජෝතිකා නම් වූ මේ විමාන වස්තු ප්‍රකරණයෙහි
පළමුවන පීඨවර්ග වර්ණනාවයි.

# චිත්‍රලතා වර්ගය.

## 18. දසි විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතාවර්ගයෙහි දසි විමානවස්තුව නම් කවරයත්:- දිව්‍ය බ්‍රහ්ම නමැති හංස සමූහයා විසින් එලඹියයුතුවූ පියුම් විලක් වැනිවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි සැවැත්නුවර වසන්නාවූ එක්තරා උපාසකකෙනෙක් බොහෝ උපාසකවරුන් සමග විහාරයට ගොස්බණ අසා ඉක්බිති සියලු පිරිස නැගී ගියකල බුදුන් කරා එළඹැ නමස්කාර කොට එකත්පස්ව හිඳ දක්වනුයේ, "ස්වාමීනි, මම මෙතැන්පටන් සඞ්ඝයාට නිරන්තරයෙන් බත් සතරක් දෙමි"යි කීයේය. එකල්හි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ප්‍රස්තානුකූල වශයෙන් බණ වදරා වදළ බණෙහි සිත සමාදන් කරවා සමාදන් කළ ප්‍රතිපත්තියෙහි සිත තියුණු කරවා ඒ දනය සංඝයාට දෙවූසේක. ඉක්බිති උපාසකයා බුදුන් වැඳ අවසර ගෙන එයින් නැගී උපාසක වරුන්ගේ ආරාධනා පිළිගෙන සංඝයා නියමකොට දක්වා දෙන්නාවූ බත් උදෙසන තෙරුන්වහන්සේ කරා ගොස් වැඳ කියන්නේ "ස්වාමීනි මගේ ගෙයි සෙට පටන් නිරන්තරයෙන්බත් සතරක් තබා මා විසින් සඞ්ඝයාට දෙනු ලැබෙයි. සෙට පටන් සඞ්ඝයා වහන්සේ මාගේ ගෙට නිරන්තරයෙන් වඩනාසේක්වා"යි කියා බත් උදෙසන තෙරුන්වහන්සේට ආරාධනාකොට ඉක්බිති තමන්ගේ ගෙට ගොස් දසිය කැඳවා කියන්නේ, මම විහාරයට ගොස් බණ අසා සතුටු සිත් ඇතිව, සඟහට නිරන්තරයෙන් බත් සතරක් දෙමි කියා ආරාධනා කෙළෙමි. එසේ හෙයින් තී විසින් සෑම කලම නොපමාවිය යුතු ය"යි කීයේය. ඒ දසි වානහි ශීලසම්පන්න වන්නීය ශ්‍රද්ධා ඇති හෙයින් විශේෂයෙන්ම කුශල් කැමැත්තීය. එබැවින් එබසට සතුටුව ඒ වචනය මුදුණෙන් පිළිගෙන දවසින් දවස කල් බලා නැගී ප්‍රණීතවූ අන්නපාන ඛාද්‍යභොජ්‍යාදී සියලු භොජන විකෘතිය පිළියෙළකොට ඉක්බිති ගෙයත් හැමද සුවඳ පිරිබඩලා අසුන් පණවා භික්ෂූන් වැඩිකල අසුන්වල වඩා හිඳවූ නමස්කාර කොට ගඳදුම් මල්පහන් ආදියෙන් පුද නිරන්තරයෙන් සතුටුවී සකස්කොට අහර වළඳවන්නීය. ඉක්බිති එක් දවසක් කරණලද අහරකිස ඇති භික්ෂූන් කරා එළඹැ නමස්කාරකොට විචාරන්නී, "ස්වාමීනි, ජාතිජරාමරණාදී දුකින් මිදීමට කවර හේතුවකින් පිළිවන්දැ?යි විචාළීය. එකල්හි භික්ෂූහු· දසියට සරණයද පඤ්චශීලයද දී

ඉක්බිති ශරීර සවභාව දන්වා කායගතාසති වශයෙන් ප්‍රතික්කූල මනසිකාර කර්මස්ථානයක් කියා අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මකථාවෙන් බණ වදළා හුය. ඉක්බිති ඒ ස්ත්‍රී එතැන් පටන් සොළොස් අවුරුද්දක් නොකඩකොට සිල් රක්‍ෂාකරන්නී අතුරතුරෙහි සිහි නුවණින් යෙදී කමටහන් මෙනෙහිකරන්නී එක්දවසක් ධර්මශ්‍රවණසත්ප්‍රාය ලැබ ඥානපරිපාකයට ගිය බැවින් විදර්ශනාවඩා සෝවාන් ඵලයෙහි පිහිටියාය. ඒ ස්ත්‍රීතොමෝ එයින් පසු නොබෝකලකින් කාලක්‍රියාකොට තවුතිසා දෙව්ලොව සක්දෙව් මහ රජාණන්ට වල්ලභවූ පරිචාරිකාවක් ව උපන්නීය. පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය භාණ්ඩ ගත් සැටදහසක් පමණ නළු නාටකයන් විසින් පිරිවරණ ලදුව ලක්‍ෂයක් දෙවඟනන් හා සමග මහත්වූ දිව්‍යානුභාවයෙන් දිළිහි දිළිහී මහත් දිව්‍ය සම්පත් අනුභව කරන්නී සමගිව සතුටුව සහ පිරිවරින් නන්‍දනොද්‍යානාදියෙහි ක්‍රීඩා කෙරෙමින් හැසිරෙයි. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඞ්ගනාව දැක ඈ විසින් ගිය දවස කළාවූ කුශලකර්මය ලොකයාහට ප්‍රකාශකර වනු කැමතිව "අපි සකෙකාව දෙවිනෙද" යනාදී ගාථාවලින් විචාළසේක.

"අපි සකෙකාව දෙවිනෙද රමෙම චිත්තලතාවනෙ
සමනතා අනුපරියාසි නාරිගණපුරකඛතා,
ඔභාසෙනති දිසා සබබා ඔසධී විය තාරකා"

යනුහෙයින්, "චිත්‍රා නම් දිව්‍යාඞගනාවගේ කුශලකර්මයෙන් පහළවූ හෙයින්ද බොහෝසේම නොයෙක් ඵල පල්ලවයෙන් හා මලින් ගැවසීගත්තාවූ කල්ප ලතාවනයෙන් ගැවසීගත් හෙයින් චිත්‍රලතාවනයයි කියනලද අතිරම්‍ය වූ උයන්හි දෙව්ලොව දෙවියන් පිරිවරා අඩුතුන් කෙළක් සුරංගනාවන් හා සමග උයන් කෙළියට වන් ශක්‍රයාමෙන් හාත්පසින් ගැවසීගත්තාවූ දිව්‍ය ස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි ජොතිමත්ව බබලන්නෙහි. තවද සියලු තාරකා වන් අභිභවා ජොතිමත් බබලන්නාවූ ඔසධි තාරකාවක් සේ ශරීරාලොකයෙන් දශදිග් ඒකාලෝක කෙරෙමින් බබලන්නෙහිය. එම්බා දෙවතාදුව, තී මෙබඳු වර්‍ණසම්පත් පරිවාරසම්පත් ආදිවූ මේ සියලු සම්පත් ලැබීමට කරණලද කුශල කර්මය කවරේදැයි විචාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණලද වචනය මුදුණෙන් පිළිගත් ඒ දෙවතාදුව මේ මතු කියන ගාථාවන්ගෙන් කුශල කර්මය ප්‍රකාශකළාය.

"අහං මනුසෙසසු මනුසසභූතා
දසි අහොසි පරපෙසසියා කුලෙ.

උපාසිකා චක්ඛුමතො, ගොතමස්ස යසස්සිනො,
තස්සා මෙ නික්ඛමො ආසි සාසනෙ තස්ස තාදිනො,
කාමං භිජ්ජතු යං කායො, නෙව අජෙඣපප සජ්ඣනං" පෙ-

යනුහෙයින්, ස්වාමීනි මම මීට පූර්වජාතියෙහි මනුෂ්‍යයන් අතුරෙන් අනුන්ගේ ගෙදර දසියක්ව බැලමෙහෙකෙරෙමින් ජීවත් වීමි. එතකුදුවුවත් ගෞතම ගොත්‍රයෙහි උපන් හෙයින් ගෞතම නම්වූ පසැස් ඇති සර්වඥයන්වහන්සේගේ ශාසනයෙහි ශ්‍රද්ධා සම්පන්න උපාසිකාවක්ව සොළොස් හවුරුද්දක් මුළුල්ලෙහි සිල්රක්ෂා කෙරෙමින් කායගතාසතී ආදී කර්මස්ථාන මෙනෙහි කරන්නාවූ මට මෙබඳු සිතෙක් පහළවිය. මෙපමණින්ම මාගේ වියසිසන්තානය ශීථිලවෙයි. වීර්යය වඩා සිත තියුණුකරන්නෙමි දෙතිස් කුණප කොට්ඨාසයෙන් යුත් මේකය ඒකාන්තයෙන් පෙන පිඩක්සේ බිඳීයන්නේය. එසේ හෙයින් ඒ බුදුන්ගේ සත්තිස් බොධි පාක්ෂික ධර්ම සඞ්ඛ්‍යාත ශාස්තෲශාසනයෙහි අප්‍රමාදව වීර්යය කටයුතුයයි සිතා බලවත් උත්සාහ ඇතිව විදර්ශනා වඩා කෙලෙසුන් කෙරෙන් නික්ම ශාසනයට ඇතුළත්ව උතුම් ලොකොත්තර ගුණයෙහි පිහිටියෙමි"යි කියා ඉක්බිති ආර්යමාර්ගයෙහි ගුණ දක්වන්නී මෙසේ කිව

"සික්ඛාපදානං පඤ්චන්නං මග්ගො සොවත්ථිකො සිවො.
අකණ්ටකො අගහණෝ උජුසබ්භිපවෙදිතො,
නික්කමස්ස ඵලං පස්ස යථිදං පාපුණිත්ථිකා,
ආමන්තනිකා රඤ්ඤොම්හි සක්කස්ස වසවත්තිනො"

යනුහෙයින්, "යමෙක් නිත්‍ය ශීලවශයෙන් සමාදන්වූ පඤ්ච ශික්ෂාපද කොට්ඨාසයන්ගේ උපනිශ්‍රය භාවයෙන්ද ඒ ශික්ෂාපදයන්ගේ පාරිපූරිකත්වයෙන්ද ලද්දවූ ශික්ෂාපදයන් සම්බන්ධවූ ගුණයෙන් යම් සිතක හටගත්තාවූ සන්තොෂයෙක් ඕහට සර්වප්‍රකාරයෙන් සැප ඵලවාද, එබැවින් යහපත්වූ කෙළෙස් සතුරන් කෙරෙන් වන උවදුරු නැති බැවින් ක්ෂෙමවූරාග නැමති විෂකටු නැති බැවින් පිරිසුදුවූ, මිථ්‍යාදෘෂ්ටි නැමැති වනගහනයෙන් මිදුනු බැවින් වල්නැත්තාවූ වඞ්කකුටිලභාවයක් නැති හෙයින් ඍජුවූ, බුද්ධාදී මහොත්තමයන් විසින් ප්‍රතිවෙධ කරණලද්දවූ යම් ආර්ය මාර්ගයක් ඇද්ද, ඒ මාර්ගයට යම් උපායකින්, යම් ඥනයකින්, පැමිණියෙම්ද, එම ඵලානිශංසය බලා වදළමැනව. ඉසුරුමත් සක්දෙව් මහරජාණන්ගේ කෙලිකාලයෙහි ඔහු විසින් අලාප සලාපාදී ක්‍රීඩාවට කැඳවිය යුතුවීමි" කියා ගිය දවස කළාවූ කුශලයත් එයින් පැමිණි අධිපතිභාවයත් ප්‍රකාශකොට ඉක්බිති පරිවාර සම්පත් ප්‍රකාශකරන්නී,

"සට්ඨිතුරියසහස්සානි පටිබොධං කරොන්ති මෙ,
ආලම්බො ගග්ගරො භීමො සාධුවාදීච සංසයො.
පොක්ඛරො ච සුඵස්සො ච වීණාමොක්ඛා ච නාරියො
නන්දාචෙව සුනන්දා ච සොණදින්නා සුචිම්හිතා.
අලම්බුසා මිස්සකෙසී ච පුණ්ඩරිකාතිදාරුණී,
එණිඵස්සා සුඵස්සා ච සුභද්දා මුදුවාදිනී.
එතා චඤ්ඤා ච සෙය්‍යාසෙ අච්ඡරානං පබොධිකා
තා මං පාලෙනුපාගන්ත්වා අභිභාසන්ති දෙවතා,
හන්ද නච්චාම ගායාම හන්ද තං රමයාමසෙ,
නයිදං අකතපුඤ්ඤානං කතපුඤ්ඤාන මෙවිදං.
අසොකං නන්දනං රම්මං තිදසානං මහාවනං.
සුඛං අකතපුඤ්ඤානං ඉධ නත්ථි පරත්ථ ච,
සුඛඤ්ච කතපුඤ්ඤානං ඉධ චෙව පරත්ථ ච"

යනුහෙයින්, "භෙරිවීණාදී තූර්‍ය්‍යභාණ්ඩයන් අතුරෙන් එක් මුහුණින් යුත් සැලබෙර විදුරුබෙර ආදිවූ ආතත නම් තූර්‍ය්‍ය විශේෂයෙන් දෙළසෙක, එසේම දෙමුහුණින් යුත් මිහිඟුබෙර ආදී විතත නම් තූර්‍ය්‍ය විශේෂයෙන් දෙළසෙක, සර්‍වභාගයෙන් වෙළා කරණලද පණාබෙර ආදිවූ ආතත විතත නම් තූර්‍ය්‍ය විශේෂයෙන් දෙළසෙක, කුලුතාලම් ආදී කොට ඇති ඝන නම් තූර්‍ය්‍ය විශේෂයෙන් දෙළසෙක. වස්කුළල් සක් සින්නම් ආදී සුසිර නම් තූර්‍ය්‍ය විශේෂයෙන් දෙළසෙකැයි මෙසේ පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩ විශේෂයෙන් දෙළස දෙළසක් එකිනෙකට දහස දහස බැගින් පරිවාර හා සමග සැටදහසක් පමණ වූ ආලම්බ නම් ගන්ධර්‍ව දිව්‍යපුත්‍රයාය, එසේම ගග්ගරය, භීමය, සාධුවාදීය, සංසය ය, පුෂ්කරය, සුඵස්සයයනාදි නොයෙක් ගන්ධර්‍වදිව්‍යපුත්‍රයන් හා වීණාමොක්ෂාය, නන්දය, සුනන්දය, සොණදින්නාය, අලම්බුසාය, මිශ්‍රකෙසීය, පුණ්ඩරිකාය යනාදීවූ නොයෙක් දිව්‍යාඞ්ගනාවන් හා මෙකී නොකී සැට දහසක් පමණ නළුනාටක සෙනාව පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩ ගෙන යුක්ත ප්‍රයුක්ත වූ කාලයෙහි මා කරා එළැඹ හාවභාව ලීලා දක්වා මෘදු ප්‍රියවචනයෙන් මෙසේ කියති. හිමි, කුමක් කරමෝද නෘත්‍ය කරමෝද? ගායනාකරමෝද? කවර ක්‍රීඩාවක නුඹ සිත් ඇලේද? යනාදී ප්‍රිය බස් කියා පදමයක් ප්‍රබොධකරන්නාසේ මාගේ සිත සතුටු කරවති. මා විසින්ලද්දවූ මේ දිව ඉසුරු කුසල් කළවුන්ටම නියතවා විනා කුශල් නොකළවුන්ට නොලැබෙන්නේය. තවුතිසා වැසි දෙවියන්ගේ සිත් සතුටු කරවන්නාවූ සිත් කළුවූ මේ නන්ද නම් උයනෙහි ක්‍රීඩා සැප විඳිම්හ. ඉහලොක පරලොක සම්පත්තියද කුසල් නොකළාවූ උභයලොකවාසීන්ටම නොලැබෙයි" කියා කුසල්කළවුන්ටම සාධාරණ බව දක්වන පිණිස,

"තෙසං සහව්‍යකාමානං කත්තබ්බං කුසලං බහුං,
කතපුඤ්ඤා හි මොදන්ති සබ්බභොග සමඞ්ගිනො"

යනුහෙයින්, " ඒ තවුතිසා වැසි දෙවියන් හා එක්ව දිව්‍යසම්පත් අනුභවකරනු කැමැත්තන් විසින් දනාශීලාදී වශයෙන් බොහෝ කුශල් කටයුත්තේය"යි කීව. එකල්හි මුගලන් මහ තෙරුන්වහන්සේ පිරිවර සහිතවූ ඒ දෙව්දුවට විස්තරවශයෙන් බණවදරා මිනිස්ලොවට වැඩ සියලු ප්‍රවෘත්තිය බුදුරජාණන් වහන්සේ ට සැළකළසේක. බුදුරජාණන් වහන්සේ එම අර්ථොත්පත්ති කොට ගෙන එතැන්හි රැස්වූ පිරිසට ධර්මදෙශනා කොට වදළ සේක. ඒ ධර්ම දෙශනාව දිව්‍යමනුෂ්‍යයන් සහිත ලොකයාහට සාර්ථකවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි
**චිත්‍ර ලතා වර්ගයෙහි දසි විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදි.

## 19. ලබුමා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතාවර්ගයෙහි දෙවැනිවූ ලබුමා විමාන වස්තුව නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. හේ කෙසේද යත්?

සර්වලොක දිවාකරවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි බරණැස්නුවර ඉසිපතනාරාමයෙහි වැඩවාසයකරණ සේක. එසමයෙහි කෙවට්ටවාර නම් වූ බරණැස්නුවර එක්තරා වාරයෙක් ඇත්තේය. ඊට නුදුරුතෙන නිවිට්ට නම් ගමය යි කියා කෙවට්ටවාරයටම ව්‍යවහාරකරනු ලැබේ. ඒ නිවිට්ටගාම නම් වූ කෙවට්ටවාරයෙහි නුවණැත්තාවූ ශ්‍රද්ධාසම්පන්න වූ ලබුමා නම් වූ එක්තරා ස්ත්‍රියක්තොමෝ පිඩු පිණිස පැමිණෙන භික්ෂූන්ට දන් දී නැවතීමට අසුන් ශාලාවක් කොට දුන්නීය. අනෙකවිධ වූ ධාන්‍යරසයෙන් පානයකිරීම පිණිස ආචාමකඤ්ජිකයයි පාන වර්ගයක්ද පිළියෙළකොට දෙන්නීය. මෝ තොමෝ ප්‍රථම ඵලයයි කියනලද සෝවාන් ඵලයටද මුගලන් මහතෙරුන්වහන්සේ ගෙන් අසනලද ධර්මදෙශනාවශානයෙහි සකෘදගාමී ඵලයටද පැමිණියාය.

(මෙහි විස්තර කථාව උත්තරා වස්තුවෙහි ආ නියායෙන් දතයුතු)
මේ විමානවස්තු ප්‍රකරණයෙහි
**චිත්‍ර ලතා වර්ගයෙහි ලබුමා විමානවස්තු වර්ණනාව** කියා නිමවනලදී

# 20. ආචාම දයිකා විමාන වස්තුව

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි චිත්‍ර ලතා වර්ගයෙහි තෙවැනි වූ ආචාම දයිකා විමාන වස්තුව නම් කවරැයත්:- එහි පළිවෙළ කථාව මෙසේ දතයුතු.

සර්වලොකහිතානුකම්පීවූ අනධිවර වූ තථාගත සම්මාසම්බුදු රජාණන්වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එම නුවර එක්තරා කුලයක් අහිවාතක රෝගයෙන් නැසී එක් ස්ත්‍රියක් ඉතිරිව හික්මිය බිඳ ගොස් එක්තරා ගෙයක පිටිපස දුඃඛ ජීවිකාවෙන් ජීවත්ව වසන්නී ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට ලුණු නුමුසු පිළින් කැදිත්තක් දී එදවස් රාත්‍රියෙහි කාලක්‍රියාකොට නිර්මානරතී නම් දිව්‍යලොකයෙහි උපන්නීය. ශක්‍රදෙවෙන්‍ද්‍රයෝ ඒ ස්ත්‍රිය කාලක්‍රියාකළ බව දැන මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කරා ගොස් මෙසේ විචාළේය.

"පිණ්ඩාය තෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දළිද්දා කපණා නාරි පරාගාරං අවස්සිතා.
යා තෙ අදාසි ආචාමං පසන්නා සෙහි පාණිහි,
සාහිත්වා මානුසං දෙහං කන්නු සාදිසතං ගතා"ති

යනුහෙයින්, "ස්වාමිනි. පිඬු පිණිස වැඩ තුෂ්නීම්භූතව සිටියාවූ නුඹවහන්සේට පිළිනි කැදිත්ත දුන් දිළිඳු ස්ත්‍රී තොමෝ කාලක්‍රියාකොට කොහි උපන්නීදැ?" විචාළේය එකල්හි මහතෙරහු මෙසේ වදළසේක.

"පිණ්ඩාය මෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දළිද්දා කපණා නාරි පරාගාරං අවස්සිතා.
යාමෙ අදාසි ආචාමං පසන්නා සෙහි පාණිහි,
සා හිත්වා මානුසං දෙහං විප්පමුත්තා ඉතො චුතා.
නිම්මානරතිනො නාම සන්ති දෙවා මහිද්ධිකා,
තත්ථ සා සුඛිතා නාරී මොදතා චාමදායිකා"ති

යනුහෙයින්, "ශක්‍රදෙවෙන්‍ද්‍රයෙනි, මට පිළිනි කැදිත්තක් දුන් දුප්පත් ස්ත්‍රිය ඒ කැදිත්ත දුන් කුශලයෙන් නිර්මානරතී නම් දිව්‍යලොකයෙහි උපන්නීය" යි වදළසේක. "මෙහි විස්තර දේශනාව පරිච්ඡෙද පොතෙහි හෙළු බසින් ප්‍රකාශ වූ බැවින් මෙතැන් හි සංක්ෂෙප විය. විස්තර අසනු කැමැත්තහු දන පරිච්ඡෙදයෙන් අසා දතයුත්තාහ" ඉක්බිති ආයුෂ්මත්

මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ශක්‍රයා විචාළ නියාවත් මහතෙරහු වදළ නියාවත් විස්තර වශයෙන් බුදුන්ට දැන්වූසේක. බුදුරජාණෝ එම අත්‍යෝත්පත්තිකොට ගෙන එතැන්හි රැස්වූ පිරිසට බණ වදළසේක. ඒ ධර්‍මදෙශනාව බොහෝ දෙනාට සාත්‍ථිකවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්‍ගයෙහි
**ආචාම දයිකා විමාන වස්තුව**
කියා නිමවනලදි.

## 21. චණ්ඩාලි වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්‍ගයෙහි සිව්වැනිවූ චණ්ඩාලි විමාන වස්තුව නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

මහපොළොව සේ විස්තාර වූ ගුණ ඇති භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වැඩවසනසේක. එසමයෙහි බුදුරජාණන්වහන්සේ එක් දවසක් අලුයම් වේලෙහි මහා කරුණා සමාපත්තීන් නැගී විනෙයජනයන් දක්නා පිණිස මුළුලොව බලා වදළසේක. එකල්හි රජගහනුවර සමීපයෙහි එක්තරා සැඩොල් ගමෙක් ඇත. ඒ ගම වසන්නාවූ ගෙවුනාවූ ආයු ඇතිව නරකයෙහි උපදනා අකුශල් ඇති එක්තරා චණ්ඩාල මැහැල්ලක් දැක වදරා ඈ කෙරෙහි කරුණා උපදවා සිතා වදරණ සේක, "ස්වර්‍ගලොක සම්පතට කාරණාවූ කුශලයක් ඈ ලවා කරවා නරකයට යන ගමන් වළකා දෙව්ලොව උපදවමි"යි සිතා වදරා මහත්වූ භික්‍ෂු සංඝයා පිරිවරා රජගහනුවරට පිඩු සිඟා වැඩිසේක. එසමයෙහි ඒ සැඩොල් මැහැළිතොමෝ සැරයටි දඬුකඩෙක එල්බගෙන නුවරින් නික්ම යන්නී මහසඟ පිරිවරා වඩනා බුදුන් දැක ඉදිරියෙහි සිටියාය. සර්‍වඥයන්වහන්සේද ඇගේ ගමන් වළකන්නා සේ මහසඟ පිරිවරා මාර්‍ගය මැද වැඩසිටිසේක එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ බුදුන් ගේ අදහස් දැන එදවස්ම ඇගේ ආයුසංස්කාරය ගෙවෙන නියාව දැන ඈ කෙරෙහි කරුණා උපදවා බුදුන් සිරිපා වඳවා වැඩෙහි යොදනු පිණිස ඉදිරියෙහි සිටි සැඩොල් මැහැල්ලට මෙසේ වදළසේක.

"චණ්ඩාලි වන්‍ද පාදනි ගොතමස්ස යසස්සිනො,
තමෙව අනුකම්පාය අට්ඨාසි ඉසිසුත්තමො.
අභිප්පසාදෙහි මනං අරහන්තම්හි තාදිනි.
ඛිප්පං පඤ්ජලිකා වන්‍ද පරිත්තං තව ජීවිතං"

යනුහෙයින්, "එම්බා සැඩොල්, මැහැල්ල, මේ එසේ මෙසේ කෙනෙක් නොවෙයි, ෂට්විධ මුණීන්ට ශ්‍රෙෂ්ඨවූ නොහොත් විපස්සී බුදුන් ආදිකොට සත්වැනිව බුදුව සියල්ල දත් බුදුකෙනෙක, තී කෙරෙහි අනුකම්පාවෙන් නුවරට නොවැඩ මහසඟ පිරිවරා අතරමග වැඩසිටිසේක. සියලු දිව්‍ය මනුෂ්‍යයන් විසින් කරන ලද පූජාවට සුදුසුවූ බුදුන් කෙරෙහි සිත පහදවා ගනුව. තීගේ ජීවතය බොහෝකල් නොපවත්නේය; දැන්ම බිඳී විනාශයට පැමිණෙන ස්වභාව ඇත්තේය. එසේ හෙයින් ගෞතම සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාද වන්‍දයට නමස්කාර කරව. එපමණ කුශල කර්‍මය තිට පිට්වහල් වෙයි" වදළසේක. ඒ බැව් ප්‍රකාශකොට දක්වන්නාවූ සඞ්ගීතිකාරක මහාස්ථවිරයන් විසින්,

"චොදිතා භාවිතත්තෙන සරීරන්තිමධාරිනා.
චණ්ඩාලි වන්‍දි පාදනි ගොතමස්ස යසස්සිනො,
තමෙනමවධී ගාවී චණ්ඩාලිං පඤ්ජලිං ඨිතං,
නමස්සමානං සම්බුද්ධං අන්‍ධකාරෙ පභඞ්කරං.
"ඛීණාසවං විගතරජං අනෙජං,
එකං අරඤ්ඤම්හි රහෝ නිසින්නං,
දෙවිද්ධිපත්තා උපසංකමිත්වා
වන්‍දාමි තං වීර මහානුභාවං"

යනුවෙන් ප්‍රකාශකරණලද්දේය. බුද්ධාදී මහොත්තමයන් විසින් භාවිතවූ ආර්‍යමාර්ගයට පැමිණ එමමාර්ග භාවනාවෙන් කෙලෙසුන් තවා සසරසැරිසරන්නාවූ භවොත්පත්ති නැතිහෙයින් කෙළවර ආත්මය ධරන්නාවූ මුගලන් මහතෙරුන්වහන්සේ විසින් චොදනාකරණ ලද ඒ සැඩොල් මැහැල්ල බුද්ධාලම්බන ප්‍රීති උපදවා ඒපදෙත්තමවූ ගෞතම සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ගේ ශ්‍රී පාදවන්‍දය පසඟ පිහිටුවා වැඳ නැගී සිට දෙහොත් මුදුන් දී බුදුන් වැඳ වඩනා කල්හිද බල බලා බුද්ධාලම්බන ප්‍රීතින් වැඳ සිටියාය. එකල්හි බුදුරජානන්වහන්සේ "මෙපමණෙක්ම මේ මැහැල්ලියට වැඩ පිණිස වන්නේය"යි සිතා වදරා මහසඟ පිරිවරා ඇතුළු නුවරට පිඩුසිගා වැඩිසේක. එල්හි අලුත වැදූ දෙනක් ළමා වස්සෙකු ගෙන කුළුව දිවන්නී බුදුන් බලා වැඳ සිටිචණ්ඩාල මැහැල්ලට අහින් ඇණ ඉරා එතන්හිම ජීවිතක්‍ෂයට පමුණුවාපුව. ශරීරයෙහි තල බිජුවටක් පමණ තැනින් නැගී රශ්මියෙන් අනන්තාපරිමාන සක්වල එකාලොක කරතත් පොහොසත්වූ තවද සත්‍වයන්ගේ නුවණ නැමති ඇස් වසා සිටි මොහාන්‍ධකාර විධ්වංසනයකොට ප්‍රඥ නැමති ආලොකයෙන් නිවන් මග

එලිය කළාවූ සම්‍යක් සම්බුඩ සර්‍වඥරාජොත්ත මයාණන්වහන්සේගේ ශ්‍රී පාද වන්‍දයට නමස්කාර කළාවූ කුශලයෙන් එම චණ්ඩාල මැහැල්ල තවුතිසා දෙව්ලොව මහත්වූ රන්විමනෙක උපන්නීය එකෙණෙහිම දිව්‍යසෘඞ්ප්‍රාප්තවූ ඒ දිව්‍යාඞ්ගනාතොමෝ ඇගේ දිව ඉසුරු බලා, " කවර කුශලකර්‍මයක් හෙතුකොටගෙන මෙබඳුසම්පත්ති ප්‍රතිලාභයෙක් මට විදැ"යි යටගිය දවස කළාවූ සුචරිතකර්‍මය නුවණැසින් බලන්නී, මුගලන් මහතෙරුන්වහන්සේගේ නියෝගයෙන් බුදුන්ගේ ශ්‍රීපාදවන්‍දය නමස්කාර කළාවූ කුශලකර්‍මයෙන් ලද්දවූ ඉෂ්ටවිපාකයයි දැක මහත්වූ සන්තොෂයට පැමිණ බුදුගුණ හා මහතෙරුන්වහන්සේගේ ගුණ සිහිකොට එදවස්, "මහතෙරුන්වහන්සේ දක්නට යෙමි" යි සිතා විමානය හා සමග මිනිස්ලොවට අවුත් එක්තරා වනාන්තරයෙක ඡායාසම්පන්න රුකක් මුල එකලාව කායවිවෙකයට පැමිණ දිවාවිහරණයෙන් වැඩහුන්නාවූ මුගලන් මහතෙරුන්වහන්සේ කරා එළැඹ විමානය ආකාශයෙහි රඳවා විමානයෙන් බැස, "මහානුභාවසම්පන්න මහාවිරයාණන්වහන්ස නුඹවහන්සේට නමස්කාර කෙරෙමි" කියා නමස්කාර කළාය. එසේ සහපිරිවරින් අවුත් නමස්කාර කොට ශරීරප්‍රභාවෙන් සියලු වනලැහැබ එකාලොක කෙරෙමින් දිළිහි දිළිහි සිටි දිව්‍යාඞ්ගනාව දැක මුගලන් මහතෙරුන්වහන්සේ මෙසේ විචාළසේක.

"සුවණ්ණ වණ්ණා ජලිතා මහායසා
විමානමොරුය්හ අනෙක චිත්තා,
පරිවාරිතා අච්ඡරානං ගණෙන
කා ත්වං සුභෙ දෙවතෙ, වන්‍දසෙ මමං"

යනුහෙයින් "අනෙකප්‍රකාරවූ විචිත්‍ර චිත්‍ර කර්‍මාන්තයෙන් හෙබියාවූ දිව්‍ය විමානාරූඪව ලක්ෂයක් දෙවඟනන් පිරිවරාකනක රූපයක් මෙන් දිළිහි දිළිහී මා කරා එළඹැ නමස්කාරකොට එකත්පස්ව සිටියාවූ තෙපි කවරහුදැ?"යි විචාරා වදළසේක. මෙසේ මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද ඒ දිව්‍යාඞ්ගනාතොමෝ මහත්වූ ආදර බහුමාන ඇතිව මහතෙරුන්වහන්සේ ගේ වචනය මුදුණෙන් පිළිගෙන ගියදවස කළාවූ සුචරිත කර්‍මය හා ඒ සියලුම ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට දන්වන්නී මෙසේ කිව,

"අහං භන්තෙ, චණ්ඩාලි තයා වීරෙන පෙසිතා.
වන්දිං අරහතො පාදෙ ගොතමස්ස යසස්සිනො.
සාහං වන්දිත්ව පාදනි චුතා චණ්ඩාලයොනියා,
විමානං සබ්බතො භද්දං උපපන්නම්හි නන්‍දනෙ.

අච්ඡාරනං සතසහස්සං පුරක්ඛත්වාන තිට්ඨති,
තාසාහං පවරා සෙට්ඨා වණ්ණෙන යසසායුනා.
පහුතකත කල්‍යාණා සම්පජානා පතිස්සතා
මුනිං කරුණිකං ලොකෙ තං භන්තෙ වන්දිතුමාගතා"

යනුහෙයින්, වීර්‍ය්‍යසම්පන්නවූ ඍද්ධිමතුන් කෙරෙහි අගතැන්පත් ස්වාමීන්වහන්ස, නුඹවහන්සේ විසින් බුදුගුණ කියා, චණ්ඩාල මැහැල්ල, බුදුන්ගේ ශ්‍රී පාදවන්දය වඳුවයි නියෝග කරණලදුව ගෞතම බුදුන්ගේ ශ්‍රීපාද යුගලයට නමස්කාරකළාවූ චණ්ඩාල මැහැල්ල නම් මමය. එදවස් අලුත වැදූ දෙන ළමා වස්සකු ගෙන කුළුව දිවන්නී බුදුන් බල බලා වැඳ සිටී මා එතනම ඇණ මැරුවාය ඒ නමස්කාරමය කුශලය ස්වල්පවී නුමුදු පින් කෙත සාරවත් හෙයින් ඒ චණ්ඩාලාත්මභාවයෙන් චුතව තවුතිසා දිව්‍යලොකයෙහි රන්රිදී ආදිවූ නොයෙක් රත්නයෙන් නිමිහෙයින් සර්වප්‍රකාරයෙන් යහපත්වූ දුටුවන් සිත් සතුටු කරවන්නාවූ දිව්‍යවිමානයෙක උපන්මි. ලක්‍ෂයක් පමණවූ මේ දිව්‍යාඞ්ගනාවන්ට වඩා ශරීරවර්ණ යසශ්‍රී ආදියෙන් උතුම් විමි. එසේ නමස්කාර වශයෙන් කරණලද කල්‍යාණ කර්මය හෙතුකොටගෙන උපන්නාවූ ඉෂ්ටවිපාකය සිහිකරන්නාවූ මම තුනුරුවන් කෙරෙහි විශේෂයෙන් සතුටුව සත්වලොකයා කෙරෙහි පතළ මහා කරුණා ඇති බුදුන්ගේ ගුණයද එසේම නුඹවහන්සේගේ ගුණයද සිහිකොට නුඹවහන්සේ වඳනා පිණිස ආයෙමි"යි කීවාය. ඒ බව ප්‍රකාශකොට දක්වන්නාවූ සඞ්ගීතිකාරක මහාස්ථවිරයන් විසින්

"ඉදං වත්වාන චණ්ඩාලි කතඤ්ඤු කතවෙදිනී,
වන්දිත්වා අරහතො පාදෙ තත්ථෙවන්තරධායථා"ති.

යනුහෙයින්, "නියතව සිටි අපාය මාර්ගය වළකා ස්වර්ගලොක සම්පත්තියට කාරණවූ වන්දනාමය සුචරිතකර්මය කියා කෙරෙව් උපකාර සැලකීමෙන් කෙළෙහිගුණ දක්නාවූ එ චණ්ඩාල දිව්‍යාඞ්ගනාතොමෝ මේ සියලූ ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට කියා ඉක්බිති මහතෙරුන් වහන්සේගේ ශ්‍රී පාදවන්දය නමස්කාර කොට එතන්හිදිම අතුරුදන්ව දෙව්ලොවට ම ගියාය"යි ප්‍රකාශ කරණ ලද්දේය. ඉක්බිති ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේට එපවත් දැන්වූසේක. බුදුරජාණන්වහන්සේ එම අත්ථොත්පත්තිකොට ගෙන එතැන්හි රැස්වූ පිරිසට ධර්මදේශනාකොට වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජනවත් විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි
**චණ්ඩාලි විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී

## 22. භද්‍රා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි පස්වැනිවූ **භද්‍රා විමාන වස්තුව** නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

සකල ජන හෘදයානන්දකරවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක සැවැත්නුවර ගොදුරු ගම්කොට දෙව්රම් වෙහෙර වැඩවසනසේක. එසමයෙහි කිම්බිල නම් නුවර තුනුරුවන් කෙරෙහි ප්‍රසන්න සිත්ඇති ශ්‍රද්ධාසම්පන්න ශීලාචාර ගුණඇති රෝහක නම් වූ එක් සිටුපුත්‍රයෙක් ඇත්තේය. එසේම එම නුවර උපභොග සම්පත් ඇති සමාන කුලයෙක යහපත් රූපශ්‍රීන් යුක්තවූ භද්‍රා නම් එක්තරා උපාසිකා කුමාරිකාවක් ඇත්තීය ඕතොමෝ ශ්‍රද්ධාසම්පනන වූව, ශීලසම්පන්න වූව, යහපත් ආචාර සමාචාර ඇති බැවින් ප්‍රකෘති නාමයෙන් ම භද්‍රා නම් වූවාය එසමයෙහි රෝහක කුමාරයාගේ මවුපිය දෙදෙන භද්‍රාවගේ මවුපියන් හා කථාකොට ආවාහ විවාහයට සුදුසු අවස්ථාවෙහි ශුභවූ නක්‍ෂත්‍ර දිනයෙක භද්‍රාව රෝහකයන්ට සරණ පාවාදුන්හ. එතැන් පටන් ඔහු දෙදෙන සමගි සතුටුව ප්‍රිය සංවාසයෙන් වසන්නාහු ඒ කුමාරිකාතොමෝ ස්වාමිපුත්‍රයාටද මවුපිය නැදි මයිල් වැඩි මහල්ලන්ටද ආචාර සමාචාර ඇති බැවින් භද්‍රාව යයිකියා සියලූ නුවර මුලුල්ලෙහි ප්‍රසිද්ධවූවාය.

එසමයෙහි අග්‍රශ්‍රාවක වූ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ පන්සියයක් භික්‍ෂු සංඝයා පිරිවරා දනව් සැරිසරන්නාහු අනුක්‍රමයෙන් කිම්බිල නුවරට පැමිණියාහුය. එකල්හි රෝහක නම් සිටුපුත්‍රයා සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ඒ නුවරට වැඩී බව අසා දැන මහත්වූ සන්තොෂ ඇතිව මහතෙරුන් කරා ගොස් නමස්කාරකොට "ස්වාමිනී සෙට දවස මා කෙරෙහි අනුකම්පාවෙන් මාගේ දනය ඉවසා වදළ මැනව"යි කියා සැමදෙනාවහන්සේටම දන් පවරා දෙවන දවස් අහර පිළියෙලකොට ප්‍රණීත වූ ඛාද්‍යභොද්‍යාදියෙන් සැමදෙනාවහන්සේම වළඳවා ඉක්බිති පුත්‍ර දරාවන් හා සමග මහතෙරුන්වැඳ එකත්පස්ව හිඳ කාලානුරූප වශයෙන් වදරණලද ධර්මදෙශනාව අසා අවවාදයෙහි පිහිටමින් සරණයෙහි පිහිටා පන්සිල් සමාදන්විය. ඔහුගේ භද්‍රා නම්වූ

භාර්‍යාව වනාහි නිරන්තරයෙන් පඤ්චශීලය රක්‍ෂා කෙරෙමින් අටවක් දිනය, තුදුස්වක් දිනය පසළොස්වක් දිනය පාටිපදිකය යන මේ පොහෝදවස්හි පෙහෙවස් වෙසෙමින් අතිශයින්ම ශීලාචාර ගුණයෙන් යුක්තවූවාය. එසේ හෙයින් දෙවතාවන් විසින්ද කරණලද අනුකම්පා ඇතිහෙයින් ඒ භද්‍රාවගේ හිසමත්තෙහි මිථ්‍යාවාද වශයෙන් වැටුනාවූ ලොකාපවාද සන්හිඳුවා ශීලාදි ගුණය ලොවට ප්‍රකාශකරණ ලදුව අතිශයින්ම ගුණකීර්තියද දශදිග පැතිර ගියේය. ඒකෙසේ වූ මිථ්‍යාවාදයෙක්ද යත්:- එසමයෙහි එක් දවසක් ඒ භද්‍රාවගේ ස්වාමීවූ රොහකයෝ වෙළඳම් පිණිස කිම්බිල නුවරින් නික්ම තක්සලා නුවරට ගියෝය. එකල තක්සලා නුවරවාසීන්ගේ නැකැත්කෙළි නම්වූ උත්සව දිනය සම්ප්‍රාප්ත විය. එදවස් රොහකයන්ගේ යහළුවෝ රොහකයන් කරා ගොස් "යහළු රොහකයෙනි නැකැත් කෙළියට යම්හ"යි කියා කැඳවූහ.

එබැවින් රොහකයන්ටද නැකැත් කෙළියට යන අභිප්‍රා ඇතිවිය. එකල්හි යටකියනලද ඔහුගේ භාර්‍යාවවූ භද්‍රා නම් කුමාරිකාව කිම්බිල නුවර වෙසෙයි. ඒ උත්සව දිනයෙහි නැකැත් කෙළියට යන අභිප්‍රාය රොහකයන් සිත හටගත් කෙණෙහිම ඒ භද්‍රාවගේ ශීලානුභාවයෙන් ඒ ගෙයි අධිගෘහිත දෙවතාවා විසින් ඔහුගේ දිව්‍යානුභාවයෙන් ඇගේ ස්වාමීවූ රොහකයෝ යම් තැනක වෙසෙද්ද ඒ සමාගමයට පමුණුවා රොහකයන් හා නැකැත් කෙළියට යොදවනලදුව එදවස් ස්වාමිපුත්‍රයන් හා ප්‍රිය සංවාසයෙන් භද්‍රාව කුස දරු බිජුවටක් ඇතිවිය. නැවත ඒ දෙවතාවා විසින් ඒ කුමාරිකාව කිම්බිල නුවරට පමුණුවනලදුව අනුක්‍රමයෙන් දරුගැබ මහත්ව ගර්භනිභාවය ප්‍රකටවූ කල්හි "අනාචාරයේ හැසිර සොර සැමියන් හා වැස දරු ලද්දිය"යි කියා නැදිමයිල් ආදිහු සැක ඉපදවූහ. එකල්හි එම දෙවතාවා විසින් ඔහුගේ දිව්‍යානුභාවයෙන් ඒ සඬකාව නැතිකරවනු පිණිස මහත්වූ ගංගා ජලප්‍රවාහය සියලු කිම්බිල නුවර වසා රළ නැගි පැතිර එන්නාසේ වායු වේගයෙන් ඉතිරනංගවනලද්දේය. එකල්හි ඒභද්‍රාවගේ පතිව්‍රතාධර්ම සඬඛ්‍යාත සත්‍ය ක්‍රියා බලයෙන් ඒ ජලප්‍රවාහය නැවත වාතවෙගයෙන් පෙරසේම ගඟටම බැස ගියේය, එකල්හි නැදිමයිල් ආදීන්ගේ ශඬකාව සුලන් දුටු පරඬලා පතක්සේ දුරු විය. ඉක්බිති ඇගේ ස්වාමිපුත්‍රයා විසිනුදු පෙර නැදිමයිලන් ආදීවූ සැක කළාසේම, "අනාචාරයේ දරු ලද්දීය"යි කියා සැක කරණ ලද්දීය. එකල්හි තක්සළා නුවරදී ඔහු විසින් දෙනලද පේරුස් මුද්ද දක්වා ඔහුගේ සැක දුරුකොට මෙසේ යහපත් ශීලාචාර ගුණ සම්පත් ඇති බැවින් ස්වාමීපුත්‍රයා හා මවුපිය නැදිමයිල් ආදී සියලු නෑයන් ගේ ද නුවර

වැසියන්ගේද සැක දුරුකොට දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ සියල්ලවුන්ගෙන් කීර්ති ප්‍රශංසා ලැබ අතිශයින්ම ලොකයෙහි ප්‍රසිඬවූවාය.

ඉක්බිති ඒ භද්‍රා නම් උපාසිකා තොමෝ එයින් පසු නොබෝ දවසකින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලෝකයෙහි උපන්නීය. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ගණ්ඩම්බ වෘක්ෂ මූලයෙහිදී යමකප්‍රාතිහාර්‍ය්‍ය කෙරෙමින් තීර්ථක මර්ථනයකොට තුන්පියවරකින් තවුතිසා භවනයට වැඩිකල්හි සක්දෙව් මහරජාණෝ දෙව්පිරිස් පිරිවරා බුදුන් කරා එළඹැ නමස්කාරකොට ඉක්බිති බුදුන්ට වැඩහිඳීමට නිසි අස්නක් පරීක්ෂාකරන්නාහු, "පාණ්ඩුකම්බල ශෛලාසනයට වඩා උතුම් ආසනයක් මේ දිව්‍යලොකයෙහි නැත්තේය. මේ ශෛලාසනය දිග සැට යොදුන, පුළුල පනස් යොදුන, බුදුරජානෝ දෙළොස්රියනක් උස් ඇතිසේක. මේ අස්නෙහි වැඩ උන්කල මහත් පර්වතයක් මත්තෙහි සිටි වටුකුරුල්ලකුසේ ප්‍රකාශව නොපෙනෙනසේක්දේ හෝ"යි සැක සිත සිතා බුදුන් වඩාගෙන ගොස් පාණ්ඩුකම්බල ශෛලාසනය බුදුනට පිළිගැන්වූහ. එකල්හි සර්වඥයන්වහන්සේ ඔවුන්ගේ අදහස් දැන, "දෙවතාවෝ බුදුබල නොදන්නාහුය"යි සිතා වදරා දිග නව වියත් පුළුල සවියත් සුගත් සිවුර සතර පටක් කොට මහත් රන්පලසකින් කුඩා පුටුවක් වසන්නාසේ බැලූ බැලූ දිග සිවුරම විනා පඩුපුල් අස්න නොපෙනෙනසේ වසා අතුට ආසනය පුරා වැඩහුන්සේක. එකල්හි දෙවතාවෝ, අහෝ ආශ්චර්‍ය්‍යමත් බුදු බලයක් බලව"යි කියා සාධුකාරයක් පැවැත්වූහ. මෙසේ ඒ බුදුරජාණන්වහන්සේ තවුතිසා භවනයට වැඩ පරසතු ගසමුල පුඩුපුල් අස්නෙහි වැඩහුන්කල්හි දසදහසක් සක්වළ දෙවතාවෝ බුදුන් කරා එළැඹ නමස්කාරකොට එකත්පස්ව උන්නාහු ඒ දෙවතාවන් අතුරෙන් ඒ භද්‍රා නම් දිව්‍යඞගනාවද බුදුන් කරා එළැඹ නමස්කාර කොට එකත්පස්ව සිටියාය. එදවස් දශදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයන් මධ්‍යයෙහි ඒ භද්‍රා නම් දිව්‍යාඞගනාවගේ ඓශ්චර්‍ය්‍ය සම්පත්තියත් ගියදවස කළාවූ කුශලකර්මයත් ප්‍රකාශකරවනු පිණිස බුදුරජාණන්වහන්සේ මෙසේ විචාරා වදළසේක.

"නීලා පීතා ච කාළා ච මඤ්ජෙට්ඨා අථ ලොහිතා,  
උච්චාවචානං වණ්ණානං කිඤ්ජක්ඛපරිවාරිතා.  
මන්දාරවානං පුප්ඵානං මාලං ධාරෙසි මුද්ධනි,  
නයිමෙ අඤ්ඤෙසු කායෙසු රුක්ඛාසන්ති සුමෙධසෙ.  
කෙන කායං උප පන්නා තාවතිංසං යසස්සිනී,  
දෙවතෙ, පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං" ති

යනුහෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, තී වනාහි නීල පීත ලොහිතාවදාත මඤ්ජෙට්ඨපභස්සරයයි කියනලද අනෙක ප්‍රකාර වර්ණසම්පන්න පත්‍රකිඤ්ජල්ක කෙශරපඞ්ක්තියෙන් හෙබියාවූ මදරා මලින් ගොතා කරණලද මුදුන්මල්කඩින් හා අනෙකප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් හෙබියාවූ මල්වඩම්වලින් සැරහීසෙසූ දෙවතා වන් මධ්‍යයෙහි දීප්තිමත්ව බබලන්නෙහිය. මේ දෙව්ලොව සෙසු දෙවතාවන් අතුරෙහි මෙබඳු මල් ගස් නැත්තේය. අනෙක් දෙවතාවන් අතුරෙහි මෙබඳු සැරසීමක් නැත්තේය. මහත්වූ යශ ශ්‍රී ඇති එම්බා දෙවතා දුව, ගිය දවස තී විසින් කරණලද කවර කුශලකර්මයක් හෙතුකොටගෙන මේ තව්තිසා භවනයෙහි උපන්නීද? මා විසින් විචාරණලද මේ පැණය මේ දෙව් බඹ පිරිස් මැද ප්‍රකාශකරව. යම් කුශල කර්මයකින් මෙබඳු දිව්‍යශ්‍රීසම්පත්තියක් ලබනලද්දේ වීනම්, ඒ කුශල කර්මයාගේ මේ ඵලයයි කියා ප්‍රකාශකරව"යි වදළසේක. එකල්හි ඒ දිව්‍යාඞ්ගනාතොමෝ, එසේය ස්වාමීන්වහන්සැ"යි බුදුන් වදළ වචනය මුදුණෙන් පිළිගෙන දෙහොත් මුදුන් දී සිට මෙසේ ප්‍රකාශකළාය.

"හද්දිත්ථීති මං අඤ්ඤිංසු කිම්බිලායං උපාසිකා,
සද්ධා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.
අච්ඡාදනඤ්ච හත්තඤ්ච සෙනාසන පදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.
චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ග සුසමාගතං,
උපොසථං උපවසිස්සං සදා සීලෙසු සංවුතා.
පාණාතිපාතා විරතා මුසාවාද ච සඤ්ඤතා,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරකා.
පඤ්චසික්ඛාපදෙ රතා අරියසච්චාන කොවිදා,
උපාසිකා චක්ඛුමතො අප්පමාදාවිහාරිණී.
කතාවාසා කතකුසලා තතො චුතා,
සයං පභා අනුවිචරාමි නන්දනං
හික්ඛූ චහං පරමහිතානුකම්පකෙ,
අභොජයිං තපස්සියුගං මහාමුනිං.
කතාවාසා කතකුශලා තතො චුතා,
සයං පභා අනුවිචරාමි නන්දනං.
අට්ඨඞ්ගිකං අපරිමිතං සුඛාවහං,
උපොසථං සතතමුපාවසිං අහං
කතාවාසා කතකුසලා තතො චුතා,
සයං පභා අනුවිචරාමි නන්දනං" ති.

යනාදීන් දක්වනලද හෙයින් ශ්‍රද්ධාසම්පන්නව යහපත් ආචාර සමාචාර ඇති හෙයින්ද නුවර වසා ගලා එන්නාසේ ඉතිර නැංගාවූ ගංගා ජලප්‍රවාහය පතිව්‍රතා ධර්ම සඞ්ඛ්‍යාත සත්‍ය ක්‍රියා බලයෙන් සන්සිඳුවා නුවර වාසීන් විස්මය පත් කරවූ අඛණ්ඩාජීදුවූ සිල් ඇති බැවින් ද යහපත් උත්තම ස්ත්‍රියයි යන අර්ථයෙන් කිම්බිල නුවර වාසීහු මට භද්‍රා නම් උපාසිකා යයි කියා දනිත්මය, ආමන්ත්‍රණය කෙරෙත්මය. එබැවින් ස්වාමීනි, ශ්‍රද්ධාශීලාදී ගුණ සම්පන්නව තුනුරුවන් කෙරෙහි පැහැද දන සංවිභාගයෙහි ඇලුම් ඇතිව ඉහලොක පරලොකාර්ථ දැන වසන්නෙමි, චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලාන ප්‍රත්‍යය යන සිවුපස දනයෙන් අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝයාට උපස්ථාන කෙළෙමි. අන්නපාන වස්ත්‍රාභරණ මාලා ගන්ධ විලෙපන සෙය්‍ය ආවාස ප්‍රදීප යන දශවිධ දන වස්තුවෙන්ද පූජා සත්කාර කෙළෙමි. තුදුස්වක්, පසළොස්වක්, අටවක් පාටිහාරිය පක්ෂය යන පොහෝ දවස් අෂ්ටාඞ්ග සමන්විතව බුදුසවුවන්ගේ ගුණයට අනුකූලව පෙහෙවස් විසීමි. නිරන්තරයෙන් පංච ශීලය රක්ෂා කෙළෙමි. එබැවින් විශේෂයෙන් ප්‍රාණඝාතයෙන් දුරුවීමි. ලේඩිත්තකුත් නොනැසීමි. විශේෂයෙන්ම අදත්තාදනයෙන් දුරුවීමි. පර සන්තක බව දැන නුල් රැළක් පමණවත් සොර සිතින් වේවයි, බලාත්කාරයෙන් වේවයි, අනුන් අයිති බඩුවක් නොගතිමි විශේෂයෙන්ම කාමමිථ්‍යාචාරයෙන් දුරුවීමි. කිසි කලෙකත් මා සමනාණන් හැර රාගයෙන් පෙරළුනාවූ සිත් ඇතිව පර පුරුෂයන් මුහුණ නොබැලීමි. විශේෂයෙන්ම මුසාවාදයෙන් දුරුවීමි. කෙළි පිණිසවත් බොරු බසක් නොකීමි. විශේෂයෙන් සුරා පානයෙන් දුරුවීමි. පිනි බිඳක් පමණවත් රා ටිකක් නොබීවෙමි. තවද ශ්‍රද්ධා නැමති ධනය, ශිලය නැමති ධනය, පාපයෙහි ලජ්ජා වශයෙන් පවත්නා හිරි නැමති ධනය, සසර භය වශයෙන් පවත්නා ඔත්තප්ප නැමති ධනය මහණ බමුණන් කරා එළඹැ ඇසූ පිරූ තැන් ඇති බැවින් ශ්‍රැත නැමති ධනය. දන්දීම් වශයෙන් පවත්නා ත්‍යාග නැමති ධනය, ප්‍රඥ නැමති ධනය යන මේ සත්වදෑරුම් වූ ආර්‍ය්‍ය ධනය පෙර කළ පිණින් ලත් බැවින් බුදුරජාණන්වහන්සේගේ ශාසනයෙහි අප්‍රමාදවිහාරීවූ උපාසිකාවක් වීමි. එසමයෙහි අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේ ලැබ ප්‍රණීතවූ භොජනයෙන් සන්තර්පණය කෙළෙමි. මෙසේ කරනලද කුශල් හෙතුකොටගෙන මේ දිව්‍යසම්පත් අනුභව කෙරෙමි'යි කීව. ඉක්බිති බුදුරජාණන්වහන්සේ මාතෘ දිව්‍ය පුත්‍රයා ප්‍රධානකොට ඇති දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන්ට තුන් මාසයක් මුලුල්ලෙහි ජල පොළවසේ අති

ගම්භිර වූ අභිධර්ම පිටකය දේශනාකොට වදරා ඉක්බිති මිනිස් ලොවට වැඩ භික්ෂු සඞ්ඝයාට ආමන්ත්‍රණය කොට භද්‍රා නම් දිව්‍යාඞ්ගනාවගේ විමානය ප්‍රකාශකොට බණ වදාළසේක. ඒ ධර්ම දේශනාව එතන්හි සම්ප්‍රාප්ත පිරිසට ප්‍රයෝජන විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි
**භද්‍රා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදී.

## 23. සොණදින්නා විමාන වස්තුව.+

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි සවන සොණදින්නා විමාන වස්තුව නම් කරවයත්:

මෛත්‍රී නිවාස වූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කර වදාරන සේක. එසමයෙහි වනාහි නාලන්‍දනුවර ප්‍රසන්න වූ ශ්‍රද්ධාවෙන් යුක්ත වූ සොණදින්නා නම් වූ එක්තරා උපසිකාවක් වූවාය. ඕතොමෝ භික්ෂූන්ට සිවුපසයෙන් උපාස්ථාන කරන්නී එසෙම නිරන්තරයෙන් පිරිසුදු වූ අඞ්ග අටකින් යුක්ත වූ පෞෂධශීලය රක්ෂා කරන්නීය. ඕතොමෝ ධර්මශ්‍රවණය යහපත් සේ ලැබ හේතුසම්පත් ඇති බැවින් චතුස්සත්‍ය කර්මස්ථානයන් ගත්තී සෝවාන් වූවාය. ඉක්බිත්තෙන් ඕතොමෝ එක්තරා රෝගයකින් පෙළුණී කාලක්‍රියා කොට තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. ඒ දිව්‍යකුමාරිකාතොමෝ පිරිවර සහිත ව උයන්කෙළි පිණිස යන්නී මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා දැක බලවත් ව හටගත්තාවූ ප්‍රීති ප්‍රමොද්‍යයෙන් යුක්ත ව තෙරුන්වහන්සේ කරා පැමිණ දොහොත් මුදුනෙහි තබා වැඳගෙන එකත්පසෙක සිටියාය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි සවන
**සොණදින්නා විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදි.

## 24. උපෝසථා විමාන වස්තුව+.

තව ද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි සත්වන උපොසථා විමාන වස්තුව නම් කවරයත්:

+ පසුව කල පරිවර්තනය

ත්‍රෛලෝක්‍ය තිලක වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන මහාවිහාරයෙහි වැඩවාසය කර වදරනසේක. එසමයෙහි සාකේත නුවර ශ්‍රද්ධාශීලාදී උතුම් ගුණයෙන් යුක්ත වූ දනාදී පුණ්‍යකර්මයන්හි නිරන්තරයෙන් ඇලුණා වූ උපෝසථා නම් වූ එක්තරා උපාසිකාවක් වූවාය. ඕතොමෝ මැතකලක්හි කාල ක්‍රියා කරන්නී තමා විසින් කරනලද සුචරිතකර්ම බලයෙන් නිදා පිබිදියාක් මෙන් තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. අනෙකුදු සියලු විස්තර පෙර කියනලද විමාන වස්තූන් පරිද්දෙන් දැනගත යුතුයි.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි **සත්වන උපෝසථා විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදි.

## 25. සද්ධා විමාන වස්තුව හා 26. සුනන්ද විමාන වස්තුව.+

තව ද මේ විමානවස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි **අටවන සද්ධා විමාන වස්තුව හා නවවන සුනන්ද විමාන වස්තුව** නම් කවරයත්:-

සකලජන සමූහයා නිර්වාණදායක සම්මාසම්බුදු රජාණන්වහන්සේ රජගහනුවර ලෙහෙනුන්ට බත් වැටුප් දෙන හෙයින් කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වාසය කර වදාරනසේක. එසමයෙහි වනාහි රජගහ නුවර ශ්‍රද්ධාසම්පන්න වූ ශීලාදිගුණයෙන් යුක්ත වූ නිරන්තරයෙන් දනාදී පුණ්‍යකර්මයෙහි යෙදුණා වූ රත්නත්‍රය ශරණ පරායණ වූ ශ්‍රද්ධාය, සුනන්දය යි උපාසිකාවෝ දෙදෙනෙක් වාසය කළෝය. මැත කලෙක්හි ඔවුන් දෙදෙනා කාලක්‍රියා කරන කල්හි තමතමන් විසින් කරන ලද කුශලකර්ම නමැති චිත්‍රකාරයන් විසින් නිර්මිත කරනලද තව්තිසා දිව්‍යලොකයෙහි ස්වර්ණමය වූ දිව්‍ය ප්‍රාසාදයන්හි උපන්නෝය. ඒ දෙදෙනා දහස් සංඛ්‍යාත වූ නළුනාටකාදී දෙව් පිරිස් පිරිවරා දිවසිරි විඳින සමයෙහි මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ විමානයන් දැක එළඹ අනෙක් දෙව් විමන් වල වසන දෙවියන් සමග කළා වූ ප්‍රශ්න විසර්ජනාදිය මෙන් කොට මිනිස් ලොවට පැමිණ බුදුරජාණන් වහන්සේට එපවත් දැන්වූසේක. බුදුරජාණෝ ද එම අර්ථෝත්පත්ති කොටගෙන පැමිණි පිරිසට ධර්මදේශනා කළ සේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

+ පසුව කල පරිවර්තනය

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි **අටවන ශ්‍රද්ධා විමාන වස්තු වර්ණනාව හා නවවන සුභද්‍ර විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදී.

## 27. භික්ෂාදායිකා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි දස වැනිවූ **භික්ෂාදායිකා විමාන වස්තුව** නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

අසරණ සරණවූ කරුණා නිධානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක. එසමයෙහි උත්තර මධුරා නම් නුවර සමීපයෙහි නුවරින් පිටත් වසන්නාවූ ගෙවුනාවූ ආයු ඇතිව අපායෙහි උපදනා අකුසල් ඇත්තාවූ එක්තරා ස්ත්‍රියක් ඇත්තීය. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් දවසක් අලුයම් වේලෙහි මහා කරුණා සමාපත්තීන් නැගී මුලු ලෝ බාල වදරන සේක, ගෙවුනාවූ ආයු ඇතිව අපායෙහි උපදින්ට සුදුසුවූ අකුශල් ඇති ඒ ස්ත්‍රිය දැක වදරා අපායට යන ගමන් වළකා සුගතියෙහි උපදවන කැමතිව කරුණාව විසින් චොදනා කරනලදින් හුදකලාව උත්තර මධුරාවට වැඩ පෙරවරු භාගයෙහි හැඳ පෙරව පා සිවුරු ගෙනපිටි නුවරට පිඩු සිගා වැඩිසේක. එසමයෙහි ඒ ස්ත්‍රීතොමෝ අහර පිස එකත් පසෙක තබා පැන් තොටට ගොස් දිය නහා ඉක්බිති පැන් කළයක් ගෙන ගෙට යන තැනැත්තී අතර මගදී බුදුන් දැක, "කිමෙක්ද, ස්වාමීනි, නුඹවහන්සේ විසින් යම්කිසි භොජනයක් ලබන ලදදැ?යි විචාරා, "මතු ලබම්හ"යි බුදුන් විසින් වදළකල්හි අහර නොලත් බව දැන පැන් කළය බිම තබා බුදුන් කරා එළඹැ නමස්කාර කොට "ස්වාමීනි. නුඹවහන්සේට පිණ්ඩපාතය දෙමි, මාගේ දනය ඉවසා වදළ මැනව"යි ආරාධනා කළාය. එකල්හි බුදුරජාණන්වහන්සේ මුවෙන් නොබැණ ඉවසා වදළසේක. ඒ ස්ත්‍රී බුදුන් මුවෙන් නොබැණ දනය ඉවසූ බව දැන පළමුවෙන්ම ගෙට ගොස් දිය හිස යහපත්කොට හමදනා ලද භූමි ප්‍රදේශයෙක්හි ආසනයක් පණවා බුදුන් වඩිනා පෙරමග බල බලා සිටියාය. බුදුරජාණෝ ගෙට වැඩ පණවනලද ආසනයෙහි වැඩහුන් සේක. ඉක්බිති ඒ උපාසිකාව පිළියෙලකරණලද භොජනයෙන් වැළඳවූවාය. කරණලද අහරකිස ඇති බුදුරජාණෝ අතින් පහකරණලද පාත්‍රය ඇතිසේක් දනානුමෝදනාවෙන් බණ වදරා වැඩිසේක. ඒ ස්ත්‍රී අප්‍රමාණ වූ ප්‍රීතියෙන් පිරුණාවූ සිත් ඇතිව එසේ උපන් ප්‍රීතිය නොහැර වඩිනා

බුදුන් යම්තාක් ඇසට විෂයව පෙනේද ඒ තාක්කල් බුඩාලම්බන ප්‍රීතියෙන් බල බලා වැඳ සිටියාය. ඊට අනතුරුව ඒ උපාසිකාව කීප දවසක් ගියකල කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උතුම්වූ රන්විමනෙක උපන්නීය. පරිවාර ස්ත්‍රීහුද දහසක් පමණ වූහ. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙව චාරිකාවෙන් වඩනාසේක් බුදු මුඛයෙකිනුත් කියා නිමවාලිය නොහැක්කාවූ ශ්‍රී සම්පත් අනුභවකරන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාව දැක මෙසේ විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා"

යනුහෙයින්, "එම්බා දෙවතාදූ, තී ඔසධී තාරකාවක් සේ දස දිග් එකාලොක කෙරෙමින් බබලන්නීය. මේ දිව්‍ය සම්පත් ලැබීමට කළාවූ කුශල කර්මය කවරේද?"යි විචාරා වදාළසේක. එකල ඒ කුශල කර්මය ප්‍රකාශ කරන්නවූ දිව්‍යාඞ්ගනා තොමෝ මෙසේ ප්‍රකාශ කළාය.

"අහං මනුසෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
අද්දසං විරජං බුඞං විප්පසන්නමනාවිලං
තස්ස ආදහං භික්ඛං පසන්නා සෙහි පාණිහි
තෙන මෙ තාදිසො වණ්ණො-පෙ-පභාසති"

යනුහෙයින්, "ස්වාමීනි, මම මිනිස්ලොව උපන් සමයෙහි බුදුන් දැක සතුටුව ආහාර දනයක් දිනිමි. එපමණ කුශලය හෙතුකොට ගෙන මෙබඳු දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදිමි" යි කීව. ඉක්බිති මුගලන් මහ තෙරුන්වහන්සේ මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ එම අත්‍යෝත්පත්ති කොට ගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට ධර්ම දෙශනාකොට වදාළ සේක. ඒ ධර්ම දෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තුප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි
**භික්ෂාදායිකා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 28. දුතිය භික්‍ෂාදයිකා විමාන වස්තුව

තව ද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි **එකොළොස්වන දුතිය භික්‍ෂාදායිකා විමාන වස්තුව** නම් කවර යත්:

සකල සත්වයා කෙරෙහි නිසලව පවත්නා කරුණා ගුණයෙන් යුක්ත වූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කර වදරන සේක. එසමයෙහි වනාහි රජගහනුවර ශ්‍රද්ධාසම්පන්න වූ එක්තරා ස්ත්‍රියක් තෙමෝ පිඬු පිණිස හැසිරෙන්නාවූ එක් රහත් තෙරකෙනකුන් දැක තමාගේ ගෙදරට වැඩමවාගෙනවුත් අහර පිළිගැන්වූවාය. ඕ තොමෝ එපමණවූ කුශල කර්මයක් පමණක් කොට ඉන් මෑත කලෙක්හි කාලක්‍රියා කොට **තව්තිසා** දිව්‍යලොකයෙහි නොයෙක් දිව්‍යඓශ්වර්‍ය්‍යයෙන් සමන්විත වූ රන් විමනෙක උපන්නීය. අනෙකුදු විස්තර කථාව පෙර කියනලද විමාන වස්තුන් මෙනැයි දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතා වර්ගයෙහි
**එකොළොස් වන දුතිය භික්‍ෂාදායිකා විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

# පාරිච්ඡත්තක වර්ගය

## 29. උළාර විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පරසතු වර්ගයෙහි පළමුවැනිවූ උළාර විමාන වස්තුව නම් කවරයත්:- එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

සාධු ජන නමැති කෞමුද වන ප්‍රබොධයට සරා සඳ මඬලක් වැනිවූ බුදුරජාණෝ එක් සමයෙක රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේට උපස්ථාන කරන්නාවූ රජගහ නුවර එක්තරා ශ්‍රද්ධාවන්ත කුලයක නිරන්තරයෙන් දන් දීමෙහි ඇලුම් ඇත්තාවූ දන් දීමෙහි තුටු පහටු සිත් ඇත්තාවූ ශ්‍රද්ධාවන්ත කුමාරිකාවක් ඇත්තීය. ඕ තොමෝ පෙරවරු භාගයෙක කිසියම් කන බොන දෙයක් ඒ ගෙයි උපදිද, එයින් ඒ

කුමාරිකාවටත් කොටසක් ලැබේද, ඒ තමන් ලත් කොටසින් භාගයක් දන් දී අනුභව කරන්නීය. දන් නොදී අනුභව නොකරන්නීය. දන් පිළිගන්නට නිසි සිල්වත් කෙනෙකුන් බත් වේලෙහි නුදුටහොත් භාගයක් සඟවා තබා දුටුකල දන් දෙන්නිය. එසේම "මාගේ දියණියෝ දනාධ්‍යාශ ඇත්තීය. දන විභාගයෙහි ඇලුම් ඇත්තීය"යි සතුටු සිත් ඇතිව දෙභාගයක් දෙන්නිය. එසේ දෙන්නීද පළමුලත් කෙටස දන් දුන් කල අනෙක් කෙටසක් දෙයි. සිල්වතුන් දුටුකල එයිනුදු භාගයක් දන් දෙන්නීමය. මෙසේ කල්යන කල ඇගේ මව්පිය දෙදෙනා වැඩිවිය පැමිණෙන ලද ඒ කුමාරිකාව එම නුවර සමාන කුලයක කුමාරයෙකුට සරණ කොට දුන්හ. ඒ කුලය වනාහි මිථ්‍යාදෘෂ්ටිකය. තුනුරුවන් කෙරෙහි අප්‍රසන්නය, ශ්‍රද්ධා හීනය, එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ රජගහ නුවර ගෙපිළිවෙළින් පිඩු සිඟා වඩනා සේක් ඒ කුමාරිකාවගේ මයිලනුවන් දෙර සමීපයෙහි වැඩ සිටිසේක. කුමාරිකාව ඒ තෙරුන්වහන්සේ දැක සතුටු සිත් ඇතිව නමස්කාරකොට, "මෙසේ වැඩිය මැනව"යි කියා ගෙට ගොස් නැන්දණියන් විසින් සඟවා තබනලද කබලු පූවක් දැක නැන්දණියන් ආකල, "මෙපවත් කියා පින් අනුමෝදන් කරවමි" සිතා විශ්වාසයෙන් ගෙන තෙරුන් වහන්සේට පූජාකළාය. මහ තෙරුන්වහන්සේ අනුමොදනා කොට වැඩිසේක. ඉක්බිති ඒ කුමාරිකාව නැන්දණියන් ආකල මෙපවත් කියන්නී, "මෑණියනි, නුඹ විසින් සඟවා තබන ලද කබලු පූවක් මුගලන් මහ තෙරුන් වහන්සේට පූජාකෙළමි. එහි පින් අනුමෝදන්ව"යි කීවාය. එබසට කිපී, "කිමෙක්ද? මේ කවර බුහිටි කමෙක්ද? නපුරු කෙල්ල, මා සන්තක කබලු පූව මා නොවිචාරා හිස මුඩු ශ්‍රමණයාට දුන්නීදැ?"යි කියා බැණ, තට තට යන අනුකරණ ඇතිව ක්‍රොධයෙන් දිළිහි කටයුතු නොකටයුතු සලකාගත නොහී ඉදිරිපිට තිබූ මෝල් දණ්ඩක් ගෙන අංශ කූටයට පහරක් දුන්නීය. ඒ කුමාරිකාවසුකුමාල ශරීර ඇති හෙයින් දගෙවුනාවූ ආයු ඇති හෙයින්ද එම පහරින්ම බලවත් දුඃඛ වේදනාවෙන් මඩනා ලදුව කීප දවසකින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නීය. මේ අනෙක් කුශලයෙක් නොවෙයි. තෙරුන්වහන්සේට දුන්නාවූ කබලු පූවෙහි අනුසස් වන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් දහසක් පමණ දෙවගනන් පිරිවරා මහත්වූ දිව්‍ය ලීලාවෙන් විරාජමානව බබලන්නාවූ දිව්‍යාඞ්ගනාව දැක සමීපයට වැඩ ඈ විසින් ගිය දවස කරනලද කුශල කර්මය මෙසේ විචාළසේක.

"උළාරො තෙ යසො වණ්ණො සබ්බා ඔභාසතෙ දිසා,
නාරියො නච්චන්ති ගායන්ති දෙවපුත්තා අලඞ්කතා.
මොදන්ති පරිවාරෙන්ති තව පූජාය දෙවතෙ,
සොවණ්ණානි විමානානි තවිමානි සුදස්සනෙ.
තුවංසි ඉස්සරා තෙසං සබ්බකාම සමිද්ධිනී,
අභිජාතා මහන්තාසි දෙවකායෙ පමොදසී,
දෙවතෙ පුච්ඡිතාචික්ඛා කිස්ස කම්මස්සිදං ඵලං,
කෙන තෙ තාදිසො වණ්ණො-පෙ-පභාසති"

යනාදීන් "එම්බා දිව්‍යාඞ්ගනාව, තීගේ රන්කඳක් වැනිවූ ශරීර වර්ණය හා යසස් ඉතා උදාරතරවෙයි" යනාදීන් සම්පත් වර්ණනාකොට , "මේ දිව ඉසුරු ලැබීමට කළාවූ කුශලය කවරේ ද?"යි විචාරා වදාළ සේක. එකල මහතෙරුන් වහන්සේගේ වචනය මුදුණෙන් පිළිගෙන ඒ දිව්‍යාඞ්ගනා තොමෝ මෙසේ ප්‍රකාශ කළාය.

"අහංමනුස්සෙසු මනුස්ස භූතා
පුරිමාය ජාතියා මනුස්ස ලොකෙ,
දුස්සිල කුලෙ සුණිසා අහොසිං
අස්සඬෙසු කදරියෙසු අහං.
සඬා සීලෙන සම්පන්නා සංවිභාගරතා සදා,
පිණ්ඩාය චරමානස්ස අපූවං තෙ අදස්සහං.
තදහං සස්සුයාචික්ඛිං සමණො ආගතො ඉධ,
තස්ස ආදස්සහං පූවං පසන්නා සෙහි පාණිහි.
ඉතිස්සා සස්සු පරිභාසි අවිනීතා තුවං වධූ.
න මං සම්පුච්ඡිතුං ඉච්ඡි සමණස්ස දදමහං.
තතො මෙ සස්සු කුපිතා පහාසි මුසලෙන මං,
කූටඞ්ගච්ඡි අවධි මං නාසක්ඛිං ජීවිතුං චිරං,
සා අහං කායස්ස භෙද විප්පමුත්තා තතො චුතා,
දෙවානං තාවතිංසානං උපපන්නා සහව්‍යතං"

යනාදින් දක්වන්නි, "ස්වාමීනි, මම මිනිස් ලොව වසනකල පිඩු පිණිස වැඩියාවූ නුඹවහන්සේ දැක පහන් සිත් ඇතිව මා සතු දෙයක් නැති බැවින් නැන්දණියන් සන්තක කබලු පූවක් දැක විශ්වාසයෙන් ගෙන පූජාකොට ඉක්බිති නැන්දණියන්ට කබලු පූව දුන් පවත් කීමි. එබසට කිපී "මා නොවිචාරාමා සන්තක කපලු පූව ශ්‍රමණයන්ට දුන්නීදැ?"යි කියා ඉදිරියේ තුබු මෝල දණ්ඩක් ගෙන පහරක් දී අංශකූටය

බිඳපුව. එබැවින් බොහෝ දවසක් ජීවත්විය නොහි කාලක්‍රියා කොට ඒ කුශලකර්මයෙන් මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලදිමි'යි කිව. මහ තෙරහු දෙවතාදුවට බණ වදරා මිනිස් ලොවට අවුත් බුදුනට එපවත් කී සේක. බුහුදු එම අථෝත්පත්ති කොට ගෙන එතැන්හි පැමිණි පිරිසට බණ වදාළ සේක. ඒ ධර්ම දේශනාව බෙහෝදෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **පාරිච්ඡත්තක වර්ගයෙහි**
**උළාර විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදී.

## 30. උච්ඡුදායිකා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි **දෙවන උච්ඡුදායිකා විමාන වස්තුව** නම් කවර යත්.

ෂඩ් අසාධාරණ ඥානයෙන් යුක්ත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහානුවර වෙළුවනාරාමයෙහි වැඩ වාසය කර වදරනසේක. එසමයෙහි එක්තරා රහත් කෙනකුන් වහන්සේ එනුවර පිඩු සිඟා හැසිරෙනසේක්, එක්තරා ගෙදෙරකට වැඩිසේක. ඒ ගෙහිමි පුරුෂ තෙම කිසිම ශ්‍රද්ධාවක් නැත්තේය; මිථ්‍යාදෘෂ්ටිකය ඔහුගේ භාර්‍යාතොමෝ මිසදිටු වූ නමුත් ශ්‍රද්ධා ඇත්තීය. එබැවින් තමාගේ ගෙට වැඩියා වූ රහත් තෙරණුන් දැක ප්‍රසන්න වූ සිතින් උක්දඬු කඩක් පූජා කළාය. ඉක්බිති ඇගේ ස්වාමි වූ පවිටු පුද්ගලතෙම එය දැක බලවත් ව හටගත්තාවූ ක්‍රොධයෙන් මේ ශ්‍රමණයාහට මාගේ ගෙයින් උක්දඬු කඩක් දුන්නීයයි ඈ කෙරෙහි ක්‍රොධ උපදවා ඈට තර්ජන කොට ළඟ තිබූ පුටුවකින් ගැසීය. ඔහු විසින් ගසනලද කොට එම කුශල කර්මයාගේ බලයෙන් දිව්‍යලොකයෙහි උපන්නීය. ඈ විසින් තෙරුන් වහන්සේ නිසා ම දිව ඉසුරු ලබන ලදැයි මහත් සතුටට පැමිණ එදවස් රාත්‍රියෙහි ම සියලු ගිජ්ඣකූටපර්වතය චන්ද්‍රසූර්‍යයන් මෙන් බබුළුවමින් තෙරුන්වහන්සේට උපස්ථානය පිණිස පැමිණ තෙරුන් වහන්සේ වැඳ ඇදිලි සහිත ව නමස්කාර කරන්නී එක් පාර්ශවයක සිටියාය. ඉක්බිති තෙරන්වහන්සේ ඒ දිව්‍ය කුමාරිය දැක ඇගේ උදර වූ දිව්‍ය සම්පත් වර්ණනා කරමින් මෙසේ විචාළසේක.

"ඔභාසයිත්වා පඨවිං සදෙවකං
අතිරොචසි චන්දිමසූරියා විය,
සිරියා ච වණ්ණෙන යසෙන තෙජසා
බ්‍රහ්මාව දෙවෙ තිදසෙ සහින්දකෙ.

පූජාමි තං උප්පලමාලධාරිණී
ආවෙළිනී කඤ්චනසන්නිභත්තචෙ,
අලඞ්කතෙ උත්තමවත්ථධාරිණී
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං.

කිත්වං පුරෙ කම්මමකාසි අත්තනා
මනුස්සභූතා පුරිමාය ජාතියා
දානං සුචිණ්ණං අථ සීලසඤ්ඤමං
කෙනූපපන්නා සුගතිං යසස්සිනී

යනු හෙයින් මහාමෙරු පර්වත පාර්ශවයෙක්හි මිනිස් ලොව සීමා කොට එකම පහනක් මෙන්ද දහසක් රැස් විහිදුවා බබළන්නාවූ චන්ද්‍ර සූය‍ර්යයන් මෙන් ද එසේම ශ්‍රී සම්පත්තියෙන් හා වර්‍ණයෙන් ද යශසින් ද තේජසින් ද දෙව්ලොව දෙවියන්ට වඩා මෛත්‍රී ගුණයෙන් යුක්ත ව මහාබ්‍රහ්මයා මෙන් ද රන්රිදී ආදී සවර්‍ණමය පුෂ්පාවලින් ගෙන් සැරසුණාවූ ද එසේම උපුල්මල්මාලා ධරන්නා වූද ඉතා අලඞකාර වූ උතුම් දිව්‍ය වස්ත්‍ර ධරන්නා වූ ද ඉතා අලඞකාර වූ උතුම් දිව්‍ය වස්ත්‍ර ධරන්නා වූද තී මා වඳනා පිණිස පැමිණියෙහි. ඒ පැමිණිය වූ යහපත් වූ තී කරව දෙවතාවියක් දැයි විචාරමි. පෙර මනුෂ්‍යාත්ම භාවයෙහි වාසය කරන කල්හි තී විසින් කවර පුණ්‍යකර්‍මයක් කරනලද ද? කවර ශීලාදී ගුණධර්‍මයක් රක්නා ලද ද? කවර දිව්‍යලොකයෙක්හි උපදනා ලදදැ"යි විචාළසේක. එබස් අසා දෙවතාදූ තොමෝ තෙරුන් වහන්සේට මෙසේ සැළ කළාය.

"ඉදානි භන්තෙ, ඉමමෙව ගාමං
පිණ්ඩාය අම්හාක ඝරං උපාගමි,
තතො තෙ උච්ඡුස්ස අදසි ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියා.

සස්සු ච පච්ඡා අනුයුඤ්ජතෙ මමං
කහන්නු උච්ඡුං වධුකෙ අවාකිරි,
නච්ඡඩ්ඩිතං න ච පන ඛාදිතං මයා
සන්තස්ස භික්ඛුස්ස සයං අදාසහං.

තුය්හං න්විදං ඉස්සරියං අථො මම
ඉතිස්සා සස්සු පරිභාසතෙ මමං,

පීඨං ගහෙත්වා පහාරං අදාසි මෙ
තතො චුතා කාලකතාමහි දෙවතා.

තදෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
දෙවෙහි සද්ධිං පරිචාරයාමහං
මොදමහං කාමගුණෙහි පඤ්චහි.

යනුවෙන්, "ස්වාමිනි, මුගලන් මහතෙරුන්වහන්ස, මම මිනිස් ලොව ඉපද එක්තරා ස්වාමි කුලයෙක වසන කල්හි මනා සන්සුන් ගුණයෙහි පිහිටියා වූ එක්තරා භික්ෂු නමක් එම ග්‍රාමයෙහි පිඩු පිණිස හැසිර ගෙපිළිවෙලින් අපගේ ගෙදෙරට ද වැඩිසේක. උන්වහන්සේ දුටුවා වූ මම ප්‍රසන්න වූ සිත් ඇත්තී අප්‍රමාණ වූ ප්‍රීතියට පැමිණ ඒ තෙරුන් වහන්සේට උක්දඬු කඩක් පූජා කෙළෙමි. ඒ දුටුවා වූ මාගේ ස්වාමිපුරුෂතෙම පසු ව මට ආමන්ත්‍රණය කොට, එම්බල භාර්‍යාව, තී විසින් කවර කාරණයක් නිසා මාගේ ගෙහි තිබූ උක්දඬු කඩ බැහැර කරනලද ද? භික්ෂු නමකට කුමක් පිණිස දෙනලදද ද? තී විසින් මාගේ ගෙහි තිබූ ඉසුරු සම්පත්තිය නසන ලද ද"යි ක්‍රොධයෙන් කිපී ළඟ තිබූ පුටුවක් ඔසවා එයින් මට පහරක් ගැසීය. ඒ පහර වැදුණා වූ මම එයින් ම කාලක්‍රියා කොට දිව්‍යලොකෙයහි උපන්නෙමි. ස්වාමීනි, මුගලන් මහතෙරුන් වහන්ස, බලවත් ව හටගත්තා වූ ශ්‍රද්ධා චෙතනාවෙන් යුක්ත ව උක්දඬුකඩ පමණක් දීමෙන් කරන ලද ස්වල්පමාත්‍ර වූ ඒ පින් කරණ කොටගෙන මහත් ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙන් යුක්ත වූ දිව්‍යලොකයෙහි දිව්‍යසමූහයා පිරිවරා දිව්‍යමය වූ පඤ්චකාම සම්පත්තියෙන් සතුටු වන්නේමි"යි කියා තමන්ගේ දිව්‍ය ඓශ්වර්‍ය්‍යය තෙරුන් වහන්සේට විස්තර කොට කීව. තෙරුන් වහන්සේද ඒ අසා මිනිස්ලොවට වැඩ බුදුරජාණන් වහන්සේට සැළ කළහ. බුදුරජාණන් වහන්සේද පැමිණ සිටි පිරිසට එම කාරණය අත්‍ථොත්පත්ති කොට ධර්‍ම දෙශනා කළ සේක. ඒ දෙශනාව බොහෝදෙනාට සාර්‍ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **තුන්වන පාරිච්ඡත්තක වර්‍ගයෙහි දෙවන උච්ඡුදායිකා විමාන වස්තු වර්‍ණනාව** කියා නිමවන ලදී.

# 31. පල්ලඞක විමාන වස්තුව.

තව ද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි තුන්වන පලලඞක විමාන වස්තුව** නම් කවර යත්:

සර්වමාරවාරණ කෙශරීන්ද්‍රායමාන වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කර වදරනසේක. එසමයෙහි වනාහි සැවැත්නුවර වාසිවූ එක්තරා උපාසකයකුගේ දුහිතෲවක් තොමෝ එහි ම සමාන කුලපුත්‍රයකුට පාවා දෙනලද්දීය. ඕතොමෝ වනාහි ක්‍රොධ නොකරන්නීය: නිරන්තරයෙන් ශීලාචාර ගුණයෙන් යුක්ත වූවාය: ස්වාමිපුරුෂයා ද පන්සිල් ගන්වා තොමෝද පන්සිල් හා පෙහෙවස් නිරන්තරයෙන් ම රක්ෂා කරන්නීය. මෙසේ උතුම් ගුණයෙන් යුක්ත වූ ඕතොමෝ අනෙක් කලෙක්හි කාලක්‍රියා කොට තව්තිසා භවනයෙහි උපන්නීය. එසමයෙහි වනාහි මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙහි වඩනාසේක් තව්තිසා දිව්‍ය ලෝකයට පැමිණ මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙන් යුක්ත වූ ඒ පලලඞක දිව්‍ය විමානය දැක දෙවතාදු අතින් මෙසේ විචාරා වදාළ සේක.

"පලලඞකසෙට්ඨෙ මණිසොණ්ණචිත්තෙ
පුප්ඵාභිකිණ්ණෙ සයනෙ උළාරෙ,
තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
උච්චාවචා ඉද්ධි විකුබ්බමානා.

ඉමා ච තෙ අච්ඡරායො සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති,
දෙවිද්ධිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං

කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, තීගේ මේ නොයෙක් විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් හා නොයෙක් රැස් විහිදෙන්නා වූ උදරතර වූ පර්‍ය්‍යඞ්කය මාණික්‍යරත්නයෙන් හා ස්නරනින් නිමියේය" යනාදින් සමප් වර්ණනා කොට "මෙබඳු සම්පත් ලැබීමට කරන ලද කුශලකර්මය කවරේ දැ"යි විචාළසේක. ඒ කුශලකර්මය ප්‍රකාශ කරන්නාවූ දිව්‍යාඞ්ගනා

තොමෝ මෙසේ ප්‍රකාශ කළාය.

˝අහං මනුස්සෙසු මනුස්සභූතා
අඩ්ඪෙ කුලෙ සුණිසා අහොසිං,
අක්කොධනා භත්තු වසානුවත්තිනී
අහොසිං අප්පමත්තා උපොසථෙ˝-පෙ-

යනුහෙයින්, ˝ස්වාමීනි, මම මිනිස් ලොව වසන සමයෙහි ගව ධන රතනාදියෙන් ආඪ්‍ය වූ කුලයක ක්‍රෝධ නැත්තා වූ, ස්වාමියාට අනුකූල පැවතුම් ඇත්තා වූ, අප්‍රමාද ස්වභාව ඇත්තා වූ, යෙහෙළියක් වීමි. එසමයෙහි නිත්‍යපඤ්චශීලය රකිමින් පොහොය පෙහෙවස් වෙසෙමින් පුරුෂයාට රෑ දවල් දෙක්හිම අප්‍රමාද ව වැදීම් පිදීම් ආදී ආචාර ශීලයෙන් යුක්ත වීමි. තුණුරුවන් කෙරෙහි පහන්සිත් ඇත්තා වූ ශ්‍රද්ධාවන්ත වූ බුද්ධශාසනයෙහි ශීලාචාර වූ උපාසිකාවක් ව ප්‍රාණඝාතාදී දශවිධ අකුසලින් දුරුව දශවිධ වූ කුසල් කොට මේ දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදිමි˝යි කීවාය. එකල්හි මුගලන් මහතෙරුන් වහන්සේ විස්තර වශයෙන් බණ වදරා මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ එම අර්ථෝත්පත්ති කොටගෙන සම්ප්‍රාප්ත පිරිසට විස්තර වශයෙන් බණ වදළසේක. ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි තුන්වැනි වූ පල්ලඞ්ක විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදී.

## 32. ලතා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි **තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි ලතා විමාන වස්තුව** නම් කවර යත්:

අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට එක් සමයෙක සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එසමයෙහි සැවැත් නුවර වසන්නාවූ එක්තරා උපාසකයකුගේ නුවණැත්තා වූ කාර්‍යාකාර්‍යයෙහි දක්ෂ වූ ස්ථානොචිත පඤ්ඤාවෙන් යුක්ත වූ ලතා නම් වූ දුවණියකෙනෙක් ඇත්තාහ. ඒ කුමාරිකාව එක්තරා පතිකුලයකට යවන ලද්දී ස්වාමියාට හා නැදිමයිලන්ට ප්‍රියමනාප වන්නීය. ඒ ගෙයි සියලු බර උසුලන්ට ද වස්තු රැස් කිරීමට ද පිරිවර ජනයාට සංග්‍රහ කරන්නට ද සමර්ථ ව

ක්‍රොධ නොකිරිම ස්වභාව කොට ඇත්තීය. තුනුරුවන් කෙරෙහි පැහැද නොකඩකොට පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙමින් දන් දිමෙහි ඇලුම් ඇතිව නොපමාව දන ශීලාදී වශයෙන් බොහෝ කුසල් රැස් කළාය. ඒ උපාසිකාව එයට පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි වෙසමුණු මහරජහට ධීතෘවක් ව අපන්නී ලතා දිව්‍යාඞගනාව යයි ප්‍රසිඞ වූවාය. ඒ ලතාවගේ නැගණියන් වූ සජ්ජා ය, පවරාය, අච්චිමුඛීය, සූතාය, කියා අනෙකුදු දිව්‍යාඞගනාවෝ සතර දෙනෙක් ඇත්තාහුය. ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් ඒ දෙවඟනන් පස්දෙනා ගෙන්වා තමන්ට නැටුම් ගී කීම් ආදිය පිණිස නාටක ස්ත්‍රී භාවයෙන් පරිචාරිකා සථානයෙහි තබනලදහ. ඔවුන් පස්දෙනා අතුරෙන් ලතා දිව්‍යාඞගනාව නැටුම ගී කීම් ආදියෙහි දක්ෂ බැවින් අනෙක් සතරදෙනාට වඩා දෙවියන්ට ප්‍රිය වන්නිය. ඒ පස්දෙන ම සමගිව සැප විහරණයෙන් හුන්නාහුය. මෙසේ දවස් යවන කල්හි නෘත්‍ය ගීත කිරීමෙහි මම සමර්ථයෙමි, මම සමර්ථ කියා උන්ගේ නෘත්‍යගීත පිණිස විවාදයෙක් උපන. එසේ විවාද කොට වෙසමුණු මහරජ්ජුරුවන් කරා ගොස්, "පියාණන් වහන්ස, අප පස්දෙනා අතුරෙන් නෘත්‍යගීත කිරීමෙහි කවරෙක් වඩා සමර්ථදැ"යි විචාළාහුය. එකල වෙසමුණු රජ කියන්නේ, "දූවරුනි, තෙපි ගොස් හිමවන අනවතප්ත විල සමීපයෙහි දෙවසමාගමයෙහි නටව. එකල්හි තොපගේ සමර්ථබව ප්‍රකාශ වන්නේය"යි කියේය. ඒ දිව්‍යාඞගනාවෝ තම තමන් ස්වභාව ලීලාවෙන් හිඳගත නොහී සිත හටගත් සන්තෝෂයෙන් "ආශ්චර්යය, අද්භූතය"යි ප්‍රීතිවාක්‍යය පවත්වා සාධුකාර දෙමින් ඔල්වර හඬ ගසමින් පිළී හිස සිසාරමින් සියලු හිමාල ය වනය කම්පා කරන්නාසේ ඒකකොලාහල කළාහුය. අනෙක් සතරදෙනා නටන කල ශිතකාලයෙහි හැකිල සිටිනා කොවුලන් සේ තුෂ්ණිම්භූතව හුන්නාහුය. එකල ලතාවෙගේ සමර්ථකම විශේෂයෙන් ප්‍රකාශ විය. ඒ දිව්‍යාඞගනාවන් සතර දෙනාට මෙබඳු සිතෙක් පහළ විය. මේ ලතාවෙ කවර කුශල කර්මයක් කොට අප සියල්ල ම අභිභවනය කොට බබළාද? මෙසේ සිතා, "මෙබඳු ඓශ්චර්යයක් ලැබීමට ඇය විසින් කළා වූ කුශලය කවරේදැ"යි කියා සූතා නම් දිව්‍යාඞගනාව වචාළාය. ඒ දිව්‍යාඞගනාව ද කුශලය ප්‍රකාශ කොට කිව. එසමයෙහි දෙවචාරිකාවෙන් දෙව්ලොවට වැඩියා වූ මුගලන් මහතෙරුන් කීවෝය. මුගලන් මහතෙරුන් වහන්සේ මිනිස්ලොවට වැඩ කුශලකර්මය විචාරීමට කාරණා සහිතව මුල පටන් සියලුම ප්‍රවෘතිය බුදුන්ට දන්වනසේක්.

"ලතා ච සජ්ජා පවරා ච දෙවතා
අච්චිමුඛී රාජවරස්ස සිරීමතො,

සුතා ච රඤ්ඤො වෙස්සවණස්ස ධීතා
රාජී මතී ධම්මගුණෙහි සොභථ"-පෙ-

යනුහෙයින්, "ස්වාමීනී, ලතා ය, සජ්ජා ය, පවරා ය, අච්චිමුඛී ය, සුතා ය"යි කියා වෙසමුණු මහරජුහුගේ දූවරු පස්දෙනෙක් ඇත්තාහ. ඒ පස්දෙනා අනවතප්ත විලට නහන්ට ගියාහුය. නිම්ලවූ සිහිල් පැන් නහා ඉක්බිති නෘත්‍යගීත කොට ලතා නම් දිව්‍යාඞගනාවනගේ නැටුම් බලා දෙවතාවෝ විශේෂයෙන් සතුටුවූ හෙයින් ලතා දිව්‍යාඞගනාව යටගිය දවස කළාවූ කුශලකර්මය විචාරනු කැමති ව සුතා නම් දිව්‍යාඞගනාව මෙසේ විචාළීය. "එම්බා ලාතාවෙනි, යහපත යනාදින් ප්‍රශංසා කටයුතු වූ නෘත්‍යගීත හා රූප ශ්‍රී ශරීර වර්ණනාදී මේ දිව්‍ය ඓශ්වර්‍ය්‍යයක් ලබන්නට පූර්වජාතියෙහි කළාවූ කුශල කර්මය කවරේ දැයි විචාළාය. මෙසේ සුතා නම් දිව්‍යාඞගනාව විසින් විචාරන ලද පැනය විසඳන්නාවූ ලතා නම් දිව්‍යාඞගනාව මෙසේ ප්‍රකාශ කළාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
උළාරභොගෙ කුලෙ සුණිසා අහොසිං,
අක්කොධනා භත්තුවසානුවත්තිනී
අහොසිං අප්පමත්තා උපොසථෙ"-පෙ-

යනුහෙයින්, "යටගිය දවස මිනිස්ලොව වසන සමයෙහි එක්තරා උදරභොග ඇති කුලයෙක යෙහෙළියක් විමි. ස්වාමියාට අනුකූල වූ පැවතුම් ඇතිව, ක්‍රොධයෙන් දුරුව අප්‍රමාද ව, නිරන්තරයෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙමින් සතුටු සිත් ඇතිව පුරුෂයාට ද පුරුෂයාගේ මල්බෑයන්ට ද නැදි මයිලන්ට දන් සිත් ලෙස උපකාර කෙළෙමි. දැසි දසුන්ට ද, සිත් වූ පරිද්දෙන් සංග්‍රහ කෙළෙමි. අප්‍රමාද ව ගිහිධර්ම තඞඛ්‍යාත පතිව්‍රතා ධර්මය රක්‍ෂා කොට ඒ කුශලානුභාවයෙන් මේ දෙව්ලොව ඉපද සෙස්සන්ට වඩා ආයුෂයෙන් ද වර්ණයෙන්ද සැපයෙන් ද බලයෙන් ද විශේෂ බව පැමිණියෙමි. ක්‍රීඩා රතියෙන් අනල්ප වූ මහත් දිව්‍යශ්‍රී සම්පත් අනුභව කෙරෙමි"යි කිව. එබස් අසා පතිව්‍රතාධර්ම සංඛ්‍යාත කුශල ධර්මයට ප්‍රශංසා කරන්නා වූ සුතා නම් දිව්‍යාඞගනාව අනෙකුත් තුන්දෙනාට මෙසේ කිව.

"සුතං නු තං භාසති යං අයං ලතා
යං නො අපුච්ඡිමහ අකිත්තයී නො,
පතිනො කිරසමාකං විසිට්ඨනාරිනං
ගතී ච තාසං පවරා ච දෙවතා-පෙ"

යනුහෙයින්, යම් හෙයකින් අප ජ්‍යෙෂ්ඨ බුහුනණියන් අතින් විචාළමෝ නම් ඒ පැනය අපට ප්‍රකාශ කොට කියයි. මෙසේ මේ ලතාව යම් ප්‍රතිව්‍රතා ධර්මයක් ප්‍රකාශ කොට කියා ද, ඒ ධර්මය අප විසින් අසනලද්දේය. එබැවින් විශේෂයෙන් ප්‍රශංසා කටයුත්තේය ස්වාමිපුරුෂයෝ නම් ස්ත්‍රී භාවයට පැමිණියා වූ විශිෂ්ට වූ අප පොෂ්‍යය කරන හෙයින් ද උතුම් වන්නාහ. දෙවතාවන් හා මෙලොවත් උන්න්ගේ ම පිහිට ප්‍රතිසරණය; පරලොවත් හිත සැප එළවන හෙයින් උන්ගේ ම පිහිටය ස්ත්‍රීහු යම් තැනක උපන්නාහු පතිව්‍රතා ධර්මය රක්‍ෂා කෙරෙද්ද, අපි ද ඒ මිනිස්ලොව ඉපිද පතිව්‍රතා ධර්මය රක්‍ෂා කොට මේ ලතාව යම් ඓශ්වර්‍ය්‍ය සම්පත්තියක් ප්‍රකාශ කොට කීවා ද, ඒ දිව්‍යපුරු ලබම්ව'යි කියා නැවත මේ උපමාවෙන් ප්‍රකාශකරන්නී, 'යම් සේ සිංහයා තමාට නිවාස වූ පර්‍වත ආශ්‍රය කොට ගල්ගුහායෙහි වැස අවශේෂ ක්‍ෂුද්‍රා ක්‍ෂුද්‍ර සත්‍වයන් මැඩපවත්වා ඇතුන් මරා මස් අනුභව කෙරේද, එමෙන් ආර්‍ය්‍යශ්‍රාවිකා වූ ධර්මචාරි වූ උපාසිකා තොමෝ බත් පිළී පමණක් දී පොෂ්‍යය කරන හෙයින් ස්වාමිපුරුෂයා ආශ්‍රය කොට වසන්නී පිළිගත් වස්තුවෙහි හෙවත් තමන් සන්තක වස්තු ආදී යෙහි උදනා මසුරුමලාදි අකුසල් මැඩ පවත්වා ක්‍රොධය නසා ස්වර්ගයෙහි ඉපිද සතුටු වන්නිය'යි කියා සුතා නම් දිව්‍යාඞගනාව ප්‍රශංසා කළාය' යන මේ කථා ප්‍රබන්ධය බුදුන්ට දැන්වූ සේක. බුදුරජාණෝ එම අත්පෝත්පත්ති කොටගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්ම දෙශනාව බොහෝදෙනාට සාත්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පරිච්ඡෙදයෙහි
**සතරවන ලතා විමාන වර්‍ණනාව** කියා නිමවන ලදී.

## 33. ගුත්තිල විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පාරිච්ඡත්තක වර්ගයෙහි පස්වැනිවූ +ගුප්තිල විමාන වස්තු වනම් කවරයත්;- එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු.

ජල පොළොවක් සේ ගැඹුරු වූ විසිතුරු දෙශනා ඇති බුදුරජාණන් වහන්සේ එක් සමයෙක රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ තව්තිසා දෙව්ලොව

---

+ ගුප්තා රක්ෂිතා ධනං ශාස්ත්‍රං වාශ්‍යස්තීති ගුත්තිලඃ යි.

පිළිවෙලින් එකතැන පිහිටියා වූ සතිසක් පමණ දිව්‍ය විමානවල වෙන වෙනම දහස දහසක් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා මහත්වූ දිව්‍ය සම්පත් අනුභව කරන්නා වූ සතිසක් දිව්‍යාඞ්ගනාවන් දැක, "අභික්කන්තෙන වණ්ණෙන" යනාදී ගාථාවලින් වෙන වෙනම පූර්ව ජාතියෙහි කරනලද කුශල කර්මයන් විචාරා ඔවුන් විසිනුදු ඒ වචනය ට අනතුරුව "වත්ථුත්තමදයිකා නාරි" යනාදී ගාථාවන්ගෙන් වෙන වෙනම කුශල් ප්‍රකාශකොට කී කල මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක බුදුරජාණෝ එබස් අසා, "මෞද්ගල්‍යායන ස්ථවිරය, දිව්‍යාඞ්ගනාවෝ තොප විසින් විචාරණ ලදුව මෙසේ ප්‍රකාශ කොට කීවාහු වේදැ"යි වදරා මහතෙරහු විසින් විස්තර දෙශනාවට ආරාධනා කරවන ලදුව තමන්ගේම පූර්ව චරිත වශයෙන් අතීතවූ ගුත්තිල පණ්ඩිතයන්ගේ උත්පත්ති කථාව ගෙනහැර දක්වා වදළ සේක. ඒ කෙසේදයත්?

"යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහා බෝසතානෝ එක්තරා ගන්ධර්ව කුලයක ඉපිද ගන්ධර්ව ශිල්පයෙහි කෙළවරට පැමිණ තිඹරු නාරදදි ගන්ධර්ව දිව්‍යපුත්‍රයන්සේ ගුත්තිලාචාරීන් වහන්සේ යයි සියලු දිශාවන්හි ප්‍රසිද්ධව දඹදිවට එකාචාරිව අන්ධවූ මව් පියන් රක්ෂාකෙරෙමින් වෙසෙති එසමයෙහි උදෙනි නුවරවාසී වූ මූසිල නම් ගන්ධර්වයෙක් එපවත් අසා බෝසතුන් කරා ගොස් වැඳ එකත්පස්ව සිටියේය. "කුමක් පිණිස ආයෙහිද?"යි විචාළ කල නුඹවහන්සේ සමීපයෙහි ශිල්ප උගන්ට ආමි යි කීය. පණ්ඩිතයෝ එබස් අසා ලක්ෂණ දැන්මෙහි සමර්ථ බැවින් ඔහුගේ ලකුණු බලා අසත්පුරුෂවූ තද පරුෂවූ කෙළෙහි ගුණ නොදන්නා විෂමාධ්‍යාශ ඇති එකෙක. එබැවින් මොහු මා විසින් සංග්‍රහ නොකට යුතුය යි සිතා ශිල්ප උගන්ට අවසර නුදුන් සේක. මවුපියන්ට මෙහෙකොට ඔවුන් ලවා යාච්ඤා කරවිය. එසේ මවුපියන් විසින් යාච්ඤා කරන ලද ගුත්තිල පණ්ඩිතයෝ, මවුපියන් ගේ වචනය නම් අතික්‍රාන්ත නොකටයුතුයයි සිතා ශිල්ප උගන්වන සේක් මසුරු මල නැති හෙයින්ද මහත් කරුණා ඇති හෙයින්ද ආචාර්ය භාගයකුත් නොතබා නිරවශෙෂකොට ශිල්ප ඉගැන්වූ සේක.

"ඒ මූසිලයා ද නුවණ ඇති හෙයින්ද පෙර පුරුදු හෙයින්ද කුශීත නොවන හෙයින්ද තීක්ෂ්ණකොට උගන්නාලද ශිල්ප ඇතිව සිතන්නේ, මේ බරණැස් නුවර නම් මුලු දඹදිව රජුන්ට අග්‍රවූ රජහට නිවාස හෙයින් අධිපති නුවරය. එබැවින් මෙනුවර රජු හා පිරිසට ශිල්ප දැක්වුයෙම් නම්

ඉතා යෙහෙක. එසේ කල ආචාරින් මෙන් නුවණින් මුලු දඹදිව ප්‍රසිඬ වෙමියි සිතා ආචාරීන්ට මෙසේ කිය. ආචාරින්වහන්ස, රජු ඉදිරියේ මම ශිල්ප දක්වනු කැමැත්තෙමි, රජහට මා දැක්වුව මැනවැයි කීය. එකල බෝ සතාණෝ සිතනසේක්, මොහු මා සමීපයෙහි උගන්නාලද ශිල්ප ඇත්තේය. එබැවින් මෝහට පිටිවහලක් ලැබේවායි සිතා කරුණා සිත් ඇතිව රජ සමීපයට කැඳවාගෙන ගොස් රජහට දක්වා, දෙවයන් වහන්ස, මාගේ මේ අතවැස්සා උගත් වීණා ශිල්ප බලා වදාළ මැනවැයි කී සේක. රජු, යහපතැයි කියා වීණා ගායනා අසා සතුටුව සිය රටට යනු කැමතිව සිටි ගමන් වළකා, මා සමීපයෙහි වසව, ආචාරීන්ට දුන් සැපතින් භාගයක් දෙමි කිය. එබසට මූසිලයා, මම ආචාරීන්ට භය නොවෙමි, ආචාරීන් මට වඩා දන්නා දෙයක් නැත, සමකොටසක් දුන මැනවයිකීහ. එසේ නොකියව, ආචාරිහුම මහත් වෙති, තට භාගයක් දෙමියි රජු විසින් කී කල්හි, දෙවයන්වහන්ස, එසේ වී නම් මාගේද ආචාරින්ගේද ශිල්ප වාදදක්නාසේක්වායි කියා රජගෙන් නික්ම, මෙයින් සත්වන දවස් රාජාඬගණයෙහිදී මාගේ ද ගුත්තිලාචාරීන්ගේද ශිල්ප වාදයදැක්ම වෙයි. ඒ වාදය දක්නා කැමති කෙනෙක්සත්වන දවස් රාජාඬගනයෙහි රැස්වෙත්වා යි කියා ඒ ඒ තැන ඇවිද උද්ඝොෂණය කෙලේය. මහබෝසතාණෝ එපවත් අසා සිතනසේක්, මේ මූසිලයා තරුණය, කායබල ඇත්තේය. මම වනාහි ජරාවෙන් ජීණීවීමි. ඉදින් මට පරාජයෙක් වීනම් නපුර. ජිවත් වීමට වඩා මියයාම උතුම්ය. එබැවින් වල් වැද කර වැල ලා මියෙමියි සිතූහ. මෙසේ සිතා වලට ගිය සේක මරණ භයින් තැතිගෙන නැවත ආසේක. එසේම නැවත නැවතත් යමින් එමින් වෙහෙසෙන සේක් එතැන්හි යන එන මහ වල්විය, තණ පහවිය. එකල්හි සක්දෙව් මහරජාණෝ එපවත්දැක බෝසතුන් කරා අවුත් දෘශ්‍යමාන ශක්‍ර විලාශයෙන් ආකාශයෙහි සිට, ආචාරීනි, කුමක් කරනසේක්දැ?යි විචාළහ. එබස් අසා මහ බෝසතාණෝ තමන් කළ කී දේ මේ ගාථාවෙන් ප්‍රකාශ කළ සේක.

සත්ත තන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං,
සො මං රඞගමහි අවෙහති සරණං මෙ හො හි කොසියා ති.

"කොසිය ගොත්‍රයෙහි උපන් සක්දෙව් රජාණෙනි, සත් තතක් ඇත්තාවූ ඒ තන්ත්‍රින් සත්දෙනාගේ සැදීම් වශයෙන් සප්ත ප්‍රකාරයෙන් පවත්නා සවර සතකින්ද එ මැ විෂය කොට සුදුසු වශයෙන් පවත්නා දෙවිස්සක් ප්‍රමාණ ශ්‍රැතීන් හා ඒ ශ්‍රැති භෙද අපාභරණ වශයෙන් පවත්නා සමපණස් මෘච්ඡනාවන්ගේ ව්‍යාප්තවීමෙන් සවරයාගේද ශරීරයාගේද

වීණාවගේද ඔවුනොවුන්ගේද සංසන්දනයෙන් අසන්නවුන්ගේ සිත් අතිශයින් අභිරමණය කරන හෙයින් රාමණෙයාවූ සවර ශතාදි විභාග වශයෙන් සදනලද චතුර්විධ ගන්ධර්ව ශිල්පය නොහැර ආචාර්‍ය්‍ය මුෂ්ටි රහිතව ගන්ධර්ව ශිල්පය නිෂ්ඨාකොට නොසඟවා මූසිල නම් අතවැසියාහට කීම්; උගන්වා හික්මවීම්. ඒ මූසිලයා දැන්, වාද කෙරෙමියි, මා හා සමග රජ පිරිස් මැද නෘත්‍ය මණ්ඩලයෙහි ශිල්ප දක්වන්නට එවයි කියා මා කැඳවයි. එබැවින් දෙදෙව්ලොවට අධිපතිවූ සක්දේව් මහ රජාණෙනි, මට පිටිවහල්වුව මැනව, මට පිළිසරණ වෙවයි කීසේක. එබස් අසා සක්දෙව් මහරජාණෝ නොබව, ආචාරීනි, සැක නොවුව මැනව, මම නුබ රකිමි, පිළිසරණ වෙමි කියා අස්වසන්නාහු:-

අහං තෙ සරණං හොමි අහමාචරිය පූජකො
න තං ජහිස්සති සිස්සො සිස්සමාචරිය ජෙස්සසි

යනු හෙයින්, (ගිය දවස මහ බෝසතානෝ ශක්‍රයාට ගුරුවූ සේක. එබැවින් ශක්‍රයා බෝසතාණන්ට ආචාර්‍ය්‍ය වාදයෙන් ආමන්ත්‍රණය කරයි.) ආචාරිනී, මම ගුරු පූජා කෙරෙමි; මූසිලයා සේ සමකොට නොසිතමි, මා වැනි අතවැසියකු සිටියදී කවර හෙයකින් නුඹට පරාජය වේද? මම නුඹට පිළිසරණ වෙමි නුඹට මුත් ශිෂ්‍යවූ මූසිලයාට ජය නැත්තේය සත්වන දවස මමත් සාකච්ඡා මණ්ඩලයට එමි. සැක නොව නෘත්‍ය මණ්ඩලයට එනසේක්වා යි කියා අස්වසා දෙව් ලොවට ගියහ. ඉක්බිති සත්වන දවස් රජු මහ පිරිස් පිරිවරා, ශිෂ්‍යාචාර්‍ය්‍ය දෙදෙනාගේ ශිල්ප වාදය බලම්හයි කියා සිංහාසනාරූඪව රාජ සභාවෙහි උන්හ. ගුත්තිලාචාරිද මූසිලයාද ශිල්ප දක්වනු පිණිස සැදී පැහැදී රජු කරා එළඹැ නමස්කාර කොට තම තමන්ට සුදුසු අසුන්වල හිඳ වීනා ගායනා වට පටන්ගත්තාහුය. එකල්හි ශක්‍රදෙවේන්ද්‍රයෝද එම නෘත්‍ය මණ්ඩලට අවුත් ආකාශයෙහි සිටියෝය. ඒ ශක්‍රයා වනාහි මහබෝසතාණන් විසින් දකිනු ලැබෙයි. අවශෙෂයන් විසින් නොදක්නා ලැබෙයි. රජ පිරිස දෙදෙනාගේම ගායනා අසා දෙදෙනාගේම ගායනා සම හෙයින් දෙදෙනා කෙරෙහිම සම සිත් වූහ. ඉක්බිති ශක්‍රයා, ගුත්තිලාචාරීනි, එක් තතක් සිඳුවයි කිය. පණ්ඩිතයෝ එක් තතක් සිඳ ගායනා කළ සේක. එකලද පෙරසේම මධුර සවර විය. එසේම දෙවන තුන්වන සතරවන පස්වන සවන සත්වන තතයයි මෙම ක්‍රමයෙන් සිඳුවයි කීය. එසේ සිඳ ගායනා කළහ. පෙර සේ මධුර නාදවිය. ඒ බව දැක මූසිලයා පරාජය වීමෙන් දුර්මුඛව බිම බලාගත, එතැන්හි සිටි රජ පිරිස තුටු පහටුව ගුත්තිල පණ්ඩිතයන්ට සාධුකාර දුන්හ. රජු මූසිලයා රාජ සභාවෙන් පිටත ලැවූහ. මහජනයා කිපි කැට කැබිලිති දඬු මුගුරු ආදියෙන් තළා එතැන්හිම ජීවිත

විනාශයට පැමිණ විය සක්දෙව් මහරජාණෝ බෝසතුන් හා සමග ප්‍රිය කථාකොට දෙව්ලොවටම ගියෝය. එකල දෙවතාවෝ, මහරජ නුඹ මද කලක් කොයි ගියසේක්දැ?"යි විචාරා එපවත් අසා, මහරජ, අපිද ගුත්තිලාචාරීන් දක්නා කැමැත්තම්හ. ගුත්තිලාචාරින් මේ තැන්හි ගෙවා අපට දැක්වුවමැනවයි කීහ. ශක්‍රයා දෙවතාවන් කී බස් අසා මාතලී දෙව් පුත් කැඳවා, මාතලිය, වෛජයන්ත නම් රථය ගෙන ගොස් අපගේ ගුත්තිලාචාරින් කැඳවා ගෙන එව, දෙවතාවෝ ආචාරින් දක්නා කැමැත්තෝයයි කියා යැවීය. එකල මාතලී දෙව්පුත් වෛජයන්ත නම් රථය ගෙන මිනිස් ලොවට ගොස් ගුත්තිල පණ්ඩිතයන් රථයට නංවා ගෙන දෙව් ලොටව ගියේය. ශක්‍ර දෙවේන්‍ද්‍රයෝ බෝසතුන් දැක සතුටුව උන් හා ප්‍රිය කථාකොට ආචාරිනි, දෙවතාවෝ වීණා ගායන අසන්ට කැමැත්තේයයි කීහ. එබසට බෝසතාණෝ කියනසේක, දෙවයෙනි, අපි ශිල්ප නිසාම ජීවත් වම්හ. වැටුප් වසතුවක් නැතිව ශිල්ප නොපාම්හයි කීසේක. කෙබඳු වස්තුවත් කැමැත්තේ වේදැ?යි විචාළ කළ අනෙක් වස්තුවකින් මට ප්‍රයෝජන නැත මේ දෙවතාවන් විසින් පූර්වජාතියෙහි කරන ලද කුශල් ප්‍රකාශකොට කීම මැ මට වස්තුව නම් වෙයි කීසේක. දිව්‍යාඞ්ගනාවෝද එබසට යහපතැයි කියා ඔවුන් කළ කුශල් ප්‍රකාශකොට කීහ. ඒ දිව්‍යාඞ්ගනාවෝ කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස්ලොව ඉපිද වෙන වෙනම කුශල් කොට එයින් චුතව තවුතිසා දිව්‍ය ලොකයෙහි වෙන වෙනම දිව්‍යාප්සරාවන් දහස දහස පිරිවරා ශක්‍රයාට පාදචාරිකාවන්වැ පිළිවෙළින් පිහිටි සතිසක් දිව්‍ය විමානවල ඉපිද බුදු මුඛයකින් මුත්කියා කියා නිමවාලිය නොහැකි මහත්වූ දිව්‍ය සම්පත් අනුභව කරන්නාහුය. මෙසේ එක තැන පිළිවෙළින් පිහිටි සතිස් දිව්‍යාඞ්ගනාවන්ගේ විමන් දැක ඔවුන් මෙබඳු සම්පත් ලැබීමට යටගිය දවස කරනලද කුශල් ප්‍රකාශ කරනු කැමතිව වීණා ශිල්ප දැක්වීමට වැටුප් වියදම් වශයෙන් ප්‍රතිඥ ගෙන වදරන සේක් මේ ගාථාවන්ගේන් විචාළ සේක.

අභික්කන්තෙන වණ්ණෙන යාතවං තිට්ඨසී දෙවතෙ,
ඔහාසෙනත්ති දිසා සබ්බා ඔසධී විය තාරකා,
පුච්ඡාමිතං දෙවි පෙ-පභාසතී

යනු හෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, ති අනෙකවිධ රැසින් දිලියෙන නොයෙක් දිව්‍යාභරණයෙන් සැරහී මහත්වූ ශරීර වර්ණයෙන් දිළිසෙමින් දෙව් පිරිස් මැද යම් ලීලාවකින් සිටින්නෙහිද, එකල්හි තාරකාවන් මැද දිළියෙන ඔසධී තාරකාවන් සේ දස දිග් එකාලොක කෙරෙමින්

බබලන්නෙහිය. මෙසේ දිලියෙන්නාවූ තී කවර කුශල කර්මයක් හෙතුකොගෙන වර්ණ සම්පත් භොග සම්පත් පරිවාර සම්පත්ආදියෙන් ජොතිමත්ව බබලන්නෙහිදැ?"යි විචාළ සේක. මෙසේ ගුත්තිල පණ්ඩිතයන් විචාල පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මෙසේ ප්‍රකාශ කළාය.

වත්‍ථු ත්තමදායිකා නාරි
පවරා හොති නරෙසු නාරිසු,
එවං පියරූපදායිකා මනාපං
දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං,
තස්සා මෙ පස්ස විමානං
අච්ඡරා කාම වණ්ණිනී හමස්මි,
අච්ඡරා සහස්සස්සාහං
පවරා පස්ස පුඤ්ඤානං විපාකං,

යනුහෙයින්, එම්බා ගුත්තිල ගන්ධර්වය, මම යටගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස් ලොව ඉපිද මෙලෝ පරලෝ දැන වසන්නෙම් කර්මපල අදහමින් මිනිස්ලොව විද්‍යමාන වස්ත්‍ර ජාතීන් අතුරෙන් අනගි වූ කොටි ගණන් අගනා උතුම් පිළිසඟලක් රහත් නමකට පූජා කෙළෙම්. එපමණ කුශලය හෙතුකොටගෙන මේ දෙව්ලොවට අධිපතිවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයන්ට අග්‍රමෙහෙසිකා වැ කවර කෙනෙකුන් විසිනුත් කියා නිමවාලිය නොහැකි මෙබඳු දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදිමි. එබැවින් මේ ලොකයෙහි ස්ත්‍රී පුරුෂයන් අතුරෙන් යම් ස්ත්‍රීයක් උතුම් වස්ත්‍රයක් දුන්නේ වී නම් ඕ තොමෝ ප්‍රියමනාප වූ වර්ණ සම්පත් දුන්නාවීනම් වෙයි. එබැවින් සියලු ස්ත්‍රී පුරුෂයන් අතුරෙන් අග්‍රවූ ප්‍රිය මනාපවූ දිව්‍ය සම්පත් ලබයි. එහි අනුසස් දක්නා පිණිස මාගේ මේ උත්තම වර්ණ සම්පත් හා දිව්‍ය විමානාදි සියලු සම්පත් බැලුව මැනව. එක වස්ත්‍රය දුන්නාවූ කුශල කර්මය සියලු සැපතට මුල කාරණා වන්නේයයි කිව. ඉක්බිති පිළිවෙලින් සිටි අනිත් සියල්ලවුන් අතින්ද වෙන වෙනම පෙරසේම විචාළ සේක. ඔවුහුද වෙන වෙනම කුශල් ප්‍රකාශකොට කීහ.

හේ කෙසේද යත්:- එක් දෙවඟනක් කියන්නී, යටගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස්ලොවදී තුනුරුවන් කෙරෙහි පැහැද උතුම් වූ සමන් මල්දමක් හා සුවඳ මල් පූජාවක් කෙළෙම්. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමියි කිව. ඉක්බිති අනෙක් දෙවඟනන් කියන්නී, එම බුදුන් දවස මිනිස් ලොව උපන් සමයෙහි තුනුරුවන් කෙරෙහි පැහැද සඳුන් සුවඳ කස්තුරිකාදී උතුම් සුවඳ ගඳ පූජාවක් කොට මේ සම්පත් ලදිමියි කිය. ඊට අනතුරුව අනෙක් සුර සුන්දරියක් කියන්නී, මම යටගිය

දවස කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස් ලොවදී අනුභව කටයුතුවූ වැල, වරකා, අඹ, කදලි, නාළිකෙරාදි වශයෙන් ඵලා ඵල දනයක් දුනිමි. එපමණ කුසලින් මේ සියලු සම්පත් ලදිමියි කිව. ඉක්බිති අනෙක් දිව්‍යාඞ්ගනාවක් කියන්නී, පින්වත් ගන්ධර්වය, මම මිනිස් ලොව වසන සමයෙහි ගිතෙල් මී සකුරු ආදි මිහිරි රස දනය දුනිමි. එපමණ පිණින් මෙබඳු සම්පත්තියක් ලදිමිය කිය. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් කියන්නී පින්වත්නි. මම මිනිස් ලොව උපන් සමයෙහි කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි සංඝයා දිඝී මාගීයට පැමිණ වඩනාහු මා වසන ගම සමීපයට පැමිණියා දැක සතුටුව වැඳ පුද ඔවුනොවුන්ගෙන් බණ අසා එක පොහෝ දිනයෙක අෂ්ටාඞ්ග සමන්විතවූ පෙහෙවස් පමණක් විසීමි. එම කුශලයෙන් මේ දිව්‍ය සම්පත් ලදිමියි කිව ඉක්බිති අනෙක් සුරසුන්දරියක් කියන්නි, කාශ්‍යප බුදුන් ගේ ශාසනයෙහි පැවිදිවූ භික්ෂු කෙනෙකුන් වහන්සේ කිසි කටයුත්තක් නිසා නැව් නැගී වඩනාසේක් අහර වළඳනා කාලය සම්ප්‍රාප්තවූ හෙයින් එම නැව පිටම හිඳ වළඳනා සේක. මම එසමයෙහි උන්වහන්සේට බොන පැන් හා මුඛ ධොවන පැන් පමණක් දුනිමි. එපමණ කුශලයෙන් මේ දිව ඉසුරු ලදිමි. දිය පිටම හිඳ කිසි ආයාසයක් නැතිව අතට ගෙන දුන් පැන් සිහිත්තෙහි අනුසස බලවයි කිය. ඊට අනතුරුව අනෙක් දිව්‍යාඞ්ගනාවක් කියන්නී යටගිය දවස කශ්‍යප බුදුන් සමයෙහි එක්තරා කුල දුවක්ව චණ්ඩවූ විෂමාධ්‍යාස මව්පියන් ඇති පුරුෂයෙකුට සරණ ගොස් ඒ එරුෂවූ නැදිමයිනල් විසින් ක්‍රොධයෙන් දිළිහි නොයක් ලෙසින් අප්‍රිය වචන කියා පරිභව බණනකල නොකිපී මෛත්‍රී ගුණයෙන් යෙදී සසර සිහිකෙරෙමින් සිහි නුවණින් යෙදී වරද ඉවසා නොපමාවිමි. එපමණ කුශලයෙන් මේ දිව ඉසුරු ලදිමියි කිව. ඉක්බිති අනෙක් සුර සුන්දරියක් කියන්නී, යටගිය දවස මම කාශ්‍යප බුදුන් සමයෙහි එක්තරා කුල ගෙයෙකැ දසියෙක්වැ ඉපිද දුඃඛ ජීවිකාවෙන් දවස් යවන්නෙමි එතකුදු වූවත් දන් දීමෙහි ඇලුම් ඇතිවීමි එබැවින් කර්මඵලඅදහමින් දන සංවිභාගය සිතින් සලකා මා ලත්කොටසින් භාගයක් දන් දී අනුභවකරන සුලු වීමි. හිමියන් විසින් නොයෙක් ලෙසින් ආක්‍රොෂ පරිභව බණනකල මා වැනි වැඩ පසස්නා දාසියකටත් මෙසේ කියව්දැයි අභිමාන නොකොට සිහිනුවණින් යෙදී කිසි කෙලෙකත් ක්‍රොධ නොකොට සන්හුන් කායවාක් සමාචාර ඇති බැවින් කීකරුව මෛත්‍රී ගුණයම පහළ කෙළෙමි. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලබමියි කිව. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් කියන්නී, මම යටගිය දවස කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි මහණ වූ භික්ෂූ කෙනකුන් දැක සතුටු සිත් ඇතිව කිරිබත් පමණක් පූජා කෙළෙමි. එපමණ කුශලයෙන් මෙබඳු

සැපතක් ලදිමියි කිව. ඊට අනතුරුව අනෙක් සුරසුන්දරියක් කියන්නී, එම්බා ගන්ධර්වය, මම යටගිය දවසමිනිස් ලොව උපන් සමයෙහි පිණ්ඩපාතික සඟනමකට සකුරු පිණ්ඩයක් පූජා කෙළෙමි. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමියි කිය ඊට අනතුරුව අනෙක් සුරසුන්දරියක් කියන්නී, මම කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස් ලොවදී පිණ්ඩපාතයෙහි වඩනා සඟනමක් හට උක් දඬු කඩක් පමණ පූජාකෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමිය කිව. ඉක්බිති අනෙක්සුර සුන්දරියක් කියන්නී මම මිනිස්ලොව උපන් සමයෙහි පිණ්ඩපාතික සඟනමකහට තිඹිරි ගෙඩියක්පමණක් පූජා කෙළෙමි. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමියිකිව. ඉක්බිති අනෙක් සුර සුන්දරියක් කියන්නී මම යටගිය දවස මිනිස්ලොවදී පිණ්ඩපාතික සඟ නමක් දැක කැකිරි ගෙඩියක් පූජා කෙළෙමි. එපමණ කුශල යෙන් මබඳු සමපතක් ලදිමියි කිව. නැවත අනෙක් දෙවඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි පිණ්ඩපාතික සඟ නමක් දැක තියඹරා ගෙඩියක් පූජා කෙළමි. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමියි කිව. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි පිඬු සිගා වඩනා සඟනමක් හට වැල ඵලයක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමියි කිව. ඊට අනතුරුව අනෙක් සුරඟනක් කියන්නී, එම්බා ගන්ධර්වය, මම මිනිස් ලොව වසන සමයෙහි පිණ්ඩපාතික සඟනමක්හට බොරළු දමුණු ඵල පමණක් පූජා කෙළෙමි. එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි යි කිව. නැවත අනෙක් සුරඟනක් කියන්නී, මම මිනිස් ලොව වසන සමයෙහි භික්ෂුකෙනෙකුන් වහන්සේට ශීත නිවාරණය පිණිස හස්තප්‍රාප්තයක් දිනිමි හෙවත් අඟුරු කබලක් පූජා කෙළෙමි. එපමණ පිනින් මෙබඳු සැපතක් ලදිමියි කිව. ඉක්බිති අනෙක්සුරසුන්දරියක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි භික්ෂුන්කෙනෙකුන්ට පලා කොල මිටක් පමණ පූජා කෙළෙමි. එපමණ කුශලින් මෙබඳු සැපතක් ලදිමිය කිව. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි මඟ වඩනා එක් භික්ෂුකෙනෙකුන් දැක පුලුන් මිටක් පමණ පූජා කෙළෙමි. එපමණ පිනින් මෙබඳු සැපතක් ලදිමියි කිව නැවත අනෙක් සුර සුන්දරියක් කියන්නී මම මිනිස් ලොව වසන සමයෙහි පිඬු සිගා වඩනා සඟනමක් දැක සතුටු සිත් ඇතිව මුල පලා මිටක් පමණ පූජා කෙළෙමි. එම පිනින් මෙබඳු සැපතක් ලදිමියි කිව. අනෙක් දෙවඟනක් කියන්නී මම යටගිය දවස මිනිස්ලොව පිඬු සිඟා වඩනා සඟ නමක් දැක සතුටුව කොසඹ කොළ මිටක් පූජා කෙළෙමි, එම කුශලින් මෙබඳු සැපතක් ලදිමියි කිව. ඉක්බිති

අනෙක් සුරඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි පිඩු සිඟා වඩනා තෙරකෙනකුන්ට ඇඹුල් කැදිත්තක් පමණ පූජා කෙළෙමියි කිව. අනෙක් සුරඟනක් කියන්නී, මම මිනිස් ලොව වසන සමයෙහි පිඩුසිඟා වඩනා සඟනමක්හට තෙල් මුරුවටක් පූජා කෙළෙමියි කිව. නැවත අනෙක් සුරඟනක් කියන්නි, මම මිනිස්ලොව වසන සමයෙහි එක සඟනමක් හට කහබානක් හෙවත් සිවුරු පටියක් දිනිමියි කිව. නැවත අනෙක් සුර සුන්දරියක් කියන්නී මම මිනිස් ලොව උපන් සමයෙහි එක් සඟනමක් හට කර එල්වා පරිහරණය කටයුතුවු පටියක් පූජා කෙළෙමියි කිව. අනෙක් දෙවඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි සඟනමක්හට සිවුරුස් විජිනි පත්‍රයක් පූජා කෙළෙමියි කිව. ඉක්බිති අනෙක් සුරඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි සඟනමක්හට තල්වටක් හෙවත් තල්පතින් කළ වටාපතක් දිනිමියි කිව. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් කියන්නී, මම යටගිය දවස මිනිස්ලොවදී මොණරපිල් කළඹක් ගොතා කරනලද හෙයින් මනාවූ මොනරපිල් සාවිජිනිපතක් පූජා කෙළෙමියි කිව. නැවත අනෙක් සුර සුන්දරියක්කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි එත්කරා සඟ නමක්හට කුඩයක් පූජා කෙළමියි කිව ඉක්බිති අනෙක් දෙවඟනක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි සඟ නමක්හට සෙරෙප්පු යුගලයක් පූජා කෙළෙමියි කිව. නැවත අනෙක් සුර සුන්දරියක් කියන්නී, මම මිනිස්ලොව වසන සමයෙහි පිඩු සිඟා වඩනා සඟ නමක්හට කබලූ පූවක් පූජා කෙළෙමියි කිව. ඊට අනතුරුව අනෙක් දෙවඟනක් අතින් විචාළ සේක. ඒ දිව්‍යාඞ්ගනාව කියන්නී, යටගිය දවස මම මිනිස්ලොව වසන සමයෙහි පිඩු සිඟා වඩනා තෙරකෙනකුන්ට අඟලාවක් පූජා කෙළෙමි. එම කුශලයෙන් මෙබඳු සම්පතක් ලදිමියි කිව. ඊට අනතුරුව සතිස්වන දිව්‍යාඞ්ගනාව අතිනුදු ඈ කළ කුශල කර්‍මය පෙරසේම විචාළ සේක. ඒ දිව්‍යාඞ්ගනාව කියන්නී, ගුත්තිල පණ්ඩිතයෙනි මම මිනිස්ලොව වසන සමයෙහි කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි පැවිදිවූ භික්‍ෂු කෙනෙකුන්වහන්සේ දැක පහන් සිත් ඇතිව සකබලික නම් කැවිලි විශේෂයක් පූජා කෙලෙමි. එම කුශල කර්‍මය හෙතුකොටගෙන මේ සියලුඓශ්වර්‍ය්‍ය සම්පත්තියක් ලදිමියි කිව මෙසේ ඒ දිව්‍යාඞ්ගනාව යටගිය දවස ඈ විසින් කරනලද සුචරිත කර්‍මය ප්‍රකාශකොට කී කල්හි විශේෂයෙන් සතුටුව ප්‍රකාශ කරන්නාවූ මහබෝසතාණෝ.

සවාගතං වත මෙ අජ්ජ සුප්පභාතං සුවුට්ඨිතං,
යං අද්දසං දෙවතායො අච්ඡරා කාම වණ්ණියො.
ඉමාසාහං ධම්මං සුත්වා කාහාමි කුසලං බහුං.

දනෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච,
සචාහං තත්‍ථ ගමිස්සාමි යත්‍ථ ගන්‍ත්‍වා න සොචරෙ

යනුහෙයින් අද මා විසින් මේ දිව්‍යලොකයට ආ ගමනත් ඉතා යහපත, අද මේ රාත්‍රියත් යහපත් වැඩක හැසිරීමෙන් අතික්‍රාන්තවිය. මෙලෝ පරලෝ දන්නා රූපශ්‍රී ඇති දිව්‍යාඞ්ගනාවන් දැකීමෙක් ඇද්ද, ඒ දැකීමත් යහපත් වන්නේය. කුශලකර්‍ම ඵල ප්‍රත්‍යක්‍ෂකිරීම් වශයෙන්ම සතුටු සිත් ඇත්තාවූ මම මිනිස් ලොවට ගොස් අප්‍රමාදව ප්‍රාණසාතාදීවූ දශවිධ අකුශලයෙන් දුරුව දන්දීම ආදීවූ දශවිධ කුශල කර්‍මයෙහි පිහිටා කුසල් කෙරෙමියි කියා කුශලකර්‍ම ඵල ප්‍රත්‍යක්‍ෂයෙන්ම දැන සිත එකඟවූ බව ප්‍රකාශකොට, මේ දිව්‍ය භවනයට ආගමන සාර්‍ථක විය යි කීසේක. ඉක්බිති ගුත්තිල පණ්ඩිතයෝ නැවත මිනිස් ලොවට ගොස් කියනලද ක්‍රමයෙන් දිවිහිමියෙන් කුශල්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගිය සේක.

"මෞද්ගල්‍යායන ස්ථවිරය, ගුත්තිල පණ්ඩිතව උපන්නෙම් දැන් මේ ලොවුතුරා බුදුවූ මම්ය"යි වදරා "කාශ්‍යප බුදුන්ගේ බුඩොත්පාදය පටන් මාගේ මේ බුඩොත්පාදය දක්වා දෙව් ලොවම සැරිසරන්නාහු කියනලද විමන්වල සැප විඳිනවුන් දැක තොප විසින් විචාරන ලදුව ප්‍රකාශකොට කිවාහුය. දැන් තොප විසින් විචාරණ ලදුව ප්‍රකාශකොට කිවාහුම නොවෙයි. මා විසිනුදු ගුත්තිල පණ්ඩිතව උපන් සමයෙහිද විචාරන ලදුව තොපට කීවා සේම වෙන වෙනම ප්‍රකාශකොට කීවාහුම වේදැ"යි විචාරා මේ ගුත්තිල විමාන වස්තු දෙශනාව ගෙනහැර දක්වා වදළසේක. වත්‍ථුත්තම දයිකා විමානය පටන් සක්ඛලිදයිකා විමානය දක්වා වෙන වෙනම වර්‍ණනාකරන ලද කුශල කර්‍මයන් මුගලන් මහ තෙරුන් වහන්සේ ප්‍රකාශකොට කීවා සේ පළමු කොට ගුත්තිලාචාරින්ට කී හෙයින් ගුත්තිල විමානයයි කියා සංගීති කාලයෙහි සංග්‍රහවට නැගූ පමණක් විනා ඒ විමානයන් ඒ ඒ දිව්‍යාඞ්ගනාවන් සන්තකමය. සංගිතිකාරක මහා ස්ථවිරයන් විසින් ගුත්තිල විමාන නම්විය. ඒ දිව්‍යාඞ්ගනාවෝ සතිස් දෙන වනාහි කාශ්‍යප බුදුන්ගේ බුඩොත්පාද කාලයෙහි පටන් කුශල කර්‍ම නැවත සිහිකිරීම් වශයෙන් උපදනා ප්‍රිතිචිත්තයෙන් කාලක්‍රියා කොට දිව්‍යලොකයෙහිම ඉපිද දෙවන ආත්ම භාවයෙහි පටන් එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි දෙව්ලොවම සැරිසන්නාහු අප බුදුන් කාලයෙහිද තවුතිසා භවනයෙහි එක තැන පිහිටි සතිසක් දිව්‍ය විමානවල ඉපද දස දහසක් දෙවඟනන් පිරිවරා දිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කරන්නාහුය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ දිව්‍යාඞ්ගනාවන් දැක ඔවුන් විසින් පූර්‍වජාතියෙහි කරනලද කුශල

කර්‍මයන් විචාරනු කැමතිව යට ගුත්තිල පණ්ඩිතයන් විචාළ සේම විචාළසේක. ඔවුන් විසිනුදු ගුත්තිල පණ්ඩිතයන් කාලයෙහි ප්‍රකාශකොට කීවාසේම මුගලන් මහ තෙරුන් වහන්සේට වෙන වෙනම ප්‍රකාශකොට කීවාහුයයි දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පාරිච්ඡත්තක වර්‍ගයෙහි
**ගුත්තිල විමාන වස්තු වර්‍ණනාව** කියා නිමවන ලදී.

## 34. දද්දල්ල විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තෙවෙනි පාරිච්ඡත්තක වර්‍ගයෙහි සයවැනිවූ දද්දල්ල විමාන වස්තුව නම් කවරයත්:-
එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු කෙසේද?

භාග්‍යවත් බුදුරජාණන් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නාල නම් ගම එක්තරා කෙළෙඹි පුත්‍රයෙකුගේ භද්‍රාය සුභද්‍රායයි දියණියන් දෙදෙනෙක් වූහ. උන් දෙදෙන එක පුරුෂයකුට සරණ ගොසින් වසන්නාහුය. ඔවුන් අතුරෙන් භද්‍රාව නිරන්තරයනේ දන් දෙන්නීය. එක් දවසක් තමන් නැගණිවූ සුභද්‍රාවටත් දන්දීමෙහි අනුසස් කියමින් අවවාද කෙළේය. එකල සුභද්‍රාවද යහපතැයි කියා භද්‍රාවගේ වචනය පිළිගෙන රේවත මහතෙරුන් වහන්සේ ඇතුළුව අට දෙනෙකුන් වහන්සේ වඩා හිඳුවා සාංඝික කොට දනයක් දුන්නීය. ඒකුශලයෙන් සුභද්‍රාව නිර්‍මාණරතී නම් දිව්‍යලොකයෙහි උපන්නීය. සුභද්‍රාව තමන්ගේ සම්පත් දැක භද්‍රාව උපන් තැන් බලා ශක්‍රයාට පරිචාරිකාව උපන් බව දැක භද්‍රාවගේ විමානයට ගොස් දිළිහි දිළිහී සිටියාය. භද්‍රාව සුභද්‍රා නම් දිව්‍යාඞ්ගනාව දැක, " මේ දෙව්ලොව දෙවියන් වඩා ශරීර වර්‍ණයෙන් බබලන්නාවූතී කවුරුද?"යි විචාළාය. එකල්හි සුභද්‍රාව කියන්නී "පෙර මිනිස් ලොව උපන් සමයෙහි එක් පුරුෂයකුට භාර්‍ය්‍යාව විසූවාවූ සුභද්‍රා නම් වූ තොප නැගණියෝ නම් මමය. නිර්‍මාණරතී නම් දෙව්ලොව උපන්මි"යි කිව. "කවර කුශලයකින් නිර්‍මාණරතිදෙව්ලොව උපන්නීද?"යි විචාරණ ලදුව සුභද්‍රාව කියන්නී පෙර මම සඟ අටනමකට සාංඝික දනයක් දුන්නෙම්ද ඒ කුශලයෙන් මෙබඳු දිව ඉසුරක් ලදිමි"යි කිව ඒ භද්‍රාව විචාරන්නාහු. " මා බොහෝ සේ දන් දී හීනවූ තවුතිසා දෙව්ලොව උපදින්ටත් තොප එක් දවසක් දන් දී නිර්‍මාණරතී දෙව්ලොව උපදින්ටත් කාරණ කවරේදැ?"යි විචාළාය. එකල සුභද්‍රාව කියන්නී, මම සාංඝිකය දුන් හෙයින් නිර්‍මාණරතී

දෙව් ලොව උපන්මි. තෝ පුද්ගලික කොට දුන් හෙයින් හීනවූ තවුතිසා දෙව්ලොව උපන්නෙහිය'යි කියා සාංඝික දනය මහානිසංස බව ප්‍රකාශකොට ගියාය. ශක්‍රයා ඒ දිව්‍යාඞගනාව කථා කොට ගියා දැක භද්‍රාව අතින් මෙසේ විචාළේය. භද්‍රාව ඒ සියල්ලම ශක්‍රයාට කිව. ශක්‍රයෝ ද මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා දැක ඒසියල්ලම පවත් තෙරුන් වහන්සේට කීහ. මහතෙරහු මිනිස්ලොවට වැඩ ඒ සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අත්‍ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්‍මදේශනාව බොහෝදෙනාට සාත්‍ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පාරිච්ඡත්තක වර්‍ගයෙහි
**දද්දල්ල විමාන වස්තු වර්‍ණනාව** දන පරිච්ඡේදයෙහි විස්තර
වශයෙන් හෙළබසට නැගූ බැවින් මෙතන්හි ග්‍රන්‍ථ
බොහෝවන නිසා සංක්‍ෂෙපයෙන් කියා නිමවන ලදී.

## 35. සේසවතී විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තෙවැනි වූ පාරිච්ඡත්තක වර්‍ගයෙහි සත්වැනි **සෙසවතී විමාන වස්තුව** නම් කවරයත්? එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු.

ත්‍රිපදෙත්තමවූ බුදුරජාණන් සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මගධරට නාලක නම් ගමෙක් විය. ඒ ගම එක්තරා සිටු පුත්‍රයක්හුගේ සෙසවතී නම් යෙහෙළියක් ඇත්තීය. ඒ කුමාරිකා වනාහි යටගියදවස කරනලද කුසල් ඇතිහෙයින් මහ පින් ඇතිවූවාය. ඒ කෙසේද යත්? 'යටගිය දවස කාශ්‍යප බුදුන්ගේ ශ්‍රී ශරීරය ආදහන කළ තැන එක ඝනවූ ධාතු වසා රුවන් දගබ කරන කල්හි මේ සෙසවති කුමාරිකා ළදරු කුමාරිකාවක්ව මෑණියන් හා සමග ඒ චෛත්‍යස්ථානයට ගිය තැනැත්ති රන් උළු කර්‍මාන්ත කරන්නවුන් දැක මෑණියන් අතින් විචාරන්නී, මෑණියෙනි, මොහු කුමක් කෙරෙද්දැ?යි විචාළීය එකල මෑණියෝ කියන්නාහු, දියණියෙනි, මේ දගැබ බඳනා පිණිස රන් උළු වැඩ කරවතියි කීහ. එකල්හි ඒ පවත් අසා ඒ කුමාරිකාව සතුටු සිත් ඇතිව, මෑණියෙනි, මගේ කර පළඳනා ලද මේ ස්වර්‍ණමයවූ කුඩා පළඳනා වක් ඇත. මේ පළඳනාව දගැබ පිණිස දෙමිය කිවාය. මෑණියෝ එබසට, යහපත දෙවයි කියා පළඳනාව කරින් ගලවා මේ කුමාරිකාව විසින් දෙනලද පළඳනාව

මේ රණෙහි බහා, උළුකැටක් කරවයි කියා සවණීකාරයා අතට දුන්නාහු. සවණී කාරයා කී ලෙසම කෙළේය. ඒ කුමාරිකාව එයින් අපරභාගයෙහිකාලක්‍රියා කොට එම කුසලයෙන් දිව්‍ය ලොකයෙහි ඉපිද නැවත නැවතත් සුගතියෙහිම සැරිසන්නී අප බුදුන් සමයෙහි නාලක නම් බමුණු ගම උපන්නි අනුක්‍රමයෙන් දෙලොස් හැවිරිදි වයසට පැමිණියාය. එක් දවසක් මෑණියන් විසින් තෙල් ගෙනෙවයි කියා මිළදී යවන ලද්දි මිළගෙන එක්තරා සල්පිලකට ගියාය ඒ සල්පිල එක්තරා කෙළඹි පුත්‍රයෙක්, පියාණන් විසින් නිධාන්කොට තබන ලද රන් රිදීමුතු මැණික් රත්නයන් ගොඩනගමියිසිතා ඒ හිරණ්‍ය සවණීාදියගන්නා පිණිස ගොඩ නගන්නේය. ඒ ආපණිකයා ඔහුගේ කම්බලයෙන් කැට කැබිලිති ගල් බොරළු සේ නැගෙන්නා දැක මහත් සංවේගයට පැමිණ එක් දවසක්, පින්වත් කෙනෙකුන් නිසා වත් රිදී ආදිය සේ වේදේහෝයි සිතා විමසනුපිණිස සල්පිල රැස්කොට තුබුයේය. එසමයෙහි තෙල් පිණිස මිළ ගෙන ගියාවූ ඒ සෙසවති කුමාරිකාව මහත්රුවන් ගොඩ දැක, කිමෙක්ද? පින්වත, රන් රුවන් මෙසේ අනාථයේ දමන්නෝ ඇද්ද? මනාකෙට සඟවා තිබිය යුතු නොවේදැ?යි කිව කෙළෙඹි පුත්‍රයා එබස් අසා, මේ කුමාරිකාව මහ පින් ඇත්තිය. මේ කුමාරිකාවගේ පුණ්‍ය මහිමයෙන් අපගේ මේ සියළු වස්තුව රන් රුවන් ව ගියේ නම් අපට මහත් අභිවෘධියෙක මේ කුමාරිකාව මපුතුනුවන්ට සරණ පිණිස කැඳවාගෙන එමියි සිතා ඇගේ මෑණියන් සමීපයට ගොස්, නැගිණියනි, තොප දියණිවූ සෙසවතී මපුතනුවන්ට සරණ පිණිස දෙවයි කියා වළක්වා මෑණියන්ට බොහෝ වස්තු දී ආවාහ විවාහ කොට ඒ කුමාරිකාව ශීලාචාර ගුණ ඇති බව දැන භාණ්ඩාගරයෙහි දෙර හරවා කැට කැබිලිති ආදිය සේ තුබු වස්තුරැස දක්වා, දියණියෙනි, කුමක් පෙනේද?"යි විචාරා, මේ ගෙයි රැස්කොට තබනලද රන් රුවන් රැස දකිමියි කීකල, මේ සියල්ලම අපගේ කම් බලයෙන් අන්‍යධීනවූ වස්තුය. තීගේ කුල විපාක වශයෙන් ප්‍රකෘතිමත්ව රන්රුවන් විශේෂවිය. එබැවින් මෙතැන් පටන් මෙ ගේ සියල්ලම තී සන්තකය, තීම රකුව, තී විසින් දෙනලද දෙයක් ම අපි අනුභව කරම්හයි කියා ඒ සියලූම සම්පත් සෙසවතිය සන්තකයයි කියා ව්‍යවහාර කළහ.

"එසමයෙහි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ, මාගේ මවු රූපසාරිනම් බ්‍රාහමණ දෙවින්ට මා ලත් නිවන් සම්පත් පොෂාවණීක මිළ කියා ඒ පිණිස දී පිරිනිවන් පාමියි සිතා බුදුන් කරා එළඹැ උපන් ගෙයිදී පිරිනිවන් පානට අවසර ගෙන බුදුන්ගේම අනුමතියෙන්

අනෙකවිධ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා නොයෙක් ස්තුති සහස්‍රයෙන් බුදුගුණ කියා ස්තුතිකොට බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට දර්‍ශන විෂයවනතාක් තැන් පටන් බුදුන්ට අභිමුඛව ගොස් මුවහවන තැන සිට පසඟ පිහිටුවා වැඳ භික්ෂු සංඝයා පිරිවරා විහාරයෙන් නික්ම භික්ෂු සංඝයාට අවසර දී ආයුෂ්මත් අනඳමහ තෙරුන්වහන්සේ අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්‍මදෙශනාවෙන් අස්වසා සිවුවනක් පිරිස අතුරෙන් නිත්‍ය පරිවාර පන්සියයක් සංඝයා පිරිවරා අනුක්‍රමයෙන් නාලක නම් ගමට පැමිණ මෑණියන් සොවාන් ඵලයෙහි පිහිටුවා එදවස් අළුයම් වේලෙහි මහත්වූ පවනින් නිවීගිය මහාප්‍රදීපයක් මෙන් උපන් ගෙයිදී පිරිනිවන් පා වදාළ සේක. එසමයෙහි සැරියුත් ස්වාමීන් පිරිනිවි පවත් අසා දිව්‍යබ්‍රහ්මයන් සහ මනුෂ්‍යයෝ රැස්ව ශරීර සත්කාර වශයෙන් සත් දවසක් මුළුල්ලෙහි ගඳ දුම්මල් පහන් ආදී නොයක් පූජා පෙළහරින් දවස් යැවූහ. ඉක්බිති අගරු චන්‍දනාදියෙන් සියක් රියන් පමණ දර සෑයක් කළාහුය. ඒ සෙසවතී කුමාරිකාවද මහ තෙරහු පිරිනිවන් පා වදාළ බව අසා ඒ ස්ථානයට ගොස්, සියතින් ගඳ දුම්මල් පහන් ආදියෙන් පුදමියි රන්මල් රිදී මල්ද අනෙකුදු නොයක් මල් හරිචන්‍දනාදී නොයෙක් සුවඳ කරඬුද ගෙන්වාගෙන යනු කැමතිව මයිලනුවන් විචාරා ඔහු විසින්, තෝ බැරැරුම් ඇත්තෙහිය. එතැන්හි බොහෝදෙනාගේ රැස්වීමෙන් ජනසම්බාධ ඇත්තේය. ගඳ දුම්මල් පහන් ආදී පූජා භාණ්ඩ යවා මෙහිම වසවයි කියා වලක්වමින් සිටියදී ශ්‍රද්ධා ඇති බැවින් නොපසුබට වීර්‍ය්‍ය ඇතිව, ජීවිත විනාශයට යේ නමුදු ගොසින්ම පූජා සත්කාර කෙරෙමියි කියා මයිලනුවන් කී බස් නොගිවිසා පිරිවර හා සමග පූජා භාණ්ඩ ගෙන්වාගෙන ගොස් ගන්ධ පුෂ්පාදීන් පූජා කොට දෙහොත් මුදුන්දී වැඳ සිටියාය. එසමයෙහි තෙරුන්වහන්සේ ශරීර පූජාවට ආවාවූ පිරිස් අතුරෙන් මදයෙන් මත්වූ ඇතෙක් ඒ ස්ථානයට දිව අයේය. ඔහු දැක මනුෂ්‍යයන් මරණ භයින් තැතිගෙන දිවන කල මහත් ජන සම්මර්‍දනයෙන් වැටී හුන් සෙසවතී කුමාරිකාවන් ඇඟ පිටට මනුෂ්‍යන් පැණ පෑගී මිරිකී මැරුණිය. ඒ කුමාරිකාව ශ්‍රද්ධා සම්පන්නව කර්‍මඵල අදහමින් පූජා සත්කාර කොට තෙරුන් වහන්සේ කෙරෙහි චිත්තප්‍රසාද වශයෙන් කරනලද කුශල කර්‍මය හෙතුකොටගෙන කාලක්‍රියා කොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නිය පරිවාර ස්ත්‍රීහුද දහසක් පමණ වූහ. උපන් කෙණෙහිම ඒ දිව්‍යාඞ්ගනාව ඇගේ දිව්‍ය සම්පත් බලා, කවර කුශලකර්‍මයක් හෙතුකොටගෙන මා විසින් මෙබඳු සම්පත්තියක් ලබන ලදදැ?යි ඇගේ කුශල කර්‍මය පරීක්ෂාකරන්නී තෙරුන් වහන්සේට කරනලද පූජා සත්කාරයත් එයින් ජනිත වූ ඉෂ්ට විපාකයත් දැක රත්නත්‍රය කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූ සිත් ඇතිව සැට ගැලක් පුරාලන

පමණ සර්වාභරණයෙන් සැරහී දහසක් දෙවඟනන් පිරිවරා චන්ද්‍රසූර්‍යයන්සේ මහත් දිව්‍යානුභාවයෙන් දිළිහී දිළිහී දසදිග් ඒකාලොක කෙරෙමින් විමානය හා සමග බුදුන් දක්වන පිණිස මිනිස් ලොවට අවුත් විමානයෙන් බිමට බැස බුදුන් කරා එළඹැ නමස්කාරකොට දෙහොත් මුදුන් දී එකත්පස්ව සිටියාය. එසමයෙහි වඞ්ගීස මහ තෙරුන් වහන්සේ බුදුන් සමීපයෙහි සිටිසේක් බුදුන්ට නමස්කාර කොට, ස්වාමීනි, මේ දිව්‍යාඞ්ගනාව මෙබඳු සම්පත් ලැබීමට කරනලද කුශලකර්මය විචාරන්ට අවසර දෙන සේක්වායි කීසේක. එසඳ බුදුහු වඞ්ගීස ස්ථවිරය, පිළිවිසවයි වදාළ සේක. ඒ දිව්‍යාඞ්ගනාව කරනලද කුශලකර්මය විචාරණු කැමතිව වඞ්ගීස මහ තෙරහු පළමුකොට ඇගේ සම්පත් ප්‍රකාශ කරන සේක්,

"පලික රජත හෙමජාල ජන්නං
විවිධ විචිත්‍ර තලමද්දසං සුරම්මං,
ව්‍යම්හං සුනිම්මිතං තොරණූප පන්නං
රුචකුපකිණ්ණමිදං සුභං විමාන,
භාති ච දසදිසා නොභෙ සූරියො
සරදෙ තමොනුදෙ සහස්සරංසි,
තථාතපතිමිදං තව විමානං
ජලම්ව ධූමසිඛො නිසෙ නභගෙ,
මුසතීව නයනං සතෙරතාව
ආකාසේ ඨපිතමිදං මනුඤ්ඤං
විණාමුරජසම්මතාළඝුට්ඨං
ඉද්ධං ඉන්දපුරං යථා තවෙදං

යනාදි ගාථාවන්ගෙන් විමාන වර්ණනාකොට , බහලාන්ධ කාර විධ්වංසනය කොට ආකාශයෙහි බබලන්නාවූ සූර්‍ය මණ්ඩලය සේ බබලන්නාවූ මේ විමානය ඇතුළුව මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලැබීමට තී පූර්ව ජාතියෙහි කළාවූ කුශල කර්මය කවරේද?යි විචාරා වදාළසේක. මෙසේ වඞ්ගීස මහ තෙරුන්වහන්සේ විසින් විචාරණලද පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මෙසේ කීව.

යථා ච මෙ අධිගතමිදං විමානං
කොඤ්ච මයූර චකොරසඞ්ඝචරිතං:
දිබ්බපිලව හංසරාජචිණ්ණං
දිවිජකාරණ්ඩ ච කොකිලාභි නදිතං.

නානාසනතානක පුප්ඵ රුක්ඛ විවිධා
පාටලිජම්බු අසොකරුක්ඛවනන්තං.
යථා ච මෙ අධිගතම්දං විමාන
තන්තෙ පවදිස්සාමි සුණොහි භන්තෙ.
මගධවර පුරත්ථිමෙන
නාලකගාමො නාම අත්ථි භන්තෙ,
තත්ථ අහොසිං පුරෙ සුණිසා
සෙසවතීති තත්ථ ජානිංසු මමං.
සාහං අපචිතත්ථ ධම්ම කුසලං
වෙමනුස්ස පූජිතං මහන්තං,
උපතිස්සං නිබ්බුතං අප්පමෙය්‍යං
මුදිතමනා කුසුමෙහි අබ්භොකිරිං,

යනාදීන්, වර්ණනීයවූ කොංචාමයුරාදි පක්ෂිසමූහයා විසින් ගැවසී ගත්තාවූ පිපී වැනීගිය මලින් ගැවසි ගත්තාවූ සල් පළොල් ආදී නොයක් දිව්‍ය වෘක්ෂාදියෙන් ශොභාමත්වූ මාගේ උයන් විමන් ආදී මේ සියලු සම්පත් ලැබීමට කරනලද කුශලකර්මය ප්‍රකාශ කෙරමි. අසා වදාළ මැනව, ස්වාමීනි, ජය ශ්‍රී මහා බෝධින්වහන්සේට නැගෙනහිර දිග මගධරට නාලක නම් ගමෙක් ඇත. ඒ ගම එක්තරා කෙළඹිපුත්‍රයෙකුට යෙහෙළිව සෙසවතී කුමාරිකාවයයි ප්‍රසිඬව විසීමි එසමයෙහි දම් සෙනෙවි සැරියුත් මහ තෙරුන්වහන්සේ පිරිනිවන් පෑ තැනට ගොස් මළ ශරීරයට ස්වර්ණ මල් හා සුවඳ මල් ආදියෙන් පූජා කෙළෙමි. එපමණ කුශලය හෙතුකොට ගෙන මෙබඳු සම්පත්තියක් ලදිමි'යි කිව. මෙසේ වංගීස මහ තෙරුන්වහන්සේ විසින් විචාරනලද වචනය මුදුනෙන් පිළිගෙන ඒ දිව්‍යාඞ්ගනාව විසින් කියනලද වචනය අර්ථොත්පත්තිකොටගන එතැන්හි පැමිණි පිරිසට බුදුරජාණන්වහන්සේ ධර්ම්ම දෙශනාකොට වදාළසේක. ඒ ධර්ම්මදේශනාව දිව්‍යාඞ්ගනාවට හා බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පාරිච්ඡත්තක වර්ගයෙහි
**සෙසවතී විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

# 36. මල්ලිකා විමාන වර්‍ණනාව

තව ද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පාරිච්ඡත්තකවර්‍ගයෙහි **අටවන මල්ලිකා විමාන වසතුව** නම් කවර යත්:

සර්‍වලොකෙකනායකවූ බුදුරජාණන්වහන්සේ දම්සක් පැවැතුම් සූත්‍රදෙශනාවෙහි පටන් පරිනිර්‍වාණ මඤ්චකයෙහි දී සුභද්‍ර නම් පරිබ්‍රාජකයා විනයනය කොට වදාළ ධර්‍මදේශනාව දක්වා සියලු බුඬකෘත්‍යයන් කොට නිමවා කුසිනාරානුවර මල්‍ලරාජයන්ගේ උපවර්‍ත නම් සල් උයනෙහි දී වෙසක් මස පුර පසළොස්වක් ලත් අඟහරුවාදා විසා නකතින් අලුයම් වේලෙහි පිරිනිවන් පා වදාළ කල්හි දිව්‍යමනුෂ්‍යයෝ බුදුන්ගේ ශ්‍රී ශරීරයට පූජා කරන්නට පටන් ගත්තාහුය. එසමයෙහි බන්ධුල සෙනාධිපතින්ගේ භාර්‍ය්‍යාව වූ මල්‍ලරජ්ජුරුවන් දූ වූ මල්ලිකා නම් ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් කුසිනාරා නුවර වසන්නී විශාඛා මහඋපාසිකාවගේ මේල පළඳනාව වැනි වූ තමන්ගේ මේල පළඳනාව සුවඳ දියෙන් සෝධා දුහුල් සුඹුළුවකින් බැඳ අනිකුදු පූජා කටයුතු වූ බොහෝ වූ ගඳ දුම්මල් පහන් ආදියත් ගෙන ගොස් බුදුන්ගේ ශරීරයට පූජා කළාය මේ මෙහි සංක්‍ෂෙපය වන්නේය. විස්තර කථාව රත්නාවලී නම් දම්පියා අටුවා කථාවෙහි ප්‍රකාශ වූයේය. ඒ බන්ධුල මල්ලිකාව එයින් පසු නොබෝ දවසෙකින් කාලක්‍රියා කොට ඒ කුශලය හේතුකොටගෙන තව්තිසා දිව්‍යලොකයෙහි මහත් වූ රන් විමනෙක උපන්නීය. ඒ රත්නාභරණ පූජානුභාවයෙන් සත්රුවනින් නිර්මිත වූ උදර වූ විමානාදියෙන් හා විශේෂයෙන් ම සිඞගිසවර්‍ණයෙන් නිර්මිත වූ උද්‍යාන විමාන වස්ත්‍රාභරණ මාලාදියෙන් නික්මෙන්නා වූ රන්වන් රැසින් රන්රසධාරා ඉසින්නා සේ ඒකොභාස කෙරෙමින් දිලියෙන්නා වූ සෙස්සන් විසින් සාධාගත නොහැක්කා වූ උදරතර වූ දිව්‍යසමපත්තියෙක් පහළ වීය. එකල්හි ආයුෂ්මත්වූ නාරද මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ විමානය සමීපයට වැඩිසේක. ඒ දිව්‍යාඞගනාව ද තෙරුන්වහන්සේ දැක උන්වහන්සේ කරා එළඹ නමස්කාර කොට දෙහොත් මුදුන් දී වැඳ එකත්පස්ව සිටියාය. එකල්හි තෙරුන් වහන්සේ ඒ දිව්‍යාඞගනාව විසින් පූර්‍වජාතියෙහි කරනලද කුශල කර්‍මය මෙසේ වදාළසේක.

"පීතවත්ථෙ පීතධජෙ - පීතාලඞකාර භූසිතෙ,
පීතන්තරාහි වග්ගුහි - අපිළන්ධාව සොභසි-පෙ"

යනු හෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, තී කවර දිව්‍ය නිකායක උපන්නීද? තීගේ රූපශ්‍රී සමපත්තිය කිසියම් පළඳනාවක් නැත්තේ නමුදු ශරීර ශොභාවෙන් දිප්තිමත් වෙයි. එබඳු ශ්‍රී ශරීරයෙහි රන්වන් වස්ත්‍රයක් හැඳ රන්වන් වස්ත්‍රයක් එකාංශ කොට ස්වර්ණමය වූ නොයෙක් ආභරණ යෙන් සැරහී විශේෂයෙන් බබළන්නීය. මුතුමැණික් ආදී නෙයෙක් රත්නයෙන් නිර්මිත වූ කර්ණාභරණ ග්‍රීවාභරණ හස්තපාදාභරණාදී නොයෙක් ආභරණයන් අතුරෙන් සමහරෙකින් හංසස්වරනාද වැනි නාද ඇසෙයි. සමහරෙකින් මයුර ස්වර කුරවික නාද මෙන් ද පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද මෙන් ද යහපත් වූ මනහර මිහිරිනාද ඇසෙයි. මෙසේ අනෙකප්‍රකාර දිව්‍යාභරණයෙන් සැරසී මුදුනෙන් රන් ධජ නඟා සත් රුවනින් නිර්මිත වූ රථවිමානාරූඪව රන් රුවනක් සේ බබළන්නා වූ එම්බා දිව්‍යාඞ්ගනාව, තී මෙබඳු දිව්‍යශ්‍රීසුරුක් ලැබීමට පූර්වජාතියෙහි කරනලද කුශල කර්මය කවරේදැ"යි විචාළසේක. එකල්හි ඒ පැනය විසඳන්නා වූ දිව්‍යාඞ්ගනාව මෙසේ කිවාය.

"සොවණ්ණජාලං මණිසොණ්ණචිත්තං
මුත්තාචිතං හෙමජාලෙන ඡන්නං,
පරිනිබ්බුතෙ ගොතෙමෙ අප්පමෙය්‍යෙ
පසන්නචිත්තා අහමභිරොපයිං-පෙ"

යනුහෙයින්, "හිස පටන් පාදන්තය දක්වා සියලු ශරීරය රන් දැලින් වසනලදුව ග්‍රීවාභරණ හස්තාභරණ පාදාභරණාදී වශයෙන් ඒ ඒ තන්හි අලඞ්කාර පිණිස මුතු මැණික් ආදී නොයක් රත්නයෙන් විසිතුරු කරනලද මේල පළඳනා නම් ආභරණ විශේෂයක් ගෙනගොස් පහන්සිත් ඇතිව පිරනිවන් පා වදාළ ගෞතම බුදුන්ගේ ශරීරයට පූජා කෙළෙම් ඒ කුශල කර්මය හේතු කොටගෙන මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලදිමි"යි කිව. එකල්හි ආයුෂ්මත් වූ නාරද මහතෙරුන් වහන්සේ ඒ දිව්‍යාඞ්ගනාවට බණ වදරා මිනිස් ලොවට වැඩ ධර්මසංගායනා කරන්නා වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති මහාසංඝයාට කීසේක. එකල්හි මේ විමාන වර්ණනාව ද විමාන වස්තු දෙශනාවට අන්තර්ගත කොට සංගායනා කළාහුය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි **අටවන මල්ලිකා විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදි.

# 37. විසාලක්ඛි විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි නවවන විසාලක්ඛි විමාන වස්තුව නම් කවරයත්:-

සකල ගුණ නිධානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළකල්හි අජාසත් රජ්ජුරුවෝ තමන් විසින් ලබන ලද බුදුන්ගේ ශරීරධාතු මහත් පූජා පෙරහරින් නුවරට වඩාගෙන ගොස් රජගහනුවර දගැබක් කරවා පූජාසත්කාර කරති. එසමයෙහි රජගහනුවර වසන්නාවූ එක්තරා මාලාකාරයකුගේ දූ වූ සොවාන් ඵලයෙහි පිහිටියාවූ ආර්‍ය්‍යශ්‍රාවිකාවූ සුනන්‍දා නම් උපාසිකාවක් ඇත්තිය. ඒ උපාසිකාව තමන්ගේ පියාණන්ගේ ගෙයින් පළඳනා පිණිස එවනලද සුවඳ මල් හා සඳුන් සුවඳ කස්තුරිකා දී වූ සුවඳ බඩුද දවස්පතා ගමන් කරවා දගැබට පූජාකළාය. පොහෝ දිනයෙහි තොමෝ ගොස් ස්‍වහස්‍තයෙන් පූජාකෙරෙව්වාය. ඒ උපාසිකාව එයින් පසු එක්තරා රෝගයකින් පෙළී කාලක්‍රියාකොට ශක්‍රදෙවේන්‍ද්‍රයාට පරිචාරිකාව උපන්නිය. එකල්හි එක් දවසක් ශක්‍රදෙවේන්‍ද්‍රයන් හා සමග උයන්කෙළිපිණිස චිත්‍රලතා වන නම් උයනට ගියාය. ඒ උයනෙහි අනෙක් දේවතාවන්ගේ ශරීර ප්‍රභාවෝ මල් ආදියෙහි රැස් වැදගැන්මෙන් විසිතුරුව වර්ණයෙන් බබළන්නාහුය. මේ සුනන්‍දා නම් දිව්‍යාඞ්ගනාවගේ ශරීර ප්‍රභාව වනාහි අවශේෂ වස්ත්‍රාභරණ මාලාදියෙහි රැස් වැදීමෙන් අනෙක් වර්ණයකට නොපැමිණ ඇගේම ශරීරප්‍රභාවෙන් දශදිග් බබුළුවමින් සිටියාය. ශක්‍රදෙවේන්‍ද්‍රයෝ ඒ දිව්‍යාඞ්ගනාව දැන සතුටුව ඒ දිව්‍යාඞ්ගනාව විසින් පූර්වජාතියෙහි කරනලද කුශල කර්මය දැනගනු කැමතිව මෙසේ විචාළෝය.

"කා නාම ත්වං විසාලක්ඛි රමෙම චිත්තලතා වනෙ,
සමන්තා අනුපරියාසි නාරීගණපුරක්ඛතා.
යද දෙවා තාවතිංසා පවිසන්ති ඉමං වනං,
සයොග්ගා සරථා සබ්බෙ චිත්‍රා හොන්ති ඉධාගතා-පෙ-"

යනුහෙයින්, "විපුලවූ නෙත්‍ර යුගලයක් ඇත්තාවූ එම්බා භද්‍රාව, තී මීට පූර්වජාතියෙහි කවර නම් ඇත්තියක් වූයෙහිද? කවර කුශලයක් කොට මේ දෙව්ලොව උපන්නෙහිද? යම් කලෙක්හි දෙවතාවෝ උයන්කෙළි පිණිස මේ චිත්‍රලතා නම් උයනට ප්‍රවෙශ වන්නාහුද, මේ චිත්‍රලතා වන නම් උයනට පැමිණි යාවූ ඒ දෙවතාවන්ගේ ශරීර ප්‍රභාව හා වස්ත්‍රාභරණ මාලාවන් හා රථාශ්වාදී සියල්ලම මේ උයන්හි අනෙක ප්‍රකාර මල්වල

රැස් වැදීමෙන් නොයෙක් විසිතුරු වර්ණවෙති. මේ උයනට පැමිණියාවූ තීගේ ශරීරප්‍රභාවෝ විකාර වර්ණයකට නොපැමිණෙන ස්වභාලීලාවෙන් ජොතිමත්ව බබලන්නීය. තී පූර්වජාතියෙහි කළාවූ කුශලය ප්‍රකාශකොට කියව´යි කීහ. මෙසේ ඒ ශක්‍රදෙවෙන්‍ද්‍රයා විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනාතොමෝ මෙසේ ප්‍රකාශකළාය.

"අහං රාජගහෙ රමෙම සුනන්‍දනාමුපාසිකා,
සද්ධාසීලෙන සම්පන්නා සංවිභාගරතා සදා
අච්ඡාදනං ච භත්තං ච සෙනාසනපදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.

යනාදීන් දක්වනලද හෙයින්, "දෙදෙව්ලොවට අධිපතිවූ සක්දෙව් මහරජාණන්වහන්ස, මම මීට පෙරජාතියෙහි සිත්කළුවූ රජගහනුවර මාලාකාර දූ සුනන්‍ද නම් උපාසිකාවක් වීමි. එසමයෙහි මම දන්දීමෙහි ඇලුම් ඇතිව ශ්‍රද්ධාසම්පන්න හෙයින් ප්‍රසන්න වූ සිත් ඇතිව අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝයාට දන් දුනිමි. නිරන්තරයෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් විසිමි. මාගේ ඥාතිකුලය මාලාකාර කුලයවූයේය. එබැවින් පළඳනා පිණිස පියාණන්ගේ ගෙදෙරින් එවනලද සුවඳ මල් හා සඳුන් සුවඳ කස්තුරි කපුරු ආදිකොට ඇති සුවඳ විලවුන් ආදිය ගමන් කරවා බුදුන්ගේ ධාතු පිහිටුවා බඳනාලද දගැබට දවස්පතා පූජාකරවීමි. පොහෝ දිනයෙහි පහන්සිත් ඇතිව සියතින්ම පූජාකෙළෙමි. එ කුශලකර්මය හෙතුකොටගෙන මේ දිව්‍යසම්පත් හා මෙබඳු දිව්‍යසෘද්ධියක් ලදිමි" කියා "මල්ගඳ විලවුන් ආදී පූජා වෙන් හා සිල් රැකීමෙන් සිද්ධවන්නාවූ කුශලයද බලවත් හෙයින් දැන් ඒ කුශලය විපාක දීමට පටන්ගන්නාලද්දේ නොවෙයි. අනිත් අත්මභාවයෙහි විපාක දෙන්නේය. කවර ප්‍රකාරයකින් සකෘදගාමී වෙම්දැ?යි කියා ආර්‍ය්‍යධර්ම විෂයෙහි මාගේ ප්‍රාර්ථනාව වන්නේය´යි කිව. ශක්‍ර දෙවෙන්‍ද්‍රයෝ තමන් විචාළ නියාවත් දිව්‍යාඞ්ගනාව ප්‍රකාශකොට කී නියාවත් දෙවචාරිකාවෙන් වැඩියාවූ වඞ්ගීස මහතෙරුන්වහන්සේට කීයේය. වඞ්ගීස මහතෙරුන් වහන්සේ සංගීතිකාරක මහාස්ථවිරයන්ට කීසේක උන්වහන්ස්ලා මේ කථාවද විමාන වස්තු දේශනාවට අන්තර්ගත කොට සංග්‍රහයට නගා සංගායනා කළහ.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි
**නවවන විසාලක්ඛි විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

# 38. පාරිච්ඡත්තක විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි තෙවැනි පාරිච්ඡත්තක වර්ගයෙහි දසවැනිවූ පාරිච්ඡත්තක විමාන වස්තුව නම් කවරයත්:-

අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි සැවැත්නුවර වාසී එක්තරා උපාසකයෙක් බුදුන් කරා එළඹැ නමස්කාර කොට, 'ස්වාමීනි, සෙට දවස මාගේ දනය ඉවසා වදළ මැනවැ'යි කියා ආරාධනාකොට නැවත තමන්ගේ ගෙට ගොස් දෙර සමීපයෙහි මණ්ඩපයක් සාද උඩ විසිතුරු වියන් බැඳ වටතිර ඇද පරික්ෂෙපකොට ධවජ පතාක නංවා නානා වර්ණ පිළි හා සුවඳ මල් දම් එල්වා නොයෙක් අලඞ්කාරයෙන් මණ්ඩපය සරහා පැන් ඉස යහපත්කොට හමදනාලද භූමි ප්‍රදේශයෙහි අසුන් පණවා බුදුන්ට කල් දැන්වූයේය. එකල්හි බුදුරජාණෝ පෙරවරු සමයෙහි හඳනා සිවුරු පැළඳ පාසිවුරු ගෙන විහාරයෙන් නික්ම දිව්‍ය විමානයක් සේ අලඞ්කෘත කොට සරහනලද මණ්ඩපයට වැඩ සූර්‍ය්‍යමණ්ඩලයසේ සමුද්‍ර කුක්ෂිය එකාලොක කෙරෙමින් බුදුරැසින් දිළිහී දිළිහී පණවනලද ආසනයෙහි වැඩහුන්සේක එකල්හි ඒ උපාසකයා ගඳ දුම්මල් පහන් ආදියෙන් බුදුන්ට පූජා කෙළේය. එසමයෙහි කාෂ්ඨහාරි නම් වූ එක්තරා ස්ත්‍රියක් දර පිණිස අන්ධවන නම් අරණ්‍යයට ගිය තැනැත්තී ඒ වනයෙහි වැඩහුන් බුදුන් දැක පහන් සිත් ඇතිව වැඩහුන් ආසනයට මල් ඇතිරියක් සේ හෝපලු මල් අතුට පූජා කොට පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණා කොට ගියාය. ඒ ස්ත්‍රිය එයින් පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට තවුතිසා දිව්‍ය ලොකයෙහි උතුම්වූ රන්විමනෙක උපන්නීය. පරිවාර ස්ත්‍රීහු දහසක් පමණ වූහ ඒ දිව්‍යාඞ්ගනාව එක් දවසක් නන්දන නම් උයන්හි දහසක් දෙවඟනන් පිරිවරා නටමින් ගායනා කෙරෙමින් පරසතු මල් ගොතමින් සතුටුව ක්‍රීඩා කෙරෙයි. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ යටකී ක්‍රමයෙන් දෙව චාරිකාවෙන් වඩනාසේක් තවුතිසා භවනයට වැඩ ඒ දිව්‍යාඞ්ගනාව දැක ඒ දිව්‍යාඞ්ගනාව විසින් කරනලද කුශලකර්මය මේ ගාථාවන්ගෙන් විචාළ සේක.

"පාරිච්ඡත්තකෙ කොවිළාරෙ රමණීයෙ මනොරමෙ,
දිබ්බ මාලං ගන්ථමානා ගායන්ති සම්පමොදසි.
තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,

දිබ්බා සද්ද නිච්ඡරන්ති සවණීයා මනෝරමා.
තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුචිගන්ධා මනෝරමා.
විවත්තමානා කායෙන යා වෙණීසු පිළන්ධනා,
තෙසං සුයෲති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා.
වටංසකා වාතධූතා වාතෙන සම්පකම්පිතා,
තෙසං සූයෲති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා
යාපි තෙ සිරස්මිං මාලා සුචිගන්ධා මනෝරමා,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛො මඤ්ජුසකො යථා
ඝායතෙතං සුචිං ගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින් "දිව්‍යමය උයනෙහි පරසතු මදරාමල් ගොතා පැළඳ නටන්නාවූ තීගේ මුදුන් මල් කඩින් හා දෙපය පටන් හිස දක්වා ගැවසී තිබෙන වස්ත්‍රාභරණ මාලාදිය වාත වේගයෙන් කම්පිතව පංචාඞ්ගික තූර්‍ය්‍යනාදයක් සේ සියල්ලන් විසින් අසනු ලැබෙයි. ගන්ධමාදන පර්‍වතයෙහි නන්දන මූලක පබ්භාරයෙහි මැණික් ලෙණ දෙර පිහිටි දියෙහි ගොඩෙහි හැම මල් පිපෙන්නාවූ මඤ්ජුෂක නම් වෘක්ෂය යම් සේ නොයෙක් යොදුන් ගණන් හිමාල වන ප්‍රදේශය සුගන්ධ පිණ්ඩයක් සේ එක පැහැර සුවඳ කෙරේද, එමෙන් තීගේ ඇඟ හිස වළඳනා ලද වස්ත්‍රා භරණ මාලාදියෙන් හා ශරීරාවයවයෙන් නික්මෙන්නාවූ සුවඳින් දසදිග එකපැහැර සුවඳ පැතිරෙයි" යානාදින් දිව්‍ය සම්පත් වර්‍ණනාකොට, "මෙබඳු සම්පත් ලැබීමට කරන ලද කුශල කර්‍මය කවරේද?යි" විචාළ සේක. ඒ පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනාව නම් මේ ගාථා දෙකින් ප්‍රකාශ කළාය.

"පභස්සරං අච්චිමන්තං වණ්ණ ගන්ධෙන සංයුතං,
අසොක පුප්ඵමාලාහං බුද්ධස්ස උපනාමයිං.
තාහ කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙත සොකා සුඛිතා සම්පමොදමනාමයා"ති.

යනු හෙයින් " ස්වාමීනි, මම මිනිස් ලොව උපන් සමයෙහි ප්‍රවාලමය රේණු පෙළින් හා ගිනි රැසක් සේ රත්වූ යහපත් සුවඳ ඇති හෝපලු මල් ගෙන ගොස් බුදුන්ට පූජා කෙළෙමි. එපමණ කුශලයෙන් බුදුන් විසින් වර්‍ණනා කටයුතුවූ අවශෙෂයන් විසින් කියා නිමවාලිය නොහැකි දිව්‍ය සම්පත්තියක් ලදිමි"යි කිව. එකල මහ තෙරහු විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක.

බුදුරජාණෝ එම අජ්ඣාත්පත්ති කොටගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට බණ වදළසේක.ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පාරිච්ඡත්තක වර්ගයෙහි
**පරසතු විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

පරමාර්ථජෝතිකා නම්වූ ඛුද්දකට්ඨකථාවෙහි තුන්වන
**පාරිච්ඡත්තක වර්ග වර්ණනාවයි.**

# මඤ්ජෙට්ඨක වර්ගය

## 39. මඤ්ජෙට්ඨ විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි පළමුවන මඤ්ජෙට්ඨ විමාන වසතුව නම් කවරයත් එහි පිළිවෙල කථාව මෙසේ දතයුතු.

කරුණාවෙන් සිහිල්වූ භාග්‍යවත් බුදුරජාණෝ එක් සමයෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක, එසමයෙහි සැවැත්නුවර වාසීවූ එක්තරා උපාසකයෙක් බුදුන් කරා එළඹැ නමස්කාර කොට බුදුන්ට ආරාධනා කොට නැවත ගෙට ගොස් ගෙදොර සමීපයෙහි මණ්ඩපයක් සාද උඩුවියන් බැඳ වට තිර ඇද පරික්ෂෙප කොට ධවජ පාතාක නංවා නා නා වර්ණ පිළි හා ඔලම්බක පුෂ්පදමයන් එල්වා නොයෙක් අලඞ්කාරයෙන් මණ්ඩපය සරහා පැන් ඉස හමදනා ලද භූමි ප්‍රදේශයෙහි අසුන් පනවා බුදුන්ට කල් දැන්වූයේය. එකල්හි බුදුරජාණෝ පූර්වාහ්න සමයෙහි හැඳ පා සිවුරු ගෙන දිව්‍ය විමානයක් සේ අලඞ්කෘත කොට සරහා පිළියෙල කරණ ලද මණ්ඩපයට වැඩ උදයගිරි පර්වත මස්තකයෙහි දිළියෙන බාලාර්ක මණ්ඩලය සේ දිලිසෙමින් පණවන ද ආසනයෙහි වැඩහුන්සේක. එකල්හි ඒ උපාසකයා ගඳ දුම් මල් පහන් ආදියෙන් පූජාකෙළේය. එසමයෙහි එක්තරා කුල දසියක් අන්ධ වනයට ගොස් ඒ වනයෙහි පිපුනාවූ මල් ඇති සල්ගසක් දැක සුපිපි මල් කඩාගෙන ඉරටුවල අමුනා මුදුන් මල්කඩ කිපයක් කොට නැවත ගොනා ඉතිරිවූ බොහෝ සල් මල් ගෙන ඇතුලූ නුවරට වන්නී යුගන්ධර පර්වත

මස්තකයෙහි පර්‍වත කුක්ෂිය එකොහොෂ කෙරෙමින් දිළියෙන බාලාර්ක මණ්ඩලය සේ සවනක්සණ බුඩරශ්මි මාලාවන් විහිදුවා ඒ මණ්ඩපයෙහි දිලිහි දිලිහී බුඩාසනයෙහි වැඩ හුන් බුදුන් දැක සිත හටගත්තාවූ බලවත් ප්‍රීති සොම්නස් ඇතිව ඒ ගෙන යන මලින් පූජාකරන්නී මුදුන් මල්කඩ කිපය වැඩහුන් ආසනය වට තබා සෙසු මල් ආසනයට වට විසුරුවා පූජාකොට බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට ගියාය. ඒ දසිතෙමෝ එයින් පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට තවුතිසා දිව්‍යලොකයෙහි ගොමුත්තක ගොමෙධකාදී මැණික් රත්න වශයෙන් හා රන්පබලුම්ණිමය දෙව්විමනෙක උපන්නීය. ඒ විමන් දෙර ඉදිරියෙහි රුවන්වැලි අතුරන ලද භූමිභාග ඇති මහත් සල්වනයක් පහළ විය. ඒ දිව්‍යාඞ්ගනාව යම් දවසෙක විමනින් නික්ම ඒ සල්වනයට ප්‍රවේශවන්නී විනම් එකල්හි ඒ සල් අතු නැමී හිස මත්තෙහි මල් වගුරුවති. මෙසේ මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභව කරන්නී එක් දවසක් විමනින් නික්ම දහසක් දෙවඟනන් පිරිවරා මහත්වූ දිව්‍යසෘඞියෙන් සල්වනයට ප්‍රවිෂ්ටව ශරීර ප්‍රභාවෙන් දිළිහි දිළිහී සැප විඳිමින් ක්‍රීඩා කෙරෙයි එසමයෙහි ආයුෂ්මත් වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් තවුතිසා දෙව්ලොවට වැඩ ඒ දිව්‍යාඞ්ගනාව දැක ඈ සමීපයට වැඩ මේ සම්පත් ලැබීමට ඈ විසින් ගිය දවස කරනලද කුශල කර්‍මය විචාරණ සේක් මේ ගාථාවන්ගෙන් විචාළේය.

"මඤ්ජෙට්ඨකෙ විමානස්මිං සොණ්ණවාලුක සන්ථතෙ,
පඤ්චඞ්ගිකෙන තුරියෙන රමසී සුප්පවාදිතෙ
තස්මා විමානා ඔරුයහ නිම්මිතා රතනාමයා,
ඔගාහසී සාලවනං පුප්ඵිතං සබ්බකාලකං,
යස්ස යස්සෙව සාලස්ස මූලෙ තිට්ඨසි දෙවතෙ,
සො සො මුඤ්චති පුප්ඵානි ඔනමිත්වා දුමුත්තමො.
වාතෙරිතං සාලවනං ආධුතං දිජ සෙවිතං,
සායසෙ තවං සුචිං ගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං"ති.

යනාදීන් ඇගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් වර්‍ණනාකොට "මෙබඳු සම්පත් ලැබීමට කරන ලද කුශල කර්‍මය කවරේදැ?යි විචාළ සේක. මෙසේ තෙරුන් වහන්සේ විසින් විචාරණ ලද පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තෙමෝ මේ ගාථාවන්ගෙන් ප්‍රකාශ කළාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා දසී අයිරකුලෙ අහුං,
බුද්ධං නිසින්නං දිස්වාන සාලා පුප්ඵෙහි ඔකිරිං,
වටංසකඤ්ච සුකතං සාල පුප්ඵමයං අහං,

බුද්ධස්ස උපනාමෙසිං පසන්නා සෙහි පාණිහි.
තාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධ වණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදමනාමයා"ති.

යනු හෙයින් "ස්වාමීනී, මම යටගිය දවස එක්තරා කුල දසියක් වීමි. එසමයෙහි භොජන ශාලායෙහි මහසඟ පිරිවරා වැඩහුන් බුදුන් දැක සතුටු සිත් ඇතිව ආසනය වට වැසිවස්නා සේ සල් මල් විසුරුවා සල් මලින් කරනලද මුදුන් මල්කඩ කීපයක් ආසනය වට සාද බුදුන්ට පුජාකෙළෙමි. එපමණ කුසලය හෙතුකොට ගෙන මෙබඳු දිව ඉසුරක් ලදිමි" යි කිව. එකල මුගලන් මහ තෙරහු මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ එම අථ්ථොත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළ සේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මඤ්ජෙට්ඨ වර්ගයෙහි
**මඤ්ජෙට්ඨ විමාන වස්තු වර්ණනාව** කියා නිමවන ලදී.

## 40. පභස්සර විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි **දෙවන ප්‍රභාස්වර විමාන වස්තුව** නම් කවරයත්:-

කරුණාවෙන් සිහිල්වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක රජගහනුවර වැඩවසන සේක. එසමයෙහි රජ ගහනුවර ශ්‍රද්ධා සම්පන්න වූ එක්තරා උපාසකයෙක් ඇත්තේය.. ඒ උපාසකතෙම ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ කෙරහි විශේෂයෙන්ම ප්‍රසන්නවූ සිත් ඇත්තේය. ඔහුගේ ශ්‍රද්ධා සම්පන්නවූ දූවක් ඇත්තීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ රජගහ නුවර ගෙපිළිවෙලින් පිඩු සිඟා වඩනා සේක් ඒ කුලගෙටත් වැඩිසේක ඒ කුමාරිකාව තෙරුන් වහනසේ දැක සතුටු සිත් ඇතිව ආසනයක් පනවා තෙරුන් වහන්සේ ආසනයෙහි වැඩහුන් කල්හි සමන් මල් පූජාකොට මිහිරිවූ උක් සකුරු පිඩක් තෙරුන් වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූවාය. තෙරුන් වහන්සේ ඒ කුමාරිකාවට අනුමෙවෙනි බණ වදරණු කැමතිව වැඩහුන් සේක. ඒ කුමාරිකාව ගිහිගෙයි බොහෝ කටයුතු ඇති බැවින් අවකාශ නැති බව දන්වා අනෙක් දවසක බණ අසමි කියා තෙරුන් වහන්සේට නමස්කාර කොට වඩනට කල් දැන්වූවාය. ඒ කුමාරිකාව එදවස්ම කාලක්‍රියා කොට

තව්තිසා දිව්‍යලොකයෙහි උතුම් වූ රන්විමනෙක උපන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ දිව්‍යඞගනාව දැක සමීපයට වැඩ මෙසේ විචාළ සේක.

"පභස්සරවන වණ්ණනීභෙ
සුරත්තවත්ථ නිවාසනෙ,
මහිද්ධිකෙ චන්දන රුචිරගත්තෙ
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං -පෙ"

යනුහෙයින් ප්‍රභාස්වර වූ වර්ණ සම්පන්නවූ සුරක්තවූ දිව්‍යවසළු වක් හැඳ එසේම දිව සළුවක් එකාංශකොට සඳුන් තවරනලද මනොඥවූ ශරීරයක් ඇතිව මට වඳනා තී කරෙක්හිද? නන්දනවනයෙහි ශක්‍ර දෙවෙන්ද්‍රයා සේ යම් ආසනයක හුන්නෙහිද ඒ පය්‍යඞ්කය මහාර්ඝවූ නා නා විධ රත්නයෙන් විසිතුරු විය' යනාදීන්වර්ණනාකොට මෙබඳු සමපත් ලැබීමට කරනලද කුශලය කවරේදැ?'යි විචාළ සේක. එකල්හි ඒ දිව්‍යාඞගනාව මෙසේ කිව,

"හොති ච මෙ අනුතාපො
අපරඩං දුක්කතඤ්ච හනෙත,
සාහං ධම්මං නාසෙසාසිං
සුදෙසිතං ධම්ම රාජෙන-පෙ-"

යනු හෙයින් මම මිනිස් ලොව වසන සමයෙහි පිඬු පිණිස වැඩියාවූ නුඹවහන්සේට සමන් මල් පූජාකොට උක්සකුරු පිඩක් පාත්‍රයට පිළිගැන්වූයෙමි. එකල්හි නුඹවහන්සේ බණ වදරන පිණිස වැඩහුන්සේක. මම අවකාශ නැති හෙයින් බණ නෑසුයෙමි බුදුන් විසින් වදරණ ලද ධර්මය නෑසූ හෙයින් මා විසින් නොකටයුත්තක් කරන ලද්දේය. එබැවින් විපිළිසරවීමක් ඇත්තේය. ස්වාමීනි, මේ කාරණය නුඹවහන්සේට කියමි. යම් අනුකමපා කටයුත්තක් ඇත්නම් බුදුන් විසින් වදරන ලද ශීලාදී කිසියම් ගුණධර්මයක සමාදන් කරවන සේක්වා එසේ වී නම් මාගේ ඉසුරු සමපත් කියා නිමවිය නොහැක්කේය'යි කී. එකල්හි මහතෙරහු විස්තර වශයෙන් බණ වදරා මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අත්‍යෝත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මහෙජ්ජරථක වර්ගයෙහි
**දෙවත ප්‍රභාසවර විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී

# 41. නාග විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මහෙජ්ජරථක වර්ගයෙහි තුන්වන නාගවිමාන වස්තුව නම් කවරයත්:-

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි බරණැස් නුවර වසන්නාවූ ශ්‍රද්ධාවන්තවූ ශීලාචාර සම්පන්නවූ එක්තරා උපාසිකාවක් බුදුරජාණන් උදෙසා වස්ත්‍ර දෙකක් වියවා යහපත් කොට මැදුම් පිරියම් කරවා බුදුන් කරා එළැඹ බුදුන්ගේ ශ්‍රී පාද මූලයෙහි පිළිසහල තබා මෙසේ කිය. "ස්වාමීනි යම් කුශල කර්මයක් බොහෝ කලක් මුලුල්ලෙහි මට හිත සැප පිණිස වැටේද ඒ කුශල කර්මය මට අත්පත් කරණ පිණිස බුදුරජාණන් වහන්සේ මා කෙරෙහි අනුකම්පාවෙන් මේ පිළිදෙක පිළිගන්නා සේක්ව"යි කිව. බුදුරජාණෝ ඒ පිළිසහල පිළිගත් සේක. නැවත ඒ උපාසිකාව උපනිශ්‍රය සම්පත් ඇති බව දැක චතුස් සත්‍යය ප්‍රකාශකොට බණ වදාළ සේක. ඒ උපාසිකාව දෙශනා කෙළවර සොවාන් ඵලයෙහි පිහිටා බුදුන් වැඳ අවසර ගෙන ප්‍රදක්ෂිණා කොට ගෙට ගියාය එයින් පසු නොබෝ දවසකින් කාලක්‍රියා කොට තව්තිසා දෙව්ලොව ශක්‍රදෙවෙන්ද්‍රයන්ට වල්ලභ වූ යසුත්තරා නම් අග්‍ර මෙහෙසිකාවක්ව උපන්නීය. ඇගේ කුශලානුභාවයෙන් භස්ත්‍යාලඞ්කාරයෙන් හෙබියාවූ රන් දැලින් වසන ලද ඇත් වාහනයක් පහළ විය. ඒ ඇතු පිට නිර්මිතවූ මැනික් මය මණ්ඩප මධ්‍යයෙහි සර්ව රත්නමය පර්‍ය්‍යඞ්කයෙක් පහළ විය. දළ දෙකෙහි කමල කුවලයාදී නොයෙක් මලින් ගැවසී ගත්තාවූ සිහිල් ජලයෙන් පිරුනාවූ රමණිය පොකුණු පහළ විය. එකල්හි මල්කෙමිවල පඤ්චාංගික තූර්‍ය්‍ය භාණ්ඩ ගත් දිව්‍යාඞ්ගනාවෝ නටති. ගායනා කරති. මෙසේ මහත් දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලද්දීය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ බරණැස් නුවර කැමති කලක් වැඩ වාසය කොට සැවැත් නුවරට යම් දිශාවකින් යායුතු වේද ඒ දිශාවෙන් මගට පැමිණ ගම් නියම් ගම් රාජධානි පිළිවෙලින් වඩනා සේක් සැවැත් නුවරට පැමිණ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ඒ දිව්‍යාඞ්ගනාව තමා විසින් අනුභව කරන දිව්‍ය සම්පත් බලා ඒ දිව්‍ය සම්පත් ලැබීමට කාරණා කවරේදැ?යි පරීක්ෂා කරන්නී බුදුනට පිළිසහල දුන් බව දැන බුදුන්

කෙරේ පැහැද ආදර බහුමාන සතුටු සොම්නස් ඇතිව බුදුන් වඳනා කැමතිව පෙරයම ඉකුත් මධ්‍යම රාත්‍රියෙහි ඇත් වාහනාරූඪව ආකාශයෙන් අවුත් ඇතු පිටින් බැස බුදුන් වැඳ දෙහොත් මුදුන් දීඑකත්පස්ව සිටියාය. එකල්හි වංගීස මහ තෙරුන් වහන්සේ බුදුන් විසින් අනුදන්නා ලදුව මේ ගාථාවන් වදළ සේක.

"අලඞ්කතා මණිකඤ්චනාචිතං
සුවණ්ණජාල චිත්තං මහන්තං,
අභිරුය්හ ගජවරං සුකප්පිතං
ඉධාගමා වෙහායසං අන්තළික්ඛෙ-පෙ"

යනුහෙයින් කියන ලද ක්‍රමයෙන් දිව ඉසුරු වර්ණනාකොට මෙබඳු සම්පත් ලැබීමට තී විසින් කරණ ලද කුශල කර්මය කවරේදැ?යි විචාළසේක. එකල්හි කුශලය ප්‍රකාශකොට දක්වන්නී මෙසේ කීව.

"බාරානසියං උපසංකමිත්වා
බුද්ධ ස්සහං වත්ථයුගං අදාසිං,
පාදානිවන්දිත්වා ඡමා නිසීදිං
විත්තා වහං අඤ්ජලිකං අකාසිං-පෙ-"

යනු හෙයින් ස්වාමීනි යටගිය දවස බරණැස් නුවර එක්තරා ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් වීමි. එසමයෙහි පිළිසඟලක් වියවාගෙන බුදුන් කරා ගොස් බුදුන්ට පිළිගන්වා වැඳ බිම එකත්පසෙක හුන්නෙමි. එකල්හි බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදළ සේක. මම ඒ බණ අසා සෝවාන් වීමි. ආයු මඳ හෙයින් නොබෝ දවසකින් කාලක්‍රියාකොට ඒ කුශලයෙන් සක්දෙව් මහරජාණන්ට අග්‍රමහෙසිකාවූ සොළොස් දහසක් වල්ලභ දිව්‍යාඞ්ගනාවන් අතුරෙන් දශ දිශාවෙහි ප්‍රසිද්ධවූ යසුත්තරා නම් එක්තරා අග මෙහෙසියක් වීමියි කීව. එකල්හි බුදුරජාණන් වහන්සේ එම අර්ථෝත්පත්තිකොට ගෙන බණ වදළසේක. ඒ ධර්මදෙශනාව දිව්‍යාඞ්ගනාවට හා බොහෝදෙනාට සාර්ථක විය. ඒ දිව්‍යාඞ්ගනාව බුදුන් වැඳ අවසරගෙන දෙව් ලොවටම ගියාය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි
**තුන්වැනිවූ නාග විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

# 42. අලෝමා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි සතරවන අලොමා විමාන වස්තුව නම් කවරැයත්:-

භාග්‍යවත්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ එක් සමයෙක බරණැස් නුවර නිසා ඉසිපතනාරාම යෙහි වැඩ වසන සේක. එසමයෙහි බුදුරජාණන් වහන්සේ එක් දවසක් පූර්වාහ්න කාලයෙහි මනාකොට හැඳ පා සිවුරු ගෙන බරණැස් නුවර ට පිඩු සිඟා වැඩිසේක. එකල්හි අලොමා නම් වූ එක්තරා දුක්පත් ස්ත්‍රියක් බුදුන් දැකහටගත් බලවත් ප්‍රීති සොම්නස් ඇතිව දියයුතුවූ දන සවල්ප වී නමුදු බුදුන්ට දෙනලද්දේ මහත් ඵල මහානිසංස වෙයි සිතා දුර්වණවූ ලුණු නැත්තාවූ වියළි ගියාවූ කොමුපිඬු ගෙන ගොස් පිළිගැන්වූවාය. බුදුරජාණෝ පිළිගත්සේක. ඒ ස්ත්‍රියද ඒ දනය අරමුණු කොට ගෙන විශේෂයෙන්ම සතුටුව එයින් මෑත භාගයෙහි කාලක්‍රියාකොට එම කුශල කර්‍ම හෙතුවෙන් තව්තිසා දෙව්ලොව මහත්වූ රන්විමනෙක උපන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා සේක් ඒ දිව්‍යඞගනාව දැක මෙසේ විචාළ සේක,

අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙව තෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා"

යනුහෙයින් එම්බා දිව්‍යාඞගනාව තී ඔසධී තාරකාවක් සේ ශරීරාලෝකයෙන් දශදිග් එකාලොක කෙරෙමින් බබලන්නෙහි ය. මෙබඳු දිව ඉසුරක් ලැබීමට පූර්වජාතියෙහි කරනලද කුශලය කවරේද?"යි විචාළ සේක. ඒ වචනය මුදුණෙන් පිළිගෙන කුශල කර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යාඞගනා තොමෝ,

අහං ච බාරාණසියං බුද්ධස්සාදිච්ච බන්ධුනො,
අදසිං සුක්ඛ කුම්මාසං පසන්නාසෙහි පානිහි-පෙ-"

යනු හෙයින් ස්වාමීනි, මම යටගිය දවස බරණැස් නුවර එක්තරා දිළිඳු ස්ත්‍රියක් විමි. එසමයෙහි පහන්සිත් ඇතිව සූර්‍ය්‍ය වංශෝද්භූතවූ බුදුරජාණන්වහන්සේට වියලූනාවූ යව කොමුවක් පමණ පූජාකෙළෙමි. ඒ කුශලයෙන් මේ සියලු සම්පත් ලදිමි කිව. (එබැවින් ලොකයෙහි යම් කෙනෙක් සකස්කොට දන් දුන්නාහු වීනම් ඔවුන් ලබන සම්පත් කියනුම

කවරේද? ලුණු නැත්තාවූ වියලූනාවූ යව කොමුවෙහි අනුසස් බලව. මේ අලොමා නම් දුප්පත් ස්ත්‍රී සුවපත්වූ බව දැක කවරෙක් නම් කුශල් නොකෙරෙත්ද? එක බත් පිඩකුදු ඇත. එයින් භාගයක් දන්දීවිනා අනුභව නොකරන්නේමය). ඉක්බිති තෙරුන් වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ එම අත්‍ථොත්පත්ති කොටගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළ සේක. ඒ ධර්‍මදෙශනාව බොහෝ දෙනාට සාර්‍ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්‍ගයෙහි
**සතරවැනිවූ අලොමා විමාන වස්තු වර්‍ණනාව**
කියා නිමවන ලදි.

## 43. කඤ්ජිකදායිකා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සිව්වැනි මඤ්ජෙට්ඨකවර්‍ගයෙහි කඤ්ජිකදායිකා විමාන වස්තුව නම් කවරැයත්:-

සර්‍වලොකෛකනාථවූ බුදුරජාණෝ එක්සමයෙක අන්‍ධකවින්‍ද නම් රට එක්තරා රමණියවූ ස්ථානයෙක්හි වැඩවසන සේක. එසමයෙහි බුදුන් ගේ කුස වාතරෝගයෙක් උපන, බුදුහු අනඳ මහා තෙරුන්වහන්සේට ආමන්ත්‍රණයකොට, "යව, ආනන්‍දය, තෝ පිඩු පිණිස ගොස් මාගේ කුස උපන් වාතරොගයට නිසි බෙහෙත් කැඳක් ගෙණෙව"යි වදාළසේක. එකල අනඳමහ තෙරුන්වහන්සේ බුදුන්ගේ වචනය අසා මුදුණෙන් පිළිගෙන සතරවරම් දෙව්රජ දරුවන් විසින් දෙනලද ශෛලමය පාත්‍රය ගෙන තමන්වහන්සේට උපස්ථානකරන්නාවූ වෙදණන්ගේ ගෙදෙරට වැඩ දෙර සමීපයෙහි වැඩ සිටිසේක. එකල වෙදණන්ගේ භාය්‍ය්‍යාව මහතෙරුන් දැක සතුටු සිත් ඇතිව පෙර මගට ගොස් පසඟ පිහිටුවා වැඳ පාත්‍රය අතට ගෙන විචාරන්නී, "ස්වාමිනි, කෙසේ වූ බෙහෙතක් නුඹවහන්සේට ප්‍රයෝජන ඇද්ද?යි විචාළිය. මෙසේ උපාසිකාව මහනුවණ ඇති හෙයින් "මහතෙරහු බෙහෙතින් ප්‍රයෝජනයක් ඇතිකල මේ ගෙට වඩනාසේක. භික්‍ෂා පිණිස වැඩි ගමණක් නොවෙයි" කියා සිතින් සලකා දැන විචාළ හෙයින්,"කැඳකින් ප්‍රයෝජන ඇතැ"යි වදාළසේක නැවත සිතන්නී අප අනඳමහ ස්වාමින්ට ප්‍රයෝජන බෙහෙතක් පිණිස වැඩිබවක් නොවෙයි මේ වනාහි සර්‍වඥයන්වහන්සේගේ පාත්‍රයවන්නේය. එබැවින් බුදුන්ට සුදුසු වූ කැඳක් ඉදිකරමිය"යි සිතා බලවත්ව හටගත්තාවූ ප්‍රිතිසොම්නස්

ඇතිව ඩෙබරයුෂයෙන් කැඳ පිස පාත්‍රය පුරවා පිළිගන්වා, "මෙපමණකින්ම අපිවැනි ශ්‍රද්ධාවන්තයන්ට සුදුසු නොවෙයි" සිතා අනෙකුදු සූප ව්‍යඤ්ජන සහිත අහර පිළියෙලකොට යැවූහ. ඒ බෙහෙත් කැඳ වැළඳු කෙණෙහිම බුදුන්ගේ කුස හටගත් වාතරෝගය සන්සිඳින. ඒ උපාසිකාව එයින් පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට ඒ කුශලමය හේතුවෙන් තවුතිසා දෙව්ලොව ඉපිද මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභවකෙරෙයි. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් දහසක් දෙවඟනන් පිරිවරා දිව ඉසුරු අනුභව කරන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාව දැක ඈ විසින් ගිය දවස කරණ ලද කුශල කර්‍මය මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා"-පෙ-

යනාදී ගාථාවන්ගෙන් දිව්‍ය සම්පත් වර්‍ණනාකොට, "එම්බා දෙවතාදුව, තී මෙබඳු සම්පත් ලැබීමට කළාවූ කුශලය කවරේදැ?" විචාළසේක. එබස් අසා ඒ ප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මේ ගාථාවන්ගෙන් මදක් ප්‍රකාශ කළාය.

"අහං අන්ධකවින්දස්මිං බුද්ධස්සාදිච්චබන්ධුනො,
අදසං කොලසම්පාකං කඤ්ජිකං තෙලධූපිතං.
පිප්ඵල්‍යා ලසුණෙන ච මිස්සං ලාමඤ්ජකෙන ච,
අදසිං උජුභූතස්මිං විප්පසන්නෙන චෙතසා.
යා මහෙසිත්තං කාරෙය්‍ය චක්කවත්තිස්ස රාජිනො,
නාරි සබ්බඞ්ගකල්‍යාණී භත්තුචවානොමදස්සිකා.
එතස්ස කඤ්ජික දනස්ස කලං නාග්ඝන්ති සොළසිං,
සතං කඤ්ඤ සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
එතස්ස කඤ්ජික දනස්ස කලං නාගඝන්ති සොළසිං.
සතං හෙමවතා නාගා ඊසා දන්තා උරූළ්හවා,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා,
එතස්ස කඤ්ජක දනස්ස කලං නාගඝන්ති සොළසිං.
චතුන්නමපි ච දීපානං ඉස්සරං යොධ කාරයෙ,
එතස්ස කඤ්ජක දනස්ස කලං නාගඝන්ති සොළසිං"ති

යනුහෙයින්, "ස්වාමීනි, මම මීට පූර්‍වජාතියෙහි මිනිස්ලොව අන්ධකවින්ද නම් රට වසන සමයෙහි ඩෙබර යුෂ සතර එකට සිඳුවා කැඳ

පිස ඉඟුරු මිරිස් තිප්පිලි අසමෝදක පෙරුන්කායන් සුදුලුනු කළුදුරු ය මේ කටුකභාණ්ඩයන් එක්කොට බහා බැඳ තෙල් සිඳුවා සුවඳ දුම් කවා මේ බෙහෙත් කැඳ බුදුන්ට ඵාසු පිණිස වේවායි කියා පූජාකෙළෙම්. එපමණ කුශලින් මෙබඳු සම්පත්තියක් ලදිම්'යි කියා කුශලකර්මය ප්‍රකාශකොට ඉක්බිති තුනුරුවන් වටනා පින්කෙත් ලෝකයෙහි නැති බව හඟවන්නී, 'මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් සතර මහ දිවයිනට අධිපතිවූ චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍රමහෙෂිකා බවට පැමිණ පඤ්චකල්‍යාණයෙන් යුක්තව ස්වාමියාට ප්‍රියකරුව සුවසූදහසක් බිසෝවරුන්ට නායකව ශ්‍රී සම්පත් අනුභවකරන්නේ වී නමුදු ඒ සියලු ඉසුරු සම්පත්තිය බුදුන් උදෙසා දුන් එක කැඳ දනයාගේ සොළොස්වැනි කලාවෙන් කලාවකටක් නොඅගනේය. තවද රත්තරන් පස්කලදෙක් නිකයෙක් නම් නම්වෙයි. ඒ නිකවශයෙන් රත්රන් සියදහසක්ද අශ්වාලඞ්කාරයෙන් සරහනලද අසුන් සියක් දහසක්ද සෛන්ධවයන් යොදා රථාලඞ්කාරයෙන් සරහන ලද රථ සියදහසක්ද මුක්තාමාණික්‍යමය කුණ්ඩලාභරණාදී නොයෙක් අලඞ්කාරයෙන් සරහනලද කන්‍යාභනාවන් සිය දහසක් ද යන මේ සියල්ලම යම් කෙනෙක් යාචකයන්ට දන්දුන්නේ වී නමුදු ඒ සියලුම දන් මේ එක කඤ්ජික දනයාගේ සොළොස්වැනි කලාවෙන් කලාවකටත් නොඅගනේය. දත්වල රන් කුප්පි බහා නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද හිමාල වනයෙහි උපන් අලි ඇතුන් සියදහසක් දුන්නේවී නමුදු මා දුන් එක කඤ්ජික දනයාගේ සොළොස්වැනි කලාවෙන් කලාවටත් නොඅගනේය. දත්වල රන් කුප්පි බහා නොයෙක් හස්ත්‍යලංකාරයෙන් සරහනලද හෙමවතාදී ඇත්කුලයන් ගෙන් පිටත් අලි ඇතුන් සියක් දහසක් දුන්නේ වී නමුදු මා දුන් එක කඤ්ජික දනයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවටත් නොඅගනේය. යමෙක් සතර මහාවිපයට අධිපතිව චක්‍ර වර්තී රාජ්‍යය කරන්නේ වී නමුදු ඒ ඉසුරු සම්පත්තිය මා දුන් එක කැඳ දනයාගේ සොළොස්වන කලාවෙන් කලාවකටත් නොඅගනේය'යි කියා 'තුනුරුවන්ට වඩා වටිනා පින් කෙතක් ලොකයෙහි අතිශයින් නැතැ'යි කියා බුදුගුණ ප්‍රකාශකොට කිව. එකල්හි මුගලන් මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යඞ්ගනාවට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුනට එපවත් දැන්වූසේක. බුදුරජාණෝ එමඅත්ථොත්පත්තිකොට ගෙන එතන්හි රැස්වූ පිරිසට බණ වදළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි මඤ්ජෙට්ඨක වර්ගයෙහි

**කඤ්ජිකදායිකා විමාන වස්තු වර්ණනාව**

කියා නිමවන ලදී.

# 44. විහාර විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවැනි මඤ්ජෙට්ඨක වර්‍ගයෙහි සවැනි වූ **විහාර විමාන වස්තුව** නම් කවරයත්:-

සර්‍වලොකෛකනාථ වූ භාග්‍යවත් බුදුරජාණන් ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නුවර වාසීන්ගේ එක්තරා ක්‍රීඩා දවසෙක පරිවාර ජනයා හා යෙහෙළිවරුන් විසින්, "උයන් කෙළියට යම්හ"යි කියා යාච්ඤාකරණලද විශාඛා මහාඋපාසිකාව සුවඳ පැනින් ඉස සෝද නහා සුවඳ තෙල් ගා යහපත්ව බත් අනුභවකොට නව කෙළක් අගනා මේල පළඳනාව පැළඳ පන්සියයක් යෙහෙළියන් පිරිවරා මහත්වූ ඓශ්වර්‍ය්‍යයෙන් දෙවඟනක් සේ ගෙයින් නික්ම උයන් බල බලා මදතැනක් ගොස් මෙසේ සිතුවාය. "බාල කුමාරිකාවන්සේ සිහිමුළාව කෙළ ඇවිදීම අප වැන්නන්ට සුදුසු නොවෙයි. විහාරයට ගොස් බුදුරජාණන්වහන්සේද ප්‍රියවූ භික්ෂු සංඝයාද දැක බණ ඇසුයෙම් නම් ඉතා යෙහෙකැ"යි සිතා විහාරයට ගොස් එක්තැනෙක සිට මේල පළඳනාව ගලවා දසිය අතට දී බුදුන් කරා එළඹැ නමස්කාරකොට එකත්පස්ව උන්නාය. බුදුරජාණෝද සුදුසු ලෙසින් බණ වදළසේක. ඒ විශාඛාව බණ අසා ඉක්බිති අවසරගෙන බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට මනොභාවණීය වූ භික්ෂුසංඝයාද වැඳ විහාරයෙන් නික්ම මදතැනක් ගොස් ආභරණ පළඳනා කැමතිව දසිය කැඳවා, පින්වත් දසිය, ආභරණ පළඳිම්, දෙව"යි කිව දසි වනාහි ආභරණ පොදි බැඳ විහාරයෙහි තබා ඒ ඒ තැන ඇවිද යනකල සිහිමදව වහා අවුත් කැටුව ගියහෙයින්, "ආභරණ දෙව"යි කී කල එකෙනෙහිම කියන්නී, "ස්වාමීනි සිහිමද ව විහාරයෙහිම තබා ආමි, වහා ගෙන එමි, මදක් සිටිනු මැනව"යි වළක්නා කැමතිවූවාය. එකල විශාඛාවෝ කියන්නාහු "පින්වත් දසිය, ඉදින් විහාරයේ තබා ආයෙහි නම් අපි නොගනුම හ. විහාරය පිණිස පරිත්‍යාග කරම්හ"යි කියා විහාරයට ගොස් බුදුන් කරා එළඹැ නමස්කාරකොට තමන් අභිප්‍රාය බුදුන්ට දන්වන්නාහු, ස්වාමීනි, විහාරයක් කරවනු කැමැත්තම්හ. මා කෙරෙහි අනුකම්පා උපදවා විහාරදනය ඉවසා වදළ මැනවැ"යි කියා ආරාධනා කළහ. බුදුරජාණෝ මුවෙන් නොබැන ඉවසා වදළසේක ලක්ෂයක් අධිකකොට නව කෙළක් වසතු දී විශාඛාවෝ මේල පළඳනාව ගෙන ඒ සියලුම වස්තු වියදම්කොට පූර්‍වාරාම විහාරය කරවන්නාහු ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ විහාර කර්‍මාන්තය නිමවන තෙක් එතැන්හි වැඩ සිටුවා උන්වහන්සේගේ නියෝගයෙන් හිත්තිස්තම්භ තලාන් ගොනැස්

කැණිමඬුලු දෙරබා වාතපාන සොපානාදි ගෙහාවයවයන් යහපත් කොට සදනලද දඬු කර්මාන්තයෙන් හා මනොඥවූ සුධාලෙපන කර්මය හා මාලාකර්ම ලතා කර්මාදී විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන්ද යහපත් කොට ඔප් නගා නිම වනලද ඉඳුනිල් මැණික්පෝරුවක්සේ විසිතුරු භූමිභාග ඇති යටමාලේ සැතපෙන ගෙවල් පන්සියයක් හා උඩුමාලේ ගෙවල් පන්සියයෙකැයි ගෙවල් දහසකින් ප්‍රතිමණ්ඩිතවූ ප්‍රාසාදය බුදුන්ගේ හා මහාසංඝයාගේ විසීමට සුදුසු පරිද්දෙන් දිව්‍යවිමානයක්සේ අලඞ්කෘතකොට කරවා ඒ ප්‍රාසාදයන්ට පරිවාර වශයෙන් සක්මන් මණ්ඩප භොජන ශාලාදියද යන මේ සියලු විහාරකර්මාන්තය නවමාසභිකින් කරවා නිම කළාහ. විහාර කර්මාන්තය නිමිකල්හි නවකෙළක් පමණ රුවනින් විහාර පූජාව කරන්නාවූ විශාඛාවෝ පන්සියයක් යෙහෙළියන් හා සමග ප්‍රාසාදයෙහි මතු මහලට නැගී ඒ ප්‍රාසාදයාගේ ලක්ෂණ ශ්‍රී සමෘද්ධිය බලා සතුටු සිත් ඇතිව පරිවාර ස්ත්‍රීන්ට ආමන්ත්‍රණයකොට මෙසේ කීහ. "නවකෙළක් වස්තු වියදම්කොට මෙබඳු විහාරයක් කරවන්නාවූ මා විසින් යම් කුශලකර්මයක් රැස්කරනලදද ඒ සියලු පින් තොපට දුනිමි. පින් අනුමෝදන්වහුවා"යි කියා පින් දුන්නීය. ඒ සියලුම ස්ත්‍රීහු, "යහපත, යහපතැ"යි කියා පින් අනුමෝදන්වූවාහුය. එදවස් එතැන්හි සිටි එක්තරා උපාසිකාවක් විශේෂයෙන්ම තුනුරුවන් කෙරහි සතුටුව පින් අනුමෝදන් වූවාය. ඒ උපාසිකාව එයින්පසු නොබෝකලකින් කාලක්‍රියාකොට ඒ පින් අනුමෝදන්වූ කුශලයෙන් තව්තිසා දෙව්ලොව උපන්නීය. ඇගේ කුශල මහිමයෙන් නොයෙක් කූටාගාරයෙන් හා උයන් පොකුණු ආදියෙන් ප්‍රතිමණ්ඩිතවූ සිව්සැට ගවු පුළුල හා උස ඇති සියක් යොදුන් තැන් අන්ධකාර විධ්වංසනයකොට ප්‍රභා විහිදෙන්නාවූ ආකාශයෙන් යන්නාවූ මහත්වූ දිව්‍යවිමානයෙක් පහළ විය. ඒ දිව්‍යාඞ්ගනාව උයන් කෙළි ආදියට යන්නීද දහසක් දෙවඟනන් පිරිවරා විමානය හා සමගම යන්නීය. මෙසේ මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභවකෙරෙයි. ඒ විශාඛා මහා උපාසිකාව වනාහි උදර වූ මහත් පරිත්‍යාග ඇති හෙයින්ද තුනුරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත හෙයින්ද නිර්මාණරතී නම් දිව්‍යලොකයෙහි ඉපිද සුනිර්මිත නම් දිව්‍යරාජයාට අග්‍රමහෙසිකාභාවයට පැමිණියාය. එසමයෙහි ආයුෂ්මත් වූ අනුරුද්ධ මහතෙරුන් වහන්සේ තව්තිසා භවනයෙහි දෙව චාරිකාවෙන් වඩනාසේක් විශාඛාවගේ යෙහළියවූ දිව්‍යාඞ්ගනාව දැක මෙසේ විචාළසේක.

අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

තස්ස තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්ද නිච්ඡ රන්ති සවණීයා මනොරමා.
තස්ස තෙ නච්චමා නාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බ ගන්ධා පවායන්ති සුචිගන්ධා මනොරමා"ති

යනාදීන් යට කියනලද ක්‍රමයෙන් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය විචාරා වදාළ සේක. ඒ දිව්‍යාඞ්ගනාව මහතෙරුන් වහන්සේගේ වචනය පිළිගෙන මෙසේ ප්‍රකාශකළාය.

"සාවත්ථියං මය්හං සඛී බදන්තෙ
සංඝස්ස කාරෙසි මහාවිහාරං,
තත්ථප්පසන්නා අහමනුමොදිං
දිස්වා අගාරඤ්ච පියඤ්ච මෙතං
තායෙව මෙ සුද්ධානුමොදනාය
ලද්ධං විමානං අබ්භුතං දස්සනෙය්‍යං
සමන්තතො සොළසයොජනානි
වෙහායසං ගච්ඡති ඉද්ධියා මම
කූටාගාර නිවෙසා මෙ විභත්තා භාගසො මිතා
දද්දල්ලමානා ආභන්ති ස්මන්තා සතයොජනා"

යනාදීන්, "ස්වාමීනි, අනුරුඬ ස්ථවිරයන්වහන්ස, සැවැත් නුවර වාසීවූ විශාඛා නම් ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් සතරදිගින් වඩනා මහා සංඝයාට සැපසේ වසන පිණිස නවකෙළක් වස්තු වියදම් කොට පූර්වාරාම නම් මහත් විහාරයක් කරවා ඒ විහාරය බුදුපාමොක් මහා සංඝයාට පූජාකරණ කළ මා විසින් රැස්කරණ ලද මේ සියලුම පින් තොපට දුනිමි, පින් අනුමෝදන් වෙව"යි කියා පින් දුන්නීය. ඒ පින් අනුමෝදන් වන්නාවූ මෙම මේ දිව්‍ය විමානයක් සේ ගෙවල් දහසකින් ප්‍රතිමණ්ඩිතවූ උදරතරවූ ප්‍රාසාදයද ඒ ප්‍රාසාදය නිසා පරිත්‍යාග කරණලද ධන රාශියද දැක, මේ ප්‍රාසාදය නිසා මෙතෙක් වස්තු දෙනලදයි කියා සිතින් සලකා අතිශයින් පහන්සිත් ඇතිව පින් අනුමෝදන් වීමි. මෙසේ ශුද්ධසිතින් පින් අනුමෝදන්වූ කුශලයෙන් මෙබඳුවූ දිව්‍යසම්පත්තියක් ලදිමි"යි කිව. එකල්හි මහතෙරහු ඒ විහාරය කරවූ විශාඛාවන් උපන් තැන් ඒ දිව්‍යාඞ්ගනාව ලවා ප්‍රකාශකරවනු කැමතිව මෙසේ විචාළසේක.

"තායෙව තෙ සුද්ධානුමොදනාය
ලද්ධං විමානං අබ්භුතං දස්සනීයං,

යා චෙව සා දනමදසි නාරී
තස්සා ගතිං බ්‍රෑහි කුහිං උප්පන්නා සා" ති.

යනුහෙයින් "යම් ස්ත්‍රියක් බොහෝ වස්තු වියදම්කොට විහාරයක් කරවා බුදුපාමොක් මහාසඞ්ඝයාට දී තිට පින් දුන්නීද ඒ විශාඛාවෝ දැන් කොහි උපන්නීද? පින් අනුමෝදන්වූ තිට මෙතෙක් සැපතක් ලැබුණු කල ඒ විශාඛාවන්ට පහළ වූ සමපත කියනුම කවරේද? ඒ විශාඛාවන් උපන් තැන් ප්‍රකාශකොට කියව"යි වදළසේක. එකල්හි මහතෙරුන්වහන්සේ විසින් විචාළ පමණක් දක්වන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාතොමෝ මෙසේ කිව.

"යා සා අහු මය්හං සඛීහදන්තෙ
සඞ්ඝස්ස කාරෙසි මහාවිහාරං,
විඤ්ඤාතධම්මා සා අදසි දනං
උප්පන්නා නිම්මාණරතීසු දෙවෙසු
පජාපතී තස්ස සුනිම්මිතස්ස
අචින්තියො කම්මවිපාක තස්සා,
යමෙතං පුච්ඡසි කුහිං උප්පන්නා සා
තන්තෙ වියාකාසි අනඤ්ඤථා අහං" ති.

යනුහෙයින්, "ස්වාමිනි, යම් ඒ විශාඛා නම් උපාසිකාවක් පූර්වාරාම විහාරය කරවා බුදුපාමොක් මහාසංඝයාට පූජාකොට මට පින් දුන්නීද සෝවාන් ඵලයෙහි පිහිටා චතුස්සත්‍ය ධර්මය දන්නා මා යෙහෙළියවූ ඒ උපාසිකාව නිර්මාණරතී නම දෙව් ලොව සුනිර්මිත නම් දිව්‍යරාජයාට අග්‍රමහෙසිකාව උපන්නීය. ඒ උපාසිකාවගේ කුශල විපාකයෙන් පහළවූ ඉසුරු සම්පත් අචින්ත්‍යය අප්‍රමෙය බැවින් කියා නිමවාලිය නොහැක්කේ ය"යි කිව. විශාඛාවන්ට පහළ වූ දිව්‍ය සමපත් පහත දෙව්ලොව සිටි දිව්‍යඞ්ගනාව කෙසේදැනගත්ති දැයි යතහොත්:- යටකී දද්දල්ල විමාන වස්තුවෙහි සුභද්‍රා නම් දිව්‍යාඞ්ගනාව සමීපයට අවුත් කථාකොට ගියාසේ ඒ විශාඛාදිව්‍යාඞ්ගනාවද මෙකී දිව්‍යාඞ්ගනාව වසන තැනට අවුත් කථාකොට ගියාය. එබැවින් ඒ විශාඛාවන් උපන්තැන හා දිව්‍යසම්පත් ප්‍රකාශකොට කිව. මෙසේද කියා ඉක්බිති බොහෝ දෙනා කුශලයෙහි පිහිටුවන පිණිස බණ කියන්නී මෙසේ කිව.

"තෙනහඤ්ඤෙපි සමාදපෙථ
සඞ්ඝස්ස දනානි දදථ චිත්තා,

ධම්මකථං සුණාථ පසන්නමානසා
සුදුල්ලභො ලද්ධො මනුස්සලාභො.
යං මග්ගං මග්ගාධිපත්‍යදෙසයි
බ්‍රහ්මස්සරො කඤ්චන සන්නිභත්තචො,
සඞ්ඝස්ස දනානි දදථ චිත්තා
මහප්ඵලා යත්ථ භවන්ති දක්ඛිණා"-පෙ-

යනුහෙයින් "ස්වාමීනි, කුශලකර්ම විපාකය මා ලවා ප්‍රකාශ කරවනසේක්වීනම් සුචරිත ගුණය ප්‍රකාශකොට කියමි. නැවත මිනිස්ලොවට වැඩ බොහෝ සත්පුරුෂ ජනයන් කුශල්කිරීමෙහි සමාදන් කරවා මෙසේ බණ වදාළ මැනවි. එම්බා පින්වත්වූ සත්පුරුෂයෙනි, අෂ්ට දුෂ්ට ක්ෂණයෙන් මිදී මනුෂ්‍යාත්මභාවය ලැබීම දුර්ලභවන්නේය. එබැවින් දුර්ලභවූ මනුෂ්‍යාත්මභාවයත් බුධොත්පාදයත් ලද්දවූ තෙපි බණ අසා කුශල් අකුශල් හැඳින දන ශීලාදී වශයෙන් කුශල් රැස්කරව්. එසේ දෙනලද දනයෙක් ඇත්නම් මහත්ඵල මහානිසංසවන්නේය. යනාදීන් තුණුරුවන් ගුණයත් කුශල් කිරීමෙහි අනුසඳුත් ප්‍රකාශකොට කිව මැනව"යි කිව. එකල්හි අනුරුඩ මහතෙරුන්වහනසේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජාණෝ එම අත්‍යෝත්පත්තිකොටගෙන එතැන්හි පැමිණි පිරිසට බණ වදාළ සේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාත්ථිකවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මඤ්ජෙට්ඨ වර්ගයෙහි
**විහාර විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදී.

## 45. පීත විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවැනිවූ මඤ්ජෙට්ඨක වර්ගයෙහි නවවැනි පීතවිමාණ වස්තුව නම් කවරියත්:-

ශ්‍රීපදෙත්තම වූ බුදුරජාණන් වහන්සේ සියලු බුඩ කෘත්‍යයන් කොට නිමවා පිරින්වන් පා වදාළ කල්හි මගධෙශවරවූ අසජාසත් මහරජ්ජුරුවන් විසින් තමන් ලත් ධාතු කොට්ඨාශය නොයෙක් පුද පෙරහරින් වැඩමවා ගෙන ගොස් රජගහනුවර මහත්වූ දාගැබක් කරවා ජීවමාන බුදුන්ට පූජාකරන්නාසේ මහත් වූ පූජාසත්කාර පවත්වන කල්හි රජගහනුවර වසන්නාවූ එක්තරා ස්ත්‍රියක් අලුයම නැගී සිට සිරුර පිළිදැගුම්කොට පවිත්‍රශීලීව සකසා හැද වැටකොළු මල් සතරක් කඩාගෙන ශ්‍රඩා

බලයෙන් නොපසුබටව වීර්‍ය්‍ය ඇතිව මාර්ගයෙහි වන උවදුරු නොසලකා ඒ දගැබ දිසාවට අභිමුඛව යන්නීය. එකල අලුතවැදූ දෙනක් ළමා වස්සකු ගෙන දුවන්නී වහා අවුත් මග බැස ඒ ථූප පූජා පිණිස යන ස්ත්‍රියට අභිමුඛව අඟින් ඇණ ඒ ස්ත්‍රිය එතැන්හිම ජීවිත විනාශයට පමුණුවාපුව. ඒ උපාසිකා වනාහි එතැන්හිම කාලක්‍රියාකොට ධාතුපූජා පිණිස ගිය කුශලය හෙතුකොටගෙන තව්තිසා දෙව්ලොව උපදනා තැනැත්තී උයන්කෙළියට යන සක්දෙව් මහරජාණන්ගේ අභිමුඛයෙහි දෙකෙළ පණස්ලක්‍ෂයක් පමණ දෙවගනන් මැද ඇගේ ශරීර ප්‍රභාවෙන් සියළු දෙවගනන් අභිභවනය කෙරෙමින් රථ විමානය හා සමග පහළවූවාය. සක්දෙව් රජාණෝ ඒ දෙව්දුව දැක විෂමපත්ව ආශ්චර්‍ය්‍යාද්භූතවූ ප්‍රීති සොම්නස් ඇතිව කවර නම් උදරතර කුශලයක් හෙතු කොටගෙන, මේ දිව්‍යාඞ්ගනාව මෙබඳු මහත් දිව්‍ය සමෘඩියකට පැමිණියාදැ?යි" යි විචාරනු කැමතිව මේ ගාථාවන් විචාලෝය.

"පීතවත්‍ථෙ පීතධජෙ පීතාලඞ්කාරභූසිතෙ,
පීතචන්‍දනලිත්තඞ්ගෙ පීත උප්පලමාලිනී
පීතපාසාදසයනෙ පීතාසනෙ පීතභාජනෙ,
පීතඡත්තෙන පීතරථෙ පීතස්සෙ පීතවිජනෙ.
කිං කම්මමකරී භද්දෙ පුබ්බෙ මානුසකෙ භවෙ,
දෙවතෙ පුච්ඡිතා චික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං" ති.

යනුහෙයින්, "ශරීරයත් ශරීරයෙහි පළඳනා ලද වස්ත්‍රාභරණ සඳුන් මාලාදිය හා කුඩ කොඩි සේසත් විමානාසන පරිවාරාදී සියල්ලත් ස්වර්ණ වර්ණයෙන්ම බබලන්නාහ. තී මෙබඳු දිව ඉසුරක් ලැබීමට මිනිස් ලොවදී කළාවූ කුශලය කවරේද?"යි විචාළෝය. මෙසේ ශක්‍රදෙවෙන්‍ද්‍රයා විසින් විචාරණ ලද පැනය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මේ ගාථාවන්ගෙන් ප්‍රකාශ කළාය.

"කොසාතකී නාම ලතත්‍ථි භන්තෙ කිත්තිතා අනභිජ්ඣිතා,
තස්සා චත්තාරි පුප්ඵානි ථූපා අභිහරිං අහං.
සත්‍ථුසරීරමුද්දිස්ස විප්පසන්නෙන චෙතසා,
නාස්ස මග්ගං භවෙක්ඛිස්සං තදග්ග මනසාසතී.
තතො මං අවධි ගාවී ථූපං අප්පත්තමානසං,
තඤ්චාහං අභිසඤ්චය්‍යං භීයො නූන ඉතො සියා.
තෙන කම්මෙන දෙවින්‍ද, මඝවා දෙවකුඤ්ජර,
පහාය මානුසං දෙහං තව සහව්‍යත මාගතා" ති

යනුහෙයින් "දිව්‍යරාජොත්තම වූ ස්වාමීන් වහන්ස මිනිස් ලොව වැටකොළු නම් වැල් ජාතියක් ඇත්තේය. මම ද අවිද්‍යාවෙන් නොමුළාව කුශල් ඵල දන්නා බැවින් බුදුන් සිහිකොට වැටකොළු මල් සතරක් කඩා ශාරීරික ධාතූන්ට පූජා කෙරෙමියි සිතා මගට බැස දගබ දිශාවට යන්නෙමි එකල අලුත වැදූ දෙනක් ළමා වස්සකු ගෙන දිව එන්නී උවදුරු නොසලකා තුනුරුවන් ගුණ සිත සිතා යන්නාවූ මා දගැබ සමීපයට යන්ට පළමුවෙන් ඇණ මරණු ලැබූවෙමි. ඒ මල් සතර ධාතූ උදෙසා යොමුකොට මඳ තැනක් ගෙනගිය පමණින් මෙබඳු සැපතක් ලදිමි. නුඹවහන්සේ හා සමග සැප විඳීමට පැමිණියෙමි. ඉදින් ඒ මල් පූජාකළා නම් මෙයටත් වඩා උදරතර සම්පත් ලබන්නෙමි"යි කිව එබස් අසා සතුටුව ශක්‍රදෙවෙන්ද්‍රයෝ මාතලී දිව්‍යපුත්‍රයා ඇතුලුව තව්තිසා වැසි දෙවියන්ට මෙසේ බණ කීහ.

පස්ස, මාතලි, අච්ඡෙරං චිත්තං කම්ම ඵලං ඉදං
අප්පකම්පි කතං දෙය්‍යං පුඤ්ඤං හොති මහප්ඵලං.
නත්ථි චිත්තෙ පසන්නම්හි අප්පිකානාම දක්ඛිණා,
තථාගතෙවා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ
එහි මාතලි අම්හෙහි හියෝ්‍යා හියෝ්‍යා මහෙමසෙ,
තථාගතස්ස ධාතුයො සුඛො පුඤ්ඤනමුච්චයො.
තිට්ඨන්තෙ නිබ්බුතෙ වාපි සමෙ චිත්තෙ සමං ඵලං,
චෙතො පණිධි හෙතු හි සත්තා ගච්ඡන්ති සුගතිං,
බහුන්නං වත අත්ථාය උප්පජ්ජන්ති තථාගතා,
යත්ථ කාරං කරිත්වාන සග්ගං ගච්ඡන්ති දායකා" ති.

යනුහෙයින්, "මාතලී දිව්‍යපුත්‍රය, බුදුන්ගේ ආශ්චර්‍ය්‍යවත් ගුණයක් බලව. දියයුතු දන වස්තුව ස්වල්පවී නමුදු කුශලය මහත් ඵල වන්නේය. එබැවින් බුදුන් කෙරෙහිද බුදු සව්වන් කෙරහිද පහන් සිත් ඇතිව දුන්කල දනවස්තුව සවල්පවන්නේ නොවෙයි. නුගබිජුවට කුඩාවුවත් ගස මහත්වන්නාසේ දනය ස්වල්පවීනමුදු මහත් ඵල වන්නේය. එබැවින් මෙසේ එව, මාතලිය, උයන් කෙළියට යාමෙන් ප්‍රයෝජන නැත. බුදුන්ගේ ධාතු පූජාකිරීම කුශල් අතුරෙන් උතුම් වූ කුශලයෙක් නම් වන්නේය. ශරීර ධාතු පූජාවට යම්හ. බුදුන් කෙරෙහි සම අදහස් ඇතිව යමක් පිදූයේ වීනම් ජීවමාන බුදුන්ට කළාවූ පූජාවත් පිරිනිවන් පෑ කල කරන ලද උද්දේසික පූජාවත් සම විපාක වන්නේය, සිත් ප්‍රසන්නවූ කුශලය හෙතුකොටගෙන සත්වයෝ ස්වර්ග ලොක සම්පත්තියට හා නිර්වාණයට පැමිණෙන්නාහ. එබැවින් බොහෝ දෙනාට වැඩ පිණිස බුදුවරයෝ ලොව

පහළවන්නාහ. බුඩොත්පාද කාලයෙහි තමතමන්ගේ ශක්ති පමණින් පූජාසත්කාර කොට දයකයෝ සුගතියට යන්නාහ`යි කියා ප්‍රශංසාකොට උයන් කෙළිය තබා තමන් නිරන්තරයෙන් පූජාසත්කාර කරන ලද සිලුමිණිසෑය සමීපයට ගොස් සත්දවසක් මුළුල්ලෙහි පූජා සත්කාර කෙළේය. එයින් පසු එක් දවසක් ආයුෂමත්වූ නාරද මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් තව්තිසා භවනයට වැඩිසේක. ශක්‍රදෙවේන්‍ද්‍රයෝ සියලුම ප්‍රවෘත්තිය උන්වහන්සේට කීහ. නාරද මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ සංගීතිකාරක මහාස්ථවිරයන්ට කීසේක. උන්වහන්සේලා මේ විමාන වර්ණනාවත් බොහෝදෙනාට වැඩ පිණිස ධර්මසංග්‍රහවට නගා සඞගායනා කළහ.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මඤ්ජෙට්ඨක වර්ගයෙහි
**පීත විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදී.

## 46. චතුරිත්ථි විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි සත්වැනි වූ චතුරිත්ථි විමාන වස්තුව නම් කවරයත්:-

දෙවාතිදෙව වූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවන මහා විහාරයෙහි වැඩවාසයකර වදරණසේක, එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ පළමු කියනලද පරිද්දෙන් දෙවචාරිකාවෙහි හැසිරෙමින් තවුතිසා භවනයට වැඩිසේක. එහි පිළිවෙළින් දිව්‍යවිමාන සතරෙක්හි දිව්‍යප්සරාවන් දහසදහස පිරිවරකොට ඇතිව දිව්‍ය සම්පත් අනුභවකරන්නාවූ දිව්‍යකුමාරිකාවන් සතරදෙනෙකු දැක ඔවුන් විසින් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය විචාරන සේක්,

"අභික්කන්තෙන වණ්ණෙන-පෙ-
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති"

යනාදින් පිළිවෙලින් විචාළ කල්හි ඔවුහු තෙරුන්වහන්සේට පිළිවෙන් මෙසේ සැළකළෝය.

"සා දෙවතා අත්තමනා-පෙ-
යස්සකම්මස්සිදං ඵලං"ති

යනුවෙන් "ස්වාමීනි, අපි සතරදෙන කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි ඒසිකා නම් රට පණීකත නම් නුවර එක්තරා කුලගෙයෙක්හි ඉපිද වැඩිවිය පැමිණි ස්ත්‍රීන් සතර දෙනෙක්ව එම නුවරෙහිම ස්වාමි කුලයට ගොස් සමගිව වාසය කෙළෙමු. එසේ කල්හි පිඩු පිණිස හැසිරෙන එක්තරා භික්ෂුවක් දැක අපගෙන් එකියක්තොමෝ ඉතා ප්‍රසන්න සිත් ඇත්තී ඇසළ මල් කළඹක් පිදිය. අනෙක් ස්ත්‍රියක් තොමෝ නීලොත්පල කලාපයක් පිදිය අනෙක් ස්ත්‍රියක් තොමෝ සේවත පදුම කලාපයක් පිදිය අනෙක් ස්ත්‍රී තොමෝ සමන්මල් පිදිය. මෙසේ පිදුවාවූ අපි අනෙක් කලෙක්හි කාලක්‍රියාකොට තවුතිසා භවනයෙහි දහසක් දිව්‍යාප්සරාවන් පිරිවරකොට ඉපිද ආයු ඇතිතාක් එහි දිව්‍යසම්පත් අනුභවකොට එයින් චුතව එම පුණ්‍ය විපාක හේතුවෙන්ම දිව්‍යසම්පත් අනුභව කරමින් අපගේ බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි මේ දිව්‍යප්‍රාසාද සතරෙහි ඉපිද සැපඅනුභව කරන්නෙමුය"යි තෙරුන්වහන්සේට සැළකළෝය. තෙරුන්වහන්සේද පිළිවෙළ කථාවද චතුස්සත්‍ය ධර්මයද වදාළසේක. ඒ ධර්මය අසා පිරිවර සහිතවූ ඔවුහු සොවාන් ඵලයට පැමිණියෝය. ඉක්බිති තෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුරජාණන්වහන්සේට ඒ ප්‍රවෘත්තිය සැළකෙළේය බුදුරජාණන්වහන්සේද එයම අත්ථොත්පත්තිකොටගෙන පැමිණි පිරිසට ධර්මදෙශනා කළසේක. ඒ ධර්මදෙශනාතොමෝ බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි
**සත්වන චතුරිත්ථි විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 47. අම්බ විමාන වස්තුව

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි අටවන අම්බ විමාන වස්තුව නම් කවරැයත්.

එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර වැඩවසනසේක. එසමයෙහි සැවැත්නුවර වසන්නාවූ එක්තරා ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් ආවාසදානය මහත් ඵල මහානිශංස ඇතිබව අසා ආවාසයක් කරවන අදහස් ඇතිව බුදුන් වැඳ කියන්නී, "ස්වාමීනි, මම ආවාසයක් කරවනු කැමැත්තෙමි, ඒ ආවාසය කරන්ට සුදුසු ස්ථානයක්

ලබනු කැමැත්තෙමි"යි කීවාය. එකල්හි බුදුරජාණන්වහන්සේ ඒ බව භික්ෂූන්වහන්සේට වදාළසේක. භික්ෂූහු ආවාසයට සුදුසු ස්ථානයක් දක්වා කීවාහුය. ඒ උපාසිකාව එතැන්හී රමණීය වූ විහාරයක් කරවා ඒ විහාරය අවට අඹගස් රෝපණය කරවූහ. එබැවින් ඒ විහාරය අඹගසින් පරික්ෂෙපකරණලද්දවූ ඡායුදක සම්පන්නවූ මුතුරුසක්සේ සුදුවැල්ලෙන් ගැවසීගත්තාවූ රිදිපටක්සේ සිත්කලුවූ භූමිභාග ඇතිවිය ඒ උපාසිකාතොමෝ ඒ විහාර කර්මාන්තය නිමවා නානාවර්ණ වස්ත්‍රයෙන් වියන් බැඳ මල්දම් එල්වා විහාරය දිව්‍ය විමානයක්සේ අලඞ්කෘතකොට සරහා සුවඳ තෙලින් පහන් නගා අඹගස් අලුත් වස්ත්‍රයෙන් වෙලා සංඝයාට පූජාකළාය. ඒ උපාසිකාව එයින් අපරභාගයෙහි කාලක්‍රියාකොට තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. ඇගේ කුශලානුභාවයෙන් පූර්වජාතියෙහි කරනලද කුශල කර්මය ප්‍රකාශකොට දක්වන්නාසේ දිව්‍යමය අඹවනයෙන් පරික්ෂෙපකරනලද උතුම්වූ දිව්‍යප්‍රාසාදයෙක් පහළවිය. ඒ දිව්‍යාඞ්ගනාව තරුපිරිවැරූ පූර්ණ චන්ද්‍රයාසේ දිව්‍ය ස්ත්‍රී සමූහයා පිරිවරා මහත්වූ දිව්‍යසම්පත් අනුභව කරන්නීය. එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඞ්ගනාව දැක මෙසේ විචාළසේක.

"දිබ්බනෙත අම්බවනං රම්මංපසාදෙත්ථ මහල්ලකො,
නානාතුරිය සංඝුට්ඨො අච්ඡරාගණඝොසිතො"-පෙ-

යනුහෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, තීගේ මේ රමණීයවූ දිව්‍යමය අඹවනයෙහි නානාප්‍රකාර තූර්යනාදයෙන් හා පරිවාර දිව්‍යාඞ්ගනාවන්ගේ ගායනාවෙන් ඝොෂා කරනලද යම් මේ මහත්වූ විමානයෙක් ඇද්ද ඒ විමානය රුස්කළඹක්සේ බබලන්නාවූ වියනින් හා නානාවිධ රත්නයෙන් නිර්මිතවූ පහනින් ඒකාලොකව බබලන්නේය. දිවසලු නමැති එලයෙන් හා එයින්ම නැගෙනලද දිව්‍යපාත්‍රයෙන් ගැවසීගත්තාවූ අඹවන යෙන් පිරිවරණලද මේ ස්වර්ණමය දිව්‍යප්‍රාසාදය හිරුවිමනක්සේ ජොතිමත්ව බබළන්නේය"යි කියා දිව්‍යසම්පත් වර්ණනාකොට මෙබඳු සම්පත් ලැබීමට කරනලද කුශලය කවරේද"යි විචාළ සේක. මුගලන් මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ ඒ දිව්‍යාඞ්ගනා තොමෝ මෙසේ කීවාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
විහාරං සඞ්ඝස්ස කාරෙසිං
අම්බෙහි පරිවාරිතං"-පෙ-

යනුහෙයින්, "ස්වාමීනි, යටගිය දවස සැවැත්නුවර එක්තරා උපාසිකාවක් වීමි. එසමයෙහි විහාරයක් කරවා ඒ විහාරය අවට අඹගස් රෝපනයකොට විහාරය නොයෙක් අලංකාරයෙන් සරහා අඹගස් වස්ත්‍රයෙන් එලගන්වා සරහා බුඩපුත්‍රවූ මහසංඝයාට පූජාකෙළමි. ඒ කුශලයෙන් මේ සියලු සම්පත් ලදිමි"යි කීවාය. එකල්හි මහතෙරුන්වහන්සේ විස්තර වශයෙන් බණවදරා මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණන්වහන්සේ එම අත්ථොත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨකවර්ගයෙහි
**අටවන අම්බ විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදී.

# 48. රජ්ජුමාලා විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවැනිවූ මඤ්ජෙට්ඨක වර්ගයෙහි දෙළොස්වැනිවූ රජ්ජුමාලා විමාන වස්තුව නම් කවරයත්:-

එක් සමයෙක්හි ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි දඹදිව ගයා නම් වූ බමුණු ගමෙක් විය. ඒ ගම වසන්නාවූ නාම ගොත්‍රයෙන් අප්‍රසිඩවූ බමුණෙකුගේ එක්තරා දියණියක් ඇත්තීය. ඒ කුමාරිකාව වැඩිවිය පැමිණිකළ ඒ ගම අනෙක් බමුණු කුමාරයකුට සරණපිණිස දෙනලදුව පතිකුලයට ගිය තැනැත්තී ඒ ගෙයි ඉසුරු සැපතට හිමිව වසන්නීය. එ ගෙහිම දසියෙකුගේ දුවක් ඇත්තිය. ඒ බමුණු කුමාරිකාව කෙල්ල දුටු තැන් පටන් ක්‍රොධයෙන් දිළිහී, තට තට යේ කිපී ක්‍රොධය ඉවසාගතනොහී ආක්‍රොශ පරිභව බෙණෙයි. යම් කලෙක වැඩිවිය පැමිණ කාය බල සාමර්ථ්‍යයක් ඇතිවූවාද එකල්හි දනහිසින් වැළමිටින් තළා මරා කිසිම වරදක් නැතිව නිකරුණේ හිංසා පීඩා කෙරෙයි. ඊට කාරණා කවරේදැයි යතහොත්:-පෙර ජාතියෙහි බඳනාලද වෛරයක් නිසා වෙහෙසෙන්නීය. ඒ කෙසේදයත්:- "යටගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි මෝ තොමෝ කුලකුමාරිකාවක් වූවාය. මේ බමුණු කුමාරිකාව ඒ ගෙයි දසියක්ව උපන්නීය. ඒ කුලකුමාරිකාව නිරන්තරයෙන් දණ්ඩෙන් කැටකැබිලිති ආදියෙන් හා අතින් පයින් ඒ දසියට තළා මරා බොහෝසේ වෙහෙසන බැවින් දුකින් පීඩිතව අභිමාන උපදවා ශක්ති

පමණින් දනාදි කුසල් කොට, මේ කුශලය හේතුකොටගෙන උතුම් කුලයක ඉපිද මේ කුලදරිකාවට ස්වාමිව මට දුන් වෙහෙසට දියුණු තියුණා වෙහෙසම්වායි කියා ප්‍රාර්ථනා කළාය. ඒ දසි වනාහි එසේ කරන ලද ප්‍රාර්ථනා ඇතිව එයින් චුතව කුශලාකුශල කර්මවශයෙන් සැරිසරන්නී මේ බුද්ධොත්පාද කාලයෙහි කියන ලද ගයා නම් බමුණුගම ඉපිද පතිකුලයට ගිය තැනැත්ති ඒ ගෙයි සියලු සැපතට හිමිවූවාය. එකල පෙර කී කුල ස්ත්‍රියද එයින් චුතව සසර සැරිසරන්නී ඒ ගෙයි දසීව උපන්නීය. මෙසේ කරන ලද ප්‍රාර්ථනා වශයෙන් බද්ධවෛරීවූ ඒ බමුණු කුමාරිකාව කෙල්ලට වෙහෙසන්නී කිසි වරදක් නැතිව ඉසකේ වැටිය අල්වා බිම හෙළා අතින් පයින් ඇන තළා නිරන්තරයෙන් වෙහෙස කෙරෙයි ඒ දුක් ඉවසාගත නොහී ඉසකේ වැටිය අල්වා තලන හෙයින් එක්දවසක් කරණවෑමි ශාලාවට ගොස් හිසකෙස් කප්පවා හිස මුඩුකොට ගෙට ගියාය. බමුණු කුමාරිකාව ඒ බව දැන කිමෙක්ද, දුෂ්ට කෙල්ල, තී හිස මුඩකළ පමණකින්ම නිදෙස් වන්නීදැ'යි කියා හිස රැහැණක් බැඳ ඒ රැහැණ අල්වා නමා බැඳ හෙළා අතින් පයින් ඇණ වෙහෙස කෙරෙයි. ඒ රැහැණ මාලාවක්සේ තිබෙන හෙයින් එතැන්සිට ඒ දසී රජ්ජුමාලාවයයි කියා අනෙක් නමකින් ප්‍රසිද්ධවූවාය. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණෝ මහා කරුණා සමාපත්තියෙන් නැගී විනෙයජනයන් දක්නා පිණිස මුළුලොව බලා වදරණසේක් ඒ රජ්ජුමාලාව සොවාන් ඵලයෙහි පිහිටුවීමට උපනිශ්‍රය සම්පත් ඇති නියාවත් ඒ බමුණු දුව සරණයෙහි පිහිටන නියාවත් සර්වඥතාඥනයෙන් දැන වදරා පූර්වාහ්න සමයෙහි හැඳ පෙරව වනාන්තරයට වැඩ එක්තරා ඡායා සම්පන්නවූ රුකක් මුල සවර්ණවර්ණ බුද්ධ රශ්මිමාලාවන් විහිදුවමින් දිළිහි දිළිහී වැඩහුන්සේක, එදවස් යටකී රජ්ජුමාලාව දවස දවස ගුටි මුරකා වෙහෙසෙන්නී මෙසේ සිතුවාය. මාගේ මේ දුඃඛ ජීවිකාවෙන් ජීවත්වීමට වඩා මියයාම යහපතැයි කලකිරුණාවූ සිත් ඇතිව පණ නසාගන්නා කැමතිව කළය ගෙන පැන්තොටට යන්නීයක් සේ මිනිසුන් වංචාකොට ගෙයින් නික්ම කළය මගින් ඉවත තබා අනුක්‍රමයෙන් ගොස් වනාන්තරයට වැද බුදුන්හුන් රුක්මුලට නුදුරු තෙනක එක්තරා ගසක් දැක කරවැල්ලා ගන්නා අභිප්‍රාය ඇතිව හිස බැඳ තුබූ රැහැන ගලවා වහා ඇසිරෙනසේ මුදුපාසකොට ඒ ගස අත්තක බැඳ මන්ද කරලාගෙන, යම්කිසි කෙනෙක් සිට මරණයට අන්තරායක් කෙළේවිනම් නපුරුයි සිතා ඇතමෑත බලන්නී සවර්ණක් ඝන බුද්ධරශ්මිමාලාවන් විහිදුවමින් දිළිහි දිළිහී එතැන්හිරුක්මුල වැඩහුන් බුදුන් දැක සතුටු

සිත් ඇතිව මරණ නමැති ප්‍රපාතයෙහිවැටී ගිය චිත්තය බුඩ ගෞරවයෙන් සර්ඥ නමැති සමබිමට අදනා ලදුව, කිමෙක්ද, සර්ඥවරයෝ නම් මා වැන්නනටත් කරුණා වෙන් බණ වදරන්නාහ. එබැවින් බුදුන් සමීපයට ගොස් බණ අසා මේ දුකින් මිදුනේවිනම් ඉතා යෙහෙකැයි සිතුවාය. එකල්හි බුදුරජාණෝ ඇගේ සිත බලා, රජ්ජුමාලා යයි වදළසේක. ඒ වචනය අසා අමෘතාභිෂේකයක් ලද්දසේ අතුරු නැතිව ප්‍රීති යෙන් පිරුණාවූ සිත් ඇතිව ප්‍රීතියෙන් ඉපිළ පැණනැගී බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව සිටියාය. බුදුරජාණෝ අනුපූර්වීකථාවෙන් බණවදළසේක. රජ්ජුමාලාව එකෙණෙහිම සෝවන් ඵලයෙහි පිහිටියාය. කිසිකෙනෙකුන් විසින් සොළවාලිය නොහැක්කාවූ ශ්‍රද්ධාවෙහි පිහිටා සඬකා රහිතව ආර්‍ය ගුණයට පැමිණියාය. බුදුරජාණන්වහන්සේද මේ රජ්ජුමාලාවට නුදුරු තැන එක්තරා රැකක් මුල හිරුවිමනක්සේ දිලිහි දිලිහී වැඩහුන් සේක. ඉක්බිති රජ්ජුමාලාව කිසිකෙනකුන් විසින් විනිපාතනය නොකට හැක්කාවූ තමන් කෙරෙහිද සියල්ලවුන් කෙරෙහිද සමව පවත්නා ක්‍ෂාන්ති මෛත්‍රී දයානුකම්පා ඇතිහෙයින්: බැමිණි මා මරා වේවයි, වෙහෙසා වෙවයි, යම් වධයක් කරනු කැමත්තීනම් ඒ කෙරේව`යි සිතා පැන් කළයත් ගෙන ගෙට ගියාය. එසමයෙහි ගෙ හිමි බ්‍රාහමණයා ගෙදෙර සමීපයෙහි සිටියේ ගෙට එන රජ්ජුමාලාව දැක, එම්බා රජ්ජුමාලාව, අද තී දිය ගෙණෙනා පිණිස ගිය තැනැත්ති බොහෝ කල්යවා අවුය. තීගේ මුහුණ වර්‍ණයත් අතිප්‍රසන්නය. පෙර සේ නොව අනෙක් ආකාරයකින් උපස්ථානයත් කෙරෙයි. මෙසේ වන්ට කාරනා කවරේදැ?යි විචාළේය රජ්ජුමාලාව ඒ සියලුම ප්‍රවෘත්තිය බමුණාට කිව. බ්‍රාහමණයා එබසට සතුටුව ගෙටගොස්, දියණියෙනි, මෙතැන්පටන් මේ රජ්ජුමාලාව ලවා තී විසින් කිසිවක් නොකරවියයුතුයයි යෙහෙළියට අවවාදකොට බුදුන් කරා එළඹ නමස්කාරකොට ආදරයෙන් කරන ලද ගෞරව බහුමාන ඇතිව පිළිසඳර කථාකොට ආරාධනාකොට ගෙට වඩාගොස් වඩා හිඳුවා ප්‍රනීතවූ කන බොන දෙයින් වළඳවා වළඳ ඉක්බිති ශ්‍රී හස්තයෙන් පහකරනලද පාත්‍රය ඇති බුදුන් කරා එළඹැ නමස්කාරකොට එකත්පස්ව හුන්නේය. ඔහුගේ යෙහෙළියද බුදුන් වැඳ එකත්පස්ව හුන්නේය. එපවත් අසා ගයා නම් ගම වසන්නාවූ බමුණන් හා ගොවිහුද බුදුන් කරා එළඹැ නමස්කාරකොට එකත්පස්ව හුන්නාහුය. සමහරු බුදුන් හා සමග පිළිසඳරකොට එකත්පස්ව හුන්නාහුය. එකල්හි බුදුරජාණෝ රජ්ජුමාලාවට කථාකොටයටගිය දවස කුලදූවක්ව බමුණු කුමාරියට වෙහෙසදුන්

නියාවත් බමුණු දුව රජ්ජුමාලාවට දසිව උපන් නියාවත් විස්තරවශයෙන් වදරා ඔවුනොවුන්ගේ චරිතානුකූල වශයෙන් සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක ඒ බණ අසා බ්‍රහමණයා හා ඔහුගේ යෙහෙළිද එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝ ද සරණ ශීලයෙහි පිහිටියාහුය. ඉක්බිති බුදුරජාණෝ හුනස්නෙන් නැඟී සැවැත් නුවරට වැඩිසේක. බ්‍රාහමණයා රජ්ජුමාලාව දූ තනතුරෙහි තැබූ යේය. එතැන් පටන් බමුණු දුව රජ්ජුමාලාවගේ මුහුණ ප්‍රිය නෙත්‍රයෙන් බලමින් සමගි සතුටුව දවස් යැවීය රජ්ජුමාලාව එයින් පසු නොබෝ දවසකින් කාලක්‍රියාකොට තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. පරිවාර ස්ත්‍රීහු දහසක් පමණ වූහ. ඒ දිව්‍යාංගනාව එක්දවසක් සැටගැලක් පමණ පුරාලන සර්වාභරණයෙන් සැරහී දහසක් දෙවඟනන් පිරිවරා නන්දනොද්‍යානයෙහි කෙළිමින් මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නීය. එකල ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ එක් දවසක් දෙවචාරිකාවෙන් වඩනාසේක් මහත්වූ දිව්‍යානුභාවයෙන් හා මහත් දිව්‍ය සෘඬියෙන් බබලන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාව දැක ඇ විසින් කරණලද කුශල කර්මය මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
හත්ථෙ පාදෙ ච විග්ගය්හ නච්චසි සුප්පවාදිතෙ.
තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො
දිබ්බා සද්ද නිච්ඡරන්ති සවනීයා මනොරාමා.
විවත්තමානා කායෙන යා වෙණීසු පිළන්ධනා,
තෙසං සුය්‍යන්ති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා
වටංසකා වාතධුවා වාතෙන සම්පකම්පිතා,
තෙසං සුය්‍යන්ති නිග්ඝොසො තුරියෙ පඤ්චඞ්ගිකෙ යථා
යා පි තෙ සිරස්මිං මාලා සුවිගන්ධා මනොරමා,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛො මඤ්ජූසකො යථා
ඝායසෙ තං සුවිගන්ධං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, "එම්බා දිව්‍යාඞ්ගනාව, තී මේ ලීලාවකින් දීප්තිමත්ව සිටින්නී විනම් හස්තපාදයෙන් අනෙකප්‍රකාර වර්ණඇති මල් මිටිගෙන නටන්නීය." යනාදීන් වර්ණනාකොට යට කී ක්‍රමයෙන් කුශලකර්මය විචාළසේක. ඒ පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මේ ගාථාවන් ප්‍රකාශකළාය.

"දසී අහං පුරෙ ආසිං ගයායං බ්‍රාහමණස්සහං,
අප්පපුඤ්ඤ අලක්ඛිකා රජ්ජුමාලාති මං විදූ.
අක්කොසානං වධානඤ්ච තජ්ජනාය ච උපක්කතා,
කුටං ගහෙත්වා නික්කම්ම ගච්ඡිං උදකහාරියා.
විපථෙ කුටං නික්ඛිපිත්වා වනසණ්ඩං උපාගමිං,
ඉධෙවාහං මරිස්සාමි කො අත්ථො ජීවිතෙන මෙ
දළ්හං පාසං කරිත්වාන ආසුම්භිත්වාන පාදපෙ,
තතො දිසා විලොකෙසිං කො නු ඛො වනමස්සිතො.
තත්ථද්දසාසිං සම්බුද්ධං සබ්බලොකහිතං මුනිං,
නිසින්නං රුක්ඛමූලස්මිං ඣායන්තමකුතො භයං
තස්සා මෙ අහු සංවෙගො අබ්භුතො ලොමහංසිනො,
කො නු ඛො වනමස්සිතො මනුස්සො වා උදාහු දෙවතා.
පාසාදිකං පාසාදනීයං වනා නිබ්බාණමාගතා,
දිස්වා මනො මෙපසීදි නායං යාදිස කීදිසො
ගුත්තින්ද්‍රියො ඣානරතො අබ්භිගගතමානසො,
හිතො සබ්බස්ස ලොකස්ස බුද්ධො සොයං භවිස්සති.
භයභෙරවො දුරාසදො සීහොව ගුහමස්සිතො,
දුල්ලභායං දස්සනාය පුප්ඵං ඔදුම්බරං යථා"-පෙ-

යනාදීන් ප්‍රකාශකරන්නී, "පෙර මම මිනිස් ලොව ගයා නම් බමුණුගම එක්තරා බමුණකුගේ ගෙයි පින් මද කාලකන්නිවූ දසියක් විමි. ඒ ගෙයි බැමිණියක් මා හිසකේ වැටියඅල්වාගෙන ඇත මැත ඇද අතින් ඇණ වෙහෙසන හෙයින් දුක් ඉවසිය නොහී හිසකෙස් කප්පවාලීමි. එකල රැහැණකින් හිස බැඳ ඒ ලනුව අල්වාගෙන වෙහෙස කෙරෙයි. ඒ රැහැණ හිසින් ගලවාලිය නොදී නිරන්තරයෙන් මාලයක්සේ තිබෙන හෙයින් රජ්ජුමාලායයි කියා ආමන්ත්‍රනය කෙරෙති. ඒ වධ ඉවසිය නොහී මහත් දෙම්නසට පැමිණ, "මාගේ මේ දුඃඛ ජීවිකාවෙන් කවර අර්ථයෙක්ද? මිය යාම උතුමැයි සිතා දිය පිණිස පැන්තොටට යන්නියක්සේ ගෙයින් නික්ම මගින් ඉවත්ව බැද්දේ කළය තබා වනසණ්ඩයට ගොස් එක්තරා රැකක් මුලට පැමිණ මෙතැන්හි කර වැලලා මියෙමි"යි සිතා ඉස බැදි ලනුව ගලවා මඳු ඇස්ස තනා තරකොට අත්තෙහි බැඳ මන්ද බොටුවට දමා, "මේ වනාන්තරය ආශ්‍රයකොට යම්කිසි කෙනෙකුන් විසින් මරණයට අන්තරායක් කෙළේවීනම් නපුරැයි සිතා ඇත මැත බැලූයෙමි එතනට නුදුරුතැන රැකක් මුල වැඩහුන් බුදුන් දැක මට මෙබඳු මහත්වූ සංවේගයක් උපන. පෙර නුදුටුවිරූ මේ ආශ්චර්‍යයීමත් පුරුෂයා මේ වල

වසන කවර වීර පුරුෂයෙක්ද නොහොත් දෙවතා කෙනෙක්දැ?යි පරීක්‍ෂාකරන්නෙම් දෙතිස් මහ පුරුෂලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණබ්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් දිළියෙන්නාවූ ශ්‍රී විලාශය දැක, මේ එසේ මෙසේ ලාමක සත්‍වයෙක් නොවෙයි. සර්‍වලොක ගුරුවූ බුදුරජාණන්වහන්සේය. මේ බුදුන් දැක්ම නම් රන්ගල් ගුහාවෙක්හි වසන්නාවූ භයජනකවූ කෙශර සිංහයාගේ දැකීම දුර්‍ලභවන්නාක්මෙන්ද දිඹුල්මල් දැකීම දුර්‍ලභවන්නාක්මෙන්ද පින්මද සත්‍වයන් විසින් නොලැබිය හැක්කාවූ දුර්‍ලභ දැක්මෙකැයි සතුටු සිත් ඇතිව රැහැණ කරින් ගලවා බුදුන් කරා ගොස් වැඳ පව් ගෙවා ගත්තෙම් වීම් නම් ඉතා යෙහෙකැයි සිතිමි. එක්ල්හි බුදුරජාණන් වහන්සේ, එම්බා රජ්ජුමාලාව බුදුන් සරණ යවයි වදාළසේක. මිහිරිවූ මෑදුවූ කර්‍ණරසායනවූ මධුර වචන අසා විශෙෂයෙන්ම සතුටුව බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව සිටියෙමි. එකල්හි බුදුරජාණෝ මාර්‍ගාධිගමයට සුදුසුවූ කෙලෙසුන් තුනීවූ සිත දැක ජාති ජරා මරණාදීදුක්‍ඛ සත්‍යයද ඒ දුක් ඉපදිමට මුල්වූ තෘෂ්ණා සඞ්ඛ්‍යාත සමුදය සත්‍යයද ඒ තෘෂ්ණාවගේ නැසීමයයි කියනලද නිරොධසත්‍යයද ඒ දුක නිරුද්‍ධවීමට කරනු ලබන ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත මාර්‍ග සත්‍යයද යන මේ චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක. මම ඒ බණ අසා සෝවාන් ඵලයෙහි පිහිටා අචල ශ්‍රද්‍ධාවෙන් යුක්තව තුනුරුවන් කෙරෙහි අති ප්‍රසන්නවූ ප්‍රෙමණිය වූ බුදුන්ගේ දියණියක් වීමි. එබැවින් සසරදුකින් මිදී දැන් මේ දෙව්ලොවට ආවාවූ මම මාර්‍ගරතියෙහිද ඵලරතියෙහිද සිත් අලවා කිසි භයක් නැතිව පඤ්චකාම රතියෙන් ක්‍රීඩාකෙරමින් මහත්වූ දිව්‍යසම්පත් අනුභවකෙරෙමියි කියා යට දැසි විමාන වර්‍ණනාවෙහි කී පරිද්දෙන් දිව්‍යසම්පත් වර්‍ණනාකොට මාගේ මේ දිවඉසුරු බලා වදාළ මැනවයි කිව. එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජානෝ එම අත්‍ථොත්පත්තිකොට ගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්‍මදේශනාව බොහෝ දෙනාට සාත්‍ථකවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි
**මඤ්ජෙට්ඨක වර්‍ගයෙහි රජ්ජුමාලා විමාන වස්තු වර්‍ණනාව**
කියා නිමවන ලදී.

## 49. උවජු විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මඤ්ජෙට්ඨක වර්ගයෙහි දසවන උච්ඡු විමාන වස්තුවද, මෙම විමාන වස්තු ප්‍රකරණයෙහි තුන්වන පාරිච්ඡත්තක වර්ගයෙහි දෙවන උච්ඡු දයිකා විමාන වස්තුව මෙනී. මෙහි වෙනස් වශයෙන් පැනෙන්නේ පිඬු පිණිස පැමිණි භික්ෂු නමකට උක්දඬු කඩක් පූජාකළ භාර්‍ය්‍යාවට ස්වාමිපුරුෂතෙම වියලූනු මැටිකැටයකින් ගසා ජීවිතක්ෂයට පමුණුවන ලද්ද පමණෙකි. අනෙක් සියල්ල උච්ඡු දයිකා විමානවස්තුව මෙනැයි දතයුතු.

## 50. වන්‍දන විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සතරවන මාඤ්ජෙට්ඨක වර්ගයෙහි එකාදශවන වන්‍දන විමාන වස්තුව නම් කවරැ යත්:-

දෙවාතිදෙවවූ බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසයකර වදරණ සේක. එසමයෙහි වනාහි බොහෝ භික්ෂුහු එක්තරා ගාමිකා වාසයෙක්හි වස්වැස සම්පූර්ණ කරණලද වස් ඇත්තාහු පවරා අස්වසනලද සෙනසුන් ඇතිව පාසිවුරු ගෙන බුදුරජාණන් වහන්සේ දැකීම පිණිස සැවැත් නුවරට වඩින්නාහු එක්තරා ගමකට පැමිණ ඒ ග්‍රාමයද ඉක්මවා වඩින්නාහු. එකල්හි ඒ ගම එක්තරා ස්ත්‍රියක් තොමෝ ඒ වඩින්නාවූ භික්ෂූන් වහන්සේලා දැක ප්‍රසන්නවූ සිත් ඇත්තී එසේම හටගන්නාවූ ආදර බහුමාන ඇතිව ඒ භික්ෂූන් පසඟ පිහිටුවා වැඳ උන්වහන්සේලාගේ දර්ශන පථය ඉක්මවනතෙක් දෙහොත් මුදුනෙහි තබා වැඳගෙන ප්‍රසාදවූ සිතින් යුක්තව අනිමිස ලොචන ඇතිව සිටියාය. ඕතොමෝ මෙපමණෙක් පින්කම්කොට අනෙක් කලෙක්හි කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නීය. ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රීතොමෝ දිව්‍යසම්පත් අනුභව කරමින් වසනකල්හි එක් දවසක් ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දිව්‍යලොකයට වැඩ ඇගේ දිව්‍යසම්පත් දැක මෙසේ විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන
යා ත්වං තිට්ඨසි දෙව තෙ-පෙ-
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී"ති.

මෙසේ මුගලන් මහතෙරුන් වහන්සේ විචාළ කාරණය මුදුනෙන් පිළිගෙන ඒ දිව්‍යාඞ්ගනාව මිනිස්ලොවදී තමන් කළ පුණ්‍ය කර්මය විස්තරව ප්‍රකාශකළාය. සෙස්සද පෙරකී නයින් දතයුතු.

සතරවන මඤ්ජෙට්ඨක වර්ගය කියා නිමවනලදි.

# මහාරථ වර්ගය

## 51. මණ්ඩූක දිව්‍ය පුත්‍ර විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථවර්ගයෙහි පළමුවැනිවූ මණ්ඩූක දිව්‍ය පුත්‍ර විමාන වස්තුව නම් කවර යත්:-

ත්‍රිභුවනෙක තිලක වූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක චම්පා නුවර ගොදුරුගම්කොට ගර්ගරානම් පොකුණ සමීපයෙහි රමණිය වූ විහාරයෙක වැඩ වසනසේක. එසමයෙහි බුදුරජාණෝ අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තියට සමවැද සමාපත්තීන් නැඟී විනෙයජනයන් දක්නාපිණිස මුළුලොව බලා වදරණසේක් එක්තරා මැඩියෙකු දැක, "අද මා බණ වදරනකල එක්තරා මැඩියෙක් මාගේ ස්වරයේ නිමිත්ත ග්‍රහණය කෙරෙමින් අසා හෝනේය. එකල්හි ගවපාලකයෙකුගේ උපක්‍රමයෙන් මිය දෙව්ලොව ඉපද මහත්වූ දෙව්පිරිස් පිරිවරා මහජනයා බල බලා සිටියදීම මා දක්නා පිණිස එන්නේය. එතැන්හි දි බොහෝදෙනාට ධර්මාභිසමය වෙයි" කියා දැක පෙරවරු මනාකොට හැඳ පා සිවුරු ගෙන මහත්වූ භික්ෂු සංඝයා සමග චම්පා නුවරට පිඩු පිණිස වැඩ පිණ්ඩපාත ලාබයෙන් සඞ්ඝයාට පාදුකොට කරන ලද අහරකිස ඇතිව නැවත විහාරයට වැඩ භික්ෂුසඞ්ඝයා තමන් වහන්සේ වැඳ වත් දක්වා අවසර ගෙන තමතමන්ගේ දිවාස්ථානවලට ගිය කල සුගන්ධවූ ගඳකිළියට වැඩ ඵලසමාපත්ති සැපයෙන් දවස් යවා සවස් වේලෙහි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවණක් පිරිස් පොකුණුතෙර ධර්මසභා මණ්ඩපයෙහි රැස්වූ කල්හි සුරභි සුගන්ධ ගන්ධ කුටියෙන් කාලානුරූපවූ ප්‍රාතිහාර්‍යයෙන් නික්ම පොකුණු තෙර ධර්මසභා මණ්ඩපයට වැඩ අලඞ්කෘතකොට පණවනලද බුද්ධාසන මස්තකහෙි වැඩ හිඳ මැණික් ගල්තලා මත්තෙහි සිංහනාදකරන අභිත කෙශර සිංහරාජයකුසේ අචින්ත්‍යය අප්‍රමෙය්‍යවූ බුද්ධානුභාවයෙන්

අනුපමවූ බුඩලීලාවෙන් අෂ්ටාඞ්ග සමුපෙත බ්‍රහ්මස්වර විහිදුවා සර්වසත්ව ස්වකීය භාෂානුරූපවූ මධුර වචනයෙන් ධර්මදෙශනාව පටන්ගත්සේක. එකෙණෙහි එක්තරා මැඩියෙක් පොකුණෙන් නික්ම අවුත්, මොහු විසින් ධර්මයෙක් කියනු ලැබෙයි සිතා ධර්ම සංඥාවෙන් ස්වරයෙහි නිමිත්තග්‍රහණය කෙරෙමින් පිරිස් කෙළවර බණ අසා හොත්තේය. එසමයෙහි එක්තරා ගොපලු දරුවෙක් ඒ භූමි ප්‍රදේශයට ආයේ නොයෙක් බුඩශ්‍රීන් දිළිහි දිළිහී බණ වදරන බුදුරජාණන් වහන්සේද සන්සුන් ඉඳුරන් ඇතිව කායවාක් සමාචාරයෙන් යෙදි බණ අසන පිරිසද දැක ඒ ධර්මශ්‍රවණයට එළවන ලද සිත් ඇතිව අත තිබූ කෙවිටි ලීය බිම සිටුවා එලී සිටින්නේ බණ අසා හොත් මැඩියා නොදැක ඉස මත්තෙහි අවුණා ඉස පලවා සිටියේය. ඒ මැඩියා එතැන්හි කාලක්‍රියාකොට බණඇසූ කුශලයෙන් තව්තිසා දෙව්ලොව නිද පිබිදියාක්හු සේ දොළොස් යොදුන් රන් විමනෙක උපන්නේය. නොයෙක් දිව්‍යාභරණයෙන් සැරහී දිව්‍යාප්සරා සමූහයා පිරිවරා දිප්තිමත්ව බබලන්නාවූ තමන්ගේ දිවඉසුරු දැක උපන්කෙණෙහිම පූර්වජාතියෙහි කරනලද කුශලකර්මය බැලීම දෙවතාවන්ගේ ධර්මතාවක් හෙයින් මේ දිව්‍යපුත්‍රයාද-, කොයින් චුතව අවුත් මෙහි උපන්නෙම්දැ?"යි ආවර්ජනා කරන්නේ පූර්ව ජාතියෙහි ජලගොචරව තිරිසන් යොනියෙහි සිට ආබව දැක, තිරිසන්ව සිටි මමත් මෙබඳු සම්පත් ලදින් මේ දෙව්ලොව උපන්මි මෙබඳු සැපතක් ලැබීමට කවර කුශල කර්මයක් කළෙම්දැ"යි පරීක්‍ෂා කරන්නේ බුදුන්ගේ ස්වරයෙහි නිමිත්තග්‍රහණයකොට ශබ්දය ඇසූ පමණක් විනා අනික් කුශලයෙක් නොදැක බුදුන් කෙරෙහි ප්‍රසන්නව විමාන ය හා සමගම මිනිස් ලොවට අවුත් විමානය ආකාශයෙහි රඳවා බිමට බැස මහජනයා බලබලාසිටියදි මහත් වූ දිව්‍යානුභාවයෙන් දිළිහි දිළිහී බුදුන් කරා එළඹැ ශ්‍රීපාදයට නමස්කාරකොට දොහොත් මුදුන්දී එකත්පස්වසිටියේය. එකල්හි බුදුරජාණෝ බුඩානුභාවයත් කුශලකර්ම ඵලයත් සියලු මහජනයාට ප්‍රත්‍යක්‍ෂකොට දක්වනු පිණිස දැන දැන ම මෙසේ විචාරා වදළසේක.

"කො මෙ වන්‍දති පාදානි ඉද්ධියා යසසා ජලං,
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා"ති

යනුහෙයින්, "විදුළිය කැල වැළඳි රන් පර්වතයක්සේ සැට ගැලක් පුරාලන පමණ සර්වාභරණයෙන් සැරහී මහත්වූ දෙව් පිරිස් පිරිවරා ෂව්වර්ණයෙන් හා ශරීරාලොකයෙන් දශදිග් එකොද්භාෂකෙරෙමින් දිළිහි දිළිහී මාගේ ශ්‍රීපාද අරවින්දයට නමස්කාර කරන්නවූ තෝ දිව්‍ය බ්‍රහ්ම නාග

යක්ෂ රාක්ෂස මනුෂ්‍යාදීන් අතුරෙන් කවරෙක්හිද˚සි විචාරා වදාළසේක. මෙසේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් විචාරණ ලද වචනය මුදුණෙන් පිළිගෙන දිව්‍යපුත්‍රතෙම පූර්වජාතිය ආදිකොට සියලුම ප්‍රවෘත්තිය කියන්නේ මේ ගාථාවන්ගෙන් ප්‍රකාශකොට කීයේය.

මණ්ඩූකොහං පුරෙ ආසිං උදකෙ වාරිගො චරො,
තව ධම්මං සුණන්තස්ස අවධි වච්ඡපාලකො.
මුහුත්තං චිත්තප්පසාදස්ස ඉද්ධිං පස්ස යසඤ්ච මෙ,
ආනුභාවඤ්ච මෙ පස්ස වණ්ණං පස්සජුතිඤ්ච මෙ.
යෙච තෙ දීඝමද්ධානං ධම්මං අස්සොසුං ගොතම,
පත්තා තෙ අචලට්ඨානං යත්ථ ගන්ත්වාන සොචරෙ"ති,

යනුහෙයින්, "ස්වාමීනී, මම මීට පූර්වජාතියෙහි දිය ගොදුරුකොට උපන් දියම භූමිකොට වසන එක්තරා මැඩියෙක් විමි. එසමයෙහි නුඹවහන්සේ විසින් සර්වසත්ව ස්වකීය භාෂානුරූප ලක්ෂණීය ස්වභාෂානුරාගශ්‍රවණීය මධුර වචනයෙන් දෙශනාකරන ලද්දවූ ධර්මදෙශනා ශබ්දයෙහි නිමිත්ත ග්‍රහණයකොට, මේ කියන්නේ ධර්මයෙකැයි සිතා බණ අසා හොත්තාවූ මා එක්තරා ගොපලු දරුවෙක් අත තුබූ කෙවිට්ටි දණ්ඩක් බිම ඔබා හිස මත්තේ ඇණ හිසපලා මැරුයේය."යි කියා නැවත: "ස්වාමීනි, නුබවහන්සේගේ ධර්මදේශනාවෙහි පැහැද ශබ්ද මාත්‍රයක් පමණ ඇසූ කුශලයෙන් සමෘද්ධවූ දිව්‍ය සමපත්තියද නළුනාටකාදී පරිවාර සමපත්තියද මේ දිව්‍ය සමූහයා අභිභවමින් දෙලොස් යොදුනෙක පැතිර පවත්නා අන්ධකාර විධ්වංශනය කොට බබලන්නාවූ ශරීරාලොකයද බලා වදළමැනව"යි කියා ඔහුගේ දිව්‍ය ඉසුරු සම්පත් ප්‍රකාශ කොට කියා එතැන්හි රැස්වූ පිරිසට හා බොහෝදෙනාට ධර්මශ්‍රවණමයකුශලය ප්‍රකාශකොට කියන්නේ "ස්වාමීනි, මද ඇසිල්ලක් බණ ඇසූ පමණකින් මෙතෙක් සැපත් ලැබුනුකල මේ ලොකහි යම්කිසි කෙනෙක් නුඹවහන්සේගේ ධර්මදේශනාව මා සේ නොව බොහෝ කලක් ඇසුවාහු වීනම් ඔවුන්ට වන්නාවූ ඉෂට විපාකය කියා නිමවාලිය නොහැක්කේය. ඒ සත්වයෝ සසර වසනතෙක්කල් මුළුල්ලෙහි කිසියම් සංසාර ව්‍යසනයකට නොපැමිණ දෙව්මිනිස් සැපත් විඳ කෙළවර මේ ලොකවාසීහු යම් තැනකට ගියාහු සොක නොකෙරෙද්ද, එබඳු, අචලස්ථානවූ ප්‍රණීතවූ අමෘතවූ මහානිර්වාණයට පැමිණෙන්නා හ""යි කියා, "දැන් එහි අනුසස් දක්නා පිණිස මොහොතක් කල් බණ ඇසූ මාගේ සම්පත් බලා වදළ මැනව"යි කීයේය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඒ දිව්‍ය පුත්‍රයාගේද සම්ප්‍රාප්ත පිරිස ගේද චරිතය

බලා විස්තරවශයෙන් ධර්මදෙශනාකොට වදාළ සේක. ඒ ධර්මදෙශනාවගේ කෙළවර ඒ දිව්‍යපුත්‍රයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. අනෙකුදු සුවාසූදහසක් ප්‍රාණීහු සඬර්මාමෘතපානය කොට අමාමහනිවන් දුටුවාහුය. ඉක්බිති ඒ මණ්ඩූක දිව්‍යපුත්‍රයා බුදුන් වැඳ අවසර ගෙන ප්‍රදක්ෂිණාකොට නැවත භික්ෂුසංඝයාට ද නමස්කාරකොට සහ පිරිවරින් දෙව්ලොවටම ගියේය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි මහාරථ වර්ගයෙහි
**මණ්ඩූක දිව්‍යපුත්‍ර විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

## 52. රේවතී විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පස්වැනිවූ මහාරථවර්ගයෙහි දෙවැනි වූ රෙවති විමාන වස්තුව නම් කවරැයත්-

සතරාමර ලොක ගුරු වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි බරණැස් නුවර සමීපයෙහි වූ බරණැස් රජහු විසින් න්‍යග්‍රොධ මුවරජහට දෙන ලද වැටුප් හා අභය දුන ඇති හෙයින් මිගදයනම් වූ ඉසිපතනාරාමයෙහිවැඩ වාසයකරණසේක. එසමයෙහි බරණැස්නුවර ශ්‍රද්ධාසම්පන්නවූ කුලයෙක තුනුරුවන් කෙරෙහි ප්‍රසන්නවූ ශ්‍රද්ධා සම්පන්න නන්දික නම් වූ උපාසකයෙක් ඇත්තේය. හෙතෙමෙ නිරන්තරයෙන් ආසනශාලාව හැමදීමය නහන බොන පැන් එලවා තැබීමය, දැහැටිදඬු එළවීමය. තෙමේ යම්තරම් දෙයකින් යැපී මධුරකොට දන්දීමය, යනාදීන් නොයෙක් ලෙසින් මහාසඞ්ඝයාට උපස්ථාන කරන්නේ, දුගී මගී යාචකයන්ටද දනපතිව දන්දෙන්නේය. එසමයෙහි සමීපගෙයක නන්දිකයන්ගේ මයිලනුවන් දූ වූ රෙවතී නම්වූ කුමාරිකාවක් ඇත්තිය. ඕ තොමෝ දන් නොදන්නීය, සිල් නොරක්නීය, බණ නොඅසන්නීය. නන්දිකයන්ගේ මවුපියෝ ඒ රෙවතී නන්දිකයන්ට සරණ පිණිස ගෙනෙනු කැමති වුවාහුය. ඕතොමෝ පව්ටු අදහස් ඇති හෙයින් නන්දිකයෝ නොකැමතිවිය. නන්දිකයන්ගේ මෑණියෝ රෙවතිය හට මෙසේ කිව. "දියණියනි, තෝ මේ ගෙට අවුත් සංඝයා වහන්සේ වැඩහිඳිනා භොජනශාලාව අලුත්ගොමයෙන් පිරිබඩගා හිඳිනා අසුන් පණවා භික්ෂූන් වහන්සේ වැඩිකල්හි නමස්කාරකොට පාත්‍රා ගෙන වඩා හිඳුවා ධබරාවෙන් පැන් පෙරාදී වැළඳූ කල්හි පාත්‍රා සොධා උපස්ථාන කරව.

මෙසේ කළ කල මපුතණුවන් සිත් ගත්තීනම් වේය˙යි කීහ. එබසට රෙවතී තොමෝ සැදැහැනැතත් සවාමිපුත්‍රයාසිත්ගන්නා පිණිස එසේම කළාය. ඉක්බිති මැණියෝ රෙවති අවවාදයෙහි පිහිටි බව නන්දිකයන්ට කියා නන්දිකයෝ යහපතැයි කියා ඉවසූ කල දවස් නියම කොට අවවාදකළහ එකල්හි නන්දිකයෝ රෙවතීයට මෙසේ කීහ ˙එම්බා සොඳුර භික්‍ෂු සංඝයාවහන්සේටද මවුපියන්ටද උපසථාන කරන්නී වී නම් තී මේ ගෙයි වසන්ට ලබන්නීය. එසේ හෙයින් නොපමාව වත් පිළිවෙත් කරව˙යි කීයේය. රෙවතී තෙමෝ නන්දිකයන්ගේ බස් අසා ˙යහපතැයි˙යි පිළිගෙන සවාමියා සිත්ගන්නා පිණිස නොබෝ දවසක් ශ්‍රද්ධා ඇති එකියක් සේ නන්දිකයන්ට අනුව පවත්නී කල්යාමකින් දරු දෙදෙනෙකු ලද්දීය. නොබෝ කලකින් නන්දිකයන්ගේ මවුපිය දෙදෙන කාලක්‍රියා කළාහුය. එකල්හි ඒ ගෙයි සියලුම ඉසුරුසම්පත් රෙවතීට හිමිවිය, නන්දිකයෝ දුගී මගී යාචකයන්ට ගෙදර දන්වැට තබා දන් දෙන්නේය. මහා සංඝයා වහන්සේටද දනපතීව මහදන් පැවැත්වූයේය. තවද නන්දිකයා ඉසිපතන විහාරාසන්නයෙහි ගබඩාසතරකින් ප්‍රතිමණ්ඩිතවූ චතුශ්ශාලාවක් කරවා එහි ඇඳ පුටු බිසි බිමෙබාහන කලල් පැදුරු ගිනිකබල් කළ කොතලා සැලි වලන් ආදී සෙනාසන භාණ්ඩයන් සපයා ඒ විහාරය පිළිගන්වන දවස් බුදුන් ප්‍රධානකොට ඇති මහාසඞසයා වහන්සේට මහත්කොට උදරතරව දන් දී ඉක්බිති බුදුන්ගේ ශ්‍රී හසතයෙහි පැන් වත්කොට විහාරය පිළිගැන්වූයේය. ඒ දක්ෂිණොදකය හා සමඟ විහාරය පිළිගැන්වූ කෙණෙහි තවුතිසා දිව්‍යලොකයෙහි දිගින් පුළුලින් සතලිස් අට ගවු පමණ ඇති සාරසියයක් ගවුඋස ඇති නොයෙක් මහල් ඇති දහස් ගණන් ගබඩා ඇති හිරු රැස් කලඹක්සේ බලන්නාවුන්ගේ ඇස් බමන්නාවූ සත් රුවන්මය සර්‍වාභරණයෙන් ජෝතිමත්ව බබලන්නාවූ නොයෙක් දහස්ගණන් දෙවඟනන් විසින් ගැවසීගත්තාවූ සප්තරත්නමය දිව්‍යප්‍රාසාදයෙක් පහළවිය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙහි වඩනාසේක් නන්දිකයන්ට ඒ පහළවූ දිව්‍යප්‍රාසාදය දැක තමන්වහන්සේට නමස්කාර පිණිස ආවා වූ දිව්‍යපුත්‍රයන් අතින් මෙසේ විචාළ සේක, ˙හිරුවිමණක් සේ ජොතිමත්ව බබලන්නාවූ මේ ප්‍රාසාදය කාගේ විමානයෙක්දැ?යි විචාරා වදළසේක. ඒ දිව්‍ය පුත්‍රයෝ උන්වහන්සේට උත්තරදෙන්නාහු ˙සවාමීනි, මේ ප්‍රාසාදය හිමියා නැත්තේය; හෙතෙම මිනිස්ලොව වසන්නේය; බරණැස් නුවර නන්දික නම් කෙළෙඹි පුත්‍රයෙක් සංඝයාවහන්සේ උදෙසා ඉසිපතන විහාරාසනනයෙහි ගබඩා සතරකින් ප්‍රතිමණ්ඩිතවූ චතුශ්ශාලාවක් කරවා පිළිගැන්විය ඔහට මේ ප්‍රාසාදය පහළවිය˙යි කීවාහුය. ඒ විමානයෙහි උපන්

දිව්‍යාඞ්ගනාවෝ තෙරුන්වහන්සේට නමස්කාරකොට කියන්නාහු, ස්වාමීනි, බරණැස්නුවර නන්දික නම් උපාසකයාට පරිචාරිකා වන පිණිස අපි මේ දිව්‍යවිමානයෙහි උපනුම්හ: ස්වාමීනි, නන්දිකයන්ට මෙසේ වදළමැනවි නන්දිකයෙනි, තොපට පරිචාරිකා වන පිණිස උපන් දිව්‍යාඞ්ගනාවෝ තෙපි මිනිස්ලොව කල්යවන හෙයින් කළකිරුණාවූ සිත් ඇත්තාහුය. දිව්‍යලොකසම්පත්තිය නම් මැටිභාජනයක් බිඳ රන්භාජනයක් ගන්නාක් මෙන් සතුටු එළවා මනවඩන්නේය˙යි කියා මේ දෙව් ලොවට එන්ට වදළ මැනවැයි˙ කිවාහුය. දිව්‍යාඞ්ගනාවන් කී බස් යහපතැයි පිළිගෙණ මහතෙරහු වහා දෙව්ලොවින් මිනිස්ලොවට අවුත් දම්සභා මණ්ඩපයෙහි සිව්වනක් පිරිස් මැද වැඩහුන් බුදුන් කරා එළඹැ මෙසේ විචාළසේක. ˙ස්වාමීනි, කරණලද කුශල් ඇතිව අප්‍රමාදව වසන කුල පුත්‍රයන් මිනිස් ලොව සිටියදීම දිව්‍යලොකයෙහි සම්පත් පහළවේදැ? යි විචාළ සේක. බුදුරජාණන් වහන්සේ, ˙මෞද්ගල්‍යායන ස්ථවිරයෙනි, නන්දිකයන්ට තවුතිසා දිව්‍යලොකයෙහි පහළවූ දිව්‍යසම්පත්තිය තා විසින් දක්නාලද්දේය. දැන් කුමක් පිණිස මා විචාරන්නෙහිදැ?˙යි වදළසේක එකල්හි මහතෙරහු, ˙එසේය, ස්වාමීනි, නන්දිකයන්ට පහළවූ දිවඉසුරු මා විසින් දක්නාලද්දේය˙යි දැන්වූසේක. එකල්හි බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කරන සේක්, ˙යම් සේ දේශාන්තරයකට ගිය පුරුෂයෙක් එනු අසා නෑයෝ මිත්‍රයො පෙරමගට ගොස්, මෙසේ ˙එව පුත්‍රයෙනි, මිත්‍රයෙනි, යනාදීන් ආමන්ත්‍රණය කෙරෙද්ද එමෙන් කරනලද කුශල් ඇති සත්පුරුෂයන් මෙලොවින් පරලොවට යනකල කුශල් නමැති ඥාතිමිත්‍රයෝ සම්පත් නමැති අතින් පිළිගෙන ආදර දූක්වා සතුටුවෙති.˙ ඒ බව දක්වනු පිණිස මේ ගාථා දෙකින් ධර්මදේශනා කළසේක.

˙චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං
තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතී ගණ්හනති පියං ඤාතිංච ආගතං˙ති.

යනු හෙයින් ˙යම් සේ පරදේශයට ගොස් බොහෝකලක් එහි වැස ලබන ලද ලාභසත්කාර ඇතිව යම් පුරුෂයෙක් සුව සේ ඒ ද, ඔහු දැක නෑයෝ ඉදිරියට ගොස් වැළඳගැන්මෙන් ද සිප ගැන්මෙන්ද ආ බව යහපත යනාදී ප්‍රිය බස් කියා විශේෂයෙන්ම සතුටු වෙද්ද, එමෙන් දන ශීලාදි වශයෙන් කරණ ලද කුශල් ඇති සත්පුරුෂයන්ද පරලොව යනකල කුශල් නමැති නෑයෝ පිළිගන්නාහුයි˙යි වදළ සේක. ඒ බණ අසා සතුටුව

ප්‍රීතීන් පිරුණාවූ ශරීර ඇති නන්දිකයෝ පෙර දවසට වඩා බොහෝ කොට දන්දෙමින් සිල්රකිමින් බොහෝ කුශල් කරන්නාහු වෙළඳම් පිණිස යනු කැමතිව එක් දවසක් රේවතිය ලඟට කැඳවා කියන්නාහු "සොඳුර මා විසින් භික්ෂු සංඝයාට හා දුගී මඟී යාචකයන්ට දෙනලද දනය මා සිටිනා සේ අප්‍රමාදව පවත්වා ලව"යි කීහ. ඒ රේවතීයද එබසට යහපතැයි කීවාය. මෙසේ අවවාද කොට නන්දික තෙම වෙළඳමට ගියේය. හෙතෙම යම්තැනෙක ලැගුම් ගෙන සිටිනේවීනම් භික්ෂු සංඝයාට හා දුගීමගී යාචකයන්ට විභවානුරූපව දන්දෙන්නේ රහතුන් වහන්සේලාද ඔහුට අනුකම්පා උපදවා දුරිනුදු අවුත් දන් පිළිගන්නා සේක්මය. රේවතියද නන්දිකයන් ගිය කීපදවසක් දනය පවත්වා යාචකයන්ට දෙන දනය නැතිකළාය. භික්ෂූන් වහන්සේලාටද කාඩි හා නිවුඩු සාලේ බත් දෙන්නීය. භික්ෂූන් වහන්සේ වැළඳූ කල්හි තමන් අනුභවකොට ඉතිරි බත්සුලු හා දියමස් ගොඩමස් කැවිලි හා ඇට කටු ආදිය විසුරුවා මිනිසුන්ට දක්වා මෙසේ කියයි. "ශ්‍රමණයන්ගේ කටයුතු හැමදෙනාම බලව්. අපි සැදැහැයෙන් දෙනලද දනය මෙසේ වළඳන්ට සුදුසුදැ?යි කියා සංඝයාගේ නුගුණ මනුෂ්‍යයන්ට දක්වන්නීය. වෙළඳමෙන් ලබන ලද ලාභ සත්කාර ඇතිව එන්නාවූ නන්දිකයෝ එපවත් අසා නොසතුටු සිත් ඇතිව රේවතිය ගෙයින් පිටත්කරවා ගෙට වන්නීය. දෙවන දවස් බුදුපාමොක් මහා සංඝයාට දන් දී එතැන් පටන් භික්ෂූන්ට හා අනාථ යාචකයන්ට නිති දන් පැවැත්වූයේය. නැවත තමාගේ යහලුවන් විසින් යාච්ඤාකොට ගෙට කැඳවා ගෙන එන ලද රේවතියට බත් පිළි පමණක් දී ඉන්ට සැලැස් විය. නන්දිකයෝ අප්‍රමාදව කුශල් කොට එයින් නොබෝ දවසකින් කාලක්‍රියාකොට තව්තිසා දෙව්ලොව තමන්ට පහළවූ දිව්‍ය විමානයෙහිම උපන්හ. රේවතී වනාහි නන්දිකයන් මළ පසු සියලු දන්වැට නැතිකොට මේ ශ්‍රමණයන් නිසා මාගේ ලාභසත්කාර නැතිවියයි සංඝයා කෙරෙහි වෛරබැඳ භික්ෂූන්ට ආක්‍රොශ පරිභව බෙණෙමින් ඇවිදිනීය. එකල්හි වෙසවුණු මහරජ්ජුරුවෝ යක්ෂයන් දෙදෙනකු කැඳවා මෙසේ කීහ. "යව තොපි ගොස් මෙයින් සත්වන දවස ජීවත්ව සිටියදිම රේවතී නරකයට දමන්නෙම්හයි කියා සියලු බරණැස් නුවරට ඇසෙන සේ අඬගසවයි"යි නියෝග කළහ. ඒ යක්ෂයෝ ගොස්, මෙයින් "සත්වන දවස්හි ජීවත්ව සිටියදීම රේවති නරකයට දමන්නෙමු පාපිෂ්ටවූ අසත්පුරුෂවූ රේවතීට වන්නාවූ අනර්ථය නුවරවාසීහු දැනගෙන මේ රේවතී මෙන් පව් නොකොට පින් කෙරෙත්වා"යි උද්ඝොෂණය කළාහුය. ඒ හඬ අසා මනුෂ්‍යයෝ භයින් තැතිගෙන කටයුතු නොකටයුතු සලකාගත නොහී තම තමන්ගේ ඉෂ්ට දෙවතා නමස්කාර කෙරෙමින්

වෙවුල වෙවුලා ඒ ඒ අත දිවමින් චඤ්චලව මහත්වූ සංවේගයට පැමිණියාහ. රේවති වනාහි ප්‍රාසාදයට නැගී දෙර වසාගෙන හුන්නීය. ඉක්බිති සත්වන දවස් ඇගේ අකුශල කර්‍මයා විසින් චොදනා කරනලදුව වෙසවුණු මහ රජහු විසින් අණවා එවන ලද යක්‍ෂයෝ දෙදෙන අඤ්ජනකූට පර්‍වත මෙන් ඉතා නිල්වූ භයානකවූ මහත් ශරීර ඇතිව පර්‍වත විවරයක් මෙන් මහත්වූ මුඛයක් ඇත්තාවූ දෙක පොළයෙන් නික්ම තිබෙන්නාවූ මහත් දළ ඇත්තාවූ මැදින් බිඳී අගින් පැතළීවූ මහත්වූ නාසිකා ඇත්තාවූ සලා දිදී ඇවිලෙන ගිනිවැටක් සේ කෘරවූ තඹ රැවුල් ඇත්තාවූ නිල් මේකුලක්සේ මහත් උදර ඇත්තාවූ තියුණු මුවහත් ඇති කඩුපෙලක් සේ දික්ව රුධිර ධාරාවෙන් ගැවසී ගත්තාවූ රත්වූ නිය පතර ඇත්තාවූ රැලි සහිත පලල් නළල්තල ඇත්තාවූ පිටිතොල මස් කකා මනුෂ්‍යමාංස භක්‍ෂණය කොට ලේ පානය කරන්නාවූ භයානක චණ්ඩ පරුෂ ස්වභාව ඇතිව මතු මහල්තලයෙහි උන් රේවතිය කරා අවුත් මෙසේ කීහ.

"උට්ඨෙහි රෙවතෙ සුපාප ධම්මෙ
අපාරුතං ද්වාරං අදන සීලෙ,
නෙස්සාම තං යත්ථ ථුනන්ති දුග්ගතා
සමප්පිතා නෙරයිකා දුක්ඛෙන.
ඉච්චෙව වත්වාන යමස්ස දූතා
තෙ වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා,
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතං
පක්කාමයුං දෙවගණස්ස සන්තිකෙ"ති.

යනු හෙයින් "එම්බා පවිටුවූ රේවතිය, මේ ප්‍රාසාදය නරක දුකින් ගලවන්ට නොහැකි වන්නේය. හුන් තැනින් වහා නැඟී සිටුව. යම් හෙයකින් ආර්‍ය්‍යයන් වහන්සේට ආක්‍රොශ පරිභව බෙණෙමින් තීගේ දෙර සමීපයට ආ යාචකයන්ට ආහාර පානාදි වශයෙන් කිසිවක් නොදී දඬු මුගුරු කැටපහන් ආදියෙන් තලා මරා එලවමින් අනුන්ගේ සම්පත් නොඉවසන සුලුවූ තමාගේ සම්පත් සඟවා මසුරුවූ ශඨප්‍රයෝගයෙන් හෝ කෛරාටික ගුණයෙන් යෙදී තුනුරුවන් ගුණ නොසලකා දන ශීලාදි කිසියම් කුශල කර්‍මයක් නොකළාද එබඳු ලාමක ස්වභාව ඇති තී වැනි හීන සත්වයන්ට නරකවල දෙර නොවසන ලද්දේය. තී වැන්නන්ට නරකයම වාසස්ථාන වන්නේය. මේ සත්වලොකයෙහි දන පවතීව දන් දෙන්නාවූ සිල්වත් මසුරුනොවන්නවූ තීගේ ස්වාමිපුත්‍රයන් වැනි පින් කළවුන්ට ම ස්වර්‍ගලොකයෙහි වාසයස්ථාන වන්නේය. එසේ හෙයින් පින්කළවුන්ට ස්වර්‍ගයත් පව්කළවුන්ට අපායත් නියතවා විනා මේ

ප්‍රාසාදය තිට රක්‍ෂා ස්ථානයක් නොවෙයි. මෙහි මොහොතකුදු නොයිඳ පළා එව එසේ නොව මෙතැන්හි හිඳිනට නොදෙම්හ වහා නැගී සිටුව"යි කියා වෙන වෙනම අත්දෙක ගසා අල්වා ගෙන බරණැස් නුවර මුළුල්ලෙහි,"පව්කළවුන් ඉදිරි විඳිනා දුක් මෙසේය"යි කියන්නාසේ වීථියෙන් වීථියට නුවර මුළුල්ලෙහි ගල්මුල් ආදියෙහි ඇණ බිමලා ඇද භ්‍රමණයකොට උකුස්සකු ගත්කකුළු පැටවියක් සේ අහසට නගාගෙන තවුතිසා භවනයෙහි නන්දිකයන්ගේ විමන් දෙර සිටවූහ. එසේ සිටුවන ලද ඒ රේවතී තොමෝ සූර්‍ය්‍යමණ්ඩලය සේ ඉතා ප්‍රභාමත් ව බබලන්නාවූ විමානය දැක මෙසේ විචාළීය.

ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
ව්‍යම්හං සුභං කඤ්චනජාලච්ඡන්නං,
කස්සෙ තමාකිණ්ණජනං විමානං
සුරියස්ස රංසීරිව ජොතමානං.
නාරිගණා චන්දන සාරලිත්තා
උභතො විමානං උපසොභයන්ති,
තං දිස්සති සුරිය සමාන වණ්ණං
කො මොදති සග්ගපත්තො විමානෙ"ති.

යනුහෙයින්, "ආකාශයෙහි දහසක් රැසින් දිළියෙන්නාවූ හිරු විමනක්සේ රන්දැල් වසා නොයෙක් රශ්මිජාලායෙන් හා සප්තවිධ රත්නයෙන් ආකීර්ණව ජොතිමත්ව බබළන්නාවූ තෙල පෙනෙන විමානය කාගේ විමානයෙක්ද? යෙල යාළක් පමණ සඳුන් සුවඳ විලවුන් ගල්වන ලද ශරීර ඇතිව දිවසළු පැලද සත්රුවනින් විසිතුරු වූ සර්වාභරණයෙන් සැරහී මේ විමානය උභයපාර්ශ්වයෙහි සත්රුවනින් විසිතුරු චාමර ගෙන දෙපස සලමින් සිටිති. සමහරු ගායනාකෙරෙති. භාවනාව ලීලාවෙන් යුත් නොයෙක් දහස් ගණන් දිව්‍යාඞ්ගනාවෝ දෙපස සිට දිව්‍ය පුත්‍රයා සතුටු කරවති, මෙසේ මේ පරිවාර දිව්‍ය සේනාව මධ්‍යයෙහි සූර්‍ය්‍ය මණ්ඩලය සේ මේ ප්‍රාසාදයෙහි සුව විඳිනුයේ කවරෙක්දඃ කොයි සිට ස්වර්ගලොකප්‍රාප්තවූ කෙනෙක් ද?"යි කියා යක්‍ෂයන් අතින් විචාළීය. එසේ විචාරන ලද යක්‍ෂයෝ මෙසේ කීහු.

"බාරාණසියං නන්දියො නාමාසි උපාසකො
අමච්ඡරී දානපතී වදඤ්ඤූ,
තස්සෙ තමාකිණ්ණජනං විමානං

සූරියස්ස රංසිරිව ජොතමානං
නාරිගණා චන්දනසාරලිත්තං
උභතො විමානං උපසොභයන්ති:
තං දිස්සති සුරියසමානවණ්ණං
සො මොදතී සග්ගපපත්තො විමානෙ.
නන්දියස්සාහං භරියා
ආගාරිනී සබ්බකුලස්ස ඉස්සරා,
භත්තු විමානෙ රමිස්සාමි දානහං
න පත්ථයෙ නිරයං දස්සනාය.
එසො තෙ නිරයො සුපාපධම්මෙ
පුඤ්ඤං තයා අකතං ජීවලොකෙ,
න හී මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගුපගානං ලභති සහව්‍යතං"ති.

යනුහෙයින්, "මිනිස්ලොව බරණැස්නුවර මසුරුනොව දානපතීව දන් දුන්නාවූ බුඩාදී රත්නත්‍රයෙහි පහන්සිත් ඇති සිල්වත්වූ නන්දික නම් උපසකයෙක් විය. ඕහට දහසක් රැසින් දිලියෙන හිරුමඩලක් මෙන් බබලන්නාවූ අනල්ප වූ දිව්‍ය වූ චන්දන කුඞකුමාදි සාරගන්ධයෙන් අඞගරාග ගෙන සිටි දිව්‍ය ස්ත්‍රීන්ගෙන් ගැවසීගත් මේ දිව්‍යප්‍රාසාදය පහළවීය: එහි බලන්නවුන්ගේ ඇසට රසාඤ්ජනයක් බඳුවූ දිව්‍යමය නිලුපුල්පෙති වැනිවූ දිගුපුළුල් සුනිල් නෙතින් හා සියලු අවයව සම්පත්තින් සැරහුනාවූ භාස්කරයාසේ භාවභාව ලීලා විලාශයෙන් යුත් නොයෙක් දහස් ගණන් දිව්‍යාඞගනාවෝ සළුන් විලවුන් ගෙන ඔහු පිරිවරා සිටිති. මෙසේ දෙපස සැදි සිටි දිවපිරිස් මැද සූර්‍ය්‍යයාසේ බබලන්නාවූ තෙල පෙනෙන්නාවූ දිව්‍යපුත්‍රයා නම් නන්දික උපාසකයාය"යි කීවාහුය. එබස් අසා රෙවතිය කියන්නී, "එසේවී නම්, පින්වත්නි, මම ඒ නන්දිකයන්ගේ ගෙයි එක්ව ඉසුරු විඳි ස්ත්‍රියක්මි. ඒ නන්දිකයෝ මාගේ ස්වාමි පුත්‍රයාය. එසේ හෙයින් මාගේ ස්වාමියාගේ විමන්හි සිත් අලවමි. දැන් මම නරකය දක්නටද පැසෙන්නටද නොකමැත්තෙමිය"යි කීවාය. එසේ කී රෙවතියට යක්ෂයෝ කියන්නාහු, "එම්බල, රෙවතිය තීගේ ප්‍රාර්ථනාවෙන් කම් නැත. නන්දික දිව්‍ය පුත්‍රයාගේ සිත් කලුවූ නිර්මල වූ කිසිකලෙකත් තී කරා නොපැමිණෙන්නාවූ ස්වභාව ඇති මේ රත්නප්‍රාසදය තී කුමක් පිණිස ප්‍රාර්ථනාකෙරේද? එසේ නොපතව. තී නරකයට යනු කැමති වේවයි නොකමැතිවේවයි තීගේ පැතීමෙන් ප්‍රයෝජන නැතැ"යි කියා සංසවක

නම් නිරය සමීපයට ගෙනගොස් සිටුවා කියන්නාහු, "රෙවතිය, තී විසින් මනුෂ්‍ය ලොකයෙහිදි සවල්‍ප මාත්‍රවූද කුශල කර්‍මයක් නොකරනලද්දේය. එසේ පින් නොකරන තමාගේ සම්පත් සඟවන සුලුවූ මසුරු මලයෙන් යුක්තවූ අනුන් කෙරෙහි වෙෂ ඉපදවීමෙන් හා තමාගේ සිත හටගත් ලොභාදි පාපධර්‍මයන් හා ලාමක සවභාව ඇති තී වැනි සත්‍වයෝ චනාහි කුශල් කොට දිව්‍යලොකයෙහි මහත්වූ දිව ඉසුරු විඳිනා දෙවියන් හා සමග වාසයකරන්නට නොලැබෙ"යි කියා නැවත, තී බොහෝ කලක් මහදුක් විඳීමට වාසස්ථානයවූ මේ සංසවක නම් නරකයෙහි පැසීමට නියත වන්නීය"යි කියා ඒ යක්‍ෂයෝ දෙදෙන එතැන්හිම අන්තර්‍ධානවූවාහුය. එදවස් යමපල්හු දෙදෙනෙක් අවුත් ඒ සංසවක නම් ගූථ නරකයෙහි ලන පිණිස අදනාකල්හි ඒ රෙවතිය යමපලූන් අතින් මෙසේ විචාළීය.

"කිනතු ගූථඤච මුත්තඤච අසුචි පතිදිසසති,
දුගගනධං කිමිදං මීළහං කිමෙත උපවායතී"ති.

යනුහෙයින්, "ආහාර මලයෙන් හා මුත්‍රාදියෙන් ද ඔරු නැවූ සා මහත් පණුවන් විසින් ගැවසී ගත්තාවූ නාසිකාව පැළී යන තරම් දුගඳීනධ ඇති මේ මහත් අසුචි වළක් දක්නා ලැබෙයි. මෙසේ දුර්ගන්ධ හමන්නාවූ අසුචි වළ කීමෙක්දැ?"යි විචාළීය. එසේ විචාළ රෙවතියට යමපල්ලූ නරකයේ නමද දිග පුළුල හා ආයුෂයද ප්‍රකාශකොට කියන්නාහු,

"එස සංසවකො නාම ගමභීරො සතපොරිසො,
යත්‍ථ වසසසහසසානි තුවං පචචසි රෙවතෙ"ති

යනුහෙයින්, "මේ සංසවක නම් නරකය සියක් යොදුන් පමණ උසවන්නේය. සියක් යොදුන් වට ඇති සියක් යොදුන් තැන් උන්නවුන් ඉස් පැළීයන පමණ දුර්ගන්ධ ඇති කකියනලද ගූථනරකයෙහි හුනුසත්‍වයා සුවිමුබවූ ලොහොතුඩු වැනි තුඩු ඇති ඔරු නැවූ පමණ පණුවෝ වටලාගෙන හාත්පසින් සිවි සිඳ මස් සිඳ නහර ඇට සිඳ මස් ලිය ලියා කමින් සකල ශරීරය ගුල්ලන් විසින් වීදිනලද දණ්ඩක් පරිද්දෙන් සිදුරුකොට ඇට මුල් කති. මිනිස්ලොව ආයුගණනින් තුන්කෙළ සැට ලක්‍ෂයක් අවුරුදු මේ නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නිසා දවසින් තිස්දවස් මස්කොට දෙළොස්මස් අවුරුදු කොට ඒ අවුරුද්දෙන් මේ නරකයෙහි දහසක් අවුරුදු ආයු වන්නේය. එම්බා රෙවතිය, තී ඒ නරකයෙහි නොයෙක් දහස් ගණන් අවුරුදු පැසෙන්නීය"යි කියා යමපලූන් විසින් කියනලද කල්හි රෙවතී තොමෝ තමන් ඒ නරකයෙහි උපදනට හෙතුවූ අකුසල කර්‍මය විචාරන්නී මෙසේ විචාළීය.

"කිනතු කායෙන වාචාය මනසා දුක්කතං කතං,
කෙන සංසවකො ලඩො ගම්භීරො සතපොරිසො"ති.

යනුහෙයින්, "පින්වත්නි, කයින්ද වචසින්ද මනසින්දැයි යන මේ ත්‍රිවිධ දුශ්චරිතයන් අතුරෙන් කවර නම් අකුශල කර්මයක් හේතුකොටගෙන සියක් පුරුෂ ප්‍රමාණ ගැඹුරුවූ සංසවක නම් මේ අසූචි නරකයමා විසින් ලබන ලද්දේද? කවර අකුශලයකින් මේ නරකයෙහි උපදිම්දැ?"යි විචාළීය. එකල්හි යම පල්හු ඒ අකුශල කර්මය, ප්‍රකාශකොට කියන්නාහු,

"සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ,
මුසාවාදෙන වඤ්චෙසි තං පාපං පකතං තයා" ති.

යනුහෙයින්, "රේවතීය තී යම් වෙෂ මොහයක් කරණ කොටගෙන සන්සිඳුවනලද පාපයන් ඇතිහෙයින් ශ්‍රමණ නම් වූ ද බාහිතකිරීම් වශයෙන් නසනලද ලොභාදී ධර්මයන් ඇතීහෙයින් බ්‍රාහ්මණ නම් වූද එයින් අන්‍යවූ අනාථයන්ද යන මේ හැමදෙනාම බොරුවෙන් රවටා වඤ්චාකෙළේද, තී විසින් එබඳු පව්වූකමක් කරණලද්දේය. එහෙයින් මේ සත්වලොකයෙහි යම් කිසිවෙක් කායාදී චාරත්‍රයෙන් ප්‍රාණඝාතාදී අකුසල් කෙළේවිනම් මෙබඳු මහත් දුකට පැමිණෙන්නේය. තීද කායාදී චාරත්‍රයෙන් මහත් අකුසල් කළාය. එසේ හෙයින් මේ නරකයෙහි පැසෙන්නෙහිය"යි එහි පැසෙන්නට හෙතුවූ අකුශලකර්මය ප්‍රකාශ කොට කියා නැවත කියන්නාහු,

"තෙන සංසවකො ලඩො ගම්භීරො සතපොරිසො,
තත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙ"ති.

යම් අකුශල කර්මයකින් ගැඹුරෙන් සියක් පුරුෂයන් උස ඇති දහසක් අවුරුද්දට ආයු ඇති නිරන්තරයෙන් ගූථ මූත්‍රාදි යෙන් අසූචි වහනය වන හෙයින් සංසවක නම් වූ නරකයෙක් ඇද්ද, ඒ නරකයෙහි අකුශලකර්ම බලයෙන් රෙවතිය, තී පැසෙන්නෙහිය"යි කියන්නාහු මේ මතු කියන ගාථාවෙන් මෙසේ කීහ.

"හත්ථෙපි ඡින්දන්ති අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්ති අථොපි නාසං,
අථොපි කාකොළගණා සමෙච්ච
සංගම්ම ඛාදන්ති විඵන්දමානං"ති.

යනාදීන් කියන්නාහු, "රෙවතිය, තී වනාහි තුන් ගවු උස ඇති ශරීරයෙන් මේ නරකයෙහි නොයෙක් දහස් ගණන් අවුරුදු පැසෙන්නෙහිය.

තී විසින් කරනලද අකුශල කර්‍මය යම් පමණ කාලයක් නොගෙවේද එපමණකල් පැසි මහ දුක් විඳිනාවූ තීගේ අත්පා කන් නාසා අඟපසඟ තියුණු මුවහත් ඇති හස්ති තොමර මුද්ගරාදි නානාප්‍රකාර ආයුධ ගෙන කපති, පළති, ඉරති, තළති. නැවත කැපූ කැපූ තන්හි මස් හටගන්නේය. තවද තීගේ තුන් ගවුදිග ශරීරයෙහි නොයෙක් දහස් ගණන් කවුඩෝ තල්කඳ සා ගිනි ගෙන දිළියෙන අයොමය තුඩින් මස් විද විද ඉරා කති. නැවත කර්‍මබලයෙන් කෑ තන් මස් පිරෙයි' යනාදීන් එහි දුක් කම්කටුල් ඒ යම පලුන් දෙදෙනා විසින් කී කල්හි; ඒ රෙවතිය 'මිනිස්ලොව ට කුශල් කරනු පිණිස යෙමිය' යාච්ඤාකරන්නී මෙසේ කියා ඇඬූහ,

"සාධූ ඛො මං පටිනෙථ කාහාමි කුසලං බහුං,
දනෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච,
යං කත්වා සුඛිතා හොන්ති න ච පච්ඡානුතප්පරෙ"ති.

. යනුහෙයින්, 'සත්වයෝ යම් කුශලයෙක් කොට නිවන් දැකීමෙන් සුවපත් වෙද්ද, එබඳුවූ දන ශීලාදී කුශල් කෙරෙමි; මිනිස් ලොවට හැරිය මැනව'යි කීහ. එකල්හි නිරයපාලයෝ මෙසේ කීවාහුය.

"පුරෙ තුවං පමජ්ජිත්වා ඉදනි පරිදෙවසි,
සයං කතානං කම්මානං විපාකං අනුභොස්සසී"ති.
'රෙවතිය, තී පෙර කුසල් නොකොට ප්‍රමාද විහාරීව දැන් කුමක් පිණිස හඬන්නෙහිද? තී විසින් කළාවූ අකුශල කර්‍මය තීම විඳුව'යි කියා,

ඉච්චෙවං විප්පලපන්තිං ඵන්දමානං තතො තතො
ඛිපිංසු නිරයෙ ඝොරෙ උද්ධපාදං අවං සිරා"ති.

නොයෙක් විලාප කිය කියා ඔබිනොබ වැටෙමින් අඬන්නා වූ රෙවතියගේ දෙකකුල ගසා අල්වා ඌර්ධ්වපාදව අධොශීර්ෂ කොට කප් ගින්නක් මෙන් නිරන්තරයෙන් සලා ගුගුරා දශදිග දිවන ගිනි සිලු ඇති සංසවක නම් ගූථ නරකයෙහි හෙලූහ. ඉක්බිති භික්ෂූන් වහන්සේ රෙවතී යක්ෂයන් ගෙනගිය බව බුදුරජාණන් වහන්සේට දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ 'එම්බා මහණෙනි, ඒ රෙවතිය වෙසවුණු මහ රජුගෙන් නියෝග ලත් යක්ෂයන් දෙදෙනෙක් අවුත් අල්වාගෙන ඒ සා මහත් බරණැස් නුවර වීථියෙන් වීථියෙහි ඇදගෙන ගොස් තව්තිසා දෙව්ලොව නන්දිකයන්ගේ විමානය දක්වා සංසවක නම් ගූථ නරකය සමීපයට ගෙන ගොස් තව්තිසා දෙව්ලොව නන්දිකයන්ගේ විමානය

දක්වා සංසවක නම් ගුථ නරකය සමීපයට ගෙන ගොස් සිටුවා අන්තර්ධාන වූහ. ඒ නරකයෙහි වසන යමපල්හු දෙදෙනෙක් අවුත් අල්වාගෙන ගොස් නරකයට දැමූ හ'යි මෙසේ මේ ප්‍රවෘත්තිය විස්තර වශයෙන් වදරා මත්තෙහි චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළ සේක. ඒ දේශනාවසානයෙහි බොහෝදෙනා සෝවාන් සකෘදගාමි, අනාගාමි, අර්හත් යන සතර මඟ සතර ඵලයට පැමිණියාහුය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මහාරථ වර්ගයෙහි
**රේවතී විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

## 53. ඡත්‍ර මානවක විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථ වර්ගයෙහි තෙවැනි වූ ඡත්‍රමානවක විමාන වස්තුව නම් කවරැ යත්:-

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩවසන සමයෙහි සෙතව්‍ය නුවර ඡත්‍ර නම් බමුණු කුමාරයෙක් උක්කට්ඨා නුවර පොක්ඛරසාති නම් බ්‍රාහමණයා කරා ගොස් ශිල්ප ඉගෙන නිමවා නැවත සෙතව්‍ය නුවරට ගොස් මවුපියන්ට එපවත් කියා ගුරු පඬුරු පිණිස කහවණු දහසක් ගෙන උක්කට්ඨ නුවර පොක්ඛරසාති නම් බමුණා කරා යමින් සටියේය. එසමයෙහිබුදු රජාණෝ එදවස් අළුයම් වේලෙහි ඡත්‍ර මාණවකයා දැක වදරා ඒ මාර්ගයෙහි රුකක් මුල වැඩහුන් සේක. ඡත්‍රමාණවකයා මග යමින් සිට බුදුන් දැක සමීපයට ගොස් බුදුන්ගෙන් බණ අසා සරණ සීලයෙහි පිහිටා තුනුරුවන් සිහිකරමින් ඒ මගට බැස යන කල සොරු දැක විද මැරූහ. ඒ කුමාරයා කාලක්‍රියාකොට තව්තිසා දෙව්ලොව තිස් යොදුන් රන්විමනෙක උපන්නේය. කුමාරයා මළ පවත් අසා මව්පියන් හා සෙතව්‍ය නුවර වාසීහුද රැස්ව මහත් සමාගමෙක් විය බුදුරජාණෝ ද ඒ ස්ථානයට වැඩි සේක එකල්හි ඡත්‍ර නම් දිව්‍යපුත්‍රයා විමානය හා සමග දෙව් ලොවින් අවුත් බුදුන් වැද එකත්පස්ව සිටියේය. බුදුරජාණෝ දිව්‍යපුත්‍රයාට හා සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළ සේක. ඒ බණ අසා බොහෝ සත්වයෝ සතර මග සතර ඵලයට පැමිණියාහ. බුදුරජාණෝ ජේතවනාරාමයට වැඩ ඡත්‍ර නම් දිව්‍ය පුත්‍රයාගේ විමානය වර්ණනාකොට සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළ සේක. ඒ දෙශනාව බොහෝදෙනාට සාත්ථක විය. මෙහි විස්තර ශීල පරිච්ඡේදයෙන් අසා දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මහාරථ වර්ගයෙහි
**ඡත්‍ර මාණවක විමාන වස්තු වර්ණනාව**
සංක්ෂේපයෙන් කියා නිමවන ලදී.

## 54. කක්ටක රසදයක විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථ වර්ගයෙහි සතරවැනි කර්කටකරස දයක විමාන වස්තුව නම් කවරයත්:-

සර්වලොකෛකනාථවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ශ්‍රද්ධාවෙන් පැවිදිව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ආරබ්ධ විපස්සක වූ භික්ෂු කෙනකුන් වහන්සේ බුදුන් කෙරෙන් කර්මස්ථාන ගෙන වීර්‍ය්‍යකරණසේක් කර්ණයෙහි පහරණ ලද රුජාවකින් පෙළෙන ලද ශරීර ඇතිව සිත එකඟකොට ගත නොහැක්කා වූ කෙලෙසුන් තුනීකිරීමට සුදුසු නොවන්නාවූ කයක් ඇති බැවින් විදර්‍ශනා භාවනා කිරීමට උත්සාහ කරන්ට නොහැකිවන සේක. වෛද්‍යවරුන් විසිනුදු විධි වූ පරිද්දෙන් බෙහෙත් කොටත් ඒ රොගය එාසු නොවූයේය. එබැවින් ඒ භික්ෂූන් වහන්සේ බුදුන්ට එපවත් කියන සේක, "ස්වාමිනි, මාගේ කණෑ හටගත් රොගය නිසා කර්මස්ථානයන් සිහිනොහැර සිත එකඟකොටගත නොහෙමි කී සේක. එකල්හි බුදුරජාණන්වහන්සේ උන්වහන්සේ ගේ හෙතු සම්පත් ඇති නියාවත් රොගය නිසා අධිගමයට අන්තරාය වන නියාවත් කර්කටකරස භොජනයෙන් කර්ණරොගය හා කෙලශ රොගය සන්සිඳෙන නියාවත් සර්වඥතා ඥානයෙන් දැක වදරා කකුළුරස භොජනය සැපයයි කියා දැන කැප වශයෙන් මේ භොජනය කෙසේ ලැබේදැයි සිතා එක්තරා කෙත් පාලකයෙක් කකුළුරස පිසන්නා දැක ඒ කෙත් පාලකයාට වන වැඩත් දැක උන්වහන්සේට වදරණ සේක, "මහණ තෝ මගධ ක්ෂෙත්‍රයට පිඬු පිණිස යව"යි වදාළ සේක. බොහෝ කල් දක්නා ලද බුදුරජාණන් වහන්සේ විසින් මතුවන වැඩ දක්නා ලදැයි සිතා යහපතැයි කියා බුදුන් වදාළ වචනය මුදුනෙන් පිළි ගෙන බුදුන් වැඳ අවසර ගෙන කයින් සිවුර හා අතින් පාත්‍රය ගෙන මගධ රට කෙතට වැඩ නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා කෙත් පාලකයෙකුගේ දෙර සමීපයෙහි වැඩසිටි සේක. එකල කෙත් පාලකයා කර්කටක රස හා බත් පිස, මඳක් කල් යවා බත් අනුභව කෙරෙමි"යි සිතා හුන්නේ ඒ තෙරුන් වහන්සේ දැක සතුටුව පාත්‍රය ගෙන ඔවුන්ගේ වාසභවනයෙහි ආසනයක්

පණවා පැණවූ ආසනයෙහි තෙරුන් වහන්සේ වඩා හිඳුවා කකුළු රස භොජනය පිළිගැන්විය. තෙරුන් වහන්සේ ඒ භොජනය මඳක් වැළඳූ කෙණෙහි පහරණ ලද රැජාව සන්සිඳී ග්‍රීෂ්ම කාලයෙහි පැන් කළ සියයක් වත්කළා සේ ශරීරය සිහිල් වූයේය. තෙරුන් වහන්සේ කයට සැප ආහාර ලැබීමෙන් චිත්ත පහසුව ලැබ විදර්ශනා වශයෙන් සිත නිර්වාණයට යොමුකොට නමන්නේය. භොජනය වළඳ නිමවන්ට පළමුවෙන් ආශ්‍රවක්‍ෂයකරාභිඥනයෙන් නිරවශෙෂකොට සකල කෙලශයන් නසා රහත් ඵලයෙහි පිහිටා කෙත්පාලකයාට මෙසේ වදළසේක "එම්බා උපාසකය තාගේ පිණ්ඩපාත දනයෙන් මාගේ රෝගය සන්සිඳී කයත් සිතත් යහපත්විය. තොපද මේ කුශකර්මඵලයෙන් හෙවත් මේ කුශලය හේතුකොටගෙන පහවූ කායචිත්ත රෝග ඇතිව නිදුක් නිරොගී වෙව"යි කියා අනුමෙවෙනි බණ වදරා වැඩිසේක. කෙත රක්නා තැනැත්තේ එයින් පසු නොබෝකලකින් කාලක්‍රියාකොට හාත්පසින් උස්ව නැංගාවූ උතුම්වූ පද්මරාග මාණික්‍යමය ටැම් ඇත්තාවූ සවර්ණ වර්ණමය වූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ වෛදූර්‍ය්‍යමාණික්‍යමය ගබඩා ඇති දෙළොස් යොදුන් දිව්‍ය විමානයෙක මැණික්මය ගෙයක උපන්නේය. ඔහු විසින් පූර්වජාතියෙහි රැස්කරනලද කුශල කර්මය ප්‍රකාශකරණු පිණිස කුශල කර්මයෙන් නිර්මිත වූ මුතු සාල්ලෙක රන්වන් කකුළුවෙක් එළි සිටියේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනා සේක් තුන් ගවු උස දිව්‍යාත්ම භාවයක් ඇතිව සර්වාභරණයෙන් සැරහී දහසක් දිව්‍යස්ත්‍රීන් පිරිවරා හිරු සඳුසේ මහත්වූ දිව්‍යඍද්ධියෙන් දිළියෙන්නාවූ දිව්‍යපුත්‍රයා දැක පූර්වජාතියෙහි කළාවූ කුශල කර්මය ප්‍රකාශකරවනු කැමතිව මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො වාදසයොජනානි,
කූටාගාරා සත්තසතා උළාරා,
වෙළුරියත්ථම්භා රුචකත්ථ තා සුභා
තත්ථච්ඡසි පිවසි ඛාදසී ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගු,
දිබ්බාරසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියො ච නච්චන්ති සුවණ්ණඡන්නා"-පෙ-

යනුහෙයින්, "හත්පසින් උස්ව නැංගාවූ පද්මරාග මිණි මය ටැම් ඇත්තාවූ උදරතර විපුල වූ සත්සියයක් පමණ සවණීමය වූ කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ වෛදූය්‍ය මිණිමය ගබඩා වෙන් උප සොභිත වූ දෙළොස් යොදුන් පමණ මහත්වූ දිව්‍ය විමානයක් හා ඒ විමානයෙහි වෛදූය්‍ය මිණිමය ගබඩාවෙහි රන් පුවරු මත්තෙහි සද තිබෙන්නාවූ දිව්‍ය රස භොජනයෙන් හා සියුම් මොලොක් සුවපහස් ඇති ආස්තරණ අතුට සුවඳ මලින් සරහා තිබෙන්නාවූ ශ්‍රී යහනින් හා සවණීාභරණාදී නොයෙක් අලඞකාරයෙන් සැරහී ශ්‍රවණීයවූ මධුර නාද පවත්වා බෙර වීණා වාද්‍යාදියෙන් ගායනාකෙරෙමින් නටන්නාවූ නළුනාටකාදීන් හා රූපශබ්දදි පඤචකාම සමපත්ති යෙන් අඩුවක් නැත්තාවූ මෙබඳුවූ දිව්‍ය සමපත්තියක් ලැබීමට තා විසින් පූවීජාතියෙහි කරණලද කුශලය කවරේද"යි විචාරා වදළසේක. මෙසේ මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"සතිං සමුපපාදකරො වාරෙ කකකටකො ඨිතො,
නිටඨිතො ජාතරූපසස සොභති දසපාදකො.

යනුහෙයින් සණරණින් නිමියාවූ රන්කඩක් වැනිවූ කයක් ඇත්තාවූ එකෙකි පාශ්වයෙක්හි පස් පස් පයක් බැගින් දෙපස දශපයක් ඇත්තාවූ රන්වන් කකුළුවෙක් මාගේ විමන් දෙර සාල්ලෙහි සොභාවත්ව එලී සිටිනා ලෙස දැක වදළසේක් වීනම් ඒ රන්වන් කකුළුවා පූවී ජාතියෙහි කකුළුමස් රස දන්දී මේ දිව්‍යසමපත් ලත් බව සිහිකොට බොහෝදෙනාට කුශලකම්ය ප්‍රකාශ කරවනු පිණිස පහළව සිටින්නේයයි නුඹවහන්සේ සිතා වදරන සේක්මය. එබැවින් සවාමීනි, මා කියන්නේ කිමෙක්ද? මා කියන්නේ නම් මේ කකුළුවාගෙන් ප්‍රයෝජන කවරේද? මේ සලකුණෙන් කකුළුමස් දුන් කුශල කම්ය හෙතුකොට ගෙන මේ දිව ඉසුරු ලද්දේයයි කියා දැන් වදළ මැනව"යි කීයේය. එකල්හි තෙරුන්වහන්සේ පිරිවර සහිත වූ ඒ දිව්‍යපුත්‍රයාට බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුරජාණන් වහන්සේට එපවත් සැලකළ සේක. බුදුරජාණන් වහන්සේ එම අතෙථාත්පත්තිකොටගෙන එතැන්හි පැමිණි පිරිසට බණ වදළසේක. ඒ දෙශනාව බොහෝ දෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මහාරථ වගීයෙහි
**කක්ටක රසදයක විමාන වස්තු වණිනාව**
කියා නිමවන ලදි.

# 55. චාරපාලක විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වන මහාරථ වර්ගයෙහි පස්වන චාරපාලක විමාන වස්තුව නම් කවරැයත්:-

සර්‍වධර්‍මයන් සර්‍වාකාරයෙන් දත්තා වූ සර්‍වඥයන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වැඩවසනසේක. එසමයෙහි රජගහනුවර එක්තරා උපාසකයෙක් නිරන්තරයෙන් සංඝයාට බත් සතරක් දෙන්නේය. ඒ උපාසකයාගේ ගෙය කෙළවර පිහිටි මහදොර ඇතුළට සොරු වදනාහෙයින් උන් වළක්වන පිණිස බොහෝ සෙයින්ම ඒ දොර වසනලද්දේ වෙයි. භික්ෂූහු ඔහුගේ දනය පිණිස දොර සමීපයට වැඩ දොර වසනලද හෙයින් සමහර දවසක බත්නොලැබ ආපසු වඩනාහුය. උපාසකයා අවුත් භාර්‍ය්‍යාවට කියන්නේ "කිමෙක්ද, භද්‍රාව, තී විසින් අපගේ ස්වාමීන්වහන්සේලාට සකස්කොට බත් දෙනලදදැ"?යි විචාළේය. එබසට ඒ ස්ත්‍රී කියන්නී, "එදවස්වල සඞ්ඝයාවහන්සේ වැඩියේ නැතැ"යි කීවාය. එකල්හි නොවඩින්ට කාරණා කවරේදැ"?යි විචාළේය. එබසට ඒ ස්ත්‍රී කියන්නී, "ගෙය කෙළවර දොර වසන ලද හෙයිනැයි සිතමි කීවාය. උපාසකතෙම එබස් අසා මහත් සංවේගයට පැමිණ චාරපාලයකු මා විසින් සෑදුව මැන වයි සිතා එක්තරා, පුරුෂයකු කැඳවා, "අද පටන් තෝ මේ දොර රක්ෂාකරමින් හිඳ යම් වේලකසංඝයාවහන්සේවැඩිසේක්වී නම් උන් වහන්සේලා ඇතුළු ගෙට වඩා පාත්‍රගෙනආසනයෙහිවඩාහිඳුවා කළමනා කටයුතු සියල්ලම තෝ ම කරව"යි කියා එක්තරා පුරුෂයකු දොර රක්ෂාවට තුබූයේය. ඒ චාරපාලයාද යහපතැයි කියා එතැන් පටන් එසේම කෙරෙමින් භික්ෂූන් සමීපයෙහිදී බණ අසා උපදනාලද ශ්‍රද්ධාව ඇතිව කර්‍මඵල අදහා සරණයෙහිද පිහිටියේය. භික්ෂු සංඝයාටද සකස්කොට උපස්ථානකෙළේය. ඉක්බිති නිරන්තරයෙන් බත් සතරක් දී සංඝයාට උපස්ථාන කළාවූ උපාසකයා මෑත භාගයෙක්හි කාලක්‍රියා කොට යාමනම් දිව්‍යලොකයෙහි උපන්නේය. චාරපාලකවනාහි කාලක්‍රියාකොට අනුන්ගේ දනයෙහි සකසා වතාවත් කිරීම් වශයෙන් කරනලද කුශලයෙන් හා අනුන් කරන කුශලය අනුමෝදන් වූ කුශලයෙන් ද තවුතිසා දිව්‍යලොකයෙන් දොළොස්යොදුන් රන් විමනෙක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දේවචාරිකාවෙන් වඩිනාසේක් ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළසේක.

"උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදසයොජනානි:
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතා සුභා"-පෙ-

යනුහෙයින්: සුවණ්ණකක්කටක විමානයෙහි කියනලද ක්‍රමයෙන්, "එම්බා දිව්‍යපුත්‍රය, තෝ මේ දෙළොස් යොදුන් රන් විමානය ඇතුලුවූ දිව්‍ය සම්පත් ලැබීමට කරණලද කුශලය කවරේද?" විචාළසේක. එකල්හි කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"දිබ්බං මමං වස්ස සහස්සමායු
වාචාභිගීතං මනසා පවත්තිතං
එත්තාවතා ඨස්සති පුඤ්ඤකම්මො
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො"-පෙ-

යනුහෙයින්, "ස්වාමීනි මම යටගිය දවස එක්තරා ද්වාරපාලයෙක් වීමි. එසමයෙහි දොරසමීපයට වැඩියාවූ මහසංඝයා දැක මේ බුඩපුත්‍රවූ මහසඞ්ඝයාවහන්සේ අති පවිත්‍රවූ ශීලාචාර ගුණඇත්තාහ යනාදීන් ගුණසිහිකොට ප්‍රසන්නවූ සිත් ඇතිව නමස්කාරකොට "ස්වාමීනි, මෙසේ වැඩිය මැනවයි කියා එක්තරා උපාසකයකුගේ ඇතුළුගෙට වඩා, "මෙහි ආසන පනවන ලද්දේය. වැඩහුන මැනවයි කියා වඩා හිඳුවා, ස්වාමීනි, ශරීරයෙහි ඵාසු අඵාසු කවරේද? වෙහෙර සුවසේ විසූසේක්ද? යනාදීන් ආචාර සමාචාර වශයෙන් පිළිසඳර කථාමාත්‍රයක් පමණ කෙළෙමි. මෙපමණක්ම කුශලයක් කෙළෙමි. මෙපමණෙක් විනා මා සතු දෙයින් යම්කිසි දනවස්තුවක් දෙන ලද්දෙන් නොවෙයි. ආචාර සමාචාර කුශලමාත්‍රයක් පමණ හෙතුකොට ගෙන මේ දිව ඉසුරු ලැබ මිනිස්ලොව ගණනින් තුන්කෙළ සැටලක්ෂයක් අවුරුදු ආයු ඇතිව මහත්වූ දිව්‍යසම්පත් අනුභව කෙරෙමි"යි කීයේය. එකල්හි මහතෙරහු ඕහට බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජාණන් වහන්සේ එම අත්ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාත්ථිකවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වන මහාරථ වර්ගයෙහි
**පස්වැනි වූ ද්වාරපාලක විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 56. කරණීය විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනිවූ මහාරථවර්ගයෙහි සවැනිව පැනෙන පළමුවන කරණීය විමාන වස්තුව නම් කවරැයත්

ලොකදිවාකරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදරණසේක, එසමයෙහි වනාහි සැවත්නුවර වාසීවූ එක්තරා උපාසකයෙක් තෙමේ නහන උපකරණ ගෙන අචිරවති නම් ගංගාවට ගොස් නාපියා එනුයේ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර පිඩු පිණිස හැසිරෙන බව දැක උන්වහන්සේ කරා එළැඹ වැඳ මෙසේ සැළකෙළේය. කෙසේද:- "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කිසිවෙකුගේ ආරාධනාවක් අද පිළිගෙන වදරනලද දැ"?යි විචාළේය. එකල බුදුරජාණන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් වැඩසිටිසේක. එකල්හි ඒ උපාසකතෙම කිසිවකුගේ ආරාධනාවක් ලැබී නැති බව දැන, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා කෙරෙහි අනුකම්පාවෙන් මාගේ දනය පිළිගත මැන වැ"යි ආරධනා කෙළේය. බුදුරජාණන් වහන්සේද, ඒ ආරාධනාව තුෂ්ණිම්භාවයෙන් ඉවසා වදළසේක. ඉක්බිති උපාසකතෙම බුදුරජාණන් වහන්සේ තමන්ගේ නිවසට වැඩමවා බුදුරජාණන් වහන්සේට වැඩහිඳීමට සුදුසු ආසනයක් පණවා එහි වැඩහිඳුවා ප්‍රණීතවූ ආහාරපානයන් වැළඳවූහ. බුදුරජාණන් වහන්සේද කරණලද භක්ත කෘත්‍ය ඇත්තේ ඔහට අනුමෝදනා වදරා විහාරයට වැඩිසේක. ඒ පිණ කරණකොටගෙන උපාසකතෙම දිව්‍යලොකයෙහි උපන් පරිදි පෙර කියනලද විස්තර සෙයිනැයි දැනගත යුතුයි.

මෙතෙකින් මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පළමුවන
**කරණීය විමාන වස්තුව කියා නිමියේය.**

## 57. දුතීය කරණීය විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථ වර්ගයෙහි සත්වැනි වූ දෙවැනි කරණීය විමාන වස්තුව නම් කවරැයත්:-

ඵිපදෙත්තම වූ බුදුරජානන් වහන්සේ එක්සමයෙක්හි රජගහනුවර වැඩවසනසේක එසමයෙහි රජගහනුවර එක්තරා උපාසකයෙක් තෙම බුදුන්ට ආරාධනාකොට දන් දෙන්නේය. එසමයෙහි ආරණ්‍යසෙනාසනයක

වසන්නාවූ එක්තරා තෙරකෙනකුන් වහන්සේ පිඩු සිඟා වැඩිසේක. එකල්හි එක්තරා පුරුෂයෙක් තෙරුන්වහන්සේ දැක නමස්කාර කොට උපාසකයාගේ ඇතුළුගෙට වඩා ආසනයෙහි වඩා හිඳුවා යටකී චාරපාලයා මෙන් සත්කාරකෙළේය. ඉක්බිති උපාසකයා එයින් අප රභාගයෙක්හි කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි සත් සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ දෙළොස් යොදුන් දිව්‍යප්‍රාසාදයක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ දෙව්ලොවට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළසේක.

"උච්චමිදං මණිථූනං විමානං" -පෙ-

යනාදීන් යටකියනලද ක්‍රමයෙන් ඔහුගේ දිව්‍යසම්පත් වර්ණනාකොට, "මෙබඳු සම්පත් ලැබීමට කරණලද කුශලකර්මය කවරේද?"යි විචාරා වදාළසේක. එබස් අසා ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ ප්‍රකාශ කළේය.

"කරණීයානි පුඤ්ඤානි පණ්ඩිතෙන විජානතා,
සම්මග්ගතෙසු තාදිසු යත්ථදින්නං මහප්ඵලං"-පෙ-

යනුහෙයින්, "ස්වාමීනි, මා මිනිස්ලොව වසන සමයෙහි අරණ්‍යසෙනාසනයක වසන්නාවූ තෙරකෙනෙකුන් වහන්සේ පිඩු පිණිස වැඩිසේක. උන්වහන්සේ දැක සතුටු සිත් ඇතිව දියයුත්තක් නැත්තේවි නමුදු නමස්කාරකොට දන්දෙන්නාවූ එක්තරා උපාසකයකුගේ ගෙට වැඩමවා ආසනයෙහි වඩා හිඳුවා සුවදුක් විචාරා සමාචාර දක්වා අනුන් දෙන දානයෙහි පින් අනුමෝදන් වීමි. එපමණ කුශලය හෙතුකොටගෙන මේ තවුතිසා දිව්‍යලොකයට පැමිණියෙමි. මට වැඩ පිණිස ම ඒ තෙරුන් වහන්සේ වනයෙන් නික්ම ගමට පැමිණිසේකැයි සිතමි. එබැවින් තමහට වැඩකැමති ශ්‍රද්ධාවන්තයන් විසින් දානශීලාදී වශයෙන් කුශල් කටයුත්තාහ. එතකුදුවුවත් සම්‍යක්මාර්ගයට පැමිණියාවූ ආර්ය්‍ය ශ්‍රාවකයන් අතුරෙන් යම්කෙනෙකු කෙරෙහි පහන්සිත් ඇතිව කිසියම් දෙයක් දෙනලද්දේවිනම් ඒ දානය මහත්ඵල මහානිශංස වන්නේය"යි කීයේය. එකල්හි තෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජාණන් වහන්සේ එපවත් අත්ථොත්පත්තිකොටගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට විස්තර වශයෙන් බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාත්ථිකවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වන මහාරථවර්‍ගයෙහි
**සත්වැනි වූ දෙවත කරණිය විමාන වස්තු වර්‍ණනාව**
කියා නාමවනලදී

## 58. සූචි විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනිවූ මහාරථ වර්ගයෙහි අටවැනි වූ සූචි විමාන වස්තුව නම් කවරැයත්.

සර්‍වලොකෛක ප්‍රදීපායමාන වූ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වාසයකර වදරණසේක. එසමයෙහි ආයුෂ්මත්වූ සැරියුත් මහතෙරුන් වහන්සේ සිවුරු ගෙත්තම් කිරීමට හිදිකටුවක් ලැබීම සඳහා රජගහනුවර පිඩු පිණිස වැඩි ගමන්හි එක්තරා කර්‍මාරයකුගේ ගෙදෙරකට වැඩ මඳක් වැඩ සිටිසේක. එකල්හි කඹුරුතෙම, "ස්වාමීනි, කවර කාරණයෙක්දැ?"යි විචාළේය. "චීවර කර්‍මයක් ඇත්තේය"යි වදළ කල්හි හිදිකටුවෙන් ප්‍රයෝජන ඇතැයි සිතා ප්‍රසන්නවූ සිතින් හිදිකටු දෙකක් පූජාකොට වැඳ, "ස්වාමීනි, හිදිකටුවෙන් මතුද ප්‍රයෝජන ඇතිකල්හි දන්වා වදළ මැනව"යි ආරාධනා කෙළේය. තෙරුන්වහන්සේද අනුමෝදනා වදරා විහාරය ට වැඩිසේක. ඒකර්‍මාරතෙම මෑතකලෙක්හි කාලක්‍රියාකොට එම කුශලානුභාවයෙන් තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නේය. අනෙක් සියල්ලද පෙරකී නයින් දතයුතු.

## 59. දෙවන සූචි විමාන වස්තුව

රජගහනුවර වාසීහු එක්තරා සන්නාලි පුරුෂයෙක් විහාරයට පැමිණ චීවරගෙත්තම් කරන භික්‍ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස හිදිකටු සහිත හිදිකූලාවක් පූජාකොට ගියේය. ඒ පිණින් ඒ පුරුෂතෙම තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නේය. අනෙක් සියලු විස්තරය පළමු කියනලද කථා වස්තුන් මෙනැයි දතයුතුයි.

## 60. නාග විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනිවූ මහාරථ වර්‍ගයෙහි දසවැනිව ප්‍රකාශව එන පළමුවැනි නාග විමාන වස්තුව නම් කවරැයත්:-

එක් සමයෙක්හි දෙව්‍යාති දෙව්වූ අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි මුගලන් මහ තෙරුන්වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනා සේක් තව්තිසා භවනයෙහි හැලිඇත් වාහනාරූඪව දිව්‍ය සේනාව පිරිවරා ආකාශයෙන් යන්නාවූ එක්තරා දිව්‍ය පුත්‍රයකු දැක සමීපයට වැඩ ඉදිරියෙහි වැඩ සිටිසේක. ඒ දිව්‍ය පුත්‍රයා තෙරුන්වහන්සේ දැක ඇත්කඳ පිටින් බැස තෙරුන් වහන්සේට නමස්කාර කොට දෙහොත් මුදුන් දී සිටියේය. ඒ දිව්‍යපුත්‍රයා කවර කුශලයකින් ඒ දිව්‍ය සම්පත් ලද්දේදැයි යතහොත්:- යටගිය දවස කාශ්‍යප බුදුන් විසි දහසක් හවුරුදු බුඩරාජ්‍යශ්‍රී විඳ සියලු බුඩකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පා වදළ කල්හි ශ්‍රී ශරීරය ආදහන කළ තැන එකඝණවූ ධාතු වසා සතර ගව් පමණ මහත්වූ සත්රුවන් දගැබක් කොට පූජාසත්කාර කරණ සමයෙහි කිකී නම් මහරජාණ කෙනෙක් මහ ඇමතිවරුන් හා ගම් නියම් ගම් වැස්සන් හා ඇතුළු නුවර පිටිනුවර බොහෝදෙනා හා දවසින් දවස වඩ වඩා නිරන්තරයෙන් මල් පූජා කෙරෙති. මෙසේ රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් නිරන්තරයෙන් මල්පූජා කරණ හෙයින් සමන් මල් ආදි මාහැඟි උතුම් මල් දුර්ලභ වූයේය. එසමයෙහි එක්තරා උපාසකයෙක් කහවණු අටක් ගෙන මාලාකාර වීථියට ගොස් මල් නැත්තෙන් කහවනු අටට මල් අටක් දෙවයි කියා ඇවිද එක මලකුදු නොලැබ මල්වත්තට ගොස් මලාකාරයාට මෙසේ කී යේය. "එම්බා මාලාකාරය, මේ කහවනු අට නිසා මල් අටක් දෙව"යි කීය. එබසට මාලාකාරයා කියන්නේ" හිමි, මා විසින් සහවා තබන ලද කිසියම් මල් ජාතියක් නැත. මල් වත්තෙහිද කිසිවක් නොතබා නෙලා දෙන ලද්දේය. බොහෝ මනුෂ්‍යයෝ මිළදී මල් ගෙන ගියහ. දැන් නුඹ පසුව ආ බැවින් කුමක් කෙරෙම්දැ?"යි කීයේය. එබසට උපාසකයා කියන්නේ ආරාම යෙහි කිසියම් ගසෙක සැඟවී තුබූ මල් මම ගොස් බලා සොයා නෙලාගන්නා කැමැත්තෙමි" කීයේය. එසේ වී නම් ආරාමයට ගොස් බලා සොයාගන්නැ"යි කී හෙයින් උපාසකයාද යහපතැයි කියා මල් වත්තට වැද ඒ ඒ තැන බලා සොයන්නේ නටුවෙන් ගිලිහි ගස මුල වැටී තුබූ මල් අටක් ලැබ මාලාකාරයාට කියන්නේ, "පින්වත, මා විසින් මල් අටක් සොයගන්නා ලද්දේය. කහවණු අට ගනුව"යි කීය. එකල්හි මාලාකාරයා කියන්නේ, "නුඹ පිනින් ලද්දවූ මලට මම මිළ නොගනිමි. ඒ ගෙන ගොස් බුඩපූජා කළ මැනව"යි කීයේය. උපාසකයාණෝ "නොමිලයේ මල් ගෙන චෛත්‍යාඞගණයට ගොස් සතුටු සිත් ඇතිව රුවන් දගැබට පූජා කළහ. ඒ උපාසකයා එයින්

අපරභාගයෙහි  කාලක්‍රියා කොට තව්තිසා දෙව්ලොව ඉපිද එහි ආයු පමණින් දිව ඉසුරු විඳිමින් නැවත නැවතත් චුතිප්‍රතිසන්ධි වශයෙන් බුඩාන්තරයක් මුළුල්ලෙහි දිව ඉසුරු විඳ දෙව්ලොව ම සැරිසරන්නේ මේ බුඩොත්පාද කාලයේ හිද තව්තිසා දෙව්ලොව ඉපද ඇත් වාහානාරූඪව දෙවගනන් පිරිවරා අහසින් යමින් සිට මහතෙරුන් දැක ඇතු පිටින් බැස නමස්කාර කොට එකත්පස්ව සිටියේය. මහ තෙරහු ඒ දිව්‍ය පුත්‍රයාගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් දැක ඔහු විසින් ගිය ජාතියෙහි කළා වූ කුශල කර්‍මය ලොවට ප්‍රකාශ කරනු පිණිස මේ ගාථාවන්ගෙන් විචාළ සේක.

"සුසුක්කඛන්ධං අභිරුය්හ නාගං
අකාචිනං දන්තිං බලිං මහාජවං

අභිරුය්හ ගජවරං සුකප්පිතං
ඉධාගමා වෙහාසයමන්තලික්ඛෙ.

නාගස්ස දන්තෙසු දුවෙසු නිම්මිතා
අච්ඡොදිකා පදුමිනියො සුඵුල්ලා,

පදුමෙසු ච තුරියගණා පවජ්ජරෙ
ඉමා ච නච්චන්ති මනොහරායො.

දෙවිද්ධිපත්තොසි-පෙ-පභාසතී"ති,

යනු හෙයින්, "එම්බා දිව්‍ය පුත්‍රය, තාගේ මේ උත්තම වාහන යවූ හස්තිරාජයාගේ සතර පාදයද වස්ති කොෂයද මුඛ ප්‍රදෙශය ද දෙකන් තල හා වාලධියද යන මේ රක්ත වර්‍ණයෙන් බබලන්නාවූ මෙකී අවයවයන් තබා සියලු සර්‍වාඞ්ගය රිදී පර්‍වතයක් සේ ඉතා ධවල වෙයි. අජානීය ලක්‍ෂණවූ ජව බලසම්පන්නවූ ආකාශ චාරීවූ රන් සැත් රන් පොරොදු කුම්භාලඞ්කාරාදී නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් සැරහුණා වූ රන් කුප්පි හා රිදී විහිදෙන්නා වූ දළ සහළින් හා කුශල කර්‍මයෙන් නිර්මිතව පවත්නාවූ මේ ඇතුගේ දළ දෙකෙහි ප්‍රසන්න වූ සිහිල් ජලයෙන් පිරී තිබෙන්නාවූ පොකුණුවල පිපී වැනී ගිය දිව සුවඳ විහිදුවන පද්ම වනයෙන් ගැවසී ගත්තේය. ඒ පියුම් පෙතිවල දිව්‍යාඞ්ගනාවෝ සර්‍වාභරණයෙන් සැරහී භෙරිවීණාදී තූර්‍ය්‍යභාණ්ඩ ගෙන නටමින් ගායනා කෙරෙමින් රූප ශබ්දදි පඤ්චකාම සම්පත්තියෙන් තොප සන්තර්පණය කරන්නාහු ය. එම්බා දිව්‍ය පුත්‍රය, මේ සම්පත් ලැබීමට කළාවූ කුශල කර්‍මය කවරේදැ?" යි විචාරා වදාළ සේක. මෙසේ මුගලන් මහතෙරුන්

වහන්සේ විසින් විචාරණ ලද පැණය විසඳන්නාවූ දිව්‍ය පුත්‍ර තෙම මේ ගාථාවන්ගෙන් කුශල කර්‍මය ප්‍රකාශ කොට කීයේය.

"අට්ඨේව මුත්ත පුප්ඵානි කස්සපස්ස මහේසිනො,
ථූපස්මිං අභිරෝපෙසි ං පසන්නො සෙහි පාණිහි.
තෙන මෙ තාදිසො වණ්ණො -පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින් "ස්වාමීනි, මම ගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස් ලොව උපන් කල්හි නටුවෙන් ගිළිහී ගස මුල හුනු මල් අටක් දැක ගෙන ගොස් කාශ්‍යප බුදුන්ගේ ධාතු වසා බඳනාලද දාගැබට පහන් සිත් ඇතිව සිය අතින් පූජාකෙළෙමි. ඒ කුශල කර්‍මය හේතුකොට ගෙන මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලදිමි"යි කීයේ ය. එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ ඒ දිව්‍ය පුත්‍රයාට විස්තර වශයෙන් බණ වදරාමිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණෝ එම අර්ථෝත්පත්ති කොට ගෙන එතැන්හි රැස්වූ පිරිසට ධර්‍මදේශනා කොට වදාළ සේක. ඒ ධර්‍මදෙශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මහාරථ වර්‍ගයෙහි
**පළමුවැනි නාග විමාන වස්තු වර්‍ණනාව**
කියා නිමවන ලදී.

## 61. දුතිය නාග විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වන මහාරථ වර්‍ගයෙහි එකොළොස්වන දෙවැනි නාග විමාන වස්තුව නම් කවරයත්:-

ලොක දිවාකරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාම විහාරයෙහි වැඩ වාසයකර වදරණ සේක. එසමයෙහි වනාහි ඉතා යහපත් ශ්‍රද්ධා සම්පන්න වූ පිරිසිදු සිත් ඇත්තාවූ එක්තරා උපාසකයෙක් තෙම නිත්‍ය පඤ්චශීලයෙහි පිහිටියෝ උපොසථ දිනයෙහි උපොසථ ශීලය සමාදන් ව පෙරවරු කාලය විභවානුරූප පරිදි භික්ෂු සංඝයාට දන් පිළිගන්වා තෙමේද භත්තකෘත්‍යය කොට පිරිසිදු වස්ත්‍රයක් හැද එසේම පිරිසිදු වස්ත්‍රයක් උතුරුසලු කොට සවස් වේලෙහි බොහෝ සෙයින් අෂ්ටවිධ පානයන් ගෙන විහාරයට ගොස් භික්ෂු සංඝයාට

පිළිගන්වා බුදුරජාණන් වහන්සේ සමීපයට එළඹ ධර්මශ්‍රවණය කෙරෙයි. මෙපරිද්දෙන් හෙතෙම දනමය වූ ද, ශීලමයවූ ද බොහෝ සුචරිතයන් රැස්කොට අපරභාගයෙහි කාලක්‍රියා කොට තව්තිසා දිව්‍ය ලොකයෙහි උපන්නේය. ඔහුගේ පුණ්‍ය තෙජසින් සර්වප්‍රකාරයෙන් ධවලවූ මහත් දිව්‍යමය වූ ඇත් වාහනයෙක් පහළ විය. ඒ දිව්‍ය කුමාර තෙමේ තමහට පහළවූ හස්ති වාහනාරූඪව මහත් දිව සෙනග පිරිවරා කලින් කල උයන් කෙළි පිණිස යන්නේය. ඉක්බිති එක් දිනක් කෙළෙහි ගුණ සැලකීම් වශයෙන් අර්ධ රාත්‍රි වේලෙහි ඒ දිව්‍යයානාවට නැඟී බුදුරජාණන් වහන්සේ වඳින්නෙමැයි දිව්‍යලොකයෙන් අවුත් සියලු වෙළුවනය බබුළුවමින් ඇත්කඳින් බැස බුදුරජාණන් වහන්සේ කරා එළඹ මනාකොට බුදුන් වැඳ ඇඳිලි බැඳ එකත්පසෙක සිටියේය. එකල්හි බුදුරජාණන් වහන්සේ සමීපයෙහි හුන් ආයුෂ්මත් වංගීස මහතෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් ලබන ලද අවසර ඇතිව ඒ දිව්‍යපුත්‍රයාගෙන් කරුණු විචාළේය. අනෙක් සියලු ප්‍රවෘත්ති ද පෙර කියන ලද නයින් දතයුතු.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වෙනි මහාරථ වර්ගයෙහි
**දෙවැනි නාග විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 62. තතිය නාග විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථ වර්ගයෙහි දෙළොස්වැනිව ප්‍රකාශව එන තුන්වැනි නාග විමාන වස්තුව නම් කවරැයත්,-

සකල ගුණ නිධානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර කලන්දකනිවාප නම් වූ වෙලුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි රහතුන් තුන් දෙනෙකුන් වහන්සේ ග්‍රාමාන්තර සෙනාසනයෙක වස් විසූහ. වසන ලද වස් ඇති ඒ තෙරුන් වහන්සේලා තුන්නම වස් පවරා අනන්තයෙහි, "බුදුන් වඳින්ට යම්හ"යි කියා ඒ සෙනාසනය තැන්පත්කොට තබා මහට පැමිණ රජගහනුවර උදෙසා ඒ නුවර දිසාවට අභිමුඛව වඩනාහු සවස් වේලෙහි අතුරුමග එක්තරා මිථ්‍යාදෘෂ්ටි බ්‍රාහ්මණයෙකුගේ උක් කෙතක් සමීපයට ගොස් උක් කෙත රකින පුරුෂයා අතින් විචාරන්නාහු, "ඇවැත්නි, අද අපට රජගහනුවරට යන්ට පිළිවන්දැ?"යි විචාළහ. එකල්හි ඉක්ෂුපාලකයා කියන්නේ,

"ස්වාමීනි, මෙතන් පටන් රජගහ නුවරට අඩයොදුන් පමණ වෙයි. දැන් සවස් වූ හෙයින් වැඩිය නොහැක්ක, අද මෙතැන්හි වැඩසිට සෙට වැඩිය මැනව"යි කීය. ඒ රහතුන් වහන්සේලා වදරන්නාහු, "ඇවැත්නි, මෙහි අප විසීමට සුදුසු කිසියම් ආවාසයක් ඇද්ද?"යි වචාළහ. එබස් අසා ඉක්ෂුපාලකතෙම කියනුයේ, "ස්වාමීන් වහන්ස, එතකුදුවූවත් නුඹ වහන්සේලාට ආවාසයක් මම දෙන්නෙමි වේදැයි කීය. තෙරුන් වහන්සේලාද ඉවසා වැඩසිටියාහ. ඒ ඉක්ෂුපාලකයා ආවාසය කරන්නේ එසේම තිබියදී උක් දඬුගස් කීපයක් එක්කොට මණ්ඩපාකාරයෙන් බැඳ මත්තෙහි උක්කොළ වසා බිම පිදුරු අතුට ආසන පනවා එක් තෙරකෙනෙකුන්ට දුන්නේය. ඉක්බිති තමන් වසන ගෙයින් දෙතුන් දණ්ඩක් හා ශාඛා කීපයක් ගෙන මනාකොට පිළියෙන් වසා පිළීකුටියක් කොට අනෙක් තෙරුන් වහන්සේට දුන්නේය. ඒතුන්දෙනා වහන්සේම එදවස් එතැන්හිම විසූහ. ඉක්ෂුපාලයා එදවස් රාත්‍රියෙහි ඇවෑමෙන් කල් ඇතිව ආහාර පිළියෙළකොට අරුණට පළමුවෙන් දැවටි දඬු හා මුව දෙවුනා පැන් දී උදය උක්සකුරු හා සමග ආහාර වළඳවා වළඳ ඉක්බිති අනුමෙවෙනි බණ වදරා වඩනා උන්වහන්සේලාට, "මාගේ කොට සවන්නේය"යි කියා එක් එක් උක් දණ්ඩ බැගින් පූජාකොට පසු ගමන් පිණිස උන්වහන්සේලා හා සමග මහට බැස මඳ තැනක් ගොස් වැළකී සිටිනේ තමන්ගේ ආගන්තුග උපකාරයද දනයද සිහිකොට ඒ සුචරිත කර්මය අරභයා උදරතරවූ ප්‍රීති සොම්නස් උපදවා සතුටුව කෙතට යමින් සිටියේය. උක් කෙත හිමි මිථ්‍යාදෘෂ්ටි බ්‍රාහමණයා කෙතට එන්නේ උන්වහන්සේලා ඉදිරියට පැමිණ අත තුබූ උක් දඬු දැක "මේ උක් දඬු නුබවහන්සේලා කොයින් ලබන ලද්දේ දැ?"යි විචාරා, "ඉක්ෂුපාලයා විසින් දෙන ලද" යි කී කල්හි තමන් මිථ්‍යාදෘෂ්ටි බැවින් දණ්ඩෙන් ගැසූ නයෙකු සේ කිපී නොසතුටුව තට තට යන අනුකරණ ඇතිව ක්‍රොධයෙන් දිළිහි ඉක්ෂුපාලයා පස්සේ දිව අත තුබූ මුගුරෙන් පහරන්නේ එක පහරින්ම ජීවිතය විනාශ කෙළේය. ඉක්ෂුපාලයා තමා විසින් කරණ ලද කුශල කර්මය සිහිකොට සුදම් දෙව් සභාවෙහි උපන්නේය, ඔහුගේ කුශලානුභාවයෙන් උතුම්වූ මහත් දිව්‍යමය ඇත්වාහනයෙක් පහළවී. ඉක්ෂුපාලයා මළ පවත් අසා ඔහුගේ මව්පියන් හා අවශෙෂ නෑයෝ අඩා වැලප කඳුලු මුසු මුහුණින් යුක්තව එතනට පැමිණියාහ. සියළු ගම්වැසි මනුෂ්‍යයෝද එතැන්හි රැස් වූහ. මව්පිය දෙදෙන ශරීරය ආදහන කරන්ට ආරම්භ වූහ. ඒ දිව්‍යපුත්‍රයා ඔහුගේ දිව ඉසුරු දැක, " කොයින් චුතව කවර කුශලයකින් අවුත් මෙහි උපන්නෙම්දැ"යි පරීක්ෂාකරන්නේ, තමන්ගේ පූර්ව චරිතය දැක "තුනුරුවන් ගුණ ලොකයාට ප්‍රකාශ

කෙරෙමි"යි සිතා රන් පොරෝදු මිණිකිංකිණිකාදී නොයෙක් හස්ත්‍යාලංකාරනේ අලංකෘතවූ ඇතු පිටට පැන නැගී පඤ්චාඞගික තූර්‍ය්‍යඝෝෂය කරවමින් මහත්වූ දිව්‍ය ඍද්ධියෙන් මිනිස් ලොවට අවුත් එතැන්හි රැස්වූ පිරිස් මැද දෘෂ්‍යමාන රූපයෙන් සියල්ලට පෙනි පෙනී හිරු විමනක් සේ ආකාශයෙහි සිටියේය. එකල්හි එතැන්හි රැස්වූ මිනිසුන් අතුරෙන් එක්තරා පණ්ඩිත පුරුෂයෙක් ඒ දිව්‍යපුත්‍රයා විසින් කරණ ලද කුශල කර්‍මය මේ ගාථාවන්ගෙන් විචාළේය.

"කොතු දිබ්බෙන යානෙන සබ්බසෙතෙන හත්ථිනා,
තුරියතාළිතනිගෙඝොසො අන්තළික්ඛෙ මහීයති.
දෙවතානුසි ගන්ධබ්බො ආදුසක්කො පුරින්දදෙ,
අජානන්තා තං පුච්ඡාම කථං ජානෙමු තං මයං" ති.

යනු හෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය සර්වාඞග ධවලවූ ඇත් වාහනාරූඪව අවුත් ආකාශයෙහි බබලන්නාවූ තොප සතුටු කරවමින් නළු නාටක සේනාවෝ භෙරි වීණාදි තූර්‍ය්‍ය භාණ්ඩ ගෙන පඤ්චාංගික තූර්‍ය්‍යඝෝෂය පවත්වමින් තොපට පූජාසත්කාර විදිමින් දිළියෙන්නාවූ තෝ දෙවතා කෙනෙක්ද? නොහොත් ගන්ධර්වයෙක්ද? ශක්‍රදෙවේන්ද්‍රයාද? තොප කවුරුන් බවත් අපි නොදනුම්හ. අපට ප්‍රකාශකොට කියව"යි කීයේය. එබස් අසා ඒ පැණය විසඳන්නාවූ දිව්‍යපුත්‍ර තෙම මෙසේ කීයේය.

"නම්හි දෙවො න ගන්ධබ්බො නපි සක්කො පුරින්දදෙ,
සුධම්මා නාම යෙ දෙවා තෙසං අඤ්ඤතරො අහංති"ති.

යනුහෙයින්, එම්බා පින්වත මම අවශෙෂ දෙවතාකෙනකුන් නොවෙමි, ගන්ධර්වකෙනෙක් නොවෙමි, ශක්‍රයාත් නොවෙමි. තව්තිසා වැසි දෙවියන් අතුරෙහි සුධර්මා නම්වූ යම් අනුතුරු දිව්‍යනිකායෙක් ඇද්ද ඒ දෙවතාවන් අතුරෙන් එක්තරා මහානුභාව සම්පන්න දිව්‍යරාජයෙක්මි"යි කීයේය. ඉක්බිති ඒ පණ්ඩිත පුරුෂයා මෙසේ විචාළේය.

"පුච්ඡාම දෙවං සුධම්මං පුථුං කත්වාන අඤ්ජලිං,
කිං කත්වා මානුසෙ කම්මං සුධම්මං උපපජ්ජති"ති

යනු හෙයින්, "එම්බා සුධර්මා නම් දිව්‍යපුත්‍රය, නුඹවහන්සේට නමස්කාරකොට අදිලි බැඳ විචාරම්හ. දන ශීලාදී වශයෙන් සත්වයෝ

මිනිස් ලොවදී කවර කුශලයක් කොට සුධර්මා නම් දිව්‍යනිකායෙහි උපදිත්දැ?’යි විචාළේය ඒ දිව්‍යපුත්‍රයාද තමන්ගේ කුශල කර්මය අරභයා විචාළ හෙයින් එබස් අසා අනෙකුදු දන ශීලාදී වශයෙන් කුශල් කළවුන් එහි උපදනා වීනමුදු තමන් කළ කුශලයම ප්‍රකාශකොට කියන්නේ මේ ගාථාවෙන් ප්‍රකාශ කෙළේය.

“උච්ඡාගාරං තිණාගාරං වත්ථාගාරඤ්ච යො දදෙ,
තිණ්ණං මඤ්ඤතරං දත්වා සුධම්මං උපපජ්ජතී”ති.

යනු හෙයින් එම්බා පින්වත්නි, මේ ලොකයෙහි යම්කිසි කෙනෙක් උක් දණ්ඩෙන් ගෙයක් ඉදිකොට උක් කොළ වසා කළ උක්පැලක් වේවයි, තණ වසා කළ වල් පැලක් වේවයි, පිළි වසා කළ පිළි කුටියක් වේවයි මේ ත්‍රිවිධ කුටීන් අතුරෙන් එක්තරා ගෙයක් කොට භික්ෂු සඞ්ඝයාට පිළිගන්වා එහි වඩා හිඳුවා උපකාර කෙළේවී නම් ඒ සත්වතෙම තව්තිසා දෙව්ලොව සුධර්මා නම් දිව්‍ය නිකායෙහි උපදනේය’ යි කියා තමන් උක් කෙත රක්ෂාකළ නියාවත් සකස්කොට තෙරුන් වහන්සේලාට කළ ආගන්තුග උපකාරයත් ඒ කුශලයෙන් දෙව්ලොව උපන් නියාවත් කියා තමන්ගේ මෘතශරීරයත් දක්වා ඉක්බිති ත්‍රිවිධරත්නයෙහි ගුණ කියා මව්පියන් හා සමග ප්‍රිය කථාකොට ‘අප ලත් දිව ඉසුරු ලබන පිණිස අප්‍රමාදව කුශල් කළ මැනවැ’යි කියා අවවාද කොට දෙව්ලොවටම ගියේය. මනුෂ්‍යයෝ ඒ දිව්‍යපුත්‍රයාගේ වචනය අසා බුදුන් කෙරෙහිද සංඝයා කෙරෙහිද පැහැද ආදර බහුමාන ඇතිව බොහෝසේ දනොපකරණ සපයා ගැල්වල පුරා වෙළුවනාරාමයට ගොස් බුදුපාමොක් මහ සඟනට දන් දී ඉක්බිති සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට සැලකළෝය. බුදුරජාණෝ ප්‍රශ්න විසර්ජනා දෙක එසේම වදරා එම අත්ථොත්පත්තිකොට ගෙන ඔවුන්ට විස්තර වශයෙන් බණ වදරා ඔවුන් සරණ ශීලයෙහි පිහිටුවා වදළසේක. ඒ බණ අසා ශ්‍රද්ධාවෙහි පිහිටියාවූ උපාසකවරු බුදුන් වැඳ අවසර ගෙන තමන් ගමට ගොස් ඉක්ෂුපාලයා මළ තන්හි විහාරයක් කරවූහ.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි මහාරථ වර්ගයෙහි
**තතිය නාග විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

# 63. චූලරථ විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පස්වැනි වූ මහාරථ වර්ගයෙහි තෙළෙස් වැනිවූ චූලරථ විමාන වස්තුව නම් කවරැයත්-

සකල ගුණ නිධානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සියලු බුඞකෘත්‍යයන්කොට නිමවා පිරිනිවන් පා වදාළ කල්හි ධාතු බෙදගත් රජදරුවන් ආදී උත්තමයෝ ඒ ඒ තන්හි ධාතු බෙදන තැනට රැස්වූ මහාශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධානකොට ඇති පන්සියයක් පමණ ක්ෂීණාශ්‍රව මහාසංඝයා විසින් , "ධර්මසඞගායනා කිරීම රජගහනුවරදී වන්නේය"යි කියා නියම කොටගෙන ශ්‍රාවක සන්නිපාතයට නියම වූ ඇසළ පුර පසළොස්වක් දිනය සම්ප්‍රාප්ත වනතෙක් විනෙයජනයන් දක්නා පිණිස තම තමන්ගේ පිරිස් හා සමග ඒ ඒ තන්හි වසනකල ඒ මහා ශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ කාත්‍යායන මහතෙරුන් වහන්සේ එක්තරා ප්‍රත්‍යන්තදෙශයෙක එක්තරා වනසණ්ඩයක් නිසා චෛත්‍යස්ථානයෙක වැඩ වසන සේක. එසමයෙහි අස්සක රට පෝතලී නුවර අස්සක නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කෙරෙයි. ඒ රජහුගේ අග්‍රමෙහෙසිකා දෙවීන් කුස ඒ රජු නිසා උපන් සුජාත නම් වූ සොළොස් හැවිරිදි වයස් වූ කුමාරයෙක් පියරජහු විසින් අනෙක් කුඩා බිසවක් කෙරෙහි බැඳී රටින් නගන ලදුව වල් වැද වනචරකයන් නිසා වනයෙහි වෙසෙයි. ඒ කුමාරයාගේ උත්පත්ති කථාව කෙසේදයත්- ඒ සුජාතා කුමාරයා වනාහි යටගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි බුදුසස්නෙහි පැවිදිව අධි ගමයකට පැමිණ ගතනොහීශීලයෙහි පමණක් පිහිටියේ පෘථග්ජනව කාලක්‍රියාකොට තව්තිසා දෙවුලොව ඉපද එහි ආයුපමණින් දිව ඉසුරු විඳ නැවත නැවතත් සුගතියෙහිම සැරිසරන්නේ මේ බුඩොත්පාද කාලයෙහි අපමහ ගෞතම බුදුරජාණන් ශ්‍රී මහාබෝධි මුලයෙහිදී ලොවුතුරා බුදුවූ දවස් පටන් තිස්වන වර්ෂයෙහි අස්සක නම් රට පොතලී නුවර අස්සක රජහුගේ අග්‍රමහසිකා දෙවීන් කුස උපන්නේය. ඕහට සුජාත කුමාරයෝයි නම් විය. ඒ සුජාත කුමාරයා මහපිරිවරින් දෙව් කුමරුවකුසේ වැඩෙයි. එසමයෙහි ඔහුගේ මෑණියෝ කාලක්‍රියා කලාහුය. එකල්හි රජ්ජුරුවෝ අනෙක් බිසවක් අග්‍ර මහෙසිකා ස්ථානයෙහි තුබුවෝය. එයින් පසු නොබෝකලකින් ඒ බිසවද රජු නිසා කුමාරයෙකු වැදූහ. රජ්ජුරුවෝ ඇගේ පුත්‍රයා දැක සතුටුව "එම්බා සොඳුර, මෙබඳු පුත් රුවනක් වදදුන් තී විසින් කැමති වනලද වරයක් ගණුව"යි කියා වරදුන්නේය, ඒ බිසවද, "දෙවයෙනි, මා

විසින් වර ගන්නා ලද්දේයෙ. එතකුදු වුවත් මට ප්‍රයෝජනයක් ඇතිවිට ගනිමි"යි කියා වරනොගෙන තබා යම් කලෙක සුජාත කුමාරයා සොළොස් හැවිරිදි වයසට පැමිණියේද එකල්හි බිසව සිතන්නී, "මේ සුජාත කුමාරයාට රාජ්‍යය දුනහොත් නපුරු; ඊට පළමුවෙන් වර ගතමැනව"යි සිතා රජ්ජුරුවන්ට මෙසේ කීහ. "දේවයන් වහන්ස, පෙර දවසෙක මපුතණුවන් දැක සතුටුව නුඹවහන්සේ විසින් වරයක් දෙනලද්දේය. ඒ වරය මට දැන් දුනමැනව"යි කිව. රජ්ජුරුවෝ ද, "වර ගනුව, දෙවීනි" යි කීහ. එසේවීනම්, "මපුතනුවන්ට රාජ්‍යය දෙව"යි කීව. රජු එබසට කිපී, "චණ්ඩාලිය, තී කුමක් කියහිද? දිව්‍යකුමාරයකුසේ මාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රවූ සොළොස් හැවිරිදි සුජාත කුමාරයන් සිටියදි කවරහෙයකින් මෙසේ කියහිද? කුමක් හෙයින් , "මාගේ පුතුට රාජ්‍යය දෙවයි කියහිදැ?යි ප්‍රතික්ෂේප කෙළේය. බිසව නැවත නැවතත් යාච්ඤාකරන්නී සිත් ගතනොහී එක් දවසක් මෙසේ කීව. "දෙවයෙනි, නුඹ සත්‍යයෙහි පිහිටිසේක් වී නම් මපුතුහට රාජ්‍යය දෙව"යි කිව. එබසට රජ්ජුරුවෝ සිතන්නාහු, "මා විසින් නොසලකා මෑහට වරදෙන ලද්දේය. මේ බිසවද හැමවේලෙහිම මේ වචනයම කීය"යි සිතා විපිළිසරවූ සිත් ඇතිව සුජාත කුමාරයා ළඟට කැඳවා එපවත් කියා ශොක කෙරෙමින් දැසින් කඳුලු හෙලුහ. සුජාත කුමාරයෝ ශොකයෙන් හඬන පියාණන් දැක බලවත්වූ දෙම්නසට පැමිණ දැසින් කඳුලූ පවත්වා කියන්නාහු: දෙවයෙනි නුඹවහන්සේ මට අවසර දෙනසේක්වී නම් අනෙක් තැනෙකට යෙමි"යි කීහ. එබස් අසා, "අනෙක් නුවරක් නිමවා දෙමි, එහි වසව"යි කියා රජ විසින් කියනලද කල්හි කුමාරයා නොකැමතිවිය. රජ්ජුරුවෝද, "මාගේ යහලුවූ රජදරුවෙක් සමීපයට යවා පොෂ්‍යය කරමි" කීහ. එකල්හි එයිනුදු කුමාරයා නොකැමතිව " දෙවයෙනි, හුදකළාව වලට යෙමි" කීහ. එකල්හි රජ්ජුරුවෝ, පුතනුවන් දැතින් වැළඳ ඉස සිඹ සනහා, "මා සිටිනා තෙක් තොප මලනුවෝ රාජ්‍යය කෙරේවා; මා නැතිකළ මේ නුවරට අවුත් තොප සතු රජ්‍යයෙහි පිහිටා රාජ්‍යය කරව"යි කියා අවවාදකොට යවූහ. ඒ කුමාරයාද රජ්ජුරුවන් වැඳ අවසරගෙන මෑණියන් නැති අඩුව සිතා මහදුක් උසුලමින් වල් වැද වල් වැද්දන් නිසා වසන්නේ එක් දවසක් මෘග සූකරාදීන් සොයා ඒ වල දඩයමට ගියේය. සුජාත කුමාරයන් පෙර කාශ්‍යප බුදුන් සමයෙහි පැවිදිව වසනකළ යහලුව මහණදම් පුරා හැසුරුණාවූ එක්තරා දිව්‍යපුත්‍රයෙක් ඔහු කෙරෙහි කරුණාවෙන්, "සසර දුකින් මුදවමි" යි සිතා මුව වෙසක් මවා කුමාරයට පෙනී පලොභනය කෙරෙමින් දිවගොස් කාත්‍යායන මහතෙරුන් වහන්සේගේ පන්සල සමීපයට පැමිණ අනතධාන විය. ඒ කුමාරයාද, "මුවා දැන්ම ගනිමි,

දැන්ම ගනිමි"යි පසුපස්සෙහි දිවන්නේ තෙරුන් වහන්සේ වසන තැනට පැමිණ මුවා නොදැක පන්සලින් පිටත වැඩහුන් තෙරුන් වහන්සේ දැක උන්වහන්සේ සමීපයෙහි දුනු කෙළවර බිම ඔබා දුන්නේ එලී සිටියේය. තෙරුන් වහන්සේ ඔහු දිශාව බලා කුමාරයා සිටින ලෙස දැක ආදියෙහි පටන් ඔහුගේ සියලුම ප්‍රවෘත්තිය දිව්‍යඥානයෙන් දැන ඔහු කෙරෙහි කරුණායෙන්, කථාකිරීමට අවකාශ දෙමි"යි සිතා ඕහට සංග්‍රහකරන සේක් නොදන්නාසේ මෙසේ විචාළේය.

"දළ්හධම්මා නිසාරස්ස ධනුං ඔලුබ්භ තිට්ඨසි,
ඛත්තියො නුසි රාජඤ්ඤො ආදු ලුද්දො වනෙ චරෝ"ති

යනුහෙයින්, "දුන්න නගා දුනුදිය මැද ලොහෝ ර්යම් ආදී කිසියම් බරක් බැඳ දුනු දණ්ඩක් මැදින් අල්වාගෙන කර පමණතැන් දක්වා උඩ නගාගත්කල ලෝහාදී බර බිමින් ඉගිල එසවීගියේ නම් දෙදහසක් නගන ලද දළ්හ ධනු නම් වෙයි. එබඳු දෙදහසක් බල දරන්නාවූ විශිෂ්ටවූ හර ඇති වෘක්ෂයෙන් මනාකොට සද නගනලද දුන්නක් ගෙන එක් කෙළවරක් බිම ඔබා අනෙක් කෙළවර එලී සිටිනාවූ තෝ ශාක්‍ය රාජකුමාරයෙක් ද? නොහොත් මේ වළ වසන වල් වැද්දෙක්ද? මේ දෙපක්ෂයෙන් පිටත් අනෙක් රජදරු කෙනෙක්දැ?"යි විචාරා වදාළසේක. එකල්හි ඔහු තමන් රාජකුමාර බව ප්‍රකාශකොට කියන්නේ,

"අස්සකාධිපතිස්සාහං භන්තෙ පුත්තොවනෙ චරෝ,
නාමං මෙ භික්ඛු තෙ බ්‍රෑමි සුජාතො ඉති මං විදූං.

යනුහෙයින්, "ස්වාමීනි, අස්සක රට වැස්සන්ට අධිපතිවූ අස්සක රජහුගේ පුත්‍රවූ සුජාත කුමාරයා නම් මමය. මාගේ නම නුඹවහන්සේට කියමි. මම සුජාත කුමාරයෝහයි කියා දැන වදාළ මැනව. හූරන් මුවන් සොයා මේ වළ හැසිරෙන්නාවූ සුජාත කුමාරයෝය" යි කියා රටවැස්සෝ දනිති"යි කීහ. එබස් අසා මහතෙරහු ඔහු හා සමග පිරළිසඳර කථාකොට ආගන්තුග සත්කාර පිණිස මෙසේ වදාළසේක.

"ස්වාගතන්තෙ මහපුඤ්ඤ අථො තෙ අදූරාගතං,
එත්තො උදකමාදය පාදෙ පක්ඛාලයස්සු තෙ
ඉදම්පි පානීයං සීතං ආහතං ගිරිගබ්භරා,
රාජ පුත්ත තතො පිත්වා සන්ථතස්මිං උපාවිසා" ති.

යනුහෙයින්, "එම්බා රාජකුමාරය, හුරන් මුවන් සොයා යන ගමණක් සේ නරකාදි දුකට පැමිණිය යුතුවූ ගමනෙක් නොවෙයි. දැන් මෙතනට ආ ගමන ප්‍රීති සොම්නස් ඉපදීම් වශයෙන් සියලු වැඩට කාරණා වූ යහපත් ගමනෙක. මේ පැන් ගෙණ පා ධොවනය කරව. මේ ගිරිලෙණ පැන් නිම්ලවූ සිහිල් පැන් වන්නේය. එයින් පැන් ගෙන බී විඩා සංසිඳුවා මෙතන ඇතිරියේ හිඳ ශරීරය සතපාගනුව"යි වදාළසේක. එබසට රාජ කුමාර තෙම තෙරුන් වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන ඒ ආගන්තුග සත්කාර ඉවසමින් මෙසේ කීය.

"කල්‍යාණී වත තෙ වාචා සවණීයා මහාමුනී,
නෙලා වත්‍ථවතී වග්ගු මන්‍තවා අත්‍ථසංහිතා භාසසෙ.
කා තෙ රති වනෙ විහරතො
ඉසිනීසභ වදෙහි පුට්ඨො:
තව වචනපථං නිසාමයිත්වා
අත්‍ථ ධම්මපදං සමාචරෙමසෙ"ති.

යනුහෙයින්, "ස්වාමීවූ උත්තමර්ෂින් වහන්ස, නුඹවහන්සේගේ වචනය කණට මිහිරිව ඇසිය යුතු හෙයින්ද අර්ථ සහිතව ඉතා යහපත්වන්නීය. මෙලෝ පරලෝ වැඩ අවැඩ ප්‍රඥාවෙන් පිරිසිඳ දැන ධර්මාන්විතව කියනසේක. සියලු ඍෂීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ ඍෂිවූ උතුමාණන් වහන්ස, මේ ජනශූන්‍යවූ වනයෙහි වසන්නාවූ නුඹවහන්සේට කවර ඇල්මෙක්ද? නුඹවහන්සේ සිතින් කවරක් අරමුණුකොටගෙන කම්පා නොව වසන සේක්ද? උභයලොකාර්ථාධිගමයට උපායසහිතව කියන වචන මාර්ගය අසා ඉහලොක පරලොක දෙක්හිම අර්ථාවහ හිතාවහ වන්නාවූ ශීලාදි ධර්මකොට්ඨාසයෙහි මමද පිළිපදිමි"යි කියා තෙරුන් වහන්සේ ගේ ගුණ කියා ඒ ගුණයෙහි හැසිරෙන පිණිස පිළිවෙත් විචාළේය. එකල්හි මහතෙරහු "දැන් මෝහට සුදුසු පරිද්දෙන් තමන් වහන්සේගේ පිළිවෙත් කියන්ට වටනේය"යි සිතා මෙසේ කීසේක.

"අහිංසා සබ්බපාණීනං කුමාරම්හාක රුච්චති,
ථෙය්‍යා ච අතිචාරා ච මජ්ජපානා ච ආරති,
ආරති සමචරියා ච බාහුසච්චං කතඤ්ඤුතා,
දිට්ඨෙව ධම්මෙ පාසංසා ධම්මා එතෙ පසංසියා"ති.

යනුහෙයින්, "එම්බා පින්වත් රාජකුමාරය, සියලු සත්වයන්ට හිංසා පීඩා නොකිරීමද, සොරකම් නොකිරීමද, ස්ත්‍රීසෙවනය නොකිරීමද, බොරු නොකීම්ද, රහමෙරින් වැළකීමද, යන මෙකී දේ අපට

ජියිවන්නේය. ත්‍රිවිධ දුශ්චරිතයෙන් දුරුව ත්‍රිවිධ සුචරිතයෙහි හැසිරීමද, බහුශ්‍රැතව සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මයෙන් යුක්ත කථාකිරීමද, උපකාර සැළකීම් වශයෙන් කෙළෙහිගුණ දන්නා බවද, ඉහලොක පරලොක දෙක්හිම සත්වයන්ට හිත සැප එලවන හෙයින් මෙකී ධර්මයෝ ප්‍රශංසා කටයුතු වන්නාහුය. එසේ බුදු පසේ බුදු මහසව්වන් විසින් ප්‍රශංසා කටයුතුවූ ප්‍රතිපත්ති ධර්මයෙහි පිහිටියම්හ`යි කියා ඕහට අනුරූප පරිද්දෙන් සම්‍යක් පිළිවෙත් වදරා ඉක්බිති අනාගත ඥානයෙන් ඔහුගේ ආයු සංස්කාරය බලන්නේ පස්මසක් පමණ ආයු වන්නේ යයි දැක ඕහට සංවේග උපදවා දැඩිකොට ප්‍රතිපත්තියෙහි පිහිටු වන පිණිස මේ ගාථාව වදළසේක.

"සත්තිකෙ මරණං තුය්හං ඔරං මාසෙහි පඤ්චහි,
රාජපුත්ත විජානාහි අත්තානං පරිමොචයා"ති.

යනුහෙයින්, "එම්බා රාජකුමාරය, පස්මසකින් මෙපිට තෝ මරණයට පැමිණෙන්නෙහිය. එබැවින් මරහු තට සමීපවූහයි කියා දැන ගනුව, මරහුළංවූහයි සිතා අපායාදී දුකින් මිදෙන්ට උත්සාහ කරව`යි වදළසේක. රාජකුමාරයා එබස් අසා තමන් ඒ දුකින් මිදීමට උපාය විචාරන්නේ මෙසේ කීය.

"කතමං ස්වාහං ජනපදං ගන්ත්වා කිං කම්මං කිඤ්ච පොරිසං,
කාය වා පන විජ්ජාය භවෙය්‍යං අජරාමරො"ති.

යනුහෙයින්, "ස්වාමීනි, කවර දනව්වකට කවර දේශයකට ගොස් කවර පුරුෂ බල පරාක්‍රමයෙන් කවර විද්‍යාවක් කවර ශාස්ත්‍රයක් කවර මන්ත්‍රයක් ඉගෙන කවර උපායකින් අජරාමර වෙම්දැ?`යි විචාළේය. එබසට මහතෙරහු ඕහට බණ වදරණ පිණිස මේ ගාථාවෙන් වදළසේක.

"න විජ්ජතෙ සො පදෙසො කම්මං විජ්ජා ච පොරිසං,
යත්ථ ගන්ත්වා මච්චො රාජපුත්තාජරාමරො.
මහද්ධනා මහාභොග රට්ඨමන්තෙපි ඛත්තියා,
පහූතධන ධඤ්ඤාසෙ න තෙපි අජරාමරා.
යදි තෙ සුතා අන්ධකවෙණ්හුපුත්තා
සූරා වීරා වික්කන්තප්පහාරිනො,
තෙපි ආයුක්ඛයං පත්තා
විද්ධසතා සස්සතීසමා,
ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාල පුක්කුසා,
එතෙ චඤ්ඤෙ ච ජාතියා න තෙපි අජරාමරා" -පෙ-

යනුහෙයින්, "එම්බා රාජකුමාරය, මේ ලොකයෙහි අජරාමර දෙයක් වේවයි දිපයක් වේයයි ජනපදයක් වේවයි යම්කිසි පුරුෂ වික්‍රමයක් බල පරාක්‍රමයක් වේවයි විද්‍යාවක් වේවයි මන්ත්‍රණයක් වේවයි ඒකාන්තයෙන්ම අජරාමරවීමට නිසි උපායක් නැත්තේමය: නිවන් පුරය හැර මනුෂ්‍යතෙම අනෙක් යම්කිසි තැනකටගොස් අජරාමර වෙමි යන සිතෙක් ඇද්ද එබඳුවූ කර්‍ම විපාකයෙන් මිදීමට නිසිතැනක් ඒකාන්තයෙන්ම නැත්තේ ය"යි කියා ජාති ජරා මරණාදියෙන් මිදීමට නිසිතැනක් නැති බව හඟවා සියල්ලම ශාස්වත වශයෙන් නියත නොවන බව ප්‍රකාශකොට වදරණසේක්, "එම්බා රාජකුමාරය, දවසකට සියක් කෙළක් ධන නිධානගතවන්නාවූ විසි අමුණක් වියදම් වන්නාවූ ක්‍ෂත්‍රිය මහාසාර කුලයෙහි උපන්නාහුද අසූකෙළක් ධන නිධාන ගතවන්නාවූ දසාමුණක් වියදම්වන්නාවූ බ්‍රාහමණමහාසාර කුලයෙහි උපන්නාහුද සතලිස් කෙළක් ධන නිධාන ගතවන්නාවූ ගෘහපති මහාසාර කුලයෙහි උපන්නාහුද තමන් පිරිස හා බොහෝදෙනාට සත් අට වර්‍ෂයක් සෑහෙන පරිද්දෙන් රැස්කොට තබනලද මහත් උපභොග පරිභොගසම්පත් ඇත්තාවූ කාශි කොසලාදි ජනපදධිපතිවූ ප්‍රසිඬවූ පින්වත් ජනයෝද හිරණ්‍ය සවර්‍ණ මුක්තා මාණික්‍යාදී බොහෝ ධන සම්පත් ඇත්තාවූ වෙළඳ ගොවි ආදීහුද චණ්ඩාල පුක්කුසාදි අවශෙෂ හින මධ්‍යම උත්කෘෂ්ට ජාති ඇත්තාහුද අන්ධක වෙන්හු පුත්‍රයයි යන නමින් ප්‍රසිඬවූ සෞර වීර බලපරාක්‍රමයෙන් සමන්විතවූ සතුරු බල මැඩ ජයගෙන වසන්නාවූ කුලපරම්පරාව ශාසවතයක් හා සමවහිර සඳසේ අවිනෂ්ටව පවත්නාවූ ජාතියෙන් විශිෂ්ටවූවාහුද යන මේ සියල්ලම තම තමන් හිසමත්තෙහි වැටෙන ලද ජරාමරණ වලකාගත නොහෙත්මය: මරණයට පැමිණෙන්නාහ. තවද සන්හුන් ඉඳුරන් ඇත්තාවූ කාය වාක් සමාචාරයෙන් යුත් ශීලාදීගුණ ඇති අට්ටකය වාමක යනාදි ඍෂිවරයන් විසින් තමන්ගේ ප්‍රඥා නැමති ඇසින් බලා ලොවට පහලකරණලද කප්පය ව්‍යාකරණය යනාදීවූ යම් මන්ත්‍රජාතියෙක් ඇද්ද ඒ මන්ත්‍ර විද්‍යාවෙන් හා අවශෙෂ ශාස්ත්‍ර ජාතියකින්වත් ජරා මරණ වළකා ගතනොහැක්කේය"යි කියා බණ වදළසේක එබස් අසා රාජකුමාර තෙම තමා විසින් කළමනා කටයුතු කියන්නේ මෙසේ කීයේය.

"සුභාසිතා අත්ථවතී ගාථායො තෙ මහාමුනී,
නිජ්ඣත්තොම්හි සුභටෙඨන ත්වඤ්ච මෙ සරණංභවා"ති.

යනුහෙයින්, "මහර්ෂිවූ සවාමීන්වහන්ස, නුබවහන්සේ විසින් මෙලෝ පරලෝ හඟවා ධර්‍මයවූ පරිද්දෙන් මාගේ සිත හෙළා වදරණලද

ගාථා අභිප්‍රායන් දැන සිතට නගා ගතිමි. නුඹවහන්සේගේ ධර්මදේශනාව ඉතා යහපත, නුවනැත්තවුන් විසින් සිත්හි ළා දැරිය යුතු හෙයින් අර්ථ සහිත වන්නේය, වැඩ අවැඩ මෙලෝ පරලෝ නුඹවහන්සේ ම දන්නා සේක. එබැවින් නුඹවහන්සේගේම සරණ යෙමි, මට පිටිවහල්වුව මැනව`යි කීය. එබස් අසා ඔහු සම්‍යක් පිළිවෙත්හි පිහිටවනු පිණිස අනුශාසනා කරණ මහතෙරුන් වහන්සේ මේ ගාථාව වදළසේක.

"මා මං ත්වං සරණං ගච්ඡා තමෙව සරණං වජ,
සක්‍යපුත්තං මහාවීරං යමහං සරණං ගතො"ති.

යනුහෙයින්, "එම්බා රාජකුමාරය, තෝ මා සරණනොයව, ශාක්‍යපුත්‍රවූ ගෞතම නම් බුදුකෙනෙකුන්ගේ යම් සරණක් මම ගියෙම්ද තෝ ඒ මහාවීරවූ බුදුන් සරණ යව`යි වදළසේක. එබසට රාජකුමාරතෙම මෙසේ කීයේය.

"කතරස්මිං සො ජනපදෙ සත්ථා තුම්හාක මාරිස,
අහම්පි දට්ඨුං ගච්ඡිස්සං ජිනං අප්පටිපුග්ගලං"ති.

යනු හෙයින්, "ස්වාමීනි, නුඹවහන්සේගේ ගුරුවූ ශාස්තෲන් වහන්සේ කවර දිගක කවර රටක දැන් වැඩවසන සේක්ද? ඒ අප්‍රති පුද්ගලවූ පස්මරුන් දිනූ බුදුරජාණන් වහන්සේ දකින්ට යෙමි`යි කීයේය. එකල මහතෙරහු මෙසේ වදළසේක.

"පුරත්ථිමස්මිං ජනපදෙ ඔක්කාකකුලසම්භවො,
තත්ථාසි පුරිසාජඤ්ඤො සො ච ඛො පරිනිබ්බුතො" ති.

යනුහෙයින්, "එම්බා රාජකුමාරය, මේ ස්ථානයට නැගෙණහිර දිග්භාගයේ ජනපදයෙහි කපිලවස්තු පුරයෙහි මහාසම්මත රජහු පටන් පිරිසිදුව පැවත ආවාවූ ඔක්කාකකුලයයි කියන ලද යම් සූර්‍ය වංශයක් ඇද්ද ඒ සූර්‍යවංශොද්භූතව ශ්‍රී මහාබොධි වෘක්ෂ මූලයෙහි දී සවාසනා සර්වකෙලශයන් නසා ලොවුතුරා බුදුවූ පුරුෂොත්තම කෙනෙක් සත්වයන් භවකාන්තාරයෙන් එතර කළසේක්ද, ඒ ශාස්තෲවූ බුදුරජාණෝ පන්සාළිස් හවුරුද්දක් මුලුල්ලෙහි බුදුව වැඩ හිඳ සියලු බුඩකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පා වදළසේකැ`යි කියා බුදුගුණ වදළසේක. මෙසේ තෙරුන් වහන්සේ වදරණ ලද ධර්මදේශනාව අසා සතුටු සිත් ඇති රාජකුමාර තෙම සරණයෙහිද ශීලයෙහිද පිහිටියේය. එයින් කීහ:-

"සචෙ හි බුද්ධො තිට්ඨෙය්‍ය සත්ථා තුම්හාක මාරිස,
යොජනානි සහස්සානි ගවෙෂය්‍යං පයිරුපාසිතුං.
යතො ච ඛො පරිනිබ්බුතො සත්ථා තුම්හාක මාරිස,
නිබ්බුතමපි මහාවිරං ගච්ඡාමි සරණං අහං,
උපෙමි සරණං බුද්ධං ධම්මඤ්චාපී අනුත්තරං
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං
පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි,
අමජ්ජපො නො ච මුසා භණාමි
සකෙන දරෙන ච හොමි තුට්ඨො"ති

යනුහෙයින්, ස්වාමීන් වහන්සේගේ ශාස්තෲන් වහන්සේ දහසක් යොදනින් මත්තෙහි වැඩසිටින්නාසේක් වීනම් දැන් ඒ දහස් ගණන් යොදුන් දුර මග ගෙවා වඳින්ට භජනය සෙවනය කරන්ට යෙමි, දැන් ඒ බුදුරජාණන් වහන්සේ යම් හෙයකින් නිවන්පුර වැඩිසේක්ද? ඒ බුදුන් සරණයෙමි"යි කියා තෙරුන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ සිල් ගන්නේ, "බුදුන් සරණ යෙමි අනුත්තරවූ දහම් සරණයෙමි; බුඩපුත්‍රවූ සඟ සරණ යෙමියි කියා තුන් සරණයෙහි පිහිටා ඉක්බිති, "ප්‍රාණ ඝාතයෙන් වැළැකෙමි, සත්වයන් කෙරෙහි මෛත්‍රී කරමි; අදින්නාදනයෙන් වැළැකෙමි, දුන් දෙයක්ම ගනිමි, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්මි, සිය අඹුවන් නිසාම සතුටු වෙමි, මද්‍යපානයෙන් වෙන් විමි, නිරවද්‍යපානයම කෙරෙමියි කියා සරණයෙහිත් ශීලයෙහිත් පිහිටියේය. මෙසේ සරණයෙහිද ශීලයෙහිද පිහිටනලද කුමාරයාහට මහතෙරහු මෙසේ වදළසේක "එම්බා රාජකුමාරය, මේ වල විසීමෙන් තට කම් නැත්තේය. තාගේ ජීවිතය බොහෝ කල් නොපවත්නේය. පස් මසක් ඇතුළත තෝ නස්නේය, එබැවින් තොපගේ පියරජහු සමීපයට ගොස් දන සීලාදී කුශල් කොට ස්වර්ගපරායණ වෙව"යි කියා තමන් වහන්සේ සමීපයෙහි තුබූ ශරීර ධාතු දී අවවාදකොට, "පියාණන් වහන්සේ සමීපයට යව"යි සමුදී යවුසේක. රාජකුමාරයා තෙරුන් වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙන තෙරුන් වහන්සේට නමස්කාරකොට මෙසේ කීයේය. "ස්වාමීන්වහන්ස, මම පියාණන් සමීපයට යෙමි, මට අනුකමපාවෙන් එහි මා වසන තැනට වැඩිය මැනව"යි කියා ආරාධනාකොට තෙරුන් වහන්සේ විසින් ඉවසූ බව දැන මහතෙරුන් වැඳ අවසරගෙන ප්‍රදක්ෂිණාකොට පියරජහුගේ නුවරට ගොස් උයනට වැද තමන් ආ බව රජ්ජුරුවන්ට දැන්විය. රජ්ජුරුවෝ

එබස් අසා සහ පිරිවරින් උයනට ගොස් කුමාරයා වැළඳ සිඹ සනහා ඇතුළු නුවරට කැඳවාගෙන ගොස් අභිෂේක කොට රාජ්‍යයට පමුණුවනු කැමතිවූහ. එකල ඒ කුමාරතෙම කියන්නේ, "දෙවයන් වහන්ස, මාගේ ආයුෂය ස්වල්පවන්නේය. මෙයින් මතු සාර මසක් ගියකල මට මරණය පැමිණෙයි, එයින් මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත, නුඹවහන්සේ පිටිවහල් කොටගෙන කුසල්කොට ගනිමි" යි කියා තෙරුන් වහන්සේගේ ගුණයත් බුඩාදී රත්නත්‍රයෙහි ආනුභාවත් රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ එපවත් අසා මහත්වූ සංවේගයට පැමිණ තෙරුන් වහන්සේ කෙරෙහිද තුනුරුවන් කෙරෙහිද ප්‍රසන්නවූ සිත් ඇතිව මහත්වූ විහාරයක් කරවා කාත්‍යායන මහතෙරුන් වහන්සේ සමීපයට දූතයෙක් යැවූහ. තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට හා මහජනයාට අනුග්‍රහ කෙරෙමින් වැඩිසේක. එකල දුරින් වඩනා තෙරුන් වහන්සේ දැක රජ් ජුරුවෝ සහ පිරිවරින් පෙරගමන්කොට මහතෙරහු වඩාගෙන ගොස් විහාරය තෙරුන් වහන්සේට පිළිගන්වා සකස්කොට සිවුපසයෙන් උපස්ථාන කෙරෙමින් සරණ ශීලයෙහි පිහිටියේය. රාජ කුමාරයාද සිල් සමාදන්ව තෙරුන් වහන්සේට හා භික්ෂු සංඝයාට සකස්කොට උපස්ථාන කෙරෙමින් දන් දෙමින් බණ අසමින් බොහෝසේ කුශල් රැ ස්කෙරෙමින් සාරමසක් ඇවෑමෙන් කාලක්‍රියාකොට තවුතිසා දෙව්ලොව උපන්නේය. ඔහුගේ කුශලානුභාවයෙන් සත් රුවනින් ප්‍රතිමණ්ඩිතවූ සියක් යොදුන් පමණ රථ විමාණයක් පහළවිය. පරිවාර ස්ත්‍රීහු නොයෙක් දහස් ගණන් වූහ. රජ්ජුරුවෝ කුමාරයාගේ ශරීරය ආදාහණ කරවා භික්ෂු සඞ්ඝයාට මහදන්පවත්වා බුදුන් උදෙසා ධාතු චෛත්‍යයට පූජාසත්කාර කළෝය. එකල්හි රජ්ජුරුවන් ඇතුළුව බොහෝ මනුෂ්‍යයෝ ඒ විහාරස්ථානයට රැස්වූහ. තෙරුන්වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ඒ ස්ථානයටම වැඩිසේක. මෙසේ ගිහිපැවිදි දෙපක්ෂයෙන්ම එහි මහත් සමාගමෙක් විය. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රතෙම තමන් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මයත් තෙරුන්වහන්සේ කළ උපකාරයත් දැක කෙළෙහිගුණ දන්නා බැවින්, "තෙරුන් වහන්සේකරා ගොස් වඳිමි. තෙරුන් වහන්සේගේ ගුණයත් සර්වඥ ශාසනයෙහි ගුණයත් බොහෝදෙනාට ප්‍රකාශකෙරෙමි" යි සිතා දිව්‍යරථයට නැගී මහත් වූ දෙව්පිරිස් හා සමග දෘශ්‍යමාන රූපයෙක් මිනිස්ලොවට අවුත් රථය ආකාශයෙහි රඳවා බිමට බැස තෙරුන් වහනසේගේ ශ්‍රී පාද වන්දයට නමස්කාරකොට පිය රජ්ජුරුවන් හා පිළිසඳර කථාකොට නැවත තෙරුන් වහන්සේ කරා ගොස් දෙහොත් මුදුන්දී එකත් පස්ව සිටියේය. මහතෙරහු ඒ දිව්‍යපුත්‍රයාගේ ශ්‍රී සමෘද්ධිය දැක ඔහු විසින් කරණ ලද කුශලකර්මය ප්‍රකාශ කරවනු පිණිස මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"සහස්ස රංසීව යථා මහප්පභො
දිසං යථා භාති නභෙ අනුක්කමං
තථප්පකාරො තවයං මහාරථො
සමන්තතො යොජනසත්තමයාතො.
සුවණ්ණපට්ටෙහි සමන්තමොත්ථටො
උරස්ස මුත්තාහි මණීහි චිත්තිතො,
ලෙඛා සුවණ්ණස්ස ච රූපියස්ස
සොභෙන්ති වෙළුරියමයා සුනිම්මිතා.
සීසඤ්චිදං ලොහිතකාය චිත්තිතං
යුත්තා සුවණ්ණස්ස ච රූපියස්ස
සොභන්ති අස්සා ච ඉමෙ මනොජවා
සො තිට්ඨසි හෙමරථෙ අධිට්ඨිතො
දෙවානමින්දොව සහස්සවාහනො,
පුච්ඡාමි තාහං යසවන්ත කොවිදං
කථං තයා ලද්ධො අයං උළාරො"ති.

යනුහෙයින්, "දහසක් රැසින් දිලියෙන්නාවූ මහත් ප්‍රභාමත්වූ සූර්‍යමණ්ඩලය හාත්පසින් අන්ධකාර විද්වංශනයකොට යම්සේ ආකාශයෙහි බබලාද එමෙන් තාගේ මේ මහාරථ විමානය හාත්පසින් ජොතිමත්ව බබලන්නේය. එකතුදු වුවත් මේ ලොකයෙහි සත්වයන් ඇසට පෙනෙන්නාවූ ආලොකයන් අතුරෙන් සූර්‍යමණ්ඩලයට වඩා මහත් ආලෝකයක් නැතිහෙයින්ද අනෙක් උපමාවක් ප්‍රකාශව නොපෙනෙන බැවින්ද ආලොකය නිසා සූර්‍ය මණ්ඩලයට උපමාකළ පමණෙක් විනා හිරුමඩල පනස්යොදුන් පමණ වෙයි. මේ රථ විමානය අයමින් විතරින් උසින් සියක් යොදුන් පමණ වෙයි. මිනිස්ලොවට පැමිණි කෙණෙහිම තුන්දිවයිනක පැතිර පවත්නාවූ අඳුරු දුරුකොට දිළියෙමින් මේ විමානය හිරු විමානයටත් වඩා අතිශයින්ම ප්‍රභාමත් වෙයි, මේ රථය හාත්පසින් රන් පටින් වසනලදදේය, ඒ රන්පටෙහි බබලන්නාවූ මාලාකර්ම ලතාකර්මාන්ත වෛදූර්‍ය මාණික්‍යයෙන් නිමියේය. රථඋරය මුතු මැණික්මය විසිතුරු කර්මාන්තයෙන් නිමියේය. සියලු රථ කර්මාන්තය රන් රිදී මුතු මැණික්මය වන්නේය. මේ රථයෙහි කිඹුල්මුඛ දෙකද ලොහිතඞකමිණිහා වෛදූර්‍යමිණියෙන් නිමියේය. වියලුතු රණින් රිදියෙන් නිමියේය. මේ රථයෙහි යොදනලද ශෛන්ධව අශ්වයෝද දිව්‍යපුත්‍රයා යම්තැනකට යේම්යි සිතු කෙණෙහිම සිතු තැනකට රථය අදනාහෙයින් මනො මය ජව ඇත්තාහ. දහසක් ශෛන්ධවයන් යොදනලද වෛජයන්ත නම් රථයෙහි හුන්නාවූ ශක්‍රදෙවේන්ද්‍රයාසේ තෝද මේ රථ විමානාරූඪව මේ

දිව්‍ය සමූහයා අභිභවමින් බබලන්නෙහිය. තා විසින් පූර්වජාතියෙහි කරනලද කවර කුශලයක් හේතුකොට ගෙන මේ දිව්‍යසුරු ලද්දේදැ'යි විචාළසේක. මෙසේ ඒ මහතෙරුන්වහන්සේ විසින් විචාරනලද ප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍ය පුත්‍රතෙම මේ ගාථාවන්ගෙන් ප්‍රකාශකෙළේය.

"සුජාතො නාමහං භන්තෙ රාජපුත්තො පුරෙ අහුං,
ත්වඤ්ච මං අනුකම්පාය සඤ්ඤමස්මිං නිවෙසයි.
ඛීණායුකඤ්ච මං ඤත්වා සරීරං පාදසි සත්ථුනො,
ඉමං සුජාත පූජෙහි තං තෙ අත්ථාය හෙහිති.
තාහං ගන්ධෙහි මාලෙහි පූජයිත්වා සමුය්‍යුතො,
පහාය මානුසං දෙහං උප පන්නොම්හි නන්දනං,
නන්දනොපවනෙ රම්මෙ නානාදිජගණායුතෙ,
රමාමි නච්චගීතෙහි අච්ඡරාහි පුරක්ඛතො"ති.

යනුහෙයින්. "ස්වාමීනි, මෙම නුවර රජහුගේ පුත්‍රවූ කාල ක්‍රියා කළ සුජාත කුමාරයෝ නම් මමය. එසමයෙහි නුඹවහන්සේ මට සුජාත කුමාරය, මේ ධාතු පූජාකරව, මතු ස්වර්ග මොක්ෂ සම්පත් දෙන හෙයින් මහත් වැඩ පිණිස වන්නේය'යි කියා බුදුන්ගේ ශරීර ධාතු දුන්සේක. මමද ඒ ධාතු ගෙනගොස් ගඳ දුම් මල් පහන් ආදියෙන් පූජාකොට මේ දිව්‍යලොකයෙහි උපන්මි" යනාදීන් ප්‍රකාශකොට කියා තෙරුන්වහන්සේ වැද අවසර ගෙන ප්‍රදක්ෂිණා කොට මවුපියන් විචාරා රථයට නැගී දෙව්පිරිස් පිරිවරා දෙව්ලොවටම ගියේය. මහෙතෙරුන්වහන්සේ එම අර්ථෝත්පත්ති කොටගෙන එතැන්හි රැස්වූ පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝදනාට ප්‍රයෝජනවිය ඉක්බිති මහතෙරුන්වහ්සේ තමන් විචාළ නියාවත් දිව්‍යපුත්‍රයා කී නියාවත් ඒ සියලුම ප්‍රවෘත්තිය තත්වූ පරිද්දේන් ධර්මසඞ්ගායනා කරන කාලයෙහි ධර්මසංග්‍රාහක මහාස්ථවිරයන්ට කීහ. ඒ මහා ස්ථවිරයේ මේ විමානවස්තුවද සංග්‍රහයට නගා විමානවස්තු දෙනාවට අන්තර්ගත කොට සංගායනා කළහ.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි පස්වැනි මහාරථ වර්ගයෙහි
**තෙළෙස්වන චූලරථ විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

# 64. මහාරථ විමාන වස්තුව

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පස්වැනි මහාරථවර්ගයෙහි තුදුස්වන මහාරථ විමාන වස්තුව නම් කවරයත්:-

සනරාමර ලොකගුරුවූ බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් තවුතිසා භවනයෙහි තමන්ගේ විමනින් නික්ම දහසක් අසුන් යොදනලද මහත්වූ දිව්‍යරථයකට නැගී මහත්වූ දෙව්පිරිස්ද පිරිවරා මහත්වූ දිව්‍යසෘඩියෙන් දිලිහි දිලිහී උයන්කෙළියට යන්නාවූ එක්තරා ගොපාල නම් දිව්‍යපුත්‍රයෙකුගේ ඉසුරු දැක බුදුන්ට දන්වා ප්‍රකාශකරවූසේක. ඔහුගේ කුශලකර්මය මේ මතු පහළ වන්නේය. කෙසේද යත්:- "මේ මහා භද්‍ර කල්පයෙහි එකානුවන් කල්පයෙහි බුදුහු මහාවිපස්සී නම් බුදුන් සමයෙහි දෙතිස්මහා පුරුෂලක්‍ෂණයෙන් හා අසූ අනු ව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් දිලියෙන්නාවූ බුඩ ශ්‍රී දැක සතුටු සිත් ඇතිව රන් මාලාවක් පූජා කොට මේ කුශලය හෙතුකොට ගෙන මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා උරච්ඡද මාලාවක් පහළ වේවා"යි කියා කරනලද ප්‍රාර්ථනා ඇතිව එකානු කපක් මුළුල්ලෙහි සුගතියෙහිම සැරි සරන්නේ මේ මහාභද්‍ර කල්පයෙහිම තුන්වැනිව බුදුවූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වෙදත්‍රයෙහි පරතෙරට පැමිණ ගොපාල බ්‍රාහමණයයි ප්‍රසිඩව මෙලෝ පරලෝ කුසල් අකුශල් හැඳින සත්පුරුෂ ගුණයෙහි පිහිටියේය, රාජ්‍යශ්‍රී සමාන ඉසුරු සම්පත් අනුභව කෙරෙයි, ඔහු යටගිය දවස මහා විපස්සී නම් බුදුන් සමයෙහි කළ ප්‍රාර්ථනා වශයෙන්ම කසී රට කිකී නම් කසී රජහුගේ අග්‍ර මෙහෙසිකා දෙවින් කුස උපන් දිව්‍යාඞගනාවක් වැනිවූ උතුම් රූපශ්‍රියෙන් හා සියුම් මොලොක් ශරීර සුවපහස් ඇත්තාවූ සියලු ළයමඬල වසා වළඳනාලද ස්වර්ණමය උරච්ඡද මාලාවක් ලැබූ හෙයින් උරච්ඡද මාලා නම් රාජ කුමාරිකාවක් පහළවූවාය, ඒ රාජකුමාරිකාව ගොපාල බ්‍රහමණයා කළ ප්‍රාර්ථනා බලයෙන් පියරජහු විසින් පාවාදෙන ලදුව දෙවඟනක් වැනිවූ රාජකුමාරිකාව විසින් කරනලද උපකාර විඳිමින් ශ්‍රී සම්පත් අනුභව කෙරෙමින් බුදුන් කෙරෙහි පැහැද බුදු පාමොක් මහසඟනට අශදශදනාදි මහදන් පවත්වා ඒ බ්‍රාහමණයා හා රාජකුමාරිකාව උදෙසා බුදුන් විසින් වදරනලද බණ අසා ද ශ්‍රඩා සති වීර්‍ය්‍ය සමාධි ප්‍රඥා යන පඤ්චසෘඩි නුමුහුකළ බැවින් මාර්ගඵලයක් උපදවාගත නොහී පෘථග්ජන කාලක්‍රියාවෙන් ම

කාලක්‍රියාකොට ඒ ජාතියෙහි කරනලද කුශලකර්මය හේතුකොට ගෙන තවුතිසා භවනයෙහි සාරසියයක් ගවු පමණ රන්විමනෙක උපන්නේය. පිරිවර දිව්‍යාඞ්ගනාවෝ නොයෙක් කෙළගණන් පහළවූහ, නොයෙක් විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් ශොභාමත්වූ භිත්ති හා රථාලඞ්කාරයෙන් හෙබියාවූ මිහිරිනාද පවත්නාවූ රථචක්‍ර හා දහසක් අඳුන් යොදනලද්දවූ රථාලොකයෙන් සූර්‍ය්‍යමණ්ඩලයට නින්දාකරන්නාක් වැනිවූ ප්‍රභාසම්පන්නවූ දිව්‍යරථයක් පහළවිය. ඒ දිව්‍යපුත්‍රතෙම එහි ආයු පමණින් දිව්‍යසම්පත් අනුභවකොට නැවත නැවතත් දිව්‍යලොකයෙහිම සැරිසරන්නේ මේ බුඬොත්පාද කාලයෙහිද ශෙෂව තුබූ එම කුශල කර්ම විපාකයෙන් කියනලද රථ විමානය ඇතුලුවූ දිව්‍ය සම්පත්තියෙන් සමෘඬවූ ගොපාලදිව්‍යපුත්‍රයායි කියන මේ නමින් ප්‍රසිඬව එම තවුතිසා භවනයෙහි දිව්‍යසම්පත් අනුභව කරන්නේ එක් දවසක් තමන් රන් විමනින් නික්ම රථයට නැගී මහත්වූ දෙව්පිරිස් පිරවරා මහත්වූ දිව්‍ය සෘඬියෙන් දිලිහි දිළිහී උයන්කෙළි පිණිස යන්නාවූ දිව්‍යපුත්‍රයාගේ අභිමුඛයෙහි මුගලන් මහතෙරුන්වහන්සේ පෙනී වදළ සේක. එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම තෙරුන්වහන්සේ දැක වහා රථයෙන් බැස තෙරුන්වහන්සේට නමස්කාරකොට දෙහොත් මුදුන්දි එක්තපස්ව සිටියේය. එකල්හි ඒ දිව්‍යපුත්‍රයාගේ ඉසුරු සම්පත් දැක ඔහු විසින් පූර්වජාතියෙහි කරනලද කුශලකර්මය ඔහු ලවාම ලොකයාට ප්‍රකාශකරවනු කැමතිව මෙසේ විචාළසේක.

"සහස්සයුත්තං හයවාහනං සුභං
ආරුය්හිමං සන්දනං නෙක චිත්තං,
උය්‍යානභූමිං අභිතො අනුක්කමං
පුරින්දදෙ භූතපතීව වාසවො,
සොවණ්ණමයා තෙ රථකුබ්බරා උභො
ඵලෙහි අංසෙහි අතීව සඞ්ගතා,
සුජාතගුම්බා නරවීරනිට්ඨිතා
විරොචතී පණ්ණරසෙව චන්දෙ
සුවණ්ණජාලාවතතො රථො අයං
බහූහි නානාරතනෙහි චිත්තිතො,
සුනන්දිඝොසො ච සුභස්සරො ච
විරොචතී චාමරහත්ථ බහූහි."

යනාදින් දක්වනල දහෙයින් අනෙකප්‍රකාර විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන්

හෙබියාවූ දහසක් අසුන් යොදනලද වෛජයන්ත නම් රථයටනැඟී දෙදෙව්ලොව දෙවියන් පිරිවරා උයන් කෙළි යන ශක්‍රදෙවෙන්ද්‍රයාසේ දිව්‍යසේනාව පිරිවරා නානාවිධ රත්නයෙන් විසිතුරු වූ දහසක් ශෛන්ධවයන් යොදනලද රථවිමානාරූඪව උයන් බිමට යන්නාවූ, එම්බා මහානුභාවසම්පන්නවූ දිව්‍ය පුත්‍රය, චන්ද්‍රමණ්ඩලයසේ නොයෙක් රැසින් දිලියෙන්නාවූ තාගේ මේ රථ විමානය මත්තෙහි කුටාගාර සටහන් ඇති පලසෙවෙනි සත් රුවනින් නිමියේය. සතරදිග නහනලද ටැම් සමූහය දක්‍ෂවූ ලියනවඩුවන් විසින් ඔවුන්ගේ සෞරවීයසී බල දක්වා පද්ම කුමුදකාර සටිකා හිඳුවා ශක්තිවූ පරිද්දෙන් ලියා නැඟුවාසේ සත්රුවනින් නිමියේය, රථයෙහි සිටිනාවුන් රක්‍ෂාකරන පිණිස හා අතින් අල්වාගත හැකිවූ පරිද්දෙන් දෙපස ආවරණකොට සාදනලද කිඹුල් මුවදෙක සත්රුවනින් නිමියේය, වෙදිකාකාරයෙන් සදනලද රථයාගේ දෙපස ගනරතින් හා සත්රුවනින් නිමියේය. දහස්ගණන් දැවී හාරන්පුවරු කඩ චක්‍රාකාරයෙන් විදුලිය වැළඳ දිලියෙන්නාසේ ශොභාමත්වූ සියදහස් ගණන් රෙඛා සමූහය ගන රණින් නිමියේය, අනෙකවිධ රත්නයෙන් නිමියාවූනාභි නිම්වළලු සහිත රථසක් පෙළින් ශොභාමත්වෙයි. ඊමත්තෙහි සත්රුවන් ධජ නගා තිබෙයි, නානාවිධ රත්නයෙන් නිමියාවූ චාමර ගත් අත් ඇති රතනයෙන් සැරහී නටමින් ගායනා කරමින් පවත්වනලද නළු නාටකයන් විසින් කරනලද නෘත්‍ය ගීත ලීලා දැක සතුටුව පවත්වනලද සාධුකාර නාදයෙන් හා ආශිර්වාද වශයෙන් පවත්වනලද සතුති මඞගල්‍ය ඝොෂාවෙන් එකනිත් නාදවෙයි මේ රථය පදනා කල මිණි කිංකිණික නාදය රථ චක්‍රනාදය දක්‍ෂවූ ගන්ධර්වයන් විසින් වයනලද පඤ්චාඞගික තූර්‍ය්‍යනාදයක්සේ කර්‍ණරසායනව මධුරනාද පවත්නේය රථයෙහි යොදන දහසක් සෛන්ධවයෝ ඔවුනොවුන්ට නොපසුබැස රථය අදනාහුය. දහසක් චාමර එකවිට වල්පත් සැලීමෙන්ද රථාලඞකාරය පිණිස අසුන් ගේ කුර සංඝට්ටනයෙන්ද අලඞකාරවන්නේය. සිවු සැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයෙන් සමන්විතවූ නොයෙක් කෙළගණන් දෙවඟනන් පිරිවරා රථවිමානාරූඪව තෝ ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් බබලන්නෙහිය. එම්බා දිව්‍යපුත්‍රය, මෙබඳු සැපතක් ලැබීමට තා විසින් ගිය ජාතියෙහි කරනලද කුශලකර්‍මය කවරේද?යි විචාරා වදාළසේක. මෙසේ මුගලන් මහතෙරුන්වහන්සේ විසින් විචාරන ලද පැණය විසඳන්නාවූ දිව්‍ය පුත්‍රතෙම මෙසේ ප්‍රකාශ කෙළේය.

ජිතින්ද්‍රියං බුද්ධං අනොමනික්කමං
නරුත්තමං කස්සපං අග්ගපුග්ගලං,

අවාපුරන්තං අමතස්ස ධාරං
දෙවාතිදෙවං සතපුඤ්ඤලක්ඛණං.
තමන්නපානෙන ච චීවරෙන ච
ඛජ්ජෙන භොජ්ජෙන ච සායනෙන ච,
සන්තප්පයිත්වා ද්විපාදනමුත්තමං
සො සග්ගසො දෙවපුරෙ රමාමහං."

යනු හෙයින්, "ස්වාමීනි, මම කාශ්‍යප බුදුන් සමයෙහි ගොපාල නම් බ්‍රාහ්මණව බුදුන් දුටු කෙණෙහිම මේ එසේ මෙසේ සත්වකෙනෙක් නොවෙයි. සකල කෙලශයන් නසා සියල්ල දත් ලොවුතුරා බුදුකෙනෙකැයි සතුටු සිත් ඇතිව බණ අසා දනයට ආරධනාකොට මාගේ වාසභවනයෙහි ගෙයක් වියන් බැඳ වට තිර ඇද ඔලම්බක පුෂ්පදමයන් එල්වා යහපත් ඇතිරි අතුට මධ්‍යයෙහි බුදුන් වඩා හිඳුවා දෙපාර්ශ්වයෙහි අග්‍රශ්‍රාවක දෙදෙනා ප්‍රධාන කොට ශ්‍රාවක සංඝයා වඩා හිඳුවා ඛාද්‍යභොජ්‍යාදි ආහාර වර්ගයන් වළඳවා සිවුරු පූජා කෙළෙමි මෙසේ අසදෘශ දනාදී වශයෙන් ත්‍රිවිධ චෙතනාව පිරිසිදුකොට මහත්වර ධන පරිත්‍යාගකොට පිරිසිදු ගුණගණාඩ්ගසඩ්ගත උදරතර මහා පින්කෙත්වූ බුදුන් ප්‍රධානකොට මහාසඞ්ඝයාට මහදන් පවත්වා ඒ කුශලකර්මය හෙතුකොටගෙන මිනිස්කුණප හැර මේ දෙව්ලොව ශක්‍රයා වැනිවූ උදරතර සම්පත් ලදිමි" කියා කුශලකර්මය ප්‍රකාශකොට බුදුන්ගේ උත්තම ගුණ මහත්තත්වය ප්‍රකාශකරනු පිණිසද බොහෝ දෙනා ශ්‍රද්ධාවෙහි පිහිටුවා කුශල ක්‍රියාවෙහි යොදවනු කැමතිවද මෙසේ කීයේය.

"ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච
පණීතරූපං අභිකඩ්ඛතා මුනි,
අන්නඤ්ච පානඤ්ච බහුං සුසඞ්ඛතං
පතිට්ඨපෙතබ්බං අසඞ්ගමානසෙ."

යනුහෙයින්, "අග්‍රවූ ආයුෂය, අග්‍රවූ වර්ණය, අග්‍රවූ සැපය අග්‍රවූ බලය, යනාදීවූ සියලු උතුම් සම්පත් කැමති ශ්‍රද්ධාවන්තයන් විසින් අන්නපානාදි යම්කිසි දනයක් ඇත්නම් බුද්ධාදි රත්නත්‍රයෙහිම පිහිටුවිය යුත්තේය. මෙලොවත් පරලොවත් බුදුන්ම විනා ලොවැස්සන් විසින් කරණලද පූජාසත්කාර විඳීමට සුදුසු කෙනෙක් කිසි තැනෙක නැත්තේය"යි කියා බුදුගුණ ප්‍රකාශ කෙළේය එකල්හි මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාගේ සිත් බලා කෙලෙසුන් තුනීවූ යහපත් වූ මෘදුවූ කෙලෙසුන් කෙරෙන් විනීවරණවූ ප්‍රසන්නවූ මාර්ගාධිගමයට සුදුසුවූ සිත

දැන චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක. එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම සොවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති මුගලන් මහතෙරුන් වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක බුදුරජාණන්වහනසේ එම අත්ථොත්පත්තිකොටගෙන එතැන්හි රැස්වූ පිරිසට ධම්මදෙශනාකොට වදාළසේක. ඒ ධම්මදෙශනාව බොහෝ දෙනාට සාත්ථකවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි පස්වන මහාරථ වර්‍ගයෙහි
**තුදුස් වන මහා රථ විමාන වස්තු වණ්නාව**
කියා නිමවනලදී.
පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දකට්ඨකථාවෙහි
පස්වන මහාරථවර්‍ගය කියා නිමවනලදී.

# සවන පායාසි වර්‍ගය

## 65. අගාරිය විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සවැනිවූ පායාසි වර්‍ගයෙහි පළමුවන අගාරිය විමාන වස්තුව නම් කවරයත්:-

සර්වලොක ප්‍රියඞ්කරවූ අප භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි වනාහි රජගහනුවර එක්කුලගෙයෙක්හි රත්නත්‍රය කෙරෙහි අතිශයින් පැහැදුනාවූ ශීලාචාර ගුණසම්පන්නවූ භික්ෂූන්ට හා භික්ෂුණීන්ට ඉතා අවනතවූ එක්තරා අඹුසැමි දෙදෙනෙක් වූහ. ඔවුහු තුමූ රත්නත්‍රය කෙරෙහි පැහැද ජීවිතාන්තය දක්වා පින්කොට එම මිනිසත් බවෙන් චුතව තවුතිසා දෙව්ලොව උපන්නාහුය. ඔවුන් විසින් කරනලද පුණ්‍යකර්මය විපාකදීම් වශයෙන් නානාලඞ්කාරයෙන් විභූෂිතවූ දහයොදුන් රන් විමනෙක් පහළවිය. එහි දහස් ගණන් දිව්‍ය සෙනාව පිරිවාර මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභව කරන්නාහුය. එසමයෙහි මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙහි හැසිරෙනසේක් ඒ දිව්‍යවිමානය දැක එහි වැඩ වදරා මේ සමපත් ලැබීමට ගිය දවස කරනලද කුශලකර්මය විචාරණසේක් මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"යථා වනං චිත්තලතං පභාසති
උය්‍යාන සෙට්ඨං තිදසානමුත්තමං,
තථූපමං තුය්හමිදං විමානං
ඕභාසයං තිට්ඨති අන්තළික්ඛෙ.

දෙවිද්ධිපතෙතාසි මහානුභාවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී" ති.

යනුහෙයින්, "එම්බා දෙවතාව, ඉතා දීප්තිමත්ව බබළන්නාවූ චිත්‍රලතා වනය යම්සේද එපරිද්දෙන් තවුතිසා වැසි දෙවියන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ උයනකින් යුක්තවූ එසේම නොයෙක් දිව්‍යලඞ්කාරයෙන් යුක්තවූ තොපගේ මේ විමානය මහත් අලොකයෙන් බබළමින් ආකාශයෙහි සිටින්නේය. මහත්වූ උදරතර ආනුභාව සම්පන්නවූ එම්බා දෙවතාව, තොප විසින් මීට පූර්ව්ජාතියෙහි මනුෂ්‍යභූතව කවර කුශලයක් කොට මෙබඳු දිව්‍ය සෘඞියක් දිව්‍යානුභාවයක් දිව්‍ය සමපත්තියක් ලබනලද්දේද, කවර කාරණයෙකින් මෙබඳු වස්ත්‍රාභරණාදියෙක් හා ශරීර වර්ණයෙන්ද දසදික් බුබුළුවාද? මීට කාරණාවූ සුචරිතකර්මය ප්‍රකාශකොට කියව"යි වදළසේක.

"සො දෙවපුත්තො අත්තමනො මොග්ගල්ලානෙන පුච්ඡිතො,
පඤ්හං පුට්ඨො වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං"ති.

යනුහෙයින්, මුගලන් මහතෙරුන්වහන්සේ විසින් විචාරන ලද්දවූ ප්‍රශ්නය විසර්ජනය කරන ඒ දිව්‍යපුත්‍රතෙම, "රත්නත්‍රයෙහිගුණ සිහිකොට ආහාර පානවර්ගයෙන් ප්‍රසන්නවූ සිතින් භික්ෂු භික්ෂුණීන්ට කරනලද සංග්‍රහ කරණකොටගෙන මෙබඳු සැපතක් ලද්දෙමි" මහතෙරුන්ගේ වචනය මුදුනෙන් පිළිගෙන,

"අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
ඔපානභූතා ඝරමාවසිම්හ,
අන්නඤ්චපානඤ්ච පසන්නචිත්තා
සක්කච්ච දානං විපුලං අදම්හ.
තෙන මෙ තාදිසො වණ්ණො-පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, "ස්වාමීනි, මාගේ භාර්‍ය්‍යාව සහ මමද මීට පෙර ජාතියෙහි මෙමබුඩොත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපිද විද්‍යමාන මිනිසුන්ට අනාගීතව දවස් යවන්නමෝ එසමයෙහි රත්නත්‍රය කෙරෙහි ප්‍රසන්නවූසිත් ඇතිව භික්ෂු භික්ෂුණීන්ට ඉතා අවනතවූවමෝ ආහාරපාන වර්ගාදියෙන් සංග්‍රහකොට ලැබූ කුශලකර්මය හෙතුකොටගෙන මෙබඳු සමපත්තියක් ලද්දෙමු, ස්වාමිනී" කිව. එකල්හි මහතෙරහු පිරිවර සහිත

ඒ දිව්‍යපුත්‍රයාහට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුරජාණන්වහන්සේට එපවත්දැන්වූ සේක. බුදුරජාණන්වහන්සේ එම අත්‍යෝත්පත්තිකොටගෙන එතැන්හි පැමිණි පිරිසට ධර්ම දෙශනාකොට වදළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට ප්‍රයෝජන විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසි වර්ගයෙහි
**පළමුවන අගාරිය විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදි.

## 66. දෙවෙනිවූ අගාරිය විමානවස්තුවද

**මේ නයින් දතයුතු.**

## 67. ඵලදායක විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සවැනිවූ පායාසි වර්ගයෙහි තුන්වැනිවූ ඵලදායක විමාන වස්තුව නම් කවරයත්:-

සකල ලොක ශිවඞකරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි බිම්බිසාර රජ්ජුරුවෝ අකාලයෙහි අඹ අනුභවකරනු කැමතිවූහ. එකල්හි රජ්ජුරුවෝ ආරාමපාලයා ගෙන්වා කියන්නාහු, "එම්බා ආරාමපාලය, මට අඹ ඵලයෙහි ලොභ උපන. එබැවින් මට අඹ ගෙනවුත් දෙව"යි කීහ. එකල්හි ආරාම පාලතෙම කියනුයේ, "දේවයන්වහන්ස, අඹ ගස්වල අඹඵල නැත්තේද නොවෙයි එතකුදුවත් වහා දීපිය නොහැක්කේය. දෙවයන් වහන්ස මඳ කල් ඉවසා වදරනසේක් නම් යම් ආකාරයකින් නොබෝදවසකින් අඹඵල ගනීද එලෙස කරමි"යි කීය රජතෙමේ එබස් අසා, "යහපත, ආරමපාලය, එසේ කරවයි කී"ය නැවත ආරාමපාලයා අඹ උයනට ගොස් අඹගස්මුල පස් හැර දමා යම් ලෙසකින් ගස්වල පත් නැතිවේද හෙවත් කොළ වැටේද එබඳු රූක්ෂ වූ බොරලු කැට මිශ්‍රවූ පස් දමා එබඳු දිය වත්කෙළේය. නැවත පත් ගිලිහෙන්ට වන් කල්හි රළු බොරළු පස් ඉවත දමා යහපත්වූ ප්‍රකෘති පස් දමා මනාකොට දිය වත්කෙළේය. අඹ ගස් නොබෝ දවසකින් දලුකොළ හා මල් කැකුළු හටගෙන මුකුලිතව මල් පිපී මැලකි හටගෙන අඹ ඵල ගත්තේය. ඒ උයනෙහි එක් අඹ ගසක පළමුකොටම මනොසිලා සුණු රැඳුසේ වර්ණසම්පන්නවූ අඹ ඵල සතරක් පැසුනේය. උයන් පාලයා ඒ අඹ සතර නෙලාගෙන, රජ්ජුරුවන්ට දක්වමි කියා ගෙනයන්නේ

අතරමගදී පිඩු පිණිස වඩනා මුගලන් මහතෙරුන්වහන්සේ දැක මෙසේ සිතුවේය. "මේ අග්‍රවූ අඹපල අග්‍ර දක්ෂිණෙය්‍යවූ මේ මහතෙරුන් වහන්සේට දුන්නේ වීනම් ඒකාන්තයෙන්ම මට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිතසැප පිණිස වන්නේය. රජ්ජුරුවන්ට ගෙනයන්නාවූ අඹ දුන් වරදට රජ්ජුරුවන් මරණසේක හෝ රටින් නගනසේක හෝ වේවයි ඒ දුක් මේ ජාතියට පමණක් වන්නේය. රජ්ජුරුවන්ට දුන්කල රජ සතුටුව ඉහලොක සම්පත් පමණක් දෙනසේක. එයිදු ස්වල්ප මාත්‍රයෙක් වෙයි. මේ ස්වාමීන් වහන්සේට දුන් කල්හි එසේ නොවෙයි. ඉහලොක පරලොක දෙක්හිම මහත් ඵල මහානිසංස වන්නේය"යි සිතා ඒ අඹ ඵල තෙරුන් වහන්සේට පූජාකොට රජ්ජුරුවන් කරාගොස් රජ්ජුරුවන්ට එපවත්කීහ රජු එබස් අසා රාජපුරුෂයන් කැඳවා, "මොහු මට ගෙනා අඹ, තෙරුන් වහන්සේට දුන්නෙමි කියා යමක් කියා නම් ඒ සැබෑදැයි විමසා එත්ව"යි කීහ. එකල්හි තෙරුන්වහන්සේ ඒ අඹ ගෙන ගොස් බුදුන්ට පිළිගැන්වූසේක. බුදුරජාණන් වහන්සේ එයින් එකක් සැරියුත් මහ තෙරුන් වහන්සේටද එකක් මුගලන් මහ තෙරුන් වහන්සේටද එකක් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේටද දෙවා වදරා එකක් තමන් වහන්සේ වැළඳූසේක. රාජ පුරුෂයෝ එපවත් දැක රජ්ජුරුවන්ට කීවාහුය. රජ්ජුරුවෝ එපවත් අසා මොහු ඒකාන්තයෙන්ම ප්‍රඥාවන්ත වීරපුරුෂයෙක තමාගේ ජීවිතය පරිත්‍යාගකොට කුශල් කෙළේය. තමන් උදෙසා ගෙන ආවාවූ අඹ ඵලයත් ස්වල්ප නොකොට යහපත්වූ සමතැනටම පැමිණෙන ලෙස කෙළේයයි කියා සතුටු සිත් ඇතිව ඕහට එක් ගම්වරක් හා වස්ත්‍රාභරණාලංකාරාදි උපකරණ සියල්ලදී, "එම්බා ආරාමපාලය, අම්බඵලදනය හෙතුකොටගෙන තා විසින් යම් කුශලයක් රැස්කරන ලදද එයින් මට පින් දෙව"යි කීහ. ආරාමපාලයාද "දෙවයන් වහන්ස, සුවසේ පින් අනුමෝදන්වනු මැනව"යි කියා පින් දුන්නේය. උයන්පාලයා එයින් අපරභාගයෙහි කාලක්‍රියා කොට තවුතිසා භවනයෙහි උපන්නේය. ඕහට සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ සූසැට ගව් පමණවූ රන් විමනෙක් පහළවීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙව්ලොවට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළ සේක.

"උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො සොළස යොජනානි,
කූටාගාරා සත්ත සතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.
තත්ථච්ඡසි පිවසි ඛාදසී ච
දිබ්බා චා වීණා පවදන්ති වග්ගු

අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා
දිබ්බාච කඤ්ඤා තිදසවරා උළාරා,
නච්චන්ති ගායන්ති පමොදයන්ති"

යනාදීන්, යට කියනලද ක්‍රමයෙන් දිව්‍යසම්පත් වර්ණනාකොට, "මේ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ දිව්‍ය ප්‍රාසාදය ඇතුළුවූ දිව්‍යසුරු ලැබීමට කරනලද කුශලය කවරේද?යි විචාරා වදාළසේක. එකල්හි යටගිය දවස කරනලද කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"ඵලාදායි ඵලං විපුලං ලභති
දදමුජ්ජුගතෙසු පසන්නමානසො,
සොහි මොදති සග්ගගතො තිදිවෙ
අනුභොති ච පුඤ්ඤඵලං විපුලං".

යනුහෙයින් "ස්වාමීනි, මේ ලොකයෙහි යම් කිසි කෙනෙක් ඍජුමාර්ගයට පැමිණියාවූ අෂ්ටායර්‍ය පුද්ගල මහා සඞ්ඝයා කෙරෙහි පහන් සිත් ඇතිව අම්බඵලාදිවශයෙන් යම්කිසි ඵලදානයක් දුන්නේ වී නම් ඒ ඵලයතෙම දිව්‍යලොකයට ගියේ උදරතරවූ මහත් ඵල ලබමින් සතුටුව දිව්‍යසම්පත් අනුභව කෙරෙයි, ඒ මහත් ඵල මහානිසංස ඇතිබව මගේ මේ දිව්‍යසුරු බලා දත යුත්තේමය. මම යටගිය දවස මිනිස්ලොව වසන සමයෙහි එක්තරා ආරාමපාලයෙක් වීමි. එසමයෙහි අළුත් අඹ ඵල සතරක් පූජාකෙළෙමි. ඒ කුශල කර්මය හෙතුකොටගෙන මේ සියලු දිව්‍යසුරු ලැබීමි. එබැවින් දිව්‍යමනුෂ්‍ය සම්පත් කැමැත්තාවූ නුවනැති මනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් දන්දෙන්ට සුදුසු වන්නේය"යි කීයේය. එකල්හි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට විස්තර වශයෙන් බණ වදරා මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අර්ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළ සේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසි වර්ගයෙහි
**ඵලදායක විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

# 68. උපස්සයදායක විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සවැනි වූ පායාසී වර්ගයෙහි සතරවැනි වූ පලමුවන උපස්සයදායක විමාන වස්තුව නම් කවරැයත්:-

පුරනලද දශපාරමී ඇති භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වෙළුවනාරාම විහාරයෙහි වැඩ වාසය කරන වදරණසේක. එසමයෙහි වනාහි එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ගම්කාවාසයෙක්හි වස් වැස සමුණීකොට රක්නාලද වස් ඇත්තේ වස් පවරා බුදුරජාණන් වහන්සේ වදිනා කැමතිව රජගහ නුවරට එනුයේ අතුරු මාර්ගයෙහිදීම සවස්ව ගියහෙයින් එක්තරා ගමකට පැමිණ රාත්‍රිභාගයෙහි වාසයට තැනක් පරීක්ෂාකරන්නේ එක්තරා උපාසකයෙකු දැක විචාරනුයේ, "එම්බා උපාසකය, මේ ගමෙහි ප්‍රව්‍රජ්‍යාසම්පන්නයන්ට වාසයට සුදුසු තැනෙක් ඇද්දැ?" යි විචාළසේක. එබස් ඇසූ උපාසකතෙම, "වහන්ස, මඳක් නැවතුව මැනව" යි කියා ප්‍රසන්නවූ සිත් ඇතිව තමාගේ ගෙට ගොස් භාර්‍ය්‍යාව හා සමග මේ ප්‍රවෘත්තිය කියා තෙරුන් වහන්සේට විසීමට සුදුසු තැනක් පරීක්ෂාකෙට දැන එහි ආසනයක් පනවා පා දේනා පැන් හා පා තැබීමට පුටුවක්ද තබා තෙරුන් වහන්සේ කරා පැමිණ වැඳ ආරාධනා කොට වැඩමවා පා ධොවනයකොට පහන් දල්වා ඇඳෙහි ආස්තරණ අතුරා තෙරුන් වහන්සේට පිළිගැන්විය. ඉක්බිති තෙරුන් වහන්සේට දෙවැනි දවසට දන් පිණිස ආරාධනා කොට දෙවෙනි දවස්හි වළඳවා ගිලන්පස පිණිස උක් සකුරු පිඩක්ද පිළිගන්වා තෙරුන් වහන්සේ වඩිනා කල්හි පසු ගමන්කොට නැවතුනේය. ඒ උපාසකතෙම ඉන් මෑත කාලයෙක්හි භාර්‍ය්‍යාව හා සමග කාලක්‍රියාකොට තවුතිසා භවනෙහි අනෙක ප්‍රකාරවූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙන් හා සිය දහස් ගණන් දිව්‍ය නළු නාටක සමූහයා විසින් පිරිවරනලද දෙළොස් යොදුන් රන් විමනෙක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩිනා සේක ඒ දිව්‍ය විමානයට වැඩ දිව්‍යපුත්‍රයා දැක ප්‍රීති සොම්නස් උපදවා, "ගියදවස මෙබඳු දිවඉසුරු ලැබීමට කරන ලද කුශල කර්‍මය කවරේද?" යි දිව්‍යපුත්‍රයාගෙන් අසනුයේ මේ ගාථාවන්ගෙන් විචාළසේක.

"චන්දො යථා විගතවලාහකෙ නභෙ
ඔභාසයං ගච්ඡති අන්තලික්ඛෙ,
තථූපමං තුය්හමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ

දෙවිද්ධි පත්තොසි මහානුභවො
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං
කෙනාසි එවං ජලිතානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, " එම්බා දිව්‍යපුත්‍රය, පහවූ වලාකුල් ඇති අහසෙහි චන්ද්‍රයාසේ දිළියෙමින් මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් යුක්තව අහසෙහිම ඒ මේ අත ගමනාගමනය කරන්නාවූ තොපගේ මේ විමානය අහස බබුලුවා සිටින්නේය. මහත් දිව්‍යඍද්ධිප්‍රාප්ත මහානුභාව සම්පන්න එම්බා දිව්‍යපුත්‍රය, මීට පූර්වජාතියෙහි මනුෂ්‍යභූතව කවර කුශලයක් කොට මෙබඳු දිව්‍යඍද්ධියක් දිව්‍යානුභාවයක් දිව්‍ය සම්පත්තියක් ලබන ලද්දේද, කවර කාරණයකින් මෙබඳු වස්ත්‍රාභරණාදියෙන් හා ශරීර වර්ණයෙන්ද, දශදිග් බබුළුවාද? මීට කාරණාවූ සුචරිත කර්මය ප්‍රකාශකොට කියව"යි වදාළසේක. එබස් අසා ඒ දිව්‍යපුත්‍රතෙම තෙරුන් වහන්සේගේ වචනය කැමතිව තමන් පින් ප්‍රකාශකරනුයේ මෙසේ කීය.

"අහඤ්ච භරියා ච මනුස්ස ලොකෙ
උපස්සයං අරහතො අදම්හ,
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්චදානං විපුලං අදම්හ
තෙන මෙ තාදිසොවණ්ණො-පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසති" ති.

යනුහෙයින්, "ස්වාමීනි, මගේ භාර්‍යාව සහ මමද මීට පූර්ව ජාතියෙහි මෙම බුඩොත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපිද එක් රහත් නමකට සෙනසුනක්ද දුන්නේය. එසේම ප්‍රසන්නවූ සිතින් ආහාර පාන වර්ගයන් සකස්කොට මහත් දනයක් දුන්නෙමු. මෙපමණ කුශල කර්මය හෙතුකොටගෙන මෙබඳු දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලදින් ශරීර වර්ණයෙන්ද දශදිග් බබුළුවම්" කිව මෙසේ මහ තෙරුන් වහන්සේ විසින් විචාළාවූ ප්‍රශ්නය ඒ දිව්‍ය පුත්‍රයා විසින් විසර්ජනය කළ කල්හි මහ තෙරුන් වහන්සේ පිරිවර සහිතවූ ඒ දෙවතාවාට විස්තර වශයෙන් බණ වදරා ඉක්බිති මිනිස්ලොවට වැඩ ප්‍රශ්න පුච්ඡා විසර්ජන දෙක යුක්ත කොට බුදුරජාණන් වහන්සේට දැන්වූ සේක. බුදුහු එම අර්ථොත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක ඒ ධර්ම දේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසි වර්ගයෙහි
**පළමුවන උපස්සයදයක විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 69. දුතිය උපස්සයදයක විමාන වස්තුව.

## 70. භික්ෂාදයක විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සවැනි වූ පායාසී වර්ගයෙහි සවැනිවූ භික්ෂාදයක විමාන වස්තුව නම් කවරැයත්:-

සර්වධර්මයන් සර්වාකාරයෙන් දත්තාවූ බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි එක් භික්ෂු කෙනකුන් වහන්සේ දිසී මාර්ගයට පැමිණ වඩනාසේක් අතරමඟ එක්තරා ගමකට පැමිණ ගෙපිළිවෙළින් පිඬුසිඟා වඩනාසේක් ඒ මග නාමගොත්‍රයෙන් අප්‍රසිඬවූ එක්තරා පුරුෂයකුගේ දොරසමීපයෙහි වැඩ සිටිසේක එකල්හි ඒ ගෙහිමි පුරුෂයා අත් පා සෝද පිරිසිදුකොට බත් අනුභවකෙරෙමින් හුන්නේය. ඔහුගේ භාර්‍ය්‍යාව තලියෙහි බත් ලා ඉදිරියෙහි තුබුවාය. එකල්හි භික්ෂූන් වහන්සේ දැක ප්‍රසන්නවූසිත් ඇතිව තමන් ට අනුභව කිරීමට එලවනලද බත් තැටිය ගෙනගොස් තෙරුන් වහන්සේගේ පාත්‍රයෙහි බහන්නේ. තෙරුන් වහන්සේ විසින්, "එක්කොට සක් දෙව"යි වදරනලද කල්හිද ඒ වචනය නොඇසුනා මෙන් ඒ බත් සියල්ලම නිමවා පිළිගැන්විය එකල්හි තෙරුන් වහන්සේ ඕහට අනුමෝදනා වදරා වැඩිසේක. ඉක්බිති ඒ පුරුෂයා වනාහි, "මට අනුභව කිරීමට එලවනලද ආහාරය අනුභව නොකොට බඩසාව සිට පිණ්ඩපාතයෙන් කලාන්ත වූ තෙරුන් වහන්සේට මා විසින් දෙන ලද්දේය"යි නැවත නැවතත් සිහිකෙරෙමින් උදරතරවූ ප්‍රීති සොම්නස් ඇතිව එයින් මෑතභාගයෙහි කාලක්‍රියාකොට පතලූ ආහාරය අනුභව නොකොට දන්දුන් කුශලානුභාවයෙන් තවුතිසා දෙව්ලොව දෙළොස් යොදුන් රන් විමනෙක උපන්නේය. එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් මහත්වූ දිව්‍යසෘඩියෙන් දිළියෙන්නාවූ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළසේක.

"උච්චමිදං මණිථූණං විමානං
සමන්තතොවදසයොජනානි,

කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා
දෙව්ඩිපත්තොසි මහානුභාවො-පෙ-
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, මෙසේ වෛදූර්‍ය්‍ය මණිමය ටැම් ඇත්තාවූ සතළිස් අටගවු පමණවූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ නොයෙක් රත්නයෙන් විසිතුරුවූ භිත්ති දෙරකවුළු ආදියෙන් සැදුම් ලද්දවූ තාගේ මේ උදරතරවූ විමානය ඉතා ශොභාමත් ව දිළිසෙයි. තාගේ ශරීරවර්ණයද චන්ද්‍රමණ්ඩලයසේ දශ දිග්හි ඒකාලොක කෙරෙමින් දිළිසෙයි. මෙබඳු සම්පත් ලැබීමට තා විසින් පූර්වජාතියෙහි කරනලද කුශල කර්මය කවරේදැ?"යි විචාරා වදාළසේක. ඒ තෙරුන් වහනසේ විසින් විචාරණලද පැණය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"අහං මනුස්සෙසු මනුස්සභූතො
දිස්වාන භික්ඛුං තසිතං කිලන්තං,
ඒකාහං භික්ඛං පටිපාදයිස්සං
සමඞ්ගි භත්තෙන තද අකාසිං
තෙන මෙ තාදිසො වණ්ණො-පෙ-
වණ්ණො ච මෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, "ස්වාමීනි, මම මීට පූර්වජාතියෙහි මේ බුද්ධොත්පාද කාලයෙහි එක්තරා ශ්‍රද්ධාවන්ත පුරුෂයෙක් වීමි. එසමයෙහි එක් දවසක් ආහාරයෙන් කලාන්තවූ පිඩු පිණිස මාගේ ගෙදෙරට පැමිණි තෙරකෙනකුන් දැක මට අනුභව කිරිමට සාදගත් ආහාර පමණක් පූජාකෙළෙමි. එපමණ කුශල කර්මය හෙතුකොටගෙන මෙබඳු දිව ඉසුරක් ලදිමි"යි කීයේය එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ ඒ දිව්‍ය පුත්‍රයාට විසතර වශයෙන් බණ වදරා මිනිස්ලොව වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජාණෝ එම අත්පොත්පත්තිකොට ගෙන එතැන්හි රැස්වූ පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසි වර්ගයෙහි
**භික්ෂාදායක විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 71. යවපාලක විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සවන පායාසි වර්‍ගයෙහි සත්වන යවපාලක විමාන වස්තුව නම් කවරයත්-

සුරනරමකුටමණිකිරණායමාන වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවාසය කර වදරනසේක. එසමයෙහි රජගහනුවර එක්තරා දුප්පත් දරුවෙක් යවකෙතක් රක්‍ෂාකෙරෙයි හෙතෙමෙ එක් දවසෙක උදසන වේලෙහි තමහට අනුභව කිරීම පිණිස කොමුපිඩු ලැබ, කෙතට ගෙනගොස් අනුභවකෙරෙමැ"යි සිතා ඒ කුම්මාස ගෙන යවකෙතට ගොස් එක්තරා රුක්මුලෙක්හි හුන්නේය. එකෙණෙහිම එක්තරා රහත් කෙනෙකුන් වහන්සේ මහට පිළිපන්සේක, මධ්‍යාහ්න කාලයෙහි ඒ ස්ථානයට පැමිණ යවපාලකයා වැදහොත් රුක්මුලට වැඩිසේක. යවපාලකතෙම වේලාව බලා "ස්වාමීන්වහන්ස, වැළඳීමට ආහාර කොහින් ලබනලද්දේදැ?යි විචාළේය. එබසට තෙරුන් වහන්සේ තුෂ්ණීම්භූතවූසේක. ඉක්බිති යවපාලකතෙම තෙරුන් වහන්සේ නොවැළඳි බව දැන තෙරුන් වහන්සේට මෙසේ සැළ කෙළේය. ස්වාමීන් වහන්ස, වේලාව ආසන්න බැවින් පිඩු සිඟා වැළඳීමට අපොහොසත්ය එබැවින් මට අනුකම්පා පිණිස මේ කුමමාසය වළඳ වදළ මැනවයි කියා තෙරුන් වහන්සේට ඒ කොමු පිළිගැන්වූයේය. තෙරුන් වහන්සේද ඔහුට අනුකම්පා පිණිස ඔහු බලා සිටියදීම ඒ කොමුපිඩු වළඳ අනුමෝදනා වදරා වැඩිසේක ඒ දුප්පත් දරුතෙම මා විසින් මෙබඳු කුම්මාස දනයක් දෙනලද්දේය"යි සිත පහදවාගෙන අනෙක් කලෙක්හි කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි (භික්‍ෂාදයක විමාන වස්තුවෙහි කියන ලද පරිදි) දිව්‍යවිමානයෙක්හි උපන්නේය. ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේගේ ප්‍රශ්න විචාරිමාදිය පෙරකී නයින් දතයුතුයි

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසි වර්‍ගයෙහි
**යවපාලක විමාන වස්තුව** කියා නිමවනලදි

## 72. කුණ්ඩලී විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි පායාසී වර්‍ගයෙහි අට වැනිවූ පළමුවන කුණ්ඩලී විමාන වස්තුව නම් කවරයත්-

දෙවාතිදෙව වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වසනසේක එසමයෙහි අග්‍රශ්‍රාවකවූ

සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ නිත්‍ය පරිවාර වූ පන්සිය පන්සියසංඝයා පිරිවරා කසීරට දනවු සැරිසරා වඩනාහු සවස සූර්‍ය්‍යයා අස්තඞ්ගතවන වේලෙහි එක්තරා විහාරයකට පැමිණියාහ. එපවත් අසා ඒ විහාරයට ගොචරවූ නුදුරු ගමක වසන්නාවූ එක්තරා උපාසකයෙක් තෙරුන් වහන්සේලා කරා එළඹැ නමස්කාරකොට සිරිපතුල් සෝද තෙල් ගල්වා පුටු ඇඳ කලාල් පැදුරු එලවා සද ඇතිරි අතුට මනාකොට අඳුන් පණවා වඩා හිඳුවා දනාරාධනා කොට දෙවෙනි දවස් අහර පිළියෙලකොට මහත්කොට දන් පැවැත්වූයේය. තෙරුන් වහන්සේලාද වළඳ ඉක්බිති අනුමෝදනා වදරා වැඩියාහුය. එයින් අපරභාගයෙහි උපාසකතෙම කාල ක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන් විමානයක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් තවුතිසා භවනයට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළසේක.

"අලඞ්කතො මල්‍යධරො සුවත්‍ථො
සුකුණ්ඩලී කප්පිතකෙසමස්සු,
ආමුත්තහත්‍ථාභරණො යසස්සී
දිබ්බෙ විමානම්හි යථාසි චන්දිමා.
දිබ්බා ච වීණා පවදන්ති වග්ගු
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා,
දිබ්බා ච කඤ්ඤා තිදසචරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති.
දෙවිද්ධිපත්තො සි මහානුභාවො-පෙ-
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී"ති.

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, යහපත් අන්දන් තබන ලද කෙශමශ්‍රූන් හා පළඳනාලද කුණ්ඩලාභරණ ඇතිව දිව්‍යමය වස්ත්‍රාභරණ මාලාදියෙන් හා අනේකවිධ රත්නයෙන් විසිතුරුව පාදභරණාදි නොයෙක් අලංකාරයෙන් සැරහී තෝ මේ දිව්‍යප්‍රාසාදයෙහි චන්ද්‍රයාසේ ජෝතිමත්ව බබලන්නෙහිය. සිවුසැටක් පමණ ස්ත්‍රී අලඞ්කාරයෙන් සැරහුණාවූ දිව්‍යාඞ්ගනාවෝ වීණා ගායනාකෙරෙමින් නෘත්‍ය ගීත කෙරෙමින් තොප සතුටු කරවන්නාහු වෙති. එම්බා දිව්‍යපුත්‍රය, තා විසින් මෙබඳු සැපතක් ලැබීමට කළාවූ කුශලය කවරේදැ?"යි විචාරා වදළසේක. එබස් අසා කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"අහං මනුස්සෙසු මනුස්සභූතො
දිස්වාන තෙ සමණෙ සීලවන්තෙ,

සම්පන්නවිජ්ජාචරණෙ යසස්සි
බහුස්සුතෙ තණ්හක්ඛයූපපන්නෙ.
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො,
සක්කච්ච දනං විපුලං අදසිං"-පෙ-

යනුහෙයින්, "ස්වාමීනි යටගිය දවස මම මිනිස්ලොව වසන සමයෙහි ශීලසම්පන්නවූද බහුශ්‍රැතවූද තෘෂ්ණාක්ෂය කළාවූද ඒ මහා සඞ්ඝයා දැක සතුටවූ සිත් ඇතිව අන්නපානාදියෙන් උදර තරව දන් දී උපකාර කෙළෙම් ඒ කුශලයෙන් මේ සියලුම දිව ඉසුරු ලදිමි"යි කීයේය එකල්හි මහ තෙරුන් වහන්සේ ඔහට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අර්ථෝත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදළ සේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි පායාසි වර්ගයෙහි
**කුණ්ඩලී විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී

# 73. දුතිය කුණ්ඩලි විමාන වස්තුවද
**මේ නයින් දතයුතු**

# 74. උත්තර විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සවැනි වූ පායාසි වර්ගයෙහි දසවැනි වූ උත්තර විමාන වස්තුව නම් කවරයත්-

සකල සත්වානුකම්පා ඇති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සියලු බුඩකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පා වදළ කල්හි ධාතු බෙදගත් රජදරුවන් ආදීහු ඒ ධාතු නිධන් කෙරෙමින් ඒ ඒ තන්හි දාගැබ් බඳනට පටන් ගත්තාහුය. එසමයෙහි ධාතු බෙදන තැනට රැස්වූ මහා ශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධානකොට ඇති මහ සංඝයා වහන්සේ විසින් "ධර්ම සඞ්ගායනා කිරීම රජගහනුවරදී වන්නේය"යි නියම කොටගෙන ශ්‍රාවක සන්නිපාතයට හා වස්විසීමට නියමවූ ඇසළ මස පුරපසළොස්වක් දිනය සම්ප්‍රාප්ත වනතෙක් තම තමන්ගේ පිරිස් හා සමග මහාස්ථවිරයන් ඒ ඒ තැන්හි

වසන කල ඒ මහා ශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියයක් භික්ෂු සංඝයා පිරිවරා සෙතව්‍ය නුවරට පැමිණ සිංසපා වනයෙහි වැඩවසනසේක. එසමයෙහි පායාසි රාජන්‍යද නම් බ්‍රාහ්මණයෙක් බොහෝදෙනා විසින් පිරිවරන ලදුව තෙරුන් වහන්සේ කරා එළඹැ පිළසඳර කථාකොට එකත්පස්ව හිඳ මෙසේ කීයේය. "කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, "මෙලොව සිටියන්ට පරලොවත් නැත; මළ සත්වයන්ට නැවත ඉපදීමකුත් නැත; කුශල් කිරිමෙන් ලබන එල විපාකයකුත් නැත; අකුශල් කිරීමෙන් වන අපා දුකකුත් නැතැයි කියා මම මෙබඳු වාදයක් දෘෂ්ටියක් ඇත්තෙමි"යි කීයේය. එකල්හි තෙරුන් වහන්සේ වදරනසේක්, එම්බා රාජන්‍යදය, මම එසේ නොකියමි, පරලොව නැත, කුසල් අකුසල් නැත,කියා දැකවත් අසාවත් නැත්තේය. එසේවී නමුත් මම තා අතින් කාරණයක් විචාරමි. මේ චන්ද්‍ර සූර්ය්‍ය දෙදෙනා මේ ලොවද, පරලොවද දෙවියෝද, මනුෂ්‍යයෝද දන්නෙහි වී නම් කියව"යි වදළසේක. එකල්හි බ්‍රාහ්මණයා සිතන්නේ "මේ තෙරුන්වහන්සේ චන්ද්‍රසූර්ය්‍ය උදහරණය පළමුකොට වදළසේක. එබැවින් චන්ද්‍ර සූර්ය්‍යයන් මෙන් කිසිවක්හු විසින් මැඩ පැවැත්විය නොහැක්කේය. "මේ චන්ද්‍ර සූර්ය්‍ය දෙදෙන මෙලොවැයි කිම් නම්, චන්ද්‍ර සූර්ය්‍ය දෙදෙන කොපමණ උස මහත ඇත්තාහුද, යනාදී වාදරොපණය කරණසේක. එකල්හි මට උත්තරය කියා ලිය නොහැක්ක පරලොවැයි කීම් නම්, පරලොව නැතැයි කියාගත් මාගේ වාදය බිඳෙයි. එතකුදු වූවත් මුන්වහන්සේටම එක්විය යුතුය"යි සිතා "පරලොව දෙවියෝය; මෙලොවත් නොවෙයි, මනුෂ්‍යයෝත් නොවෙයි" කීය. එකල්හි කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ "පරලොවත් කුශල් අකුශලූත් ඇතැයි කියා මේ කාරණයෙන් දැනගනුව"යි වදළසේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ, "එතකුදුවුවත් කාරණා ඇතිහෙයින් මම අදහා නොගනිමි, සතුන් නැසීම සොරකම් කිරිම ආදිවූ දශවිද අකුසල් කළාවූ මාගේ නෑයන් මිත්‍රයන් මරණාසන්න කාලයෙහි උන්කරා ගොස් මෙසේ කීමි. පින්වත්නි, ප්‍රාණඝාතාදී අකුසල් කළ සත්වයෝ අපායෙහි උපදනාහයි කියා සමහර ශ්‍රමණ බ්‍රාහමණ කෙණෙක් කියන්නාහු වෙති. උන් කියන්නාහු බස් සැබෑ වී නම් තොප පව් කළ බැවින් අපායෙහි උපදනාහු වෙති. එසේ උපනහොත්, අපි අපායේ උපනුම්හයි කියා මට අවුත් කියවයි කිමි. ඔව්හුද යහපතැයි කියා කාලක්‍රියා කළාහුය. ඔවුන් අතුරෙන් අවුත් මටකී කෙනෙක්වත් දූතයකු එව් කෙනෙක් වත් නැත. එබැවින් පරලොව නැතැ,යි කිමී" යි කීය එකල්හි මහතෙරහු වදරණසේක, "රාජන්‍යදය, මම තට උපමාවක් කියමි. උපමාවෙනුත් සමහර

නුවනැත්තාහු වචනාර්ථය දන්නාහුය'යි වදරා 'රාජකුමාරය, තොපගේ විජිතයෙහි රාජ අපරාධ කළාවූ සොරකු ගෙනවුත් තොපට දක්වා, මේ සොරාහට වධ යෙදුව මැනවයි කීකල තොපි චොර ඝාතක යන් කැඳවා 'මොහු පිටිතලහයා බැඳ වීථියෙන් වීථිය සන්ධියෙන් සන්ධිය කසයෙන් තලා කෂාරස්වරවූ පණාබෙරින් වධ බෙර ගස්වා හිස් සිඳුවයි කියන්නේ වේද එකල්හි වධකරුවෝ ඔහු අල්ලා කී ලෙස වධබෙර ගසා බැඳ වීථියෙහි දකුණු වහසල් දෙරින් පිටත්කරවා සොරුන් මරන තැන හිඳුවා ඉස්සිඳින්නට ආරම්භ වූ කළ, අසවල් ගම මාගේ නෑයන් මිත්‍රයන් බලා එනතෙක් මා හිස නොකපාව යි කියා චොරඝාතකයන් කෙරෙන් ගැළවීයන්ට සොරා අවසරයක් ලබාද, නොහොත් හඬ හඬා සිටියදීම හිස කපත්දැයි විචාළ සේක. එසේ නොලැබෙයි හඬ හඬා සිටියදීම හිස කපන්නාහුය'යි කීය. 'එසේ වී නම් රාජකුමාරය, සොරාත් මනුෂ්‍යයෙක, වධකරුවෝත් මනුෂ්‍යයෝය, මනුෂ්‍යයෙක් මනුෂ්‍යයන්ගෙන් ගැලවී නෑයන් දකින්නට යාම නොලබා නම් පව්කොට අපායේ උපන් තොපගේ ඥතිමිත්‍රයෝ අමනුෂ්‍යවූ යමපළුන්ගෙන් ගැළවී කෙසේ තොපකරා එද්ද? මේ කාරණයෙන් පරලොව ඇති බව දැනගනුව'යි වදළසේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ, 'එතකුදුවුවත් මම අදහා නොගනිමි, ඊට කාරණා ඇත, ඒ කවරේදයත්-

ප්‍රණඝාතාදී දශවිධ අකුශලින් දුරුවී දන ශීලාදි වශයෙන් කරණලද කුශල් ඇත්තාවූ මාගේ නෑයන් මිත්‍රයන් මරණාසන්න කාලයෙහි උන් කරාගොස් මම මෙසේ කීමි. පින්වත්නි මේ ලොකයෙහි කුසල් කළ සත්වයෝ දිව්‍යලොකයෙහි උපදනාහ'යි කියා සමහර ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් කියන්නාහු වෙති. උන් කියන බස් සැබෑවි නම් තොපි කුසල් කළ බැවින් දෙව්ලොව උපදනාහු වෙති. එසේ උපනහොත් අපි දෙව්ලොව උපනුම්හයි කියා මට අවුත් කියවයි කීමි. ඔව්හුද යහපතැයි කියා කාලක්‍රියා කළෝය. ඔවුන් අතුරෙන් මට කී කෙනෙක්වත් කියා එව් කෙනෙක්වත් නැත. එබැවින්, පරලොව, නැත 'කීමි' යි කීය. එකල්හි තෙරුන්වහන්සේ වදරණසේක්, 'එම්බා රාජකුමාරය, උපමාවක් කියමි: ඉස පටන් අසූචි වළක ගැලී සිටි පුරුෂයකු දැක තොපි තොපගේ පුරුෂයන්ට මෙසේ කියන්නාහුය. මොහු අසූචි වළින් ගොඩනගා උනපත්තෙන් පිස සෝද පඩුමැටියෙන් උලවා තෙල් ගල්වා සුවඳ සුණු ගල්වා සෝදවයි කියා සෝදවා සර්වාභරණයෙන් සරසවා ප්‍රාසාදයකට නංවා පඤ්චකාම සම්පත්තියෙන් උපකාර කරන්නේවේද, ඒ ප්‍රාසාදහිරුඪව පඤ්චකාම සම්පත් අනුභව කරන්නාවූ පුරුෂයා නැවතත් එම අසූචි වලෙහි ගැලෙනු

කැමතිදැ?'යි විචාළසේක. 'එසේ නැත, අසූචි දුර්ගන්ධ බැවින් ඉතා පිළිකුල් කෙරෙ'යි කීය. එසේ වී නම් සුවඳ විලවුන් ගා සර්වාභරණයෙන් සැරසී සිටි චක්‍රවර්ති රජ්ජුරුවන් වැනියවුන් පවා සාරසියයක් ගවු දරු සිටි දෙවියන්ට කරබැඳි ගැරඬි කුණක්සේ වැටහෙති. එබැවින් කුශල් කොට දෙව්ලොව උපන් තොපගේ ඤාතිමිත්‍රයෝ පරලොව ඇති බව කියන්ට තොප කරා කෙසේ එද්ද? මේ කාරණයෙන් පරලොව ඇති බව දැනගනුවයි වදාළසේක එකල්හි බ්‍රාහමණයා කියන්නේ 'තවත් කාරණා ඇත, අදහා නොගනිමි, කවරේදයත්:- දශ විධ අකුශලින් දුරුව දශවිධ කුශලයෙහි පිහිටියාවූ මාගේ නෑයන් මිත්‍රයන් මරණාසන්න කාලයෙහි උන් කරා ගොස් මම මෙසේ කීමි, පින්වත්නි, කුශල්කළ සත්වයෝ තවුතිසා දෙවලොව උපදනාහයි කියා සමහර ශ්‍රමණ බ්‍රාහමණයෝ කියන්නාහු වෙති. උන් කියන බස් සැබෑ වී නම් තොපිත් තවුතිසා දෙව්ලොව උපදනාහු වෙති. එසේ උපනහොත් මට අවුත් කියවයි කිමි. උන් අතුරෙන් අවුත් කී කෙනෙක්වත් කියා එව් කෙනෙක් වත් නැත, එබැවින් පරලොව නැත කියමි'යි කීය. එකල්හි තෙරුන් වහන්සේ වදරණසේක්, 'එම්බා රාජඤ්ඤය, මිනිස් ලොව සියක් අවුරුද්දක් තවුතිසා වැසි දෙවියන්ට එක් දවසෙක් වෙයි එයින් තිස් දවසෙක් මසෙක් වෙයි: ඒ මසෙන් දෙළොස් මසෙක් අවුරුද්දෙක් වෙයි. ඒ අවුරුද්දෙන් දහසක් අවුරුද්දට ආයුවෙයි. තව්තිසා දෙව්ලොව උපන් තොපගේ ඤාති මිත්‍රයෝ දෙතුන් දවසකින් පඤ්චකාම සම්පත් අනුභව කොට නැවත ගොස් පායාසි රාජඤ්ඤ නම් බ්‍රාහමණයාට කුසල් අකුශල් හා පරලොව ඇති බව කියන්ට යම්හයි කියා දෙතුන් දවසක් සැප විඳ අවුත් කියන්නාහු නම් එසේ ලැබේදැ?'යි විචාළසේක 'කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, නොලැබෙයි. උන් එන කල මම කාලක්‍රියා කොටත් බොහෝකල් ඉක්මෙයි' කීය. එසේ කියා නැවතකියන්නේ 'තව්තිසා දෙව්ලොව දෙවියන් ඇති බවද බොහෝ ආයු ඇති බවද නුඹවහන්සේට කීවෝ කවුරුද? මම අදහා නොගනිමි'යි කීයේය. එසේ කල්හි තෙරුන් වහන්සේ වදරණසේක් 'එම්බා රාජඤ්ඤය, මම උපමාවක් කියමි. යම්සේ ජාත්‍යන්ධ පුරුෂයෙක් හිර සඳ නොදකීද, තාරකාවන් නොදකීද, නීල පීතාදි රූපයන් නොදකීද එසේ නොදැකීම නිසා ඔහු මෙසේ කියන්නේය. හිර සඳ නැත, තාරකාවන් නැත නීල පීතාදී රූපයකුත් නැත. නීල පීතාදී රූපයන් දුටු කෙනෙකුත් නැත. මම නොදනිමි, මම නොදක්නෙමි. එබැවින් නැතැයි කියන්නේ වේද, ඒ කියන වචනය ඇත්තක්ද, යහපත් වචනයෙක්ද, නොහොත් නෙදක්නා බැවින් කියාදැ?'යි විචාළ සේක. 'පින්වත් කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, ඔහු නොදක්නා හෙයින් කියන

බවක් විනා යහපත් බසෙක් නොවෙයි˝ කීය. ˝එම්බා රාජකුමාරය, තව්තිසා වැසි දෙවියෝත් ඇද්ද, එබඳු දිඝායුෂයකුත් ඇද්ද, ඒ දුටුවෝ කව්රුද, නුඹවහන්සේට කීවෝ කව් රුදැ?යි කියන හෙයින් තෝ ද ඒ ජාත්‍යන්ධයාට උපමාකොට සිතමි. ජාත්‍යන්ධයාට චන්ද්‍ර සූර්‍යාදී රූපයන් නොපෙනෙන්නාසේ තාගේ මේ ප්‍රයෝගයෙන් පරලොව දැන ගත නොහැක්ක. දිවැස් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ විශේෂයෙන් දක්නාහුය˝යි වදළ සේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ, එසේ ද වුවත් මම අදහා නොගනිමි. ඊට කාරණා ඇත, කවරේද යත්:-

සිල්වත්වූ ශ්‍රමණ බ්‍රාහමණයෝ මරණයට පැමිණියාහු, අපට පරලොව සැප ඇතැයි කියා දනිත් නම් විෂ කා හෝ මියෙත්මය, ශස්ත්‍රයෙන් හෝ කරවැල්ලා හෝ මියෙත්මය, දුකට පිළිකුල්වූ මරණ නොකැමැත්තාවූ සැප කැමැත්තාවූ ජීවත්වනු කැමැත්තාවූ ශ්‍රමණ බ්‍රාහමණයන් දක්නෙමි. කුශල විපාකයක් නැතිහෙයින් මරණ නොකැමැත්තාහ, ජීවත්වනු කැමැත්තාහ. එබැවින්, පරලොව නැතැයි කියමි˝යි කීය. එකල්හි තෙරුන් වහන්සේ වදරනසේක් ˝එම්බා රාජකුමාරය, මම පෙරවූ දෙයක් කියමි. එක්තරා බ්‍රාහමණයකුගේ අඹුවෝ දෙදෙනෙක් වූවාහුය, එක් සත්‍රියකුගේ දශදෙළොස් වයස්වූ පුතෙක් ඇත්තේය, එක් සත්‍රියක් ගර්භිණීවූවාය, එකල්හි බ්‍රාහ්මණයා කාලක්‍රියාකෙළ්ය, ඒ ගෙයි සියලූම ඉසුරු සමපත් ඒ ගැබිණියටම සන්තක විය එකල්හි ඒ බ්‍රහමණකුමාරයා ගැබිණියට කියන්නේ, මැණියෙනි, පියාණන් සන්තක ධනධාන්‍යාදී සියලූ සමපත් නුඹ සන්තක විය, මටත් දයාද කොටසක් දෙවයි කීය, එකල්හි බැමිණි කියන්නී, මා වදනතෙක් බලව, පුතකු වි නම් තොපටත් භාගයක් දෙමි. දුවක් වීනම් තොපටම පරිවාරිකා කොට සියලූම සම්පත්දෙමියි කීය. කුමාරයා දෙවෙනිවත් තුන්වැනිවත් එසේම දයාද දෙවයි කීය. එකල්හි අඥාන බාල නුවණ නැති බැමිණි කුමාරයෙක්ද කුමාරිකාවක්දැයි කියා බලමි සිතා ගෙට වැද බඩ ඉරා අනයව්‍යසනයට පැමිණියාය. එමෙන් රාජකුමාරය, තෝත් පරලොව සොයා අනයව්‍යසනයට පැමිණියෙහිය. සිල්වත්වූ යහපත් ගුණ ඇති ශ්‍රමණ බ්‍රාහමණයෝ එසේ අනය ව්‍යසනයට නොපැමිණෙන්නාහුය. යම්තාක් ආයු පරිපාකයට යේද ඒතාක් කල් බොහෝ කුශල් රැ ස්කෙරෙමින් බොහෝ දෙනාට හිත සැප පිණිස පිළිපදිමින් ආත්මාර්‍ථ පරාර්‍ථ සාදමින් බොහෝකල් සිටිනාහුය˝යි වදළ සේක. ˝එසේද වුවත් මම අදහා නොගනිමි ඊට කාරණා ඇත. කවරේද? ජීවිතය සොයමියි සිතා මරන්ට සුදුසු වරදක් ඇති සොරෙකු අල්වා සැළියෙක ලා

තෙත්සමින් මුවවසා බැඳ සණකොට මැටි බැඳ ලිප තබා ගිනිකොට නිවුන කල බිමට බා මැටි බිඳ වැසුම් හැර වහා බැලීමි. එකල ජීවිතය නික්මෙනවා නුදුටුයෙමි. එබැවින් පරලොව නැතැයි කියමි කීය. 'එම්බා රාජකුමාරය, දවල් සයනය කරන්නාවූ තෝ උයන් පොකුණු ආදීවූ රමණීයවූ භූමිභාග සිහිනෙන් දුටුයේ අද්දැ?'යි විචාළ සේක. 'දුටිමි' කිය. 'ඒ සිහින දකිනාකල කොරුන් කුදුන් හා බාල තරුණ ස්ත්‍රීහු තා රක්‍ෂාකොට උන්නාහුදැ?'යි විචාළ සේක. 'රැක උන්නාහුය'යි කීය. 'ඔවුන් අතුරෙන් තාගේ ජීවිතය ශරීරයෙන් පිටත්වන බවක් හෝ ඇතුල්වන බවක් හෝ දුටුවෝ ඇද්දැ?'යි විචාළසේක. 'නැතැයි' කීය. 'එසේ වී නම් ජීවත්වූ ස්ත්‍රීහු ජීවත්වූතාගේ ජීවිතය නික්මෙන්නා නොදකිත් නම් මළ සත්වයාගේ ජීවිතය නික්මෙන්නා කෙසේ දකීද? මේ කාරණයෙන් පරලොව ඇති බව දැනගනුව'යි වදළ සේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ 'මරන්ට නිසි සොරකු අල්වා තරාදියේ තබා කිරා එහිම සිටියදී දුනුදියෙන් බොටුව වෙලා මරා නැවතත් කිරුව. ජීවත්ව හුන්කල බර සැහැල්ලුවිය. මළ කල බර බොහෝවිය, තදවිය. එබැවින් පරලොව නැතැයි සිතමි'යි කීය. එකල්හි තෙරුන් වහන්සේ වදරණ සේක 'දවසක් මුළුල්ලෙහි යවටත් ගිනිකොට ගිනිගෙන දිලියෙන යවට තරාදියේ තබා කිරා නැවත නිවුනු කල කිරන්නේ වීනම් කවර වේලෙක බර බොහෝ වේද කවර විට සැහැල්ලුව මෘදු වේදැ'යි විචාළ සේක. 'ගිනිගත් යවට ගිනි හා වායු එක්වූ බැවින් සැහැල්ලුත් වෙයි, මෘදුත් වෙයි, නිවුනු කල බරත් වෙයි. තදත් වෙයි' කීය. 'එමෙන් රාජකුමාරය, ජීවත්වූ සත්වයා උෂ්ණ සහගතව, වායු සහගතව විඤ්ඤාණ සහගතව සිටිනා හෙයින් සැහැල්ලු වෙයි, මෘදු වෙයි, මළ ශරීරය උෂ්ණයද, වාතයද, විඤ්ඤාණයද නැති හෙයින් බර වෙයි, තද වෙයි: මේ කාරණයෙන් පරලොව ඇතැයි කියා දැනගනුව'යි වදළසේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ, 'ජීවිතය නික්මෙන්නා බලම්හයි සිතා මරන්නට නිසි වරද ඇති සොරකු ගෙනා පුරුෂයන්ට මෙසේ කීමි. සිවි, සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු, විනාශ නොකොට ජීවිතයෙන් තොරකරව: හෙවත් මරවයි කීමි. උන් එසේම කළෝය. ඔහු මියන්ට ආසන්නවූ කල්හි උඩුකුරු කොට හොවා ජීවිතය නික්මෙන්නා බලවයි කීමි. ඔව්හු එසේම කළෝය. නැවත මුනින් හොවා බලව, දකුණැලයෙන් හොවා බලව, වම් ඇලයෙන් හොවා බලව, නගා සිටුවා බලව, ඉස බිම තබා බලව, අනෙක් අතින් අනුව, පයින් අනුව, කැටින් පහරව, දණෙන් පහරව, ශස්ත්‍රයෙන් පහරව: ඔබ්මොබ බිම ඇන සොලවා බලවයි කීමි. එසේ කොටත් දිවි නික්මෙන්නා නුදුටුම්හ. එබැවින් පරලොව නැතැයි සිතමි'යි කීය. එකල්හි තෙරුන්වහන්සේ

වදරණසේක් "එම්බා රාජඤ්ඤය, ඊට උපමා වශයෙන් පෙරවූ දෙයක් කියමි. සක්පිඹිනා පුරුෂයෙක් එක්තරා ප්‍රත්‍යන්ත ගමක් මැදට ගොස් තුන්වරක් සක පිඹ සක බිම තබා හුන්නේය. මනුෂ්‍යයෝ ඒ ශබ්දය අසා සතර දිගින් අවුත් "මේ මිහිරිවූ කණ්රසායනවූ ඇලුම් කටයුතුවූ ශබ්දය කවර නාදයෙක්දැයි විචාළාහුය. ඒ පුරුෂයා මේ සංඛනාදයයි කීය. ඒ කල්හි අඥනවූ බාලවූ මනුෂ්‍යයෝ ඒ සක උඩුකුරුකොට හොවා සඩඛනාද කරවයි කීවුය. නාද නැතː මුහුණින් හොවා දකුණැලයෙන් හොවා, වම් ඇලයෙන් හොවා, නභා සිටුවා සංඛනාද කරවයි කීහ. අතින් පැහැර කටින් පැහැර, සැතින් පැහැර, ඔබ්නොබ බිම ඇණ සොලවා සංඛණාද කරවයි කිවුය එකල්හි සක්පිඹිනා පුරුෂයා සිතන්නේ, මේ ප්‍රත්‍යන්ත ජනපදවාසී බාල ජනයෝ නුනුවණයහ. කෙසේ සංඛනාද සොයද්දැ?යි කියා සක පිඹ කර වතුරුවාගෙන ගියේය එකල්හි මනුෂ්‍යයෝ පුරුෂයාගේ ව්‍යයාමයෙන් හා වායු සහගතව නාද පවත්නේ යයි කියා දැනගත්තාහුය. එමෙන් රාජඤ්ඤය, මේ කයද වායු සහගතව, උෂ්ණසහගතව. විඤ්ඤාණ සහගතව, යාම් ඊම් ඉඳීම් සිටිම් ආදී ඉරියව් පවත්වමින් රූප ශබ්දාදි පඤ්චකාම සම්පත් අනුභව කෙරෙයි. එබැවින් පරලොව ඇතැයි කියා දැනගනු වයි වදළසේක. එකල්හි බ්‍රාහමණයා කියන්නේ "ජීවිතය සොයමියි සිතා මරණට සුදුසු වරද ඇති සොරෙකු ගෙනාකල පුරුෂයන්ට මොහුගේ සම සිඳ ජීවිතය බලවයි මෙසේ කීමි. එසේ කොටත් ජීවිතය නුදුටුම්හ. නැවත සිවි සිඳ බලව, මස් සිඳ බලව, නහර සිඳ බලව, ඇට සිඳ බලව, ඇට මුල් සිඳ බලවයි කීමි. එසේ බලාත් ජීවිතය නුදුටුම්හ. එබැවින් පරලොව නැතැයි සිතමි"යි කීය. එකල්හි තෙරුන් වහන්සේ වදරණ සේක, "මීට උපමා සහිත පෙරවූ දෙයක් කියමි. වනයෙහි වසන්නාවූ අග්ගික නම් ජටිලයෙක් කිසි කටයුත්තක් පිණිස මනුෂ්‍යපථයට යනු කැමතිව ළදරු කාලයෙහි වල දමා තිබු කුමාරයකුවඩාගෙනවුත් වල වැඩුනාවූද දශ දෙළොස් වයස් පිරුණාවූද ඒ කුමාරයා බණවා පුත්‍රයː මා එනතෙක් ගිනි පූජාකරව, ගිනි නිවුනේ වීනම් මෙයින් ගිනි උපදවා ගනුවයි කියා දර කොටනකැත්ත හා ගිනි ගානා දඬුකඩ දෙක දක්වා ගියේය. කුමාරයා කෙළ ඇවිදීමෙන් ගිනි නිවුනේය. හෙතෙම ගිනි නිවුනු බව දැක, ගිනී උපදවමියි සිතා ගිනි ගානා දඬුකඩ ගෙන කැත්තෙන් සැස්සේය. එසේ ගිනි නොදැක දෙකට පැළීය. එසේත් නොදැක තුනට හතරට පහට දශයට පළා එසේත් නොදැක කඩ කඩ කොට කපා වන ලා කොටා සුණු විසුණු කොට සුළගේ හැරත් ගිනි උපදවා ගත නොහැකි විය. නැවත අග්ගික ජටිලයා අවුත් පුත, ගිනි පූජා කෙළෙහිදැ?යි විචාළේය. එකල තමන් කළ කටයුතු

සියල්ලම කීය. මේ ලදරුවා නොදන්නා නිසායයි සිතා බලා සිටියදී ගිනි ගා මෙසේ ගිනි ඉපදවිය යුතුයයි කීයේය. ඒ බාලවූ දරුවා ගිනි සොයන්නට උත්සාහ කළා සේ තෝද පරලොව සොයන්නට උත්සාහ කෙළෙහිය. තාගේ මේ විපරිත දෘෂ්ටිය හරුව. මේ විපරීත දෘෂ්ටිය නොහළුයේ වීනම් තට බොහෝ කලක් මුළුල්ලෙහි අහිතයට දුකබයට කාරණා වෙයි" වදළසේක එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ "කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, "පරලොව නැත, කුශල් නැත, අකුශල් නැතැයි කියා මම මේ ලාමක දෘෂ්ටි ගත් බව කොසොල් රජ්ජුරුවන් ඇතුලුව බොහෝ පණ්ඩිතවරු දනිති. මම දැන් මේ දෘෂ්ටිය හැරියේ වී නම් පායාසි රාජඤ්ඤයා බාලයාය, අඥානයාය, අව්‍යක්තයාය, මෙතෙක් දවස් වරදවා හැසුරුණේයයි නින්දකෙරෙති. ඒ නිසා නොහරිමි, නුඹ වහන්සේගේ වචනය නාසන නිසාත් නුඹවහන්සේ හා සමකොට සිතන්නාවූ යුගග්‍රාහක නිසාත් නොහරිමි"යි කීය. "එම්බා රාජඤ්ඤය, ඊට උපමා වශයෙන් පෙරවූ දෙයක් කියමි. සාර්ථවාහකයෝ දෙදෙනෙක් ගැල් දහසක් ගෙන බොහෝ වෙළඳුන් හා එක්ව වෙළඳම් කොට ඇවිදිනාහුය. යම් ප්‍රදේශයකට ගිය කල ඒ ප්‍රදේශයෙහි දර පැන් හා තණකොළ ආදිය වහාම විනාශ වන්නේය. එබැවින් ගැල් දහසක් ගෙන එක මග යාම දුෂ්කර යයි කියා ගැල් පන්සියය පන්සියය දෙකට බෙදගෙන ඔවුනොවුන් අතුරෙන් අඥාන වෙළඳ නායක තෙම පළමුවෙන් මම යෙමි"යි කියා ගොස් යක්ෂාධිගෘහිතවූ අල්පභක්ෂ නිරුදක කාන්තාරය ළඟට පැමිණ දිය දර පටවාගෙන යන්නේය. එකල්හි යක්ෂයෙක් මඩ වැකුණු රථචක්‍ර ඇති කොටලුවන් යෙදූ රථද තෙත් හිසකේ හා තෙත් පිළී ඇති මිනිස් වෙසක්ද මවාගෙන නෙලුම් දැලි කකා ඉදිරියට අවුත් මාර්ගයෙහි වැසි වැස ඇල කඳුරු පිරී මඩ ගෝරු බොහෝ බව කියා දිය දර ගැලින් ඉවත දම්මවා අන්තර්ධාන විය. එබසට දිය දර දමා වාලුකා කාන්තාරයට පැමිණි මේ පිරිසට දිය දර නොදැක සවස්වනතුරු ගොස් මිනිසුන්ට හා රිය අදනා ගොනුන්ටද කිසිම ආහාර පාන වර්ගයක් නොමැති බැවින් කලාන්තවූ ශරීර ඇතිව ඒ ඒ තැන වැටි හුන්නාහුය. එකල්හි යක්ෂයෝ අවුත් ගොන් හා මිනිසුන්ගේ ශරීර මාංශ භක්ෂණය කොට ඇට පමණක් දමා ගියාහුය. ඉක්බිති අනෙක් වෙළඳුණන්ද එසේම වාලුකාකාන්තාරය සමීපයට පැමිණි කළ යක්ෂයා පෙරසේම අවුත් දිය දර ඉවත්කර දමන්ට කීය. එකල්හි නුවණැති සාත්තු නායකයා ඔහුගේ ලක්ෂණයෙන් යක්ෂයෙකු බව දැන සියලු මිනිසුන් රැස්කොට පෙර මේ කාන්තාරයෙහි දිය දර ඇතැයි කියා ඇසුවෝ ඇද්දැයි විචාරා නැතැයි කී කල එසේවීනම් දිය දුටුකල මුත් එකදිය බිඳුවක් පමණ කුත් පිටත නොදමත්වයි කියා අවවාද කොට

පළමු ගිය වෙළඳුන් මළ තැන් සොයන්ට යම්හයි කියා වහ වහා ගොස් ඇටකටු හා බඩු පිරූ ගැල් පමණක් දැක විෂ්මයට පත්ව පරණ ගැල් හා අගය අඩු වස්තු දමා අලුත් ගැල් හා මාහැඟි වස්තු ගෙන සුවසේ වෙළඳම් කොට කම්වූ පරිද්දෙන් පරලොව ගියේය. එම්බා රාජඤ්ඤය, තෝ දර දිය දමා වාලුකා කාන්තාරයට පැමිණ වෙළඳුන් හා විනාශයට පැමිණි වෙළඳ නායකයාට උපමාකොට සිතම්. මේ සංසාර නමැති කාන්තාරයට පැමිණ කුසල් නැමති මාර්ගෝපකරන දමා තටත් තාගේ පිරිවර ජනයාටත් අහිතයට දුඃඛයට කාරණාවෙයි. තාගේ විපරිත දෘෂ්ටිය හරුව˙යි වදළ සේක.

එබසටත් පෙරසේම ˙නොහරිම්˙යිකීය. එකල්හි ඊට උපමා පිණිස මහතෙරුන් වහන්සේ වදරණ සේක්, ˙එම්බා රාජඤ්ඤය, මම පෙරවූ දෙයක් කියම්. ඌරන් පොෂ්‍යකරණ පුරුෂයෙක් කිසි කටයුත්තක් පිණිස දුර තැනකට ගොස් යන්නේ අතරමග වියලි තුබු අසූචි ගොඩක් ඌරන්ට දෙන්නගෙනයෙම්යි සිතා උතුරු සළුවෙ පොදි බැඳ ඉස තබාගෙන යන කල මහත් වැස්සකින් තෙමී ඉස පටන් දෙපය කෙළවර කොට අසූචි වැහෙන්ට වන. ඒ දැක මනුෂ්‍යයෝ, කිමෙක්ද, තෝ උමතුයෙහිද? අසූචි පොදිය දමවයි කිවාහුය. එබස් අසා තොපි උමතු වන්නහු වෙති. මම ඌරන්ට ගෙනයෙම්යි කියා එය ඉස තබා ගෙනම ගියේය. එම්බා රජඤ්ඤය තොත් සූකර පොෂකයාට උපමාකොට සිතම්. අසූචි පොදිය වැනිවූ තාගේ විපරිත දෘෂ්ටිය හරුව˙යි වදළ සේක එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ ˙වහන්ස, මම මේ දෘෂ්ටිය ගත් බව කොසොල් රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝදනා දන්නා හෙයින්ද, නුඹවහන්සේගේ වචනය නාසන නිසා නුඹ හා සමකොට සිතන යුගග්‍රාහය නිසාද මේ ලාමකවූ විපරිත දෘෂ්ටිය නොහරිම්˙යි කීය. එකල්හි තෙරුන් වහන්සේ වදරණසේක්, ˙එම්බා රාජඤ්ඤය මම උපමාවක් කියම්. පෙර අක්‍ෂධූර්තයෝ දෙදෙනෙක් බොහෝසේම දූ කෙළනාහුය. ඔවුන් අතුරෙන් එකෙක් පරාජය වන බව දැන පසඇට ගිලිනවා දැක අනෙක් අක්‍ෂධූර්තයා, පසඇට නොගිලූව˙යි කියද්දිම ඔහු දෙවෙනි වත් පසඇට ගිලිනේය. එකල්හි අනෙක් පුරුෂයා එක් දවසක් විෂ යොදා පසඇට දැමීය. එදවස්ද පෙරසේම පැරදෙන බව දැන පසඇට ගිල කාලක්‍රියා කෙළේය. එම්බා රජඤ්ඤය, තෝ ද මේ විපරීත දෘෂ්ටිය නොහැරියේ වී නම් පස ඇට ගිල නැසුනු අක්‍ෂධූර්තයාමෙන් අනව්‍යසනයට පැමිණ සසර දුකින් ගැලවිය නොහෙන්නෙහිය. තා විසින් ගන්නා ලද ලාමක දෘෂ්ටිය හරුව˙යි වදළසේක. එබසටත් පෙරසේම

"නොහරිමි"යි කීය. එකල්හි තෙරුන් වදරණ සේක් "එම්බා රාජසෘෂදය, මම උපමා වක් කියමි. උපමාවෙනුත් නුවණැත්තාහු කියන ලද වචනයාගේ අර්ථය දන්නාහුය" යි වදරා "රාජසෘෂදය, මම පෙරවූ දෙයක් කියමි. එක්තරා දනවුවක වැසි මනුෂ්‍යයෝ එය හැර අන් තැනක ට ගියාහුය. එසමයෙහි යහළුවන් දෙදෙනෙක් මිනිසුන් හැර ගිය ජනපදයෙහි කිසියම් වස්තුවක් දමා තිබුයේවීනම් ඒ ගෙන එන්ට යම්හයි කියා ගොස් එක්තරා ගමෙක්හි දමන ලද හනවැහැරී ගොඩක් දැක හන මිටි දෙකක් බරට බැඳගෙන එන්නා හුය. මෙසේ එන අතර අනෙක් ගමකට පැමිණ එතැන්හි දමනලද හන නුල් දැක ඔවුන් අතුරෙන් නුවණැති යහළුවා කියන්නේ, මේ හන වැහැරී ගෙන ගොස් නුල්කරන්ට වුවමැනව. එබැවින් මේ හන මිටි දමා හන නුල් ගෙනයම්හයි කීය. එකල්හි අනෙක් යහළුවා කියන්නේ, මේ හන මිටිය මම මනාකොට බැඳ දුර සිට ගෙන එන ලද්දේය එබැවින් නොදමන්නෙමි. තෝද නොගනුවයි කීය. එකල්හි ඒ නුවණැති යහළුවා හන වැහැරී මිටිය දමා හන නුල් බරක් බැඳගත්තේය. ඉක්බිති ඔහු දෙදෙනම එක්ව යන්නාහු අනෙක් ගමකට පැමිණි යහ. එහිදී දමන ලද හන පිළී ගොඩක් දැක ඒ නුවණැති යහළුවා කියන්නේ යහළුව, හන බර දමව, මම හන නුල් දමමි. අපි දෙදෙන හන පිළී ගෙන යම්හයි කීය. එකල්හිද අඥාන යහළුවා, මම මේ හන මිටිය මනාකොට බැඳගෙන දුර සිට ගෙනෙන ලද්දේය. එබැවින් නොදමම්යි කීය. නුවණැති යහළුවා නුල් දමා හන පිළි බරක් බැඳගත්තේය මෙම ක්‍රමයෙන් ඔහු දෙදෙන එක්ව යන්නාහු අනෙක් ගමකටද පැමිණියහ. එතැන්හි දමන ලද ක්ෂෞම වැහැරී ගත්තේය මෙම ක්‍රමයෙන් ක්ෂෞම වැහැරී දමා ක්ෂෞම නූල් ගත්තේය. ක්ෂෞම නූල් දමා ක්ෂෞම පිළි ගත්තේය. ක්ෂෞම පිළි දමා කපු ගත්තේය. කපු දමා කපු නුල්ද නුල් දමා කපු පිළිද ගත්තේය. කපු පිළි දමා කලූ ලොහෝ ගත්තේය. කලූ ලොහෝ දමා තඹ ලොහෝද, තඹ ලොහෝ දමා කලූ ඊයම්ද, කලූ ඊයම් දමා සුදු ඊයම්ද, සුදු රිදිද ගත්තේය. අනෙක් පුරුෂයා හන මිටියම ගෙන යන්නේය. මෙසේ දෙදෙන එක්ව යන්නාහු මසුරන් ගොඩක් දුටහ. ඉක්බිති නුවණැති යහලුවා කියන්නේ යහලුව, තෝ හන මිටිය දමව. මම සුදු රිදී බර දමමි. අපි දෙදෙනම මසුරන් දෙබරක් ගෙන යම්හයි කීය. එබසටත් අඥාන යහළු කියන්නේ මම් මේ හන බර මනාකොට බැඳ දුර සිට ගෙනෙන ලද්දේය. එහෙයින් එය ඉවත නොදමමි. තෝද නොගනුවයි කීය. එකල්හි නුවණැති පුරුෂයා රිදී බර දමා මසුරන් බරක් බැඳගෙන ගමට ගියේය. ඔහුගේ මව්පියන් හා අඹු දරුවෝද විශේෂයෙන්ම සතුටු වූවාහුය. බොහෝ වස්තුවත් ලද්දේය. මසුරන්

නොගෙන හනමිටිය පමණක් ගෙනගිය පුරුෂයාගේ මව්පියන් හා අඹු දරුවෝද නොසතුට දෙම්නස් වූවාහු වසනුවෙනුත් පිරිහුනාහුය. එම්බා රාජඤ්ඤය, තෝද බුඬරත්නය, ධර්මරත්නය, සංඝරත්නය යන ත්‍රිවිධ රත්නයෙන් උපසොභිතවූ මේ මගුල් සක්වල ඉපිද දන ශීලාදී වශයෙන් කුශල කර්‍මයන් නොකොටැ පරලොව නැත, කුශල් නැත, චුති චිත්තයෙන් මත්තෙහි උපදනා සත්‍වයන් නැත්තේයයි කියා ලාමක වූ විපරීත දෘෂ්ටිය ගෙන තාගේ ඤාති මිත්‍රයන් හා පිරිවරජනයන්ද අඹුදරුවන් ඇතුළුව තා ආශ්‍රය කළාවූ බොහෝදෙනාත් සතර අපායාදියට පමුණුවා බොහෝ කාලයක් මුළුල්ලෙහි සසර දුක් විඳුව, තෝත් නරකාදිසතර අපායට පැමිණ අනයව්‍යසනයට පැමිණෙන්නෙහිය. එබැවින් එම්බා රජඤ්ඤය, තෝත් හන මිටිය ගෙනගිය පුරුෂයාට උපමාකොට සිතම් තාගේ මේ ලාමකවූ විපරීත දෘෂ්ටිය හරුව. ඒ දෘෂ්ටිය තට දීඝ කාලයක් මුළුල්ලෙහි අහිතයට දුඃඛයට කාරණාවෙයි වදළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ "සවාමිනි, නුඹවහන්සේ පළමුකොට වදළ උපමාවෙන්ම පරලොව ඇතිබව දැනගතිමි. එතකුදුවුවත් නුබවහන්සේගෙන් විසිතුරු ප්‍රශ්න විසසර්ජනයන් අසනු කැමතිව මෙතෙක් කාරණා කීමි. සමසක් මංමුළාවූ එකක්හු අත අල්වාගෙන මේ මඟ යවයි කියා මග පැවාක් මෙන් නුඹවහන්සේගේ ධර්‍මදෙශනාව ඉතා යහපත් වන්නේ"ය කියා ප්‍රශංසාකොට "අද පටන් තුනුරුවන් සරණයෙමි" කියා සරණ ගොස් කියන්නේ ස්‍වාමීනි, අද පටන් මහදන් පවත්වනු කැමැත්තෙමි, මට අනුශාසනාකොට වදළ මැනවයි කීය. එකල්හි තෙරුන්වහන්සේ "එම්බා රාජඤ්ඤය, යම් ලෙසකින් ප්‍රාණඝාතාදී පව් නොපිරේ නම් එලෙසින් දන්දෙව"යි වදළසේක. එතැන් පටන් ශ්‍රමණ බ්‍රාහමණයන්ට හා දුගි මගී යාචකයන්ට දන් දෙන්නේ පෙර දන්දී පුරුද්දක් නැති හෙයින් කැඳ හා කාඩි ඇඹුල් දෙවෙනි කොට නිවුඩු සාලේ බත් දෙයි. දළ පිළී හා මහත් දහ ඇති පිළිදෙයි. මෙසේ සකස්නොකොට දන්දී චාතුර්‍මහාරාජික දිව්‍යලොකයෙහි හීනවූ දිව්‍යනිකායෙක උපන්නේය. එසමයෙහි ඒ දන විධානය කරන්නාවූ උත්තර නම් මානවකයෙක් විය. ඒ උත්තර නම් මාණවකයා එක්දවසක් දන් දී "මේ පායාසි රාජඤ්ඤයන් හා මේ ජාතියෙහි එක්වූ පමණක් විනා මතු එක්නොවම්හ"යි කියා පැතුයේය. බ්‍රාහමණයා එපවත් අසා ඔහු ගෙන්වා සැබෑදැ?යි කියා විචාළේය. එකල්හි "නුඹවහන්සේ සකස්නොකොට දමාපියන දෙයක් සේ සවල්ප දෙය දන්දී මතුත් සවල්ප දේම ලබන සේක, එකල්හි නුඹ එක්ව උපනහොත් අපටත් ස්වල්ප දෙයක්ම ලැබෙයි, එබැවින් නුඹ හා

එක්නොවම්හයි කියා ප්‍රාර්ථනා කෙළෙමියි කීය. එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ "අප පරිභොග කරණ පරිද්දෙන් දන් දෙව"යි කීය. එතැන් පටන් ඒ උත්තර මානවකයා දනය පැවැත්වීමෙහි ව්‍යාවෘතව සකස්කොට දන්දී තව්තිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන්විමනෙක උපන්නේය, ඉක්බිති ඒ දිව්‍යපුත්‍ර තෙම දිව්‍ය සම්පත් ලැබීමට කාරණා කවරේදැ?"යි පරීක්ෂාකොට කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගෙන් බණ අසා දන ශීලාදී වශයෙන් කුශල් කොට අවුත් උපන් බව දැන කළ උපකාරය සලකමින් විමානය හා සමග තෙරුන්වහන්සේ කරා එළඹ විමානයෙන් බැස පසඟ පිහිටුවා වැඳ දෙහොත් මුදුන් දී එකත්පස්ව සිටියේය. එකල්හි තෙරුන් වහන්සේ ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළ සේක.

"සා දෙවරාජස්ස සභා සුධම්මා
යත්ථච්ඡති දෙව සඞ්ඝො සමග්ගො,
තථූපමං තුයහමිදං විමානං
ඔභාසයං තිට්ඨති අන්තලික්ඛෙ,
දෙවිද්ධිපත්තොසි මහානුභාවො"-පෙ-

යනුහෙයින් "එම්බා දිව්‍යපුත්‍රය, තව්තිසා වැසි දෙවියන් රැස්ව හිඳිනාවූ සක්දෙව් මහරජහුගේ සුධර්මා නම් දිව්‍යසභාව මෙන් තාගේ මේ දිව්‍යප්‍රාසාදය ආකාශයෙහි දීප්තිමත්ව බබළන්නේය. තෝද දෙව්ලොව දෙවියන් පිරිවරා බබළන්නාවූ ශක්‍රයා මෙනැයි සිතමි, මෙබඳු සැපතක් ලැබීමට කලාවූ කුශලය කවරේදැ?"යි විචාරා වදළසේක. එකල්හි ඒ කුශල කර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

අහංමනුස්සෙසු මනුස්සභූතො
රඤ්ඤො පායාසිස්ස අහොසිං මානවො,
ලද්ධා ධනං සංවිභාගං අකාසිං
පියා ච මෙ සීලවන්තො අහෙසුං
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දනං විපුලං අදසිං
තෙන මේ තාදිසො වණ්ණො"-පෙ-

යනුහෙයින්, "යටගිය දවස මිනිස්ලොව වසන සමයෙහි පායාසි රාජඤ්ඤ නම් බ්‍රාහමණයාගේ කායකෘත්‍යයෙහි දක්ෂවූ උත්තරනම් මානවකයෙක් වීමි. එසමයෙහි දන් දීමෙහි සතුටුසිත් ඇතිව කර්මඵල අදහමින් මාලත් දෙය මම අනුභවනොකොට යම් දෙයකින් යැපී සකස්කොට දන් දුනිමි. යහපත් කොට ශීලයද රක්ෂා

කෙළෙමි. ඒ පායාසි රාජකුමාරයාගේ දනයද අනුන්ගේ දනයයි නොසිතා මාගේ දනයක් මෙන් සතුටු සිත් ඇතිව සකස්කොට දන් දුනිමි. ඒ කුශලකර්මය හෙතුකොට ගෙන මේ දිව ඉසුරු ලදිමි" කියා ප්‍රශංසාකොට මහතෙරුන් වහන්සේ වැද අවසර ගෙන දෙව්ලොවටම ගියේය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සවැනි වූ පායාසි වර්ගයෙහි දස
**වැනිවූ උත්තර විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

පායාසි වර්ග වර්ණනාව කියා නිමවන ලදී.

# සුනික්ඛිත්ත වර්ගය.

## 75. චිත්තලතා විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වන චිත්‍රලතා වර්ගයෙහි පළමුවන චිත්‍රලතා විමාන වස්තුව නම් කවරයත්-

ලොවට පින්කෙත්වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදරණසේක. එසමයෙහි වනාහි සැවැත්නුවර ස්වල්ප භොග ඇත්තාවූ දිළිඳුවූ එක්තරා උපාසකයෙක් තෙමේ අනුන්ගේ ගෙහි කර්මාන්තකොට ජීවත් වෙයි හෙතෙම ප්‍රසන්නවූ ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ ජීර්ණවූ මහළු වයසට පැමිණියාවූ මවුපිය දෙදෙන පොෂ්‍යය කරමින් මෙසේ සිතුයේය. ස්වාමිකුලයෙහි සිටින්නාවූ ස්ත්‍රීහු නම් ඉසුරු සම්පත් නිතර ප්‍රාර්ථනා කෙරෙයි ස්වාමියා හෝ ස්වාමියාගේ වැඩිසිටියෙක් හෝ නොබලයි. එබැවින් මවුපියන්ගේ චිත්ත දුක්ඛය ආරක්ෂාකෙරෙමින් දරපරිග්‍රහයක් නොකරමැයි සිතා තමාම මවුපියන්ට උපස්ථාන කරමින් නිත්‍ය පඤ්චශීලය හා උපොසථ දිනයන්හි අෂ්ටාඞ්ගශීලයද රකිමින් සුදුසු අවස්ථාවන්හි දනාදිය දීමෙන් පින්රැස්කෙරෙමින්ද සිට අනෙක් කලෙක්හි කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් දිව්‍යවිමානයෙක්හි උපන්නේය. මුගලන් මහතෙරුන් වහන්සේ විසින් අසනලද ප්‍රශ්නාදි විස්තර පෙර කී නයින් දතයුතුයි.

## 76. නන්දන විමාන වස්තුව.

මෙහි දෙවන නන්දන විමානවස්තුවද චිත්‍රලතා විමාන වස්තුව මෙනි, වෙනසෙක් නම් අඹුදරුවන් පොෂණය කරමින් මවුපියන් උපස්ථාන කළ බවයි. එබැවින් මේ විමාන වස්තුවද එසේ දැනගතයුතුයි.

## 77. මණිථූන විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වන චිත්‍රලතා වර්ගයෙහි තුන්වන මණිථූන විමාන වස්තුව නම් කවරයත්-

සර්වලොකප්‍රියඞ්කරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසයකර වදරනසේක. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු ආරණ්‍ය සේනාසනයෙහි වාසයකරනසේක. එසමයෙහි ඒ භික්ෂූන් පිඩුපිණිස ගමට වඩිනා මාර්ගයෙහි එක් උපාසකයෙක් විසම තැන් සම කෙරෙයි කටුහුල් පහකෙරෙයි. එසේම වනලැහැබ් පහකෙරෙයි, වර්ෂාකාලයෙහි ඇලවල් ආදී ජලාශ ස්ථානයන්හි ඒ දඬු පාලම්සාදවයි. හිරුරැස් ඇති මාර්ගය දෙපස වෘක්ෂයන් රොපනය කෙරෙයි. ජලාශයන්හි මැටි උගුලුවා පළල්වූ ගැඹුරු තැන් දකෙරෙයි. නහන පැන් පානයකරන තොටවල් සම්පාදනය කෙරෙයි. ශක්ති පමණින් දන්දෙයි. එසේම සිල් රකියි. මෙසේ වාසය කරන්නාවූ හෙතෙම අනෙක් කලෙක්හි කාලක්‍රියා කොට තවුතිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන් විමනෙක උපන්නේය. එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යපුත්‍රයාගේ දිව්‍ය ශ්‍රී සම්පත් දැක ඔහු අතින් මෙසේ විචාළසේක.

උච්චමිදං මණිථූනං විමානං
සමන්තතො ද්වාදසයොජනානි,
කූටාගාර සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතා සුභා"-පෙ-

යනු පෙර අසනලද පරිදියයි දැනගත යුතුයි.
**මණිථූන විමාන වස්තු වර්ණනාවද**
කියා නිමවනලදි.

# 78. සුවණ්ණ විමාන වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනිවූ සුනික්ඛිත්ත වර්ගයෙහි සතරවැනි වූ සුවර්ණ විමාන වස්තුව නම් කවරැයත්:-

සර්වලොකෛකනාථවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අන්ධකවින්ද නම් රට වැඩ වසනසේක. එසමයෙහි එරට නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා ශ්‍රද්ධාසම්පන්න වූ උපාසකයෙක් ඔහුගේ ගමට නුදුරු තැන එක්තරා මඩු ගල් නම් පර්වතයෙක් මුදුනෙහි සක්මන් මණ්ඩපය ජන්තාගෘහ භොජනශාලාදී සියල්ලෙන්ම සම්පූර්ණකොට නිරන්තරයෙන් බුදුන්ගේ වාසයට සුදුසු පරිද්දෙන් ගඳකිළියක් කරවා බුදුන්ට පිළිගන්වා පිරිවර සහිත බුදුන් විහාරයෙහි වස්වා නිරන්තරයෙන් සකස්කොට උපස්ථාන කෙළේය. තවද නිරන්තරයෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙමින් නිරන්තරයෙන් සුපිරිසුදු ශිලයෙහි පිහිටා යහපත් ශීලසංවර ඇතිව කාලක්‍රියාකොට ඒ කුශලානුභාවය ප්‍රකාශකොට දක්වනු පිණිස පුෂ්පාරාම ඵලාරාමාදියෙන් සමෘද්ධවූ රමණීය වූ සිත්කළු භූමිභාග ඇති රන්පර්වතයක් මුදුනෙහි නානාරත්නයෙන් විසිතුරුවූ රශ්මිජවාලා සමුජ්වලිත විචිත්‍රවෙදිකාවෙන් පරික්ෂිප්ත කරණ ලද අනෙක ප්‍රකාර විචිත්‍ර කර්මාන්තයෙන් නිමියාවූ භිත්ති දෙරකවුළු සොපාන මාලාදි වශයෙන් අනෙක ප්‍රකාරයෙන් අලංකෘතවූ රන් විමනෙක් පහළවිය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් දෙව්ලොවට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක ඔහු විසින් ගිය ජාතියෙහි කරණලද කුශලකර්මය ප්‍රකාශකරවනු පිණිස මේ ගාථාවන් වදළසේක.

"සොවණ්ණමයෙ පබ්බතස්මිං විමානං සබ්බතො පභං,
හෙමජාලකපච්ඡන්නං කිඞ්කිණිජාලකපපිතං
අට්ඨංසා සුකතා ථම්භා සබ්බෙ වෙළුරියාමයා,
එකමෙකාය අඨංසියා රතනාසනත්තිනිම්මිතා.
වෙළුරියසුවණ්ණස්ස ඵලිකා රූපියස්ස ච,
මසාරගල්ලමුත්තාහි ලොහිතඞ්කමණීහි ච.
චිත්‍රා මනොරමා භූමි නතත්‍රෙණු දධංසතී රජො,
ගොපානසීගණා පීතා කූටං ධාරෙන්ති නිම්මිතා.
සොපානානි ච චත්තාරි නිම්මිතා චතුරො දිසා,
නානාරතනගබ්භෙහි ආදිච්චොව විරොචති"

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, මේ රන් පර්වතය මුදුනෙහි දිලියෙන්නාවූ තාගේ මේ විමානය අතිශයන්ම ශොභාමත් වෙයි. මත්තෙහි රන්දැල් වසා රන් රසු දැලින් සැරසී තිබෙයි. බිම ඉන්ද්‍රනීලමාණික්‍යමය බැවින් රජස් ධූලි නොනැගෙයි. සියලු ටැම් වෛරෝඩමාණිමය වෙයි. එතකුදු වුවත් ඒ ටැම් සියල්ලම අෂටාංශ වෙයි. එයින් එක් අංශයෙක් ඵලිකමය, එක් අංශයෙක් රිදීමය. එක් අංශයෙක් මැසිරිගල්මය එක් අංශයෙක් සර්වරත්නමයද වෙයි. ගොනැස් සවණිව වණිවූ පුෂ්පරාගමාණිමය වෙයි. ගොනැස් දරා සිටි කර්ණිකාව සත්රුවනින් නිමියේය. සතරදිග සත්රුවනින් නිමියාවූ හිනිමං සතරකින් හා නානාවිධ රත්‍නයෙන් නිර්මිතවූ නොයෙක් ගබඩායෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ රන් පර්වතය මුදුනෙහි දිලියෙන්නාවූ විමානය යුගඳුරු මුදුනෙහි දිලියෙන හිරු වියනක්සේ දශදිග් ඒකාලොක කෙරෙමින් බබලන්නේය. තවද මේ විමානයෙහි නොයෙක් දිව්‍යාභරණයෙන් සැරසී බබලන්නාවූ තෝ සමපනස් යොදුන් හිරු විමනෙහි දිලියෙන සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයා මෙන් සොභාමත්ව බබලන්නෙහිය. එම්බා දිව්‍යපුත්‍රය, මෙබඳු දිව්‍යසම්පත් ලැබීමට තා විසින් කරණලද කුශලකර්මය කවරේදැ?"යි විචාරා වදාළසේක. ඒ තෙරුන් වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍ය පුත්‍රතෙම මෙසේ කීයේය.

"අහං අන්ධකවින්දස්මිං බුද්ධාසසදිච්චබන්ධුනො,
විහාරං සත්ථු කාරෙසිං පසන්නො සෙහි පාණිහි.
තත්ථ ගන්ධඤ්ච මාලඤ්ච පච්චගඝඤ්ච විලෙපනං
විහාරං සත්ථුනො දසිං විප්පසන්නෙන චෙතසා."

යනුහෙයින්, "ස්වාමීන්වහන්ස, මම මීට පූර්වජාතියහි අන්ධකවින්දනම් රට එක්තරා උපාසකයෙක්වීමි. එසමයෙහි මාගේ සවහස්තයෙන් විහාරයක් කොට නොයෙක් අලංකාරයෙක් සරහා බිම සුවඳ පිරි බඩලා ගඳදුම් මල්පහන් ආදියෙන් පුදා විහාරය බුදුනට පිළිගන්වා බුදුන් එහි වඩා හිඳුවා සතුටු සිත් ඇතුව සිවුපසයෙන් උපකාර කෙළෙමි ස්වාමීනි, මෙපමණ කුශලකර්මය හෙතුකොට ගෙන මෙබඳු දිව්‍යසම්පත්තියක් ලදිමි"යි කීයේය. මෙසේ ඒ දිව්‍ය පුත්‍රයා කුශලකර්මය ප්‍රකාශකොට කී කල පිරවර සහිත දිව්‍ය පුත්‍රයාට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජාණන් වහන්සේ එම අත්‍යෝත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනිවූ සුනික්ඛිත්ත වර්ගයෙහි
**සතරවැනි වූ සුවණ්ණ විමාන වස්තුව**
කියා නිමවන ලදි

# 79. අම්බ විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි වූ සුනික්ඛිත්ත වර්ගයෙහි පස්වැනි වූ අම්බ විමාන වස්තුව නම් කවරයත්:-

අශරණ ශරණවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වේලුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි රජගහනුවර එක්තරා දුප්පත් පුරුෂයෙක් බැල මෙහෙපිණිස අනුන්ගෙන් බත් වැටුප් ගෙන ඔවුන් සන්තක අඹ උයනක් රක්ෂාකෙරෙයි. එක් දවසක් ග්‍රීෂ්ම ඍතුයෙහි තද අව්වෙන් උණුවූ සුදු වැල්ලෙන් ගැවසීගත්තාවූ ඒ ඒ අතවිස්තීර්ණවූ මිරිඟුජලයෙන් යුත් භූමිභාග ඇති දුර මඟට පැමිණ සේදයෙන් යුත් ශරීර ඇතිව ග්‍රීෂ්මයෙන් ක්ලාන්තව අඹ උයන සමීපයෙන් වඩනා සැරියුත් මහතෙරුන් වහන්සේ දැක උන් වහන්සේ කරා එළඹ නමස්කාරකොට , "ස්වාමීනි, ග්‍රීෂ්ම කාලය ඉතා දැඩිවෙයි: ස්වාමීන් වහන්සේ ගේ ශරීරයත් බලවත්වූ උෂ්ණයෙන් ක්ලාන්තවූසේ දක්නා ලැබෙයි. ස්වාමීනි මා කෙරෙහි අනුකම්පායෙන් මේ අඹ උයනට වැඩ මඳ කලක් මේ සෙවනේ වැඩහිඳ මාර්ගඛේදා සන්හිඳුවාගෙන වැඩියමැනවයි ආරාධනා කෙළේය. එකල මහතෙරුන් වහන්සේ ඔහු විශේෂයෙන් ප්‍රසන්නවූ බව දැක ඔහුගේ සිතට ගත් ප්‍රසන්නතාව මතු මත්තෙහි වඩ වඩා වැඩෙහි යොදනු කැමතිව අඹවනයට වැඩ එක්තරා අඹගසක් මුල වැඩහුන්සේක එකල්හි ඒ පුරුෂතෙම කියන්නේ, "ස්වාමීනි, පැන් නහනු කැමතිසේක්වීනම් මේ ළිඳෙන් පැන්ගෙන පිළිගන්වා නහවමි"යි කීය. තෙරුන් වහන්සේ මුවෙන් නොබැණ ඉවසූසේක. ඒ පුරුෂතෙම ළිඳෙන් පැන් ගෙන පෙරා තෙරුන් වහන්සේ නැහැවූසේක. පැන් නහවා ඉක්බිති හස්තපාද ධෝවනය කොට වැඩහුන් තෙරුන් වහන්සේට බොන පැන් පිළිගැන්විය. පැන් වළඳ ඉක්බිති සන්සිඳෙනලද කාය පරිළාහ ඇති මහතෙරුන් වහන්සේ පැන් නහවපු කුශලයත් පැන් වළඳවාපු කුශලයත් දක්වා උදක දනානු මොදනාවෙන් බණ වදරා ඔහු සතුටුකරවා වැඩිසේක. එකල්හි ඒ පුරුෂතෙම සිතන්නේ, "ඒකාන්තයෙන්ම ග්‍රීෂ්මයෙන් පීඩිතවූ තෙරුන් වහන්සේගේ ග්‍රීෂ්ම සන්සිඳවා උපකාර කෙළෙමියි සතුටුව "ඒකාන්තයෙන්ම මා විසින් බොහෝ කුසල් රැස්කරනලදදේය"යි

කියා උදරවූ ප්‍රීති සොම්නස් උපදවා කුශලය සිත තබාගත්තේය. ඒ පුරුෂතෙම එයින් අපර භාගයෙහි කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නේය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යපුත්‍රයා දැක ඔහු විසින් කරනලද කුශලකර්‍මය විචාරනු කැමතිව මෙසේ විචාළසේක.

"උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදසයොජනානි,
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියථම්භා රුචකත්ථතාසුභා
තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගු,
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියෙ ච නච්චන්ති සුවණ්ණඡන්නා."

යනාදීන් යට කියන ලද ක්‍රමයෙන් ඔහුගේ දිව්‍ය සම්පත් වර්‍ණනාකොට, "මෙබඳු සම්පත් ලැබීමට කළාවූ කුශලය කවරේදැ?"යි විචාරා වදාළසේක. එකල්හි ඒ සියලු කර්‍මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍ය පුත්‍ර තෙම මෙසේ කීයේය.

"ගිම්හානං පච්ඡිමෙ මාසෙ පතපන්තෙ දිවඞ්කරෙ,
පරෙසං භතකො පොසො අම්බාරාමමසිඤ්චති.
අථ තෙනාගමා භික්ඛු සාරිපුත්තො ති විස්සුතො,
කිලන්තරූපො කායෙන අකිලන්තොව චෙතසා
තඤ්ච දිස්වාන ආයන්තං අවොචං අම්බසිඤ්චකො
සාධු තං භන්තෙ න්හාපෙය්‍යං යං මමස්ස සුඛාවහං
තස්ස මෙ අනුකම්පාය නික්ඛිපි පත්තචීවරං,
නිසීදි රුක්ඛමූලස්මිං ඡායාය එකචීවරො."

යනු හෙයින්,"ස්වාමීනි මම යටගිය දවස බැල මෙහෙකොට රැකෙන්නාවූ එක්තරා දුප්පතෙක් වීමි. එසමයෙහි ග්‍රීෂ්ම ඍතුයෙහි පශ්චිම වූ ඇසළ මස ඉරුරැස් බලවත් හෙයින් බත් වැටුප් ගෙන අනුන්ගේ අඹ උයනක් රකිමින් අඹගස් මුල පැන් වත්කෙරෙමින් ඒ ආරාමයෙහි සිටියෙමි. එසමයෙහි ආයර්‍ය මාර්‍ගඥනයෙන් කෙලෙසුන් නැසූ හෙයින් ක්ලාන්ත නොවන්නාවූ සිත් ඇති සැරියුත් මහ තෙරුන්වහන්සේ ශරීරය පමණක් ග්‍රීෂ්මයෙන් ක්ලාන්තව ඒ ආරාම සමීපයට වැඩිසේක. එකල

මම උන්වහන්සේ දැක නමස්කාරකොට අඹගස මුල වඩා හිඳුවා, පැන් වදළමැනයි කියා ආරාධනා කෙළෙමි, එකල්හි මහ තෙරුන්වහන්සේ මා කෙරෙහි අනුකම්පායෙන් පාසිවුරු තබා එක සිවුරකින් යුක්තව වැඩසිටිසේක. එකල්හි ළිඳෙන් පැන් ගෙන නහවා පැන් වළඳවා සතුටු සිත් ඇතිව උපකාර කෙළෙමි"යි කියා ඉක්බිති, මෙපමණක් විනා අනෙක් කුශලයක් ඒ ජාතියෙහි නොකළ බව හඟවන පිණිස මෙසේ කීයේය.

"අම්බො ච සිඤ්චතා සමණො නහාපිතො,
මයා ච පුඤ්ඤං පසුතං අනප්පකං,
ඉති සො පීතියා කායං සබ්බං ඵරති අත්තනො,
තදෙව එත්තකං කම්මං අකාසිං තාය ජාතියං,
පහාය මානුසං දෙහං උපපන්නොම්හි නන්දනං,
නන්දනෙ පවනෙ රම්මෙ නානාදිජ ගණායුතෙ,
රමාමි නච්ච ගීතෙහි අච්ඡරාහි පුරක්ඛතො"ති.

යනුහෙයින්, "ස්වාමීනි, ඒ ජාතියෙහි මා විසින් අඹගස්මුල පැන් වත්කර ලද්දේය තෙරුන් වහන්සේද පැන් නහවන ලද්දේය. එබැවින් ඒ තෙරුන්වහන්සේට කළ උපකාරය පමණක් විනා ඒ ජාතියෙහි අනෙක් කුශලයක් මා විසින් නොකරන ලද්දේය. එපමණ කුශලය හෙතුකොටගෙන මේ දිව්‍යලොකයෙහි ඉපිද නන්දනොද්‍යානයෙහි නෘත්‍ය ගීතාදී වශයෙන් ක්‍රීඩා කෙරෙමින් උදාරවූ දිව ඉසුරු ලැබ පඤ්චකාමසම්පත් අනුභව කෙරෙමි"යි කීයේය. එකල්හි මහ තෙරුන්වහන්සේ ඕහට බණ වදාරාමිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූ සේක. බුදුරජාණන් වහන්සේ එම අත්‍ථොත්පත්තිකොටගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි
**පස්වැනි අම්බ විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදී.

## 80. ගොපාල විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි සවැනි ගොපාල විමාන වස්තුව නම් කවරැයත්:-

සකල ගුණ නිධාන වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වැඩ වසනසේක. එසමයෙහි රජගහ නුවර වසන්නාවූ එක්තරා ගවපාලයෙක් ගවයන් රක්නා පිණිස යන්නේ උදය බත් පිණිස යවසාලින් කරනලද කොමු ආහාරයක් ජීණිවූ කිළුටු වස්ත්‍රයක බැඳගෙන කල්යවා අනුභව කෙරෙමියි සිතා නුවරින් නික්ම ගවයන් හැසිරෙන්නාවූ ගොදුරු බිමට පැමිණියේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන්වහන්සේ ඒ ගවපාලයා දැක සිතා වදරණසේක මේ ගව පාලයා දැන් කාලක්‍රියා කෙරෙයි. එතකුදු වුවත් මට කොමු ආහාරයක් දන්දී තවුතිසා දෙව්ලොව උපදින්නේය'යි දැන ඔහු සමීපයට වැඩිසේක. එකල්හි ඒ ගවපාල තෙම කල්වේලා බලා තෙරුන්වහන්සේට කොමු ආහාරයක් දන් දෙනු කැමතිවිය. එසමයෙහි ගවයෝ අනුන්ගේ උඳු කෙතට වන්නාහුය. ඒ බව දැක ගොපලුතෙම සිතන්නේ, කිමෙක්ද, පළමුකොට මේ තෙරුන්වහන්සේට කොමු දන් දෙම්ද, නොහොත් ගවයන් උඳුකෙතෙන් පිටත්කෙරෙම්දැ?යි සිතුයේය. එකල්හි ඔහට මෙබඳු සිතෙක් පහළවිය. උඳුකෙත හිමියෝ මට යමක් කරනු කැමැත්තාහු නම් උන්ට මනාප දෙයක් කෙරෙත්වා; තෙරුන් වහන්සේ වැඩිසේක් වීනම් මාගේ මේ කොමුදනයට අන්තරාය වෙයි; පළමුකොට මේ තෙරුන්වහන්සේට කොමු පූජා කලෙම් නම් යෙහෙකැ'යි සිතා තෙරුන් වහන්සේට කොමු ආහාර පිළිගැන්විය. උන්වහන්සේද ඔහු කෙරෙහි අනුකම්පායෙන් පිළිගත්සේක. ඉක්බිති ගවයන් නවතන පිණිස උවදුරු නොබලා දිවයන්නාවූ ගවපාලයාගේ පය වැදීමෙන් කිපුණු නාගයෙක් දෂ්ටකෙළේය. තෙරුන්වහන්සේ ඔහු කෙරෙහි අනුකම්පායෙන් කොමු වළඳන්නට පටන්ගත්සේක. ගවපාල තෙම ගවයන් නවතා කෙතින් පිටත්කොට ආයේ කොමු වළඳනා තෙරුන් වහන්සේ දැක උදරවූ ප්‍රීති සොම්නස් පිළි ලබමින් හුන්නේය. එකෙණෙහිම ඔහුගේ සකල ශරීරයෙහි විෂ ව්‍යාප්තව මෙහොතකින් හිස මුදුනට පැමිණි කල්හි කාලක්‍රියාකොට තවුතිසා දෙව්ලොව දෙළොස් යොදුන් රන් විමනෙක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් තෙරුන්වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක, ඒ දිව්‍ය පුත්‍රයා දැක මෙසේ විචාරා වදළසේක

"අලඞ්කතො මාලහාරි සුවත්‍ථො
සුකුණ්ඩලී කප්පිතකෙසමස්සු,
ආමුත්ත හත්‍ථාභරණෝ යසස්සි
දිබ්බෙ විමානමහි යථා පි චන්දිමා.

දිබ්බා ච වීණා පවදන්තිවග්ගූ
අට්ඨට්ඨකා සික්ඛිතා සාධුරූපා,
දිබ්බා ච කඤ්ඤා තිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති පමෝදයන්ති"

යනුහෙයින්, "එම්බා දිව්‍ය පුත්‍රය, අන්දන් තබනලද දැළි රැවුලු ඇතිව වස්ත්‍රාභරණ මාලාදියෙන් හා හස්තාභරණාදීයෙන්ද අනෙක ප්‍රකාර දිව්‍යාලඞ්කාරයෙන්ද සැරසී මේ දිව්‍ය විමානයෙහි බබළන්නවූ තෝ යම්සේ චන්‍ද්‍රයා තාරකාවන් පිරිවරා ශරීරාලොකයෙන් ඒකාලෝක කෙරේද එමෙන් මේ දෙව් පිරිස් පිරිවරා ශරීරාලෝකයෙන් දශදිග් එකාලොක කෙරෙමින් දීප්තිමත්ව බබළන්නෙහිය. තවද සිවුසැටක් පමණ ස්ත්‍රී අලඞ්කාරයෙන් සැරසුනාවූ නොයෙක් දහස්ගණන් දිව්‍යාඞ්ගනාවෝ නටමින් ගායනාකරමින් තොප සතුටු කරන්නාහුය. එම්බා දිව්‍යපුත්‍රය, තෝ මෙබඳු දිව ඉසුරක් ලැබීමට කළාවූ කුශලකර්මය කවරේදැ?"යි විචාරා වදළසේක. එකල්හි ඒ ප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍යපුත්‍ර තෙම මෙසේ කීයේය.

"අහං මනුස්සෙසු මනුස්සභූතො
සඞ්ගම්ම රක්ඛිස්සං පරෙසං ච ධෙනුයො,
තතො ච ආගා සමණෝ මමන්තිකෙ
ගාවෝ ච මාසෙ අගමංසුඛාදිතුං.
ද්වයජ්ජ කිච්චං උභයඤ්ච කාරියං
ඉච්චෙවහං භන්තෙ තද විචින්තයිං.
තතො ච සඤ්ඤං පටිලද්ධයොනිසො
දදාමි භන්තෙති ඛිපිං අනන්තකං.
සො මාසඛෙත්තං තුරිතො අවාසරිං
පුරා අයං භඤ්ජතී යස්සිදං ධනං,
තතො ච කණ්හො උරගො මහාවිසො
අඩංසි පාදෙ තුරිතස්ස මෙසතො.
ස්වාහං අට්ටොම්හි දුක්ඛෙන පීළිතො
භික්ඛු ච තං සාමං මුඤ්චිත්වා න න්තකං,
අහාසි කුම්මාසං මමානුකම්පයා
තතො චුතො කාලකතොම්හි දෙවතා.
ත දෙව කම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා,
තයා හි භන්තෙ අනුකම්පිතො භුසං
කතඤ්ඤුතාය අභිවාදයාමි තං.

යනුහෙයින්, "ස්වාමීනි, යටගිය දවස මිනිස් ලොව වසන සමයෙහි අනුන්ගේ ගවයන් රක්‍ෂාකරන ගව පාලයෙක් වීමි. එසමයෙහි කොමු ආහාරයක් කිළුටු වස්ත්‍රයක බැඳගෙන ගවයන් රක්නා පිණිස ගොදුරු සෙවීමට ගොස් ගවයන් එක්කොට රක්‍ෂා කෙළෙමි එසමයෙහි ස්වාමිවූ නුඹවහන්සේ එතැනට වැඩිසේක. එකල්හි මම කොමු දන් දෙන්ට සිතීමි. එකෙණෙහිම ගවයෝ උඳුකෙත කන්ට යන්නාහුය. මෙසේ මා විසින් වහා කරන්නට සුදුසු කටයුතු දෙකක් එකවිටම සම්ප්‍රාප්ත වවිය. මේ දෙකෙන් පළමුකොට කුමක් කෙරෙම්දැ?යි සිතන්නාවූ මම සිහිනුවණින් යෙදී මෙසේ සිතීමි කෙත් හිමියන් මට කුමක් කරතත් පළමුකොට කොමු පිළිගන්වමියි සිතා ජීණිවූ කිළුටු වස්ත්‍රයෙහි බැඳ තුබූ කොමු පළමුකොට පිළිගැන්වූයෙමි නැවත මේ උඳුකෙත මැඩකාපු නම් නපුර; ඊට පළමුවෙන් ගවයන් කෙතෙන් පිටත්කෙරමි යි සිතා වහා දිවන්නෙමි එසමයෙහි කළු නාගයෙක් උවදුරු නොබලා දුවන්නාවූ මාගේ පය දෂ්ටකෙළේය. ස්වාමින් වහන්සේ මා කෙරෙහි අනුකම්පාවෙන් කොමු වැළඳූ සේක. නාගයා විසින් දෂ්ටකරනලදුව දුඃඛවේදනාවෙන් පීඩිතව කාලක්‍රියා කොට මේ දිව්‍යලොකයෙහි උපන්නෙමි. මේ දිව ඉසුරු ලැබීමට මා විසින් කරනලද්දේ මෙපමණ වූ ස්වල්ප කුශල කර්මයෙකි. එතකුදුවුවත් පින්කෙත් බලවත් හෙයින් මහත්වූ දිව්‍ය සම්පත්තියක් අනුභව කෙරෙමි"යි කියා නැවත තෙරුන්වහන්සේගේ ගුණයට ප්‍රශංසා කරන්නේ,

"සදෙවකෙ ලොකෙ සමාරකෙ ච
අඤ්ඤො මුනී නත්ථි තයානු කම්පකො,
තයා හි භන්තෙ අනුකම්පිතො භුසං
කතඤ්ඤුතායං අභිවාදයාමිතං.

යනුහෙයින්, "ස්වාමිනි, නුඹවහන්සේ හා සමාන වූ සකල සත්වයන් කෙරෙහි දයානුකම්පා ඇති ස්‍වාමින්වහන්සේ කෙනෙක් දෙවියන් මරුන් සහිත වූ මේ ලොකයෙහි ඒකාන්තයෙන් ම නැත්තේමය. නුඹවහන්සේ විසින් අනුකම්පා කරන ලද්දවූ මම මෙබඳු දිව ඉසුරක් ලදිමි. එබැවින් කෘතොපකාර පිණිස නුඹ වහන්සේට නමස්කාර කෙරෙමි"යි කියා ප්‍රශංසාකොට නමස්කාර කෙළේය. එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරනැන් වහන්ස් පිරිවර සහිතවූ ඒ දිව්‍ය පුත්‍රයාට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ බුදුරජාණන් වහන්සේට ඒ සියලු ප්‍රවෘත්තිය දැන්වූසේක. එම අත්‍ථොත්පත්තිකොටගෙන සම්ප්‍රාප්ත පිරිසට බණ වදරන්නාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් නිකුත් සුවඳින් සියලු දම්සභා මණ්ඩපය සුවඳ කරඬුවක් සේ

කෙරෙමින් මෙසේ වදාළ සේක.

"දිස්වාන දෙවං පටිපුච්ඡි හික්ඛු
උච්චේ විමානම්හි චිරට්ඨිතිකෙ,
ආමුත්තහත්ථාභරණං යසස්සිං
දිබ්බෙ විමානම්හි යථාපි චන්දිමා."

යනුහෙයින්, "යම්සේ චන්ද්‍ර දිව්‍ය පුත්‍රයා තමන්ගේ දිව්‍ය විමානයෙහි ධවල වූ සිසිරකිරණයෙන් ජොතිමත්ව බබළාද එමෙන් තුන්කෙළ හැටලක්ෂයක් හවුරුදු මුළුල්ලේහි සැප විඳිනා පිණිස චිරස්ථායිව පිහිටියාවූ තමන්ගේ උතුම් දිව්‍ය විමානයෙහි හස්තාභරණ පාදාභරණාදී නොයෙක් දිව්‍යාලංකාරයෙන් සැරසී මහත්වූ යසසින් හා ශරීරාලොකයෙන් දශදිග් එකාලොක කෙරෙමින් බබළන්නාවූ ගොපාල නම් දිව්‍ය පුත්‍රයා දැක මුගලන් මහතෙරහු එම්බා දිව්‍ය පුත්‍රය, තෝ මේ දිව ඉසුරු ලැබීමට ගිය ජාතියෙහි කළාවූ කුශලය කවරේදැ?"යි විචාළේය. ඒ දිව්‍ය පුත්‍රයාද කුශලකර්මය ප්‍රකාශකොට කීයේය. යනාදින් සියලුම කථා ප්‍රවෘත්තිය වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි
**සවන ගොපාල විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදි.

## 81. කන්ථක විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වන සුනික්ඛිත්ත වර්ගයෙහි සත්වැනිවූ කන්ථක විමාන වස්තුව නම් කවරැයත්:-

ත්‍රෛලොක්‍යතිලකවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහ සිටාණන් විසින් කරවා පිළිගන්වනලද ජේතවනාරාමයෙහි වැඩ වාසයකර වදරනසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙහි හැසිරෙන සේක් තවුතිසා දෙව්ලොවට වැඩි සේක. එකෙනෙහි කන්ථක නම් දිව්‍යපුත්‍රතෙම තමාගේ දිව්‍ය භවනයෙන් නික්ම දිව්‍ය යානාවකට නැගී මහත් දිව පිරිස් පිරිවරා මහත්වූ දිව්‍ය ඍද්ධියෙන් යුක්තව උයන් කෙළි පිණිස යනුයේ ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ දැක හටගත් ගෞරව බහුමාන ඇත්තේ, වහා දිව්‍ය යානාවෙන් බැස තෙරුන් වහන්සේ

කරා පැමිණ පසඟ පිහිටුවීමෙන් වැඳ දෙහොත් මුදුනෙහි තබාගෙන නමස්කාරකොට සිටියේය. ඉක්බිති තෙරුන් වහන්සේ ඒ දිව්‍ය පුත්‍රයාගේ උදරවූ ශ්‍රී සම්පත් දැක මෙසේ විචාරා වදළසේක.

"පුණ්ණමාසෙ යථා චන්දෙ නක්ඛත්තපරිවාරිතො,
සමන්තා අනුපරියාති තාරකාධිපතීසසී
තථූපමං ඉදං ව්‍යමහං දිබ්බං දෙවපුරම්හි ච,
අතිරොචතී වණ්ණෙන උදයන්තොව රංසිමා.
වෙළුරියසුවණ්ණස්ස ඵලිකා රූපියස්ස ච,
මසාරගල්ලමුත්තාහි ලොහිතඞ්කමණීහි ච.
චිත්‍රා මනොරමා භූමි වෙළුරියස්ස සන්ථතා,
කූටාගාරා සුභා රම්මා පාසාදෙ තෙ සුමාපිතො.
රම්මා ච තෙ පොක්ඛරණී පුථුලොමනිසෙවිතා,
අච්ඡොදිකා විප්පසන්නා සොණ්ණවාලුකසන්ථතා.
නානාපදුමසඤ්ඡන්නා පුණ්ඩරිකසමොතතා,
සුරභිං සම්පවායන්ති මනුඤ්ඤමාළුතෙරිතා.
තස්සා තෙ උභතො පස්සෙ වනගුම්බා සුමාපිතා,
උපෙතා පුප්ඵරුක්ඛෙහි ඵලරුක්ඛෙහි චූභයං
සොවණ්ණපාදෙ පල්ලඞ්කෙ මුදුකෙ චොල සන්ථතෙ,
නිසින්නං දෙවරාජංව උපතිට්ඨන්ති අච්ඡරා"

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, තාරකා සමූහයා විසින් පිරිවරනලද චන්ද්‍ර දිව්‍යපුත්‍රතෙම පුරපසළොස්වක් දිනයෙහි අහසෙහි යම්සේ බබළාද එපරිද්දෙන් හාත්පස බබුළුවමින් චන්ද්‍රයාසේ හැසිරෙන්නෙහිය. තවද දහසක් රැසින් ලොකය අලොකකරමින් හැසිරෙන්නාවූ සූර්‍ය්‍ය දිව්‍ය රාජයා මෙන්ද බබළන්නෙහිය. එසේම තාගේ මේ විමාන භූමිය ඉන්ද්‍රනීල මාණික්‍යමය බැවින් රජස්ධූලි නොනැගෙයි, සියලූ ටැම් වෛඩූර්‍ය්‍යමාණික්‍යමය වෙයි. එසේද වුවත් ඒ විමනෙහි ටැම් සියල්ලම අෂ්ටාංශවෙයි, එයින් එක් අංශයෙක් වෛඩූර්‍ය්‍ය මාණික්‍යමය, එක් අංශයෙක් සවර්ණමය, එක් අංශයෙක් ඵලික මය, එක් අංශයෙක් රිදිමය, එක් අංශයෙක් මසාරගල්මය, එක් අංශයෙක් මුතුමය, එක් අංශයෙක් ලොහිතඞ්ක මාණික්‍යමය, එක් අංශයෙක් සර්වරත්නමය වෙයි. ඒ දිව්‍ය ප්‍රාසාදයෙහි සිත් කළු කූටාගාර වෙයි. නොයෙක් මීන සමූහයාගෙන් ගැවසී ගත්තාවූ සිත්කළුවූ පොකුණින් හා මනාකොට පිරිසුදුවූ වැලි තලාවෙන් යුක්තවූ පස්පියුමෙන් ගැවසුනාවූ සිත් අලවන්නාවූ පුෂ්කරණී

වෙයි. අනෙක ලතා සමූහයාගෙන් හා මිහිරි සුවඳින් යුකතවූ සිත්කළුවූ නොයෙක් වන වෘක්ෂ සමූහයෙන් ඒ දිව්‍යප්‍රසාදය දෙපස ගැවසී ගත්තේය. එසේම නොයෙක් මලින් හා ඵල සමූහයෙන් සෙවුනාලද ඒ වෘක්ෂයෝ සිත් අලවමින් සිටියෝය. ඒ සවර්ණවර්ණවූ දිව්‍ය ප්‍රාසාදයෙහි මෘදු මොලොක්වූ දිව්‍යමය ආස්තරණයෙන් අතුරනලද ශක්‍රදිව්‍යරාජයා මෙන් සර්වාභරණාදීවූ නොයෙක් උදරතර දිව්‍ය ශ්‍රී ශොභාවෙන් බබළමින් සිටින්නාවූ දිව්‍ය පුත්‍රය, තෙපි කවර කුශලකර්මයකින් මෙබඳු මහත් දිව්‍ය ශ්‍රී සම්පත්තියක් ලබන ලද්දේදැ?"යි විචාරා වදළ සේක. ඒ අසා දිව්‍ය පුත්‍රතෙම තෙරුන්වහන්සේ කෙරෙහි හටගත් ගෞරව බහුමාන ඇතිව මෙසේ ප්‍රකාශ කෙළේය.

"අහං කපිලවත්ථුස්මිං සාකියානං පුරුත්තමෙ,
සුද්ධොදනස්ස පුත්තස්ස කන්ථකො සහජො අහං.
යදා සො අඩ්ඪරත්තායං බොධායමභිනික්ඛමි,
සො මං මුදූහි පාණීහි ජාලතම්බනඛෙහි ච.
සත්ථි ආකොටයිත්වාන වහ සම්මාති ච බ්‍රවි,
අහං ලොකං තාරයිස්සං පත්තො සම්බොධි මුත්තමං.
තං මෙ ගිරං සුණන්තස්ස හාසො මෙ විපුලො අහු.
උදග්ගචිත්තො සුමනො අභිසීංසිං තදා අහං.
අභිරූළ්හඤ්ච මං ඤත්වා සක්‍යපුත්තං මහායසං,
උදග්ගතචිත්තො මුදිතො වහිස්සං පුරිසුත්තමං.
පරෙසං විජිතං ගන්ත්වා උග්ගතස්මිං දිවාකරෙ,
මමං ඡන්නඤ්ච ඔහාය සො නපෙක්ඛො අපක්කමි.
තස්ස තම්බනඛෙ පාදෙ ජිව්හාය පරිලෙහිසං,
ගච්ඡන්තඤ්ච ඔහාය සො නපෙක්ඛො අපක්කමි.
අදස්සනෙනහන්තස්ස සක්‍යපුත්තස්ස සිරිමතො,
අලත්ථං ගරුකාබාධං ඛිප්පං මෙ මරණං අහු.
තස්සෙව ආනුභාවෙන විමානං ආවසාමිදං,
සබ්බකාමගුණොපෙතං දිබ්බං දෙවපුරම්හි ච.
යඤ්ච මේ අහුවා හාසො සද්දං සුත්වාන බොධියා,
තෙනෙව කුසලමූලෙන ඵුසිස්සං ආසවක්ඛයං.
සචෙ හි භන්තෙ ගච්ඡෙය්‍යාසි සත්ථු බුඩස්ස සන්තිකෙ,
මමාපි නං වචනෙන සිරසා වජ්ජාසි වන්දනං.
අහම්පි දට්ඨුං ගච්ඡිස්සං ජිනං අප්පටිපුග්ගලං,
දුල්ලභං දස්සනං හොති ලොකනාථාන තාදිනං"ති.

යනුහෙයින්, "ස්වාමීනි, මුගලන් මහතෙරුන්වහන්ස, මම යටගිය දවස ශාක්‍යයන්ගේ උත්තමවූ කපිලවාස්තුපුරයෙහි සුද්ධෝදන මහරජහුගේ පුත්‍රවූ සිද්ධාර්ථ නම් උතුම් කුමාරයාණන් උපන් දවස්හි කන්ථක නම්වූ අශ්වරාජන්ව උපන්මි එසේ ඉපිද උතුම්වූ දෙතිස් මහා පුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් ද යුක්ත වූ ඒ මාගේ ස්වාමීවූ සිද්ධාර්ථකුමාරයාණන් යම් දවසක මධ්‍යම රාත්‍රියෙහි බුදුබව ලැබීම පිණිස නික්මුනුසේක්ද, එදවස්හි මාගේ ජඩසාප්‍රදේශය ආස්ඵොටනයකොට, "කන්ථකය, මම සම්‍යක්සම්බොධියට පැමිණ දෙවියන් සහිතවූ සියලු ලොකවාසී සත්වයා සංසාර නැමති කාන්තාරයෙන් එතර කිරීම පිණිස යන්ට නික්මුණෙමි, එබැවින් වහා යාමට සිතට ගතයුතුය"යි කී කල්හි මම මහත් සතුටට පැමිණ ඔද වැඩියාවූ සිත් ඇතිව ඒ වචනය පිළිගත්තෙමි. එසේ පිළිගෙන මහත් යසස් ඇත්තාවූ ශාක්‍ය පුත්‍රවූ පුරුෂොත්තමයා මාගේ පිටට නැඟුණුකල්හි ඔද වැඩියාවූ සිත් ඇති මම උන්වහන්සේ ගෙන ගියෙමි. හිරු නැඟුණු කල්හි, නෙරඤ්ජරානම් ගංතෙරින් එතර පිට නුවරකට පැමිණ ඡන්න නම් ඇමතියා හා මාද අත්හැර අප කෙරෙහි කිසිම අපෙක්ෂාමාත්‍රයකුදු නැතිව ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේය. පැවිදි බවට පැමිණියාවූ උන්වහන්සේගේ දෙතිස් මහා පුරිස් ලකුණු ආදිය බලමින් ඒ මහා පුරුෂොත්තමයා අත්හැර හඬ හඬා ඡන්නාමාත්‍යයා හා සමග සිටියාවූ මම ඒ ශ්‍රීමත්වූ ශාක්‍ය පුත්‍රයාණන් වහන්සේගේ දර්ශනපථය ඉක්මුණු කල්හි උන්වහන්සේ නොදැකීමෙන් හටගත්තාවූ ප්‍රිය විප්‍රයෝග දුඃඛය කරණකොටගෙන ඉවසිය නොහැකි මහත් ආබාධයෙන් වහා මරණයට පැමිණියෙමි. බුදුබව ලැබීම පිණිස නික්මුණාවූ උන්වහන්සේ විසින් කියනලද ඒ සම්‍යක් සම්බොධි යන වචනය මෙනෙහිකිරීමෙන් කරනලද නිරාමිස වූ පුණ්‍යානුභාවය කරණකොටගෙන ඒ මරණින් මත්තෙහි සියලු කාමගුණයෙන් යුක්තවූ ශක්‍ර දිව්‍යරාජයා මෙන් තව්තිසා දෙව්ලොව උදාර වූ දිව්‍ය ශ්‍රී සම්පත්තියෙන් යුක්තව කන්ථක නම් දිව්‍ය රාජන්ව උපන්මි. ස්වාමින්වහන්ස, සම්‍යක් සම්බොධි යන ශබ්ද මාත්‍රයාගේ ශ්‍රවණයෙන් ප්‍රීති ප්‍රමොද්‍යයට පැමිණීම කරණකොටගෙන මේ සා දිව්‍ය ශ්‍රී සම්පත්තියට පැමිණියෙමි. එමෙන්ම ඒ සම්මා සම්බොධි යන වචනයාගේ ශ්‍රවණමය ප්‍රීතියම ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් ලැබෙන නිර්වාණ ධර්මය ලැබීමටද මහොපකාර වන්නේය. එබැවින් ස්වාමීනී, මුගලන් මහ තෙරුන් වහන්ස, මමද තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්මය වන්දනාකිරීමට යන්නෙමි. ඊට පළමුව නුඹවහන්සේ වැඩ වදරනසේක් වී නම් මා විසින් සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද වන්දය වන්දනා කළ බව

සැළකරන සේක්ව'යි යාච්ඤා කෙළේය. මුගලන් මහතෙරුන්වහන්සේද මිනිස්ලොවට වැඩ තථාගතයන් වහන්සේට එපවත් සැලකෙළෝය. කත්ථක නම් දිව්‍යරාජ තෙමේද කී පරිද්දෙන් කෙළෙහිගුණ සැලකීම් වශයෙන් බුදුරජාණන් වහන්සේ කරා පැමිණ වැඳ එකත්පසෙක්හි සිටියේය. එකල්හි බුදුරජානන් වහන්සේ කත්ථක දිව්‍යරාජයා ඇතුළු පිරිසට ධර්මදේශනා කළසේක. ඒ ධර්මදෙශනාවශානයෙහි ඒ දිව්‍යරාජයා ඇතුළුවූ බොහෝදෙන සෝවාන් ආදි මාර්ගඵලයට පැමිණීමෙන් නිර්වාණ සම්පත්තිය අවබොධකර ගත්තෝය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි
**සත්වැනි කත්ථක විමාන වස්තු වර්ණනාව**
කියා නිමවනලදි.

## 82. අනේක වණ්ණ විමාන වස්තුව.

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි අටවැනි වූ අනෙක වණ්ණ විමාන වස්තුව නම් කවරැයත්:-

සකල ගුණ නිධානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක් දවසක් ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේයට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් තවුතිසා භවනයට වැඩිසේක. එකල්හි අනෙකවර්ණ නම් වූ එක්තරා දිව්‍යපුත්‍රයෙක් තෙරුන් වහන්සේ දැක සතුටුව බලවත්ව හටගත්තාවූ ගෞරව බහුමාන ඇතිව තෙරුන්වහන්සේ කරා එළඹ නමස්කාරකොට එකත්පස්ව සිටියේය. එකල්හි මහතෙරහු ඒ දිව්‍යපුත්‍රයා දැක ඔහු විසින් පූර්වජාතියෙහි කරනලද කුශලකර්මය විචාරනු කැමැතිව ඒ දිව්‍යපුත්‍රයා අතින් මෙසේ විචාළසේක.

"අනෙකවණ්ණං දරසොකනාසනං
විමානමාරුය්හ අනෙක චිත්තං,
පරිවාරිතො අච්ඡරාසංගණෙන
සුනිවිට්ඨො භූතපතීව මොදසි,
සමස්සමො නත්ථි කුතො පනුත්තරො,
යසෙන පුඤ්ඤෙන ච ඉද්ධියාච:
සබ්බෙ ච දෙවා තිදස ගණා සමෙච්ච
තං තං නමස්සන්ති සසිංච දෙව"-පෙ-

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, නීලපීතාදි වශයෙන් නොයෙක් වර්ණයෙන් බබලන්නවූ තාගේ රූපශ්‍රී සෞන්දර්‍ය්‍යය දුටු කෙණෙහිම සිත්ශොක පරිලාහය ග්‍රීෂ්මකාලයෙහි පැන් වත්කල ශරීරීය සිහිල්වන්නාසේ දුරුවන්නේය. අනෙකප්‍රකාර විසිතුරු කර්මාන්තයෙන් නිර්මිතවූ විමානාරූඪව දිව්‍යසමූහයා විසින් පිරිවරන ලදුව සුනිර්මිත දිව්‍යරාජලීලාවෙන් දීප්තිමත්ව බබලන්නෙහිය. පරිවාරසම්පත්තියෙන්ද ආනුභවයෙන්ද ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙන්ද යන සියල්ලෙන්ම තෝ අග්‍රවන්නෙහිය. යම් සේ පුරපෑළවිය දිනයෙහි පෙනෙන්නාවූ චන්‍ද්‍රයාට සියලු මනුෂ්‍යයෝ මුළු මුළුව වඳිද්ද එමෙන් තවුතිසා වැසි දෙවතාවෝ තට වඳිති; පූජාසත්කාර කෙරෙති. මෙසේ අග්‍රබවට පැමිණෙන්නට තා විසින් කරනලද කුශලකර්මය කවරේදැ?"යි විචාළසේක. මෙසේ තෙරුන් වහන්සේ විසින් විචාරනලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"අහං භදන්තෙ අහුවාසි පුබ්බෙ
සුමෙධනාමස්ස ජිනස්ස සාවකො,
පුථුජ්ජනො අනවබොධො හමස්මිං
සො සත්තවස්සානි පරිබ්බජිස්සහං.
ස්වාං සුමෙධස්ස ජිනස්ස සත්ථුනො
පරිනිබ්බුතස්සොඝ තිණ්ණස්ස තාදිනො,
රතනුච්චයං හෙමජාලෙන ඡන්නං
වන්දිත්වා ථූපස්මිං මනං පසාදයිං"

යනුහෙයින්, "මේ මහාභද්‍රකල්පයට තිස්දහසක් වන කපින්යට බුදුවූ සුමෙධනම් බුදුරජාණන් ලොකයෙහි පැතිර පවත්නා මොහාන්ධකාර විධ්වංශනයකොට ලොව එකාලොක කෙරෙමින් විනෙය ජනයන් සසර සයුරෙන් එතරකොට සියලු බුඩකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පා වදාළ කල්හි මනුෂ්‍යයෝ බුදුන්ගේ ධාතු පිහිටුවා දගැබ් කොට පූජාසත්කාර කෙරෙති. එසමයෙහි එක්තරා පුරුෂයෙක් ශාසනයෙහි පැවිදිව සත්අවුරුද්දක් මුලුල්ලෙහි බ්‍රහමචර්‍ය්‍යාව රක්‍ෂාකොට මාර්ගඵල වශයෙන් නිශ්චලව හිත නොපිහිටි බැවින්, මේ ජාතියෙහි අධිගමනයකට පැමිණිය නොහැක්කේය"යි කුකුස්ඇතිව සිවුරු හැර ගිහිවිය. එතකුදු වුවත් ශ්‍රඩා ප්‍රඥා ඇතිහෙයින් සංවෙග බහුලව කර්මඵල අදහමින් දගැබ් මළුව හමදිමින් සුවඳ ගඳ පිරිබඩලමින් නිත්‍ය පඤ්චශීලය රකිමින් පොහොය පෙහෙවස් වෙසෙමින් බණ අසමින් අනෙකුදු බොහෝ කුශල් කෙරෙමින් සුචරිතකර්මයෙහි හැසුරුණේය. ඒ කුශලකර්මය හෙතුකොටගෙන ආයුකෙළවර එයින් ගොස් තවුතිසා දෙව්ලොව ඉපිද

උදරතරවූ කුශල් ඇතිව මහානුභාව ඇති හෙයින් ශක්‍රයා ප්‍රධානකොට ඇති දෙවතාවන් විසින් කරණලද පූජාසත්කාර ඇතිව එහි ආයුපමණින් සිට දිවඉසුරු විඳ එයින් චුතව නැවත නැවතත් දිව්‍ය සම්පත් විඳිමින් චුතිප්‍රතිසන්ධි වශයෙන් සසර සැරි සරන්නේ තිස්දහසක් කප් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභවකොට ශෙෂව තුබූ එම කුශලකර්ම විපාකයෙන් මේ බුඩොත්පාද කාලයෙහි අනෙක වර්ණ දිව්‍යපුත්‍රයයි ප්‍රසිඩව මහත්වූ දිව්‍ය සම්පත් අනුභවකරන්නාවූ දිව්‍යපුත්‍රයා දැක මහතෙරහු විචාළ පැණය විසඳන්නේ "සවාමීනී, මම සුමෙධ නම් බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව සත් හවුරුද්දක් බ්‍රහ්මචර්‍ය්‍යාව රක්‍ෂාකොට උත්තම ආර්‍ය්‍ය මාර්ගයෙන් ගොස් පැමිණියයුතුවූ අධිගමවශයෙන් මාර්ග ඵලයක් උපදවා ගත නුහුනුයෙමි, "මේ ජාතියෙහි අධිගමයකට පැමිණිය නොහැක්කේයයි කුකුස් උපදවා කලකිරුණාවූ සිත් ඇතිව සිවුරු හැර උපාසක ධර්මයෙහි පිහිටා බුදුන්ගේ ධාතු පිහිටුවා මත්තෙහි රන්දැල් වසා තබන ලද සත්රුවන් දගැබට ගඳදුම් මල් පහන් ආදියෙන් පූජාසත්කාරකොට දගැබ් මළුව හැමද අනෙකුදු බොහෝ කුසල් කෙරෙමින් අනුන්ට බණ කියා අවවාදකොට, මේ ධාතුපූජාව කරව, දන්දෙව, සිල් රක්‍ෂාකරව, යනාදීන් කුශල් අකුශල් හඟවා බොහෝ සේ අනුන් ලවාත් කුශල් කරවා ආත්මාර්ථ පරාර්ථවශයෙන් බොහෝ කුශල් රැස්කොට මේ දෙව්ලොව ඉපිද මේ දිව්‍ය සමූහයා මැද ශරීරාලෝකයෙන් දීප්තිමත්ව බබළමි" කියා කුශලකර්මය ප්‍රකාශකොට කීයේය. එකල්හි මහතෙරුන් වහන්සේ පිරිවර දිව්‍යපුත්‍රයාට විස්තර වශයෙන් බණවදරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් කීසේක. බුදුරජාණෝ එම අර්ථොත්පත්තිකොට ගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට විස්තර වශයෙන් බණ වදළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාර්ථක විය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනි වූ සුනික්ඛිත්ත වර්ගයෙහි
**අටවැනි වූ අනෙකවර්ණ විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී

## 83. මට්ට කුණ්ඩලී විමාන වස්තුව

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනිවූ සුනික්ඛිත්ත වර්ගයෙහි නවවැනි වූ මට්ටකුණ්ඩලී විමාන වස්තුව නම් කවරයත්:-

ලොකාග්‍රවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර

ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත්නුවර වසන්නාවූ ගවධන රත්නාදියෙන් ආඪ්‍යවූ ලොභසිත් ඇත්තාවූ එක්තරා මිථ්‍යාදෘෂ්ටි බ්‍රාහ්මණයෙකුගේ මට්ටකුණ්ඩලී නම්වූ කුමාරයෙක් ඇත්තේය. එ කුමාරයාහට බලවත්වූ ලෙඩක් හටගත්තේය. ඒ බමුණා වස්තු වියදම්වෙයි සිතා වස්තුලෝභයෙන් වෙදකම් නොකරවා තදවූ බව දැක ඇතුලූගෙයි මළහොත් නිකුත්කිරීම් ආදියෙහි දුෂ්කරතා සිතා ගෙයින් පිටත්කරවා වාරකොෂ්ඨයෙහි සයනය කරවිය. එකල්හි බුදුරජාණන් වහන්සේ අළුයම් වේලෙහි ලොවබලා වදරණසේක් ඒ කුමාරයා කාලක්‍රියාකොට නරකයෙහි උපදනා අකුසල් ඇතිබව දැක, අද මා එතැන්හි ගියෙම් වීනම් ඒ කුමාරයා මා දැක පැහැද ඒ කුශලයෙන්ම දිව්‍යලොකයෙහි ඉපිද සොහොනෙහි හඬන්නාවූ පිය බමුණා කරා අවුත් කුශල් අකුශල් දක්වා සංවෙග උපදවන්නේය. එකල්හි ඔහු මා කරා එන්නේය. එතැන්හි මහත් සමාගමයෙක් වෙයි. ඒ සමාගයෙහි මා විසින් ධර්මදෙශනාකළ කල්හි බොහෝ සත්වයෝ නිවන් දක්නාහුය'යි සිතා වදරා මහසඟ පිරිවරා සැවැත්නුවරට පිඩු සිඟා වැඩ මට්ටකුණ්ඩලියාගේ පියබමුණාගේ ගේදෙර සමීපයෙහි වැඩසිට සවනක් බුදුරැස් හැර වදළසේක ඒ දැක ඒ කුමාරතෙම එසේ මෙසේ බලන්නේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණ බ්‍යාමප්‍රභාකෙතුමාලා ලඞ්කාරයෙන්බබලමින් වැඩ සිටි බුදුන් දැක සතුටු සිත් ඇතිව බුඩාලම්බන ප්‍රීති උපදවා අත්දෙක එක්කොට වැඳගෙන නැඟී සිටීමට අසමර්ථ හෙයින් එතැන්හි සයනය කෙළේය. බුදුරජාණන් වහන්සේ, 'මෝහට මෙපමණක් ම සෑහෙයි, සිතා වැඩිසේක. ඒ කුමාරයා කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන්විමනෙක ඉපිද, මේ දිවඉසුරු ලැබීමට කාරණා කවරේද?යි පරීක්ෂාකරන්නේ ඒ සියලූම පවත් දැක නැවත ඔහුගේ පියවූ අදින්නපුබ්බක නම් බමුණා සොහොනෙහි ඉඳ හඬන්නා දැක, කුසල් දක්වා මොහු වැඩෙහි පිහිටුවහොත් ඉතා යෙහෙකැයි සිතා මිනිස්ලොවට අවුත් සොහොනෙහි හඬන්නාවූ බමුණා ඉදිරියෙහි මට්ටකුණ්ඩලී වේශයෙන් හඬමින් සිටියේය. බ්‍රාහ්මණයා ඔහු දැක, 'කුමක් නිසා හඬාදැ?'යි විචාළේය. එකල්හි මානවකයා කියන්නේ, 'ප්‍රභාසම්පන්නවූ සවර්ණමය රථපඤ්ජරයෙක් මට උපන්නේය. ඒ රථයට චක්‍ර දෙකක් නොලැබ ඒ දුකින් හඬමි, ජීවිතයෙනුත් කම් නැතැයි කීය. සවර්ණමය හෝ මාණික්‍යමය හෝ රථ චක්‍ර දෙකක් මම සපයා දෙමි, නොහඬව'යි පියතෙම කීය. එකල්හි මානවකයා කියන්නේ, 'එසේ වී නම් මේ පෙනෙන්නාවූ චන්ද්‍ර සූර්‍ය දෙදෙන රථචක්‍ර පිණිස දෙව'යි කීය. එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ 'එම්බා බාලවූ මානවකය නොලැබිය

හැකි දෙය පැතීමෙන් ප්‍රයෝජන නැතැයි කීය. එකල්හි මානවකයා කියන්නේ "එසේවීනම් මේ පෙණෙන්නාවූ හිරු සඳ දෙදෙනා නොලැබේනම් තාගේ හැඬීමෙන් මියපරලොව ගිය කුමාරයා කෙසේ ලැබේදැ?"යි කියා සොක සන්සිඳුවා දිව්‍යලොකයෙහි සිට ආබවත් තමන් ඔහුගේ පුත්‍රයා බවත් බුදුන් දැක පැහැද දිව්‍යලොකයෙහි උපන් බවත් කියා අවවාදකොට සරණ සීලයෙහි පිහිටුවා බුදුන් සමීපයට යැවූහ. එදවස් බුදුන්කරා යන්නාවූ අදින්නපුබ්බක නම් බමුණා දැක, අද පුතු මළ සොකයෙන් බුදුන්කරා යන්නේය. මේ බමුණා නිසා අද මහත්ධර්මදෙශනා වන්නේය"යි කියා බොහෝ දෙනා රැස්ව මහත් සමාගමයෙක් විය. ඒ මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාද විමානය හා සමග බුදුන් දකින්නට ආයේය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔහුගේ අදහස් බලා චතුස්සත්‍යය ප්‍රකාශ කොට බණ වදළසේක. ඒ දෙශනා කෙළවර ඒ දිව්‍යපුත්‍රයා හා ඇතුළුවූ සුවාසූදහසක් ප්‍රාණීහු අමාමහනිවන් දුටුවාහුය. මේ කථාප්‍රවෘත්තිය රත්නාවලියෙහි විස්තරවශයෙන් ප්‍රකාශවිය. එබැවින් මෙතැන්හි සංක්ෂෙපවිය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනිවූ සුනික්ඛිත්ත වර්ගයෙහි
**නවවන මට්ටකුණ්ඩලී විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

## 84. සෙරිස්සක විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි දසවන සෙරිස්සක විමාන වස්තුව නම් කවරැයත්:-

සර්වධර්මයන් සර්වාකාරයෙන් දත්තාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සියලු බුඞකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පා වදළ කල්හි ආයුෂ්මත්වූ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියයක් සංඝයා පිරිවරා සෙතව්‍ය නුවරට පැමිණ සිංසපා වනයෙහි වැඩ වසන සේක. එසමයෙහි තමන් වහන්සේ සමීපයට පැමිණියාවූ පායාසි රාජඤ්ඤ නම් බ්‍රාහ්මණයා පරලොව නැත, කුශල් නැත, අකුශල්නැතැයි කියා ගන්නාලද විපරිත දෘෂ්ටියෙන් මුදා සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටුවූසේක. ඒ බ්‍රාහ්මණ තෙම එතැන් පටන් කුශල් රැස්කිරීමෙහි ව්‍යාවෘතව දන් දෙන්නේ දන්දීමෙන් පුරුදුකමක් නැති හෙයින් දමාපියන දෙයක් මෙන් සකස්නොකොට දන් දී එයින් චුතව චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි ශූන්‍යවූ සෙරිස්සක නම් රිදී විමානයක හුදකළාව උපන්නේය. ඒ

සෙරිස්සක විමානය නම් කාශ්‍යප බුදුන් ගේ සමයෙහි කොළමඩුවක් කොට පූජාකළාවූ පුරුෂයෙකුට පහළවිය. හේ කෙසේද යත්:- යටගිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි එක්තරා රහත් කෙනෙකුන්වහන්සේ එක්තරා ගමෙක පිඬු සිඟාගෙන ගමින් පිටත එක්තරා භූමි ප්‍රදේශයක වැඩ හිඳ දවස්පතා ආහාර වළඳන සේක. ඒ තෙරුන් වහන්සේ දැක එක්තරා ගවපාලයෙක් සිතන්නේ, "මේ ස්වාමීන් වහන්සේ සූර්යතාපයෙන් ක්ලාන්තවන සේක, මෙතැන්හිම මණ්ඩපයක් කෙළෙම් නම් ඉතා යෙහෙකැ"යි සිතා සතුටු සිත් ඇතිව මහරිදඬු සතරක් සිටුවා ශාඛා මණ්ඩපයක් කොට දුන්නේය. ඒ මණ්ඩපය සමීපයෙහි සෙවන පිණිස මහරි ගසකුදු රෝපණය කළේය. ඒ පුරුෂතෙම එයින් අපරභාගයෙහි කාලක්‍රියා කොට ඒ කුශලකර්මය හෙතුකොටගෙන චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි උපන්නේය. ඔහුගේ විමන් දෙර පූර්වයෙහි කරණලද කුශල කර්මය ප්‍රකාශකරණ පිණිස කර්මසාදෘශ්‍ය වශයෙන් වර්ණ ගන්ධ සම්පන්නවූ මලින් අලඞකෘත වූ මහරි වනයෙක් පහළවිය. එබැවින් ඒ විමානය සෙරිසසක නම් විය. ඒ දිව්‍යපුත්‍රතෙම එතැන්පටන් බුඩාන්තරයක් මුළුල්ලෙහි සුගතියෙහිම සැරිසරන්නේ මේ බුඩොත්පාදයෙහි දෙව්ලොවින් චුතව මිනිස්ලොව ඉපිද ආයුෂ්මත්වූ යස මහ තෙරුන් වහන්සේගේ විමලාදී ගිහි යහළුවන් සිව්පනස්දෙනා අතුරෙන් ගවම්පතී නම් යහළුව බුදුන්ගෙන් බණ අසා රහත් ඵලයෙහි පිහිටිසේක. පූර්වවාසනා වශයෙන් ජන සුන්‍යවූ ඒ සෙරිස්සක නම් විමානය දැක නිරන්තරයෙන් දිවාවිහරණය පිණිස වඩනා සේක. අපරභාගයෙහි ඒ විමානයෙහි පායාසි දිව්‍ය පුත්‍රයා දැක, "ඇවැත්නි, තෝ කවරෙක්දැ?"යි විචාරා ඔහු විසින් "ස්වාමීනි, සෙතව්‍ය නුවර පායාසි රාජඤ්ඤ බ්‍රාහමණයා නම් මමය. මේ විමානයෙහි උපන්මි"යි කී කල, "කිමෙක්ද? තෝ මිථ්‍යාදෘෂ්ටි ගෙන වරදවා හැසිරෙන ලද්දෙහි වේද? කවර හෙයකින් මෙහි උපන්නෙහිදැ?"යි විචාළසේක. එකල්හි ඒ දිව්‍ය පුත්‍රතෙම කියන්නේ, "ස්වාමීනි, කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදන ලද්දවූ මම සකස්නොකොට කුශල් කළ බැවින් සුන්‍යවූ මේ දිව්‍ය විමානයෙහි හුදකළාවඋපන්මි. ස්වාමීනි, මිනිස්ලොවට වැඩිය කල මාගේ පිරිවර ජනයාට මෙසේ වදාළ මැනව. පායාසි රාජඤ්ඤ බ්‍රාහමණයා සකස්කොට ප්‍රණීතදේ දන් නොදී ස්වල්පදේ දන් දී හිස්වූ සෙරිස්සක විමානයෙහි උපන්නේය. තොපි සකස්කොට කුශල් කෙරෙමින් ඔහු සමීපයෙහි උපදනා පිණිස ප්‍රාර්ථනා කරවයි කියා වදාළ මැනවි"යි කීය. තෙරුන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් එසේ වදාළසේක. ඒ පිරිවර ජනයෝද තෙරුන් වහන්සේගේ වචනය අසා එසේම ප්‍රාර්ථනා කෙරෙමින් කුශල්

කොට ඒ සෙරිස්සක විමානයෙහි උපන්නාහුය. නැවත යම්කිසි රුක් සෙවනෙක් හෝ වතුර බින්දුවක් හෝ නැත්තාවූ වාළුකා කාන්තාර භූමියෙහි මාර්ගයට පැමිණියාවූ මිනිසුන්ට යක්ෂයන් නිසා වන උවදුරු නසන පිණිස වෙසමුණි රජ්ජුරුවෝ සෙරිස්සක නම් දිව්‍යපුත්‍රයා මාර්ගාරක්ෂාවට සිටුවූහ. ඉක්බිති එයින් අපරභාගයෙහි අඟු, මගධ දෙරටවාසී වූ වෙළඳ ගණනක් ගැල්වල බඩු පුරාගෙන සින්ධුසෝවීර දේශයට යන්නාහු වාළුකා කාන්තාරයට පැමිණ උෂ්ණ භයින් දවල් නොගොස් රාත්‍රියෙහි නකත්තරු බලා මගට යන්නාහු මංමුළාව අනෙක් දිශාවකට ගියා හුය. ඔවුන් අතුරෙන් ශ්‍රද්ධා ශීල සම්පන්නවූ එම ජාතියෙහි රහත්වීමට හේතු සම්පත් ඇත්තාවූ උපාසකයෙක් ඇත්තේය. ඔහු මව්පියන් රක්නා පිණිස ධන සොයා වෙළඳුන් හා සමග ගියේය. එකල්හි ඒ සෙරිස්සක නම් දිව්‍යපුත්‍ර තෙම ඒ උපාසකයාට අනුග්‍රහ කෙරෙමින් විමානය හා සමග තමා දැක්විය. එසේ "පැනක් සෙවනක් නැත්තාවූ මේ කාන්තාරයට තොප කුමක් පිණිස අවුදැ?"යි කියා දිව්‍යපුත්‍රයා විසින් විචාරණ ලද ඒ වෙළඳහු තමන් ආ පවත් කීවාහුය, ඒ දිව්‍යපුත්‍රයාගේ හා වෙළඳුන්ගේ කථා ප්‍රවෘත්තිය දක්වන්නාවූ සඞ්ගීතිකාරක මහා ස්ථවිරයන් විසින්,

"සුණොථ යක්ඛස්ස ච වාණිජාන ච
සමාගමො යත්ථ තදා අහොසි,
යථා කථං ඉතරිතරේනවාපි
සුභාසිතං තඤ්ච සුණොථ සබ්බෙ
යො සො අහු රාජා පායාසි නාමො
භුම්මානං සහව්‍යගතො යසස්සී,
සො මොදමානොව සකෙ විමානෙ
අමානුසො මානුසෙ අජ්ඣභාසී" ති.

යනු හෙයින්, වෙසමුණි රජ්ජුරුවන්ගේ පරිවාරිකවූ සෙරිස්සක නම් දිව්‍යපුත්‍රයාගේ ද වෙළඳුන්ගේද යම් වාළුකා කාන්තාරභූමියකදී එක්වීමෙක් විද එතැන්හිදි ඔවුනොවුන් විසින් කරණලද යම් කථා ප්‍රවෘත්තියෙක් ඇද්ද ඒ සියල්ලම ප්‍රකාශකොට දක්වම්හ. එම්බා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෙනි, තොපි සියල්ලෝම එපවත් කන් නමා අසව්. සෙතව්‍ය නුවර පායාසි රාජඤ්ඤ නම් යම් බ්‍රාහ්මණයෙක් ඇද්ද ඒ බ්‍රාහ්මණ තෙම භුමාටු දෙවියන් හා සමගිව උපන්නේය. ඒ සෙරිස්සක නම් දිව්‍යපුත්‍ර තෙම පිරිවර දෙවතාවන් හා සමග සතුටුව පඤ්චකාම සම්පත් අනුභව කෙරෙමින් තමාගේ විමානයෙහි සිට වෙළඳුන් දැක මෙසේ කීයේය.

"වඞ්කෙ අරඤ්ඤෙ අමනුස්සට්ඨානෙ
කන්තාරෙ අප්පොදකෙ අප්පභක්ඛෙ,
සුදුග්ගමෙ වණ්ණුපථස්සමජ්ඣෙ
වඞ්කං භයා නට්ඨමනා මනුස්සා,
නයිධ ඵලා මූලමයා ච සන්ති
උපාදනං නත්ථි කුතො ඉධ භක්ඛො,
අඤ්ඤත්‍ර පංසූහි ච වාලුකාහි ච
තත්තාහි උණ්හාහි ච දරුණාහි ච.
උජ්ජඞ්ගලං තත්තමිවං කපාලං
අනායසං පරලොකෙන තුල්‍යං,
ලුද්දන මාවාසමිදං පුරාණං
භූමිප්පදෙසො අභිසත්තරූපො.
අථ තුම්හෙ කෙන වණ්ණෙන
කිමාසමානා ඉමං පදෙසංහි,
අනුප්පවිට්ඨා සහසා සමෙච්ච
ලොභා භයා අථවා සම්පමූළ්හා"ති.

යනු හෙයින් "එම්බා පින්වත් මනුෂ්‍යයෙනි. මේ කාන්තාරයට පැමිණි මිනිසුන්ට අපගේ ජීවිතය ඇතිවේද නැතිවේද අපට මරණ පැමිණේද දිවි රැකගෙන යන්ට හැකිවේද"යි කියා සැක උපදවන්නාවූ නිරන්තරයෙන් යක්ෂ පිසාවාදී අමනුෂ්‍යයන් හැසිරෙන්නාවූ සුවසේ යා නොහැකි හෙයින්ද කන බොන දෙයක් නැති හෙයින්ද පැන් ගෙනයායුතු හෙයින්ද මිනිසුන්ට ගෝචර නොවන්නාවූ වැදීමට පළමුවෙන්ම මිනිසුන්ට භය උපදවන්නාවූ මේ වාළුකා කාන්තාරය මැද අඹ දඹ කෙහෙල් පොල් ආදී කෑයුතු ඵල ජාතියකුත් නැත්තේය. ක්‍ෂාරවූ උණු වැලිත් පසුත් හැර යටත් පිරිසෙයින් ගිනි එලවන දර පමණකුත් නැත්තේය එබැවින් කෑයුතු ආහාරයෙක් නම් කෙසේ ඇති වේද ඒකාන්තයෙන්ම නැත්තේය. මදක් පඩුවන් රූක්ෂවූ තද පස් ඇත්තාවූ රත්වූ කබලක් වැනිවූ සත්‍වයන්ට භය එලවනහෙයින්ද අමනුෂ්‍ය සතුරන්ගෙන් ගැවසී ගත් හෙයින්ද කිසි සැපතක් පිහිටක් නැති හෙයින්ද නරකයක් වැනි වූ පුරාතන පටන් බොහෝ කාලයක් මුළුල්ලෙහි යකුන්ටම වාසස්ථානවූ මේ භූමි ප්‍රදේශයට තෙපි කවර කාරණයක් නිසා ආවාහුද? කවර වස්තුවක් පතා ආවාහුද? තොපගේ සතුරු කෙනෙකුන් විසින් අනර්ථයක් කරනු කැමතිව රටින් නගා හරනලද්දහුද? නොහොත් මංමුළාව ආවාහුදැ?"යි විචාළේය. එබස් අසා වෙළඳහු මෙසේ කීවාහුය.

"මගධෙසු අඞ්ගසු ච සත්ථවාහා
ආරොපයිස්සං පණියං පුථුත්තං
තෙ යාමසෙ සින්ධුසොවීර භූමිං
ධනත්ථිකා උද්දයං පත්ථායානා.
දිවා පිපාසං අනධි වාසයන්තා
යොග්ගානුකම්පඤ්ච සමෙක්ඛමානා,
එතෙන වෙගෙන ආයාම සබ්බෙ
රත්තිං මග්ගං පටිපන්නා විකාලෙ.
තෙ දුප්පයාතා අපරද්ධ මග්ගා
අන්ධකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ,
සුදු ග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ
දිසං න ජානාම පමුළ්හචිත්තා
ඉදඤ්ච දිස්වාන අදිට්ඨ පුබ්බං
විමානසෙට්ඨඤ්ච තවඤ්ච යක්ඛ,
තතුත්තරිං ජීවිතමාසමාන
දිස්වා පතීතා සුමනා උදග්ගා"ති.

යනු හෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, අඟු මගධ දෙරට වැඩුනාවූ සාත්ථවාහකයෝ වම්හ. ගැල්වල බොහෝ බඩු පුරාගෙන වැඩි ලාභ උපදවම්හයි සිතා වස්තු ලොභයෙන් සින්ධු සොවීර දෙශයට වෙළඳම් පිණිස යම්හ. නුඹවහන්සේ දක්නට පළමුවෙන් උෂ්ණබලවත් හෙයින් ග්‍රීෂ්ම ඉවසිය නොහී ගොන්ට හා මිනිසුන්ට එාසු පිණිස අනුකම්පාවෙන් දහවල් එක්තෙනක ලැගුම් ගෙන සිට අපි සියල්ලම රාත්‍රියෙහි මාර්ගයට පැමිණියම්හ. අවේලාවේ ගමන යහපත් ගමනක් නොවෙයි. එබැවින් ඒ වරදඅපටම පැමිණියේම යක්‍ෂාධිගෘහිත වාළුකා කාන්තාරය මැද මඟ දැනගත නොහී විනාශ මුඛයට පැමිණියම්හ. මෙයින් මතු අපට අපගේ දිවි නැතිවෙයි කියා සිතට සැක උපන්නේය. එම්බා දිව්‍යපුත්‍රය, අපි විසින් පෙර දක්නා ලද මේ දිව්‍යප්‍රාසාදය හා නුඹවහන්සේගේ යම් මේ දැකීමෙක් ඇද්ද ඒ දැකීම හෙතුකොට ගෙන ප්‍රීතියෙන් උදග්‍රතවූ සිත් ඇත්තම්හයි. මෙතැන් පටන් දිවි ලබම්හයි සිතා නුඹවහනසේ දැක සතුටුවම්හ කීවාහුය. මෙසේ සියලු ප්‍රවෘත්තිය කී කල්හි නැවත දිව්‍යපුත්‍ර තෙම මේ ගාථා දෙකින් මෙසේ විචාළේය.

"පාරං සමුද්දස්ස ඉදඤ්ච වණ්ණුං
වෙත්තාචරං සඞ්කුපථඤ්ච මග්ගං,

නදියො පනපබ්බතානඤ්ච දුග්ගා
පුථුද්දිසා ගච්ඡථ භොගහෙතු
පක්ඛන්දියාන විජිතං පරෙසං
වෙරජ්ජකෙ මානුසෙ පෙක්ඛමානා,
යං වො සුතං වා අථවාපි දිට්ඨං
අච්ඡෙරකං තං වො සුණොම තාතා"ති.

යනුහෙයින්, ඒ දිව්‍යපුත්‍රතෙම තමාගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් ඒ වෙළඳුන් ලවා ප්‍රකාශ කරවනු කැමතිව කියන්නේ, එම්බා පින්වත්නි, මේ වෙළඳම්කරණ මිනිසුන් බලා වස්තු සොයාගන්නා වූ තොපි මහා සමුද්‍රයෙන් එතරද, මෙැනි වාලුකා කාන්තාර වලද, වේවල් බැඳ අල්වා යායුතු මාර්‍ගවලද කණු සිටුවා යායුතු සංකුපථයයි කියනලද මාර්‍ගවල ද ගංගා පර්‍වතාදී විෂම භූමිවලද වස්තු නිසා නොයෙක් දිග ඇවිදිනාහුය. පැනගෙන යායුතුවූ භූමිභාග ඇති නොයෙක් රජුන්ගේ රාජ්‍යවල.නා නා දෙශවාසී වූ වෙළඳුන් දක්නාවූ තොපි වස්තු නිසා ඇවිදිනාහුය. එසේ යන්නාවූ තොප විසින් දක්නාලද හෝ අසනලද හෝ ආශ්චර්‍ය්‍ය අද්භූත වූ යමක් ඇත්නම් ඒ සියල්ලම මට නොවලහාම කියව යි කීයේය. මෙසේ ඒ දිව්‍යපුත්‍රයා විසින් විචාරණ ලද ඒ වෙළඳහු මෙසේ කීවාහුය.

"ඉතොපි අච්ඡෙරතරං කුමාර
න නො සුතං වා අථවාපි දිට්ඨං,
අතීත මානුස්සකමෙව සබ්බං
දිස්වාන තප්පාම අනොමවණ්ණං,
වෙහාසයං පොක්ඛරඤ්ඤො සවන්ති
පහූතමල්‍යා බහුපුණ්ඩරීකා,
දුමා චිමෙ නිච්චඵලූපපන්නා
අතීව ගන්ධා සුරභිං පවායන්ති.
වෙළුරියථම්භා සතමුස්සිතාසෙ
සිලප්පවාළස්ස ච ආයාතංසා
මසාරගල්ලා සහ ලොහිතඞ්කා
ථම්භා ඉමෙ ජොතිරසාමයාසෙ.
සහස්සථම්භං අතුලානුභාවං
තෙසූපරි සාධුමිදං විමානං,
රතනන්තරං කඤ්චන වෙදිමිස්සං
තපනීයපට්ටෙහි ච සාධුඡන්නං.
දොචො නු ආසි උදචාසි යක්ඛො

උදතු දෙව්නෙ මනුස්සභූතො
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
ආචික්ඛ කො නාම තුවංසි යක්ඛා"ති.

යනුහෙයින්, "ප්‍රථම නව යෞවනයෙහි පිහිටියාවූ එම්බා දිව්‍ය කුමාරය, මානුසිකවූ ඉසුරු සමපත් ඉක්මගියාවූ නුඹවහන්සේගේ මේ ඓශ්වර්‍ය්‍ය සම්පත්තියට වඩා අප විසින් අසනලද හෝ ආශ්චර්‍ය්‍ය අද්භූත දෙයක් නැත්තේය. නුඹවහන්සේගේ අලාමක වූ උත්තම වර්ණ සම්පත්තිය හා විමාන සම්පත්තිය බලාතෘප්තියකට නොපැමිණෙම්හ. බොහෝ වූ සෙවතපද්ම රක්ත පද්මාදි නොයෙක් මලින් ගැවසීගත්තාවූ නිර්මලවූ සිහිල් ජලායන් පිරුනාවූ පොකුණු ආකාශයෙහි සන්දනය වන්නේය. මේ පොකුණු හා විමානය වට පිහිටියාවූ නිරන්තරයෙන් නොයෙක් පළපලලවයෙන් සැදුම් ලද්දවූ දිව්‍ය වෘක්ෂ පඞ්ක්තියෙන් යහපත්වූ සුරභි සුවඳ හමන්නේය. වෛඩූර්‍ය්‍ය මසාරගලල ලොහිතඞ්ක ශීලා ප්‍රවාලාදියෙන් නිර්මිතවූ අෂ්ටාංශ සොළෂාංශ වත්තිංසාංශවූ රැස් විහිදෙන්නාවූ දික්වූ ටැම් මත්තෙහි සොභාමත්වූ මේ ප්‍රාසාදය පිහිටියේය. සත්රුවනින් නිමියාවූ අසදසවූ දහසක් පමණ ටැම් හා හිකති සථමහ සොපාන මාලාවෙන් හෙබියාවූ සවර්ණමය වෙදිකාවෙන් යුක්තවූ මත්තෙහි රන්පටින් වසනලද්දවූ බොහෝසේම ජාම්බූනද සවර්ණයෙන් යහපත්කොට ඔප් නගන ලද විමානාවයවයන් ඇත්තාවූ තොපගේ මේ විමානය දවසක් මුළුල්ලෙහි බලාත් සිත් නොපිරෙන්නේය. මේ රන් මාලිගාව ඇතුලෙහි ඛාද්‍යභොජ්‍යාදී නොයෙක් දිව්‍යභොජන සද තිබෙන්නේය. දක්ෂවූ ගන්ධර්වයන් විසින් මිහිඟුබෙර පනාබෙර ආදී පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ඝොෂාවෙන් එකනින් නාදවෙයි. නොයෙක් දිව්‍යපුත්‍රයන් විසින් ස්තුති ගී කියා නමස්කාරකරණු ලබන්නෙ හිය. යම්සේ වෙසමුණු රජ්ජුරුවෝ නොයෙක් මලින් සැදුනාවූ නලිනි නම් පුෂ්කරණියෙහි නොයෙක් දෙවතාවන් පිරිවරණලදුව සතුටුව ක්‍රීඩාකෙරේද එමෙන් නුඹවහන්සේද නොයෙක් දිව්‍යාඞගනාවෙන් පිරිවරා මේ දිව්‍යප්‍රාසාදයෙහි ක්‍රීඩා වශයෙන් අචින්තෙය්‍ය අප්‍රමෙය්‍යවූ සමපත් අනුභවකරන සේක. කීමෙක්ද, නුඹ දෙවතා කෙනෙක්ද නොහොත් මේ කාන්තාරයෙහි වසනවණඩවූ යක්ෂයෙක්ද, නොහොත් දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍ර දෙවෙන්‍ද්‍රයාද, මිනිස්ජාති ඇති කෙනෙක්දැ?යි" කියා සැක ඇත්තම්හ. එම්බා දිව්‍යපුත්‍රය, නුඹවහන්සේ කවරෙක්දැ?"යි විචාළහ. එකල්හි ඒ වෙළඳුන් විසින් විචාරනලද දිව්‍යපුත්‍රතෙම තමාගේ ස්වභාවය දක්වන්නේ,

"සෙරිස්සකො නාම අහම්පි යක්ඛො
කන්තාරියො වණ්ණුපථම්හි ගුත්තො
ඉමං පදෙසං අභිපාලයාමි
වචනකරො වෙස්සවණ්ණස්ස රඤ්ඤො"ති.

යනුහෙයින්, "එම්බා පින්වත්වූ වෙළඳුනෙනි, මම මේ වාළුකා කාන්තාර භූමි ප්‍රදේශයෙහි නියුක්තවූ සෙරිස්සක නම් වූ වෙසමුණු රජ් ජුරුවන්ගේ පරිවාරිකාවූ දිව්‍ය පුත්‍රයෙක්වීමි. වෙසමුණු රජ්ජුරුවන්ගේ වචනයෙන් මේ භූමිප්‍රදේශය රක්‍ෂාකෙරෙමි"යි කීයේය. එබස් අසා මේ සම්පත් ලැබීමට කාරණා විචාරන්නාවූ සාර්ථවාහකයෝ මෙසේ විචාළාහුය.

"අධිච්චලද්ධං පරිනාම ජන්තෙ
සයං කතං උදහු දෙවෙහි දින්නං,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං මනුඤ්ඤං"ති.

යනුහෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, නුඹවහන්සේගේ මේ ඉසුරු සම්පත්තිය කිසි කාරණයක් නැතිව කැමති පරිද්දෙන් ලත් සැප තෙක්ද, නොහොත් කිසි කෙනකුන් විසින් කාලවශයෙන් පිරි නමනලද්දේද, නොහොත් නුඹගේ සෑඩි මහිමයෙන් නුඹ විසින් උපදවන ලද්දේද නොහොත් නුඹ විසින් ආරාධිතවූ දෙවිකෙනෙකුන් විසින් ප්‍රසාද වශයෙන් දෙනලද්දේදැ?"යි කියා මේ වෙළඳ සාර්ථවාහකයෝ විචාරන්නාහුය. නුඹවහන්සේ විසින් මේ විමාන සම්පත්තිය කෙසේ ලබනලද්දේදැ?"යි විචාළාහ. එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම මේ සතර කාරණයම ප්‍රතික්‍ෂෙපකොට කුශල කර්‍මය ප්‍රකාශකොට දක්වන්නේ,

"නාධිච්චලද්ධං නපරිණාමජං මෙ
න සයං කතං නහි දෙවෙහි දින්නං,
ස කෙහි කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං මනුඤ්ඤං"ති.

යනුහෙයින් "මාගේ මේ ඉසුරු සම්පත්තිය නිකරුනේ ලද්දේත් නොවෙයි. යම් කෙනෙකුන් විසින් පිරිනමන ලද්දේත් නෙවෙයි. මා විසින් උපදවන ලද්දේත් නොවෙයි. මහෙශාක්‍ය දෙවියකු විසින් දෙනලද්දේත් නොවෙයි. පූර්වජාතියෙහි කරන ලද කුශලකර්‍මයෙන් ලද්දේයයි කීය. එකල්හි වෙළෙන්දෝ කුශල කර්‍මය විචාරන්නාහු, එම්බා දිව්‍යපුත්‍රය නුඹ

විසින් පුරුදුකරණ ලද කවර ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවක් කවර ව්‍රත සමාදනයක් හෙතු කොටගෙන මේ විමානය ලද්දේදැ?යි කියා විචාළාහුය. නැවත ඒ දිව්‍යපුත්‍රතෙම තමා විසින් රැස්කරනලද කුශල කර්‍මය ප්‍රකාශ කොට දක්වන්නේ,

සමණො ච බො ආසි කුමාරකස්සපො
බහුස්සුතො චිත්තකථී උළාරො,
යො මෙ තද ධම්මකථං අකාසි
දිට්ඨිවිසූකානි විනොදයී මෙ.
තාහං තස්ස ධම්මකථං සුනිත්වා
උපාසකත්තං පටිවෙදයිස්සං,
පාණාතිපාතා විරතො අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං.
අමජ්ජපො නො ච මුසා අභාණිං,
සකෙන දරෙන ච හොසි තුට්ඨො
තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
තෙහෙව කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං විමානං"ති.

යනුහෙයින් "මම යටගිය දවස කොසොල් ජනපදවාසීන්ගේ සෙතව්‍යනම් නුවර පරලොව නැත, කුසල් නැත, අකුසල් නැතැයි කියා ගන්නාලද උච්ඡෙද දෘෂ්ටි ඇත්තාවූ මසුරුවූ ලාමක ස්‍වභාව ඇත්තාවූ පායාසි රාජඤ්ඤනම් බ්‍රාහ්මණයෙක් වීමි. එසමයෙහි බුදුන්ගේ ශ්‍රාවකවූ චිත්‍රකථිකවූ බහුශ්‍රැත වූ උදර වූ ප්‍රඥ ඇති කුමාර කාශ්‍යප නම් මහතෙරුන් වහන්සේ ඒ දෘෂ්ටිය විනොදනය කොට බණ වදළසේක. මම ඒ බණ අසා ප්‍රාණඝාතය අදත්තාදනය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යන පස්පවින් දුරුව දන ශීලාදිවශයෙන් කුශල් පමණක් කෙළෙමි. එසේ පුරුදු කරනලද ව්‍රතසමාදනය හා එම ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාව හෙතුකොටගෙන මා විසින් මේ විමානය හා මේ විපාකානිසංසය ලබන ලද්දේය"යි කීය. එකල්හි ඒ සාර්‍ථවාහකයෝ ඒ දිව්‍යපුත්‍රයාද විමානයද ප්‍රත්‍යක්‍ෂයෙන් ම දැක කර්‍මඵල අදහාගෙන තමන්ගේ කර්‍මඵල ඇදහීම දක්වන්නාහු.

"සච්චං කිරාහංසු නරා සපඤ්ඤා
අනඤ්ඤථා වචනං පණ්ඩිතානං,

යහිං යහිං ගච්ඡති පුඤ්ඤකම්මො
තහිං තහිං මොදති කාම කාමී.
යහිං යහිං සොකපරිද්දවො ච
වධො ච බන්ධො ච පරික්කිලෙසො,
තහිං තහිං ගච්ඡති පාපකම්මො
නමුච්චති දුග්ගතියා කදාචී"ති.

යනුහෙයින්, නුවණැත්තාවූ යම් කෙනෙක් යමක් කීවාහුනම් ඒ නුවණැති පණ්ඩිතයන්ගේ වචනය නම් වෙනසක්-අන්‍යථාත්වයක් නැත්තේය. කරනලද කුසල් ඇති සත්පුරුෂතෙම යම් තැනකට යේද හෙවත් දිව්‍යලොක මනුෂ්‍යලොකාදී වශයෙන් යම් යම් තැනක උපදිද, ඒ ඒ තන්හි පඤ්චකාම සම්පත් විඳිමින් සතුටුවන්නේය. කරනලද අකුසල් ඇති සත්වතෙම යම් යම් තැනකට යේද ඒ ඒ තන්හි සෝකකිරීමය, විලාපකීමය, වධ බන්ධනාදියට පැමිණීමය යනාදී නොයෙක් අනර්ථයට පැමිණ කිසි කලෙකත් සසර දුකින් නොමිදෙන්නේමය"යි කියා කුශල යට ප්‍රශංසාකොට අකුසල් කළවුන්ට නින්දාකොට ඒ දිව්‍යපුත්‍රයා හා සමග ප්‍රිය කථාකොට ඉක්බිති මනුෂ්‍ය පථයට ගොස් දිවිහිමියෙන් කුශල් කොට කම්වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත වූවාහුය. ඒ උපාසකයා ද සුවසේ ගමට ගොස් මවුපියන්ට උපස්ථානකොට ඉක්බිති සකල කෙලශ නසා රහත්ව සසරදුකින් මිදුනේය.

•

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සත්වැනිවූ සුනික්ඛිත්ත වර්ගයෙහි
දසවැනි සෙරිස්සක විමාන වස්තු වර්ණනාව
කියා නිමවන ලදි.

## 85. සුනික්ඛිත්ත විමාන වස්තුව

තවද මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනික්ඛිත්ත වර්ගයෙහි එකොලොස්වැනි සුනික්ඛිත්ත විමාන වස්තුව නම් කවරයත්:-

ජලපොලොවසේ ගැඹුරුවූ ගුණ ඇති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන් වහන්සේ එක් දවසක් යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් තවුතිසා දෙව්ලොවට වැඩිසේක. එකෙණෙහි එත්තරා දිව්‍යපුත්‍රයෙක් තමාගේ විමානයෙහි සිටියේ මුගලන් මහතෙරුන් වහන්සේ දැක හටගත්තාවූ

ගෞරව බහුමාන ඇතිව තෙරුන් වහන්සේ කරා එළඹ නමස්කාරකොට දෙහොත් මුදුන් දී එකත්පස්ව සිටියේය. ඒ දිව්‍ය පුත්‍රයාගේ උත්පත්ති කථාව නම් කවරයත් - "යටගිය දවස මේ මහාභද්‍රකල්පයෙහි තුන්වැනිව බුදුවූ කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ සියලු බුඩ කෘත්‍යයන් කොටනිමවා පිරිනිවන් පා වදළ කල්හි ශරීර ධාතු වසා ලෝවැස්සෝ දගැබක් කළාහ. එසමයෙහි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදී බොහෝදෙනා රැස්ව ගඳ දුම් මල් ආදියෙන් පූජාසත්කාර කෙරෙති. එසේ උපාසකවරු මල් පූජාකොට ගිය කල්හි ඒ ආසනවල පිදූ මල් ඒ ඒ තැන තිබෙන්නා දැක එක්තරා උපාසකයෙක් ඒ මල් ගෙන මලසුන්වල දශීනීය කොට විසිතුරු රූපාලඞ්කාරයෙන් මල් සද පූජාකෙළේය. එසේ පුද බුදුගුණ සිහිකොට බුදුන් කෙරෙහි ප්‍රසනන, උත්තමවූ බුදුන් උදෙසා මා විසින් මල් සද පූජාකරන ලද්දේයයි කියා ඒ කුසල් අරමුණු කොට ඒ කුසලකර්‍මය සිත තබාගත්තේය. ඒ උපාසකතෙම එයින් අපරභාගයෙහි කාලක්‍රියාකොට ඒ කුශලානුභාවයෙන් තවුතිසා දෙව්ලොව දෙළොස් යොදුන් රන්විමණෙක උපන්නේය. ඒ දිව්‍යපුත්‍රතෙම මහත් ආනුභාව හා මහත් ඓශ්වර්‍ය්‍ය සම්පත්තිය හා පිරිවර සම්පත් ඇතිවිය. එතැන් පටන් සුගතියෙහිම සැරිසරන්නේ මේ බුඩොත්පාද කාලයෙහිද එසේම මහත් දිව්‍යසම්පත් අනුභව කෙරෙයි. තෙරුන් වහන්සේ දැක වැඳ එකත්පස්ව සිටියේ නම් මේ දිව්‍යපුත්‍රයායි. එකල මහතෙරුන් වහන්සේ ඒ දිව්‍යපුත්‍රයා දැක ඔහු විසින් ගිය දවස කරනලද කුසල කර්‍මය මේ ගාථාවන්ගෙන් විචාළසේක.

උච්චමිදං මණිථූණං විමානං
සමන්තතො ද්වාදසයොජනානි,
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථා සුභා"-පෙ-

යනාදීන් දක්වනලද හෙයින්, "එම්බා දිව්‍යපුත්‍රය, වෛදූර්‍ය්‍ය මිණිමය ටැම් ඇත්තාවූ හාත්පසින් සතළිස් අටගවු පමණ මහත්වූ උදරතරවූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ නොයෙක් රත්නයෙන් විසිතුරුවූ භිත්ති දෙරකවුළු ආදියෙන් සැදුම්ලද්දවූ තාගේ මේ විමානය ඉතා සොභාමත්ව දිළිසෙයි. තාගේ විමානයෙහි පරිවාර දෙවතාවෝ දිව්‍යරසයෙන් යුක්තවූ අන්න පානාදිය සද, කවර භොජනයක් කවර රසයක් කවර පානවර්‍ගයක් අනුභව කරන්ට කැමතිසේක්දැ"යි යනාදීන් ප්‍රිය බසින් ආරාධනාකොට උපකාර සත්කාර කෙරෙති පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩ ගත් දෙවතාවෝ නොයෙක් අලඞ්කාරයෙන්

සැරහී නෘත්‍යගීතවාද්‍යාදි පඤ්චකාම සම්පත්තියෙන් තොප සතුටු කරවති. තාගේ ශරීර වර්ණයද චන්ද්‍රමණ්ඩලයසේ දශදිග් ඒකාලොක කෙරෙමින් දිළියෙයි. මෙබඳු මහානුභාව සම්පත් ලැබීමට තා විසින් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය කවරේදැ?යි" විචාරා වදළසේක. ඒ තෙරුන් වහන්සේ විසින් විචාරනලද පැණය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"දූනතිකබ්තතං මලං සුනීපිත්වා
පතිට්ඨපෙත්වා සුගතසස ථූපෙ,
මහිද්ධිකොවම්හි මහානුභාවො
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො

යනුහෙයින්, "ස්වාමීනි, මම යටගිය දවස මිනිස්ලොව උපන් සමයෙහි එක් දවසක් කාශ්‍යප බුදුන්ගේ ධාතු වසා බඳනා ලද දාගැබ් සමීපයට ගොස් මල් ආසනවල මල් සුළං පැහැරීමෙන් ඒ ඒ තැන විසිර වැටී තිබෙන්නා දැක ඒ මල්ගෙන මලසුන්වල විසිතුරුකොට සඳ බුදුගුණ සිහිකෙරෙමින් සතුටුවීමි. එපමණ කුශලකර්මය හෙතුකොටගෙන මහත්වූ දිව්‍යසෘද්ධියෙන්ද ආනුභාවයෙන්ද පිරිවරින්ද ශරීරවර්ණයෙන්ද සියලු පඤ්චකාම සම්පත්තියෙන්ද අග්‍රවීමි"යි කීයේය. මෙසේ ඒ දිව්‍යපුත්‍රයා තමා විසින් කරනලද කුශල කර්මය ප්‍රකාශකොට කී කල ඕහට විස්තර වශයෙන් බණ වදරා මිනිස්ලොවට වැඩ එපවත් බුදුන්ට දැන්වූ සේක.

බුදුරජාණෝ එම අත්ථොත්පත්තිකොටගෙන එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට විස්තර වශයෙන් බණ වදළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාත්ථක විය.

මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සත්වැනි සුනිකඛිත්ත වර්ගයෙහි
**එකොළොස්වන සුනිකඛිත්ත විමාන වස්තු වර්ණනාව**
කියා නිමවන ලදී.

පරමත්ථජොතිකා නම්වූ ඛුද්දකට්ඨ කථාවෙහි
සත්වන සුනිකඛිත්ත වර්ගය කියා නිමවනලදී.

# ශාසනොපකාර සංග්‍රහ වස්තුව.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සිංහල භාෂා කර්තෘන් විසින් සංග්‍රහකරණලද ශාසනොපකාර සංග්‍රහ වස්තුව නම් කවරැයත්:-

පූරාතන පටන් මූලභාෂායයි කියන ලද පාලි අර්ථ වශයෙන් පැවත ආවාවූ මේ විමාන වස්තු ප්‍රකරණයෙහි සප්ත මහා වර්ගයට අන්තර්ගතවූ කථාවස්තූන් පාලිය හැර වචනාර්ථ පමණක් ගෙන එළු බසට නගා ප්‍රකාශකොට දක්වා ඊට අනතුරුව මෑත භාගයෙහි පසුබටවූ ලක්දිව ශාසනය නැවත නිර්මලව දීප්තිමත්වූ බවද ධර්මයවූ පරිද්දෙන් පිළිපදනා මහොත්තමයන්ගේ ගුණ කීර්තිය හිර සඳ සේ දශදිග ප්‍රසිද්ධ කිරීම ඓහලෞකිකාභිවෘද්ධි වර්ධනයට කාරණා වන බවද ප්‍රකාශකොට දක්වන පිණිස මේ විමාන වස්තු ප්‍රකරණයෙහි මුලම දැක්විය යුතුවූ "සඤ්ඤා නිමිත්තං කුත්තාරං පරිමාණං ප්‍රයොජනං" යන පඤ්චාර්ථයන් මෙහිම සඞ්ගෘහිත වන බැවින් මේ විමාන වස්තු ප්‍රකරණයටම අන්තර්ගතකොට ශාසනොපකාර සංග්‍රහ නම්වූ වස්තු සංග්‍රහයෙක් අප විසින් සංග්‍රහ කරනලදුව ප්‍රකාශකොට දක්වම්හ. ලසුකොට නොසිතා මනාකොට අසා පූර්ව නරවීරයන් කළ කී කටයුතු හැදින එන දවසත් යම්කිසි කාරණයකින් ශාසනය පිරිහෙන්නට වන්නේ වී නම් ශාසනාභිවෘද්ධි වර්ධනය කැමති ශ්‍රද්ධාවන්තයන් විසින් සැක නැතිව වීර්‍ය්‍ය වඩා පස්වා දහසක් පවත්නා සර්වඥ ශාසනයට ආධාරව ස්වර්ග මොක්ෂ සම්පත් ලබන්ට උත්සාහ කටයුතු.

"උස්සාහ වඩ්ඪනත්ථාය පවක්ඛාමි ඉතො පරං,
සාසනොදය කාමීනං ඤත්වා සන්දිට්ඨිකං ඵලං.
විනාසමුඛ සම්පත්තං ලඞ්කායං ජින සාසනං,
ජොතනත්ථාය උස්සාහං කතස්ස සඞ්ඝරාජිනො.
ගුණඤ්ච වුද්ධිප්පත්තස්ස සාසනස්ස ච දපංනං,
කිත්තිස්සිරී රාජසීහ භූමිපාලස්ස වණ්ණනං.
තං සුත්වා චෙවමුස්සාහං වඩ්ඪන්තු මුනිසූණවො,
භූමිපාලාදීසබ්බෙපි කරොන්තු සත්ථු සංඞ්ගහං"ති.

සර්වලොකෛකනාථවූ අප බුදුරජාණන් වහන්සේ සද්ධර්මාමෘත වර්ෂා කෙරෙමින් පන්සාළිස් හවුරුද්දක් මුළුල්ලේහි ජීවත්ව වැඩ හිඳ සියලු බුද්ධ කෘත්‍යයන් කොට නිමවා පිරිනිවි තැන් පටන් දෙසිය සතළිස් වෙනි වර්ෂයෙහි මෙම ශ්‍රී ලඞ්කාවීපෙයහි දෙවන පෑතිස් මහරජාණන් දවස මිහිඳු මහතෙරුන් වහන්සේ ප්‍රධාන කොට ඇති මහා සඞ්ඝයා දඹදිවින් වැඩ විසුද්ධ බුද්ධශාසනය පිහිටෙව් තැන් පටන් ඒ ඒ කලරජ පැමිණි ශ්‍රද්ධා බුද්ධි

සම්පන්න රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් ධර්මධර විනයධර ලජ්ජිසුපෙසල ශික්‍ෂාකාමී මහා සඞ්ඝයා වහන්සේගේ සහායෙන් ඒ ඒ කලට සම්ප්‍රාප්ත වූ ශාසනාර්බුද දුරුකොට නිර්මලව පවත්වා ආවාවූ බුද්ධශාසනය මෑත භාගයෙහි එවැනි පින්වත්රාජරාජ මහාමාත්‍යාදීන් නොලැබීමෙන් හා පරඬගි දමිළාදි මිථ්‍යාදෘෂ්ටින්ගේ උවදුරු නිසා ලජ්ජි සුපෙසල ශික්‍ෂාකාමී තැන්වලට සිවුපසය නොලැබීමෙන් ශ්‍රද්ධාවෙන් පැවිදිවූ කුලදරුවන්ට සූත්‍රාභිධර්ම විනය සඞ්ඛ්‍යාත ත්‍රිපිටක ධර්මය සුවසේ ඉගෙන ධර්ම විනායානුකූලවූ පරිද්දෙන් පිළිපැදීමට අසමර්ථව කුලදූෂණාදී මිථ්‍යාජීවයෙන් ජීවත්වන දුශ්ශීල තැන් වලට බල වැඩී අනුක්‍රමයෙන් ශාසනය පිරිහී බුදුන් විසින් විනය ධරයන් කෙරෙහි අග්‍රස්ථානයෙහි තබන ලද උපාලි ස්ථවිරයන් වහන්සේ පටන් පිළිවෙලින් පැවත ආවාවූ-

"උපාලි දසකො චෙව සොණකො සිග්ගවො තථා,
මොග්ගලීපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිවහයෙ.
තතො මහින්දෙ ඉට්ටියො උත්තියො චෙව සම්බලො,
භද්ද නාමොච පණ්ඩිතො එතෙ නාගා මහා පඤ්ඤ
ජම්බුදීපා ඉධාගතා.
තතො අරිට්ඨො මෙධාවී තිස්සදත්තො ච පණ්ඩිතො,
විසාරදෙ කාලසුමනො ථෙරොච දිඝනාමකො
දීඝසුමනො ච පණ්ඩිතො."

යනාදීන් දක්වන ලද උපාලිය, දසකය, සොණකය, සිග්ගවය, මොග්ගලීපුත්තය, මිහිඳුය යනාදී ක්‍රමයෙන් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා වශයෙන් කවර කුලයකින් වත් ශ්‍රද්ධාවෙන් පැවිදිව ධර්ම විනය ලෙසින් ගුරු පරම්පරාව නොකඩකොට පැවත ආවාවූ ශාසන පරම්පරාව හැර තම තමන්ගේ කුල පරම්පරාව ශාසනපරම්පරාවයයි වරදවා ගෙන ශ්‍රද්ධාවන්ත රාජරාජ මහාමාත්‍යාදීන් විසින් සඞ්ඝයාට සිවුපසය පිණිස සාංඝිකකොට කැප වශයෙන් දෙන ලද ගම්බිම් කෙත්වත් ආදියත් තම තමන්ගේ ඥාතිකුල පරම්පරාවටම හිමිකොට පදවිය ලත් කෙනකුන්ට රාජකාරිය දෙමින් ගම නිසා තම තමන්ගේ දරුමුනුබුරු කෙනකුන් පැවිදිකොට සිවුරු පිළිපොත් විහාර ගම් ආදියත් ඥාතිකුල පරම්පරාවටම අයිති කෙරෙමින් ශාසන පරම්පරාවයයි ව්‍යවහාර කොට දුශ්ශීල තැන් ගිහිවීමෙනුත් ශ්‍රද්ධාවන්ත කුලදරුවන් මහණවීමෙනුත් නිර්මලව පවත්නා සර්වඥ ශාසන පරම්පරාව නසා සමහර ලජ්ජි සුපෙසල ශික්‍ෂාකාමී කීපනමක් හැර අවශේෂ තැන් මැණික් තිබියදී ගිනිඅඟුරු උකාගන්නා සේ උගත මනා ධර්මවිනය තිබියදි නැකැත් වෙදකම් යක්‍ෂ ප්‍රලයාදී නින්දිත ශාස්ත්‍ර ඉගෙන ඇතුළු නුවර පිටිනුවර

නැකැත් වෙදකම් යක්‍ෂ ප්‍රලයාදී ගර්හිත විද්‍යා දක්වා රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ සිත්ගෙන ගම් කුඹුරු ස්ථානාන්තර ලබාගෙන නොයෙක් අනාචාරයෙහි හැසිර ශාසන පිළිවෙත් පිරිහෙළා ගොවිතැන් වෙළඳම්කොට වළඵ මුදු පිළිපත් ආදිය සපයා මල්බෑ බූහුණන් ආදීන් රක්‍ෂාකිරීම ශීලයක් කොට වසන අලජ්ජිතැන් බහුල බැවින් පරඬගි දමිළාදී මිථ්‍යා දෘෂ්ටින්ගේ පැලඹීමෙන්ද ශාසනය නසින්ට වන්කල මහානුභාව සම්පන්න තෙජොබල පරාක්‍රම සමන්විත වූ දෙවෙනි රාජසිංහ නම් මහාරාජොත්තම කෙනෙක් ලංකා රාජ්‍යයට පැමිණ මහත් උත්සාහයෙන් ශ්‍රී බුඩවර්‍ෂයෙන් දෙදස් එකසිය නවානූ වෙනි වර්‍ෂයෙහිදි කොළඹ බලකොටුව හරවා පරඬගි උවදුරු දුරුකොට ඕලන්ද වාසීන් ගෙන්වා මින්මතු රාජපරම්පරාවට හා ශ්‍රී ලංකා වාසීන්ට මිථ්‍යාදෘෂ්ටි සතුරන් නිසා කිසි උවදුරක් නොවේවයි යන කරුණාධ්‍යාසයෙන් ලංකාවීපයට සමුද්‍රතීරයෙහි රැකවල් ලවමින් මෙසේ සතුරු උවදුරු දුරුකිරීමෙහි ව්‍යවෘතවීම නිසා ශාසනොපකාර කටයුතුතාක් කොටගතනොහී පරලොකප්‍රාප්තවූසේක. එම රාජසිංහ මහරජාණන්ගේ ඇවෑමෙන් රාජ්‍ය ශ්‍රී පාදප්‍රාප්ත වූ ශ්‍රඩාබුඩි සම්පන්න ශාසනොදයකාමීවූ දෙවෙනි විමලධර්‍මසූර්‍ය මහරජාණෝ "අප වැනි ශ්‍රඩාවන්ත මහොත්තමයන් විසින් සර්‍වඥශාසනයට උපකාර කටයුතුය"යි යන කරුණාධ්‍යාස ඇතිව යටත්පිරිසෙයින් ලක්දිව උපසම්පද සඞ්ඝයා පස්නමක් පමණවත් සුසීල තැන් නැතිහෙයින් රක්කඬග දෙශයෙන් අතිරේක දශවර්ගී සංඝයා ගෙන්වා එකල ශාසන පිළිවෙත් දන්නා සඟනමක් නැති නිසාදේ සීමාබන්ධනාදී වශයෙන් ශාසනය. චිරස්ථායීවන කටයුත්තක් නොකොට ධර්‍මධර විනය ධර කමක්වේවයි සුසීල දුස්සීල කමක් වේවයි ශාසන ප්‍රතිපත්ති පරික්‍ෂාවක් නැතිව ලක්දිව මෑතභාගයෙහි පැවත ආවාවූ නොපිළිවෙත්ම පිළිවෙතැයි සිතා ශ්‍රඩාවන්තයන්ගේ පැවිදි වීමට අවසර නොදී ශාසන පරම්පරාවයයි කියා වරදවා විහාර ගම් හා වැව් ගම්කුඹුරු ඇති තැන් තෙතිස් නමක් පමණ තෝරාගෙන මහ වැලිගඟෙහි උදකසීමාවෙදි උපසම්පදකරවා පිණ්ඩපාතභොජනය පංශුකූලචීවරය වෘක්‍ෂමූල සෙනාසනය අරළු ගොමුත්‍රය යන සිවුපසය අශ්‍රයකොට ශ්‍රඩාවන්තයන් විසින් නිවන් පිණිස පැවිදිවන ලද සර්‍වඥශාසනයහේ ගම් කුඹුරු නිසා එක්සිය විසි නමක් පමණ සාමණෙර තැන් පැවිදිකරවා රටින් වැඩි සංඝයා දෙශාන්තරයවා ඒ විමලධර්‍මසූර්‍ය මහරජාණෝ දනාශීලාදී වශයෙන් කුසල් කෙරෙමින් සර්‍වඥශාසනයටත් ආධාරවූ දෙවිසි හවුරුද්දක් දැහැමින් රාජ්‍යයකොට පරලොකප්‍රාප්ත වූසේක. ඒ මහරජාණන් ගේ ඇවෑමෙන් රජ පැමිණි නරෙන්ද්‍රසිංහ මහරජාණන් දවසත් සමහර ශ්‍රඩාවනත කීපනමක් හැර අවශේෂ තැන් යටකී පරිද්දෙන්ම

කුල දූෂණාදී නොයෙක් අනාචාරයෙහි හැසිරෙමින් ගෙපිළිවෙළින් සිඟා වැළඳීම තබා පාත්‍රයෙන් වැළඳීමත් නින්දිත කොට හැර ගිහි ඇමතියන්සේ බත් පිසවා පිහන් ආදියෙන් අනුභවකොට තෙරුන්වහන්සේයයි යන නාමමාත්‍රයක් පමණක් පවත්වමින් නොයෙක් නින්දිත කටයුතු කරමින් වසනකල සුචි ශුද්ධ ශීලාලඞ්කෘත සරණඞ්කරාභිධාන සංඝරාජ ස්ථවිරයන් වහන්සේ පමණක් පූර්ව වාසනා බලයෙන් ගුරුන් හැර ලක්දිව අන් කිසි තැනෙක්හි නැතිව පිරිහී ගිය නිඝණ්ටු ඡන්දස් ව්‍යාකරණාදී උගතයුතු ශාස්ත්‍ර ඉගෙන ශ්‍රද්ධාවන්ත කීපනමක් සමග සිඟා වළඳමින් පාංශුකූල සිවුරු දරමින් ආරණ්‍ය සෙනාසනවල වසමින් සාමණේර භූමියෙහි සිටත් පර්යාප්ති ප්‍රතිපත්ති දෙක්හි අප්‍රමාදව වසන සේක, කල්යාමෙන් ලක්දිව එක උපසම්පද නමකුත් නැතිව හිස්විය. නරේන්ද්‍රසිංහ මහරජාණෝ දළද මන්දිරය ඇතුළුව සමහර සිද්ධස්ථානවල පුද පවත්වා ප්‍රස්ථාවානුකූල වශයෙන් සමහර තැන් ගණනක් සාමණේර පැවිදිකරවා සිවුපසයෙන් උපකාර කොට සාවද්‍ය අනවද්‍ය වශයෙන් තෙතිස් හවුරුද්දක් රාජ්‍යකොට පරලොකප්‍රාප්ත වූ සේක. ඒ රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යශ්‍රීයට පැමිණියාවූ රත්නත්‍රය සරණ පරායන වූ සර්වගුණගණාභරණ විභූෂිතවූ සූර්යකුල ප්‍රසූතවූ විජයරාජසිංහ මහරජාණෝ. "අප වැනි ශ්‍රද්ධාවන්ත මහෝත්තමයන් විසින් ලොක ශාසනාභිවෘද්ධිවර්ධනය කිරීමෙහි උත්සාහ කටයුතුය"යි යන කරුණාධ්‍යාශ ඇතිව සංඝයා පිණිස බොහෝ පඬුරු හා මහ ඇමතියන් දෙශාන්තරයට යැවීය. ඒ පඬුරු හා මහ ඇමතියන් නැව හා සමග දියෙහි ගැලී මිනිසුන් දෙන්නකු හා එක් අමාත්‍යයෙක් පමණක් ගැලවී පයිගෝ දෙශයට ගොස් සංඝයා දැක තමන් ආ පවත් කියා අරණ්‍යවාසී මහා ස්ථවිර කෙනෙකුන් විසින් දෙනලද කර්මවාක්‍ය පොතක් ලබාගෙන ජීවිතය පමණක් රක්‍ෂාකොට ගෙන ආයේය. ඒ මහරජාණෝ නැවතත් නොපසුබට වීර්ය ඇතිව පාක්කුඩම් හා මහ ඇමතියන් දෙශාන්තර යැවූහ. ඒ අමාත්‍යයෝ බතාවියට ගොස් ගෙනගිය පඬුරු පාක්කුඩම් එහිතබා සංඝයා ඇති නැති බව පරීක්‍ෂාකරනු පිණිස සියම් දෙශයට ගොස් සංඝයා දැක සතුටුව නැවත ශ්‍රී සන්හස් හා පඬුරු පාක්කුඩම් ගෙන යන පිණිස බතාවියට ආකල විජය රාජසිංහ මහරජානෝ අටඅවුරුද්දක් දැහැමින් රාජ්‍යයකොට පරලොකප්‍රාප්ත වූ සේක. එපවත් අසා මෙකල රජ පැමිණි උතුමාණන්ට නොදන්වා සංඝයා වඩාගෙනයාම සුදුසු නොවෙයි කියා ඔලන්ද වාසීහු කී බැවින් කලකිරුණාවූ සිත් ඇතිව ගෙනගිය පඬුරු එහිම තබා නැව් නැගී ලක්දිව බලා එන්නාහු බොහෝ දෙනා විනාශයට පැමිණ කීපදෙනෙක් පමණක් ගැලවී ආවාහුය.

ඒ සමයෙහි- "නාග චම්පක පුන්නාග තිණසාලාදි භූසිතෙ.
සීතලොදක සම්පූණ්ණ වාපි පල්ලලමාපගෙ.
නා නා විහාර ආරාම චෙතියාදිහී මණ්ඩිතෙ,
හත්ථ්‍යස්ස රථ පත්ත්‍යාදී නා නා ජන සමාකුලෙ.
සබ්බිස්සරිය සම්පුණ්ණෙ සෙඩ්ඩඛණ්ඩ සෙලනාමකෙ,
නානාතුරිය සංඝුට්ඨෙ රමණීයෙ පුරුත්තමෙ.
ලංකම්බරම්හි විත්ථිණ්ණං නාසෙන්තො අහිතං තමං,
උග්ගතොවිය ආදිච්චො තොසෙන්තො සුජනම්බුජෙ.
කිත්තිස්සිරි රාජසීහ භූපාලො ගුණ භූසනො.
රජ්ජං පත්තොසි ලංකායං සක්කොව තිදසාධිපො"ති.

බහලාන්ධකාර විධ්වංශනයකොට සියලූ පද්ම වනයන් ප්‍රබොධ කරවමින් නැංගාවූ සූර්‍ය්‍ය මණ්ඩලයේ සේ ලඞ්කාවීප නැමති ආකාශයෙහි පැතිර පවත්නා පරශත්‍රු නැමති අන්ධකාර විධ්වංශනය කෙරෙමින් සත්පුරුෂ ජන නැමති පද්මයන් සතුටු කරවමින් සූර්‍ය්‍යවංශ නැමති උදයගිර පර්‍වතයෙන් උදවෙමින් ශ්‍රී බුද්ධ වර්‍ෂයෙන් දෙදස් දෙසිය අනුවෙනි වර්‍ෂයෙහි ලඞ්කාරාජ්‍ය ශ්‍රී පදප්‍රාප්ත වූ පරරාජ කිරීට භ්‍රමරනිසෙවිත පාදපඞ්කජොපෙත වූ අපගේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජොත්තම නැමති සූර්‍ය්‍ය දිව්‍යරාජ තෙම පූර්‍වොපචිත කුසලානුභාවයෙන් එකඡත්‍ර නංවා අසදෘශ ආඥගුණතේජෝබල පරාක්‍රම සමන්විත විහාරාරාම චෛත්‍යාදී නොයෙක් අලංකාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ සෙන්කඩගල නම් පුරප්‍රවරයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන් රාජ්‍ය ශ්‍රී විඳ වසමින් ජිනවර ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ දිව්‍යරාජයාගේ චොටුන්නක් වැනිවූ මුක්තා මාණික්‍යාදී නොයෙක් රත්න කර්‍මාන්තයෙන් බබලන්නාවූ නොයෙක් දහස් ගණන් අගනා රන් කරඬුවල වඩා රත්නාභරණ ග්‍රාමක්ෂෙත්‍ර ගව මහිස ඇත් අස් දසී දසාදි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තු පරිත්‍යාග කිරීමෙන්ද ධර්‍මාශෝක දෙවන පෑතිස් ආදී පින්වත් නරෙන්ද්‍රයන් පවා ප්‍රතිපත්ති සාර භික්ෂූන්ගේ සහායෙන් ශාසනය පවත්වා ආ හෙයින් අප විසිනුදු සිල්වත් සඟ නමක් සහායකොට ගෙන ශාසනොපකාර කටයුතුයයි යන පූර්‍වනරවීර වංශානුගත උදරාධ්‍යාශ ඇතිව ධර්‍මාන්විත ප්‍රතිපත්ති පුරන්නාවූ යටකී සරණඞ්කර සාමණෙරයන් වහන්සේට පුෂ්පාරාම විහාරය කරවා පිළිගන්වා සිවුපසයෙන් උපකාර කෙරෙමින් බණ අසා පොහෝ පෙහෙවස් වෙසෙමින් නිත්‍ය පඤ්චශීලය රකිමින් පුරාතණ පටන් මුළුතැන්ගෙට දෙනමෘග සූකරාදි අමු මාංශත් එපාකොට සියලූ සත්වයන්ට අභය දී දශරාජ ධර්‍මයෙන් අකොප්‍යව රාජ්‍යය කෙරෙමින් දව්භූමක දළදා මන්දිරය හා ගඩගාරාම විහාරය කරවා එහි සංඝයාට සිවුපසය පිණිස ගම් කුඹුරු ආදිය පූජාකිරීමෙන්ද එසේම මහියඞගණ

අනුරාධපුරාදී නොයෙක් සිද්ධස්ථානවල උදරතරවූ පූජා පැවැත්වීමෙන්ද සමන්තකූට පර්වතයෙහි පූජාසත්කාර පිණිස බොහෝ දෙනා රැස්වන කාලයෙහි ලාභසත්කාර පිණිස මිථ්‍යාදෘෂ්ටි යාචකයන් ගොස් සිට ශ්‍රී පාදලාඤ්ඡන ගල්ගා සුණුගෙන බොහෝ අවැඩ පුරවාගන්නා බව කර්ණයුගලයෙහි වැටුණු ක්ෂණයෙහිම කම්පිතවූ චිත්තසන්තාන ඇතිව සපරගමුවද කුට්ටාපිටිය ඇතුළුව ගම් කුඹුරු පූජා කෙරෙමින් ශ්‍රීපාද ලාඤ්ඡනය රුවන් පටකින් වසා ලක්දිව උපසම්පද කටයුතු සිද්ධවීමෙන් සංඝයා බහුලවූ කල සංඝරාජ ස්වාමින් වහන්සේට දන්වා එහි සංඝයා සිටින ලෙස සලස්වා සිවුපසයෙන් පූජාසත්කාර පැවැත්වීමෙන් බොහෝ කුසල සම්භාරයන් රැස්කරන සේක පූර්වෝපචිත කුශල මහිමයෙන් බොධිසත්ව භූමියෙහි පිහිටි අප කීර්ති ශ්‍රී රාජසිංහ මහරාජෝත්තමයාණෝ එක්තරා පොහෝ දිනයක උභය විහාරවාසී සාමණේරතැන් ගෙන්වා ඇතුළු රජගෙහිදී වළඳන්ට ආරම්භවූව. "අටපිරිකර කවරේදැ?"යි විචාරා "පත්තං පරිස්සාවනා කායබන්ධනං" යන ගාථාවෙන් බණ කී කල, "අටපිරිකර පමණවත් නැති තමුන්නාන්සේලා කෙරෙහි කවර ගුණයෙක් ඇද්ද? අටපිරිකර මුලටම වදළ පාත්‍රය දැන් කොයිදැ?යි" කියා "මෙතැන පටන් පාත්‍රයෙන් වළඳන බවක් විනා පිඟන් තැටි ආදියෙන් වැළඳූ නමක් ඇත්නම් රාජාඥා කෙරෙමි" කියා පෙර නිඳුකොට හැරියාවූ පාත්‍රා දෙමින්, "අද පටන් සංඝාය විසින් නොකටයුතු නැකැත් වෙදකම් යක්ෂ ප්‍රලයාදීනින්දිත කටයුතු අපවැනි ශ්‍රද්ධාවන්ත මහොත්තමයන් විසින් සංඝයා ලවා නොකරවිය යුතුය; සංඝයා විසින් උගතමනා ධර්මය උගතමැනව"යි කියා ආඥාකොට ශාසනාධාර උපසම්පද සංඝයා නැතිහෙයින් බුද්ධ ශාසනයාගේ නොපැවැත්ම හේතුකොටගෙන අපායභාග්වන ලංකාද්වීපවාසී පශ්චිමජනතාව කෙරෙහි පැවැති මහත් කරුණාධ්‍යාශ ඇතිව, "පූර්වනරශ්‍රෙෂ්ඨවූ රාජෝත්තමයන් විසින් පවත්වා ආවාවූ පස්වා දහසක් පවත්නා සර්වඥශාසනයට මා වැනි නරශ්‍රෙෂ්ඨයන් විසිනුදු උපකාර කට යුතුය" යි කියා පුරාතන මහොත්තමයන්ගේ පරම්පරානුගත රාජාභිමාන උපදවා, "මගේ පුණ්‍ය මහන්තත්වයෙන් හා ශාසනාභිවෘද්ධි වර්ධනය කිරීමෙහි යම් බ ලවත් අභිප්‍රායෙක් ඇත්නම් ඒ චිත්තාබ්භ්‍යන්තරෝත්පන්න කටයුතු වහාම සුවසේ සිද්ධවේව"යි යන කරුණා පූර්වාඞ්ගමවූ උදරාධ්‍යාශයෙන් නොපසුබටව වීර්ය ඇතිව ඇහැලේපොළ විජයසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රශේඛර සෙනානායක ජයතිලක පණ්ඩිත මුදලි සෙනාපති මහඇමතියාණන් සහායකොට ගෙන ශ්‍රී සන්නස් හා සමග මාහැඟි පඬුරු පාක්කුඩම් ස්‍යාමදෙශයට යවා ඒ දෙශයෙන් සංඝයා වඩිනාතෙක් අප විසින්ද අප්‍රමාද වියයුතුයයි කියා සුවිසුද්ධ ගුණ ඇති සරණංකර

සාමණේරයන් වහන්සේ හා යටකී සෙනාපති මහා ඇමතියන් හා මනත්‍රණය කොට බුදු සසුන් බබුළුවන බවට පූර්ව නිමිත්ත පානාසේ රජසිරි ලත් වර්ෂයෙහිම වෙළෙඳන කෙනකුන් හා සමග පයිගෝ දෙශයෙන් සිරිලකට පැමිණි මහ තෙරුන් වහන්සේ ලවා බොහෝ සාමණේරවරු පැවිදි කරවා පළමු සිටි දුස්සීල තැන් ගණනක් ශාසනයෙන් පිටත් කරවා ශ්‍රධාවන්ත තැන්වලට සිල් දෙවා ශාසනය පිරිසිදු කරමින් නිසණ්ටු ඡන්දස් ව්‍යාකරණ හා ධර්ම විනය පුරුදුකරවා සාමණේර තැන් ඇතිකර වූහ. එකල දෙශාන්තර ගිය ඇමතියන් බතාවියේ තුබුණු පඩුරු හා ගෙන ගිය මාහැඟි වස්තු හා ශ්‍රී සන්හස් සමගින් ශ්‍යාමදෙශය බද අයොධ්‍යපුරයෙහි රජකරන රජතුමාණන්ට දන්වා ඒ අදෘෂට මිත්‍රවූ ධාර්මික මහරජතුමාණන් විසින් එවනලද උත්තම ගුණානුවණ ඇති උපාලිස්ථවිරයන් හා එසේම ගුණ ගණාඩග සංගත ආයර්මුනි මහතෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති අතිරෙක දශවර්ග භික්ෂුසංඝයාවහන්සේ හා අයොධ්‍යපුර මහ ඇමතියෝ ලඩකාවීපයෙහි නැති ධර්ම විනය ශබ්දශාස්ත්‍රාදී පොත් පත් හා නොයෙක් පඩුරු පාක්කුඩම් ගෙන්වාගෙන සිංහල ඇමතියන් හා සමග නැව් නැඟී තිරිකුණාමලයට පැමිණි බව අසා දේලා කුඩ කොඩි සිවුරු පිරිකර ගඳදුම් මල් පහන් ආදී පූජා භාණ්ඩයන් හා මඟුලැතු සරහා පඤ්චාඞ්ගික තූර්ය භාණ්ඩ ගත් නෘත්‍ය ගීත වාද්‍යාදියෙහි නියුක්තවූ තූර්ය සෙනාව හා ඇහැලේපොල විජයසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රශේකර සෙනානායක ජයතිලක පණ්ඩිත මුදලි සෙනාපති මහ ඇමතියන් යවා සමුද්‍රතීරයෙහි පටන් නොයෙක් පූජාපෙරහරින් ධාතු පිළිම පොත් හා මහාසංඝයා වඩා ගෙන අනුක්‍රමයෙන් මහා වාළුක ගංගාසන්නයට පැමිණි කල්හි ශ්‍රී ලංකාධිපති අපගේ කීර්ති ශ්‍රී රාජසිංහ මහරාජෝත්තමයාණෝ සර්වාභරණයෙන් සැරහී තුරඩගවාහනාරූඪව ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් සිවුරඟ සෙනඟ පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් දිළිහි දිළිහී පෙරගමන් කොට අඩුපිටින් බැස සංඝදර්ශන සාධුසාමිචි රසාශවාදයෙන් දෙවෙනි රාජ්‍යයක් ලද්දසේ ඉතා සන්තුෂටව ත්‍රිවිධරත්නය පෙරදැරි කොට ස්වකීය පුරප්‍රවෙශව අභිනව කර වන ලද පුෂ්පාරාම විහාරය පිළිගන්වා එහි වසන සංඝයාවහන්සේ ට සිවුපසයෙන් උපස්ථාන කෙරෙමින් ශ්‍රී බුඩ වර්ෂයෙන් දෙදස් දෙසිය සයානුවෙනි වර්ෂයෙහි ඇසළ මහ පුරපසළොස්වක් දිනයෙහි මෙම විහාර මධ්‍යයෙහි වූ පොහෝගෙහිදී පළමුවෙනි උපසම්පද මංගල්‍යය සිඩකරවා වස් වැසවූහ. එසේ උපසම්පද කරවන්නේ ශාසනොපකාර කිරීමට සහායව සිටි සරණඞකර සාමණේරයන්වහන්සේ ලඩකාවාසී සියලු සංඝයාවහන්සේලාට ගුරු ස්ථානයෙහි පිහිටුවා ප්‍රථම දිනයෙහිම උපසම්පද කරවා විදෙශයෙන් වැඩිය සංඝයා හා ලක්දිව උභය

විහාර වාසීවූ මහාසංඝයා මධ්‍යයෙහි රජතුමාණෝ ශක්‍රදෙවේන්‍ද්‍ර ලීලායෙන් හිඳ සංඝයාට ආදර දක්වා සියලු සංඝයා වඩා පිණ්ඩපාත ධූත ව්‍රතාදිවශයෙන් ශාසනෝපකාර හෙයින් සරණංකර ස්ථවිරයෙන් වහන්සේ සංඝරාජ ධුරයෙහි පිහිටුවා "මුන්වහන්සේගේ අවවාදයෙහි නොපිහිටිය කෙනෙක් ඇත්නම් රාජාඥ කෙරෙමි" කියා ස්ථවිර පදවියෙහි තබා බොහෝදෙනා මහණ මහළු පැවිදි කරවූහ.

"ලඞ්කින්දං දස්සනත්ථාය අයුජ්ඣපුර රාජිනා
දින්නං පහෙනකං චෙව භික්ඛුසංඝංච ගාහිය,
ආගතානං අමච්චානං කත්වාන බහුසංගහං
තස්සරාජස්ස දත්වාං මහග්ඝඤ්ච පහෙනකං,
දත්වා සීහලිකාමචෙව තථෙව පුස්තකඤ්සාසනං
ලඞ්කින්දො පුනපෙසෙසි අයුජ්ඣපුර මුත්තමං"ති.

ඉක්බිති සියාම්දෙශ සඞ්ඛ්‍යාත අයොධ්‍ය සංඝයා සතර අවුරුද්දක් වැඩ සිටුවා ගෙන ග්‍රන්ථවිදර්ශනාධුරවය ඇතුළු ශාසනපිළිවෙත් මතු බොහෝ කලක් පවත්නා පරිද්දෙන් සත් අවුරුද්දක් ගුරුන්ළඟ හික්මවා එකම උපසම්පද නමකුත් නැතිව තුබූ ලක්දිව දහසක් පමණ භික්ෂු සංඝයා ඇතිකරවා ශාසනාභිවෘද්ධිවර්ධනය කිරීමෙන් පස්වාදහසක් පවත්නා ශාසනයට ආධාරව සිවුපසයෙන් උපකාර කෙරෙමින් පළමුවෙන් දෙශාගත මහා සංඝයා මැද සංඝයා රාජ ධූරයෙහි තබාලූ තමන්ට මෙවැනි ශාසනොපෙකාර කිරීමට සහායව සිටි සංඝරාජ ස්වාමිපාදයන්වහන්සේම මාහිමිකොට පළමුවෙනි උපසම්පදාවෙහි පටන් දෙළොස් වෙනි වර්ෂයෙහි වූ ඉල්මස අවදියවක ලත් සඳුද ලඞ්කාභික්ෂු සංඝයා කෙරෙහි පළමුවෙනි උපසම්පද මඞ්ගල්‍යය මහත් උදරතර පූජා පෙරහර පැවැත්වීමෙන් සිඬකරවා එදවස් පටන් පිළිම වහන්සේ නමක් නෙත් පිහිටවීමත් පොතක් ලියවා නිෂ්ඨාකිරිමත් උපසම්පද මංගල්‍යය සිඬකිරිමත් යන මෙ ත්‍රිවිධ කටයුත්තම එක් දවසම සිඬකිරීම් වශයෙන් බොහෝ දවසක් නොකඩකොට පවත්වා "මට රාජ්‍යය තිබෙනතෙක් සියලු සංඝයාම සිවුපසය නිසා වෙහෙසක් නැතිව සුවසේ ධර්මවිනය පුහුණුකරනසේක්වා"යි යන කරුණාධ්‍යාසයෙන් සතර මංසන්ධියෙහි පියුම්විලක්සේ සතර දිගින් වඩනා මහාසංඝයාට රාජභවනයෙහිදී දන්වැට තබා ගිලන් භික්ෂූන්ට බෙහෙත් පිණිස වැටුප් වියදම් හා බෙහෙත් බඩු දී එක්කෙනෙකුන්ට මිනිසුන් දශදෙනා බැගින් කැපකරුවන් විස්සක් හා වෛද්‍යාචාරීන් දෙදෙනකු සලස්වා අනෙකුදු කියා නිමවිය නොහැකි පරිද්දෙන් බොහෝ කුශල සම්භාරයන් රැස්කෙරෙමින් "මතුමත්තෙහිත් මා විසින් ඇතිකරගත් භික්ෂූන් වහන්සේලා අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තීන්

දුරුව සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටා ශාසනය නිර්මලව පැවැත්වීම විනය පර්‍ය්‍යාප්ති මුල් කොටම වන්නේය. එසේහෙයින් සැමදෙනා වහන්සේම සමගි සතුටුව විනය පොත් බලා හික්ම වියයුතුය'යි කියා කරනලද ආරාධනාවෙන් සංඝරාජ ස්වාමීන්වහන්සේ ප්‍රධානකොට ඇති උභය විහාරවාසී මහ සංඝයා පුෂ්පාරාම විහාරයට රැස්ව අප්‍රමාදව දිව රෑ දෙක්හි අර්ථකථා සහිත විනය පාලි පොත් බලා නිමවා බුද්ධ ශාසනය නිර්මලව පවත්නා සමයෙහි,

"සංඝරාජස්ස සිස්සො යො ථෙරො සූරො ච පාකටො
සීලාදිගුණ සම්පන්නො ධම්මරක්ඛිත නාමකො,
තස්ස සිස්සෙන සම්බුද්ධ සුණ්හුතෙන සාධුනා
රතනපාලෙන ථෙරෙන සද්දසත්ථාදි විඤ්ඤුනා,
ඉන්දජොතිස්ස ථෙරස්ස සද්ධම්මට්ඨිති කාමිනො
ආරාධනං පටිග්ගය්හ විඤ්ඤූනත්ථඤ්ච ආයතිං,
ආගාතා මූලභාසාය විමානවත්ථු දෙශනා
විහාය මූලභාසත්ථං සකභාසාය වණ්ණිතා,
තං සුත්වා දනසීලාදි පුඤ්ඤකම්මං විජ්ජිය
රතනත්තය ගුණඤ්ඤෙව කත්තබ්බං කුසලං බහුං" ති.

සංඝරාජ ස්වාමිපාදයන්ගේ ශිෂ්‍ය වූ පණ්ඩිත ජන හෘදයානන්ද කරවූ උපොසථාරාම විහාරයෙහි නායක ධුරයෙහි පිහිටා හිරුමඬල සේ දශදිග පතළ කීර්ති ශ්‍රී ඇති ධම්මරක්ෂිත ස්ථවිර යන් වහන්සේග් ශිෂ්‍යවූ මාතුල නම් දනව්වෙහි අස්ගිරි කොරලය බද වඟුලීලෙන සමීපයෙහි වූ ගම්මුල්ල නම් පියස ගෘහපති වංශොද්භූතවූ ඡන්දස් ව්‍යාකරණ නිඝණ්ඩු ගණිතාදී නොයෙක් ශාසත්‍රයෙහි නිපුණවූ රත්නපාල ස්ථවිරයන් වහන්සේ විසින් මහ රජතුමන් දෙනලද සිවුපසය වළඳමින් පුෂ්පාරාම විහාරයෙහි වසමින් ශ්‍රද්ධාබුද්ධි සම්පන්න ශාසනොදයකාමීවූ ගලගෙදර ඉන්දජොති තෙරුන්වහන්සේගේ ආරාධනාව පිළිගෙන මතු එන දවස පාලි අර්ථ පෙරළා බණකීමෙහි අසමර්ථ වූ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්ට වැඩ පිණිස ග්‍රන්ථ එක්සිය පන්සත්තෑවක් අධිකකොට ඇති අටළොස් බණවරකින් හා සාරදස් අටසිය පන්සැත්තෑවක් ග්‍රන්ථයෙන් හා එක්ලක්ෂ සතලිස් නවදස් සසීයක් පමණ අක්ෂර සංඛ්‍යාවක් ඇති මේ එළු විමානවස්තු ප්‍රකරණය ශ්‍රී සුද්ධ සකරාජ වර්ෂ යෙන් එක්වා දහස් සසිය දෙයානුවෙනි වර්ෂයේදී කොට නිම වන ලදි.

දෙවො වස්සතු කාලෙන සස්සසම්පත්ති හෙතු ච.
පීතො භවතු ලොකොච රාජා භවතු ධම්මිකො

ඉමිනා පුඤ්ඤකම්මෙන යාව බුද්ධො හාවමහං.
මහොසධොව ඤාණෙන ජොතිසෙට්ඨීව හොගිනා,
වෙස්සන්තරොව දනෙන හොතු මය්හං හවාහවෙ.

සත්තාසංබෙය්‍ය කප්පානි මනොපණිධි පූරිය,
නවාසංබෙය්‍ය කප්පානි වචොපණිධි පූරිය.

අට්ඨධම්මසමොධානො ලහිත්වා විවරණම්පිච,
චතුරාසංබෙය්‍ය කප්පානි පූරෙත්වා දසපාරමී.

සබ්බබුද්ධකරෙ ධම්මෙ පූරෙත්වා පත්ව මත්ථකං,
බොධිමූලෙ නිසීදිත්වා බුද්ධො හෙස්සං අනාගතෙ.

කිත්තිස්සිරි රාජසීහ රාජා රවිකුලද්ධජො.
පසන්නො විමාන වත්ථුම්හි ධම්මං සුත්වා අනෙකධා

"සඵලො ජීවිතං මය්හං සුලද්ධං වත ජීවිතං."
පීතිපාමොජ්ජ වචනා නිච්ඡාරෙන්තො සගාරවො

රට්ඨංචා ධන ධඤ්ඤංචා දතුං තහි පහොනකං
යමහං සවෙ දදෙය්‍යාමී කො අඤ්ඤො තව තෙනපී.

රජ්ජං පත්තො යාව මයා කතපුඤ්ඤං දදමි තෙ,
එවං වත්වාථ විඤ්ඤෙසි සාසනට්ඨිති කාරණං.

වසිත්වා ජනපදෙ යස්මිං විහාරෙ ඊදිසො යති,
හික්ඛූනං සාමණෙරානං සම්මා සම්බුද්ධ දෙසිතං.

සික්ඛා පෙය්‍ය ධුවං ධම්මං චිරංතිට්ඨති සාසනං,
චතුකොරලරට්ඨම්හි නූතන නගරවහයෙ.

විහාරං සහ ඛෙත්තෙහි පඤ්චදසම්මණෙහිච.
අපරම්පි තහිං රට්ඨෙ ගාමෙ හිංගුල නාමකෙ.

සත්තම්මණෙහි ඛෙත්තෙහි විහාරඤ්ච අදාසි සො,
කප්පිය පච්චයත්ථාය උහො ථෙරො පටිග්ගාහිති.

**සිද්ධිරස්තු.**